# හීය



● මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමි

## බූවැලිකඩ ඛේදවාචකය සහ නිවෙස් හිමියාගේ බකුසුවත

**මහනුවර බූවැලි කඩ ප්‍රදේශයේ කඳු බෑවුමක් සහිත අවදානම් ස්ථානයක් ඉදිකර තිබූ පස් මහල් ගොඩනැගිල්ලක් ඉකුත් සතියේ අලුයම් කාලයේ කඩා වැටුණේ ය. ඒ ගැන ඇසූ දුටු හැම දෙනකුගේම දෙනෙත් කඳුළින් තෙමී ගියාට සැක නැත. එසේ වූයේ රුපියල් කෝටි ගණනක් වටිනා පස්මහල් ගොඩනැගිල්ල මහ පොළවට සමතලාවීම නිසා නොව ඊට යටවී මාස එකහමාරක්වත් නැති කිරි සප්පයකුත් ඒ ළදැරියගේ මාපිය දෙපළත් ඒ ස්ථානයේ දීම මිය ගොස් ඇතැයි අසන්නට ලැබීමෙනි.**

එම සුවිසල් ගොඩනැගිල්ල කඩා වැටෙන්නට ඇත්තේ මහ පොළව අභ්‍යන්තරයේ සිදුවූ නාය යෑමක් හෝ ඊට සමාන ස්වභාවික භූ විපර්යාසයක් නිසා යැයි කෙනෙකුට සිතන්නට පුළුවන. එහෙත් එම ගොඩනැගිල්ල එලෙස කඩා වැටී ඇත්තේ එවැනි භූ විපර්යාසයක් නිසා නොව එහි අඩිතාලම නිසි ප්‍රමිතියට අනුව ඉදිකර නොතිබීම නිසා යැයි ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය මාධ්‍යයට හෙළිකර තිබුණේය. එපමණක් ද නොව එහි පදනමට යොදාගත් යකඩ කඳන් බාල වර්ගයේ ඒවා බවත්, මෙතරම් විශාල ගොඩනැගිල්ලක් දරා සිටීමට ඒවා සවිමත් නැති බවත් එම ආයතනය මගින් මේ වනවිටත් සොයා ගෙන තිබේ.

අදාළ ආයතනයේ බලධාරීන් සඳහන් කරන අන්දමට එම ස්ථානයේ පස්මහල් ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා අවශ්‍ය පූර්ව අනුමැතිය ද ගොඩනැගිල්ලේ හිමිකරු විසින් ලබාගෙන නැත. එහෙත් අදාළ පුද්ගලයා මාධ්‍ය හමුවේ ප්‍රකාශ කර තිබුණේ තමන් ඒ සඳහා එකී ආයතනවල පූර්ව අනුමැතිය ලබාගෙන තිබෙන බවයි. එහෙත් එය තනිකරම හතර බීරි කතාවකි.

කෙසේ වෙතත් අසත්‍ය ප්‍රකාශ කරන්නේ කවුරුන්දැයි ඉදිරි කාලය තුළ පැවැත්වෙන පරීක්ෂණ කටයුතුවලදී හෙළිවනු ඇත.

එහෙත් ප්‍රශ්නය වී තිබෙන්නේ එය නොව කඩා වැටුණු පස්මහල් ගොඩනැගිල්ලට යටවී අවාසනාවන්ත ලෙස මිය ගිය අර අසරණ කිරි සප්පයා ඇතුළු වටිනා ජීවිත තුනට වග කියන්නේ කවුරුන්දැයි යන්න පිළිබඳවය. අනෙක් අතට ඔවුන් තිදෙනාට සිදුවූ යළි පියවාගත නොහැකි අසාධාරණය රුපියල් සත වලින් තක්සේරු කිරීමට ද නොපුළුවන. මන්ද කිසිදු හඬක් නොනගා තත්පර කීපයක් ඇතුළත මරු තුරුලට ගිය ඒ අසරණයන්ගේ ජීවිත ඔවුන්ගේ පවුල් වල සාමාජිකයන්ට මහමෙරටත් වඩා වටින බැවිනි.

මීට පෙර ද මෙවැනිම සිදුවීම් දෙකක් වැල්ලවත්ත සහ ග්‍රෑන්ඩ්පාස් ප්‍රදේශවලින් අසන්නට ලැබුණු බව ද අපට මතකය. එහිදී ද ජීවිත හානි කීපයක්ම සිදුවී තිබුණේය. මේ එම සිදුවීම් මාලාවේ තුන්වැන්නය. එම තුන්වැනි සිද්ධිය මුලින් සඳහන් කළ සිදුවීම් දෙකටම වඩා බරපතළ සහ හද කම්පා කරවන ප්‍රතිඵල ජනිත කළේය.

කෙසේ වෙතත් අපට පෙනෙන අන්දමට ඉහත සඳහන් සිදුවීම් තුනටම අදාළ හේතු සාධක කීපයක්ම තිබිය හැකිය. ඒ අතරින් එක් හේතුවක් වන්නේ මෙලෙස සවි ශක්තියෙන් අඩු සුවිසල් ගොඩනැගිලි අදාළ ස්ථානයන්හී ඉදිකිරීම සඳහා අනුමැතිය ලබාදී ඇත්තේ කවුරුන් දැයි යන්න පිළිබඳවය. ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය ඒ අතරින් එක් වග උත්තරකාර ආයතනයකි. එසේම එම කඩා වැටුණු ගොඩනැගිලි පිහිටි පළාත් පාලන ආයතනය ඊළඟ වගඋත්තරකරුවා විය යුතුය. එහි තුන්වැනි වග උත්තරකරුවා ලෙස අදාළ ගොඩනැගිලි වල හිමිකරුවන්ට චෝදනා නැගීම ද නොවැළැක්විය හැකිය. මන්ද සුවිසල් ගොඩනැගිලි ඉදිකිරීමේ දී අවශ්‍ය කරන වීරිරේඛා සහතිකය, ගොඩනැගිල්ලට අදාළ ඉඩමේ දල සැලැස්ම පමණක් නොව ස්ථානීය භූ විෂමතාව ගැන ද ප්‍රදේශය අයත් පළාත් පාලන ආයතනයෙන් අනුමැතිය ලබා ගත යුතුව තිබෙන බැවිනි. එක්කෝ එම සහතික පත් අත යට ගනුදෙනුවක් දී ලබාගත් ඒවා විය හැකිය. එසේත් නැත්නම් වැරදි තොරතුරු සඳහන් කර ලබාගත් ව්‍යාජ සහතික විය හැකිය. එසේත් නැතිනම් ගොඩනැගිල්ලේ මුල් අදියරට නියමිත පරිදි අදාළ පළාත් පාලන ආයතනයෙන් අනුමැතිය ලබාගෙන පසුව ක්‍රමයෙන් එම ඉදිරි වැඩ කොටස් සපුරා ගත්තා විය හැකිය.

කෙසේ වෙතත් වැරැද්ද කවුරුන් විසින් සිදුකළ ද එය වැරැද්දමය. අදාළ පුද්ගලයන් විසින් දැන හෝ නොදැන සිදු කර ඇති එම බරපතළ වැරැද්ද නිසා තම ජීවිතවලින් වන්දි ගෙවීමට සිදුවී ඇත්තේ අර කිරි සප්පයා ඇතුළු අහිංසකයන් තුන්දෙනාටය. ඒ තරුණ මා පිය දෙපළගේ සිත් තුළ තමන්ගේ වටිනාතම වස්තුව වූ දූ සිඟිත්තිය පිළිබඳ දහසක් බලාපොරොත්තු තිබෙන්නට ඇතුවාට සැක නැත. එහෙත් ඔවුන්ගේ එම සියලුම අනාගත සිහින එක් තත්පරයක් ඇතුළත සුනුවිසුනු වී ගොස් තිබෙන්නේ ඒ කිසිවකු හෝ නොසිතූ අයුරිනි. එහෙත් මුදල් පසුපස හඹායන ආත්මාර්ථකාමී නිවෙස් හිමියා ඒ ගැන නිහඬය.

මේ අතර මාධ්‍ය වාර්තා මගින් හෙළිවූයේ නිවසේ හිමිකරුවන් තම නිවස කඩා වැටීමට යන බව දැනගෙන සිද්ධියට විනාඩි කිහිපයකට පෙර පවුල පිටින්ම එම ස්ථානයෙන් පිටව ගොස් තිබෙන බවය. ඔවුන් එලෙස නිවසින් පිටව යන මොහොතේ අඩුම වශයෙන් කෑ කෝ ගසා අවට නිවෙස්වල අයට ඒ බව දැනුම් දුන්නා නම් මෙවැනි ජීවිත හානියක් සිදු නොවන්නට ඉඩ තිබුණේය.

මේ අතර මහනුවර දිස්ත්‍රික්කයටම අයත් හෙම්මාතගම ප්‍රදේශයේ පිහිටි තවත් මහල් ගොඩනැගිල්ලක බිත්ති පුපුරා ගොස් කඩා වැටීමේ අවදානමක පවතින බවක් ද ඉකුත් දා ජනමාධ්‍යයෙන් හෙළිකර තිබුණේය. එම මාධ්‍ය වාර්තා වැඩිදුරටත් සඳහන් කර තිබුණේ අදාළ ගොඩනැගිල්ල අසලම පාසලකට ඇතුළු වන දොරටුවක් ද පවතින බවයි. එය සැබෑ නම් එම තත්ත්වය එකී පාසල් සිසු සිසුවියන්ගේ ජීවිත වලට ද බලවත් තර්ජනයකි. එහෙයින් අදාළ බලධාරීන් තවදුරටත් නිදිකිරමින් නොසිට වහාම එම ප්‍රශ්නයට මැදිහත් වී සුදුසු පියවරක් ගත යුතුය. එසේ නොමැති වුවහොත් බූවැලිකඩ සිද්ධියටත් වඩා බරපතළ ඛේදවාචකයක් සිදු වීමට ඉඩ තිබේ.

එසේම දිසාව භාර ආණ්ඩුකාරවරුන් පත් කර ඇත්තේ කාර්යාල තුළට වී පුටු රත්කරමින් මාධ්‍ය සාකච්ඡා පැවැත්වීමට නොවේ. තම බල ප්‍රදේශයේ වෙසෙන ජනතාවගේ ජීවිත ආරක්ෂා කිරීම ආණ්ඩුකාරවරුන් සතු වගකීමකි. ඔවුන්ගේ එම වගකීම දෙගුණ වී ඇත්තේ මේ වන විට මධ්‍යම පළාත් සභාව විසුරුවා හැර තිබෙන තත්ත්වයක් තුළ ප්‍රධාන අමාත්‍ය ධූරය හිස්ව පවතින බැවිනි.

එහෙයින් ජනාධිපතිවරයාගේ නියෝජිතයා වශයෙන් සිටින මධ්‍යම පළාත භාර ආණ්ඩුකාරතුමාගේ පූර්ණ අවධානය මෙවැනි සිදුවීම් කෙරෙහි යොමුවිය යුතුය. අනෙක් අතට යමක් සිදුවූ විට ඒ පිළිබඳ වගකීම අනුන් පිට පවරමින් බෝල උඩ දැමීම අදාළ බලධාරීන්ගේ කර්තව්‍යය නොවිය යුතුය. එලෙස එකිනෙකට බෝලය පාස් කිරීමෙන් සිදුවන්නේ තවත් මහා ඛේදවාචකයකට මං සැලසීමය. තවදුරටත් මෙවැනි දෑ සිදුනොවීම සඳහා නීතියේ ඇති සිදුරු වසා දැමීම ද බලධාරීන්ගේ අවධානය යොමුවීම අත්‍යවශ්‍ය වේ.

# රටම හඬවා ගොඩනැගිල්ලකට බිලි වූ

# නුවර දරු පවුල

● අසේල කුරුළුවංශ

**දහසක් පැතුම් පොදි බැඳ විවාහ දිවියට එළැඹි චමිල හා අචලාගේ එකම අපේක්ෂාව වූයේ ඉක්මනින්ම තෙවැන්නෙකු පවුල වෙත එක්කර ගැනීමය. ආදරය දෝරේ ගලමින් පැවැති එම යුවළගේ අපේක්ෂාවන් ඉටු වන්නට වැඩි කාලයක් නොගියේය. අඟහිඟකම් ගේ මානයට හෝ ගෙන්වා නොගැනීමට තරම් ආර්ථික ශක්තියක් ව්‍යාපාරිකයකු ලෙස ගොඩනගාගෙන සිටි චමිල නීතිඥවරියක් වූ අචලා රැකියාවක නිරත වනවාටද අකමැති වූයේ ඇගේ ආදරය හා දැවටෙමින් සෑම මොහොතකම ඇය හා කල් ගෙවන්නට ලොබ බැඳි නිසාය. චමිල හා අචලා ගොඩනැගූ ආදර මන්දිරය සුන්දර කරන්නට එන දූ සිඟිත්ත පිළිගන්නට දෙදෙනාම බලා සිටියේ ඇඟිලි ගනිමින්ය. කුසට සත්මසක් වෙත්දී ජායාරූප ටිකක් ගන්නට දෙදෙනාම කල්පනා කළහ. මංගල ජායාරූප ගත් තම හිතවතාටම කතා කළ චමිල මහනුවර සුන්දර ස්ථාන කිහිපයකට ගොස් ජායාරූප පෙළක් ගත්තේ උපදින්නට සිටින දූ සිඟිත්තට කවදා හෝ ඒවා පෙන්වන්නට ඕනෑ යැයි කියමිනි.....**





චමිල සහ අචලා යුවළ සිඟිති දියණිය ඔනෙලා සමඟ

දැන් සියල්ල අවසානය. චමිල, අචලා හා ඔවුන්ගේ දියණිය ඔනෙලාගේ දිවි ගමන නතර වී ඇත.ඒ කිසිවෙකුත් අපේක්ෂා නොකළ මොහොතකය.මහනුවරට මහ වැසි ඇද වැටුණු පසුගිය 19 වැනි රාත්‍රියේ චමිල හා අචලා නින්දට ගියේ තමන්ගේ නිදන කාමරයට ඉහළින් තිබූ බූවැලිකඩ සංඝමිත්තා මාවතේ පිහිටි පස් මහල් ප්‍රාසාදය හිස මතට කඩා වැටේ යැයි සිහිනයකුදු නොසිතාය .කඩා වැටුණු ගොඩනැගිල්ලේ කැබලි වලට යටවී චමිල,අචලා කැඳල්ල කුලුඳුලේ උපන් දියණියද සමඟ සුනු විසුනු වී ගියේ මොහොතකිනි. චමිල ප්‍රසාද් උපන්නේ 1985 වසරේය. 1987 ජූලි 31 දින අචලා ඒකනායක උපන්නාය.ඔවුන්ගේ කැදැල්ලට එක්වූ ඔනෙලා උපන්නේ මෙම වසරේ අගෝස්තු මස 01 දාය. ඔවුන් සියලු දෙනාගේ ජීවන ගමන නතර වූයේ පසුගිය 20 වැනි දින අලුයම එකම මොහොතකය. ඒ වනවිට ඔනෙලා මෙලොව එළිය දැක ගතකර තිබුණේ හරියටම දින 49 කි.

"චමිල හා අචලා ආදර සම්බන්ධයකින් විවාහ වුණේ. පහුගිය අවුරුද්දේ නොවැම්බර් මාසේ තමයි ඒ දෙන්නගේ වෙඩින් එක තිබ්බේ. මම තමයි එයාලගේ වෙඩින් එකේ ෆොටෝ ගත්තේ. එයාලගේ දුව ඇත්තට ම හනිමූන් බේබි කෙනෙක්. චමිල අම්පාරේ උපන් කෙනෙක්. අචලා බණ්ඩාරවෙල. චමිල හොඳ ව්‍යාපාරිකයෙක්. කඩා වැටුණු ගොඩනැගිල්ලට පහළින් එයා හෝටලයක් පවත්වාගෙන ගියා. විවාහයෙන් පස්සේ එයාලා පදිංචිව සිටියෙත් හෝටලයේම ඉහළ මහලේ කාමරයක. දුව ලැබෙන්න ඉද්දී දෙන්නා ෆොටෝ ෂූට් එකක් කළා. ඒකේ ඡායාරූප ගත්තෙත් මමයි. දරුවා උපන්නට පස්සේ දෙන්නගෙම ලෝකය වුණේ ඔනෙලා. මේ සුන්දර ලෝකය අද සුනුවිසුනු වෙලා. මහා විනාශයක් කරපු අය අද නිදැල්ලේ. නීතිය හරියට ක්‍රියාත්මක වෙනවද කියන සැකය අපිට තියෙනවා. මෙච්චර ලොකු ගොඩනැගිල්ලක් කඩා වැටුණම ඒකේ මොනතරම් බඩු තියෙන්න ඕනද? මෙයලා සිද්ධිය කලින් දැනගෙන ගෙදර තියෙන බඩු අරන් ගිහින් කියන සැකය අපිට තියෙනවා.ගොඩනැගිල්ල කඩා වැටෙන්න මොහොතකට කලින් ඉවත් වුණා කියන එක රංගනයක්. සී. සී. ටී. වී දර්ශන කිසිවක් එළියට එන්නේ නැහැ. නගර සභාව,පොලීසිය සිද්ධිය යට ගහනවා කියන එක තමයි අපේ හැඟීම. මේක අනවසර ඉදිකිරීමක්ද නැද්ද කියලා කියන්න නගර සභාවට සිද්ධිය වෙලා දින හයක් යනතුරුත් බැරිවෙලා." මියගිය චමිලගේ මිතුරෙකු වන ධනුෂ්ක අරවින්ද පැවසුවේය.

පස් මහල් ගොඩනැගිල්ල කඩා වැටෙත්දී චමිල හා අචලා දරුවා සමඟ නිදාසිටි කාමරයට යාබද කාමරයේ සිටියේ අචලාගේ මව වන ජයන්ති ඒකනායක (60) මහත්මියයි. ඇය එහි සිට ඇත්තේ ඥාති දියණියක ද සමඟනි. තම දියණියත්, බෑනාත් දරුවාත් නිදා සිටි යාබද කාමරය කොන්ක්‍රීට් තට්ටු කඩාවැටී කුඩු පට්ටම් වී යත්දී ඔවුන්ගේ ජීවිත බේරී තිබුණේ අනූනවයෙනි. එදින සිද්ධිය ජයන්ති මෙසේ විස්තර කළාය." දරුවා ලැබෙන්න ඉද්දී මම දුවට අපේ ගෙදර එන්න කිව්වා. මහත්තයා බිස්නස් කරන නිසා දෙන්නටම එන්න බැරි නිසා දුවත් එන්න බෑ කිව්වා. ඒ නිසා මම උදව්වට මෙයාලා ළඟට ආවා. එදා දවසම වැස්සා.දුවයි පුතයි දරුවයි නිදා ගන්න කාමරේ තියෙන්නේ අපේ කාමරේට අල්ලලා. පුංචි දරුවා රෑට හඩිස්සියේ හරි ඇඬුවොත් මට ඇහෙනවා. එතකොට මම දුවලා ඒ කාමරේට යනවා. එදා උදේ පාන්දර ලොකු ශබ්දයක් එක්ක පොළව දෙදරලා වගේ ගියා. ඇඟට මොකක්දෝ කඩාගෙන වැටුණා වගේ දැනුණා. මගේ ඇඳට උඩින් ගොඩනැගිලි කොටස් මූණ ළඟටම ඇවිත් තිබුණා. මොනවා වෙලාද කියලා හිතාගන්න බැරිවුණා. අවට අතගානකොට ෆෝන් එක අහුවුණා. මම 119 අංකයට කෝල් කරලා කරදරයක් කියලා කිව්වා. ටික වෙලාවකින් පොලීසිය ආවා. හමුදාවේ කට්ටියත් ආවා. ගිනි නිවන එකේ අයත් ආවා. ඒ අය ලණු දාලා මාවයි කාමරේ හිටිය අනිත් දුවයි උඩට ගත්තා. මගේ දරුවෝ හිටපු කාමරේ ඔක්කොම යටවෙලා තිබුණේ. මම හිතුවා ඇතුළේ ඒ අය හිරවෙලා ඇති ඉක්මනට ගත්තොත් ජීවිත බේරගන්න පුළුවන් වෙයි කියලා. ඒත් එයලා අපිව දාලා ගියා."

සිද්ධිය සැලවීමත් සමඟ මහනුවර පොලීසිය, යුද හමුදාව, නාගරික ගිනි නිවීම් ඒකකය හා ශ්‍රී දළදා මාළිගාවට අනුයුක්ත ගුවන් හමුදා ගිනි නිවීම් ඒකකයේ නිලධාරීන් ක්ෂණිකව එම ස්ථානයට ළඟාවී තිබිණි. කඩා වැටුණු ගොඩනැගිල්ලේ සුන්බුන් ඉවත්කර යටවී සිටින අය බේරා ගැනීම අති දුෂ්කර කාර්යයක් විය. සුන්බුන් අතර සිරවී සිටි බිළිඳියගේ සිරුර සිද්ධියෙන් පැය තුනකට පසු සුන්බුන් අතරින් පිටතට ගැනීමට හැකිවිය. එකම මොහොතක එකම ස්ථානයකදී අවසන් සුසුම් හෙළූ චමිල හා අචලාගේ නිසල සිරුරු කොන්ක්‍රීට් කණු හා බිත්ති අතරින් මතුකර ගැනීමට පැය නවයක පමණ මෙහෙයුමක් දියත් කිරීමට නිලධාරීන්ට සිදු විය.

මෙම ගොඩනැගිල්ල කඩා වැටීමත් සමඟ එහි ප්‍රමිතිය සම්බන්ධව දැඩි කතාබහක් ඇතිවිය.සැලසුමට පිටින් ගොස් එයට අමතර තට්ටුවක් එක්කර තිබෙන බව මධ්‍යම පළාත් ආණ්ඩුකාර කාර්යාලයේ පැවැති රැස්වීමකදී අනාවරණය කළේ මහනුවර නගර සභාවේ ප්‍රධාන ඉංජිනේරු පාලිත අබේකෝන් ය.

ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ මහනුවර දිස්ත්‍රික් භාර භූ විද්‍යාඥ සමන්ත කුමාර බෝගහපිටිය මේ සම්බන්ධව අදහස් දක්වමින් මෙසේ පැවසුවේය. "මේ ගොඩනැගිල්ල හදලා තියෙන්නේ නිම්නාකාර තැනක. ජල පහරක් ගොඩනැගිල්ලට පහළින් ගමන්ගෙන තිබෙනවා. මේ නිසා එහි පාදම හැරීමකට ලක්ව තිබෙනවා. භූමියේ ස්වභාවයට හා තත්ත්වයට ගැළපෙන ලෙස ඉදි කිරීම් සිදුකර නැති බව පැහැදිලිව පේන්න තිබෙනවා. එහි බර රඳවා තබා ගැනීමට කොන්ක්‍රීට් බීම් හා කොලම් වලට හැකියාවක් නොතිබූ නිසා ගොඩනැගිල්ල කඩා වැටී තිබෙනවා. මේක ස්වභාවික නාය යෑමක් නිසා සිදුවූවක් නොවෙයි. ඉදිකිරීමේ ප්‍රමිතියේ ගැටලුවක් නිසා ඇතිවූවක් බව කියන්න පැහැදිලි සාක්ෂි තිබෙනවා. ගොඩනැගිල්ල කඩා වැටීමට පෙර පූර්ව ලක්ෂණ මතුවෙන්න ඇති. ඒත් මෙවැනි ස්වභාවයේ ගිලා බැසීමකදී ක්ෂණිකව තමයි ලක්ෂණ මතුවන්නේ. මේ සිදුවීමත් එක්ක මේ භූමියේ යම් අස්ථාවර භාවයක් ඇති වෙනවා. ගිලා බැසීම සිදුවූ ගොඩනැගිල්ලට යාබද තවත් ගොඩනැගිලි හතරක් අවදානම් ලෙස අපි හඳුනා ගත්තා. ඔවුන් නිවාසවලින් ඉවත් කිරීමට පියවර ගෙන තිබෙනවා."



මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලලිත් යූ. ගමගේ



නියෝජ්‍ය පළාත් අධ්‍යක්ෂ ඩබ්ලිව්.එම්.ඒ වික්‍රමසිංහ



මහාචාර්ය අතුල සේනාරත්න



මහනුවර නාගරික කොමසාරිස් චන්දන තෙන්නකෝන්



ගොඩනැගිල්ල හිමිකරු ලෙව්කේ



භූ විද්‍යාඥ සමන්ත කුමාර බෝගහපිටිය

### මහනුවර අවදානම් ගොඩනැගිලි පිළිබඳව වාර්තාවක් ලබා ගැනීමට මධ්‍යම පළාත් ආණ්ඩුකාර නීතිඥ ලලිත් යූ ගමගේ දස පුද්ගල කමිටුවක් පත් කරයි

අවදානම් ස්ථානයක ප්‍රමිතියෙන් තොර ඉදි කිරීමක් කරන තෙක් මහනුවර මහ නගර සභාව උඩබලාගෙන සිටියේද යන්න සම්බන්ධව ජනතාව වෙතින් චෝදනා එල්ල වෙමින් තිබේ. මේ පිළිබඳ අප කළ කරුණු විමසීමකදී මහනුවර නාගරික කොමසාරිස් චන්දන තෙන්නකෝන් දැක්වූ අදහස් මෙසේය." කඩා වැටුණු පස්මහල් ගොඩනැගිල්ල මහනුවර මහ නගර සභාව මගින් අනුමත කළ සැලසුමට අනුව ඉදිකර තිබෙන්නේ ද යන්න සම්බන්ධව සොයා බැලීමට පරීක්ෂණයක් ආරම්භ කර තිබෙනවා. නගර සභාවේ නියෝජ්‍ය කොමසාරිස්, ඉංජිනේරු අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, ගොඩනැගිලි පර්යේෂණ ආයතනය ඒකාබද්ධව මෙම පරීක්ෂණය සිදුකර වාර්තාවක් සකස් කිරීමට නියමිතයි. මෙම ගොඩනැගිල්ලේ ඉදි කිරීම් 2007 වසරේ ආරම්භ කර තිබෙනවා. ගොඩනැගිල්ලට යටවීම නිසා නිවැසියන් සතුව අනුමත කළ සැලසුම් මේවන විට නැහැ. නගර සභාවේ ඇති එම සැලසුම් අපි පරීක්ෂා කරනවා.

මුලින් අනුමත කළ තට්ටු ප්‍රමාණයට පසුව තට්ටු කිහිපයක් මේ අය එකතු කරලා තියෙනවා. ඒ සඳහා 2015 දී පමණ අපිට අලුත් සැලසුමක් ඉදිරිපත් කරලා තියෙනවා. 2011 වසරේදී මේ මුළු ප්‍රදේශයම නාය යෑමට හැකි ප්‍රදේශයක් ලෙසට හඳුනා ගත්තා. 2011 වසරෙන් පසු ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නිර්දේශ නොමැතිව ගොඩනැගිලි ඉදිකරන්න අපි ඉඩ දෙන්නේ නැහැ. නගර සභාව අනුමත කරන සැලසුමට පිටින් ගිහින් ඇතැම් අය ඉදි කිරීම් කරනවා. මේවා සියල්ල සොයා බලන්න අපිට ප්‍රමාණවත් සේවකයින් නොමැති ගැටලුව තිබෙනවා. මම හිතන්නේ නගර සීමාවේ ඉදිකිරීම්වලට අදාළ නීති රෙගුලාසි යම් වෙනස්වීම් වලට ලක්විය යුතු බවයි.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ භූ විද්‍යා අංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය අතුල සේනාරත්න සිද්ධිය වූ ස්ථානය නිරීක්ෂණය කිරීමට ගියේය. ඉන් අනතුරුව මහාචාර්යවරයා දැක්වූයේ මෙවන් අදහසකි.

‘මහනුවර බෑවුම් සහිත ස්ථාන විශාල ප්‍රමාණයක් තිබෙනවා. මේවාහි ගොඩනැගිලි රැසක් ඉදිකර තිබෙන බව පේන්වා.මේ කඩා වැටුණු ගොඩනැගිල්ල එවැනි අවදානම් සහිත ස්ථානයක තිබෙන එක් ගොඩනැගිල්ලක් විතරයි. මේ වගේ ඒවා තව ගොඩක් තියෙනවා. මේ ගොඩනැගිල්ල පිහිටලා තිබෙන්නේ බූවැලිකඩ. මෙහි පොළොවේ තියෙන්නේ බූවැල්ල. මේක හදලා තියෙන්නේ ඒ බූවැල්ල මතයි. පොළව යට පාෂාණය තෙක් හාරලා ගොඩනැගිල්ලේ පාදම කම්බි වලින් ඇමිණුවා නම් මේ වගේ ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. අවුරුදු 10 කට කලින් මහනුවර සිදුකර තිබෙන ඉදි කිරීම්වලට ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නිර්දේශය අරගෙන නැහැ."

සිද්ධිය කල්තියා දැන කිසිවකුට හෝ නොදන්වා නිවසේ ඇති කළ බල්ලන් පවා රැගෙන පලා ගිය බවට නිවසේ හිමිකරු වන හිටපු බස්නායක නිලමේවරයකු වන අනුර ලෙව්කේට චෝදනා එල්ල වෙමින් තිබේ. නිවෙස කඩා වැටීමෙන් පසු අසල්වැසි හිතවතකුගේ නිවසේ තාවකාලිකව දරු දෙදෙනා හා බිරිඳ සමඟ ඔහු නවාතැන් ගෙන සිටියේය. තමන් මුහුණ දුන් අත්දැකීම වචනවලට ඔහු මෙසේ පෙරළුවේය. "මගේ දුව මේ පාර උසස් පෙළ විභාගය ලියනවා. ඒ නිසා එයා රෑ වෙනකල් පාඩම් කරනවා. අපිත් ගොඩක් වෙලාවට දුව නිදාගන්නකල් ඇහැරලා ඉන්නේ. එදා අපි ටීවී බලලා නිදාගන්න ගියා. එතකොට වෙලාව පාන්දර 1.30 ට විතර ඇති. පාන්දර එකපාරට ලොකු සද්දයක් ආවා. කොහෙන්ද කියලා හිතාගන්න බැරිවුණා. ඒ වෙද්දීම දකුණු අත පැත්තේ ගෙදර සමරසිංහ මහත්තයයි නෝනයි ටෝච් ගහලා අපට කතාකරලා කිව්වා පහළ කොන්ක්‍රීට් කණු කැඩෙනවා ඉක්මනට පැනගන්න කියලා. ඒත් එක්කම කාමරේ පොළොව ඇද වෙනවා වගේ දැනුණා. ටයිල් කැඩී කැඩී ඉස්සුණා. පුතා එතකොටම කෑ ගැහුවා, අප්පච්චි එළියට එන්න කියලා. මම ෂර්ට් එකක් හොයලා ඇඳ ගන්න ගමන් ගෙයින් එළියට පැන ගත්තා. මම දුවගෙන යද්දි නෝනයි දුවයි පුතායි පාරේ. අපි වාහනෙන් යනකොටම වගේ ගේ කඩාගෙන ගියා. මේක මම පදිංචි වෙලා ඉන්න ගෙදර. නිසි ප්‍රමිතියට හදලා තියෙන්නේ. අපි මේක කල්තියා දැනගෙන කාටවත් නොදන්වා පැනගත්තා කියලා අභූත චෝදනා කරනවා. බල්ලො අරන් ආවා කියනවා. බල්ලො දෙන්නා හොයලා ගෙනත් දුන්නේ හමුදාවෙන්. ඒවා අමූලික බොරු. මේක අනුමත සැලසුමකට හදපු එකක්."

### මිය ගිය බිළිඳියට හරියටම දින 49 යි

### සිරවී සිටි බිළිඳියගේ සිරුර පිටතට ගත්තේ පැය තුනකට පසු

මහනුවර අවදානම් ස්ථානවල ඇති ගොඩනැගිලි පිළිබඳව සොයා බලා වහාම වාර්තාවක් ලබාදෙන ලෙස දැනුම් දෙමින් මධ්‍යම පළාත් ආණ්ඩුකාර නීතිඥ ලලිත් යූ ගමගේ දස පුද්ගල කමිටුවක් පත්කර තිබේ. "මේක ඉතාම අවාසනාවන්ත තත්ත්වයක්. මේ ගොඩනැගිල්ල අනවසර ඉදිකිරිමක්ද නැත්නම් සැලසුමට පිටින් ගොස් ඉදිකරන ලද්දක්ද කියලා සොයා බලනවා. කොහොම වුණත් මහනුවර නගර සීමාවේ මේ වගේ අවදානම් ස්ථානවල නිසි ප්‍රමිතියට හදපු නැති ගොඩනැගිලි රැසක් තිබෙනවා. නගරයේ ඉඳලා හන්තාන ප්‍රදේශය බැලුවොත් පේනවා කන්ද මුදුනට යනකල් හදලා තියෙන ගොඩනැගිලි. සමහර ඒවා ඇත්තටම තියෙන්නේ එල්ලිලා වගේ. එක් අයෙක් වැරැද්දක් කළොත් ඒකට වන්දි ගෙවන්න වෙන්නේ තවත් පිරිසකටයි. මේ අවදානම් සහිත ස්ථානවල ගොඩනැගිලි හදන්න අනුමැතීන් ගණනාවක් අවශ්‍යයි. සමහර තැන්වල හදලා තියෙන ගොඩනැගිලි දැක්කම කොහොමද මේ ස්ථාන වල ගොඩනැගිලි හදන්න අනුමැතිය දුන්නේ කියලා හිතා ගන්න බැහැ.ඒත් මේවා කඩා ඉවත් කරන්න තාමත් හැකියාවක් ලැබී නැහැ. මේ සම්බන්ධයෙන් ඉදිරියේදී දැඩිව නීතිය ක්‍රියාත්මක කරනවා. මොකක් හරි ඛේදවාචකයක් වුණාට පස්සේ ටික කාලයකට නීති තදින් ක්‍රියාත්මක කරලා ඊට පස්සේ සියල්ල අමතක කරලා වැඩකරන්න තමයි අපි පුරුදු වෙලා ඉන්නේ. මේකට නැවතීමේ තිත තබන්න ඕනෑ. "

මෙම සිදුවීම සම්බන්ධයෙන් මහනුවර පොලීසිය විශේෂ පරීක්ෂණයක් ආරම්භ කර තිබේ. ගොඩනැගිල්ලේ හිමිකරු අදාළ ඉදිකිරීම්වලට අවශ්‍යය අනුමැතීන් ලබාගෙන තිබෙන්නේද සැලසුම් වලට පිටින් ඉදි කිරීම් සිදුකර තිබෙන්නේද යන්න පිළිබඳව පරීක්ෂණ පවත්වන මහනුවර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී සුදත් මාසිංහ පවසයි. මෙම කරුණු තහවුරු කරගැනීමෙන් පසු හිමිකරු නීතියට පිටින් කටයුතු කර තිබෙන බව අනාවරණය වුවහොත් ඔහුට එරෙහිව අපරාධ නීතිය යටතේ අධිකරණයේ නඩු පවරන බව ද ඔහු කීය.

"අවදානම් මට්ටමක තිබෙන ගොඩනැගිල්ලක් ස්ථාවර කරන්න ක්‍රම තියෙනවා. යම් කෙනෙකුට තමන්ගේ ගොඩනැගිල්ල සම්බන්ධව ප්‍රශ්නයක් තියෙනවා නම් ඉදිකිරීම් ඉංජිනේරුවරයකු හමුවී අදහස් ලබාගත හැකියි.අපි මුලින්ම සැලසුම් කරලා ස්ථාවර ලෙස ගොඩනැගිල්ලක් හදනවා වගේ නෙවෙයි අස්ථාවර ගොඩනැගිල්ලක් යළි ස්ථාවර කිරීම. ඒකට ලොකු මුදලක් වැයවෙනවා." මධ්‍යම පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තුමේන්තුවේ නියෝජ්‍ය පළාත් අධ්‍යක්ෂ (සැලසුම්) ඩබ්ලිව්.එම්.ඒ වික්‍රමසිංහ පවසයි.

ඡායාරූප - රුවන් මීගම්මන සහ ධනුෂ්ක අරවින්ද





# ප්‍රී ෂූට් විකාරේ අලුත්ම නාඩගම

## හක්මන මෙතෝදිස්ත පාසලේ රඟ දැක්වූ ගුරු නාටකය




● ලලිත් චාමින්ද

**ප්‍රී ෂූට් යනු වර්තමානයේ විටින් විට කරළියට එන ජනප්‍රිය මාතෘකාවක් බවට පත්වෙමින් තිබේ. මංගල උත්සවය වෙනුවෙන් අවදානම් ස්ථානවල ප්‍රී ෂූට් හෙවත් පූර්ව ඡායාරූපගත කිරීම් සිදු කරමින් සිටියදී අවාසනාවන්ත ලෙස අවසන් ගමන් ගිය සහ අනතුරට ලක්වූ පෙම්වතුන් ගැන පසුගිය දිනවල අසන්නට ලැබිණ. ප්‍රී ෂූට් ගැන එවැනි බේදනීය කතා අතරට පසුගියදා එක් වූයේ තවත් අමුතු කතාවකි.**

ඒ අමුතු ප්‍රී ෂූට් එක සිදු කර තිබුණේ මාතර හක්මන පිහිටි ප්‍රසිද්ධ පාසලක් වන මෙතෝදිස්ත පාසල් භූමියේ ය. එම රඟදැක්මේ නළු නිළියන් වී ඇත්තේ යොවුන් ගුරු යුවළකි. ගුරුවරයා පාසලට අනුයුක්ත ගුරුවරයකු ලෙස සේවය කරන අතර ගුරුවරිය එම පාසලේ සීමාවාසිකව සේවය කළ ගුරුවරියකි. පාසල් භූමියේ ක්‍රීඩා පිටිය ඇතුළු විවිධ ස්ථානවල රූගත කර තිබූ ඔවුන්ගේ ප්‍රී ෂූට් ඡායාරූප පිළිබඳ කතාව රටට හෙළි වූයේ පසුගිය 22 වැනිදා පැවති ඔවුන්ගේ විවාහ උත්සවයෙන් අනතුරුව ය. ඒ, විවාහ උත්සවයට පසුදින ඔවුන්ගේ ඡායාරූප ශිල්පියා විසින් එම ප්‍රී ෂූට් ඡායාරූප ෆේස්බුක් සමාජ ජාලයට එක්කිරීමත් සමඟ ය. එම යොවුන් ගුරු යුවළ ක්‍රීඩා ඇඳුම්වලින් සැරසී කෙළිලොල් ආකාරයෙන් පාසලේ ක්‍රීඩා පිටිය තුළ ක්‍රීඩා කරමින් සිටි ඡායාරූප සමඟ ඔවුන් දෙදෙනාගේ තවත් ඡායාරූප රැසක් ද එම ඡායාරූප අතර විය. ගුරු යුවළ විසින් පාසල් භූමියේ රූගත කර තිබූ ඡායාරූප පෙළ ඇස ගැටීමත් සමඟ හක්මන මෙතෝදිස්ත පාසලට සම්බන්ධ ගුරුදෙගුරුන්ගෙන් ඒ පිළිබඳ දැඩි විරෝධයක් නැඟෙන්නට විය. එම ගුරුවරුන් දෙදෙනාම පාසලේ දරුවන් විසින් ඉතා හොඳින් හඳුනන බැවින් ඔවුහු එවැනි ක්‍රියාවක් සිදු කිරීම අනුචිත බව බොහෝ දෙනාගේ අදහස විය.

පාසලේ ආදි ශිෂ්‍ය සංගමයේ සභාපති ප්‍රසන්න කොඩිකාර පැවසුවේ මෙම සිදුවීම සම්බන්ධයෙන් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා හා දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය දැනුවත් කිරීමට කටයුතු කළ බවයි. ඒ පිළිබඳ වැඩිදුරටත් අදහස් දක්වමින් ඔහු මෙසේද කීවේය.



දකුණු පළාත් ආණ්ඩුකාර ආචාර්ය විලි ගමගේ

"ඔවුන් පාසලේ නිවාඩු දිනයකදී තමයි පාසල තුළ එම ප්‍රී ෂූට් එක කර තිබෙන්නේ. මෙවැනි දෙයක් කිරීමේදී විදුහල්පතිගේ අනුදැනුමක් තිබිය යුතුයි. නමුත් අපට එය අනුමත කරන්නට බැහැ. පාසල කියන්නේ අනාගත පරම්පරාවට හොඳ නරක කියා දෙන ආදර්ශමත් ස්ථානයක්. ඒක නාඩගම් මඩුවක් කරන්න කාටවත් ඉඩ දෙන්න බැහැ. අපි මේ ගැන අධ්‍යාපන බලධාරීන්ට දුරකථනයෙන් පැමිණිලි කළා. ලිඛිතව පැමිණිලි කරන්න බලාපොරොත්තු වෙනවා. විදුහල්පතිනියට අපි මේ ගැන කීවත් ඇය එය ගණන් ගත්තෙ නැහැ. සාමාන්‍ය දෙයක් කියලයි කිව්වෙ."

මේ පිළිබඳ දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වයි. වික්‍රමසිරි දැක්වූයේ මෙවැනි අදහසකි. "මම මේ සිදුවීම කිසි ලෙසකින් අනුමත කරන්නේ නැහැ. ගෙදර කරන වැඩ ෆේස්බුක් එකේ දාලා පහත් තත්ත්වයට වැටෙන්න හොඳ නැහැ. මේ බව දැනුම් දුන් අයට මම කිව්වා ලිඛිතව පැමිණිල්ලක් ඉදිරිපත් කරන්න කියලා. එහෙම ඡායාරූප ගත්තත් දිය ඇල්ලක් ළඟ සිප වැලඳ ගන්න ඡායාරූපත් සමඟ එකට දැමීම කොපමණ හිතන්න ඕනද? දැනට මේ ගැන විභාග කරන්න පැමිණිල්ලක් ලැබිලා නැහැ. මේක සම්පූර්ණ වැරදි ක්‍රියාවක්. "

මුලටියන කලාප අධ්‍යාපන කාර්යාලය හා දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මේ පිළිබඳ වැඩිදුර පරීක්ෂණ පවත්වනු ලබයි. පාසල තුළ මෙවැනි රූගත කිරීමට එම ගුරු යුවළට අවසර දුන්නේද යන්න පිළිබඳ විමසීමට දුරකථන මාර්ගයෙන් විදුහල්පතිනිය හෝ නියෝජ්‍ය විදුහල්පතිනිය ඇමතීමට උත්සාහ කළද එය අසාර්ථක විය.

මේ සිදුවීම සම්බන්ධයෙන් දකුණු පළාත් ආණ්ඩුකාර ආචාර්ය විලි ගමගේ ගෙන්ද අප විමසීමක් කළෙමු. "මේ සිදුවීම පිළිබඳ අපේ දැඩි අවධානය යොමු වෙලා තියෙනවා. ඇත්තටම එක වැරදියි. මෙය බරපතල වරදක් නොවුණත් ගුරුවරුන් විදිහට එවැනි සංස්කෘතියක් ඇති කිරීම වරදක්. ඒ සඳහා පාසල ප්‍රයෝජනයට ගැනීමත් ඉතාමත් වැරදි වැඩක්. මේ පිළිබඳ සමාජ කථිකාවක් නිර්මාණය වෙලා තියෙනවා. මේ ගැන අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම්ද සොයා බලා තියෙනවා. අපි මේ ගැන සොයා බලනවා"

අතීතයේ ගුරු පරපුර සැලකුම් ලැබුවේ දේවත්වයෙනි. අනාගත පරපුරේ නුවණැස පාදන ඔවුහු සමාජයේ පෙරගමන් කරුවෝ වූහ. එවැනි ගුරු පරපුරක් නියෝජනය කරන ගුරුවරු පාසල් භූමියේදීම එවැනි නාඩගම් ප්‍රී ෂූට් එකක නිරත වනු දකින්නට සමාජය කිසිසේත් රිසිවන්නේ නැත. එම ප්‍රී ෂූට් රංගනයේ නිරත ගුරු යුවළ යෞවනයේ පසුවන්නන්ය. එම නිසාම ඔවුන්ට ප්‍රී ෂූට් අකැප නැත. එහෙත් මෙහි වරද ඇත්තේ ඔවුන් ඒ සඳහා ජාතික පාසලක පාසල් භූමිය යොදා ගැනීමය. එබැවින් සුළුතරයකගේ මෙවැනි ක්‍රියාකාකරම් ළප් තැනම ලොප් කර ගුරු වෘත්තියේ ගෞරවය සුරකින්නට බලධාරීන් කටයුතු කරනු ඇතැයි යන්න ගුරුදෙගුරුන්ගේ විශ්වාසයයි.


ආදරෙන් බෙදාගන්න

AIA HEALTHIER, LONGER, BETTER LIVES

හැම අඹ වාරෙකම අපේ ආදරණීයයන් එක්ක අපි අඹ බෙදා ගත්තා මතකද?
දැන් අපිට පුළුවන් ඊටත් වඩා වටිනා දේවල් බෙදාගන්න.



ඔබ මිලදී ගන්නා සෑම රක්ෂණ වරයක් සමඟම ඔබ කැමති කෙනෙකුට තෑගි කළහැකි රු. මිලියන 1 ක් වටිනා වසරක ජීවිත ආවරණයක් ශ්‍රී ලංකාවේ හොඳම ජීවිත රක්ෂණ සමාගම වන AIA ඉන්ෂුවරන්ස් වෙතින්. ජීවිත රක්ෂණයක් සමඟ ලැබෙන සුරක්ෂිතබව සහ සිතේ සැනසුම, ඔබට වටිනාම අයෙකු සමඟ බෙදාගන්න.

කොන්දේසි සහිතයි.
සැප්තැම්බර් 3 වන දා සිට නොවැම්බර් 30 වන දා තෙක් පමණක් වලංගුයි.

වැඩි විස්තර සඳහා 0112310310 අමතන්න

International Business Management
Accounting and Finance
Marketing Management
Events Management
Register now
Next Intake | October 2020
A·P·I·I·T BUSINESS SCHOOL



EARN A BRITISH DEGREE IN BUSINESS

STAFFORDSHIRE UNIVERSITY
AWARDED BY STAFFORDSHIRE UNIVERSITY
A·P·I·I·T

Colombo - 0765 788 788 | Kandy - 0773 577 877
www.apiit.lk | www.facebook.com/APIITofficial
APIIT Colombo Campus, No 388, Union Place, Colombo 2.
APIIT Kandy Campus, No 63, King's Street, Kandy.




වහලේ උළු කැට ඉවත් කර නිරෝෂිකාගේ සිරුරට පෙට්‍රල් දැමූ ස්ථානය පොලිස් නිලධාරීන්ගේ පරීක්ෂාවට ලක්වෙමින්

නිරෝෂිකා නිදා සිටි ඇඳ ගිනිබත්ව තිබූ අයුරු

# ප්‍රේමය, වෛරය සහ මරණය

**අතහැර ගිය පෙම්වතා විසින් අමු අමුවේ ගිනි තබා මැරූ ගැහැනියකගේ අනුවේදනීය කතාව**

● අමිල ජානක මලවිසූරිය

**උදේ හවා බුදු බණ අසන බණ, බණ පමණක් ම වූ රටක අපි දිවිගෙවමින් සිටිමු. රටේ විවිධ පෙදෙස්වලින් වාර්තා වන එකී අහස පොළොව නුහුලන අපරාධවලින් පෙනෙන්නෙ පෙර පිනකට මනුස්ස ආත්මයක් ලබා මෙලොව එළිය දුටුවද තිරිසනුන්ටත් වඩා අන්ත ලෙස මෙලොවදී ඇතැමුන් හැසිරෙන ආකාරයයි.**

මෙකී කතාන්දරයද එවන් අමනුස්ස පාපතරයකු සිදු කළ ශෝචනීය ඛේදවාචකයකි. එම ඛේදනීය කතාන්දරය දිග හැරෙන්නෙ කෑගල්ල, අලපලාවල, වතුර නමැති ග්‍රාමයෙනි. පසුගිය 15 වැනිදා අලුයම එම ප්‍රදේශයේ 20 හැවිරිදි නිරෝෂිකා රාජපක්ෂ නමැති තරුණිය ඇය සමඟ පවුල් කෑ තරුණයකු විසින් ඝාතනය කෙරිණි. ඒ, මෙතෙක් අසන්නට නොලැබුණු ආකාරයේ පාපතර තිරිසන් ක්‍රියාවක් සිදු කරමිනි. මීට වසර පහකට පමණ පෙර නිරෝෂිකා රාජපක්ෂ 15 වැනි වියෙහි පසුවූ රූමත් නව යොවුන් දැරිවියකි. නිරෝෂිකාගේ මාපියෝ ගොවිතැන් බතින් දුවා දරුවන් උස්මහත් කරමින් 'වතුර' ප්‍රදේශයේ ජීවත්වූ දුප්පත් අහිංසක වැසියන්ය. නිරෝෂිකාට බාල සහෝදරයෙක්ද වේ.

2015 වසරේ දිනක් අලපලාවෙල ප්‍රදේශයට යුද හමුදා කණ්ඩායමක් පැමිණියේ නාය යෑමෙන් නිවාස අහිමි වූවන්ට නිවාස සාදා දීමේ ව්‍යාපෘතියකට සහාය දීමටයි. යුද හමුදා සෙබළෙකු වූ හේරත් කුමාර රණසිංහද එම කණ්ඩායම සමඟ අලපලාවෙලට පැමිණියහ.

මාතලේ, පල්ලෙවෙල ප්‍රදේශයේ අයෙක් වන 28 හැවිරිදි කුමාර දිනක් නිවාස සෑදීමේ වැඩ කටයුතු සඳහා යනෙන විට නිරෝෂිකාව දුටුවේ ඇගේ නිවෙස අසලදියි. දිනපතාම පාහේ නිවෙස් සෑදීමේ වැඩට යන කුමාරට නිවෙසේ සිටින නිරෝෂිකා දැකගන්නට හැකි විණි.

මේ අතරේ කුමාරගේ සිතෙහි නිරෝෂිකා පිළිබඳව ආලයක් හට ගැනුණේ ඔහුටත් නොදැනීමයි. දිනක් කුමාර, නිරෝෂිකාට ඒ බව සැල කර සිටියේය. අනතුරුව දෙදෙනාගේ වයස් පරතරය හෝ වෙනත් කිසිදු බාධාවන් ගැන නොසිතා ඔවුහු පෙමින් වෙළුණහ. එහෙත් පාසල් වියේ පසුවූ ළාබාල යුවතියක් හෙයින් එකී සම්බන්ධය පිළිබඳව වැඩිහිටි ආශිර්වාදය ලබා ගැනීම ගැටලුවක් බව දෙදෙනාටම වැටහිණි.



කෑගල්ල පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක එච්.පී.එන්. කුලතුංග

සාජන් ලාල්, කුමාර රාජකාරි කළ යුද හමුදා ඛණ්ඩයේ සිටි අයෙකි. ලාල්ට ද කුමාර විසින් තම ප්‍රේම සම්බන්ධය ගැන සැල කර සිටියේය. කුමාර ලාල්ගෙන් ආයාචනය කළේ මෙකී සබඳතාවට සහාය දෙන ලෙසයි. ඒ අනුව ලාල් දිනක් නිරෝෂිකාගේ මාපියන් මුණ ගැසී දියණියගේ සහ කුමාරගේ සබඳතාව ගැන සියලු තතු පැවැසූහ. එහෙත් ඊට ඇගේ, දෙමාපියන් තරයේ විරුද්ධ වී තිබුණේ දියණිය පාසල් වියේ පසුවන ළාබාල දැරිවියක් වූ හෙයිනි. කෙසේ හෝ කුමන බාධක පැමිණියද කුමාර සහ නිරෝෂිකා ආලයෙන් අන්ධ වී සිටියහ.

"නිරෝ... ඔයා මාත් එක්ක යන්න එනවද?" කුමාර දිනක් එසේ ඇයගෙන් විමසීය. ඊට නිරෝෂිකාද දැක්වූයේ යහපත් ප්‍රතිචාරයකි.

ඒ අනුව නිරෝෂිකාගේ නිවෙසේ කිසිවෙක් නැති වේලාවක් බලා නිවෙසට පැමිණි කුමාර, නිරෝෂිකා රැගෙන ගියාය. ඒ මාතලේ පල්ලෙවෙල පිහිටි කුමාරගේ නිවෙසටයි.

කුමාරද සහෝදර සහෝදරියන් තිදෙනෙක් සිටින පවුලේ වැඩිමලාය. 15 හැවිරිදි බාල වයස්කාර දියණියක් හෙයින් දෙදෙනා හට නීත්‍යානුකූලව විවාහ වීමට හැකියාවක් නොවීය. එහෙත් පවුල් ජීවිතය ගෙන ගියේ මඟුල් ඇඳුමින් සැරසුණු ඡායාරූපද ලබා ගනිමිනි.

එලෙස වසර තුනක් පමණ ගෙවිණි. කුමාරද යුද හමුදාවේ රාජකාරි කරමින් සුපුරුදු පරිදි නිවෙසට ආ ගියේය. ඒ අතරේ කුමාර සහ නිරෝෂිකා අතර නොසිතූ ලෙස විරසකයන්ටද මුල පිරිණි. ඊට හේතු වී තිබුණේ කුමාරගේ ඥාති සහෝදරයකු සමඟ නිරෝෂිකාගේ අනියම් ඇසුරක් පිළිබඳව ඔහුට සැලවීමත් සමඟිනි. කුමාර නිවෙසට පැමිණි වාරයක් පාසාම දෙදෙනා අතර අඬදබර හට ගැනිණි. එහි අවසානයක් සිදුවන්නෙ නිරෝෂිකා කුමාරගේ ඥාතියා සමඟ ඔහු විසූ දඹුල්ලෙ නිවෙසට ගොස් පදිංචි වීමත් සමඟිනි.

තමා පණ මෙන් ආදරය කළ නිරෝෂිකා නොමැතිව ළතැවෙමින් සිටි කුමාර මීට මාස කීපයකට පෙරදී නිරෝෂිකා සොයා දඹුල්ලෙ ඥාති සහෝදරයාගේ නිවෙසටද ගොස් තිබිණි. එහිදී ඇතිවූ අඬදබරයක් කෙළවර වී තිබෙන්නෙ කුමාර විසින් නිරෝෂිකාට පිහියකින්ද ඇනීමෙනි.

ඇය දඹුල්ල රෝහලට ඇතුළුව ප්‍රතිකාර ගනිමින් සිටියාය. ඇයට වූ අකරතැබ්බය ගැන සැලවූ නිරෝෂිකාගේ මාපියන් දඹුල්ල රෝහලින් ඇයව රැගෙන ගොස් තිබුණේ කෑගල්ල අලපලාවෙල නිවෙසටයි. අනතුරුව සුවපත් වූ ඇය සිය මව සමඟ බීඩි එතීමේ කර්මාන්තයේ නිරත වෙමින් නිවෙසට වී කල් ගත කළාය.

ඔය අතර කුමාර යුද හමුදා සේවයෙන්ද පලාවිත් නන්නත්තාරව කාලය ගතකරමින් සිටියේය. කුමන ප්‍රශ්න පැමිණියද කුමාරගේ සිතෙහි නිරෝෂිකා පිළිබඳව වූ ආලය නිසාවෙන්ම ඔහු දිනකට දෙතුන් වරක් දුරකථන ඇමැතුම්ගෙන නිරෝෂිකාට කතා කරන්නට උත්සාහ කෙරිණි. එහෙත් ඒ කිසිවකට ඇය පිළිතුරු නුදුන්නාය. දිනක් කුමාරගේ ඇමැතුමකට පිළිතුරු දුන් ඇයගේ පියා,

"දුව එන්න කැමැති නෑ... කෙල්ලට... ඇගේ පාඩුවේ ඉන්න දීපන්..."

ඊට උරණ වූ කුමාරද 'රතු කට්ට' පනිමින් කියා තිබුණේ,

"ඕකිට කියන්න මාත් එක්ක එන්න කියලා... නැත්නම් මං ඕකිව මරණවා... මරණවාමයි..." කියායි.

තමා කලෙකදී පණ මෙන් ආදරය කළ තැනැත්තියගේ ජීවිතය විනාශ කිරීමට තරම් කුමාරගේ සිත දරදඬු වී තිබුණේ හිත්පිත් නැති එකෙකු විලසිනි. අනතුරුව ඔහු ඒ සඳහා නොයෙක් උපක්‍රම ගැන සිතමින් ළතැවිණි.

ඉවක්-බවක් නොමැතිව නන්නත්තාර වෙමින් සිටි කුමාර පසුගිය 14 වැනිදා උදෑසනින්ම අවදිව මාතලේ සිට කෑගල්ලට ඒමට බස් රථයකට ගොඩවී තිබුණේ නිරෝෂිකාව ඉවරයක් කරන බවට ඉටා ගනිමිනි. ඒ සඳහා ඔහු නිවෙසින් පිටත්ව තිබුණේ පරණ රෙදි කැබලි කීපයක්ද රැගෙන අමුතුම 'ගේම'කට සැරසෙමිනි.

එදින අලුයම කෑගල්ලට පැමිණි කුමාර වෙළෙඳසලකට ගොස් ප්ලාස්ටික් බූලියක්ද ගැනිණි. ඔහු එම බූලියද රැගෙන ගොස් තිබුණේ කෑගල්ල, බුලත්කොහුපිටිය මාර්ගයේ හෙට්ටිමුල්ලෙ, මාකුරේ පිහිටි ඉන්ධන පිරවුම් හලකටයි. ඒ, බූලියට පෙට්‍රල් ලබා ගැනීමටයි. එහෙත් ඉන්ධන පිරවුම්හලේ පෙට්‍රල් නොවීය. පසුව ඊට කිලෝමීටර් එකහමාරක් පමණ දුරින් පිහිටි හෙට්ටිමුල්ලට බස් රථයකින් ගොස් එහි වෙළෙඳසලකින් පෙට්‍රල් බූලියක් ගෙන තිබිණි.

කෙසේ හෝ 14 වැනිදා සවස් වන විට කුමාර නිරෝෂිකාගේ නිවෙස ආසන්නයට පැමිණ සැඟවී සිටි බවකි.

අනතුරුව 15 වැනිදා පාන්දර තුනහමාර පමණ වෙද්දී නිරෝෂිකාගේ නිවෙස අසලට පැමිණ ඔහු නිවෙසේ විදුලි පේනුව අසලට ගොස් විදුලිය විසන්ධි කර තිබිණි. එසැණින් කුමාර නිවෙස අසල පස් කණ්ඩියකට ගොඩවී ඉන් නිවෙසේ වහල මතට ගොඩ වී ඇත. ඒ වන විට නිවැසියන් මර නින්දේය. නිරෝෂිකා නිදන කාමරය ගැන දත් කුමාර එම කාමරයේ වහලයේ උළු කැටයක් ඉවත්කොට බලද්දී දුටුවේ බීඩි ඔතමින් සිටි නිරෝෂිකා ඇඳ මත නිදා සිටින ආකාරයයි.

රැගෙන ගිය බූලියෙන් රෙදි කැබලි පන්දමකට පෙට්‍රල් වක්කොට ගිනි දල්වා ඇඳ මත නිදා සිටි නිරෝෂිකාගේ සිරුරට විසි කෙරිණි. එසැණින් එකී පාපතරයා පෙට්‍රල් බූලියම ඇයගේ සිරුරට දමා පැන ගොස් තිබුණේ අහස පොළොව නුහුලන අපරාධයක් කරමිනි.

ඒ අතරේ නිවෙස් වෙනත් කාමරයක නිදා සිටි නිරෝෂිකාගේ පියා පාන්දරම අවදිව තිබුණේ වෙනත් අවශ්‍යතාවක් සඳහායි.

"මං නැගිටිනකොට ගෙදර කරන්ට් එක නෑ... ටෝච් ගහලා බැලුවා. අවට ගෙවල්වල ලයිට් තිබුණා. පස්සෙ තමයි මගේ කොල්ල කෑගහලා කිව්වෙ 'තාත්තෙ අක්කගේ කාමරේ ගිනි ගන්නවා' කියලා..."

ඒත් සමඟ එළියට බැසගත් නිරෝෂිකාගේ සහෝදරයා දැක තිබුණේ නිවෙස ආසන්නයේ සිට කෙනෙකු දිව යන ආකාරයයි. ඒ කුමාර බව හඳුනා ගැනීමට ඔහුට හැකි වී තිබිණි. පසුව නිරෝෂිකාගේ පියා සහ සහෝදරයා විසින් දැඩි පරිශ්‍රමයක් දරා ගිනිදැල්වලට මැදිව සිටි නිරෝෂිකා කාමරයෙන් එළියට ගෙන කෑගල්ල රෝහලට රැගෙන ගොස් තිබිණි. ඒ, ත්‍රිරෝද රථයකිනි. ඇයව කාමරයෙන් එළියට ගැනීමට යාමේදී නිරෝෂිකාගේ පියා සහ සහෝදරයාද පිළිස්සුම් තුවාල ලැබීය.

මේ අතර කෑගල්ල රෝහල් පොලිසියෙන් එකී අපරාධය ගැන කෑගල්ල පොලිසිය දැනුවත් කෙරිණි. එසැණින් කෑගල්ල පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක එච්. පී. එන්. කුලතුංග විසින් ප්‍රදේශය බාර උසස් පොලිස් නිලධාරීන්ව දැනුවත් කරමින් විමර්ශන ඇරඹීය.

එහිදී අනාවරණය වූයේ මෙකී අපරාධය සිදුකර ඇත්තෙ කුමාර බවයි. ඒ අනුව කුමාර සොයා කෑගල්ල පොලිස් නිලධාරීන් සහ ඔහුගේ නිවෙස පිහිටි පොලිස් බලප්‍රදේශය වන පල්ලෙවෙල පොලිස් නිලධාරීන්ද කුමාරගේ නිවෙස සෝදිසි කෙරිණි. එහි ප්‍රතිඵලයක් ලෙස පසුගිය 16 වැනිදා සවස් යාමයේ කුමාර අත්අඩංගුවට ගැනීමට පොලිසියට හැකිවිණි. ඔහු පොලිස් නිලධාරීන් ඉදිරියේ පාපොච්චාරණය කර තිබුණේ,

"මාව අතැරලා එකී අපේම ඥාතියෙක් එක්ක ගියානේ... සර්... ඒකයි මං මේ දේ කළේ..."

සැකකරුව කෑගල්ල මහේස්ත්‍රාත් චාමර වික්‍රමනායක මහතා ඉදිරියට පැමිණවීමෙන් පසු මේ මස 30 වැනිදා දක්වා රක්ෂිත බන්ධනාගාරගත කිරීමට නියෝග කෙරිණි.

සත් දිනක කාලයක් මාරයා සමඟ කෑගල්ල රෝහලේ දැඩි සත්කාර ඒකකයේ සයනයක් මත සටන් කළ නිරෝෂිකා අවාසනාවන්ත ලෙස පසුගිය 20 වැනිදා පාන්දර මෙලොව හැර ගියේ කෑගල්ල ප්‍රදේශයම කම්පාවට පත් කරමිනි.

මෙවැනි අපරාධ සිදුකරන පාපතරයන්ට කඩිනමින් නීතිය ක්‍රියාත්මක කොට දැඩි දඬුවම් පැමිණවිය යුත්තෙ තවත් අහිංසකයකුට මෙවැනි අපරාධයක් සිදු නොවීමට හෝ වගබලා ගැනීමට 'පාඩමක්' කියා දීමටයි.

කෑගල්ල දිසා බාර නියෝජ්‍ය පොලිස්පති ප්‍රියන්ත චන්ද්‍රසිරි සහ කොට්ඨාස බාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි කේ. ඩී. කීර්තිරත්නගේ උපදෙස් මත සහකාර පොලිස් අධිකාරි චමින්ද ධර්මරත්න මහතාගේ අධීක්ෂණය මත කෑගල්ල පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක එච්.පී.එන්. කුලතුංගගේ මෙහෙයවීමෙන් එහි අපරාධ අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක ඒ.එන්.පී. අනුරපක්ෂ, පොලිස් පරීක්ෂක ලියනගේ, පො.සැ. (9200) මනෝජ් යන නිලධාරිහු පරීක්ෂණවලට එක් වූහ.



නිරෝෂිකා

**පසුබිම් තොරතුරු සහ ඡායාරූප**
**බුලත්කොහුපිටිය සමූහ**
**- ඩබ්ලිව්. රෝහණ**

## පායා මුල් පිටපත අගරදගුරු හිමිපාණන්ට පිළිගැන්වීම



මාධ්‍යවේදිනී සුරේකා නිල්මිණි ඉලංගකෝන් විසින් රචිත අලුත්ම නවකතාව 'පායා' කෘතිය කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ට පිළිගැන්වීම පසුගිය 23 වැනිදා කොළඹ අගරදගුරු මැදුරේදී සිදුකෙරිණි. පාස්කු ඉරිදා ප්‍රහාරයට මුහුණ දුන් අයගේ සැබෑ ජීවිත අත්දැකීම් සහ ඒ සම්බන්ධ සිදුවීම් ඇසුරු කරගනිමින් ප්‍රති නිර්මාණය කරන ලද මෙම නවකතාව කතුවරියගේ 11 වැනි කෘතියයි. 'පායා' දෙව්මිණි ප්‍රකාශනයකි.

## කෝටි 25ක් විනාශ කළ ව්‍යාපෘති 5ක් වැසීමට සැලසුම්

(නිහාල් පී. අබේසිංහ)

පසුගිය 'යහපාලන' රජයේ වසර 2ක කාලයක් තුළ කිසිදු සේවාවක් ලබා නොදී රුපියල් කෝටි 25කට අධික මුදලක් වියදම් කර ඇති ව්‍යාපෘති කාර්යාල 5ක් වසා දැමීම සම්බන්ධයෙන් තීන්දුවක් ගැනීමට රජය කටයුතු කර ඇතැයි මුදල් අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් කීය.

මෙම ව්‍යාපෘති කාර්යාලයන්ට පසුගිය වසරේදී පමණක් ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකයක් පවත්වාගෙන යාම සඳහා රුපියල් කෝටි 6කට ආසන්න මුදලක් ලබාදී ඇති බව අනාවරණය වී තිබේ. ඒ අනුව බස්නාහිර කලාපීය මහනගර සැලසුම් ව්‍යාපෘතිය, විද්‍යා හා තාක්ෂණ නගර ව්‍යාපෘතිය, සමුද්‍රීය නගර ව්‍යාපෘතිය, ගුවන් නගර හා පරිපාලන නගර ව්‍යාපෘතිය යන ව්‍යාපෘති වලින් පසුගිය වසර 2 තුළ කිසිඳු කාර්යක් ඉටු නොකර එම කාර්ය මණ්ඩලයට පමණක් මුදල් වැය කර ඇතැයි දැනගන්නට ඇත.

## 'තොරතුරු පනත ගමට' වැඩසටහනක් හෙට

ජාත්‍යන්තර තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ දිනයට සමගාමීව ජනමාධ්‍ය අමාත්‍යාංශය සහ ඒප්‍රියල් (Afriel) තරුණ ජාලය එක්ව සංවිධානය කරන 'තොරතුරු පනත ගමට' වැඩසටහන හෙට (28) උදෑසන 9.00ට බණ්ඩාරවෙල නගර ශාලාවේ දී පැවැත්වේ.

තොරතුරු පනත ඇසුරෙන් තම ගැටලුවලට විසඳුම් ළඟා කර ගත හැකි ආකාරය සම්බන්ධයෙන් මෙම වැඩසටහනේ පළමු පැයේදී ජනතාව දැනුම්වත් කරයි.

## ජේ.ආර්. ජන්ම දින සමරු උළෙළ 30 දා

ජේ.ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය මඟින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ ජන්ම දින සමරු උළෙළ 114 වැනි ගුණ සමරුව 30 වැනි බදාදා ප.ව. 4.00 ට කොළඹ 07, අනගාරික ධර්මපාල මාවතෙහි ජේ.ආර්. ජයවර්ධන මධ්‍යස්ථානයේ ප්‍රධාන ශ්‍රවණාගාරයේදී පැවැත්වේ. මේ සඳහා ආණ්ඩු පක්ෂයේ හා විපක්ෂයේ මැති ඇමැතිවරුන් ඇතුළු 200 ක පමණ ප්‍රභූ පිරිසක් සහභාගි වීමට නියමිතය.

## සජිත්ගෙන් 'දිනමු කමිටු'

හක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්

ජාති සමගි ජන බලවේගය විසින් ආරම්භ කර ඇති 'දිනමු කමිටු' පිහිටුවීමේ වැඩසටහන මුළු රටම ආවරණය වන පරිදි සිදු කිරීමට සමගි ජන බලවේගය පියවර ගෙන තිබේ.

මෙහි ප්‍රථම අදියර ජාතික සමගි ජන බලවේගයේ නායක සජිත් ප්‍රේමදාස මහතාගේ ප්‍රධානත්වයෙන් ඉකුත් සතියේ ගාල්ල සහ මාතර යන දිස්ත්‍රික්කවල පැවැත්වුණි. මෙහි දෙවන වැඩසටහන අනුරාධපුර සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කිරීමට එම පක්ෂය තීරණය කර ඇත.

## යාල්දේවියෙන් ජනපතිට පැමිණිල්ලක්!

කොළඹ සිට කන්කසන්තුරය බලා ධාවනය ව යාල්දේවි දුම්රියේ මැදිරි 10 වෙනුවට මැදිරි 6ක කුඩා දුම්රියක් යෙදවීම ගැන සොයා බලන්නැයි උතුරේ ජනතා සංවිධාන කිහිපයක් විසින් ජනාධිපතිතුමා වෙත ලිඛිතව දන්වා ඇත.

මේ දුම්රියේ 2 පංතියේ මැදිරි නොමැතිව ධාවනය කරන අතර වෙන් කළ ආසන සහිත මැදිරි 3 වෙනුවට වෙන් කළ මැදිරි 2ක් පමණක් යොදා ඇතැයිද දෙවැනි පංතියේ අධික මිලක් ගෙවා ප්‍රවේශපත් මිලට ගෙන 3 පංතියේ ගමන් කිරීමට මඟීන්ට සිදුව ඇතැයිද ඇතැම් අවස්ථාවලදී භික්ෂූන් වහන්සේ ඇතුළු පූජ්‍ය හා පූජකවරුන්ටද හිටගෙන ගමන් කරන්නට සිදුව ඇතැයි දන්වා ඇත. වසර 60කට අධික කාලයක් කොළඹ හා කන්කසන්තුරේ දක්වා ධාවනය මන යාල්දේවි දුම්රිය මේ වන විට වැල්ලවත්තේ සිට උතුරට ගමන් කරන මඟීන් වෙනුවෙන් ගල්කිස්සේ සිටම ධාවනය කරනු ලබන බව එම සංවිධාන පෙන්වා දෙයි. මැදිරි 10කට වැඩි ප්‍රමාණයකින් මේ දුම්රිය ධාවනය කළ අතර මැදිරි 6ක කුඩා දුම්රියක් යාල්දේවි වැනි දුම්රියක් සඳහා යෙදවීමෙන් උතුරේ ජනතාව තුළ වැරදි මතයක් ඇති විය හැකි බවයි.

## තොරතුරු දැනගැනීමේ දිනයට සංවාදයක්

තොරතුරු දැනගැනීමේ ජාත්‍යන්තර දිනය' නිමිත්තෙන් 'අයිතිය උදෙසා මාධ්‍යවේදියෝ' සංවිධානය කරන 'විද්වත් සංවාදයක් 28 සඳුදා උදේ 9.30 සිට 12.30 දක්වා කොළඹ 07, විජේරාම මාවත පිහිටි සවුසිරිපාය ශ්‍රවණාගාරයේදී පැවැත්වේ. මෙම සංවාදය සඳහා ජනමාධ්‍ය අමාත්‍ය කෙහෙළිය රඹුක්වැල්ල, හිටපු කතානායක කරු ජයසූරිය, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳව කොමිසන් සභාවේ කොමසාරිස් නීතිඥ ක්‍රිෂාලි පිංටෝ ජයවර්ධන, රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ නීතිඥ නාලක කළුවැව, නීතිඥ ජගත් ලියනආරච්චි යන මහත්ම මහත්මීන් සහභාගි වීමට නියමිතය.

## 1 වැනි පිටුවෙන්

## ගුවන් විදුලියෙන් ලෝක ළමා දිනට වැඩසටහනක්

ලෝක ළමා දිනය නිමිත්තෙන් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ඉංග්‍රීසි අංශයේ Radio Sri Lanka නාළිකාව සංවිධානය කරනු ලබන ලෝක ළමා දින ඉංග්‍රීසි මාධ්‍ය යෙන් පවත්වනු ලබන වැඩසටහනක් ඔක්තෝබර් 02 වැනිදා ගුවන් විදුලි සංස්ථා පරිශ්‍රයේදී පැවැත්වේ. ඒ සඳහා පාසල් සිසුන් 150 දෙනකු සහභාගි වීමට නියමිත අතර එම වැඩ සටහන Radio Sri Lanka නාළිකාව ඔස්සේ ඔක්තෝබර් 4 වැනිදා විකාශය කෙරේ.

## දේශපාලන පලිගැනීම්...

සිදුවූ දේශපාලන පළි ගැනීම් සොයාබැලීම පිළිබඳව අගමැති මහින්ද රාජපක්ෂ විසින් අමාත්‍ය ගාමිණී ලොකුගේ ගේ සභාපතිත්වයෙන් යුතුව මෙම කමිටුව පත් කරන ලදී.

මෙම කමිටුවේ සෙසු සාමාජිකයන් වූයේ හිටපු අමාත්‍යාංශ ලේකම් මහින්ද සෙනෙවිරත්න, හිටපු අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ආරියරත්න ආරියප්පෙරුමය. කමිටුවේ කැඳවුම්කරු ලෙස කටයුතු කෙළේ නීතිඥ චතුරිකා විජේසිංහය.

## ගිය අය ගන්න එජාපය රට පුරා යයි

හක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්

එක්සත් ජාතික පක්ෂය හැර ගිය ලක්ෂ 16 කට ආසන්න පාක්ෂිකයන් ඇතුළු එක්සත් ජාතික පක්ෂයට ආදරය කරන ජනතාව නැවත පක්ෂය වෙත ගෙන්වා ගැනීම සඳහා දීප ව්‍යාප්ත වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන බව එක්සත් ජාතික පක්ෂයේ නියෝජ්‍ය නායක රුවන් විජයවර්ධන මහතා 'සිළුමිණ' ට පැවසීය. මේ පිළිබඳව දැනටමත් පක්ෂයේ සෙසු නායකයන් සමඟ සාකච්ඡා කර ඇති බවත් ඊට අදාළ වැඩසටහන් රාශියක් ඉදිරි කාලය තුළදී ක්‍රියාත්මක කරන බවත් හෙතෙම අවධාරණය කළේ ය.

ග්‍රාමසේවා කොට්ඨාස මට්ටම, ප්‍රාදේශීය සභා සහ පළාත් වශයෙන් මෙන් ම ජාතික තලය සඳහා වූ දැවැන්ත වැඩපිළිවෙළක් මේ සඳහා සැලසුම් කර ඇති බව ද විජයවර්ධන මහතා පැවසීය. මෙම ක්‍රියාකලාපය තුළ ජනතාවට විශ්වාසය ලබාදෙමින් පක්ෂයෙන් ඉවත්ව ගිය නායකයින් ද නැවත පක්ෂය වෙත ගෙන්වා ගැනීමට අපේක්ෂා කරන බව ද ඔහු කීවේය.

## මාතලේ ආදී තෝමස් 85 සුහද හමුව 3දා

මාතලේ ශාන්ත තෝමස් විද්‍යාලයීය 'ආදී තෝමසුවන්ගේ සංගමයේ 85 කණ්ඩායමේ' වාර්ෂික මහ සභා රැස්වීම හා සුහද හමුව මාතලේ තොටගමුව ස්ප්‍රින්ග් වීව් හෝටලයේදී ඔක්තෝබර් 3 වැනි සෙනසුරාදා පෙ.ව. 10.00ට පැවැත්වේ. මෙම අවස්ථාවට 85 කණ්ඩායමේ සාමාජිකයන්ට හා ඔවුන්ගේ පවුල්වල සියලු දෙනාට සහභාගි විය හැකි අතර, වැඩිවිස්තර වජිර දඹදෙණිය (075 240 4690) පාලිත අලුත්දුන්න (0718050156) මහත්වරුන්ගෙන් විමසිය හැකිය

## එන්ජීඕ සල්ලි...

කාර්යයක් සිදු කර ඇත්දැයි සොයා බැලීමට හැකියාව අවම මට්ටමක පවතින බවද ඔහු කීවේය.

තමන්ට වාර්තා වී ඇති පරිදි ක්‍රියාත්මක රාජ්‍ය නොවන සංවිධාන පවා ව්‍යාපෘතිවලට ලැබෙන මුදලින් වැය කරන්නේ 20%ක පමණ මුදලක් බවත් ඉතිරි 80% මුදල් ඔවුන්ගේ කටයුතු සඳහා යොදා ගෙන ඇති බවට පෙනී යන්නේ යැයිද ඔහු පෙන්වා දුන්නේය. රාජ්‍ය නොවන සංවිධාන හරහා මෙරට සංවර්ධනයට දායකත්වයක් ලබාදෙන නමුත් ඇතැම් සංවිධාන හරහා ජාතික ආරක්ෂාවට විශාල තර්ජනයක් වන අතර අන්තවාදී අදහස් පැතිරවීම වැනි කටයුතු සම්බන්ධව විධිමත් නියාමනයක් සහිත පනතක් ඉදිරියේදී ගෙන ඒමට මේ වන විට කටයුතු කරමින් සිටින බවත් ඒ සම්බන්ධව රාජ්‍ය නොවන සංවිධානවල පවා අදහස් ලබා ගනිමින් පවතින බවත් මේ වන විට විශේෂ සාකච්ඡා දෙකක්ද පවත්වා ඇතැයි ඔහු පෙන්වා දුන්නේය.

## රට වටේම...

මේ සම්බන්ධයෙන් අප කළ විමසීමකදී හමුදා මාධ්‍ය ප්‍රකාශක බ්‍රිගේඩියර් චන්දන වික්‍රමසිංහ සිළුමිණට පැවසුවේ භූමියේ ආරක්ෂාව සම්බන්ධයෙන් අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගෙන ඇති බවත් ජාතික ආරක්ෂාව සැලැසීම වෙනුවෙන් උපරිම ලෙසින් කටයුතු යොදා ඇති බවයි. ඒ වෙනුවෙන් ත්‍රිවිධ හමුදාවම ඒකාබද්ධව කටයුතු කරන බවද ඔහු කීය.

නාවික හමුදා මාධ්‍ය ප්‍රකාශක කපිතාන් ඉන්දික ද සිල්වා පැවසුවේ උතුරේ ධීවර ප්‍රජා ආරක්ෂක කමිටු සහාය ලබා ගෙන වැඩි වශයෙන් අනවසර සංක්‍රමණ සිදුවන මන්නාරම දකුණු මුහුදේ මුර සංචාරක වැඩි කර ඇති බවයි. එමෙන්ම ගුවන් ආවේක්ෂණ කටයුතුවලින් ගුවන් හමුදාව විසින් දායකත්වය සපයනු ලබන බවත් පොලිසිය හා සෙසු ආරක්ෂක අංශ හා එක්ව රටේ උපරිම ආරක්ෂාව වෙනුවෙන් ඒකාබද්ධව කටයුතු කරන බවයි. අපරාධකරුවන් රටින් පිටවීම වැළැක්වීම පිණිස උපරිම බලය යොදා ඇති බවද ඔහු පැවසීය.

පොලිසිය විසින් රට තුළ සිවිල් නීතිය ක්‍රියාත්මක කරද්දී රටෙන් මුහුදු මඟින් පැනයාමට උත්සාහ දරන පුද්ගලයන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇතැයිද පැවසූ නාවික හමුදා මාධ්‍ය ප්‍රකාශකවරයා දිවා රෑ දෙකෙහිම මුර සේවා තර කර ඇති බව කීය.

## ගෙවතු ලක්ෂ 24 ක්...

එලදායි පුරවැසියෙක් - සතුටින් ජීවත්වන පවුලක්' යන සංකල්පය යථාර්ථයක් බවට පත් කිරීමට හා ආර්ථිකව සාමාජීයව හා පාරිසරිකව සමෘද්ධිමත් දේශයක් ගොඩනැගීම අරමුණු කරගෙන මෙම වැඩපිළිවෙළ ක්‍රියාත්මක වෙයි.

මහා පරිමාණ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන අතරතුර ගෘහ ආර්ථිකය දියුණු කිරීමට ප්‍රමුඛතාව දෙමින් ඉදිරි මහකන්නයේ ආරම්භයේ සිට මෙම ජාතික වගා වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරයි. එළවළු, පලතුරු, පලා හා කැඳ වර්ග සකසන බෝග කුළුබඩු සකසන බෝග ඔසු පැළ අපනයන කෘෂිභෝග ආදී සෑම වර්ගයකම පැළ වර්ග මේ යටතේ තෝරාගත් ගෙවතු සඳහා ලබාදෙන අතර ඒ ඒ ප්‍රදේශවලට උචිත වැඩි එලදාවක් ලබාගත හැකි ශාක වර්ගවලට මෙහිදී ප්‍රමුඛතාව ලබාදෙයි.

# පොලිසියටත් කොකා ගැස්සූ ගොනාකෝවිලේ රොහාගේ පැටිකිරිය

● අමිල මලවිසූරිය


**පසුගිය මැයි 29 වැනිදා මධ්‍යම රාත්‍රියේ මොරටුව, ලක්මැදුර හෝටලයට වෙඩි වරුෂාවක් එල්ල වන ආකාරය මුළු රටම දුටුවේය. එකී වෙඩි වරුෂාව එල්ල කළේ රත්මලාන ප්‍රදේශයේ පාතාල බලය වපුරන රත්මලානේ අංජු හෙවත් කුඩු අංජුගේ පාර්ශ්වයෙනි. ප්‍රංශයේ සිටින බවට සැලවන අමල් සිංහාර ද සිල්වා හෙවත් අංජු එරට සිට මෙරට ගෝලයන් මෙහෙයවමින් සිටී. එසේම ඔහුගේ ප්‍රධාන ගෝලයා වන ධර්මසිරි නමැත්තාද ඩුබායිහි වෙසෙන බවකි. හෝටලයට ප්‍රහාරය එල්ල කිරීමට පෙර ඩුබායි සිට හෝටල් හිමිකරු ලසන්ත ඇමැතූ ධර්මසිරි කීවේ, 'උඹලට අපි ඉල්ලුවම තමයි සල්ලි දෙන්න බැරි... රෝහණගේ එවුන්ට ඕනතරම් දෙන්න පුළුවන්... අපි මේ සියලුම කප්පම් ගැනීම්... කුඩු බිස්නස් නතර කරනවා... රොහා ඉවරයක් කරපුදාට...'**



ගොනාකෝවිලේ රොහා



රොහා මියගොස් සිටි ආකාරය



රොහාට වෙඩි ප්‍රහාරය එල්ල වූ නිවෙස



රොහා නිවස තුළ මියගොස් සිටි ආකාරය



රෝහාගෙ රුව අවසන් වරට නුවරඑළියේ ෆාමසියක සිසීටීවී කැමරාවක සටහන්ව තිබූ ආකාරය

එකී රෝහණ හෙවත් ගොනාකෝවිලේ රොහා නමින් ප්‍රකටව සිටි දෙව්මිණි රෝහණ හැරල් ද සිල්වා නමැති ප්‍රබල පාතාල නායකයා පසුගිය වසර කීපය තුළ රත්මලාන, මොරටුව, ගල්කිස්ස ප්‍රදේශ හොල්ලාගෙන සිටි මත් ජාවාරම්, කප්පම් ගැනීම් ඇතුළු මිනීමැරුම් රැසකටම වගකිවයුතු ප්‍රධානතම අපරාධකාරයෙකි.

පසුගියදා බස්නාහිර පළාත බාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් හෙළි කළ සක්‍රීය පාතාල කල්ලි විස්සෙන් එක් කණ්ඩායමක් මෙහෙය වූයේ ද මෙකී ගොනාකෝවිලේ රොහායි. පසුගිය කාලයේම රිමාන්ඩ් බන්ධනාගාරගතව සිටි රොහාට ඇප නියම වුවත් ඔහු කලක් යන තෙක්ම බන්ධනාගාරයේ ගත කිරීමෙන් පසු ඉකුත් ජනවාරි මාසයේ ඇප මත නිදහස් විණි. එලෙස නිදහස්වූ රොහා පසුව සැඟවුණු දිවියක් ගත කළේය. අඩුම තරමේ ඔහු තමාගේ විශ්වාසවන්ත සගයකුට වුව දුරකථන ඇමැතුමක් ගෙන තිබුණේ තමන් විසූ ප්‍රදේශයෙන් වෙනත් ප්‍රදේශයකට ගොස් බව පොලිස් බුද්ධි අංශද අනාවරණය කරගෙන තිබුණේය. එතරමටම රොහා ආරක්ෂාව ගැන සිතමින් සැඟවුණු දිවියක් ගත කළේ ආරක්ෂක අංශවලට බියට වඩා ඔහුගේ විරුද්ධ පාර්ශ්වකරුවන්ගෙන් බේරීම සඳහායි.

ඉකුත් සමයේ පොළොන්නරුව ප්‍රදේශයේ යුද හමුදා කඳවුරකින් පාතාලයට පැන්නු ගිනිඅවි තොගයෙන් ගිනිඅවි 24ක් කොස්ගොඩ තාරකා මඟින් රොහාගේ පාර්ශ්වයටද ලැබී තිබූ බවටද සැල විණි. එලෙස අවිආයුධ රැස් කරමින් අංජුගේ පාර්ශ්වය සමඟද මහා පරිමාණ ගැටුමකට අරඅඳිමින් සිටි රොහා ඇතුළු පාතාල සාමාජිකයන්ට වැඩ වැරදුණේ වත්මන් රජය ගෙනයන පාතාල මර්දන සෘජු වැඩපිළිවෙළ නිසායි.

ඊට බියෙන් මෙරට සිටින පාතාල සාමාජිකයන් යනඑනමං නැතිව හිස්ලූලු අත දිවයන බවක් පසුගිය දින කීපයේදීම වාර්තා විණි. එහිදී රොහාද ආගිය අතක් නොමැතිව සැඟවුණු දිවියක් ගතකරමින් කෙසේ හෝ මෙරටින් ඉන්දියාවට පලා යෑමට තැත් කරමින් සිටි බවට පොලිසියට තොරතුරු ලැබී තිබිණි.



රොහා අතින් ඝාතනය වූ උපපොලිස් පරීක්ෂක රත්න බණ්ඩාර



රත්මලානේ ලන්සියා



රත්මලානේ අංජු

මීට මාස දෙකකට පමණ පෙරදී පොලිසිය අනාවරණය කරගෙන තිබුණේ රොහා නුවරඑළිය ප්‍රදේශයේ සැරිසරන බවයි. වරෙන්තුකරුවකු වූ රොහාව කොටුකර ගැනීමට පොලිසිය යාමේදී ඔහුට ලැබුණු තොරතුරක් මත එම ප්‍රදේශයෙන් පලා ගොස් තිබුණේය. එසේම මීට සති දෙකකට පමණ පෙරදී ද රොහා කටුනායක ගුවන් තොටුපොළ හරහා රටකට පැනීමට උත්සාහ කර තිබුණේ ව්‍යාජ නමක් භාවිත කරමිනි. එම උත්සාහයේදී නමෙහි ගැටලුවක් වූ හෙයින් රොහා ගුවන් තොටුපොළ බලධාරින්ටද කොකා පෙන්නා පැන ගොස් තිබූ බව පොලිස් බුද්ධි අංශවලට සැලවී තිබිණි.

අනතුරුව ඔහු මීගමුව කොච්චිකඩේ ප්‍රදේශයෙන් ටෝලර් යාත්‍රවකින් ඉන්දියාවට පලා යෑමට තැත් කරන බවට බස්නාහිර උතුර දිසා අපරාධ කොට්ඨාසයට තොරතුරක් ලැබිණි. ඒ මීට දින කීපයකට පෙරදියි.

එම කොට්ඨාසයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක නිවුන්හැල්ල විසින් එම කොට්ඨාසය බාර පසුගිය දිනවල පාතාල සාමාජිකයන් රැසක්ම අත්අඩංගුවට ගැනීමට මෙහෙයවූ නියෝජ්‍ය පොලිස්පති ප්‍රසාද් රණසිංහ මහතා දැනුවත් කෙරිණි. නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ උපදෙස් මත නිවුන්හැල්ල ප්‍රමුඛ කණ්ඩායම පසුගිය 24 දා අලුයම තුනට පමණ කොච්චිකඩේ, කම්මල්තොට වෙරළේ ධීවර කටයුතු සඳහා යොදාගන්නා ලැලි නිවෙසක සැඟවී සිට ඉන්දියාවට පලා යෑමට මාන බලමින් සිටි රොහාව කොටුකර ගැනිණි.

පසුව ඔහුව අත්අඩංගුවට ගැනීමට යාමේදී ටී56 ගිනිඅවියක්ද සත්තකයේ තබාගෙන පොලිසියට වෙඩි ප්‍රහාරයක් එල්ල කෙරිණි. එහිදී පොලිසිය පවසන පරිදි, පොලිසිය සහ රොහා අතර වූ වෙඩි හුවමාරුවෙන් බරපතළ තුවාල ලත් රොහා මීගමුව රෝහලට ඇතුළත් කරන විටද මියගොස් සිටි බවයි. ඔහු සතුව ටී 56 ගිනිඅවියට අමතරව රිවොල්වරයක් සහ ඉන්දිය රුපියල් ලක්ෂ 3 කට ආසන්න මුදලක් මෙන්ම මෙරට රුපියල් එක්ලක්ෂ පනස්දහසක මුදලක්ද දුරකථන පහක් සහ සිම්කාඩ්පත් 25ක්ද විය. තවද ඇඳුම් කීපයක්ද තිබී ඇත.

වයස අවුරුදු 41ක් පමණ වූ රොහා අඟුලාන, පොදුජය මාවතේ පදිංචිව සිටියේය. මොරටුව, කල්දෙමුල්ලෙ කාන්තාවක හා විවාහ වී සිටි ඔහු මෑත කාලීන අපරාධකාරයන් අතර සිටි දරුණුම ගණයේ අපරාධ කල්ලි නායකයෙක් ලෙස සැලැකේ. සාමාන්‍යයෙන් අපරාධ කල්ලි නායකයන් සිය ගෝලයන් මෙහෙයවා අපරාධ සිදුකළත් රොහා තමන් විසින්ම බොහෝ අපරාධ සිදුකළ අයෙකි. එසේම මොහු ඕනෑම මොහොතකදී තමන් අත්අඩංගුවට ගැනීමට එන පොලිස් නිලධාරින්ටද වෙඩි ප්‍රහාර එල්ල කිරීමට සැදිපැහැදි සිටි ම්ලේච්ඡ පුද්ගලයෙකි.

මෑත කාලයේ තවත් ප්‍රබල අපරාධකාරයෙක් වන දැනට බූස්ස බන්ධනාගාරයේ සිටින ගණේමුල්ල සංජීව හෙවත් මාකිලංගමුව සංජීව සමඟ සමීප සබඳතා පැවැත්වූ රොහා අපරාධ ලෝකයට පිවිසීමේ කතාන්දර පෙළ ගැසෙන්නෙ මෙලෙසිනි.

ගල්කිස්ස ප්‍රසිද්ධ පාසලකින් උගත් රොහාගේ එකම පන්තියේ සිටි ගජමිතුරා වූයේ අසංක සිංහාර හෙවත් ලන්සියායි. ලන්සියාගේ බාප්පලා රත්මලාන හොල්ලාගෙන සිටි චණ්ඩින්ය. ඔහුගේ ලොකු බාප්පා වූ රත්මලාන, ගල්කිස්ස ප්‍රදේශවල බලය පතුරුවාගෙන සිටි රාජා 89 භීෂණ සමයේ ගොදුරක් විණි. ලන්සියාගේ තවත් බාප්පා කෙනෙකු වූ රංජිගේ දියණියක් සමඟ රොහාගේ යහළුවෙක් ප්‍රේම සබඳතාවක් අරඹා තිබුණේය. එය කන වැකුණු ලන්සියාගේ රංජි බාප්පා රොහාට සහ ඔහුගේ යහළුවාට හොඳට සැලැකුවේ ගුටි ප්‍රහාරයක් දෙමිනි.

ඒත් සමඟ රොහා සහ ලන්සියා අතර මිතුදමටද 'තිත' තැබිණි. පවුලේ වැඩිමලා වූ හෙයින් පවුල් බර ද කරට ගත් රොහා රැකියා කීපයම නිරත වීමෙන් පසු මොරටුවේ අවන්හලක රැකියාවට ගියේ වේටර්වරයකු ලෙසිනි. එම අවන්හලට පැමිණියේ එසමයේ ප්‍රබල අපරාධකාරයෙක්ව සිටි මොරටු සමන්ය. එමඟින් රොහාට මොරටු සමන්ගේ ඇසුරට අවාස්ථාව සැලැසිණි. මොරටු සමන්ගේ ඇසුර හරහා රොහාද 'පොර'ක් වීමට තැත් කළේ අපරාධ සහ මත් ජාවාරමට එක් වෙමිනි. ඔහුගේ නැඟී සිටීම අභියෝගයක් ලෙස සැලකූ ලන්සියාගේ බාප්පා කෙනෙකු රොහාව පොලිසියට කොටුකර දුන්නෙ බෝම්බ සිද්ධියක් මුල්කරගෙනයි. ඒ හරහා බන්ධනාගාරගත වන රොහාට අපරාධ ලෝකයේ බොහෝ පුද්ගලයන් හඳුනා ගැනීමට හැකි විණි. පොලිස් විශේෂ කාර්ය බළකායේ සිටි බයිසිකල් බේබිද ඒ අතර විය.

එලෙස ව්‍යාජ සිද්ධියක් මුල් කරගෙන රොහා පොලිසියට කොටුකර දීමේ සැලැසුම සකස්කර තිබුණේ ලන්සියාගේ බාප්පා කෙනෙකු වූ එවකට දෙහිවල ගල්කිස්ස නගර සභාවේ මන්ත්‍රීවරයෙක් වූ කා අතරත් පොඩි මහත්තයා ලෙස ප්‍රකටව සිටි පුද්ගලයායි.

බන්ධනාගාරයෙන් අපරාධ ලෝකයට 'උපාධිය' ලබා එළියට එන රොහා තමා ව්‍යාජ ලෙස සිරගත කළ නාගරික මන්ත්‍රී පොඩි මහත්තයා ඝාතනය කෙරිණි. ඒ 2007 වසරේදීය. එය ඔහුගේ පළමු බිල්ල විය. එසේම බයිසිකල් බේබි යොදවා රොහාට සහ ඔහුගේ යහළුවාට පහර දුන් ලන්සියාගේ රංජි බාප්පාද පාණදුරේදී ඝාතනය කෙරිණි. මේ අතරේ මොරටු සමන්ද වෙඩි ප්‍රහාරයකින් පරලොව ගියේය. ඉන් පසුව සමන්ගේ ජාවාරම් සියල්ල කරටගෙන නැඟි සිටි රොහා කොල්ලකෑම්, කප්පම් ගැනීම්, මත් ජාවාරම්, මිනීමැරුම් යහමින් සිදුකරමින් ගෝලයන් පිරිසක්ද එක්කරගනිමින් ප්‍රබල අපරාධකරුවකු ලෙස සමාජයට පිළිලයක් වෙමින් ඉදිරියට ආවේය.

සිදුකරන ලද අපරාධවලට නැවතත් පොලිසියට කොටුවන රොහා 2008 වසරේදී නැවතත් රිමාන්ඩ් බන්ධනාගාරගත කෙරිණි. මේ අතර සිය බාප්පලා දෙදෙනකුටම මරු කැඳවූ රොහාගෙන් පළිගැනීමට ලන්සියාද පෙරට එමින් සිටියේය. මත් ජාවාරමටද එක්ව සිටි ලන්සියා රත්මලානේ ප්‍රබල අපරාධකාරයකු ලෙස ඉදිරියට ආවේය. රත්මලාන, ගල්කිස්ස, ප්‍රදේශයේ මත් ජාවාරම් ගැටුම් හරහා ලන්සියා සහ රොහා අතර ගැටුම් තවත් උග්‍ර විණි.

එම ප්‍රදේශවල පොලිසිවල ලොකු ලොක්කන් සමඟද සබඳතා තිබූ ලන්සියා නැවතත් රොහා පොලිසියට කොටුකර දුන්නේය. 2010 වර්ෂය පමණ වන විට රොහා - ලන්සියා දෙපාර්ශ්වයේ සගයන්ගේ ගැටුම් තීව්‍ර ලෙස ඉහළ ගොස් තිබිණි. අනතුරුව එම ප්‍රදේශයේ එවකට රජයේ ඇමැතිවරයකුගේ මැදිහත්වීමෙන් දෙපාර්ශ්වය සාමදානද කෙරිණි. ඊට දෙපාර්ශ්වයේ වැඩිහිටියන්ද මැදිහත් විණි.

එහෙත් දෙදෙනා අතර නැවතත් විරසකය ඇති කිරීමට දෙපාර්ශ්වයේ ඇතැම් දෙනා මාන බලමින් සිටියේය. ඒ දෙදෙනා අතර කේළාම් පතුරුවමිනි.

එහෙත් වසර දෙක තුනක පමණ කාලයක් දෙපාර්ශ්වයේ ගැටුම් නොපැවැතියත් නැවතත් රොහාගේ සහ ලන්සියාගේ ඥාතියෙක් අතර ගැටුමක් ඇති වූයේය. ඒ ත්‍රිරෝද රථයක් හා මෝටර් රථයක් මාර්ගයේ හරස් වීමෙනි.

ඒ වන විට ප්‍රබලව සිටි ලන්සියා ඊට ප්‍රතිචාර දැක්වූයේ ගිනිඅවි අතැතිව පිරිසක් සමඟ රොහා නොමැති අවස්ථාවක ඔහුගේ නිවෙසට ගොස් බැණ තර්ජනය කරමිනි. පසුව ලන්සියා සැලැසුම් කර තිබුණේ රොහාව 'ඉවරයක්' කිරීමටයි. එහෙත් 2016 වසරේ ජුනි 23 වැනිදා රොහා ඉස්සර වූයේය.

ලන්සියා මත්කුඩු නඩුවකට බිරිය සහ දියණිය සමඟ මහර අධිකරණයට ගොස් සුදු පැහැති හයිබ්‍රිඩ් රථයට ගොඩවෙද්දීම රොහා, බයිසිකල් බේබි සහ එයාෆෝස් සම්පත් සමඟ මෝටර් රථයකින් පැමිණ වෙඩි ප්‍රහාරයක් එල්ල කළේ ලන්සියාගේ ජීවිතය එතැනම ඉවර කරමිනි.

ලන්සියා ඝාතනයෙන් පසු රොහා සැඟවුණු දිවියක් ගත කළේය. ලන්සියාගේ මරණ කටයුතු සිදු කෙරුණේ ගල්කිස්ස සුසාන භූමියේදී හෙලිකොප්ටරයකින් මල් වරුෂාද පතිත කරමිනි. ලන්සියාගේ සහෝදරයෙක් වන රත්මලාන අංජු හෙවත් වත්මනෙහි කුඩු අංජු ලෙස ප්‍රකටව සිටින අමල් සිංහාර ඒ වන විට කිසිදු අපරාධ ක්‍රියාවකට සම්බන්ධ නොවූ අයෙකි. සිය සහෝදරයාගේ මරණයෙන් පසු රෝහාට බියෙන් අංජු පලා යන්නෙ මැලේසියාවටය. එහි සිට ඔහු සහෝදරයාගේ ගෝලයන්ද එකතුකොට අපරාධ ලෝකයට පිවිසියේ රොහා ඉවරයක් කිරීමේ අටියෙනි. එසේම ලන්සියා ඝාතනය කොට දින කීපයක් ඇතුළතදී රොහාගෙන් පළිගැනීමේ චේතනාව ඇතිව අංජුගේ මෙහෙයවීමෙන් රොහාගේ පුංචි අම්මාගේ පුත්‍රයා වූ ප්‍රභාත් නමැත්තා ඝාතනය කළේ පිළියන්දල, බෝකුන්දරදියි. එසේම අංජු, රොහා ඝාතනය කරන පුද්ගලයකු කෝටි 2ක මුදලක් දෙන බව කී අතර පසුව එය කෝටි 4 දක්වා ඉහළ නැංවූයේ සමාජ මාධ්‍යයන්හිද 'පොස්ට්' පළ කරමිනි.

මේ අතරේ 2016 නොවැම්බර් 15 වැනිදා රොහා සහ බයිසිකල් බේබි මෝටර් රථයකින් යන්නෙ කුරුණෑගලටයි. එම රථය ගෙන තිබුණේ මොරටුවේ කුලී රථ ආයතනයකිනි. වංචාවකට තුඩු දුන් එම රථයෙහි ජීපීඑස් මඟින් කුරුණෑගල රථය තිබෙන බව හඳුනා ගැනිණි. කුලී රථ ආයතනය 119 හරහා දැන්වීමත් සමඟ කුරුණෑගල පොලිසියේ රාජකාරි කළ 58 හැවිරිදි උපපොලිස් පරීක්ෂක රත්න දසනායක සහ කොස්තාපල් උදයකාන්ත බණ්ඩාර රොහා නතරව සිටි හෝටලයට ගොස් රථය පරීක්ෂා කිරීමට සැරසෙද්දීම ඒ බව කිසිත් නොදත් රොහා ඔහුව අත්අඩංගුවට ගැනීමට පැමිණියේයැයි සිතා පොලිස් නිලධාරින් දෙදෙනාට වෙඩි ප්‍රහාරයක් එල්ල කෙරිණි. ඉන් රත්න දසනායක එතැනම මරුමුවට පත්විණි. කොස්තාපල් බරපතළ තුවාල ලැබීය.

එසැණින් ක්‍රියාත්මක වූ පොලිස් නිලධාරින් බස් රථයකට නැඟි පලා යෑමට තැත් කළ රොහා අත්අඩංගුවට ගැනිණි. ඔහුගේ සගයා බයිසිකල් බේබි හම්බන්තොට මීගහජඳුර ප්‍රදේශයේ හේනක සැඟවී සිටියදී 2017 අප්‍රේල් 27 වැනිදා පොලිස් වෙඩි පහරකින් මරණයට පත් විය.

මේ අතරේ රොහා ඝාතනයට කුඩු අංජු නොයෙක් ආකාරයේ 'ප්ලෑන්' හදමින් සිටියේය. එවැනි ප්ලෑනක් අනුව 2017 මාර්තු මස 01 වැනිදා වැලිකඩ බන්ධනාගාරයේ සිට මත්කුඩු නඩුවකට රොහා රැගෙන ආවේ ගල්කිස්ස අධිකරණයටයි. එදින ගිනිඅවියක්ද සහිතව අධිකරණ භූමියට කුඩු අංජු විසින් මයියා නමැති සගයා යැව්වත් එදින ඔහුගේ අතින් බන්ධනාගාර බංකුවක් යටට සිය ගිනිඅවිය සහිත පාර්සලය වැටීමෙන් රොහාට තවදුරටත් ජීවත්වීමේ වාසනාව ලැබිණි.

එසේම අංජු විසින් 2019 අප්‍රේල් 08 වැනිදා රොහා ඝාතනයට තැත් කළේ දූෂිත බන්ධනාගාර නිලධාරින් මඟින් බන්ධනාගාරය තුළට සයනයිඩ් යවා රැඳවියකු මාර්ගයෙන් සයනයිඩ් එන්නත් කරමිනි. එම ප්‍රයත්නයද ව්‍යර්ථ වූයේ බස්නාහිර පළාත් බුද්ධි කොට්ඨාසයේ නිලධාරින්ට හෝඩුවාව යෑමත් සමඟ බන්ධනාගාරයේ සිදුකළ සෝදිසියේදී සයනයිඩ් සමඟ මරාල සුරංග නමැති අධික ලෙස මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිව සිටි රැඳවියා අත්අඩංගුවට ගැනීමත් සමඟිනි. තවද ගිය වසරේම ගිනිඅවියක් කුඩා කොටස්වලට ගලවා බන්ධනාගාරය තුළට යවා රොහාට වෙඩි ප්‍රහාරයක් දියත්කොට ඝාතනය කිරීමටද අංජු ප්ලෑන් කළේය. එම අවස්ථාවේදීද බස්නාහිර පළාත් බුද්ධි කොට්ඨාසයට ලැබුණු තොරතුරු අනුව බන්ධනාගාරයට යවා තිබූ ගිනිඅවියේ සියලු කොටස් සොයා ගැනීමට හැකි වූයේ දමිළ සැකකරුවෙක්ද සමඟිනි.

කෙසේ හෝ ලන්සියා - අංජු පාර්ශ්වය සහ රොහා පාර්ශ්වයේ ගැටුම් නිසාවෙන් වසර 20ක පමණ කාලය තුළදී පුද්ගල ඝාතන 20කට අධික ප්‍රමාණයක් සිදුව ඇති බවකි. එම ඝාතනවලින් 14කට පමණ රොහා සෘජුවම වගකිවයුතු බව පොලිස් පොත්වලද සඳහන්ව ඇති බවකි. මෙකී දෙපාර්ශ්වයේ ගැටුම් නිසාවෙන් රොහාගේ පාර්ශ්වකරුවෙක් යැයි ක්‍රිකට් ක්‍රීඩක ධනංජය සිල්වාගේ පියාණන් වූ නාගරික මන්ත්‍රීවරයෙක් වූ රංජන් ද සිල්වාද අංජුගේ පාර්ශ්වයෙන් 2018 වසරේ මැයි 24 වැනි දින ඝාතනය විය.

අවසානයේ විසි වසරකට අධික කාලයක් ගල්කිස්ස, රත්මලාන, මොරටුව ප්‍රදේශ වෙලාගෙන තිබූ පාතාල ගැටුම්හි එක් පාර්ශ්වකරුවකුගේ මරණය මෙලෙස සිදු වූයේ අපරාධකාරයන්ට අත්වන ඉරණම පසක් කරමිනි. ඔහුගේ මරණය නිසාවෙන් එක් පාර්ශ්වයක් දුක් වෙද්දී අංජුගේ පාර්ශ්වය 'ගේම් ඕවර්' (Game Over) යනුවෙන් සඳහන් කරමින් සමාජ මාධ්‍ය 'පෝස්ට්' පළ කරමින් 'පාටි' දමන්නෙ මල්වෙඩි සංදර්ශනද පවත්වමින් ප්‍රිති ඝෝෂා නඟමිනි.




● සටහන හා සේයා රූ
**නුවන් ජයසේකර** - සූරියවැව විශේෂ

# නිල ඇඳුමේ ගෞරවය කෙලෙසූ කිරින්දේ පොලිසිය

**"මහජන මිත්‍රශීලී පොලිසියක්" මැයෙන් දිවයිනේ සියලු පොලිස් ස්ථාන පසුගිය කාලයේ වෙනසකට ලක් කළද සැබෑවටම පොලිසිය මහජන මිත්‍රශීලී ආයතනයක්ද යන්න දෙතුන් වරක් නොව සිය දහස්වාරයක් සිතා බැලිය යුතු තැනට පත්ව ඇත්තේ ඇතැම් නිලධාරීන් ගේ අශිෂ්ඨ අශීලාචාර ක්‍රියාකලාපයන් නිසාය. මේ, එවැනි සිදුවීමක් පිළිබඳ අපට අසන්නට ලැබුණු ආසන්නත ම සිදුවීමකි. කිරින්ද පොලිස් ස්ථානයෙන් අසන්නට ලැබුණු එම ජුගුප්සාජනක සිදුවීම පිළිබඳ අමාත්‍ය චමල් රාජපක්ෂ ගේ විශේෂ අවධානයට යොමු වීමත් සමඟ සිදුවන්නට ගිය මහා අපරාධයක් වැළකී තිබේ. මේ, ඒ කතාවයි.**

තිස්සමහාරාම හල්මිල්ලෑව පදිංචි සිවු දරු පියකු වන 53 හැවිරිදි ජිනිත් ද සිල්වා මුතුමාල රජයේ ලියාපදිංචි වැලි ප්‍රවාහන හිමිකරුවෙකි. ඔහු සතුව ටිපර් රථ දෙකක් ඇති අතර ඉන් කුඩා ප්‍රමාණයේ ටිපර් රථයක් පසුගිය අගෝස්තු මස 22 දා මාගම සිට තිස්සමහාරාම ප්‍රදේශයට ධාවනය වෙමින් තිබුණි. ඒ වන විට වේලාව සවස 4.30ට පමණය. ටිපර් රථයේ රියදුරු ලෙස කටයුතු කළේ කෝන්වැලෑනේ රුවන් නමැත්තාය. ටිපර් රථයේ ඉදිරි පස අසුනේ මුතුමාල ගේ වැඩිමහල් පුතු වන චමිත් මුතුමාලද ගමනට එක්ව සිටියේය. එකවරම ඉදිරියෙන් පැමිණි එම ප්‍රදේශයේම වෙනත් අයෙකුට අයත් ටිපර් රථයක් මුතුමාලගේ ටිපර් රථයේ වද්දවාගෙන ඉදිරියට ගොස් නැවැත්විණි. අනතුරින් කිසිවකුටත් හානියක් සිදු නොවූ අතර වාහන දෙකට ඉතා කුඩා සීරීම් පමණක් සිදුව තිබුණි. අලාභය රුපියල් 4000ක් 5000ක පමණ එකකි. අනතුර පිළිබඳව දැනගත් වහාම ජිනිත් ද සිල්වා මුතුමාල ද එම ස්ථානයට ගිය අතර අනෙක් පාර්ශ්වය වෙනුවෙන්ද රියදුරකු පැමිණ තිබේ. දෙපාර්ශ්වය අතර කතාබහ වී සමථයකට වූයේ අනතුරට පත් අනෙක් පාර්ශ්වයේ අනුදැනුම මත හා එකඟතාව මතය. අනතුරට පත්වූ අනෙක් පාර්ශ්වය මුතුමාල සමඟ කලක සිට අමනාපයෙන් සිටින අයකු වන අතර ඔහු කිරින්ද පොලිස් ස්ථානයේ ස්ථානාධිපති වරයාගේ හිතවතෙකි.

එතැන් පටන් සිදු වුයේ කුමක්ද යන්න පිළිබඳ 53 හැවිරිදි ජිනිත් ද සිල්වා මුතුමාල මෙලෙස කීවේය.

"එදා හවස 6.30ට විතර එක සැරේටම කිරින්ද පොලිසියේ තුන් දෙනෙක් එකක් ජීප් එකකින් ඇවිත් ටිපර් දෙකයි තාත්තයි පුතාලා දෙන්නයි දැන්ම පොලිසියට දැන්ම එන්න කිව්වා. මම "ඇයි" ඇහුවම කිව්වා "අනතුරක් සිදුකර පලාගොස් කියලා පැමිණිල්ලක් තියෙනවා" කියලා. මම කිව්වා "පොඩි අනතුරක් වුණා, අපි කතාවෙලා සමථයකට පත්වුණා" කියලා. ඒ වෙලාවේ පොලිසියේ අය කිව්වා "ඒකට කමක් නෑ මේක ඕ.අයි.සී මහත්තයගේ නියෝගයක්. වාහන දෙකත් අරන් දැන්ම පොලිසියට එන්න" කියලා. පසුව මම පොඩි ලොරියත් අරන් පුතාලා දෙන්නත් එක්ක පොලිසියට ගියා. ඒ වෙනකොට වෙලාව රෑ 7ට විතර ඇති. ඒ ගිය ගමන්ම පුතාලා දෙන්නා පොලිස් කූඩුවට දාලා වැහුවා. මම ඇහුවා "පුතාලා දෙන්නා කූඩුවට දැම්මේ ඇයි? ඒ අය මේකට කිසි සම්බන්ධයක් නෑ. අනතුර වෙනකොට ටිපර් එක ගෙනිච්චෙත් වෙන කෙනෙක්" කියලා. "හරි හරි ඒක පස්සේ බලාගමු. 119 එකෙන් අපට කතාකරලා කිව්වෙ


පහරකෑමට ලක් වූ මුතුමාල සහ පුතු කසුන්

ඒ දෙන්නගේ නම්" කියලා පොලිසියේ මහත්තයෙක් කිව්වා.

පුතාලා දෙන්නා කූඩුවට දමලා ඕ.අයි.සී.නවරත්න මහත්තයා අපි දෙපාර්ශ්වයම එයාගේ කාමරයට අරන් ගිහින් විස්තර අහලා මට කිව්වා "තමුන් මේ අලාභය සම්පූර්ණයෙන්ම ගෙවන්න ඕනේ "කියලා. මම ඒ වෙලාවේ කිව්වා "සර් මේක මහා අසාධාරණයි.මෙයා ඇවිත් හිතාමතාමයි හැප්පුණේ.

ඒ විතරක් නෙමේ 2019 මැයි මාසේ දවසකත් මෙයා මේ විදියටම මගේ ටිපර් එක හප්පලා මම පොලිසි ආවම එදා ඔබතුමා මට කිව්වා අතින් හදා ගන්න" කියලා. ඊට පස්සේ ඕ.අයි.සී මහත්තයා උදේට ඇවිත් වාහන අරන් යන්න කියලා කූඩුවේ හිටිය පුතාලා දෙන්නව එළියට දැම්මා. 23 වැනිදා උදේ මායි මගේ දෙවෙනි පුතා කසුනුයි පොලිසියට ගියා ටිපර් එක ගේන්න. ඒ ගියාම නවරත්න මහත්තයා අනතුර පිළිබඳ පරීක්ෂා කරන්න තියෙනවා කියලා වාහනය ළඟට ගිහින් මට කිව්වා වාහන දෙකම මෝටර් රථ පරීක්ෂකට දාලා බලන්න ඕන කියලා. එහෙම කියලා ඕ.අයි.සී. වාහන දෙකේ චැසි නම්බර් පොටෝ අරන් හම්බන්තොට මෝටර් රථ පරීක්ෂකට යවලා විනාඩි 5කින් විතර මට කිව්වා "ඔයාලගේ වාහනය හොර එකක් කියලා මෝටර් රථ පරීක්ෂක එස්.එම්.එස්. එකක් එවලා තියෙනවා"කියලා. ඒ වෙලාවේ ඕ.අයි.සී.ට මම කිව්වා "මේ වාහනය 2013 වසරේ හලාවතින් ගෙනාවේ.ගෙනාව දවසේ ඉඳන්ම මේකට තවම ලීසින් තියෙනවා" කියලා. අපි ගෙදර ඇවිත් නැවත් 24 වැනිදා පොලිසියට ගියා. ඒ යනකොට හම්බන්තොට මෝටර් රථ පරීක්ෂක ඇවිත් හිටියා. අනිත් ටිපර් එක වෙනුවෙන් ඕ.අයි.සී.නවරත්න මහත්තයා පෙනී හිටියේ. අපේ වාහනය බලන්නත් කලින් මෝටර් රථ පරීක්ෂක "ආ මේ අර හොර වාහනය නේද" කියලා ඇහුවා. ඒ වෙලාවේ මම ඇහුවා "කොහොමද සර් බලන්නෙත් නැතිව මේක හොර එකක් කියන්නේ" කියලා.එතකොට මෝටර් රථ පරීක්ෂක කිව්වා "මට මේක ගැන ඕ.අයි.සී.මහත්තයා කිව්වා කියලා. ඔහු අපේ වාහනයේ එන්ජින් අංක බලලා කිව්වා "මේක අලුතින් කොටලා වගේ තියෙන්නේ" කිව්වා. මම කිව්වා "එහෙම වෙන්න බෑ" කියලා.ඒ ගමන්ම අනිත් වාහනය බැලුවා.ඒ වාහනයේ එන්ජින් අංකයක් තිබුණෙම නෑ. මම කිව්වා සර් "හොර වාහනය මේකනේ. මගේ වාහනයේ ලියකියවිලි හරියටම තියෙනවානේ" කියලා. "මේක ඒ තරම් ප්‍රශ්ණයක් නෙමේ තමුසේ කටවහගන්නවා" කියලා ඒ වෙලාවේ මට ඕ.අයි.සී.බැන්නා. "වාහන අංක ඇතුළු සියලුම ලියකියවිලි තියෙන මගේ වාහනයේ ප්‍රශ්ණයක් තියෙනවා. ඒ මොකක්වත් නැති මේ අනිත් වාහනය අවුලක් නෑ කියන්නේ මේ අසාධාරණ කතාව මොකක්ද සර් "කියලා මම ඒ වෙලාවේ ඇහුවා."මේ වාහන දෙකේම ප්‍රශ්ණ තියෙනවා.දෙපාර්ශවයටම රුපියල් 50,000 බැගින් දඩ ගහන්න කියලා මම ලියලා යනවා" කියලා මෝටර් රථ පරීක්ෂක කිව්වා.පස්සේ ඕ.අයි.සී. මට කිව්වා "මේ විදියට මට මේ වාහන දෙක නිදහස් කරන්න බෑ.දෙකම රස පරීක්ෂකට යවනවා" කියලා. අපි ගෙදර ආවා. රස පරීක්ෂකට යවනවා කිව්ව වාහන දෙකෙන් අපේ එක තියෙද්දී 25දා රෑ ඕ.අයි.සී.අනිත් වාහනය මුදා හැරියා. මම 26 වෙනිදා තංගල්ල කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී රවීන්ද්‍ර අඹේපිටිය මහතාට මේ ගැන පැමිණිල්ලක් කළා. එදාම ඕ.අයි.සී. නවරත්න මහත්තයා කිලිනොච්චිය ප්‍රදේශයට ස්ථාන මාරු කළාට පස්සේ පොලිසියේ වැඩ බැලුවේ රංජන් කියලා මහත්තයෙක්. 27දා උදේ මම පොලිසියට ගිහින් රන්ජන් මහත්තයාගෙන් ඒ ගැන ඇහුවම කිව්වා "මම වැඩ කරන්නේ මට ඕන විදියට මිසක් තමුසෙට ඕන විදියට නෙමෙයි.මගේ බලතල අනුව මම ඒ වාහනේ යැව්වා" කිව්වා. පසුව මට දැනගන්න ලැබුනා නවරත්න මහත්තයා ට්‍රාන්සර් යන්න කලින් ඒ ටිපර් එක නිදහස් කරලා කියලා."

ඒ අතරේදී මුතුමාලගේ එක් පුතකුට ඔවුන්ගේ ටිපර් රථයේ ගැටුණු අනෙක් ටිපර් රථයේ අයිතිකරු තර්ජනය කර ඇත්තේ ඔවුන්ගේ ටිපර් රථය රාජසන්තක කරන බවටය. ඒ අනුව මුතුමාලගේ පුතු එදිනම කිරින්ද පොලිසියට ඒ පිළිබඳ පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති අතර පැමිණිල්ල විභාග කිරීමට පොලිසියට පැමිණෙන ලෙස දක්වා තිබේ. ඒ අතර කිසියම් අවශ්‍යතාවකට පොලිසියට ගිය මුතුමාලගේ හිතවතකු දැක ඇත්තේ පොලිසිය බාස් කෙනෙකු ගෙන්වා ඔවුන්ගේ වාහනයේ කිසිවක් කරමින් සිටින බවයි.


සිද්ධිය පිළිබඳ ඇමැති චමල් රාජපක්ෂ කරුණු විමසමින්

"අපි යද්දි පොලිසියේ ගේට්ටුවත් වහලා තිබුණේ. මම කෑගහගෙන ගියා නඩු භාණ්ඩයක් කියලා තියාගෙන වාහනේට මේ මොකද කරන්නෙ කියලා. එතකොට කිව්වා ඕ.අයි. සී මහත්තයා කිව්වා කියලා ස්ටාට් වෙනවද කියලා බලන්න කිව්වා කියලා. වැඩ බලන ඕ.අයි.සී මහත්තයා අපිට ගෙදර ගිහින් හවස 4ට එන්න කිව්ව නිසා හවස 4ට මම කසුන් පුතා එක්ක පොලිසියට ගියා. ඒ ගිහින් ටික වෙලාවක් ඉන්නකොට වැඩබලන ඕ.අයි.සී. මහත්තයා ඇවිත් මාවයි පුතාවයි කාමරයකට අරන් ගිහින් දොර වැහුවා. එතැන තව නිලධාරීන් 7ක් හිටියා"

එහිදී මුතුමාලටත් කසුන්ටත් සිදු වූයේ වැඩබලන පොලිස් ස්ථානාධිපතිගේ සහ අනෙක් නිලධාරීන්ගේ ගුටි පූජාවකට ලක්වීමට ය.

"ගහලා ඉවර වෙලා මට වැඩ බලන ඕ.අයි.සී. කිව්වා මේ වාහනය මම රාජසන්තක කරනවා. ගෙදර තියෙන ටිපර් එකත් උබලා විකුණන්න ඕනේ.ආයේ වැලි බිස්නස් කළොත් ගෙදරට කුඩුයි බෝම්බයි දාලා බෝම්බ බලන්න ආව විදියට ඇවිත් උබලට වෙඩි තියනවා කියලා බනින ගමන් හොඳටම ගැහුවා. ඊට්පස්සේ අපි දෙන්නව කූඩුවට දැම්මා.ටික වෙලාවකින් ආයෙත් මාව නිරුවත් කරලා පහර දුන්නා. වැඩ බලන ඕ.අයි.සී. මහත්තයා අනිත් නිලධාරීන්ට මගෙ කකුල කඩන්න කිව්වත් ඒ අය කිව්වා අනේ සර් ඒක නම් කරන්න බැහැ කියලා. "

පිය පුතු දෙදෙනා පොලිසියෙන් පහර කෑමට ලක්ව සිටින බව දැනගෙන නිවැසියන් පොලිසියට පැමිණියද ඔවුනට ඒ සඳහා ඉඩ නොලැබුණ බැවින් ඔවුන් වහාම ඇමති චමල් රාජපක්ෂට ඒ බව දැනුම් දී තිබේ. ඇමතිවරයා ඒ පිළිබඳ සහකාර පොලිස් අධිකාරිවරයාට දැනුම් දීම නිසා තමාගේ දිවි ගැලවුණු බව මුතුමාල පැවසීය. ඒ වන විට පහරකෑමෙන් අසාධ්‍ය තත්ත්වයට පත් මුතුමාල සහ කසුන් සුවසැරිය ගිලන් රථයකින් දෙබරවැව රෝහලට යැවුණු අතර මුතුමාල එතැනින් හම්බන්තොට මහ රෝහලට යැවිණ.එහෙත් පොලිසියේ ඉල්ලීම මත හම්බන්තොට මහේස්ත්‍රාත් අධිකරණයේ වැඩබලන මහේස්ත්‍රාත් ආරියසේන විසින් මුතුමාල සහ පුතු කසුන් පසුගිය 11 වැනිදා දක්වා රක්ෂිත බන්ධනාගාරගත කෙරිණ.

පසුගිය දා තිස්සමහාරාම යටාල රජමහා විහාරස්ථානයේදී පැවති ජනතා ගැටලු විසඳීමේ ජංගම සේවයට ඇමති චමල් රාජපක්ෂ පැමිණි අවස්ථාවේදී මුතුමාල තමන්ට අත්විඳීමට සිදුවූ අසාධාරණය සම්බන්ධයෙන් කරුණු කීවේය. ඒ අවස්ථාවේදීම ඇමතිවරයා පොලිසියේ උසස් නිලධාරීන් අමතා එම සිදුවීම පිළිබඳ කඩිනම් පරීක්ෂණයක් පවත්වා වාර්තාවක් ලබාදෙන ලෙස නියෝග කළේය.

සිද්ධිය සම්බන්ධයෙන් තංගල්ල පළාත භාර නියෝජ්‍ය පොලිස්පති ඩී.ජගත් පලිහක්කාර මහතාගෙන් කළ විමසීමේදී ඔහු පැවසුවේ එම අමානුෂික පහර දීම සම්බන්ධයෙන් සහකාර පොලිස් අධිකාරිවරයකුගේ ප්‍රධානත්වයෙන් පුළුල් පරීක්ෂණයක් ආරම්භ කර අදාළ සිදුවීම සම්බන්ධයෙන් මූලික ප්‍රකාශ ලබාගත් බවයි. වැඩිපුර ප්‍රකාශ ලබා ගැනීමෙන් පසු වැරදි කරුවන්ට දඬුවම් කිරීමට පියවර ගන්නා බවත් මේ වන පහර දීම සිදුකළ බව කියන පොලිස් නිලධාරියා වෙනත් ස්ථානයකට මාරුකර යැවීමට කටයුතු කර තිබෙන බවද හෙතෙම සඳහන් කළේය.

● ලලිත් චාමින්ද - ගාල්ල

# හිනිදුම හඬවා අයෝමා සමු ගනියි

**දිනය ඉකුත් අඟහරුවාදා ය. වේලාව පස්වරු 1.00ට පමණ පාසල් ගොස් සිටි තම දියණියන් දෙදෙනා සමඟ ප්‍රියන්ත කුමාර ත්‍රිරෝද රථයෙන් තවලම තලන්ගල්ලේ පිහිටි තම නිවසට පැමිණියේය. නිවසේ ඉදිරිපස දොර වසා තිබුණි. ප්‍රියන්තගේ බිරිය අයෝමා වෙනදා මෙන් දියණියන් පිළිගන්නට පෙරමඟට ආවේ නැත. "තාත්තේ අම්මා කෝ " දියණියන් දෙදෙනා අසන්නට වුහ. ප්‍රියන්ත දොර විවර කළේ කුහුලෙනි. ඔහුත් දියණියන් දෙදෙනාත් නිවසේ ඒ මේ අත ඇවිදමින් අයෝමා සොයන්නට වුහ. අවසන ඔවුන්ට අයෝමා හමු විය. ඇය නාන කාමරයේ වැටී සිටියා ය.**


## අනිච්ඡාවත සංඛාරා !



## ආචාර්ය දයා හේවාපතිරණ

දමයන්තිගේ ආදරණීය ස්වාමියා වූද, අප්සරා සහ සේසත්ගේ ආදරණීය පියාණන් වූද, ආචාර්ය දයා හේවාපතිරණ මහතා වයස අවුරුදු 84ක් ආයු වළඳ සිය වාසස්ථානය වූ කැනඩාවේ රිච්මන්ඩ් (වැන්කුවර්) නගරයේ දී 2020 සැප්තැම්බර් මස 11 වැනි දින අභාවප්‍රාප්ත වූයේය. නැසීගිය හේවාපතිරණ දම්පතීන්ගේ පුතෙකු වූ ඔහු චිත්‍රා (නැසීගිය), අයිරාංගනී (නැසීගිය), ජයසේන (නැසීගිය), සරත්, ජීවා (නැසීගිය ), අයිවි, නීල්, රන්ජිත් සහ ජානකීගේ සොහොයුරා විය.

පොදු රාජ්‍ය මණ්ඩලීය (එම්.ඒ.- එංගලන්තය) සහ ෆුල්බ්‍රයිට් (ආචාර්ය උපාධිය -ඇමරිකාව) ශිෂ්‍යත්වලාභියෙකු වූ ආචාර්ය දයා හේවාපතිරණ මහතා පාරිසරික කළමනාකාරිත්වය සම්බන්ධයෙන් විශේෂඥයෙක් විය. විද්‍යෝදය (ශ්‍රී ජයවර්ධනපුර සරසවිය, සියරා ලියෝන්හි Fourah Bay සරසවිය, සැම්බියානු ජාතික සරසවිය සහ කෙන්යානු සරසවිය යන උසස් අධ්‍යාපන ආයතනයන්හි දේශකවරයෙකු ලෙස සේවය කළ ඔහු ශ්‍රී ලංකාවේ සහ කෙන්යාවේ ජාත්‍යන්තර සංවර්ධන පර්යේෂණ ගණනාවක මූලිකත්වය ගෙන කටයුතු කළේය. එමෙන්ම කැනඩාවේ ඇල්බර්ටා ප්‍රාන්තයේ සහ කැනේඩියානු මධ්‍යම රජයේ ප්‍රතිපත්ති සැලසුම් කාර්යයන්හි ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු ලෙස ඔහුගේ දයකත්වය කැපී පෙනුණේය . සිය ජීවිතයේ සැඳෑ සමයේ දී ඔහු ශ්‍රී ලංකා ජනාධිපතිවරයාගේ උපදේශකවරයෙකු ලෙස සිය මව්බිමට සේවය සැපයුවේය.

ආචාර්ය දයා හේවාපතිරණගේ වෘත්තිමය සහ අධ්‍යාපනික සේවාවට අමතරව තමන් සේවය සැපයූ සෑම රටකම පාහේ බෞද්ධ ආයතන පිහිටුවීමට මූලිකත්වය ගෙන කටයුතු කරමින් ශ්‍රී ලාංකීය සංස්කෘතියේ ප්‍රෞඪත්වය අන්තර්ජාතික තලයට ගෙන ඒමට දැක්වූ දයකත්වය අති මහත්ය. හෙළ සංස්කෘතිය සහ ලාංකීය සිතුවම් කලාව සම්බන්ධයෙන් ඔහු තුළ වූ දැනුම් සම්භාරය හේතුවෙන් බෞද්ධ සිතුවම් සම්ප්‍රදය ලොවට පෙන්වා දෙමින් කැනඩාවේ ප්‍රධාන නගරවල සහ ඇමරිකාවේ නිව්යෝර්ක් නුවර එක්සත් ජාතීන්ගේ සංවිධාන මූලස්ථානය ප්‍රමුඛ විවිධ රටවල ඔහු විසින් පවත්වනු ලැබූ අන්තර් ජාතික ප්‍රදර්ශන බොහෝ පිරිසකගේ අවධානයට පාත්‍ර වූ බැවින් හෙළ කලාවේ අභිමානය ලොව පුරා පැතිර යන්නට එයින් ලැබුණු දයකත්වය ඉමහත්ය. එමෙන්ම ඔහු විසින් අධ්‍යක්ෂණය කර නිෂ්පාදනය කරනු ලැබූ වාර්තාමය සිනමා පටය සම්මානයට පාත්‍ර වූවා සේම කැනඩාවේ ටොරොන්ටෝ ප්‍රමුඛ විවිධ නගරවල සහ ලොව පුරා රටවල් ගණනාවක ප්‍රදර්ශනය කෙරුණේය. ලාංකීය බෞද්ධ සිතුවම් කලාවේ මහිමය විදහා දැක්වෙන ස්ථිර කලාගාරයක් පිහිටුවීමට මුල් වූ ආචාර්ය දයා හේවාපතිරණ **"ශ්‍රී ලංකාවේ විහාරාශ්‍රිත සිතුවම් කලාව"** නමින් අගනා බෞද්ධ ග්‍රන්ථයක් සම්පාදනය කළේය.

ආචාර්ය හේවාපතිරණගේ ශාස්ත්‍රීය, සාමාජීය, සංස්කෘතිකමය සහ ආගමික මෙහෙවරට අමතරව ඔහු ඇසුරු කළ හැම දෙනාගේම සිත් තුළ ඔහු පිළිබඳ මතකය ඉතිරි වී ඇත්තේ අතිශය නිර්මාණශීලී, කාරුණික සහ පරිත්‍යාගශීලී හදවතකින් යුත් සිත උතුරා ගිය උණුසුම් ලෙංගතු හැඟීමකින් පිරිපුන් දයාබර මිනිසෙකු ලෙසය. සිය පවුලේ සාමාජිකයන්ට පමණක් නොව ඔහු වාසය කළ විවිධ දේශයන්හි ඔහු ඇසුරු කළ හැම දෙනාටම ආචාර්ය දයා හේවාපතිරණ පහන් කණුවක්ම විය. ඔහුගේ වියෝව හද කම්පා කළත් ඔහු විසින් ඉතිරි කරනු ලැබූ උතුම් මතකය සහ අමිල මෙහෙවර ඔහුගේ සෙවණ ලැබූ කිසිවෙකුගේ සිත් තුළින් සඳ නොමැකෙනු ඇත. අපෙන් වියෝ වූ ආචාර්ය දයා හේවාපතිරණ මහතා උතුම් වූ අමා මහ නිවනින් සැනසේවා!

**දේහය පිළිබඳ අවසන් කටයුතු සහ විස්තර සඳහා +1-604-241-0515 සහ 1-604-341-8013 යන දුරකථන අංක හෝ dayahewafuneral@gmail.com අමතන්න.**


ප්‍රියන්ත ඇය රෝහලට ගෙන යෑමේ අරමුණින් වහාම 1990 හදිසි ගිලන් රථ සේවය ඇමතුවේය. හදිසි ගිලන් රථයක් සමඟ ප්‍රියන්තගේ නිවසට පැමිණි කාර්ය මණ්ඩලය නාන කාමරයේ වැටී සිටි අයෝමා පරීක්ෂා කළහ. "ඇය මිය ගිහින්" ඔවුන් එසේ කියද්දී සිය බිරියට අත්ව ඇති ඉරණම අදහාගත නොහැකිව ප්‍රියන්ත විලාප තබන්නට විය. ඒ සමඟ අසල්වැසියන් මෙන්ම ඥාති හිතවතුන්ද ප්‍රියන්තගේ නිවසට එක්රොක් වුහ. වහාම අයෝමා හිනිදුම රෝහල වෙත රැගෙන යනු ලැබූ අතර ඇය මිය ගොස් ඇති බව රෝහල විසින් සනාථ කළේය.

පශ්චාත් මරණ පරීක්ෂණ කටයුතු සඳහා අයෝමාගේ දේහය කරාපිටිය ශික්ෂණ රෝහල වෙත රැගෙන එනු ලැබිණි. අයෝමාගේ මරණය සැක සහිත බව පවුලේ ඥාතිහු හිනිදුම පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක එම්.ටී. පත්ම කුමාර වෙත පැමිණිලි කළහ.

"මම එදා උදේ ඉඳලා දහවල් වන තුරු අයෝමා එක්ක තේ වත්තේ දළු කැඩුවා. පසුව මම දුවලා දෙන්නව ගේන්න ත්‍රිරෝද රථයෙන් නිවසින් පිටත් වෙලා ගියා. චූටි දුව පෙර පාසලෙන් අරගෙන ලොකු දෝණිගේ පාසල ඇරෙනතෙක් ජස්මින් වැලි ප්‍රදේශයේ තියෙන මගේ නිවසට වෙලා හිටියා. අපි ගෙදර ආවට පසේ තමයි අයෝමා නාන කාමරයේ වැටිලා ඉන්නවා දැක්කෙ"

ප්‍රියන්ත පොලිසියට එසේ කීවද ඔහු කී සියල්ල පොලිස් නිලධාරීන් විසින් පිළිගත්තේ නැත. අයෝමාගේ සිරුරේ තුවාල කිහිපයක්ද විය. අයෝමාගේ මරණය සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් පරීක්ෂණයක් පැවැත් වීමට පොලිසිය කටයුතු අතර උඩුගම ප්‍රධාන මහේස්ත්‍රාත් සංජීව විජේසිංහ විසින් මූලික මහේස්ත්‍රාත් පරීක්ෂණය සිදුකරනු ලැබිණ.කරාපිටිය ශික්ෂණ රෝහලේ සහකාර අධිකරණ වෛද්‍ය නිලධාරි සමාධි දන්දෙණිය විසින් සිදු කළ පශ්චාත් මරණ පරීක්ෂණයේදී අනාවරණය වූයේ අයෝමාගේ මරණය සිදුව ඇත්තේ ගෙල සිරකිරීමෙන් බවය. ඒ අනුව හිනිදුම පොලිස් ස්ථානාධිපති එම්.ටී. පත්මකුමාරගේ උපදෙස් මත මෙකී ඝාතනයේ සුලමුල අනාවරණය කරගැනීමේ වගකීම අපරාධ අංශයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක දුනවිල බණ්ඩාර වෙත පැවරිණි.

ප්‍රධාන පොලිස් පරීක්ෂක දුනුවිල බණ්ඩාර විසින් ප්‍රියන්තගෙන් ප්‍රශ්න කළේය. අයෝමා දූෂණය කොට ඇය ඝාතනය කරන්නට ඇත්තේ පිටස්තර පුද්ගලයකු බවට එත්තු ගැන්වීමට ප්‍රියන්ත දැඩි උත්සාහයක නිරතව සිටියේය. එහෙත් ප්‍රධාන පොලිස් පරීක්ෂක දුණුවල බණ්ඩාර මහතාගේ උපක්‍රම හා උපායශීලීත්වය හමුවේ ප්‍රියන්තගේ උත්සාහය සාර්ථක නොවීය. අවසානයේ ඔහු සිදුවූ දේ පොලිසිය ඉදිරියේ පාපොච්චාරණය කළේය. ඒ අනුව එම අපරාධයේ සුලමුල අනාවරණය වූයේ මේ අයුරිනි.

තවලම තලන්ගල්ල ප්‍රදේශයේ පදිංචි මුතුහේට්ටගමගේ ප්‍රියන්ත කුමාර හතලිස්පස් හැවිරිදි වියේ පසුවිය. හේ දක්ෂ චිත්‍ර ශිල්පියෙකි. පසුගිය කාලයේ තවලම ප්‍රදේශයේ අඳිනු ලැබූ චිත්‍රවලින් වැඩි ප්‍රමාණයක් අඳිනු ලැබුවේ ප්‍රියන්ත කුමාර විසිනි. කලා අංශයෙන් උසස්පෙළ සමත් වූ ප්‍රියන්ත තේ කම්හලක සහකාර කළමණාකරුවකු ලෙස කලක් සේවය කළේය. පසුව නාවික හමුදාවට එක්වී වසර 5ක් නාවික හමුදාවේ සේවය කළ ඔහු පසුව විදේශගත විය. සවුදි අරාබිය, කටාර් ඩුබායි යන රටවල වසර 9ක පමණ කාලයක් විවිධ රැකියාවන් කළ


අයෝමා අවසන ගමන් ගිය නාන කාමරය

**සැකකරු දක්ෂ චිත්‍ර ශිල්පියෙක්**

**අවුරුද්දකට කලිනුත් පවුල් ආරවුල් සම්බන්ධයෙන් පොලිසියට පැමිණිල්ලක්**

**සැකකරු ලබන 9 වැනිදා දක්වා රක්ෂිත බන්ධනාගාරයට**

ප්‍රියන්ත වරින් වර මෙරටට පැමිණියේය.

මේ අතරතුර නාවලපිටිය ප්‍රදේශයේ කාන්තාවක් හඳුනා ගත් ඔහු ඇය සමඟ යුග දිවියට පිවිසුණේය. ඒ විවාහයෙන් ඇයට වයස අවුරුදු 16 දරුවකු සිටින අතර ඔහු ගාල්ල පිලාන පින්නදුව ප්‍රදේශයේ පදිංචි අයෝමා සමඟ විවාහ වන්නේ පළමු බිරියගෙන් දික්කසාද වීමෙන් පසුවය.

අයෝමා සහ ප්‍රියන්තගේ වැඩිමහල් දියණිය පළමු වසරේ ඉගෙනුම ලබන්නීය.බාල දියණිය තුන් හැවිරිදිය. ටික කලක් යනවිට ප්‍රියන්ත සහ අයෝමා අතර නිතර ආරවුල් ඇති විය. ඇතැම් අවස්ථාවලදී අයෝමා ප්‍රියන්ත සමඟ අමනාප වී මහගෙදරට ගිය අවස්ථාවන්ද තිබුණි. මීට වසරකට පමණ ඉහතදී හිනිදුම පොලිසියටද අයෝමා හා ප්‍රියන්තගේ පවුල් ආරවුලක් සම්බන්දයෙන් පැමිණිල්ලක් ලැබී තිබුණි. ඔවුන් දෙදෙනා අතර ආරවුල් දිනෙන් දින වැඩිවද්දී කාලයක සිට එකිනෙකා සමඟ බද්ධ වෛරයෙන් පසු විය. ප්‍රියන්ත ඉතා සූක්ෂම අයුරින් අයෝමා ඝාතනය කිරීමට සැලසුම් කරන්නේ ඒ අනුවය.

එහෙත් ප්‍රියන්තගේ සැලසුම් ප්‍රධාන පොලිස් පරීක්ෂක දුණුවිල බණ්ඩාර මහතා ඉදිරියේ ලප්තැනම ලොප් වී ගියේය. අයෝමා ඝාතනය කිරීමේ කථාන්දරයේ පිටපත හා තිර රචනය පමණක් නොව ප්‍රධාන නළුවාගේ චරිතයට පණ පොවා පොලිසිය නොමග යැවීමට ප්‍රියන්ත කටයුතු කළේය. විකෘති ලිංගික ආශාවලින් යුතු කාන්තාවන්ට දැඩි ලෙස ලොල් අයකු වූ ප්‍රියන්තගේ ජංගම දුරකථනයේ තිබී අසැබි දර්ශන ද පොලිසිය විසින් සොයා ගත්තේය.


ඝාතනයට ලක්වූ අයෝමා විවාහ වූ දා

ඝාතනයට ලක්වූ දින දරු දෙදෙනා පාසල් ගිය පසු අයෝමා නාන කාමරයට ගිය පසු ප්‍රියන්තද එයට ඇතුළු විය. ඔහු ඇය සමඟ පොර බදන විට. අවස්ථා දෙකකදී පමණ අයෝමා නාන කාමරය තුළ ඇද වැටුණාය. ඇය එසේ අඩපණ වූ පසු ප්‍රියන්ත කළේ අයෝමගේ හුස්ම යන තෙක් ඇගේ ගෙල නානා කාමරයේ වූ වතුර පිරවූ බේසමට ඔබාගෙන සිටීමය. අනතුරුව නාන කාමරයේ ජල කරාමය හැර දමා දරු දෙදෙනා රැගෙන ඒමට ත්‍රිරෝද රථයෙන් පාසල වෙත ගියේය. අයෝමාගේ ඝාතනය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් ප්‍රියන්ත කුමාර උඩුගම ප්‍රධාන මහේස්ත්‍රාත් සංජීව විජේසිංහ වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ලබන 9 වැනිදා දක්වා රක්ෂිත බන්ධනාගාරගත කරනු ලැබීය.

ගාල්ල කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී වික්‍රම් ගිණිගේ, හිනිදුම ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී සිසිල කුමාර, හිනිදුම පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක නීල් පත්මකුමාර යන නිලධාරීන්ගේ උපදෙස් මත අපරාධ අංශයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක දුණුවිල බණ්ඩාර, උප පො. ප සුනිල්, පො සැ 34604 පුෂ්පකුමාර පො සැ 3073 චන්දන, පො සැ 30859 සතිස්චන්ද්‍ර, පො සැ 58417 වනිගරත්න, පො.කො 86428 බුද්ධික යන නිලධාරීන් විසින් විමර්ශන කටයුතු සිදු කරනු ලැබීය.




# කිලෝමීටර් ලක්ෂයක් හදන ගම දිනවන අලුත් ගමන

● නිහාල් පී. අබේසිංහ

**"ඇමතිතුමා මේ වට්ටක්කා කිලෝ 1ක් ගමට ඇවිල්ලා මුදලාලිලා ගෙනියන්නේ කිලෝවක් රු. 10 - 15කට. ඒත් තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථානයට අරන්ගියා නම් කිලෝ එකකට රු. 30ක් 40ක් ගන්න තිබුණා. ඒත් අපේ ගමේ පාරවල් ටික අබලන් නිසා අත්ට්‍රැක්ටරයක්වත් ලොරියක්වත් මේ ගමට එන්න විදියක් නැහැ. ගමේ පාර කැඩිලා වළවල් හැදිලා ගමනාගමනය හරියට දුෂ්කර වෙලා. බොහොම අමාරුවෙන් එන්නේ ලොකු ට්‍රැක්ටරයක් විතරයි. පින්සිද්ධ වෙයි අපි ආණ්ඩුවෙන් ඉල්ලා සිටින්නේ අපිට මේ පාර හදා දෙන්න කියන එක විතරයි."**

මේ පසුගියදා තඹුත්තේගම සිට කිලෝමීටර් 10ක් 12ක් ඈතින් පිහිටි රජරට ගම්මානයකට ගිය මොහොතේ එහි ගම්වැසියන් ප්‍රදේශයේ ඇමතිවරයකුගෙන් කළ ඉල්ලීමකි.

අද අපේ රටේ ග්‍රාමීය ජනතාවගේ දුප්පත්කමට ප්‍රධාන හේතුව වී ඇත්තේ ඒ ගම්වලට යාමට ඒමට හරියට මාර්ගයක් නොමැතිකමයි. ගමේ ගොවි ජනතාවට ඒ නිසා තම කෘෂි නිපැයුම් හරි මුදලකට විකුණා ගැනීමට අපහසුය. ඒවා ආර්ථික මධ්‍යස්ථානයකට රැගෙන යාමට පාර අබලන් නිසා ගමට ලොරියක් හෝ අත්ට්‍රැක්ටරයක් එන්නේ නැත. ඒ නිසා පිටින් එන අතරමැදි වෙළෙන්දාට ඔවුන්ගේ කෘෂි නිෂ්පාදන හැමදාම විකුණන්නට ලැබෙන්නේ කුණුකොල්ලයටය. ඒ නිසා ගමේ ජනතාව හැමදාම දුප්පතුන් ලෙසට සිටිති. ඒ මේ මාර්ග ගැටලුව නිසාමය.

පසුගිය මැතිවරණ සමයේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා මැතිවරණ ව්‍යාපාරයේ යෙදෙන අතරම ජනතා ප්‍රශ්නවලට ඉතා හොඳින් ඇහුම්කන් දුන්නේය. ග්‍රාමීය ජනතාව අතරින් ඉදිරිපත් වූ ලොකුම ගැටලුව වූයේ ග්‍රාමීය මාර්ග ඉතා අබලන් තත්ත්වයේ පැවතීමයි. ග්‍රාමීය ජනතාව දුගී බවින් අත්මිදී ඉහළට ගන්නට නම් මේ ග්‍රාමීය මාර්ග හා අර්ධ ග්‍රාමීය මාර්ග පද්ධතිය පූර්ණ ලෙස සංවර්ධනය කළ යුතු බව ජනාධිපතිතුමා තීරණය කළේය. ඒ සමගම ග්‍රාමීය ප්‍රදේශවල ඇති ජීවිත පරදුවට තියා දරුදැරියන් හා වැඩිහිටියන් එහා මෙහා යන ඒදඬු හා වැල්පාලම් වෙනුවට ස්ථිර පාලම් ඉදිකිරීමට ද එතුමා තීරණය කළේය.

ඒ අනුව ජනතා ජයග්‍රහණයෙන් පසු 'සෞභාග්‍යයේ දැක්ම' ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව රට පුරා දීපව්‍යාප්තව මාර්ග කිලෝමීටර ලක්ෂයක් හා පාලම් 5000ක් ඉදිකිරීමට ජනාධිපතිතුමා අදාළ බලධාරින්ට හා නිලධාරින්ට උපදෙස් දී ඇත. ඒ අනුව දැනටමත් එම කටයුතු ආරම්භවී තිබේ.

මේ යටතේ රට පුරා ග්‍රාමීය මාර්ග, අතුරු මාර්ග, නගරයට ප්‍රවේශ වීමේ මාර්ග, පළාත් සභා මාර්ග, වතු මාර්ග හා ප්‍රාදේශීය සභා මාර්ග ආදී සියලු මාර්ග කිලෝමීටර් ලක්ෂයක් ඉදිකිරීමට කටයුතු යොදා තිබේ. එම නව මාර්ග පද්ධතිය 2024 වන විට අවසන් කර ජාතික මාර්ග පද්ධතියට ඒකාබද්ධ කළ යුතු බවද ජනාධිපතිතුමා උපදෙස් දී ඇත.

මෙහි සියලු වගකීම් නිලධාරින් විසින් භාරගෙන කළ යුතු බවද අවධාරණය කරන ජනාධිපතිතුමා සෞභාග්‍යයේ දැක්ම වැඩසටහන යටතේ ග්‍රාමීය ආර්ථිකය ගොඩනැඟීමට ප්‍රමුඛස්ථානය ලබාදිය යුතු බවද පෙන්වාදී ඇත.

ආර්ථික ලෙස රටක් සංවර්ධනය කිරීමේදී එරට මහා මාර්ග දියුණුව ඉහළ මට්ටමක පැවතීම ඉතා අත්‍යවශ්‍ය සාධකයක් බව ආර්ථික විශේෂඥයන්ගේ මතයයි.

සුව පහසුවෙන් ඉක්මණින් හා ආරක්ෂාකාරීව තම ප්‍රවාහන අවශ්‍යතා සපුරාගැනීම සෑම පුරවැසියෙකුම සතු අයිතියකි. ප්‍රවාහන පද්ධතියේ පසුගාමිත්වය සහ බිඳුණු අන්තර් සම්බන්ධතාව පිටුදැක කාර්යක්ෂම සහ ඉහළ ප්‍රමිතියෙන් යුත් මාර්ග පද්ධතියක් ජනතාවට ලබාදීම "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයෙන් සහතික කර ඇත. ඒ අනුව රට පුරා ග්‍රාමීය හා අතුරු මාර්ග කිලෝමීටර් ලක්ෂයක් ඉදිකිරීමේදී පරිසරය හා පුරාවිද්‍යා ස්ථාන සුරැකෙන පරිදි ඒවා සිදුවිය යුතු බවද ජනාධිපතිතුමා අවධාරණය කර තිබේ.

කුඩා පාලම්, වැල් පාලම් හා ඒදඬු වෙනුවට අඩි 8 - 10 අතර පළල නව පාලම් ඉදිකිරීමට ද මේ ව්‍යාපෘතිය යටතේ කටයුතු යොදා ඇත. ජනපතිගේ උපදෙස් පරිදි මාර්ග ඉදිකිරීමේදී යොදා ගන්නා පස්, වැලි, ගල් ආදිය අවශ්‍ය ප්‍රමාණයෙන් සපයා දීමේ වගකීම සියලු දිස්ත්‍රික් ලේකම්වරුන්ට පවරා ඇත.

ඉදිකිරීම්වලට කිසිඳු බාධාවක් සහ ප්‍රමාදයක් ඇතිවීමට ඉඩක් නොතැබිය යුතු යැයිද ජනාධිපති රාජපක්ෂ මහතා අවධාරණය කර ඇත. මාර්ග ඉදිකිරීමේ අධීක්ෂණය රජය හා කොන්ත්‍රාත්කරු යන පාර්ශ්ව දෙකෙන්ම විය යුතු අතර උපකොන්ත්‍රාත් දීමට කිසිවිටෙකත් ඉඩ නොදිය යුතු බවටද ජනාධිපතිතුමා උපදෙස් දී ඇත.

යටත්විජිත යුගයේ මුල් අවදියේ අපේ රටේ තිබුණේ ගුරු පාරවල් පමණි. පසුව යටත්විජිත පාලන කාලයේ අවසාන වසරවලදී තාර පාරවල් ඉදිකිරීම ආරම්භ විය. මෑත කාලයේ වැඩිම මාර්ග ප්‍රමාණයක් කාපට් කර ඉදිකළේ 2005 - 2015 අතර මහින්ද රාජපක්ෂ මහතා ජනපති ලෙස කටයුතු කළ පාලන කාලයේදීය. රටේ සියලු ප්‍රධාන මාර්ග ඒ සමයේ කාපට් මාර්ග බවට පත්විය. උතුරු නැගෙනහිර යුද්ධයක් තිබුණත් පාලම් පාරු ගණනාවක් හරහා ගමන් කළ නැගෙනහිර ජනතාවට ඉහළම ප්‍රමිතියෙන් යුතු කාපට් මාර්ග පද්ධතියක් ලබා දීමට මහින්ද චින්තනය යටතේ කටයුතු කළේය.

ඊට අමතරව ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාව තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යසාධක බළකායේ සභාපති බැසිල් රාජපක්ෂ මහතා 2010 දී ආර්ථික සංවර්ධන ඇමතිවරයා ලෙස බස්නාහිර පළාත ඇතුළු පළාත් ගණනාවක පළාත් සභා පාරවල් ඉතා හොඳ මට්ටමට කාපට් කර ඉදිකරනු ලැබූ බව අපට මතකය. වර්තමානයේද ග්‍රාමීය මාර්ග වැඩිදියුණු කිරීම සඳහා බැසිල් රාජපක්ෂයන් තම දැඩි අවධානය යොමු කර ඇත. විශේෂයෙන් එකළ බස්නාහිර පළාත් සභාවේ මහා මාර්ග ඇමතිවරයා ලෙස සිටි රාජ්‍ය අමාත්‍ය නිමල් ලන්සා මහතාගේ මෙහෙයවීමෙන් බස්නාහිර පළාතේ ප්‍රධාන මාර්ග ඉහළ මට්ටමකට එකල ඉදිවිය.

නමුත් ඊට පසු යහපාලන කාලය අතරතුරදී මහින්ද මහතාගේ රජය ආරම්භ කළ අධිවේගී මාර්ගයක්වත් හරියට අවසන් කරන්නට නොහැකි විය. අන් පාරවල් හැදුවේද ඉබිගමනින්ය. මේ නිසා රටේම මාර්ග පද්ධතියේ අබලන් තත්ත්ව ඇතිවිය.

කෙසේ වෙතත් අද වන විට ශ්‍රී ලංකාවේ මාර්ග පද්ධතියට අයිති මධ්‍යම රජයේ මාර්ග ප්‍රමාණය කිලෝමීටර් 12,496.3 කි. ඉන් කිලෝමීටර් 271.6 ක් අධිවේගී මාර්ග වේ. දකුණු අධිවේගය එහි ප්‍රධාන මාර්ගයයි. එය කිලෝමීටර් 200 කි. ඒ සමගම AA වර්ගයේ ඉහළම ප්‍රමිතියේ මහාමාර්ග කිලෝමීටර 3720.3 ක් මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් නඩත්තු කෙරේ. කොළඹ - රත්නපුර - වැල්ලවාය - මඩකලපුව මාර්ගය AA වර්ගයේ දිගම මාර්ගය වේ. එහි දිග කිලෝමීටර 430.5 කි. ඊට අමතරව මහනුවර - යාපනය සුප්‍රසිද්ධ A - 9 මාර්ගය ද තවත් දිගු මාර්ගයකි. එහි දිග කිලෝමීටර 321 කි.

ඊට අමතරව AB වර්ගයේ මාර්ග කිලෝමීටර 460 ක්ද අපේ රටේ තිබේ. මහියංගණය - දිඹුලාගල - දළුකන්න මාර්ගය ඒ මාර්ග පද්ධතියට එක් උදාහරණයකි. එහි දිග කිලෝමීටර 72 කි. ඊට අමතරව අපේ රටේ AC නම් වර්ගයේ කිලෝමීටර 30.9 ක මාර්ග පද්ධතියක් ද මධ්‍යම රජයට අයිතිව තිබේ.

ඊට අමතරව මාර්ග සංවර්ධන අධිකාරියට හා මධ්‍යම රජයට අයත් B වර්ගයේ විශාල මාර්ග කිලෝමීටර ගණනක් ද අපේ රටේ ඇත. එම මාර්ගවල දිග කිලෝමීටර 8007 කි. ඒවාද නිරන්තරයෙන් මාර්ග සංවර්ධන අධිකාරියෙන් නඩත්තු කෙරේ. බිබිලේ - පිටකුඹුර - නාමල්ඔය - ඉගිනියාගල මාර්ගය ඊට එක් උදාහරණයකි.

කිලෝමීටර ලක්ෂයක් ඉදිකිරීමේ වැඩපිළිවෙළ යටතේ මෙම මධ්‍යම රජයට අයත් ඉහත දැක්වූ මාර්ග පද්ධතිය කිලෝමීටර 5152 ක් ඉදිකරනු ලැබේ. එසේ වුවත් එම වැඩපිළිවෙළ යටතේ ප්‍රමුඛත්වය ලබා දෙන්නේ ග්‍රාමීය පාරවල් ඉදිකිරීමටය.

මේ පිළිබඳව අදහස් දක්වන ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් ඇමැති නිමල් ලන්සා පවසන්නේ මේ අලුත් වැඩපිළිවෙළ යටතේ පළාත් සභා මාර්ග කිලෝමීටර 8000 ක් හා ග්‍රාමීය මාර්ග කිලෝමීටර 95,000 ක් පූර්ණ ලෙස ප්‍රතිසංස්කරණය කර ඉදිකරන බවයි.

ජනාධිතිතුමාගේ හා අගමැතිතුමාගේ උපදෙස් පරිදි මහාමාර්ග ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතාගේ පූර්ණ සහය ඇතිව මෙම වැඩපිළිවෙළ ක්‍රියාත්මක වෙයි.

"ග්‍රාමීය කිලෝමීටර ලක්ෂයක් සංවර්ධනය කොට 2024 වන විට ජාතික මාර්ග පද්ධතියට එක්කිරීමට පැහැදිලි ඉලක්කයක් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා අපට ලබාදී තිබෙනවා. එය අපි ඉටුකරනවා. සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති මාලාවේ පැහැදිලිව සඳහන් කර තිබෙනවා, ග්‍රාමීය මාර්ග කිලෝමීටර ලක්ෂයක් ජාතික මාර්ග පද්ධතිය හා සම්බන්ධ කරනවා කියලා. ඒ කටයුතු සාර්ථකව ඉටුකර ජනතාවගේ ආර්ථිකය නගා සිටුවීමට, සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනය ඇති කිරීමට මෙන්ම ජනතාවගේ එදිනෙදා කටයුතු කෘෂිකාර්මික කටයුතු දියුණු කර ගැනීමට අවශ්‍ය පහසුකම් සැපයීමට අපි කටයුතු කරනවා.

ගම්පහ දිස්ත්‍රික්කයේ මාර්ග පද්ධතිය 90% ක විතර වැඩ දැනටමත් අවසන්. ඉතුරුවෙලා තිබෙන මාර්ග සියල්ල ඉදිරි වර්ෂය අවසන් වන විට ඉදිකිරීමට අපේක්ෂිතයි.

දිනෙන් දින ඉහළ යන ගෝලීය උෂ්ණත්වයට විසඳුමක් ලෙස හා පරිසර සමතුලිතතාව සුරැකීමට අලුතින් ඉදිකරන මාර්ග දෙපස පැළ සිටුවීමේ වැඩසටහන ද මේ සමඟ අප ක්‍රියාත්මක කරනවා." ලන්සා ඇමතිවරයා පවසයි.

"2015 න් පසු මේ රටේ මාර්ග ඉදිකිරීම් අතරමග නතර වුණා. ඒ සංවර්ධන ක්‍රියාදාමය යළි ආරම්භ කරමින් මේ මාර්ග කිලෝමීටර් ලක්ෂය ඉහළම ප්‍රමිතියෙන් යුතුව හා අවම පිරිවැයකින් කිරීමට අපි අපේක්ෂා කරනවා. ග්‍රාමීය මාර්ග සංවර්ධන කරමින් ජාතික මාර්ග පද්ධතිය තුළ දැවැන්ත සංවර්ධනයක් සිදුකරමින් කෘෂි නිෂ්පාදන ආර්ථිකය වඩාත් ශක්තිමත් කිරීම අපේ අරමුණයි." යැයිද රාජ්‍ය ඇමති ලන්සා පවසයි.

මේ පිළිබඳව කරුණු දක්වන ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් මහාචාර්ය රංජිත් දිසානායක මහතා පවසන්නේ මේ වැඩපිළිවෙළ යටතේ මෙරට ග්‍රාමීය පෙදෙස්වල ඇති සියලු මාර්ග මෙරට ඉතිහාසයේ ප්‍රථම වරට එකවරම හැදෙන බවයි.

මේ වැඩසටහන යටතේ ආර්ථික ලෙස වැදගත්කමක් ඇති, කෘෂි නිපැයුම් වෙළෙඳපොළට ගෙන එන හා අධ්‍යාපනික කටයුතුවලට වැඩි සිසු පිරිසක් නගරයට යන එන ග්‍රාමීය මාර්ගවලට ප්‍රමුඛත්වය ලැබෙනවා. මේ වැඩසටහන යටතේ ඉදිරි වසර 4 ඇතුළත රටේ සියලු පළාත් සභා හා ප්‍රාදේශීය සභා පාරවල් හැදෙනවා. මහාමාර්ග ඇමැති ජොන්ස්ටන් ප්‍රානාන්දු හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම් රංජිත් ප්‍රේමසිරි යන මහත්වරු ලබාදෙන පූර්ණ සහායද මෙහිදී අගය කළ යුතුයි." ලේකම්වරයා පැවසීය.

"ජනාධිපතිතුමාගේ උපදෙස් අනුව මෙහිදී පරිසරය සුරැකෙන ලෙස තිරසර ලෙස මේ මාර්ග ඉදිකරමින් පවතිනවා. මේ සඳහා රජය ආසන්න වශයෙන් රුපියල් බිලියන 1500ක් වැය කිරීමට අපේක්ෂිතයි. ඒ මුදල දේශීය බැංකුවලින් ලබා ගන්නයි අදහස. එසේ වුවත් මේ මඟින් අපේ රටේ ගම් නියම්ගම් 14,000 ක ජනතාවට සෙත සැලසෙන බව කිව යුතුයි.

ඒ අනුව මේ ව්‍යාපෘතිය කරන්නේ අපේම සල්ලිවලින්. ඉදිකිරීම් කරන්නේ අපේම රටේ සුදුසුකම් කොන්ත්‍රාත් සමාගම් පමණයි. අදාළ රාජ්‍ය පරිපාලන නිලධාරින් මාර්ග ඉදිකිරීම් අධීක්ෂණය කරනවා. ඒවායේ වැඩ කරන්නේ අපේම රටේ සේවකයන්. ඒ අනුව අප වැය කරන අපේ මුදල යළි ආපසු ලැබෙන්නේ අපේ රටේම අයටයි. පිටරටවලට සතයක්වත් යන්නේ නැහැ.

"මේ යටතේ දැනට මාර්ග කිලෝමීටර 5400 ක වැඩ ආරම්භ කර තිබෙනවා. ඉන් කිලෝමීටර 600 ක වැඩ අවසන්. මේ සියලු මාර්ග අවට දැවමය ශාක පැළ ලක්ෂ 20ක් සිටුවීමට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ වැඩපිළිවෙළක් යොදා තිබෙනවා."

"ඒ සමගම ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි ග්‍රාමීය දුෂ්කර ප්‍රදේශවල පවතින වැල් පාලම් හා ඒදඬු වෙනුවට අලුත් පාලම් 5000ක් ඉදිකරනවා. ඉන් 300ක වැඩ දැනටම අවසන්. ඒවා අද හෙටම ජනතා අයිතියට පත් කරනවා. ලබන වසරේ තවත් පාලම් 1000 ක් හදනවා." රාජ්‍ය ලේකම් මහාචාර්ය රන්ජිත් දිසානායක මහතා පවසයි.

රාජ්‍ය ලේකම්වරයා තවදුරටත් පවසන පරිදි මේ යටතේ මීටර 3ක් පළල එනම් අඩි 11ක් පළල මාර්ගයක් කාපට් කිරීමට රුපියල් මිලියන 14 - 15 ත් අතර මුදලක් වැයවේ. ඒ අනුව මෙතරම් මුදලක් වියදම් කර රජය ඉදිකරනු ලබන මෙම මාර්ග සුරැකීමට අපේ රටේ ජනතාව කටයුතු කළ යුතු බවත් ලේකම්වරයා අවධාරණය කරයි.

මෙම මාර්ග කිලෝමීටර ලක්ෂයේ ව්‍යාපෘති අධ්‍යක්ෂ ඉංජිනේරු නිහාල් ප්‍රේමතිලක මහතා පවසන පරිදි මේ වැඩපිළිවෙළ යටතේ දැනටමත් ගම්පහ - කුරුණෑගල - හම්බන්තොට - මහනුවර යන දිස්ත්‍රික්කවල මාර්ග රැසක් ඉදිවෙමින් පවතී.

"මේ යටතේ අපි ග්‍රාමීය මාර්ග, අතුරු මාර්ග, අභ්‍යන්තර මාර්ග හා ප්‍රධාන මාර්ගවලට ප්‍රවේශ වීමේ මාර්ග සියල්ල හදනවා. ජාතික මාර්ග පද්ධතියේ මාර්ග කිලෝමීටර 5150 ක් පළාත් සභා මාර්ග කිලෝමීටර 8417 ක් හා ග්‍රාමීය මාර්ග කිලෝමීටර 86,433 ක් ඉදිකරන්න සියලු මැනුම් කටයුතු දැනටමත් අවසන්.

මේ ව්‍යාපෘතියේදී අපි තුන් ආකාරයකට මේ පාරවල් හදනවා. ඒ එම මාර්ගය හා ප්‍රදේශයේ ජල බැස යාමේ හා විවිධ උස මට්ටම්වල තත්ත්වය අනුවයි. සමහර පාරවල් කාපට් කරනවා. අනෙක් සමහර පාරවල්වල කොන්ක්‍රීට් කිරීම හෝ අන්තර් සම්බන්ධතා සිමෙන්ති ගල් ඇතිරීම සිදුකරනවා. ග්‍රාමීය මාර්ග පාරවල්වල පළල මීටර 3ට හා පිවිසුම් මාර්ග ආදිය මීටර් 5ක් පළලට ඉදිකරනවා. මේ සඳහා සියලු ඉංජිනේරු සහය මාර්ග සංවර්ධන අධිකාරිය හා මඟ නැගුම ආයතනවලින් ලබා දෙනවා." ඔහු පවසයි.

ව්‍යාපෘති අධ්‍යක්ෂ ඉංජිනේරු නිහාල් ප්‍රේමතිලක මහතා තවදුරටත් පවසන්නේ මෙම ව්‍යාපෘතිය මඟින් විශේෂයෙන් තම කෘෂි නිපැයුම්, තේ හාල් එළවළු ආදිය නගරයට රැගෙන එන ජනතාවට ඉමහත් ප්‍රතිලාභ ලැබෙන බවයි. ඒ මාර්ගවල ගමන්බිමන් ගිය ජනතාවට ආර්ථික ප්‍රවර්ධනයක් ද මේ මඟින් ලැබෙනවා. එයින් ඒ අපේ ග්‍රාමීය ජනතාවගේ දුප්පත්කම තරමක් දුරට හෝ අඩු වනු ඇතැයි අපේ අපේක්ෂාවයි.


ඒ අනුව ගමේ අයට දියුණු වෙන්න හා දරුවන්ට පාසල් යන්න අපේම ඉංජිනේරුවරුන් හා නිලධාරින් එක්වී නිර්මාණය කරන මේ කිලෝමීටර ලක්ෂයේ මාර්ග පද්ධතිය සුරැකීම ඒ මාර්ග දෙපස ජනතාවගේ මෙන්ම ඒවා පාවිච්චි කරන හැමගේම යුතුකමක් බව ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා පෙන්වා දෙයි.



වමේ සිට දකුණට පිළිවෙළින් ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාව තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යසාධක බළකායේ සභාපති බැසිල් රාජපක්ෂ, මහාමාර්ග සංවර්ධන ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දු, ග්‍රාමීය මාර්ග හා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍ය නිමල් ලන්සා, මහාමාර්ග අමාත්‍යාංශ ලේකම් රංජිත් ප්‍රේමසිරි හා ග්‍රාමීය මාර්ග රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් මහාචාර්ය රංජිත් දිසානායක



මහනුවර නිකටන - අලුත්දෙණිය මාර්ගය



මාතර පහළවත්ත මාර්ගය



ඇඹිලිපිටිය තෙල්බානුආර මාර්ගය



මොනරාගල - වැලිමිට්ට මාර්ගය

## ඉතිහාසයේ ප්‍රථම වරට ගමේ පාරවල් සියල්ල එකවර හැදෙනවා
### - රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් මහාචාර්ය රංජිත් දිසානායක

## ගමේම පාරවල්වලට හැඩ ඒදණ්ඩට වැල් පාලමට තිත

## පරිසරය - පුරාවිද්‍යා ස්ථාන සුරකිමින් ප්‍රමිතියට පාරවල් හදන්න ජනපතිගෙන් උපදෙස්

## උසස් ප්‍රමිතියෙන් යුතුව 2024 ට පෙර අවසන් කරනවා
### - රාජ්‍ය ඇමැති නිමල් ලන්සා

## අපේම ශ්‍රමයෙන් හදන මේ පාරවල් සුරැකීම ජනතාවගේ යුතුකමක්
### - ව්‍යාපෘති අධ්‍යක්ෂ ඉංජිනේරු නිහාල් ප්‍රේමතිලක


# කොම්පෝස්ට් පොහොර විකිණීමට ඇත

කොම්පෝස්ට් පොහොර විශාල ප්‍රමාණයක් විකිණීමට ඇත. නයිට්‍රජන් හා පාංශු පෝෂණ පදාර්ථයන්ගෙන් අනූණයි.
ඕනෑම වර්ගයක එළවළු, පළතුරු හෝ මල් වගාව සඳහා සුදුසුයි.
ගිනිගත්හේනෙන් හෝ ගාල්ලෙන් මිලදීගත හැක.

10kg 25kg
ඇසුරුම් වලින් මිලදීගත හැක

## මිලදීගැනීම් සඳහා අමතන්න:

ගිනිගත්හේන 051 492 3374

ගාල්ල 0773 955 547

සිළුමිණ

35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස්, කොළඹ 10.
දුරකථන පොදු: 011-2429429, 011-2421181, 011-2331181
කර්තෘ: 011-2429261 ජ්‍යෙෂ්ඨ සම කර්තෘ: 011-2429263
කර්තෘ මණ්ඩලය: 011-2429262-3-4-5
ෆැක්ස්: 011-2429260 (සිළුමිණ)
ඊ-මේල්: edmediaunit@gmail.com
දැන්වීම් කළමනාකරු: 011-2429351
ලුහුඬු දැන්වීම් කළමනාකරු: 011-2429341-2

වෂී 2020ක් වූ සැප්තැම්බර් මස 27 වැනිදා ඉරිදා

## දූෂණයෙන් තොර රාජ්‍ය සේවයක්! වගකීම් සහගත දේශපාලනයක්!

අශ්වයා පැන ගියාට පසු ඉස්තාලය වසා වැඩක් නැති බව දැන් අපි කී වතාවක් කියා ඇත්තැයි මතක නැත. ඒත් නැවත නැවත කියන්නට සිදුව තිබේ. ඒ කියද්දීත් පෙරහැර ගොස් අවසාන ය. ජීවිත තුනක් පොළව යට වැළලී හමාර ය. ඒ එක් ජීවිතයක් මෙලොව එළිය දැක ගෙවුණේ දවස් 49 ක් පමණී. ඛේදවාචකයට වැඩි වචනයක් එයට කිව හැකි නම් මේ සිද්ධියට කියන්නට වන්නේ ඒ වචනය ය.

මහනුවර, බූවැලිකඩ සංඝමිත්තා මාවතේ පිහිටි පස් මහල් හෝටල් ගොඩනැගිල්ලක් කඩා වැටීමෙන් සිදු වූ අනතුරේ උණුසුම තවත් පහ ව ගොස් නැත. ඇසට නැඟුණු කඳුළු බිඳු වල බර තවමත් බරකි. මෙවැනි සිදුවීම් ගණනාවක් ම සිදු වී ඒවා වෙනුවෙන් කම්පා වී, ඒ මොහොතේ ඒ ගැන උරණ වූවා මිස ඒවා අමතක වන්නට වැඩි කාලයක් ගත වූයේ නැත. කුප්‍රකට කියමනක කියැවෙන්නේ ද සිංහලයාට අමතක වන්නට වැඩි කාලයක් ගත නොවන බව ය. එය ඇත්තක් බව පෙනෙන්නේ කලින් කලට කවර දෑ සිදුවුව ද ඒ මොහොතේ විනා ඊට පසු ඒ ගැන අමතක කරන නිසා ය.

ඒ සඳහා කියන්නට බැරි තරම් උදාහරණ ප්‍රමාණයක් තිබේ. තිස් අවුරුදු මහවැලි යෝජනා ක්‍රමය ජේ. ආර් ආණ්ඩුව පස් අවුරුද්දකින් නිම කිරීමෙන් හොඳ ප්‍රතිඵල ලැබී නැත. වැල්ලවත්තේ ගොඩනැගිල්ලක් කඩා වැටී තිදෙනෙක් මිය යෑමේ මතකය තවමත් බැහැර වූයේ නැත.

ජීවිතය අහිමි වූවන් වෙනුවෙන් අහස් කුස අරා ඇදුණු සුදු කොඩි දිනක කිහිපයකින් දුර්වර්ණ වී දිරාපත් වනු ඇත. පෙට්ටි වටා තනි රැකි සුන්දර මල් පෙති හැලී නටුවෙන් ගිලිහී යෑමට එතරම්වත් දිනක් ගත නො වනු ඇත. තරුණ යුවළ හා කිරිකැටි බිලිඳා ගැන කියැවෙන අනුවේදනීය කතා මුවින් මුව නැඟී වා තලයට ම මුසුවී යෑමට දිගු කලක් ගත නොවේ. නෙතඟ නැඟි කඳුළු බිඳුවල බර පවා සහෘදයත්වයේ තරම අනුව වියැළී යන වේගය වැඩි වනු ඇත. ජීවිතය යනු මෙය වුව ද ඒ ඛේදවාචකය එවැනි හෘදයාංගම වචන පෙළකින් හෝ සාමාන්‍ය ක්‍රියාකාරීත්වයෙන් යට විය යුතු නොවේ. නොමළ වුන් නිදිගත් බිමක මළවුන් සඳහා යුක්තිය ඉටු නොවන බව ඔබ දැනටමත් දනී. එනිසා මේ සිද්ධිය සැහැල්ලුවට නොගන්නා මෙන් හා අමතක නොකරන මෙන් අපි උදක් ම ඉල්ලා සිටිමු.

ඉකුත් අගෝස්තු 29 වැනිදා හා සැප්තැම්බර් 2 දා වික්ටෝරියා ජලාශය ආශ්‍රිත ප්‍රදේශවල සුළු භූ කම්පන තත්ත්වයක් වාර්තා වී තිබිණි. මේ විනාශයට පත් වූ ගොඩනැගිල්ල පිහිටා තිබෙන්නේ බූවැලිකඩ ප්‍රදේශයට කිලෝමීටර් 15ක් 20 ක් දුරිනි. ඒ දිනයන්හි සිදු කළ අනතුරු ඇඟවීම් ගැන කිසිවකුත් අවධානයට ගත්තේ නැත. මහනුවර අනිවත්ත ප්‍රදේශයේ ඇති වූ නායයෑම් ගැන ද අවශ්‍ය තරම් අවධානයක් යොමු වූයේ නැත. නුවර වැනි තෙත් කලාපයේ ප්‍රදේශවල ගොඩනැගිලි හදන විට SOIL TEST නම් පාංශු පරීක්ෂණය කරනු ලබයි. මෙහිදී ඒ පොළොවෙහි පිහිටි ගල හෙවත් යටින්ම පිහිටි භූ ස්ථරයේ තැටිය ගැන තක්සේරුවක් ලබා ගන්නා අතර, ඉදිකිරීමේ අත්තිවාරම පිහිටි ගලට සම්බන්ද කළ යුතු තැන ගැන අදහසක් ලබා ගැනීම සිදු වෙයි. මෙවැනි පරීක්ෂණයක් කළේ නම් අතහැර දැමුණු කඳුරක් මත අත්තිවාරමක් නො දමන බවට සැකයක් නැත. මෙයින් පෙනී යන්නේ එක්කෝ මේ වැනි භූ ගර්භ පරීක්ෂණයක් මේ භූමිය සම්බන්ධයෙන් කර නැත; නැතිනම් ඒ සහතික බොහෝ රාජ්‍ය ආයතනවල කෙරෙන්නා සේ හොර පාරෙන් අදාල අවසරය ගෙන ඇති බව ය. මේ වැනි කාරණා ගැන වගකිව යුත්තෝ තම අවධානය යොමු කළ යුතු වෙති; අවධානය යොමු කර පමණක් වැඩක් නැත. ඊට අදාළ නීතිය උපරිම ක්‍රියාත්මක කළ යුතුය.

වර්තමාන ව්‍යාපාරික පැලැන්තියේ ඇතැමුන් මුදල ගැන මිස ප්‍රමිතිය ගැන කල්පනා කරන්නේ නැත. කුමන හෝ ගොඩනැඟිල්ලක් අටවා, එය ව්‍යාපාරික ස්ථානයක් බවට පත් කර ගැනීමේ හදිස්සිය ඔවුන්ට තිබේ. ඇතැම් විට සැලසුම සකස් කරන්නේ ව්‍යාපාරිකයාය. ඉදිකිරීම් ද්‍රව්‍ය තෝරා ගන්නේ ව්‍යාපාරිකයා ය. ඇතැම් විට ඉදිකිරීම් නිරීක්ෂණය කරන්නේ ද, අධීක්ෂණය කරන්නේ ද ව්‍යාපාරිකයා ය. මෙබඳු ක්‍රියාවලියක් තුළ ස්ථාවර ගොඩනැඟිල්ලක් ඉදිවීමට හේතු සාධක නැත. සිමෙන්ති ගල්වලින් මහල් නිවාස ඉදිකිරීම මේ වන විට මෝස්තරයක් වී ඇත. එය ලස්සන ය; ලාභදායක ය; පහසු ය; වේගවත් ය; එහෙත් සවි ශක්තියෙන් හා ඔරොත්තු දීමෙන් දුර්වල ය. ව්‍යාපාරිකයන් සිමෙන්ති ගල්වල ප්‍රමිතිය සොයා බලන්නේ ද නැත.

විනාශයට පත් පස් මහල් හෝටල් ගොඩනැගිල්ල ඉදි කර ඇත්තේ අස්ථාවර භූමියක බව ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය පෙන්වාදී ඇත. අදාළ ප්‍රදේශයේ නාය යෑම් ලක්ෂණ පෙන්නුම් කළ ස්ථාන කිහිපයක් ඇති බව ද සඳහන් ය. එහි අර්ථය වන්නේ මේ භූමිය ඉදිකිරීම් සඳහා නුසුදුසු බව ය. අස්ථාවර භූමියක ගොඩනැඟිල්ලක් ඉදි කරන්නේ නම් ඒ සඳහා භාවිත කළ යුතු විශේෂ තාක්ෂණික උපාය මාර්ග තිබේ. එහෙත් මේ ගොඩනැඟිල්ල ඉදි කර ඇත්තේ ඒ කිසිදු තාක්ෂණයක් හා උපදේශනයකින් තොර ව ය. රටේ මහජනයා එක අතකින් රටේ නීතියට ගරු කළ යුතු ය. තව අතකින් රාජ්‍ය ආයතන ලබා දෙන උපදේශන අනුගමනය කළ යුතු ය. ඉහත ගොඩනැඟිල්ලේ හිමිකරු ඒ සියල්ල බැලුවා යැයි කීව ද ඒවාට සහතික ගෙන ඇත ද ඔහු ඒවා ගත් ආකාරය ගැන නම් බොහෝ සැක සංකා මතු වෙන්නේ ය.

බූවැලිකඩ සිද්ධිය උගන්වන පාඩම නම් ලංකාවේ බොහෝ තැන්වල ප්‍රමිතියෙන් තොර තවත් ගොඩනැගිලි තිබෙන බව ය. එබැවින් ඒවා ගවේෂණය කර සොයා බලා ඉදිරියේදී සිදු විය හැකි අනතුරු වළක්වා ගැනීම රජය සතු වගකීමකි. නැතිනම් අතමාරුවක් ගෙන සුවසේ සිටින සමහර රාජ්‍ය නිලධාරීන්ගේ හා බල්ලො මරා හරි සල්ලි හම්බු කිරීමට දත කන නිර්ලජ්ජිත ඇතැම් ව්‍යාපාරිකයන්ගේ සුවපහසුව වෙනුවෙන් වන්දි ගෙවන්නට වන්නේ අසරණ මිනිසුන්ට ය. ඒ මිනිස් ජීවිත සමඟ සෙල්ලම් කිරීම වැළැක්වීමට නම් වංචා දූෂණ වලින් තොර රාජ්‍ය සේවයක් සේම වගකීම් සහගත දේශපාලනයක් ද අවැසි ය.

# ‘ආර්ථිකය යළි ගොඩගැනීමට සංචාරක ව්‍යාපාරය දියුණු කළ යුතුයි’

## රුසියාවේ හිටපු ශ්‍රී ලංකා තානාපති උදයංග වීරතුංග

● සුභද්‍රා දේශප්‍රිය

**ගෝලීය වසංගතයක් වන කොවිඩ් 19 වසංගතයත් සමඟ අද වන විට ලෝකයේම බොහෝ රටවල්වලට විශාල බලපෑම් රැසක් ඇති විය. සමස්ත ලෝකයට ම මුහුණ දීමට සිදුවූ මේ අනපේක්ෂිත අත්දැකීම අද වන විට ලොව පුරා රටවල සියලු ක්ෂේත්‍රයන් කඩා වැටීමට තරම් බරපතළ බලපෑමක් සිදු කර ඇත. ඒ ගෝලීය වසංගතයට සාර්ථකව මුහුණ දීමට නොහැකි වූ ලෝකයේ බලවත් රටවල් විශාල ලෙස කඩා වැටෙද්දී මේ වසංගතයට සාර්ථකව මුහුණ දීමට අපිට හැකි විය. එහෙත් වසංගතය මර්දනය කළද ලෝකයේ බොහෝ රටවලට මෙන්ම ශ්‍රී ලංකාවේද විශාල ආර්ථික කඩාවැටීමක් සිදු විය.**



“ පවතින සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට අප උත්සාහ කළ යුතුය ”

“ හම්බන්තොට කේන්ද්‍ර කරගෙන සංචාරක වැඩපිළිවෙළක් යළි ස්ථාපිත කිරීමට හැකි නම් හොඳයි ”

“ රුසියානු සංචාරකයන් ලංකාවට ගෙන්වා ගැනීම සම්බන්ධයෙන් අපි අවධානය යොමු කරමු ”

ඒ වැටුණු ආර්ථිකය නැවත ගොඩනැඟිය යුතු කාලය උදා වී ඇත. කොවිඩ් 19 සඳහා පිළියමක් මේ දක්වා නොමැති නිසා ඒ සමඟ ම ජීවත් වීමට මුළු ලෝකයට ම සිදුව තිබේ. මේවන විට ලෝකයේ බොහෝ රටවල් ඒ සඳහා සූදානම් වන බැවින් රටක් ලෙස අපද යථා තත්ත්වයට පත් විය යුතුය.

ලෝකයේ බොහෝ රටවල්වලට මෙන්ම මෙරටට විදේශ විනිමය ලැබෙන මාර්ග අතර සංචාරක ව්‍යාපාරය ප්‍රමුඛ වෙයි. විදේශ විනිමය ලැබෙන සියලු මාර්ග මේ වනවිට රටට අහිමි වී ඇතත් ඉතා කෙටි කලකදි ඕනෑම රටකට යළිත් විදෙස් විනිමය ඉපැයීමේ පහසුම මඟ සංචාරක කර්මාන්තයයි. මේ වනවිට සංචාරක ව්‍යාපාරයෙන් ලැබෙන මුදල් සහමුලින්ම නතර වී ඇති අතර එය නැවත ගොඩනැඟිය යුතු බව මෙරට ආර්ථික විශේෂඥයන්ගේ මතයයි. සංචාරක කර්මාන්තයේ නියැළෙන්නන්ගෙන් විශාල ඉල්ලීමක් ඇති අතර දැනට රටවල් අතර සංචාරය සඳහා අවසර ලැබී ඇති රටවල් අතර සංචාර සිදු වෙයි. හම්බන්තොට දිස්ත්‍රික්කය කේන්ද්‍ර කරගනිමින් විශේෂ සංචාරක වැඩපිළිවෙළක් මෙරට තුළ නැවත ස්ථාපිත කිරීමට යම් අවකාශයක් ලබාගත යුතුය. පූර්ණ සෞඛ්‍ය ආරක්ෂිත ආකාරයට සංචාරකයන් මෙරටට ගෙන්වා ගැනීම කළ යුතුය. ගෝලීයකරණය තුළ සියලු රටවල් එකට බැඳී ඇති අතර රටක් ලෙස තනිව නැගී සිටීම ඉතා අසීරු ය. අපේ රටට සංචාරක කර්මාන්තය හරහා විශාල විදේශ විනිමයක් ලැබුණු රුසියාව, බෙල්ජියම, කසකස්ථානය බෙලරුසියාව වැනි රටවල් මුල් කරගනිමින් සංචාරක කර්මාන්තය නැවත මෙරට තුළ ආරම්භ කිරීමට අදාළ සියලු අංශ මේවන විට දැනුවත් කරමින් පවතී.

සාමාන්‍ය සංචාරකයන් සඳහා ශීතකාලයට නවාතැන් පහසුකම් ලබා දෙන එක් කාමරයක් ඩොලර් හයදහසකට අලෙවි වූවත් අද වන විට එය ඩොලර් 200ක මුදලකටවත් අලෙවි නොවෙයි. රටක් ලෙස නැඟී සිටින්නට නම් විදෙස් විනිමය අනිවාර්යෙන්ම ලැබිය යුතුය. රටට විදෙස් මුදල් පැමිණිය හොත් එය බෙදී යන්නේ කෙසේද? කාටද? කියන කරුණ ගැටලුවක් නොවේ. එය මෙරටට දේශීය ආදායමක් විය යුතුය. සංචාරක කර්මාන්තය නැවත ආරම්භ කිරීමේදී යම් විවේචනය පැමිණිය හැකිය. නමුත් මේ ආකාරයට තව වසර ගණනාවක් ගත වුවහොත් ලංකාව වැනි රටවලට කුමක් සිදුවිය හැකිද යන කරුණ මතුවේ. විදෙස් ශ්‍රමිකයන්ගෙන් ලැබෙන ආදායම මේ වන විට ඇහිරී ඇත. කොරෝනාවලින් ආරක්ෂා වන්නා සේම රටට ආදායම ගෙන්වා ගත යුතුය. මේ වන විට ඇගළුම් අපනයනය තුළින් රටට විශාල වශයෙන් ලැබෙන විදෙස් විනිමය අහිමි වී ඇත. කාර්මිකයන්ට රැකියා අහිමි වී ඇත. ව්‍යවසායකයන් මෙරටට ගෙන්වා ගැනීමෙන් පසු ඒ අය සඳහා රැකියා ගැටලුව මතු වෙයි. පවතින සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට අප උත්සාහ කළ යුතුය. ඒ සඳහා සංචාරක කර්මාන්තයට නැවත මූලික අඩිතාලමක් තැබිය යුතුයි. මේ අභියෝග ජයගත යුතු බව බොහෝ විද්වතුන්ගේ මතය වී ඇත.

එහි මුල් පියවරක් ලෙස රුසියාව කේන්ද්‍රගත කරගත් රටවල් මුල් කරගනිමින් මෙය ආරම්භ කිරීමට කටයුතු කර ඇත. ඒ සඳහා දෙරට සංචාරක කර්මාන්තයේ නියැළෙන්නන්ගෙන් ඉල්ලීම්ද වෙයි. රුසියාව සහ මෙරට අතර ඇති සම්බන්ධය ඉතිහාසය පුරා දිවෙයි. ඒ නිසා විශ්වාසයෙන් යුතුව අපිට එම රටවල සංචාරකයන් මෙරට ගෙන්වා ගත හැකිය.

1991 - 1992 දශකවල සෝවියට් දේශය විශේෂයෙන් පසුකාලීනව එම ප්‍රාන්ත රටවල් බවට පත්විය. සෝවියට් දේශය බිඳ වැටීම අපේ රටට අවාසිදායකය. එයට හේතුව වනුයේ රටවල් දෙකක අර්බුදයකදී වඩා දුර්වල රටට බොහෝ දුරට සහය ලබා දුන් රටක් ලෙස සෝවියට් දේශය හැඳින්විය හැකි වීමයි. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ කාලයේ සෝවියට් දේශය සමඟ වඩා සමීප සබඳතා පැවැත්විණි. ඉන්පසු සෝවියට් දේශය බිඳ වැටීමත් සමඟ ප්‍රාන්ත රටවල් ලෙස වෙනස් වීමට පටන් ගැනීම සිදු විය. රුසියාව ජාත්‍යන්තර වශයෙන් බොහෝ සෙයින් අපට උපකාරී වන රටකි. ජාත්‍යන්තරව අපට ඇතිවූ ගැටලුකාරී අවස්ථාවලදී අපේ රට වෙනුවෙන් පළමු ස්ථානයේ පෙනී සිටින රටක් ලෙස රුසියාව හැඳින්විය හැකියි. දේශපාලනික වශයෙන් අපට රුසියාව සමඟ ගැටලු නොතිබිණි. රුසියාව වෙන්වුණු පසුව සෝවියට් දේශය සමඟ තිබුණු ගනුදෙනු වෙනස් විය. අලුතින් ගිවිසුම් අත්සන් කිරීමට සිදු විය. 2006 වසරේ මා එම රටේ ශ්‍රී ලංකා තානාපතිව මා එහි යනවිට සෝවියට් දේශයේ අනෙක් පැරණි රටවල් සමඟ ඉතා අඩු ගිවිසුම් ප්‍රමාණයත් අත්සන් කර තිබුණි. විශේෂයෙන් 1961දී ගුණපාල මලලසේකර මහතා තානාපතිව සිටියදී ගිවිසුම් අත්සන් කිරීමක් සිදුවී ඇත. රටවල් දෙකක් අතර හුවමාරු සම්බන්ධ ගිණුම්වත් අවම වශයෙන් නොතිබිණි.

රුසියාව, බෙලරුසියාව, කසකස්ථානය සහ යුක්රේන් අවම වශයෙන් එම ගිවිසුම් දෙක නැතිනම් රටවල් දෙක අතර සංචාරක කර්මාන්තයන් සම්බන්ධයෙන් කතා කිරීමටවත් අපහසු තත්ත්වයක් තිබිණි. 2014 වර්ෂය වනවිට අපේ රටේ නිෂ්පාදිත තේ වලින් සියයට 25ක් පමණ ලබා ගන්නා ලද්දේ රුසියානුවන් විසිනි. අද වනවිට එය පහළට වැටී ඇත. රුසියානුවන් වසරකට මිලියන 20 – 25 අතර ප්‍රමාණයක් විදේශ රටවලට සංචාරය කරයි. අවසානයේ අපේ රටට වඩා විශාල ප්‍රමාණයක් සංචාරකයන් පැමිණෙන රටක් බවට ඒ රටවල් පත් විය. රුසියානුවන් බහුතරය සංචාරය සඳහා කැමැති ජාතියකි. එවකට තානාපති ලෙස සංචාරකයන් ගෙන්වා ගැනීම සඳහා විශාල පරිශ්‍රමයක් දැරීමට මට සිදු විය. ඒ සඳහා ඒ වනතෙක් කිසිදු වැඩපිළිවෙළක් දියත් කර නොතිබුණි. 2005 වසරේ සංඛ්‍යා ලේඛනවල සඳහන් වන ආකාරයට පැරණි සෝවියට් දේශයේ ලංකාවට සංචාරය සඳහා පැමිණ තිබුණේ වාර්ෂිකව 4500ට ආසන්න පිරිසකි. රටවල් 15 කට ආසන්න සංඛ්‍යාවකින් ලංකාවට පැමිණ තිබුණේ ඉතාමත් සුළු පිරිසකි. මා තානාපතිව සිටින කාල වකවානුවේ එය වාර්ෂිකව එක්ලක්ෂ විසි දහසක් දක්වා වැඩි විය. 2018 වර්ෂය වනවිට එම සංචාරකයන් සංඛ්‍යාව 1000 පමණ වැඩිවීමක් සිදු වී ඇත. අපේ රට පිළිබඳව දැනුම්වත් කරනු ලැබිය යුත්තේ සංචාරක අමාත්‍යාංශය තානාපති කාර්යාලය හරහා ය. විශේෂයෙන් රුසියාව, චීනය වැනි රටවල ඉංග්‍රීසියෙන් දැනුම්වත් කිරීම්වලට වඩා රුසියානු භාෂාවෙන් අපේ රට පිළිබඳ හඳුන්වා දිය යුතුය. පොදුවේ එම ජනතාවට හුරු ඔවුන්ගේ බසයි.


ඒ සඳහා එවකට මම මාර්ග සලකුණු සහ සුවිශේෂ ස්ථාන පිළිබඳව හෝටල් පිළිබඳව සියලු තොරතුරු එහි ඇතුළත් කරනු ලැබිණි. එහිදී ප්‍රධාන සංචාරක ගම්මානයන් හඳුන්වා දීමක්ද සිදු විය.

රුසියානු සංචාරක ක්ෂේත්‍රයේ නියැළෙන්නන් සංචාරක කර්මාන්තයේ නියැළෙන්නන් අතර මේ වන විට සංචාරක ව්‍යාපාරය නැවත ආරම්භ කිරීමට එකඟතාවක් මතුවී ඇත. කෙසේ වෙතත් රටක් ලෙස ඉදිරියේදී රුසියානු සංචාරකයන් ලංකාවට ගෙන්වා ගැනීම සම්බන්ධයෙන් අප අවධානය යොමු කළ යුතුය. ඉතා විශාල රුසියානු සංචාරකයන් පිරිසක් ලංකාවට පැමිණ තිබීමත් ඔවුන්ගෙන් ලැබෙන විදෙස් විනිමයක් සලකා බලා කොරොනා වසංගතය සම්බන්ධයෙන් අවදානම් තත්ත්වය අවම කරගනිමින් අපට නැවත එය ආරම්භ කළ හැකිය.

මේ වසරේ අගෝස්තු 1වැනිදා සිට 19 දක්වා කාලය තුළ තුර්කියේ හන්තාලියා නගරයට රටවල් තිස් දෙකකින් මිලියනයක් සංචාරකයන් පැමිණ ඇත. එම මිලියන එක ලක්ෂ තුනකට ආසන්න සංචාරකයන් යුක්රේන ජාතිකයන් වෙයි. දෙලක්ෂ අනූදහසක් පමණ දෙවැනි වරට පැමිණ ඇත්තේ රුසියානුවන් ජර්මන් ජාතිකයන් අසූපස් දහසක් වෙයි. මෙතැනදී අපි දකින කාරණාවක් නම් මේ සංචාරකයන්ට ශීතකාලයේදී සංචාරය සඳහා හැකි සුදුසු රටක් පිළිබඳ සාකච්ඡා කිරීමේදී ඒ සංචාරකයන් ලංකාව පිළිබඳ වැඩි උනන්දුවක් දක්වයි. අප මේ සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු වන්නේ රටක් ලෙස රට අභ්‍යන්තරයේ පවතින මුදල් සංසරණය වෙමින් රටක් දියුණු කළ නොහැකි නමුත් විදෙස් විනිමය අපිට ලබාගත හැකි පහසු ම මාර්ගයක් ලෙස සංචාරක කර්මාන්ත හඳුනා ගත හැකි නිසාය.

සංචාරක කර්මාන්තයේ නියැළෙන්නන් විසින් ගුවන්තොටුපොළට පැමිණෙන අදාළ සංචාරකයන්ගේ පැය 72 කට පෙර ලබාගත් පී.සී.ආර් පරීක්ෂණ කර ඇති සහතිකය ඉදිරිපත් කිරීමට වග බලා ගත යුතුය. මත්තල සිට මෙරටට පැමිණි පසු පී.සී.ආර් පරීක්ෂාව කිරීමට අදාළ සංචාරක අනුගාමිකයන්ට වගකීම පැවරෙයි. සංචාරකයන් සහ ලංකාවේ ජනතාව අතර සමාජ දුරස්ථ භාවය ආරක්ෂා කිරීමටත් යම් ක්‍රමවේදයන් අනුගමනය කිරීමත් එහිදී ඉතා වැදගත් වෙයි. හම්බන්තොටට පැමිණි පසු ඒ ආශ්‍රිත වෙරළ සීමාවේ හෝටල් කිහිපයක් නතර කිරීමට පියවර ගන්නා අතර එහිදී එම හෝටල් ආශ්‍රිතව ලාංකිකයන්ට ගැවසීම තහනම් කිරීම තුළ යම් අවදානමක් වේ නම් එයින් මිදීමට හැකියාව ලැබෙනු ඇත. මුහුදු වෙරළට මේ සංචාරකයන්ට යා හැකි විය යුතු සේ ම හෝටලය තුළ යම් පහසුකමක් තිබිය යුතුය. ඒ සඳහා ලාංකිකයන්ට යම් කැපවීමක් කළ හැකි විය යුතුය.

පොදුවේ රටක් ලෙස ගොඩනැඟීමට නම් යම් යම් කැපවීම් රටක් ලෙස අපි කළ යුතුය. සියලුම පහසුකම් සංචාරකයන්ට ලබාදීමට හැකිවිය යුතුය. මේ සඳහා යම් පාර්ශ්වයන් විරුද්ධ විය හැකි නමුත් රටක් ලෙස අපිට ලැබී ඇති ස්වභාවික සම්පත්වලින් අපි උපරිම ප්‍රයෝජන ගත යුතුය. මේ කාලවකවානුවේදී වැටුණු ආර්ථිකය යළි ගොඩනගන්නට රටක් ජාතියක් ලෙස අප යම් කිසි දායකත්වයක් දිය යුතුය. අපිට අවශ්‍ය මේ අවස්ථාවේ රටට මුදල් ලැබෙන ක්‍රමවේදයකි. අද වන තෙක් අපගේ රට සංචාරකයන් සඳහා විවෘත කර නැත. යුක්රේනය, බෙලරුසියාව, කසකස්ථානය වැනි රටවල් විවෘත කර ඇත. ගුවන් ගමන් ඒජන්ත වරයා ගුවන් යානා එකසිය පනස් නවයක් ගුවන් ගත කිරීමට තීරණය කර ඇති අතර පෙබරවාරි දක්වා ගමන් කරන ලද ගුවන් යානා ඉවත් කළ වහාම එම ගුවන් ගමන් ආරම්භ කරන බව පවසයි. අපේ රටට පැමිණීමට සංචාරකයන් ප්‍රිය කරන අතර සාමාන්‍යයෙන් රුසියානුවන් දිනකට ඩොලර් 160 දිනකට වියදම් කරන අතර රුසියානුවන්ගෙන් සංචාරකයන් අසූපන්දහසක් පැමිණ ඇත. පෞද්ගලිකව මගේ ජීවිතය රුසියානු සංචාරක කර්මාන්ත වෙනුවෙන් කැප කර ඇති නිසා රුසියානු රටවල් කෙන්ද්‍රගත කරගෙන සංචාරක කර්මාන්තය හරහා මෙරටට සංචාරක කර්මාන්තය හරහා විශාල මුදල් ප්‍රමාණයක් හිමි වන බව දනිමි. යුරෝපා රටවල් හෝ කොවිඩ් පාලනය කිරීමට අපේ රට තරම් විශාල මහන්සියක් ගෙන නැති තරම්ය. නමුත් අපි මේ අවස්ථාවේදී රටක් ලෙස ඉතා ඉක්මනින් මේ වැටුණු ආර්ථිකය යළි ගොඩ නගා ගත යුතුය. ඒ සඳහා සියලු දෙනා කැපවිය යුතුය.



# කිරිඇල්ලගේ අතේ කළු පටි ගැන අගමැති ගෙන් විමසුමක්

රාජකීය හැල්ල

ශක්ති මෙන්ඩිස් කියයි... ejournalists@gmail.com

**"අපිට 20 එපා. එපා. එපා. අපිට එපා. ඕන ඕන ඕන අපිට 20 ඕන රට හදන්න ඕන" සමගි ජන බලවේගයත් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් ඉකුත් 22 වැනිදා පාර්ලිමේන්තු සභා ගර්භය මැද පැයක පමණ කාලයක් විරෝධතා දැක්වීය. පාර්ලිමේන්තුව දැඩි උණුසුම්කාරී තත්වයට පත්ව තිබූ අතර මෙහිදී මැති ඇමතිවරුන් මෙන්ම පක්ෂ විපක්ෂවල මන්ත්‍රීවරුන් නොයෙකුත් සටන් පාඨ කියමින් කෑ කෝ ගසනු දැක ගත හැකි විය.**

දෙපාර්ශ්වය එකිනෙකා ළඟට පැමිණ මුහුණට මුහුණ ළංකරමින් කෑ ගසාගත් අතර අතින් පයින් ප්‍රහාර එල්ල කිරීම දක්වා නොගොස් කටින් පමණක් විරෝධතාවයක් පෙන්වීමට දෙපැත්තේම මන්ත්‍රීවරුන් මහත් අපහසුතාවයෙන් යුතුව වගබලා ගත්හ. මෙලෙස මැති සබය ශබ්දාගාරයක් බවට පත්වූයේ 20 වෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ආණ්ඩුව සූදානම් වනවාත් සමගිනි.

පාර්ලිමේන්තුව උදෑසන 10.00ට පමණ කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ වී න්‍යාය පත්‍රයට අනුව සිදු කරගෙන ගියේය.

අගමැති මහින්ද රාජපක්ෂ මහතා සහ කැබිනට් මෙන්ම රාජ්‍ය ඇමතිවරු පැමිණ සිටි අතර විපක්ෂ නායක රනිල්, සජිත් ප්‍රේමදාස මහතා ප්‍රමුඛ සමගි ජන බලවේගය නියෝජනය කරන සෙසු පක්ෂවල නායකයන් මෙන්ම පාර්ලිමේන්තු මන්ත්‍රීවරු රැසක් සභාව වෙත පැමිණියහ.

## මනූෂ - හේෂා හොර රහසේ හොර වැඩක

මේ අතරතුර සමගි ජන බලවේගය නියෝජනය කරන මන්ත්‍රීවරු කිහිපදෙනකු විරෝධතාව සඳහා අවශ්‍ය දේවල් සංවිධානය කරමින් සිටියේය. ගාල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී මනූෂ නානායක්කාර, රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී හේෂා විතානගේ, නලින් ජයතිස්ස මෙහි ප්‍රධානත්වය ගනු ලැබීය.

විරෝධතා පුවරු, කළු පටි බෙදා හැරීම ඒ වන විටත් ඉතා රහසිගතව සිදු කිරීමට මෙම මන්ත්‍රීවරුන් කටයුතු කළහ.

20 අවජාතකයි, 20 අපිට එපා, ඇතුළු සටන් පාඨ බෝඩ් මත අඳිනු ලැබ ඇත්තේ පාර්ලිමේන්තු සංකීර්ණයේ පිහිටි විපක්ෂ නායක කාර්යාලය තුළදීය.

කළු පැහැති ෆයිල් කවරවල සටන් පාඨ ලියනු ලැබුවේ රෝහිණී කවිරත්න විසිනි. ඇය ඉතා දක්ෂ ලෙස එම පාඨ අඳිනු ලැබුවේ ගුරුවරියක් වශයෙන් කටයුතු කර ඇති බැවිනි. මාතලේ දිස්ත්‍රික්කය නියෝජනය කරන ඇයට මෙය පවරා තිබුණේ නලින් ජයතිස්ස මන්ත්‍රීවරයා විසිනි. දෙමළ භාෂාවෙන් සටන් පාඨ ලියනු ලැබුවේ වඩිවේල් සුරේෂ් මන්ත්‍රීවරයාය.

මෙලෙස අඳිනු ලැබූ සටන් පාඨ මැති සභාව තුළට සඟවාගෙනවිත් හරීන් ප්‍රනාන්දු සහ හර්ෂ ද සිල්වා ඔවුන්ගේ ආසන යට සඟවා තිබුණි.

## ස.ජ.බ. අයගේ අත්වල කළුපටි

සමගි ජන බලවේගයේ මන්ත්‍රීවරුන් එකිනෙකාගේ අත්වල කළු පටි ගැටගැසීමට කටයුතු කළ අතර විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතාගේ වම් අතේ කළුපටිය බඳිනු ලැබුවේ මනූෂ නානායක්කාර මන්ත්‍රීවරයා විසිනි.

ලක්ෂ්මන් කිරිඇල්ල මහතා ඉදිරිපිට සිටින අගමැති මහින්ද රාජපක්ෂ මහතා සිනාසෙමින් කියා සිටියේ ඔබතුමා කළු පටියක් බඳින්නේ නැද්දයි කියාය. මම කළු පටියක් ඔබගේ අතේ බඳින්නදැයි අගමැතිවරයා මෙහිදී කිරිඇල්ල මන්ත්‍රීවරයාගෙන් විමසා සිටියේය.

විපක්ෂයේ බාධක සියල්ල බිඳ දමමින් පෙ.ව. 11.40ට පමණ අධිකරණ අමාත්‍ය ජනාධිපති නීතිඥ අලි සබ්‍රි නැගී සිටිමින් 20 වන ව්‍යවස්ථා සංශෝධන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළහ.

මේ සමඟම නැවත දැඩි විරෝධතාවයක් පාර්ලිමේන්තුව තුළ ඇතිවූ අතර එකම කාලගෝට්ටියක් බවට පාර්ලිමේන්තුව පත්විය.

එහෙත් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ අත්පොළසන් මැද මෙම කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරිණි.

මේ සමගම සජිත් ප්‍රේමදාස මහතා රීති ප්‍රශ්නයක් මතු කරමින් 20 සංශෝධනය මෙරට ප්‍රජාතන්ත්‍රවාදය ආපස්සට යවන බව ප්‍රකාශ කළේය.

## බන්දුලගෙන් මුදල් රෙගුලාසි ගැන කතාවක්

එහිදී නැගී සිටි බන්දුල ගුණවර්ධන අමාත්‍යවරයා සමගි ජන බලවේගයේ විරෝධතා මැද මුදල් රෙගුලාසි දිගින් දිගටම කියාගන යනු ලැබීය. ඔහුට සහය වීමට උදය ගම්මන්පිල, කෙහෙළිය රඹුක්වැල්ල, ජනක බණ්ඩාර තෙන්නකෝන් යන අමාත්‍යවරුන් ක්‍රියාත්මක විය.

මහින්දානන්ද අලුත්ගමගේ, රෝහිත අබේගුණවර්ධන, විමල් වීරවංශ ඇතුළු මන්ත්‍රීවරු පිරිසක් දිගින් දිගටම 20 අපිට ඕනෑ බව කියමින් කෑගැසූහ.

මේ අතර ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ මන්ත්‍රීවරු අතර කිසිඳු ගැටුමක් ඇතිවිය නොහැකි තත්වයක් සභා ගර්භය තුළ තිබිය යුතු බව අගමැති මහින්ද රාජපක්ෂ මහතා ආණ්ඩු පක්ෂයේ සියලු මන්ත්‍රීවරුන් වෙත දන්වා තිබුණි.

මහින්දානන්ද අලුත්ගමගේ, ජොන්ස්ටන් ප්‍රනාන්දු සහ ලොහාන් රත්වත්තේ යන අමාත්‍යවරුන්ට විශේෂ රාජකාරියක් ලෙස ගැටුම් හට ගැනීමට ඉඩ නොතබන ලෙසට වගබලා ගන්නා ලෙස ප්‍රකාශ කර තිබූ අතර ඔවුන් තිදෙනා එම කටයුත්ත අකුරටම ඉටුකරනු ලැබීය.



"අදත් ඊයෙත් ආපු දෙදෙනෙකුම හරවා යවලා තියෙනවා. අනෙක් කාරණය කාන්තාවක් පැය ගණනක් රස්තියාදු කරලා ඇගේ ඉල්ලීම මග හැරලා තිබෙනවා."

"මෙතන ක්ලාක් කෙනෙක් නැතිලු, පියන් කෙනෙක් නැතිලු. එකවුන්ටන් කෙනෙක් නැතිලු. සල්ලි ගෙවන්න ආපු අය හරවා යවලා තිබෙනවා."

ඔයාලා මෙහෙම කරන එක හරිද ජනතාවට සේවය කරනවා කියන්නේ මේකටද. මේවා ඉදිරියේදි නම් කොහොමටවත් සිද්ධ වෙන්න බෑ. මම සිද්ධ වෙන්න ඉඩ තබන්නෙත් නැතැයි ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන් එක හුස්මට කියාගෙන යනු ලැබීය.

ඒ ඉකුත් 23 වැනිදා පස්වරුවේදීය. කිසිවෙකු නොසිතු මොහොතක කිසිවෙකුටත් නොදැනෙන්නට නාරාහේන්පිට පිහිටි නිවාස සංවර්ධන අධිකාරියට අයත් කාර්යාලයට හදිසි නිරීක්ෂණයකට එක්වෙමිනි.

ඒ වනවිටත් එම කාර්යාලයේ නොයෙක් තනතුරුවල නිරතව සිටින පුද්ගලයන් රාජකාරීවල නිරත නොවී සිටිනු ජනාධිපතිවරයා නිරීක්ෂණය කළේය.

සේවා ලාභියෙකු කළ පැමිණිල්ලකට අනුව ජනාධිපතිවරයා එම කාර්යාලය වෙත ගියේය. රාජකාරී අවශ්‍යතාවක් සඳහා අවස්ථා ගණනාවකදී පැමිණියද එය ඉටුකිරීමට නිලධාරීන් අපොහොසත්ව ඇති අතර කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවන බව පවසමින් සේවා ඉටු නොකරන බවට පැමිණිලිකාරිය සඳහන් කර තිබුණි.

කාර්යාලය අධීක්ෂණය කළ ජනාධිපතිවරයාට ප්‍රමාණවත් සේවක පිරිසක් එහි සිටින බව නිරීක්ෂණය වූ අතර සේවා ලබා ගැනීමට පැමිණි ආබාධිත පුද්ගලයෙකු දැඩි අපහසුතාවයකට පත්ව සිටි අයුරු දැක ගත හැකි විය.

මහජන අවශ්‍යතා කාර්යක්ෂම සහ නොපිරිහෙලා ඉටු කිරීම රාජ්‍ය සේවකයන්ගේ මූලික වගකීම බව කාර්ය මණ්ඩලය හමුවේ ජනාධිපතිවරයා මෙහිදී අවධාරණය කළේය.

නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශයේ ඉදිරි සැලසුම් පිළිබඳ ජනාධිපති කාර්යාලයේදී ඉකුත් 22 වැනිදා සාකච්ඡාවක් පැවැත්වුණි. මේ සඳහා එම අමාත්‍යාංශයේ නිලධාරීහු සහ රාජ්‍ය ඇමතිනි වෛද්‍ය සීතා අරඹේපොල මහත්මිය සහභාගී වූහ.

ඉකුත් සෙනසුරාදා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ පුත්තලමේ සංචාරයක නිරත විය. එතුමා මදුරන්කුලිය වතු යායකට ගියේය. පසුව රදගුරු මන්දිරය, කෘෂි තාක්ෂණික ආයතනය නිරීක්ෂණය කරනු ලැබුවේය. මේ ගමන සඳහා අගරදගුරු කාදිනල් රංජිත් හිමිපාණන් එක්වීම විශේෂ කරුණකි.

21 වැනි සඳුදා ජනාධිපතිවරයා කාර්ය බහුල දිනයකි. ඔහු රාජ්‍ය අමාත්‍යාංශවල ඉදිරි වැඩසටහන් පිළිබඳව විමර්ශන කටයුතු සාකච්ඡා කිරීම ආරම්භ කළේය.

කාන්තා හා ළමා සංවර්ධන පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශවල නිලධාරි හා අදාළ ඇමතිවරු එක්වූහ.

එදින රාත්‍රියේදී ජනාධිපතිවරයා වීඩියෝ තාක්ෂණ භාවිතයෙන් එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ සැසිවාරයට සමගාමීව සංවිධානය කෙරුණු ඉහළ පෙළේ එක්දින සමුළුව අමතා කතා කළේය.

එක්සත් ජාතීන් රාජ්‍යයන්ගේ අභ්‍යන්තර කටයුතුවලට මැදිහත් නොවනු ඇතැයි අපේක්ෂා කරන බව ජනාධිපතිවරයා සමස්ත ප්‍රජාවට පැවසීය.

බදාදා උදෑසන ජනාධිපතිවරයා වැඩසටහන් ආරම්භ කරනු ලැබුවේ අගමැති මහින්ද රාජපක්ෂයන් සමඟ එක්වෙමින්ය.

ඔවුහු ජනාධිපති කාර්යාල භූමියේ ඇති නිදහස් අධ්‍යාපනයේ පියා ලෙස සම්මානයට පත් ආචාර්ය සී.ඩබ්.ඩබ්. කන්නන්ගර ශ්‍රීමතාණන්ගේ 51 වැනි ගුණ සැමරුමට සහභාගි වෙමින් එම පිළිරුවට පුෂ්පෝපහාර පුද කළහ.

වෙළෙඳ අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා විසින් නව රජයේ පළමු කැබිනට් රැස්වීමේදී පෙන්වා දුන් අවශ්‍යතාවය හා වැදගත්කම සැලකිල්ලට ගනිමින් අපනයන සංවර්ධන සභාවේ පළමු හමුව 23 වැනි දින පස්වරු 04.00ට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් හා අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාගේ සහභාගීත්වයෙන් යුතුව ජනාධිපති කාර්යාලයේදී පැවැත්විණි.

**අපනයන සංවර්ධන අමාත්‍ය සභාව වසර 28කට පසු යළිත් රැස්වෙයි**

මෙම සභාව පිහිටුවීමේ ප්‍රධානතම පරමාර්ථය වශයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් ලබා දී ඇති සාමාන්‍ය හෝ විශේෂ උපදෙස්වලට යටත්ව ජාතික අපනයන සංවර්ධන ප්‍රතිපත්ති හා වැඩසටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම පෙන්වා දිය හැකිය. අපනයන සංවර්ධන සභාවේ පළමු රැස්වීම 1980 සැප්තැම්බර් 11 දින පැවැත්වූ අතර එතැන් සිට 1992 මැයි 26 දක්වා රැස්වීම් 10ක් පවත්වා ඇත. ඉන්පසු වසර 28ක් පුරාවට මෙම අමාත්‍ය මණ්ඩලය රැස්වී නොමැත.

## ජනපති එක්සත් ජාතීන්ගේ සමුළුව වීඩියෝ තාක්ෂණයෙන් අමතයි

සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය මූලික කර ගනිමින් රටේ සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලබමින් රටට ආදායම් හිමි කර දෙන අපනයනකරුවන්ගේ වෙළෙඳපොළ අවශ්‍යතා නිසි නියාමනයකින් යුතුව උසස් මට්ටමින් ඉටු කර දීමටත්, හැකි සෑම අවස්ථාවකදීම ඔවුන්ට ජාත්‍යන්තර වෙළෙඳපොළ සකසා දීමටත්, රටටත් අපනයනකරුවාටත් වාසිදායක සහ වැඩි ප්‍රතිලාභ අත්කරගත හැකි අන්දමේ නව සැලසුම් ක්‍රියාත්මක කිරීමටත් මෙමගින් සෘජුවම හැකියාව ලැබෙන අතර අපනයන ක්ෂේත්‍රයේ ගැටලු විසඳමින් දැනට පවත්නා ජාතික වෙළෙඳ ප්‍රතිපත්තිය සංශෝධනයට සහ නව්‍යකරණයට ලක් කිරීමත් අරමුණු කර ගනිමින් සාකච්ඡා ආරම්භ කෙරිණි.

මෙහිදී දේශීය ගොවියාගේ නිෂ්පාදනයන් සඳහා මූලිකත්වය ලබා දීමටත් ප්‍රති අපනයන කටයුතු නියාමනයක් සහිතව සිදු කිරීමට අපනයන නිෂ්පාදන ගම්මාන ඇති කිරීම සඳහාත් ගත හැකි ක්‍රියාමාර්ග රැසක් පිළිබඳව මෙහිදී සාකච්ඡාවට බඳුන් විණි. තානාපති කාර්යාලවල සිටින වෙළෙඳ ප්‍රවර්ධන නිලධාරීන් මෙම ඉලක්ක සපුරා ගැනීම සඳහා පෞද්ගලිකවම දැනුම්වත් කර ඇති බව ජනාධිපතිතුමා විසින් මෙහිදී සභාව දැනුම්වත් කරන ලදී. එමෙන්ම ගුවන්තොටුපළ පහසුකම් වැඩිදියුණු කර ව්‍යාපාරිකයන්ගේ හා ආයෝජකයන්ගේ ආකර්ෂණය දිනාගැනීම සඳහා පසුබිම් සැකසීමේ අවශ්‍යතාවය අග්‍රාමාත්‍යතුමා විසින් පෙන්වා දුන් අතර අපනයනකරුවන් අධෛර්යවත් කරන අන්දමේ නීති රෙගුලාසි ප්‍රතිසමාලෝචනය කර ඒවා නිසි පරිදි සැකසිය යුතු බවට යෝජනාව ජනාධිපති කාර්ය සාධක බළකායේ ප්‍රධානී බැසිල් රාජපක්ෂයන් ඉදිරිපත් කරන ලදී.

**ජනපති හා අගමැති කන්නන්ගර සැමරුමට එක්වෙති**

වීඩියෝ තාක්ෂණය මගින් එක්සත් ජාතීන්ගේ මහ මණ්ඩලයේ 75 වැනි රාජ්‍ය නායක සමුළුව අමතා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන් මෙසේ ප්‍රකාශ කළේය.

"ශ්‍රී ලංකාව කිසිවෙකුට ගැති නැති මධ්‍යස්ථ විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කරනවා. ප්‍රජාතන්ත්‍රවාදී ලෙස තේරීපත් වූ ආණ්ඩුවලට සහය වීම එක්සත් ජාතීන්ගේ වගකීමක්. දශක තුනකට ආසන්න කාලයක් බෙදුම්වාදයෙන් හා ත්‍රස්තවාදයෙන් බැට කෑ ශ්‍රී ලංකාව සෑම ආකාරයකම ත්‍රස්තවාදය හෙළා දකිනවා."

අගමැති මහින්ද රාජපක්ෂ ප්‍රධානත්වයෙන් උත්සව වැඩි වශයෙන් ඉකුත් සතියේ නොපැවැති අතර පාර්ලිමේන්තුව තුළ සාමකාමී මෙන්ම කලහකාරී තත්වයක් උද්ගත නොවීම සඳහා අවශ්‍ය පරිසරය ගොඩනැඟීමට ඔහු කටයුතු කළේය.

අගමැති මහින්ද රාජපක්ෂ විසින් රට පුරා ජල ගැටලුව විසඳීමේ පොදු යාන්ත්‍රණයක් සකස් කිරීම වෙනුවෙන් කමිටුපත් කිරීමට පියවර ගනු ලැබීය.

ශ්‍රී ලංකාවේ පොදු දියබෙත්ම කළමනාකරණය ප්‍රවේශයක් ක්‍රියාත්මක කිරීම උදෙසා වන උපාය මාර්ගික යාන්ත්‍රණයක් සකස් කිරීමට අදාළ ආයතන හමුවක් අගමැති ලේකම් ගාමිණී සෙනරත්ගේ ප්‍රධානත්වයෙන් අරලියගහ මන්දිරයේදී පැවැත්වුණි.

**රැවන් නියෝජ්‍ය නායක වීමෙන් පසු එජාපයේ සීතල යුද්ධය නිමවෙයි?**

කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් මගින් කෙරෙන අපනයනවල ගෝලීය ප්‍රතිශතයේ සාමාන්‍ය ඉහළ නැංවීමට රජය සහයෝගය දක්වන බව අගමැතිවරයා අවධාරණය කළේය.

හම්බන්තොට මාගම් රුහුණුපුර ජාත්‍යන්තර සම්මේලන මධ්‍යස්ථානයේදී ඉකුත් 20 වැනිදා පැවැති කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායක සංවර්ධන සම්මන්ත්‍රණයට සහභාගි වෙමින් අගමැතිවරයා එසේ කීය.

ජනාධිපති කාර්ය සාධක බළකායේ සභාපති බැසිල් රාජපක්ෂ ඉකුත් සතියේ අවස්ථා තුනකදී අරලියගහ මන්දිරයේදී සාකච්ඡා තුනකට සහභාගි විය.

උඳු භාවිතා කර ආහාර නිෂ්පාදනය කරන දේශීය උඳු වගාව සඳහා යොමු විය යුතු බව පපඩම් හා කුළුබඩු නිෂ්පාදන කර්මාන්තකරුවන් සමග දීර්ඝ වශයෙන් සාකච්ඡා කළ අතර ගෙවතුවගාව තුළින් දේශීය කෘෂි කර්මාන්තය නංවන ආකාරය පිළිබඳව බැසිල් රාජපක්ෂ මහතාගේ සාකච්ඡා පැවැත්විණි.

වර්තමාන ජනමාධ්‍ය ඇමැති කෙහෙළිය රඹුක්වැල්ලගේ උපන්දිනය සැප්තැම්බර් 21 වැනිදාය. එදින උදෑසනම ඔහුට කතා කළේ අගමැති මහින්ද රාජපක්ෂය. "ඔබට සුභ උපන් දිනයක් මැතිතුමා. ඔබගේ සියලු වැඩකටයුතු සාර්ථක වේවාකියලා මා ප්‍රාර්ථනා කරනවා." මෙහිදී අගමැතිවරයා පැවසීය.

## කෙහෙළිය උපන් දිනයට පැළ සිටුවයි

උපන් දිනය දා ඇමතිවරයා කොළඹින් බැහැර විය. ඔහු අනුරාධපුර ප්‍රජා නගරයේ බෞද්ධ වතාවත්වල නිරතවීමෙන් පසු රුක් රෝපණ වැඩසටහනට එක් විය. අනතුරුව දානමය පිංකමට ද ඔහු සහභාගි විය.

ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම් ටිල්වින් සිල්වා මහතාගේ මෑණියන්ගේ දේහයේ අවසන් කටයුතු සඳහා බේරුවල නිවසේ තැන්පත් කර තිබූ අතර ඒ සඳහා දේශපාලනඥයන් රැසක් ද අවසන් ගෞරව දැක්වීම සඳහා පැමිණ සිටියේය.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ ඊට සහභාගි වූ අතර එම අවස්ථාවේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී වජිර අබේවර්ධන, විජිත හේරත්, සුනිල් හඳුන්නෙත්ති අතර එම නිවසේදී සුහද කතාබහක් ද ඇති විය.

විපක්ෂ නායක සහ සමගි ජන බලවේගයේ නායක සජිත් ප්‍රේමදාස පසුගිය සති අන්තය ගත කරනු ලැබුවේ ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලය.

'දිනමු' පිහිටුවීමේ වැඩසටහනට සමගාමීව සජිත් ඒ ඒ දිස්ත්‍රික්කවල විහාරස්ථානවලට ගොස් නායක හිමිවරු හමුවූයේ පාර්ලිමේන්තුව තුළ විපක්ෂයේ කාර්යභාර්ය ඉටුකරන ආකාරය සහ පක්ෂයේ ඉදිරි වැඩපිළිවෙළ පිළිබඳව සාකච්ඡා කිරීමටය.

## සජිත් ගාල්ල - මාතර පන්සල්වලට යයි

"ඔබතුමා පාර්ලිමේන්තුවේදී විපක්ෂයේ කාර්ය භාරය හොඳින් ඉටු කරනවා. පාර්ලිමේන්තුවේදී ආණ්ඩුව හිතුවක්කාරී ආකාරයට කටයුතු කරන එකට බාධා වෙලා තියෙන්නේ. ඔබතුමන්ලා ශක්තිමත් විපක්ෂයක් විදියට කෙළින්ම ඉන්න නිසයි" හිමිවරුන් කිහිපදෙනකුම සජිත්ට එසේ ප්‍රකාශ කළහ.

"19 වැනි සංශෝධනයේ තියෙන නරක ඉවත් කරලා හොඳ දේවල් ඇතුළත් කරන 'නයින්ටීන් ප්ලස්' ගැන තමයි අපි ඉදිරිපත් කරන්නේ අපේ හාමුදුරුවනේ" සජිත් ස්වාමීන් වහන්සේලා හමුවේ පැහැදිලි කළේය. මේ පිළිබඳව සිවිල් සමාජ ක්‍රියාකාරීන් ද සජිත්ගේ කටයුතු අගය කරමින් කතා කර තිබුණි.

මේ අතර 20 වෙනි සංශෝධනයට විරුද්ධව ක්‍රියා කරන ආකාරය පිළිබඳව සමගි ජන බලවේගය කොළඹදී මෙන්ම කොළඹින් පිටතදී සාකච්ඡා කිහිපයක්ම පවත්වනු ලැබීය.

"මේක සම්මත කළහොත් අදට වඩා මතු පරම්පරාව අපිට ශාප කරයි. ඒ නිසා මේ දවස පාර්ලිමේන්තු ඉතිහාසයේ තීරණාත්මක දවසක්" රාජිත සේනාරත්න කීවේය.

"ආණ්ඩුව යන මේ ඒකාධිපති ගමන වහාම නතර කරන්න ඕන. අපි ඊට එරෙහිව සටන් කරන්න ඕන." මරික්කාර් සඳහන් කළේය.

"අපි විස්සට විරුද්ධව වෙන්නේ පුද්ගල කේන්ද්‍රීය හේතුවකට නොවෙයි. විස්ස කියන්නේ මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය අවසන් කරන ව්‍යවස්ථා සංශෝධනයක් නිසා. මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය අගය කරන සියලු දෙනා වෙනුවෙන් අපි අරගල කරමු" සජිත් නායකත්වය ගෙන සිය සගයන්ට කීවේය.

එක්සත් ජාතික පක්ෂ නියෝජ්‍ය නායක ලෙස පත්වූ රුවන් විජේවර්ධන එම පක්ෂයේ තිබූ සීතල යුද්ධය නිමා කිරීමට කටයුතු ක්‍රියාත්මක කළේය.

"රුවන් පක්ෂයේ සෙසු අය එක්ක කතා කරලා පක්ෂයේ අනාගතය ගැන සැලසුම් මෙන්ම උපක්‍රම පිළිබඳව වාර්තාවක් හදලා පක්ෂයට ඉදිරිපත් කරන්න තීන්දු කරලා තිබෙනවා. එම වාර්තාව මට ලැබුණම මගේ අදහස් ද ඇතුළු කරලා කෘත්‍යාධිකාරී මණ්ලයට ඉදිරිපත් කරනවා. එතනදි තවත් ප්‍රයෝජනවත් අදහස් මතු වුවහොත් ඒවට ඇතුළු කරන්න පුළුවන්." යැයි එක්සත් ජාතික පක්ෂයේ නායක රනිල් වික්‍රමසිංහ ඉකුත් බ්‍රහස්පතින්දා සිරිකොතේදී පැවැති හමුවකදී කීවේය.

"දැන් රවි, නවීන් වගේ නායකයන් රුවන්ට විරුද්ධ වූ අය මොනවගේ තීන්දුවක් ගනීවිද? ඔවුන් ඔබතුමා සමඟ සාකච්ඡා කළේ නැද්ද? මෙහිදී කිහිපදෙනකුම රනිල්ගෙන් විමසා සිටියේය.

"මට නම් කතා කළේ නෑ. රවි, නවීන් මොනවා කරයිද කියලා මම දන්නේ නෑ. ඒ අයයි තවත් කණ්ඩායමකුයි එකතු කරගෙන ඉදිරියට යන එක දැන් නව නියෝජ්‍ය නායකගේ වගකීම බව රනිල් තම ස්ථාවරය සඳහන් කළේය.

**20 වැනි සංශෝධනයට විරුද්ධව සටන් පාඨ ලිව්වේ රෝහිණී කවිරත්න !**





## මිනිසාගේ ක්‍රියාකාරකම් නිසා සිදු වූ දෙයක්

### ජ්‍යෙෂ්ඨ මහාචාර්ය අතුල සේනාරත්න

**භූ විද්‍යා අධ්‍යන අංශය - පේරාදෙණිය විශ්වවිද්‍යාලය**



**ගොඩනැගිලි කඩාවැටීම් සම්බන්ධයෙන් 1980 ගණන්වලදී ලංකාව පුරා නායයෑම් පිළිබඳ සිතියම් ගත කිරීමක් කරනු ලැබුවා. ඒ අනුව ලංකාව පුරා දිස්ත්‍රික් අටක නාය යෑම් සිදු විය හැකි අවදානම් ප්‍රදේශ සිතියම් ගත කර තිබෙනවා. ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය නායයෑම් පිළිබඳ දිස්ත්‍රික් ලේකම් කාර්යාල ලංකාව පුරා ආරම්භ කර තිබෙන අතර ප්‍රාදේශීය මට්ටමින් පොලිස් වසම්වලින්ද ඒ පිළිබඳ දැනුම්වත් කර තිබෙනවා. 2011 වසරෙන් පසු ගොඩනැගිල්ලක් ඉදිකිරීමේදී භූ විද්‍යාත්මකව එය ගොඩනැගීමට සුදුසු ප්‍රදේශයක්ද යන්න ගැන අධ්‍යයනයක් කර තක්සේරුවක් කළ යුතුයි.**

ඒ තක්සේරුවෙන් පසුවයි එම ගොඩනැගිල්ල ඉදිකිරීමේ අවසර ලබා ගැනීම කළ යුතු වන්නේ. 2011 වර්ෂයට පෙර එය ක්‍රියාත්මක නොවුණත් වර්තමානයේ ගොඩනැගිල්ලක් ඉදි කිරීමේදී එම සහතිකය ලැබුණු විට පමණයි ඉදිකිරීම් කළ යුතු වන්නේ. ඊට පෙර සෑදූ ප්‍රමිතයෙන් තොර ගොඩනැගිලි අනතුරට ලක්විය හැකියි. අපේ කාර්යභාරය විය යුත්තේ එවැනි ගොඩනැගිලිවල ප්‍රමිතිය සොයා බැලීමයි. එසේ වුවහොත් සියයට පනහක් හෝ බේරා ගැනීමට හැකි වෙයි. පාදම අනිවාර්යයෙන් ම පිහිටි ගලට අමුණා සකස් කළ යුතුයි. භූ විද්‍යාඥයන්ට පමණයි පිහිටි ගල හඳුනා ගැනීමේ හැකියාව තියෙන්නේ.

පාදම පිළිබඳ අවධානමක් තිබෙනවා නම් ගොඩනැගිලි පර්යේෂණ මධ්‍යස්ථානයෙන් උපදෙස් ලබා ගත හැකියි. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයත් දිස්ත්‍රික් මට්ටමින් පවතින අතර ප්‍රමිතිය සම්බන්ධයෙන් එම ආයතන ගොඩනැගිලි පර්යේෂණ ආයතනයත් සමඟ එකතු කටයුතු කරයි කියා මා විශ්වාස කරනවා. රජයට පුළුවන් මෙරට සිටින සියලු භූ විද්‍යාඥයන් එකතු කරමින් සති දෙකක්,තුනක් ඇතුළත අධ්‍යයනය කරමින් ඒ සම්බන්ධයෙන් වාර්තාවක් ලබා දීමට. එවිට අවදානම් සහිත ගොඩනැගිලි සම්බන්ධයෙන් කටයුතු කළ හැකියි. භූ විද්‍යාත්මක පර්යේෂණයක් කිරීම මඟින් බොහෝවිට මේ ගැටලු කලින් විසඳා ගැනීමට හැකියාව ලැබෙනවා. මහනුවර කඩා වැටුණු ගොඩනැගිල්ල මා පරීක්ෂා කර බැලුවා. එය පාෂාණයට සම්බන්ධයක් නැතිවයි ඉදිකර ඇත්තේ. පාෂාණය තිබෙන නමුත් එයට සම්බන්ධ කරලා නැහැ. උස අඩු ගොඩනැගිල්ලකට අනුමත කරන ලද්දක් පසුකාලීනව තට්ටු කිහිපයක් දක්වා උඩට ගොස් ඇත්තේ. ගොඩනැගිල්ල සෑදීම 2006 ආරම්භ කර ඇති නිසා අනිවාර්යය කොන්දේසි අනුව එය ඉදිවී නැහැ. එවැනි ප්‍රමිතියෙන් තොර නිවාස තවත් තිබිය හැකියි. ඒ නිසා ඉතා ඉක්මන් එවැනි අවදානම් සහිත ගොඩනැගිලි මොනවාද යන්න අප හඳුනාගත යුතුයි. බෑවුම් ප්‍රදේශවල ඉදිකිරීම් කිරීමේදී පහළ ප්‍රදේශයේ ජීවත් වන ජනතාවටද ඒ මඟින් අවදානමක් ඇති වනවා. මේ සම්බන්ධයෙන් සාමුහිකව කතා කිරීමට සංවිධාන විය යුතුයි. මහනුවර ගොඩනැගිල්ල සම්බන්ධ සිදුවීමේදී සිදුවී ඇත්තේ මිනිසාගේ ක්‍රියාකාරකම් නිසා සිදු වූ දෙයක්.

## මේ ගොඩනැගිල්ල කඩා වැටුණේ භූ කම්පනයක් නිසා නොවේ

### අනුර වල්පොළ

**සභාපති භූ විද්‍යා සහ පතල් කාර්යාංශය**



**පළාත් සභා ආයතනය මඟින් අනුමැතිය සඳහා යැවීමේදී එය නිසියාකාරව කළමනාකරණය කළ යුතුයි. මේ කර්තව්‍ය කෙරෙන්නේ නැහැ. නායයෑමේ අවදානම් රහිත ප්‍රදේශයක ගොඩනැගිලි ඉදිකිරීමේදී ගොඩනැගිලි පර්යේෂණ ආයතනයෙන් අනුමැතිය ගැනීමක් සිදු වන්නේ නැහැ. බොහෝ වෙලාවට ප්‍රාදේශීය සභා සහ පළාත් සභා මඟින් සිදු කරනු ලැබුවත් ඒවායේ නිසි අධීක්ෂණය සඳහා කාර්ය මණ්ඩලයේ යම් හිඟයක් තිබෙන අවස්ථාද තිබෙනවා. ඒ අවස්ථාවලදී පළාත් පාලන ආයතනයක් සතුව ඇති සම්පූර්ණ නිවාස සියල්ලම අධීක්ෂණය කිරීමක් සිදු වන්නේ නැහැ. එයයි පළමු වැනි වරද. නිසි ප්‍රමිතියන්ට අනුකූලව නොවෙයි මෙය සිදු වන්නේ.**

නායයෑම් සම්බන්ධයෙන් ගොඩනැගිලි පර්යේෂණ අනුමැතිය ගන්නේ කලාතුරකින්. එසේ නම් පළාත් පාලන ආයතනය මඟින් පමණක් අවසරය අරන් නිවාස ඉදි නොකළ යුතුයි. මේ ඉදිකරන නිවාස තුළ අවදානමක් තිබිය හැකියි. කඳුකර ප්‍රදේශවල බෑවුම් සහිත බිම්වල නිවාස සෑදීමේදී අවදානමක් ඇති අතර ම බොහෝ වෙලාවට මිනිස් ක්‍රියාකාරකම් මතද මෙවැනි දේවල් සිදුවිය හැකියි. එයින් වැළකීමට නම් ගොඩනැගිලි ඉදිකිරීමේදී සරල පිළිවෙතක් නොවෙයි මීට වඩා විධිමත් පිළිවෙතක් අනුගනය කළ යුතුයි. එසේ නම් අදාළ ආයතනවල අනුමැතිය ගත යුතුයි. ත්‍රිකුණාමලයේ මේ වන විට හෝටල් ඉදිකරලා තිබෙනවා. විකිරණශීලී මූලද්‍රව්‍ය නිකුත් කරන ඛණිජ නිධි ලංකාවේ තිබෙනවා. බොහෝ වටිනාකම් ඇති එවැනි නිධියක් උඩ හෝටල් ඉදිකර තිබෙනවා. පසුකාලීනව එහි බලපෑම් ඇතිවෙන්න පුළුවන්. ගොඩනැගිලි ඉදි කිරීමේදී අදාළ ආයතනවලින් අවසර ගත යුතුයි කියලා අපිට ක්‍රමවේදයක් තිබුණේ නැහැ. දැන් ඒ සඳහා කාලය එළැඹ තිබෙනවා. ඒ නිසා මෙය ආපස්සට හරවන්නේ නැතුව දැන් ක්‍රියාත්මක විය යුතුයි. අදාළ සියලු මෙවැනි ගොඩනැගිලිවල ප්‍රමිතිය පරීක්ෂා කිරීම සහ ඉදිරියේදී ඉදි කරන සියලුම ගොඩනැගිලි සඳහා අවසර ගත යුතුයි. එවිට අදාළ ඉදිකිරීම්වලදී අපිට කියන්න පුළුවන් අවදානමක් තියෙනවාද යන්න ගැන. ඒ වගේම පිහිටි පසේ පොස්පේට් නිධි, ඩොලමයිට් නිධි හෝ වෙනත් දෙයක් තිබෙනවාද කියා අපට පෙර දැනුම් දීමක් කළ හැකියි. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මේ සම්බන්ධයෙන් නිසි ක්‍රමවේද හඳුන්වා දී තිබෙන්නේ ඉදිරියේදී මෙවැනි දේ සිදු නොවීමට කටයුතු කිරීමටයි. ඒ අනුව යම් ගොඩනැගිල්ලක් ඉදි කිරීමේදී ආයතන විසි දෙකක් විසින් අවසර ලබා ගත යුතුයි. ඉතා කෙටි කාලයකදී මේ සඳහා අවසර ලබා දීමට මේ වන විට සැලැසුම් කර තිබෙන අතර එය ඉක්මනින් සිදු කිරීමට අප බැඳී සිටිනවා. මේ ගොඩනැගිල්ල සම්බන්ධයෙන් සඳහන් කළහොත් භූ කම්පනයක් නිසා සිදුවූ දෙයක් නොවන බව දැනට සොයාගත් තොරතුරු අනුව




සුභද්‍රා දේශප්‍රිය

# සංවර්ධන සැලසුම් සහ කඩා වැටෙන ගොඩනැගිලි

**මහනුවර බුවැලිකඩ ප්‍රදේශයේ ගොඩනැගිල්ලක් කඩාවැටීමේ සිද්ධියත් සමඟ මෙරට ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ප්‍රමිතිය සම්බන්ධයෙන් සමාජයේ නැවත කතිකාවක් ගොඩ නැඟුණි. මින් පෙර වැල්ලවත්ත ප්‍රදේශයේ එවැනිම ගොඩනැගිල්ලක කොටසක් කඩා වැටීමක් සිදු විය. මෙවැනි සිදුවීම්වලදී විවිධ පාර්ශ්වයන් විවිධ මත පළ කර ඇත. මෙවැනි ගොඩනැගිල්ලක් ඉදි කිරීමේදී අනිවාර්යයෙන් අවසරය හා උපදෙස් ලබා ගත යුතු ආයතන කිහිපයක් වේ.**

**ආපදා කළමනාකරණයේදී තාක්ෂණික වශයෙන් සේවා සැපයීම මෙන්ම ගංවතුර, නාය යෑමේ, සුළිසුළං ආදී ආපදාවන්ට ඔරොත්තු දෙන ආකාරයෙන් ඉදිකිරීම් කරන්නේද යන කාරණය ගැන විද්‍යාත්මකව තොරතුරු සැපයීමත් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් සිදු කරයි.**

**ඉදිකිරීම් සඳහා යොදාගන්නා ගොඩනැගිලි ද්‍රව්‍ය ගැන ප්‍රමිතිය විද්‍යානුකූලව සහතික කිරීමද අත්‍යාවශ්‍ය කාර්යයකි. පාරිසරික සාධක වන ජලය, වාතය, ශබ්දය වැනි කරුණු පිළිබඳ පර්යේෂණ කර එමඟින් සිදු වන කම්පන පිළිබඳ තොරතුරු ලබා දීමක් සිදුවිය යුතුය. ගොඩනැගිල්ලක් ඉදි කිරීමේදී පළමුව පළාත් පාලන ආයතනයෙන් අනුමැතිය ලබාගත යුතුය. මේ අනුමැතිය ලබා ගැනීමේදී අදාළ පළාත් පාලන ආයතනයේ සුවිශේෂී නීති ඇත. ඒඅනුව බිම් කැබැල්ලේ සහ නිවසේ සැලැසුම ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එම ඉදිකිරීමට අදාළ මූලික සැලසුම නාගරික සංවර්ධන අධිකාරියට හෝ අදාළ පළාත් පාලන ආයතනයට ඉදිරිපත් කර අනුමත කරගත යුතුයි. ඉන්පසු එහි ව්‍යුහගත සැලසුම් සකස් කිරීම සිදුවෙයි. ඉදිකිරීම් ව්‍යුහය සැලසුම් කිරීමේදී භූ ගර්භ පරීක්ෂාව කළ යුතුයි.**

**ඇතැම් විද්වතුන් පවසන්නේ පිහිටි පස නිසි ලෙස තෝරා ගෙන එම මවු පාෂාණ ශක්තිය පිළිබඳ පරීක්ෂා කොට ගොඩනැගිලි ඉදි කළ යුතු බවයි. 2011 වසරේදී ගොඩනැගිල්ලක් ගොඩනැගීමේදී එය භූ විද්‍යාත්මකව සුදුසු ප්‍රදේශයක්ද යන්න පිළිබඳ අධ්‍යයනයක් කර තක්සේරු කරමින් එයට අවසර ලබා ගැනීමට කටයුතු කර ඇතත් ඊට පෙර එවැනි ප්‍රමිතියෙන් තොර නිවාස විශාල ලෙස ඉදි වී ඇත. එයට හේතුව 2011ට පෙර එවැනි පනතක් නොතිබීමයි. ඒ නීතිය සියලු පාර්ශ්වයන් විසින් අනුගමනය කරන්නේ නම් මෙවැනි ඛේදවාචක සිදු නොවනු ඇත.**



## අපි මේ සම්බන්ධයෙන් දැඩි පියවර ගන්නවා

### නීතීඥ ලලිත් යූ. ගමගේ

**මධ්‍යම පළාත් ආණ්ඩුකාර**



**මේ වනවිට මේ සම්බන්ධයෙන් කමිටුවක් පිහිටුවා තිබෙනවා. ඒ අනුව අවදානම් නිවාස සහ සියලු නිවාස මේ වනවිට පරීක්ෂාවට ලක්කරමින් පවතිනවා. යම් කෙනෙක් ඉල්ලීමක් කළොත් තමන්ගේ නිවස අවදානම් තත්ත්වයේ කියලා, එය පරීක්ෂා කිරීමටද මේ කමිටුව යනවා. එසේ ගොස් පරීක්ෂා කරන නිවාස පිළිබඳ වාර්තාවක් සති දෙකක් ඇතුළත ලබා දෙන්න කියලා අපි නිර්දේශ කර තිබෙනවා. පළාත් සභාවේ ඉජිනේරුවන්ගේ උපදෙස් ඒ අයට ලබා දීමට කටයුතු කරනවා.**

නිවසක් ඉදිකරන්නේ නම් එහිදී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග මොනවාද යන්න පිළිබඳ ජනතාව දැනුම්වත් වී සිටිය යුතුයි. මේ කඩාවැටීමට ලක්වූ නිවසේ මුල් අදියරේ ඉදිකිරීම් සඳහා 2006 වසරේදී අවසර ගෙන ඉන්පසුව තමයි මේ ආකාරයට තට්ටු පහක් දක්වා උඩට මේ නිවස ඉදි කරලා අවසානයේ තවත් තට්ටුවක් ගත් බවයි මෙහි වාර්තාවේ සඳහන් වෙන්නේ. අපි දන්නේ නැහැ මේ නිවසේ අත්තිවාරම සකස් කර ඇත්තේ තට්ටු කීයකටද කියලා. පස සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරලා නැහැ. බෑවුම් තැනක පසට ඔරොත්තු දෙනවා ද කියන කාරණාව දන්නේ නැහැ. කමිටුව ඉදිරියේදී මේ සම්බන්ධයෙන් නිර්දේශයක් නිකුත් කර පස සම්බන්ධයෙන් පරීක්ෂා කර අදාළ ඉඩම්වල සැකසීමට සුදුසු නිවස කුමක්ද යන්න තීරණය කරයි. පිහිටිගලට සම්බන්ධ කරලා සෑදුවා නම් මෙවැනි ඛේදවාචක සිදු වන්නේ නැහැ. ගැළපෙන ක්‍රමයට නිවසක් සකස් කළ යුතුයි. නීතිවිරෝධි ලෙස නිවාස හා ගොඩනැගිලි ඉදිකිරීම සිදු වන අවස්ථා අපි දැක තිබෙනවා. මහනුවර නගර සභාවේ පමණක් නිවාස දෙසියයක් පමණ කඩා ඉවත් කරන්න තීන්දු කර තිබුණත් එකක් වත් කඩා ඉවත් කර නැහැ. ඒ දේවල් විසඳා ගත යුතුයි. මෙය ක්‍රියාදාමයක්. එකවර කළ නොහැකියි. නායයෑමක් නොවෙයි මෙතන සිදුවෙලා තියෙන්නේ ගොඩනැගිල්ලයි කඩාගෙන ගිහින් තිබුණේ. මෙහි අභ්‍යන්තර ගැටලු ගොඩාක් තිබෙනවා. දාමයක් වගේ බොහෝ තැන් පරීක්ෂා කරන්නට අවශ්‍යයි. එක් ආයතනයකට ඇඟිල්ල දිගු කරන්න බැහැ. ඉඩම් කැබලි සැලැස්ම ඉදිරිපත් කළාම අනුමත කර තියෙන්නේ 2006 වසරේදී. නමුත් එහි අනුමත විදිහට සකස් කර නැහැ.

අපි මේ සම්බන්ධයෙන් දැඩි පියවර ගැනීමට උත්සාහ කරනවා. මේ වනවිට අපිට විශාල ප්‍රමාණයක් පැමිණිලි ලැබී තිබෙනවා. මේ කැඩුණු බිල්ඩින් එක අසල ඇළක් තිබෙනවා. එම ඇළ නිසා මේ නිවස අසල ඛාදනය වීමක් සිදුවෙලා තිබෙනවා. කලින් පළුඳු වී තිබෙන බවක් පෙනෙනවා. මේ එක් සිදුවීමක් නිසා අහිංසක මිනිසුන් පිරිසක් බිලි වුණේ. කැබලි ඉවත් කරන තුරු මෙහි අත්තිවාරම සම්බන්ධයෙන් සොයා බැලීමට කිසිදු ක්‍රමවේදයක් නැහැ. ඒ නිසා මෙහි තීරණයක් ගන්න ඉතා අපහසුයි. වගකිවයුතු සියලු ආයතන එකතු කරලා කමිටුවක් පත් කරලා කමිටුවේ නිරීක්ෂණයට අනුව නිර්දේශ අනුව ඉදිරියේදී මේ වැනි දේ නොවන්නට වැඩපිළිවෙළක් සකස් කිරීමට බලාපොරොත්තු වෙනවා.

## හිතුමතේ ගොඩනැගිලි ඉදිකරන්න එපා

### ප්‍රදීප් කොඩිප්පිලි

**නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය**



**ස්වාභාවික ආපදා අවස්ථාවකදී ත්‍රිවිධ හමුදාව, පොලිසිය යොදලා අවශ්‍ය කටයුතු අපි කරනවා. ගින්න නිවීමේ කටයුතු සම්බන්ධයෙන්ද අප කටයුතු කරනවා. මෙය සිදුවී ඇත්තේ ගොඩනැගිල්ලේ ප්‍රමිතියේ ගැටලුවක් නිසාද කියන කාරණාව සම්බන්ධයෙන් දැනට පර්යේෂණ මට්ටමේ පවතිනවා. ඉදිරියේදී නාය යෑමේ අවදානම හඳුනාගත් දිස්ත්‍රික්කවල ඉදිකිරීම් සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ අනුමැතිය ලබා ගත යුතුයි. එහිදි අනුමැතිය ලැබුණහොත් පමණයි නගර සභා සහ ප්‍රාදේශීය සභාවලට අනුමැතිය ලබා දිය හැකි වන්නේ. එසේ නොමැති ව අනුමැතියෙන් තොරව කරනදේවල් කරන්න එපා කියලා තමයි අපි ජනතාවට කියන්නේ. එය නීති විරෝධී කටයුත්තක්. එවැනි ගොඩනැගිලි තමයි මේ ආකාරයට කඩාවැටීමට ලක්වන්නේ. මේ නීති පද්ධතිය තුළ මිනිසුන් නිවැරදි ආකාරයට හැසිරෙනවා නම් මෙවැනි සිදුවීම් සිදුවන්නේ නැහැ.**

කඳුකර ප්‍රදේශවල නායයෑම්වලට වැඩි උත්තේජනයක් සහ සාධකයක් වන්නේ වර්ෂාවයි. ඕනෑම බිල්ඩින් එකක් ගොඩනැගිය යුත්තේ පිහිටි ගලට අනුවයි. එවිට කඩාවැටීමක් වෙන්නේ නැහැ. එහිදී ඉදිකිරීම් සම්බන්ධයෙන් කටයුතු කළ ඉජිනේරුවන් විසින් දැනුම්වත් විය යුතුයි. ඒ නිසා ඉදිකිරීම් සම්බන්ධ ක්‍රියාකලාපයක් මේ අනතුරට හේතුව වී තිබෙනවා. මිනිස් ක්‍රියාකාරකම් නිසා මෙවැනි දේ සිදු වන අවස්ථා තිබෙනවා. පස් කඳු කැපීම්, කණ්ඩි කැපීම් සිදු වන අවස්ථාවලදී නායයෑම් සිදුවනවා. එවැනි මිනිස් ක්‍රියාකාරකම් නිසා නායයෑම් සිදුවනවා. මෙය සම්පූර්ණයෙන් ම ඉදිකිරීමේදී සිදු වන වරදක් නිසා සිදු වන අවස්ථා තිබෙනවා. පැහැදිලිවම එවැනි දේවල් සිදුවීම වැළැක්වීමට කළ යුත්තේ ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ දැනුම ඇතිව උපදෙස් අනුව ගොඩනැගිලි ඉදි කිරීමයි. එසේ නැතිව හිතුමතේ ගොඩනැගිලි ඉදිකරන්න එපා කියලයි අපි ජනතාවට කියන්නෙ. ඒ වගේම කැලෑ එළිකිරීම්, පස් කණ්ඩි කැපිම් තමන්ට අවශ්‍ය ආකාරයට නොකරන්න කියලත් අපි උපදෙස් දෙනවා. ඉදිරියේදී මෙවැනි දේ නොවන්න තාක්ෂණික දැනුම නැතිව කිසිම ඉදිකිරීමක් කරන්න එපා කියලත් අපි ජනතාවගෙන් ඉල්ලීමක් කරනවා.

## මෙය ප්‍රමිතියේ අඩුවක් නිසා සිදුවූවක්

### ආර්. එම්. එස්. බණ්ඩාර

**අධ්‍යක්ෂ, ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ පර්යේෂණ අවදානම් කළමනාකරණ අංශය**



**එම ගොඩනැගිල්ලේ ඉදිකිරීමේදී ව්‍යුහයේ ඇතිවූ ගැටලුවක් ලෙසයි අපි එය දකින්නේ. දැනටමත් අපි ඒ පිළිබඳ පර්යේෂණයක් සිදු කරනු ලබනවා. එතැන නායයෑමක් හෝ ගිලාබැසීමක් සිදුවී නැහැ. කඳුකර ප්‍රදේශවල ඉදිකිරීම් කරනවා නම් ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් දෙනු ලබන නිර්දේශයන් මත ඉදිකිරීම් කටයුතු සිදු කරන්න කියලා අපි ජනතාවගෙන් ඉල්ලිමක් කරනවා.**

ඒ වගේම පළාත් පාලන ආයතනය මඟින් අවසරය ගනු ලබන විට අපේ ආයතනය මඟින් නිකුත් කරනු ලබන නිර්දේශයද එයට ඇතුළත් කරන්න කියලා අපි ඉල්ලීමක් කරනවා. එවිට හොඳ ඉදිකිරීමක් කරන්නට පුළුවන්. එසේ නැතිව තමන්ට අවශ්‍ය අවශ්‍ය ආකාරයට ඉදිකිරීම් කරන්න එපා. නිසි අධීක්ෂණය යටතේ නිසි ප්‍රමිතිය යටතේ ඉදිකිරීම් කරන්න කියලයි අපි කියන්නෙ. තැන් තැන්වල පිහිටීම අනුව එයට අදාළ ව්‍යුහයක් මත ඉදිකිරීම් කළ යුතුයි. අනුමැතිය සඳහා පළාත් පාලන ආයතනයට යවනවා. එහිදී අපෙන් උපදෙස් ලබා ගන්න කියලයි අපි කියන්නේ. ඒ උපදෙස්, අනුමැතිය ලැබුණත් ඇතැම් අය ගොඩනැගිල්ල හදන විට එය කරන්නේ ඒ අයට ඕන විදිහටයි.

මෙය ගොඩනැගිල්ලේ පැවති ප්‍රමිතියේ අඩුවක් ලෙසයි අපි දකින්නේ. සාමාන්‍යයෙන් තට්ටු දෙකකට අනුමත කළ බිල්ඩින් එකක් නම් එහිදී එයට තව තට්ටුවක බලය දරන්න බැරිවෙයි. එවැනි දෙයක් තමයි මෙහිදී සිදුවන්නට ඇත්තේ.



දියසෙවළ බැඳී ඇති අයුරු



මලකඩ කා ඇති යකඩ තරප්පු පෙළ



වර්ෂා කාලයේ දී පංතිවල වැහි වතුර

# සවුත්ලන්ඩ්ස් බාලිකාවේ දැරියන් අනතුරේ

● ලලිත් චාමින්ද - ගාල්ල

**ලෝක උරුම ගාලු කොටුවේ පිහිටි සවුත්ලන්ඩ්ස් විද්‍යාලය දකුණු පළාතේ පමණක් නොව දිවයිනේ පිහිටි ප්‍රධාන පෙළේ බාලිකා පාසල් අතර එකකි.**

පසුගිය පාලන කාලයේ දි ගාලු කොටුවේ පිහිටි රාජ්‍ය ආයතන කොටුවෙන් ඉවත් කිරිමට තින්දුවක් ගෙන තිබුණි. රාජ්‍ය ආයතන ඉවත් කිරිමෙන් පසු එම ගොඩනැගිලි සංචාරක කටයුතු සඳහා යොදාගැනිමට සැලසුම් කොට තිබුණි. ගාල්ල සවුත්ලන්ඩ්ස් විද්‍යාලයද කොටුවෙන් ඉවත් කිරිමට ද පිඹුරුපත් සකස් කරනු ලැබීය. එහෙත් පාසලේ ආදි සිසුවියන්ගේ හා පාසල් ප්‍රජාවගේ විරෝධතා නිසා එය ලත් තැනම ලොප් විය. සවුත්ලන්ඩ්ස් විද්‍යාලයේ ඇති ගොඩනැගිලිවලින් වැඩි සංඛ්‍යාවක් ලන්දේසි යුගයේ දී ලන්දේසි ගෘහ නිර්මාණවලට අනුකූලව ඉදි කළ ගොඩනැගිලිය. මේ වනවිට මෙකී ගොඩනැගිලි බෙහොමයක් අබලන් තත්ත්වයට පත්ව ඇත්තේය. මෙකී ගොඩනැගිලි නඩත්තු කිරීමද එතරම් ලේසි පහසු කාර්යක් නොවේ. පෞරාණික ගොඩනැගිලි නිසා පුරාවිද්‍යා නිතිරිතිවලට අනුකූලව එම ගොඩනැගිලි අලුත්වැඩියා කළ යුතුය. ඒ සඳහා විශාල මුදලක් දැරීමට සිදු වේ. පාසල් ප්‍රජාවට මෙය තනිවම කළ හැකි කාර්යක් නොවේ. මේ වනවිට ගාල්ල සවුත්ලන්ඩ්ස් විද්‍යාලයේ ගොඩනැගිලි කිහිපයක් ඉතා අබලන් තත්වයේ පවතින අතර මෙම තත්වය නිසා පාසලේ ඉගෙනුම ලබන සිසුවියන් හා ආචාර්ය මණ්ඩලය ගැටලු රැසකට මුහුණ දි සිටිති. ඇතැම් ගොඩනැගිල්වල වහලය සිවිලිම් දැඩි ලෙස අබලන්වි ඇති අතර බිත්ති ඉරිතලායැමට ලක්ව ඇත. දැඩි ලෙස අබලන් තත්වයේ පවතින මෙකි ගොඩනැගිලි වල ඇති පන්ති කාමරවල සිටි අධ්‍යාපන කටයුතුවල නිරතවන සිසුවියන්ගේ මෙන්ම ගුරුවරුන්ගේ ජීවිත දැඩි අනාරක්ෂිත තත්වයට පත්ව ඇති බව දෙමව්පියෝ පවසති.

අබලන්ව ඇති එක ගොඩනැගිල්ලක් වන්නේ බී.ආර් දිසානායක ගොඩනැගිල්ලයි. මෙකී ගොඩනැගිල්ලේ කෙළවර බිත්තියේ ඉහළ කොටසේ සිවිලිම හා බිත්තිය අතර ඇත්වීමක් දක්නට තිබේ. මේ නිසා මෙකි ගොඩනැගිල්ලේ පැති බිත්තිය ඉරිතලා පැල්මක්ද ඇතිවි තිබෙන බව මව්පියන් පෙන්වා දෙති. මෙම ගොඩනැගිල්ල කඩිනමින් පිළිසකර කළ යුතුව ඇත. ඒ විතරක් නොව බී. ආර්. දිසානායක ගොඩනැගිල්ලේ පඩිපෙළ ද දැඩි ලෙස අබලන් තත්ත්වයට පත්ව ඇත. මෙකී පඩිපෙළ ඉදිකිරීම සඳහා රුපියල් 11,29000ක මුදලක් වැයවන බවට දිස්ත්‍රික් ඉංජිනේරු (ගොඩනැගිල්ල) කාර්යාලය මගින් ඇස්තමේන්තුවක් ද සකස්කොට දී ඇත.

මෙකී දෙමහල් ගොඩනැගිල්ලේ හය හා හත ශ්‍රේණියේ පන්ති 14ක සිසුවියන් 600 දෙනෙකු පමණ අධ්‍යාපන කටයුතුවල නිරතව සිටියහ. එහෙත් දෙමහල් ගොඩනැගිල්ලේ ඇති අනාරක්ෂිත බව නිසා පසුගිය 11 වැනිදින සිට පස්වරුවේ මෙකි පන්ති පැවැත්වීමට පාසල් බලධාරීන් විසින් කටයුතු කරනු ලැබීය. පස්වරු 12.30 සිට හය සහ හත ශ්‍රේණිවල පන්ති පාසලේ වෙනත් ගොඩනැගිල්ලක පැවැත්වීමට පාසල් බලධාරින් විසින් කටයුතු කර ඇත. එකී පන්ති පැවැත්වීමට ඉඩකඩ වෙන්කරගැනිම හා කාලය කළමණාකරණය කරගැනීම සඳහා 08 හා 09 ශ්‍රේණිවල පන්ති 12.30ට අවසන් කිරිමට පියවරගෙන තිබේ..

අනික් අනාරක්ෂිත ගොඩනැගිල්ල වන්නේ වික්‍රමසිංහ ගොඩනැගිල්ලයි. පාසලේ උසස්පෙළ වාණිජ්‍ය අංශයේ පන්ති පැවැත්වෙන්නේ මෙකී ගොඩනැගිල්ලේ වන අතර එහි සිසුවියන් 200 දෙනෙකු පමණ අධ්‍යාපන කටයුතුවල නිරත වෙති. මෙකී ගොඩනැගිල්ලේ ලැලි සොල්දරය හා කෙළවර කණු දිරාපත්ව ඇත. වහලය පහත්වී තිබේ. ගොඩනැගිල්ලේ ජනෙල්පියන්ද ඉතා අබලන් තත්ත්වයේ පවති. මෙහි ඉගෙනුම ලබන සිසුවියන් අනාරක්ෂිත තත්ත්වයක් යටතේ ඉගෙනුම ලබති.



ගාලු උරුමය පදනමේ සභාපති පරාක්‍රම දහනායක

## ගොඩනැගිල්ල අනාරක්ෂිත නිසා 07, 08 ශ්‍රේණිවල පන්ති පස්වරුවේ පැවැත්වීමට තිරණය කරලා

ලෙකෝ ගොඩනැගිල්ලේ කොටසක්ද අබලන් තත්ත්වයේ පවති. එහි එක් කොටසක පෙරදිග සංගීත කාමරය පවත්වාගෙන යනු ලබන අතර එහි බිත්ති ඉරිතලා පැල්මක් මතුවී ඇත. ඉදිරිපස අනෙක් බිත්තිද ඉරිතලා ගොස් ඇත. වහලයේ කොටසක් අබලන්වීම නිසා වර්ෂා දිනවලදී තෙමීමට ලක්වීමෙන් සිවිලිමේ කොටසක් කඩා වැටී තිබේ. මේ නිසා වර්ෂාව පවතින දින වලදි මෙකී පන්ති කාමරය හා බිත්ති තෙමීමට ලක්වීම නිසා එහි ඉගෙනුම ලබන සිසුවියක් ගැටලු රැසකට මුහුණ දී සිටිති.

මෙම තත්වය පිළිබඳ වගකිවයුතු බලධාරින් දැනුවත් කිරිමට පාසල් බලධාරින් කටයුතු කරනු ලැබිය. පසුගියදා රමේෂ් පතිරණ ඇමතිවරයා පාසලට පැමිණි අබලන්ව ඇති ගොඩනැගිලිවල තත්ත්වය පිළිබඳ සොයා බැලුවේය. කඩනමින් දිසානායක ගොඩනැගිල්ලේ අලුත්වැඩියා කටයුතු සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයට කතා කර ලක්ෂ 35ක මුදලක් වෙන්කරදීමට කටයුතු කරනු ලැබිය.

මේ පිළිබද දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක නිමල් දිසානායකගෙන් අප කළ විමසුමකදී මෙසේ කීවේය.

පාසලේ ගොඩනැගිලි අබලන්වීම පිළිබද ගාල්ල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරියත් ගොස් මේ ගැන පරික්ෂා කළා. මේ පිළිබඳ ව අධ්‍යාපන අමාත්‍යංශය දැනුවත් කිරිමට කටයුතු කරලා තියෙනවා. අබලන්ව ඇති ඇතැම් ගොඩනැගිලි වල අලුත්වැඩියා කටයුතු සඳහා ඇස්තමේන්තු පවා සකස් කරලා තියෙනවා.

ගාල්ල සවුත්ලන්ඩ්ස් විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමයේ සම ලේකම් උපුල්ශානි ගුණවර්ධන මෙසේ කිවාය.

පාසලේ ගොඩනැගිලි කිහිපයක ගැටලු තියෙනවා. ඒ ගොඩනැගිල අබලන් වෙලා. සිමෙන්ති කුට්ටි පඩි පෙළවල් මත එල්ලෙනවා. ඇත්තටම දරුවන් ගැන අනාරක්ෂිත බවක් තියෙනවා. ගොඩනැගිල්ලේ ලී සොල්දර දෙක හොඳටම අබලන් වෙලා. පාසලේ පුස්තකාලය වහලා තියෙන්නේ. පාසලේ වැසිකිළි වලක් අඩි 03කට වඩා හාරන්න පුරාවිද්‍යාවෙන් ඉඩ දෙන්නේ නැහැ.

ගාල්ල මහ නගරාධිපති ප්‍රියන්ත සහබන්දු කීවේ මෙවැනි කතාවකි.

රමේෂ් පතිරණ ඇමතිතුමා සහ මම පාසලට ගොස් අබලන් වූ ගොඩනැගිලි පරික්ෂා කළා. එක් ගොඩනැගිල්ලක බිත්තිය සහ පඩි පෙළ ඉදි කිරිම සඳහා රුපියල් ලක්ෂ 35ක් ඇස්තමේන්තු කරලා තිබුණා. රමේෂ් පතිරන ඇමතිතුමා මැදිහත්වෙලා අධ්‍යාපන අමාත්‍යාංශයට කතා කරලා එම මුදල ලබාදීමට කටයුතු කළා. අබලන් වී ඇති අනික් ගොඩනැගිලි වලද ඇස්තමේන්තු සක කිරීමට ඇමතිතුමා උපදෙස් දුන්නා.



ආදි ශිෂ්‍ය සංගමයේ සම ලේකම් උපුල්ශානි ගුණවර්ධන

දකුණු පළාත් සහකාර පුරාවිද්‍යා කොමසාරිස් වසන්ති අලහකොන් මෙසේ පැවසීය.

සවුත්ලන්ඩ්ස් විද්‍යාලයේ අබලන්ව ඇති ගොඩනැගිලිවල වහල හා අබලන්ව ඇති බිත්ති කපරාරු කිරිම සඳහා අවශ්‍ය අනුමැතිය අපි ලබාදීලා තියෙනවා. පුරාවිද්‍යා නීතිරීති වලට අනුව පෞරාණික බව ආරක්ෂා කරමින් අලුත්වැඩියා කටයුතු කළ යුතු වෙනවා. අපේ දෙපාර්තමේන්තුව නිලධාරියකු විසින් ඒ ගැන අධික්ෂණය කරනවා. වැසිකිළිවලවල් අපි ලබා දි නිර්දේශ අනුව හැරිමට අපහසු නම් දරුවන්ගේ අවශ්‍යතාව ගැන කියලා අපිට දැනුම් දෙන්න කියලා දන්වලා තියෙනවා. වැසිකිළිවලවල් අඩි තුනට හාරන්න ඕන කියලා අපි කියලා නැහැ. අලුත්වැඩියා කටයුතු සඳහා අවශ්‍ය අනුමැතිය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් ලබා දිලා තියෙනවා.

## පාසලේ පුස්තකාලයත් වහලා

ගාල්ල සවුත්ලන්ඩ්ස් විද්‍යාලයේ පාසල් සංවර්ධන සමිතියේ ලේකම් ළහිරු අරඹවෙල මෙසේ කීවේය.

පාසලේ තියෙන ගොඩනැගිලිවලින් වැඩි සංඛ්‍යාවක් පෞරාණික ගොඩනැගිලි. ගොඩක් ගොඩනැගිලි අබලන් වෙලා. මේ ගොඩනැගිල්ල අනාරක්ෂිත නිසා තමයි 07 හා 08 ශ්‍රේණිවල පන්ති පස්වරුවේ පැවැත්වීමට තිරණය කළේ පාසලේ. දරුවන්ගේ ආරක්ෂාව ගැන හිතලා තමයි විදුහල්පතිතුමිය ඇතුළු පාසල් බලධාරින් ඒ තින්දුව ගත්තේ. ගාලු උරුමය පදනමේ සභාපති ගාල්ල නගර සභාවේ නාගරික මන්ත්‍රී පරාක්‍රම දහනායකගේ අදහස මෙසේය.

පුරාවිද්‍යා නිතිරිති අනුව අදාළ ගොඩනැගිලි සංරක්ෂණය කරගැනිමේ වගකීම තියෙන්නේ අදාළ ආයතනවලට. සංරක්ෂණ සැලැස්මක් හදලා දීලා අවශ්‍ය මග පෙන්වීම කටයුතු අපිට කරන්න පුළුවන්. සවුත්ලන්ඩ්ස් විද්‍යාලයේ තියෙන්නේ පැරණි ගොඩනැගිලි අලුත් වැඩියා කිරිම. එය අධ්‍යාපන දේපාර්තමේන්තුව මගින් කළ යුතුයි. සවුත්ලන්ඩ්ස් විද්‍යාලය වගේ පාසලක පාසල් සංවර්ධන සමිතියට හොඳ මූල්‍ය ශක්තියක් ද තියෙනවානේ .

## කාවන් යළි මෙරටට ගෙන්වා ගැනීමේ ප්‍රායෝගික අසීරුතා

● සුරේකා නිල්මිණී ඉලංගකෝන්

**විවිධ හේතු නිසා වසර ගණන් අනුන්ගේ රටවල සිරගත වූ මිනිසුන් ගැන ඔබ අසා ඇත. එසේ සිරගත වූවකුට දැනෙන අසරණකම වදනින් කිව නොහැක්කකි. එසේ නම් එසේ සිරගත වීමේ හැඟීම් වචනවලින් ප්‍රකාශ කළ නොහැකි සත්ත්වයකුගේ තත්ත්වය කෙසේ විය හැකිද? මේ කතාව එවැනි සත්ත්වයකු ගැන ය. ඒ, කාවන් නමැති හස්ති රාජයෙකි. වසර 35 ක් ශ්‍රී ලංකාවෙන් බැහැරව පාකිස්ථානයේ සත්වෝද්‍යානයක දිවි ගෙවමින් සිටි කාවන්ට දැන් සදහටම ශ්‍රී ලංකාව අහිමි වන තැනට කටයුතු යෙදී තිබේ. ඒ, කාවන් කාම්බෝජයට යැවීමට සත්ත්ව අවිංහිසා බලධාරීන් තීරණය කිරීම නිසාය.**

කාවන් ගැන එහෙම කීවාට මේ කතාවේ අගක්මුලක් කියවන ඔබට නොවැටහෙනවා විය හැකිය. elephas maximus වර්ගයට අයත් කාවන් දැන් වසර 39ක් පමණ වන හස්තියෙකි. ලංකාවේ උපන් කාවන් වයස අවුරුදු 4ක් පමණ වද්දී ජේ.ආර්. ජයවර්ධන පාලන සමයේදී පාකිස්ථානයට යන්නේ මෙරටින් එරටට පිරිනැමුණු ත්‍යාගයක් ලෙසට ය. ඒ, 1985 වසරේදීය. ඉන්පසු කාවන්ගේ නවාතැන වන්නේ ඉස්ලාමාබාද්හි මූර්ග්සර් සත්වෝද්‍යානයයි. එහෙත් එහි කාවන්ගේ ජීවිතය සුවදායක එකක් වූයේ නම් නැත. පකිස්ථානයේ වනගත අලි නොමැති අතර සත්ත්ව උද්‍යාන කිහිපයක අලි ඇතුන් සිවු දෙනකු පමණක් ජීවත් වන බව පැවසේ. එම නිසා කාවන්ට ගෙවන්නට සිදු වූයේ අතිශය දුක්බර ජීවිතයකි. එය සිරකරුවකුට සමාන ජීවිතයක් කිවහොත් නිවැරදිය. ඔහු වෙනුවෙන් වෙන්ව තිබුණේ හස්තියකුට කිසිසේත් නොගැළපෙන තරම් කුඩා ඉඩකි. එහෙත් 1990දී කාවන්ට සුදුසු සහකාරියක් සොයා දෙන්නට එරට සත්ත්ව උද්‍යාන බලධාරීහු කටයුතු කළ අතර ඒ "සහේලී" නමැති කෙණරකි.

බිරියක් ලැබීම නිසා කාවන් ගේ ජීවිතය පෙර තිබුණාට වඩා සතුටින් පිරිණ. ඔහු ජීවත් වූ කුඩා ඉඩ සහේලි සමඟ සතුටින් බෙදා ගත්තේය. සත්වෝද්‍යානය නැරඹීමට පැමිණෙන නරඹන්නන්ට කාවන්- සහේලි ප්‍රිය දසුනක් විය. ඊට මූලික හේතුව පකිස්ථානයේ සිටි එකම ආසියානු අලියා කාවන් වූ නිසාය. එහෙත් හදිසියේ රෝගාතුර වූ සහේලි 2012 වසරේදී මිය යෑම නිසා කාවන් යළිත් අසරණ විය. පාළුව, තනිකම මෙන්ම සිරුර පෙළෙන දැඩි උෂ්ණත්වය දරාගැනීමට පමණක් නොව ලැබෙන දෙයකින් කුස පුරවා ගැනීමටද කාවන්ට සිදු විය. ඒ නිසා කාවන් ප්‍රචණ්ඩ වූ බවද පැවසේ. ඒ නිසාම 2000 වසරේ සිට කාවන්ගේ පාදවලට විලංගු දමා තිබූ බවද හෙළි වී ඇත. නමුත් එහෙත් කාවන් වෙනුවෙන් හඬක් නඟන්නට කිසිවකු සිටියේ නැත. තෑග්ගක් දුන් පසු යළි ඒ ගැන විමසුම් කරන සිරිතක් නැති නිසාදෝ මෙරට බලධාරීන්ද යළි කාවන් ගැන පකිස්ථානයෙන් විමසන්නට නොගියහ.

එහෙත් කාවන් කම්පා වූ හදවතක් ඔහු වෙනුවෙන් හඬ නඟන්නට තීරණය කරන්නේ එවැනි පසුබිමක් තුළදී ය. ඒ පකිස්ථානයේ කාවන් රඳවා සිටි සත්වෝද්‍යානයට ආ ඇමෙරිකානු පොප් ගායිකාවක වන චේර් ගේ නෙත කාවන් වෙත යොමු වීම නිසාය. සත්ත්වයකු වුවද කාවන් විඳින වේදනාව ඇය මැනවින් දුටුවාය. ඒ සැණින් ඇය ස්වෙච්ඡා සංවිධාන කිහිපයක් එක් කරගනිමින් කාවන් නිදහස් කර ගැනීමේ සටන ඇරඹුවාය. එහි අවසන් ප්‍රතිඵලය වන්නේ පරිසරවේදීන් සහ සිවිල් සංවිධාන කිහිපයක් එක්ව සත්වෝද්‍යානයට සහ එරට වන ජීවී බලධාරීන්ට එරෙහිව නඩු පැවරීමයි. එපමණක් නොව කාවන් නිදහස් කරගන්නට අන්තර්ජාල පෙත්සමක් අත්සන් කිරීමද ඔවුන් ආරම්භ කළ අතර කෙටි කලකින් ලක්ෂ දෙකක් ජනයා කාවන්ගේ නිදහස වෙනුවෙන් මේ අන්තර්ජාල පෙත්සමේ අත්සන් තබා තිබිණ. ඉස්ලමාබාද් මහාධිකරණය කාවන් වෙනුවෙන් ලබා දුන් තීන්දුව වූයේ වහාම කාවන් නිදහස් කරන ලෙසයි.



පාකිස්ථානයේ 'සිරගත' වූ කාවන් හස්තියා

# නිදහස් කළත් නිදහස් නොවූ කාවන්

## කාවන් කාම්බෝජයට යැවීමට සුදුසු සෞඛ්‍ය තත්ත්වයක සිටින බව සත්වෝද්‍යානයේ වෛද්‍යවරු නිර්දේශ කරති

වසර 30කට අධික කාලයක් කාවන් හස්තියාට කෲර ආකාරයෙන් සැලකීම 1890 දරන සත්ත්ව හිංසන පනත සහ 1979 වනජීවි සංරක්ෂණ පනත උල්ලංඝනය කිරීමක් බවත් එබැවින් වහාම හස්තියා නිදහස් කළ යුතු බවත් එම තීන්දුවෙන් වැඩිදුරටත් සඳහන් විය. ඒ අනුව ශ්‍රී ලංකාව සමග සාකච්ඡා කර කාවන් රඳවා තැබීමට සුදුසු ඔහුට සුව පහසුව සැලසිය හැකි සත්වෝද්‍යානයක් හෝ අලි ඇතුන් සිටිනා ස්ථානයක් පිළිබඳ දැනුම් දෙන ලෙසද එරට අධිකරණය පාකිස්තාන වනජීවී දෙපාර්තමේන්තුවට හා සත්වෝද්‍යාන බලධාරීන්ට නියෝග කළේය. එහෙත් කාවන් යළි මෙරටට ගෙන්වා ගැනීමට ප්‍රායෝගිකව අසීරුතා මතු කළ කරුණු කිහිපයක් ම තිබිණි. එනම්, ගෘහස්ථ හස්තියකු වන කාවන් නිදහස් කළ යුත්තේ වනයකට ය. එහෙත් පාකිස්ථානයේ සිට දැවැන්ත හස්තියකු වන කාවන් මෙරටට ප්‍රවාහනය කිරීම පහසු කටයුත්තක් නොවේ. එම නිසා කාවන් යළි බාර ගැනීම ශ්‍රී ලංකාවට අසීරු කාර්යයක් වන්නට ඇත. කෙසේ හෝ අවසානයේ උපන් බිම අහිමි වූ කාවන් කාම්බෝජයට යැවීමට සුදුසු සෞඛ්‍ය තත්ත්වයක සිටින බව සත්වෝද්‍යානයේ වෛද්‍යවරුන් විසින් නිගමනය කර තිබේ.

කාවන්ගේ ඉරණම එලෙස විසඳෙද්දී ශ්‍රී ලාංකික දිවියකුට එංගලන්ත සත්වෝද්‍යානයක් දැක්වූ අපූරු සැලකීමක් ගැන

## සාරිස්කා දිවි ධේනුවගේ පැටවා රැක ගන්න බ්‍රිතාන්‍ය දැඩි පරිශ්‍රමයක

පසුගිය සතියේ වාර්තා විය. පසුගිය 16 වැනිදා එක්සත් රාජධානියේ නොර්ෆොක්හි බන්හැම් සත්ව උද්‍යානයේ දිවි ගෙවූ ශ්‍රී ලාංකික දිවියකු වන සාරිස්කා හදිසියේ මරණයට පත් විය. පසුගිය සති කිහිපය තුළ ඇය රෝගාතුර වී සිටි බව සත්වෝද්‍යාන බලධාරීන් ප්‍රකාශ කර තිබේ. පශ්චාත් මරණ පරීක්ෂණයෙන් අනාවරණය වී ඇත්තේ සරිස්කා බරපතළ හෘද රෝගයකින් පෙළී ඇති බවයි. ඊට හේතුව සොයා ගැනීම සඳහා වැඩිදුර පරීක්ෂණ සිදු කෙරෙන බවද පැවසේ.



සාරිස්කා දිවි ධේනුව

සාරිස්කා නමැති එම දිවි ධේනුව පසුගිය ජුනි මාසයේදී පැටවුන් දෙදෙනෙකු බිහි කළ නමුත් අගෝස්තු මාසයේදී හදිසියේම එක් පැටවකු මිය ගොස් තිබේ. සාරිස්කා එංගලන්තයේ බන්හැම් සත්වෝද්‍යානයට ගොස් ඇත්තේ 2015 දීය. එතැන් සිට ඇය රැකබලා ගත් බන්හැම් සත්වෝද්‍යානයේ පාලකයන්ට සහ කාර්ය මණ්ඩලයට ඇයගේ මරණය විශාල කනස්සල්ලක් බව දැනගන්නට ලැබී තිබේ. ඔවුහු සාරිස්කාගේ මරණය ගැන වැඩිදුරටත් විමර්ශනය කරන අතර දැනට ජීවතුන් අතර සිටින ඇයගේ අනෙක් පැටවා සුරක්ෂිතව රැකබලා ගැනීමට වැඩි කැපකිරීමක් දරමින් සිටී.



සාරිස්කා දිවි ධේනුවගේ පැටවෙක්

මව අහිමි පැටවාගේ වර්ධනය ගැන එහිදී වැඩි සැලකිල්ලක් යොමු කර තිබේ. එපමණක් නොව මවගේ නම එම පැටවාට තබන්නටද සත්වෝද්‍යාන බලධාරීන් විසින් තීරණය කර තිබේ. ඊට හේතුව නොර්ෆොක්හි බන්හැම් සත්ව උද්‍යානය ශ්‍රී ලාංකික දිවියන් සුරැකීම සඳහා වන යුරෝපීය අභිජනන වැඩසටහනේ හවුල්කරුවකු වශයෙන් කටයුතු කිරීම ය. දිවියන්ගේ උප විශේෂ 9 න් එකකට අයත් මිය ගිය සරිස්කා දිවි ධේනුව ශ්‍රී ලංකාවට ආවේණික විශේෂයක් බැවින් සරිස්කා ගෙන් ඉතිරි වූ දිවි පැටවා සුරක්ෂිත කරගැනීමට සත්ත්ව බලධාරීන් කටයුතු කිරීම ප්‍රසංශනීය ය. කාවන් නම් ශ්‍රී ලාංකික හස්තියාට පකිස්ථාන සත්වෝද්‍යානය සැලකුවාට වඩා හාත්පසින්ම වෙනස් සැලකීමක් ලැබීමට තරම් සාරිස්කා දිවි ධේනුව වාසනාවන්ත වූයේ එලෙසිනි.

● චන්දිමා එදිරිමාන්න

# එළෝ පොල් පේන පොල් මිලේ අවනඩුව





පොල්,කිතුල්,තල් හා රබර් ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන, අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍ය අරුන්දික ප්‍රනාන්දු පොල් ගසකට නැඟි අයුරු

**දශක ගණනාවක් පුරා මෙරටට විදේශ විනිමය උපයා දුන් ප්‍රධාන අපනයන බෝග ලෙස හැඳින්වුණේ තේ, රබර් හා පොල්ය. නමුත් ගත වුණු වසර කීපය තුළ මෙරට පොල් වගාවෙහි පැහැදිලි කඩා වැටීමක් දක්නට ලැබුණු අතර ඊට බලපෑ ප්‍රධාන හේතු සාධක වූයේ හෙක්ටයාරයකින් ලැබෙන ආදායම අඩු වීම, සංවර්ධන ව්‍යාපෘතිවලට සහ කොටස් කර විකිණීමට පොල් ඉඩම් බහුලව යොදාගැනීම, පොහොර භාවිතය අඩු වීම, දේශීය පරිභෝජනයට ගන්නා පොල් ප්‍රමාණය වැඩි නිසා අපනයනය සඳහා ඉතිරි වන පොල් ප්‍රමාණය අඩු වීම, පළිබෝධ සහ කෘමි උවදුරු නිසා පොල් වගාවට හානි පැමිණීම, පොල් වගා කර ඇති ඉඩම්වලින් අමතර ආදායමක් ලබාගැනීමට උත්සාහ නොදැරීම, වෙනත් ආදේශක නිසා පොල් වලට විදෙස් වෙළඳ පොළේ හොඳ මිලක් නොලැබීම සහ පොල් වගාව ප්‍රවර්ධනය වෙනුවෙන් කිසිදු සාර්ථක වැඩසටහනක් ක්‍රියාත්මක නොවීමයි. මේ සාධක ද බලපාමින් පසුගිය වසර කීපය පුරාවටම මෙරට පොල් වගාව තුළ සිදු කෙරුණු පොල් නිෂ්පාදනය ප්‍රමාණවත් ලෙස වර්ධනය නොවුණි.**

මෙරට පොල් නිෂ්පාදනය කෙතරම් දුරට කඩා වැටී තිබේද යන්න වඩාත් හොඳින් පැහැදිලි වන්නේ මේ වන විට මෙරට වෙළෙඳපොළේ පොල් ගෙඩියක මිල විමසා බලන විටයි. මීට මාස කීපයකට පෙර පොල් ගෙඩියක් රු45/-ක් .රු.50/- ක් වැනි මිලකට මිලදී ගත හැකි වුව ද දැනට ඇති දැඩි පොල් හිඟය නිසාම මේ වන විට පොල් ගෙඩියක මිල රු.90/-ත් රු.100/-ත් අතර දක්වා මිලකට ඉහළ ගොස් තිබේ. මේ පිළිබඳව අදහස් දක්වමින් පාරිභෝගික අයිතීන් සුරැකීමේ ජාතික ව්‍යාපාරය ද නිවේදනයක් නිකුත් කරමින් සඳහන් කර සිටියේ මෙලෙස පොල් මිල ඉහළ යෑම සඳහා පසුගිය කාලය තුළ වගකිවයුතු නිලධාරීන් ගත් බොහෝ තීරණ බල පා ඇති බවත් ඇති වී ඇති තත්ත්වය තවත් වර්ධනය වී තවත් මාස දෙකක පමණ කාලයක් ගත වන විට පොල් ගෙඩියක මිල රු.150/-ක් දක්වා වැඩි වීමේ අවධානමක් ඇති වී ඇති බවත්ය.

පොල් ගෙඩියක මිල මෙලෙස දරා ගත නොහැකි අයුරින් ඉහළ යාම නිසා පාරිභෝගික ජනතාව අසරණ වී සිටියි. මේ නිසා බොහෝ විට ආහාර වෙළෙඳසැල් වලින් ආහාර මිලදී ගන්නා පාරිභෝගිකයන්ට පොල් කිරි යෙදූ ආහාර අලෙවිය පමණක් නොව කෑම සමඟ පොල් සම්බල ලබා දීම ද වෙළෙඳුන් විසින් නතර කර තිබේ.බොහෝ හෝටල් හා ආපනශාලා හිමියන් පොල් කිරි යෙදූ ආහාර සඳහා මේ වන විට ආදේශකයක් ලෙස කඩල පිටි යොදා ගන්නා බවද හෙළි වී තිබේ. එපමණක් නොව ඉඳි ආප්ප රසවත් කළ පොල් සම්බලයද මේ වන විට ඉඳි ආප්ප සමඟ නොලැබෙන තත්ත්වයක් නිර්මාණය වී ඇති අතර පොල් රොටී හී රසට හැපුණු පොල් කැබලිද අතුරුදන්ව ගොස් තිබේ.

පොල් ශාකය ලංකාව පුරාම බොහෝ ප්‍රදේශවල දී දක්නට ලැබුණත් එය සාරවත්ව වර්ධනය වීමට දේශගුණික සාධක රැසක්ද බලපායි. 20 'C - 27'C අතර උෂ්ණත්වය, 2000mm-2500mmත් අතර පැතිරුණ වාර්ෂික වර්ෂාපතනය වැනි පාරිසරික සාධක ඒ අතර ප්‍රධාන වන අතර පොල් වගාව ඉතාම සරු සාර වීමට නම් මීටර 100ට වඩා පහත් බිම් වඩාත් යෝග්‍ය වන බවද හඳුනා ගෙන තිබේ. ලුණු මිශ්‍ර වැලි පස වඩාත් හිතකර වන අතර ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත්වල පොල් වගාව මහා පරිමාණයෙන් සිදුකරනු ලබන්නේ පොල් වගාවට හිතකර දේශගුණික සාධක වලින් එකී මුහුදු බඩ පළාත් පොහොසත්ව ඇති නිසයි. කෙසේ වුවත් ඕනෑම පස් වර්ගයක් පොල් වගාව සඳහා සුදුසු වන අතර කොළඹ, ගම්පහ, කුරුණෑගල සහ පුත්තලම යන දිස්ත්‍රික්ක රැසකම පොල් වගාව බහුලවම සිදු කර ඇති බව පෙනේ.කොළඹ, කුරුණෑගල, සහ හලාවත යන ප්‍රදේශ ඒ අතරින් පොල් වගාවට ප්‍රචලිතම වී ඇති අතර පොල් ත්‍රිකෝණය ලෙස හැඳින්වෙන්නේද එම කොළඹ, කුරුණෑගල හා හලාවත යන ප්‍රදේශ වේ.

පොල් ගෙඩියක මිල දරා ගත නොහැකි අයුරින් ඉහළ යෑම නිසා පාරිභෝගික ජනතාව අසරණ වී සිටියි.
මේ නිසා බොහෝ විට ආහාර වෙළෙඳසැල් වලින් ආහාර මිලදී ගන්නා පාරිභෝගිකයන්ට පොල් කිරි යෙදූ ආහාර අලෙවිය පමණක් නොව කෑම සමඟ පොල් සම්බෝල ලබා දීම ද වෙළෙඳුන් විසින් නතර කර තිබේ.



පොල් වගාව තුළ ආහාරයට අවශ්‍ය පොල් පමණක් නොව ඒ පොල් වලින් තවත් ප්‍රයෝජන රැසක්ම ලබා ගන්නා අතර පොල් ගස කප්රුකක් සේ හඳුන්වනු ලබන්නේ එම ශාකයේ සෑම කොටසකින් ම යම් ප්‍රයෝජනයක් ලබා ගත හැකි නිසා යි. ලොව පොල් වගා කරන රටවල් අතුරින් ඉදිරියෙන් ම සිටින රටක් වූ ශ්‍රී ලංකාව පොල් ආශ්‍රිත නිෂ්පාදන විදෙස් රටවල්වලට අපනයනය කිරීමෙන් සැලකිය යුතු විදේශ විනිමය ආදායමක් මෙරටට උපයාදීමට ද සමත්කම් දක්වා තිබුණි.

පොල් ආශ්‍රිත නිෂ්පාදන සිදු කරමින් රටට වැඩි විදේශ විනිමය ආදායමක් උපයා දුන් පොල් ආශ්‍රිත කර්මාන්ත අතර දිසිඳි පොල් නිපදවීම, එම දිසිඳි පොල් යොදා ගනිමින් චොක්ලට්, කේක්, බිස්කට්, රසකැවිලි හා ක්ෂණික ආහාර නිෂ්පාදනය,පොල් මදය උපයෝගී කර ගනිමින් කොප්පරා,පිසීමට ගන්නා පොල් තෙල්,නැවුම් පොල්තෙල්,පොල් කිරි පිටි, පොල් ක්‍රීම් වැනි පොල් ආශ්‍රිත විවිධ ආහාර වර්ග,සබන්,ෂැම්පු වැනි දේද, පොල් කටු මඟින් හැඳි, පොල් කටු අඟුරු,බොත්තම්,සක්‍රීය කාබන්,මදුරු දඟර,විසිතුරු භාණ්ඩ වැනි නිපැයුම්ද,පොල් කෙඳි මඟින් ලණු, කඹ, ලණුපැදුරු, බුරුසු, කොසු, විසිතුරු භාණ්ඩ වැනි නිෂ්පාදනද පොල් මල් මඟින් පැණි, හකුරු, විනාකිරි වැනි දෑ ද නිපදවෙන අතරපොල් ශාකයේ කඳ ලී කර්මාන්තය සඳහා යොදාගන්නා විට පොල් අතු සහ පොල් ඉරටු පොල් අතු විවීමට, ඉදල් සෑදීමට සහ විසිතුරු භාණ්ඩ සෑදීමට යොදාගනු ලබයි. මේ වන විට වෙළෙඳපොළ තුළ පොල් ගෙඩි මිල ඉතා වේගයෙන් ඉහළ ගොස් ඇති පසුබිම තුළ පොල් ආශ්‍රිත මෙවැනි බොහෝ කර්මාන්තයන්හි කඩා වැටීමක්ද ඉදිරි කාලය තුළ දැක ගත හැකි වනු ඇතැයි නිරීක්ෂණය වී තිබේ.

ඇත්ත වශයෙන්ම මෙරට පොල් වගාව ආශ්‍රිතව ඉතා සාඩම්බර ඉතිහාසයක් පැවතුණද පසුගිය සමය තුළ එකී වගාව හා කර්මාන්තය ගමන් කරමින් තිබුණේ දියුණුවට නොව පරිහානියට බව පැහැදිලිව ප්‍රකාශ කිරීමේ හැකියාව ඇත. එය වඩා පැහැදිලි වන්නේ පොල් ගෙඩියක මිල රු 100/-කට මිලකට ඉහළ ගොස් තිබීම නිසාම නොවේ.

මේ වන විට මෙරට වගා කෙරෙන පොල් අක්කර ප්‍රමාණය ද අක්කර ලක්ෂ 11 ක් තරම් දක්වා අඩු වීම ගොස් තිබීමද පොල් කර්මාන්තයේ ඇති වී ඇති අර්බුදය හා කඩා වැටීම මොනවට කියා පායි.

ඒ නිසාම අප රටේ පොල් වගාවෙන් පසුගිය වසර කීපය තුළ ලබා ඇත්තේ වසරකට උපරිම පොල් ගෙඩි මිලියන 3109 ක තරම් වූ අවම ප්‍රමාණයකි. එසේම වර්තමානය වන විට එය වසරකට පොල් ගෙඩි මිලියන 2700-3000 ත් අතර ප්‍රමාණයකට අඩු වීමද කනගාටුදායක තත්ත්වයකි. නමුත් මෙරට පරිභෝජන හා කර්මාන්තමය අවශ්‍යතා සම්පූර්ණ කිරීමට නම් වසරකට මිලියන 4000 ක පමණ පොල් ගෙඩි ප්‍රමාණයක් අවශ්‍ය වන බවටද ගණන් බලා ඇත. පොල් මිල ද ඉහළ ගොස් සමස්ත පොල් ආශ්‍රිත සියලු කර්මාන්ත කඩා වැටීමකට ලක් වෙමින් මේ වන විට මෙරට පොල් වගාව මුහුණ දෙමින් සිටි මේ අවාසනාවන්ත ඉරණම වෙනස් කිරීම සඳහා පොල් සංවර්ධන අධිකාරිය ප්‍රමුඛ පොල් වගාවේ වගකීම් පැවරී ඇති සියලුම ආයතන ඉතාම ප්‍රශස්ත උත්සාහයක නිරත වී සිටින අතර 2023 වසර වන විට මෙරට පොල් කර්මාන්තයේ අපනයන ආදායම ඩොලර් බිලියනයක් දක්වා වර්ධනය කිරීම අරමුණු කර ගනිමින් ඔවුන් ඒ සඳහා විවිධ පියවර ගනිමින් සිටියි.

එවැනි වාතාවරණයක් තුළ පසුගිය සැප්තැම්බර් 02 වැනිදා ජාත්‍යන්තර පොල් දිනයද සැමරුණු අතර ඒ නිමිත්තෙන් දිවයින පුරා පොල් වගා සංවර්ධන වැඩසටහන් රැසක් ම සංවිධානය කර තිබුණි.පොල් වගා කිරීමේ මණ්ඩලයේ පොල් සංවර්ධන හා ව්‍යාප්ති සේවා ඇතුළත් කොට සැකසුණු "Coconut App"එකක් එළිදැක්වීම ද එදින සිදු වුණු අතර පොල් පර්යේෂණ ආයතනය මඟින් නිපදවා වැඩි දියුණු කරන ලද දෙමුහුන් පොල් ප්‍රභේදයක් හඳුන්වා දීම, පොල් පර්යේෂණ ආයතනය මඟින් නිපද වූ රතු කුරුම්ණි විකර්ෂකය හඳුන්වා දීම, ගුණාත්මක පොල් තෙල් හඳුනා ගැනීම සඳහා පොල් සංවර්ධන අධිකාරිය හඳුන්වා දෙන ලද ප්‍රමිති ලාංඡනය හඳුන්වා දීම, 2019 වසරේ පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනයෙන් වැඩිම විදේශ විනිමයක් ඉපැයූ අපනයනකරුවන් ඇගයීම වැනි මෙරට පොල් කර්මාන්තයට අතිශයින් වැදගත් වූ සුවිශේෂ සිදු වීම් රැසක් ම එදින ජාත්‍යන්තර පොල් දිනය වෙනුවෙන් සංවිධානය කර තිබුණි.

එසේම ජාත්‍යන්තර පොල් දිනය සඳහා ප්‍රකාශයට පත් කරන ලද පොල් සංවර්ධන සතිය වෙනුවෙන් දිවයින පුරා ක්‍රියාත්මක වන පරිදි වැඩසටහන් රාශියක් සංවිධානය කර තිබුණු අතර පොල් වගා කිරීමේ මණ්ඩලය මඟින් මෙහෙය වන මේ වැඩසටහන් අතරට විහාරස්ථාන ඇතුළු ආගමික සිද්ධස්ථාන, රාජ්‍ය ආයතනවල හා ගෙවතුවල පොල් පැළ සිටුවීම මෙන්ම ජංගම පොල් පැළ අලෙවි වැඩසටහන් රාශියක් ද ඇතුළත් වුණි.

මේ අතර පොල් ගෙඩියක මිල ශීඝ්‍රයෙන් ඉහළ යාම පිළිබඳව වත්මන් රජයේද දැඩි අවධානය යොමු වී ඇත. ඒ පිළිබඳව අදහස් දක්වන පොල්,කිතුල්,තල් හා රබර් ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍ය අරුන්දික ප්‍රනාන්දු සඳහන් කර සිටියේ මේ වන විට දක්නට ලැබෙන මෙම පොල් මිල වැඩි වීම පොල් මිලදී ගන්නා තැරැව්කරුවන්ගේ හා මිලදී ගන්නන්ගේ එකතුවෙන් සිදු වී ඇති අවිධිමත් මිල වැඩි වීමක් වන බවයි. වගකිවයුතු රජයක් ලෙස මෙම මිල වැඩි වීම පාලනය කිරීම සඳහා ගත හැකි සෑම ක්‍රියාමාර්ගයක්ම ගන්නා බවත්,අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ උපදෙස් පරිදි මෙරට පොල් වගාව නගා සිටුවීමට ක්‍රමවත් හා විධිමත් වැඩපිළිවෙළක් කඩිනමින් ක්‍රියාවට නංවා ඇති බවත් ඇමතිවරයා පවසයි.

එසේම තම අමාත්‍යාංශය මගින් පාලනය වන හලාවත සහ කුරුණෑගල වැවිලි සමාගම් සතු පොල් ඉඩම් වලින් ඕනෑම පාරිභෝගිකයෙකුට පොල් මිලදී ගත හැකි ක්‍රමවේදයක් දැනටමත් පිළියෙල කර ඇති බවත් පොල් මිල පාලනය කිරීමේ අරමුණින් පොල් ගෙඩියක් රු.60/- ක මිලකට අලෙවි කිරීමේ කටයුතු පොල් සංවර්ධන අධිකාරිය මගින් ආරම්භ කර ඇති බවත් අමාත්‍යවරයා අවධාරණය කරන අතර පොල් ගෙඩියක් සඳහා රු.70/- ක උපරිම සිල්ලර මිලක් නියම කරන ලෙස පොල් වෙළෙඳුන්ට හා සැපයුම්කරුවන්ට දන්වා ඇති බවත් ඇමැති අරුන්දික වැඩිදුරටත් සඳහන් කර ඇත.

● ජාලිය වීරක්කොඩි

# ගොල්ෆ් පිටිය හරහා ඇවිත් කනත්ත මැද්දෙන් යන බයිසිකල් පාර





**නාගරික සංවර්ධන අධිකාරිය කොළඹ ගොල්ෆේස් පිටියේ සිට බත්තරමුල්ල ශ්‍රී ජයවර්ධනපුර දක්වා පා පැදි මාර්ගයක් සැලසුම් කර තිබේ. එම මාර්ගයේ මූලික සැලැස්ම කෙටුම්පත් කිරීම මේ වනවිට ආරම්භ වී ඇත.ජනාධිපති ගෝඨාභය රාජපක්ෂත් නාගරික සංවර්ධන විෂය භාර අමාත්‍යවරයා වශයෙන් අගමැති මහින්ද රාජපක්ෂත් මෙම ව්‍යාපෘතිය අනුමත කර තිබේ. යෝජිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ජනාධිපතිවරයාත් අගමැතිවරයාත් නාගරික සංවර්ධන අධිකාරියේ සභාපති හර්ෂ ද සිල්වාට සහ අධ්‍යක්ෂ ජනරාල් එන්.පී.කේ. රණවීරට උපදෙස් දී ඇත.**

කටයුතු නාගරික සංවර්ධන අධිකාරියේ වැඩ බලන ව්‍යාපෘති අධ්‍යක්ෂ වයි.ඒ.ජී.කේ. ගුණතිලක යටතේ ක්‍රියාත්මකය. ගොඩනැගෙමින් අත්තේ විචිත්‍ර සංකල්පයකි. ඊට හේතුවක් තිබේ. අප දන්නා කොළඹට වඩා නොදන්නා කොළඹ මනරම්ය. එය ඓතිහාසික ස්ථාන, වාස්තු කර්මාන්ත, උද්‍යාන හා දියමංවලින් සැදි කදිම භූ දර්ශනයෙන් යුතු බිමකි. අපට මෙතෙක් කළමනාකරණය කරගන්නට බැරි වූයේ අතිශයින් වටිනා පාරිසරික කලාපයක පිහිටි ලෝකයේ ඇති දුර්ලභ තෙත් බිම් නගරයකි. මේ නගරය නිසි ලෙස කළමනාකරණය කළ හැකි බවට වූ විශ්වාසය අපට කලෙක ලැබී තිබිණි. යෝජිත පා පැදි මාර්ගය නිර්මාණය වන්නේ මේ මනරම් භූ දර්ශන පෙළහර අතරිනි.





කොළඹ සිට බත්තරමුල්ලට යෝජිත මේ පා පැදි මං පෙත දැනට සැලසුම් කර ඇති ආකාරයට දුර කිලෝමීටර 11කි. අධික තදබදයක් හා පීඩනයක් සහිත ප්‍රධාන මාර්ග අවම ලෙස සම්බන්ධ වන සේ මග සැලසුම් කර තිබේ. මංපෙතේ පළල මීටර 2.5 කි. ඉහළට හා පහළට ගමන් කරන මං තීරු දෙකකි. ඉදිවෙමින් ඇති වරාය නගරය තුළ පා පැදි මං තීරුවක් සැලසුම් වේ. යෝජිත පා පැදි මාර්ගය ආරම්භ වන්නේ වරාය නගරයෙනි.

මාර්ගය භාවිතා කරනු ඇතැයි ඉලක්ක කළ කණ්ඩායම් හතරකි. ඒ පාසල් සිසුන්, රැකියාව සඳහා පැමිණෙන පිරිස්, සංචාරකයන් මෙන්ම පා පැදි ක්‍රීඩකයන්ය. වරාය නගරයෙන් ආරම්භ වී ඉතා කෙටි දුරක් ගාළු පාර ඇසුරෙහි දිවෙන මාර්ගය බේරේ වැව දෙසට ගමන් කර වැව ඔස්සේ ගංගාරාම පරිශ්‍රය අසලට ප්‍රවේශ වේ. " කළම්බෝ සිටි සෙන්ටර් ගොඩනැගිල් අසලින්" අතුළට ගමන් කර මාර්ය විහාරමහාදේවී උද්‍යානයට හරහා ගමන් කර නෙළුම් පොකුණ රඟහල අසලින් නිදහස් චතුරශ්‍රය වෙත ගමන් කරයි. යටත්විජිත වකවානුවට යන ඉදිකිරීමක් වූ ආර්කේඩ් ගොඩනැගිල්ල දකිමින් මාර්ගය බෞද්ධාලෝක මාවත ඇසුරු කරමින් බොරැල්ල කනත්ත දෙසට දිවෙයි.

අනතුරුව මාර්ගය විහිදෙන්නේ බොරැල්ල කනත්ත මැදිනි. එය ලංකාවේදී පුද්ගලයෙකුට අත් විඳින්නට හැකි වෙනස්ම ආකාරයේ අත්දැකීමකි. කනත්ත මැදින් එන මංතීරුව අනතුරුව බොරැල්ල ගොල්ෆ් පිටිය වෙත ඇදෙයි. ගොල්ෆ් පිටියේ මනරම් දැකුම් දකිමින් ලේක් ඩ්‍රයිව් ඔස්සේ කෝට්ටේ වගුරු බිම් සීමාවෙන් දියත උයන පරිශ්‍රය ස්පර්ශ කරයි. මේ තොණ්ඩුවක හැඩය ගත් මාර්ගය අනතුරුව පාර්ලිමේන්තුව හා දියවන්නා ඔය ඇසුරෙහි විහිදෙයි. මාර්ගය මුළුමන්නිම නිමා වනවිට දියත උයනේ සිට කොලොන්නාව ඇළ මාර්ගය, මීතොටමුල්ල, ශාන්ත සෙබස්තියන් ඇළ, අලුත්කඩේ උසාවි පරිශ්‍රය ඇසුරු කරමින් බෙරේ වැව හරහා ගෝල්ෆේස් වෙත ගමන් කිරීමට සැලසුම් වේ. මේ මාර්ගයේ තැනින් තැන පා පැදි කුලී පදනම මත ලබා ගත හැකි ස්ථාන 11ක් වේ. ඒ ඕනෑම තැනකින් මිල ගෙවා පා පැදිය රැගෙන ඕනෑම තැනකට බාර දිය හැකිය. දේශීය පාරිභෝගිකයන් බොහෝ විට මාර්ගය භාවිත කරනු ඇතැයි සිතන උදෑසන හෝ රාත්‍රී කාලයේ දී භාවිත පහසුව වෙනුවෙන් මාර්ගය ආලෝක කිරීම, වර්ණ ගැන්වීම අන්තර්ජාතික ප්‍රමිතිය ප්‍රකාරව සිදුවේ.







මේ දියත් වී ඇත්තේ ව්‍යාපෘතියේ මූලික අදියරය. තවම සිදුවෙමින් ඇත්තේ මේ මාර්ගයේ භූමිය හඳුනා ගැනීමය. ලබන අයවැයෙන් මුදල් වෙන් කරගෙන වර්ෂ 2021 වනවිට මේ මාර්ගයේ ඉදිකිරීම් ආරම්භ කළ හැකිය. ඒ සඳහා සියලු ප්‍රවේශ විවෘතව ඇත.

අප අබියස වන්නේ ජාතියක් ලෙස විමසිය යුතු ඵලදායී ප්‍රවේශයකි. කාර්යාල වේලාවන් ලෙස සැලකෙන උදේත් සවසත් බත්තරමුල්ල සිට බොරැල්ල වෙත පැමිණෙන කිලෝමීටර කීපය වාහනයකින් ගමන් කරන විට දල වේගය පැයට කිලෝමීටර හයකටත් අඩු වන අවස්ථා තිබෙන්නේය. මාර්ග තදබදය, නිකරුණේ දහනය වන ඉන්ධන ප්‍රමාණය, විනාශ වන මිනිස් පැය ගණන ගැන බැලුවත් මේ ප්‍රවාහනය වෙනුවෙන් ඵලදායි විකල්ප අවශ්‍යවන කාලයකි. පා පැදි සංස්කෘතියක් විලාසිතාවක ස්වරූපයෙන් හඳුන්වා දීම ඉන් වඩාත් ඵලදායී ප්‍රවේශයක් වන්නේ එබැවිනි.



එක් අතකින් අප ජීවත් වෙමින් සිටින්නේ රජයේ රෝහලක ඕ. පී. ඩී. එකක් බඳු ජන ගහණයක් සහිත සමාජයකය. සෞඛ්‍ය සම්පන්න ජාතියක් වෙනුවෙන් පා පැදියෙන් කෙරෙන ගමනාගමනය ප්‍රවර්ධනය කිරීමට උත්සාහ කිරීම සංකල්පයක් ලෙස තවත් අතෙකින් වැදගත්ය. මෙරට වාර්ෂිකව සිදුවන මරණවලින් සියයට 75 ත් 80 ත් අතර සංඛ්‍යාවක් සිදුවනුයේ බෝ නොවන රෝග හේතුවෙනි. සංඛ්‍යාත්මකව ගතහොත් එය වර්ෂයකට මරණ එක් ලක්ෂ තුන්දහස් පන්සීයයක් (103,500) පමණය. පුද්ගලයෙක් බෝ නොවන රෝගවලට ලක්වන ප්‍රධානම හේතුවක් ලෙස සැලකෙන්නේ අඩු ව්‍යායාමවල යෙදීමය. සෞඛ්‍ය අමාත්‍යාංශය හා ලෝක සෞඛ්‍ය සංවිධානය එක්ව සිදුකරන ලද නවතම දීප ව්‍යාප්ත සමීක්ෂණයකින් හෙළි වී ඇත්තේ කාන්තාවන්ගෙන් සියයට 38.4 ක්ද පිරිමින්ගෙන් සියයට 22.5 ක් ද ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් නිර්දේශ කර ඇති දිනකට විනාඩි 20 ක් හෝ 30 ක් ඇවිදීම ඇතුළු ව්‍යායාම රටාව අනුගමනය නොකරන බවය. නව පා පැදි සංස්කෘතියක් රටට හඳුන්වා දෙන්නට සැලසුම් වන්නේ මේ සමාජ වටපිටාව දකිමිනි. ලෝකයේ දියුණු රටවල් මේ සැලසුම්වල විපුල ඵල මේ වනවිට විඳිමින් සිටිති. ජපානය, චීනය මින් මහා අර්ථයන් අත්විඳිනු ලැබූ ආසියාතික රටවල්ය. යුරෝපය පුරා පා පැදිය විලාසිතාවක් සේ පැතිර යමින් ඇත්තේ පරිසරයට මෙන්ම තමන්ගේ සෞඛ්‍ය සම්පන්න ජීවිතයට ද ඇලුම් කරන්නට පුරුදුවන මිනිසුන් හේතුවෙනි.

කොළඹ අවට මෙන්ම කොළඹින් පිටත ද පා පැදි මං තීරු සහිත මාර්ග ඉදි විය. සක්මන් ප්‍රවේශ ඉදි විය. බොහෝවිට එහි අර්ථය වූයේ ව්‍යායාමය ය.

එහෙත් මේ නව පා පැදි මංතීරුව විවෘත වන්නේ නව අර්ථයක් සහිතවය. කොළඹ පාරිසරික අලංකාරය වින්දනය කිරීම, කොළඹ ඉතිහාසය ස්පර්ශ කිරීම, ඒ අතරම සෞඛ්‍ය සම්පන්න මිනිසුන් පිරිසක් බිහි කරගැනීම, සංචාරක ව්‍යාපාරය උත්තේජනය කිරීම සහිත බහු ඵලදායී ව්‍යාපෘතියක් එහි ගැබ් වී තිබේ.

ජාතියක් ලෙස මේ ව්‍යාපෘතිය වැළඳ ගත යුත්තේ එබැවිනි.



නවක වදයට තිරස්චීනව ගොදුරු වූ කීපදෙනෙක් වමේ සිට රූපා රත්නසීලී, කැලුම් තුෂාර, අමාලි චතුරිකා සහ වර ප්‍රගාෂ්

# ජීවිතයම රැග් කරන කැම්පස් 'රැග්'

## නවක වදයට බියෙන් සරසවි හැර යන ගණන වැඩියි

● හර්ෂා සුගතදාස

**"මෙතන ඉඳලා අර පේන මල් රවුම ගාවට යනකල් පස්ස පැත්තෙන් ලියපිය නම. මේ අහගං, පාර රූල විදිහට හිතපං. රූල පිරෙන්ඩ අකුරු ලියන්න ඕනෑ. ලියන අකුරු මට තේරෙන්නත් ඕනෑ. ලියන ගමං තෝ ඒවා හයියෙන් කියන්ඩ ඕනෑ. අන්තිම අකුර මල් රවුම ළඟින් ඉවර වෙන්න ඕනෑ" යනුවෙන් විශ්ව විද්‍යාලයට පිවිසෙන නවකයන්ට නවකවදය දෙන අයුරු සඳහන් වී තිබුණේ සරත් විජේසූරියගේ 'තක්සලාවේ නියඟය' කෙටිකතාවේය.**

තක්සලාවේ නියඟය කෙටිකතාව මගේ මතකයට නැගුණේ කාලයෙන් කාලයට හිස ඔසවන සරසවි නවකවදය නැවතත් කරළියට පැමිණීමත් සමගිනි. මෙවර එය වාර්තා වන්නේ පේරාදෙණිය සරසවියේ ඉංජිනේරු පීඨයෙනි. ඉංජිනේරු පීඨයේ 2 වැනි වසරේ සිසුන්ගේ අධ්‍යයන පාඨමාලාව පසුගිය 16 වැනිදා සිට තාවකාලිකව නවතා දමා තිබෙන්නේ දෙවැනි වසරේ සිසුන් පළමු වසරේ සිසුන්ට නවකවදය දීමේ සිදුවීම් සලකා බැලීමෙන් පසුවය. දෙවැනි වසරේ සිසුන්ට නේවාසිකාගාරවලින් පවා ඉවත් වන ලෙස දන්වා ඇති අතර පළමු වසරේ සිසුන්ට සහ දෙවැනි වසර හැර සෙසු අධ්‍යයන වර්ෂවල සිසුන්ට අධ්‍යයන කටයුතු සාමාන්‍ය පරිදි පැවැත්වේ.

නවකවදය හෙවත් 'රැග්' හේතුවෙන් සරසවි වසා දැමුණු අවස්ථා අපට අසන්නට ලැබෙන්නේ වරක් දෙවරක් නොවේ. වර්තමානයේ එය සාමාන්‍ය සිද්ධියක් බවට පත්වී ඇත. සිදුවන එකම වෙනස එය පේරාදෙණිය, කැලණිය, රුහුණ, සබරගමුව, වයඹ, රජරට යනාදී වශයෙන් වෙනස්වීම පමණි.

ලංකාවේ විශ්වවිද්‍යාල ආරම්භයත් සමඟ 'රැග්' හෙවත් නවකවදය දක්නට ලැබුණ බව වාර්තා වුවත් එකල ලබාදුන් නවකවදය අමානුෂික නොවූ බව පැරැන්නන්ගේ මතයයි. නොගැළපෙන වර්ණවලින් සාරි හා හැට්ට ඇඳීම, ටයි පටිය බෙල්ල පිටුපසට කර ගැට ගැසීම, පොත් හිස මත තබාගෙන යෑම, සපත්තු කරේ එල්ලාගෙන යෑම, නාට්‍ය ජවනිකාවක් රඟදැක්වීම වැනි නවකවද තුළින් එදා ජ්‍යෙෂ්ඨයන් මෙන්ම නවකයන් ද විනෝදාස්වාදයක් ලබා තිබේ.

"මම පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ගියේ 1957 දී. ඒ කාලේ මට රැග් එකට දුන්නේ ගීතයක් ගායනා කරන්න. ඉතින් මම මේසය උඩ නැගලා ප්‍රේමයෙන් මනරංජිත වේ ගීතය සම්පූර්ණයෙන් ගායනා කළා. මම කියපු සින්දුව අහපු ජ්‍යෙෂ්ඨයන් කිව්වා මූ නම් කවදහරි ෆ'ස්ට් ක්ලාස් එකක් ගහනවා කියලා" යනුවෙන් එදා තිබූ නවකවදය ගැන සිහිපත් කළේ සම්මානිත මහාචාර්ය ජේ.බී. දිසානායකය.

මීට අමතරව නවකවදය මුවාවෙන් තම සිතැගිවලට මග පාදා ගත් ආකාරය ගැන ද ඔහු විස්තර කළේ කොක් හඬලා සිනාසෙමිනි.

"ඒ කාලේ ජ්‍යෙෂ්ඨයන් අපිට මලක් දීලා ගෑනු ළමයකුව පෙන්නලා කියනවා ඒ මල දීලා නම අහගෙන එන්න කියලා. මම ජ්‍යෙෂ්ඨයන් මට කිව්වෙ නැතිවත් බොරුවට මලක් අරගෙන මම කැමැති ගෑනු ළමයකුට දීලා නම අහගෙන කතා කරලා එනවා" යනුවෙන් පැවසූ සම්මානිත මහාචාර්ය ජේ.බී. දිසානායක අතීතාවර්ජනය කරමින් එය ආස්වාදනය කළේය.

එහෙත් අද වනවිට නවකවදය සැබැවින් ම නවකයන්ට වදයක් වී ඇත. අද එය ක්‍රෑර වද හිංසා සහ අමානුෂික තාඩන පීඩන දක්වා විතැන් වී තිබේ. අද නවකවදයේ විනෝදයක් නැත. ඇතැම් විට නවකවදය කෙළවර වන්නේ මරණයෙනි.

නවකවදය හේතුවෙන් සදාකාලික ආබාධිත තත්ත්වයට පත්වී එම නිසාම මරණය වැළඳගත් සිදුවීමක් වශයෙන් මුල් වරට අසන්නට ලැබුණේ රූපා රත්නසීලිගේ සිද්ධියයි. කරන්දෙණිය මහඒදණ්ඩ ග්‍රාමයේ පදිංචි රූපා රත්නසීලි පේරාදෙණිය කෘෂිකර්ම පීඨයට ඇතුළත් වූයේ 1975 වසරේදී ය. නවකවදය දීමට ජ්‍යෙෂ්ඨයන් පැමිණෙන විට ඔවුන්ගෙන් බේරීම සඳහා රාමනාදන් නේවාසිකාගාරයේ උඩු මහලින් බිමට පැන ගත් ඇ රෝද පුටුවට වැටුණේ සදාකාලික ආබාධිතයකු වෙමිනි. ඇගේ සරසවි සිහිනය බොඳ විය. බලාපොරොත්තු සුන් වීමෙන් ඇති වූ කනස්සල්ල හේතුවෙන් ම අවසානයේ දී ඇ 2002 වසරේ රෝද පුටුවෙන් ම ගොස් ළිඳට පැන සිය දිවි හානි කරගත්තාය.

පේරාදෙණිය සරසවියේ ඉංජිනේරු පීඨයේ නවක ශිෂ්‍ය වරප්‍රකාශ් මිය ගියේ නවකවදයේ දී ලැබූ දරුණු වද හිංසා හේතුවෙනි. ඒ 1997 දී ය. රුහුණු සරසවියේ දමින්ද පුංචිහේවා සහ කැලුම් තුෂාර වනිගතුංග නවකවදයට භාජනය වී දිවි අහිමි වූ තවත් දෙදෙනකි. 2015 වසරේදී පන්නිපිටියේ පදිංචි අමාලි චතුරිකා ගෙල වැලළාගෙන මිය ගියේ නවකවදය නිසා ඇතිවූ මානසික ව්‍යාකූලතාව නිසාය.

වෙයි. ආණමඩුව සමගිගම පදිංචි උළුවඩුගේ අසංක සම්පත් බණ්ඩාර යාපනය විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පීඨයට තේරුණු නමුදු සරසවි අධ්‍යාපනයට ආයුබෝවන් කීවේ නවකවදයේදී ලැබූ දරුණු වද හිංසා ඉවසා ගත නොහැකි නිසාය. රුහුණු සරසවියේ වත්සලා කුමුදුනී ද සිල්වා ස්නායු ආබාධයකට ලක්වූයේ නවකවදය නිසාය.

නවකවදය ලබාදුන් ජ්‍යෙෂ්ඨ සිසුන් හඳුනාගෙන පොලිස් අත්අඩංගුවට පත් කර උසාවි දමා ඔවුන්ට දඬුවම් දුන් අවස්ථා ද අසන්නට ලැබේ. නවකවදය පාලනය කර ගැනීමට නොහැකිව විශ්වවිද්‍යාලවල අධ්‍යයන කටයුතු නවතා දමන අවස්ථා ද තිබේ. ඇතැම් විට විශ්වවිද්‍යාල ආචාර්යවරුන් අධ්‍යයන කටයුතුවලින් ඉවත්වන්නේ නවකවදය දෙන සිසුන්ට පාඩමක් කියා දීමටය. එහෙත් ඔවුන් පාඩම් ඉගෙනගන්නා පාටක් නැත. නවක වදයට ගොදුරුවූ ඛේදනීය සිදුවීම් සහ සරසවි හැර යන සිසුන් දිනෙන් දින වැඩිවෙන්නේ එබැවිනි.

සරසවි වසා දැමීමෙන් සිසුන්ගේ අධ්‍යාපන කටයුතු අඩපණ වීම ගැන නවකවදය දෙන සිසුන්ට වගක් නැත. ඔවුන්ගේ ශිෂ්‍ය භාවය අහෝසි කිරීම වැනි දඬුවම් දුන්විට සිදු කරනු ලබන එකම ක්‍රියාමාර්ගය ශිෂ්‍යභාවය ලබාදෙන ලෙස හෝ පංති තහනම ඉවත් කරන ලෙස ඉල්ලා වර්ජනය කිරීම සහ උද්ඝෝෂණය කිරීම පමණි.

නවකවදය බ්‍රිතාන්‍ය, ප්‍රංසය, ඇමෙරිකාව වැනි රටවල්වල දක්නට ලැබුණේ මීට යුග ගණනාවකට පෙරය. 1820 දී ලන්ඩන් නුවර කින්ග්ස් විද්‍යාලයේ නවකයන් පිළිගැනීමේදී උසුළු විසුළු කර ජල පහර ගැසූ බවට වාර්තා වේ.

අප්‍රිකානු ගෝත්‍රිකයන් ළමයකු තරුණයකු බවට පත්වීමේදී සුළු සුළු උසුළු විසුළු ස්වරූපය රැගත් යාතු කර්ම (ritual) කළ අතර එම යාතු කර්මවල ලක්ෂණ බ්‍රිතාන්‍යයේ නවකවදය තුළ තිබූ බව මහාචාර්ය නන්දසේන රත්නපාල සඳහන් කර ඇත.

තුරන් කිරීම සඳහා වූ පනතක් ලෙස දක්වා ඇත. පනතේ අර්ථ දැක්වීමට අනුව නවකවදය යනු අධ්‍යාපන ආයතනයක ශිෂ්‍යයකුට හෝ කාර්යය මණ්ඩලයේ සාමාජිකයකුට ශාරීරික හෝ මානසික හානියක් හෝ මානසික වේදනාවක් හෝ බියක් සිදු කරන හෝ සිදු කිරීමට ඉඩ ඇති යම් ක්‍රියාවකි. 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත යටතට ගැනෙන සියලුම උසස් අධ්‍යාපන ආයතන මීට අදාළවේ. මෙම පනතේ 2 වැනි වගන්තිය අනුව මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වන නඩු විභාගයකින් වසර 2 - 10 දක්වා සිරදඬුවම් නියම කිරීමේ බලයක් තිබේ. එසේම වින්දිතයන්ට වන්දි මුදල් ලබාගැනීමට ද හැකියාව ඇත.

නවකවදයේ ම්ලේච්ඡත්වය ගැන නිරන්තරයෙන් අසන්නට දකින්නට ලැබෙන කාලයක බුද්ධිය පරීක්ෂා කළ අපූරු නවකවදයක් ගැන ටික කලකට පෙර වාර්තාවූයේ පේරාදෙණිය සරසවියෙනි. කිරිදිවැල රදාවානේ සිට සරසවියට ගිය සිසුවියක මෙයට මුහුණදී තිබිණි. ඇගේ ගම රදාවාන යැයි කී විට ජ්‍යෙෂ්ඨ සිසුන් විසින් රදාවානේ උපන් මහගමසේකර, කේ. ජයතිලක සහ කන්නිමහර සුමංගල හිමි ගැන ප්‍රශ්න කර ඇත.

ඉන් අනතුරුව සේකර සහ කේ. ජයතිලක රචනා කළ කෘති නම් කරන ලෙස දන්වා තිබේ. කේ. ජයතිලක ලියූ චරිත තුනක් නවකතාවේ නම එකී ටෙලිනාට්‍ය නැරඹූ නිසා මතකයේ තිබී පැවසුව ද මහගමසේකරගේ කිසිම කෘතියක නමක් ඇයට කියා ගැනීමට හැකිවී නැත. අවසානයේ දී ජ්‍යෙෂ්ඨයන් ඇයට පවසා තිබෙන්නේ සේකරගේ පොත්වල නම් ඇක්සයිස් පොතක සටහන් කර නොගෙන විශ්වවිද්‍යාලය පැත්තටවත් නොපැමිණෙන ලෙසටයි. ඇ සිය ගමේ පිහිටි කේ. ජයතිලක අනුස්මරණ පුස්තකාලය වෙත ගොස් තිබුණේ නවක වදයෙන් බේරීමටත් වඩා ඇ කෙරෙහි උපන් ලැජ්ජාවෙන් බව ඇ එහි සේවකයකු සමඟ පැවසීමට තරම් නිහතමානී වූවාය.

## නවකවදය නිසා මිය ගිය ගණන 14 යි

සබරගමුව විශ්ව විද්‍යාලයේ 2 වැනි වසරේ ඉගෙනුම ලැබූ අමාලි චතුරිකා මිය යෑමට පෙර ලිපියක් ලියා ඇගේ මෘතදේහය බැලීමට සබරගමුව සරසවියේ ළමුන්ට ඉඩ නොදෙන ලෙස ඉල්ලීමක් කර තිබීමෙන් සබරගමුව විශ්වවිද්‍යාලයේ නවකවදයෙන් ඇ ලැබූ පීඩාව මනාව ගම්‍ය වේ. මෙම කාලකණ්ණි නවකවදය නිසා දිවි අහිමිවූ අය 14 කි. 2015 - 2016 වසරේ නවක සිසු සිසුවියන් 1352 ක් ද 2016 - 2017 වසරේ 637 ක් ද 2017 - 2018 වර්ෂයේ 2000 ක් ද සරසවි හැර ගොස් සිටින්නේ නවකවදය නිසා ය. මෑත භාගයේ සංඛ්‍යාලේඛනවල මෙසේ සටහන් වුව ද 1970 වසරේ සිට 2000 වසර දක්වා වර්ෂ 30 ක කාලය මුළුල්ලේ නවකවදය නිසා සරසවි හැර ගොස් සිටින පිරිස 108 ක් බව මහාචාර්ය නන්දසේන රත්නපාල සිය වාර්තාවක පෙන්වාදී තිබේ. ඔහුගේ සමීක්ෂණ වාර්තාවට අනුව මෙකී දශක තුනක කාලය පුරා බරපතළ ආකාරයට නවකවදයට ගොදුරුවූ ශිෂ්‍ය පිරිස 1097 කි.

රුහුණු සරසවියේ නවකවදය ඉවසා ගත නොහැකිව විද්‍යා පීඨයේ සුපුන් සිසුවා ආපන ශාලාවේ ජනේලයකින් අඩි 20 ක් පහළට පැනීමෙන් බරපතළ තුවාල ලබා මාතර රෝහලට ඇතුළත් කළ පුවතක් වාර්තා වූයේ 2007 දීය. ඊට අමතරව ජ්‍යෙෂ්ඨයන්ගේ පහරදීම් හේතුවෙන් නවක සිසුන් 5 දෙනකු මාතර රෝහලට ඇතුළත් කර තිබුණේ එම කාලයේදීමය.

මේ ආකාරයට නවක වදයට ගොදුරුවීම නිසා රෝහල්ගත කරනු ලබන නවක සිසුහු සහ ආබාධිත තත්ත්වයට පත්වන සිසුහු අප අතර සිටිති. පසුගිය වසරේ ජ'පුර සරසවියේ අධ්‍යාපනය ලැබූ නවක ශිෂ්‍ය පසිඳු හිරුෂාන්ගේ හිසට ටයරයක් පෙරළීමෙන් ඔහු තවමත් ආබාධිත තත්ත්වයේ පසු-

## '57 දී රැග් එකට කිව්වෙ ප්‍රේමයෙන් මනරංජිත වේ ගීතය' මහාචාර්ය ජේ.බී. දිසානායක

අමානුෂික වද හිංසා ඇතුළත් නවකවදය බිහිවී තිබෙන්නේ පීඩනය හා සමාජානුයෝජනයේ දුර්වලතා නිසා බව ඔහු තවදුරටත් දක්වා තිබේ. අතීතයේ දරුවන් නිදැල්ලේ හැදී වැඩී කෙළිදෙළෙන් කාලය ගත කරමින් අධ්‍යාපනය ලැබුවත් වර්තමානයේ දරුවන් ජීවත් වන්නේ නිදහස සීමා වූ වටපිටාවකය. ඉගෙනුම ලබන්නේ තරගකාරී අධ්‍යාපන ක්‍රමයක සිරගත වීමෙනි. අනේකවිධ දුක් කම්කටොලු මැද විශ්වවිද්‍යාලයට පිවිසුණත් බෝඩිම් ප්‍රශ්න, ආහාර ප්‍රශ්න වැනි දහසකුත් ප්‍රශ්න මැද අධ්‍යාපනය ලබන සරසවි සිසුන් පිරිසක් ද සිටිති. ඔවුන්ගේ පීඩනය හා සමාජානුයෝජනයේ අඩුපාඩු ඉහළ යනවිට නවකවදය ද කුරිරු අමානුෂික වදයක් ලෙස වර්ධනය වන බව මහාචාර්ය නන්දසේන රත්නපාල පැහැදිලි කර තිබේ.

නවකවදයට එරෙහි වන්නන්ට අත්විඳින්නට සිදුවන වද හිංසා ද සුළුපටු නැත. ජයවර්ධනපුර සරසවියේ දෙවැනි වසරේ ඉගෙනුම ලැබූ ඕ.වී. සමන්ත 2002 වසරේ මරණයට පත්වූයේ නවකවදය දීමේ සිද්ධියක් සම්බන්ධයෙන් දෙපිරිසක් අතර ඇතිවූ ගැටුමකිනි. නවකවදයට විරුද්ධවූ පේරාදෙණිය සරසවියේ දෙවැනි වසරේ වෛද්‍ය සිසුන් දෙදෙනකුට මැර ප්‍රහාරයක් එල්ල වීමෙන් පේරාදෙණිය රෝහලට ඇතුළත් කළ ප්‍රවෘත්තියක් 2009 සැප්තැම්බර් 04 දින පුවත්පත්වල පළ විය.

නවකවදයේ ඇති කෲරත්වය සහ අමානුෂිකත්වය නිසාම එය වැළැක්වීමේ අරමුණින් 1998 අංක 20 දරන පනත ගෙන එනු ලැබීය. පනතේ දීර්ඝ සටහනේ දැක්වෙන ආකාරයට අධ්‍යාපන ආයතනවලින් නවකවදය සහ වෙනත් ස්වරූපයේ සාහසික ක්‍රියා ද කෲර අමානුෂික සහ නින්දිත සැලකීම් ද

එහෙත් මෙවැනි සුන්දර නවකවද ගැන වර්තමානයේ අසන්නට නොලැබෙන තරම්ය. ඒ වෙනුවට නිරන්තරයෙන් අසන්නට ලැබෙන්නේ අශීලාචාර, නින්දිත නවක වදයන්මය. විශ්ව විද්‍යාල අධ්‍යාපනය දින නියමයක් නොමැතිව කල් ගත වනවිට පිටුපසට යැවෙන්නේ සරසවි දරුවන්ගේ තරුණ ජීවිත නොවේද? සුළු පිරිසකගේ අමානුෂික ක්‍රියාවන් නිසා සමස්ත විශ්වවිද්‍යාල ප්‍රජාවගේම ජීවිත 'රැග්' විය යුතු නැත. ආරක්ෂක අංශ විසින් විශ්වවිද්‍යාල තුළ බුද්ධි අංශ නිලධාරීන් යෙදවීමට තීරණය කර තිබෙන්නේ එබැවිනි. පාතාල මර්දනය සහ මත්කුඩු මර්දනය සඳහා පියවර ගත් ජනපති ගෝඨාභය රාජපක්ෂ විසින් ආරක්ෂක ලේකම්වරයාට දන්වා තිබෙන්නේ විශ්වවිද්‍යාල තුළ පිළිලයක් ලෙස වර්ධනය වන නවකවදය නැවැත්වීමට ක්‍රියාමාර්ග ගන්නා ලෙසටය.

විශ්ව විද්‍යාල යනු ඊට ආවේණික සංස්කෘතියක් සහිත නිදහස් තැනකි. මෙම නිදහස වල්බූරු නිදහසක් බවට පත් කර ගත්තේ සරසවි සිසුන්ගෙන් අතළොස්සක් දෙනාය. විශ්ව විද්‍යාල පද්ධතියට රාජ්‍ය බුද්ධි අංශ නිලධාරීන් මැදිහත්වන්නේ ඔවුන්ගේම වරදිනි.

අනාගතයේදී ම්ලේච්ඡ නවකවදයට වැට බැඳෙන තෙක් සමස්ත ජනතාවම දෑස් දල්වා බලා සිටින්නේ ඔවුන්ගේ දරුවන්ගේ අනාගතය සුබදායි අනාගතයක් කර ගැනීමේ අපේක්ෂාවෙනි.

---





මිල්කෝ කිරි සිසිලකය

# කිරි නිෂ්පාදනය වැඩි කරන මිල්කෝ දැක්ම

## කිරි ලීටර් දෙලක්ෂ තිස් දහසක් දෛනිකව

## රුපියල් බිලියනයකට වඩා වැඩි විකුණුම්

● චන්දිමා එදිරිමාන්න

**වත්මන් රජයේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව කිරි වලින් රට ස්වයංපෝෂිත කිරීමේ අරමුණින් මේ වන විට මිල්කෝ ආයතනය විසින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අනුව එහි එක් පියවරක් ලෙස මධ්‍යම පරිමාණ කිරි නිෂ්පාදකයන්ට සිය කිරි නිෂ්පාදනයන් සිසිල් කර ගබඩා කිරීම සඳහා "මිල්කෝ කිරි සිසිලකය" නමින් කුඩා ප්‍රමාණයේ කිරි ශීතකිරීමේ නව උපකරණයක් හඳුන්වා දීමටද මිල්කෝ ආයතනය පියවර ගන්නා ලදී.**

ඉදිරියේදී මෙම කිරි ශීතකිරීමේ නව උපකරණය ප්‍රමාණාත්මක ලෙස නිෂ්පාදනය කර කිරි ගොවීන් වෙත සැපයීමට මිල්කෝ ආයතනය පියවර ගනු ඇත.එම කිරි සිසිලකය භාවිත කිරීම මගින් එකී කිරි ගොවීන්ගේ ආදායම 80% කින් පමණ ඉහළ යනු ඇති බවට ද ඇස්තමේන්තු වී තිබේ.

විශේෂයෙන්ම සවස් කාලය තුළ කිරි ගොවීන් විසින් නිෂ්පාදනය කර ගැනෙන කිරි නිෂ්පාදනයේ ධාරිතාව වැඩි කර ගැනීමට මෙම කිරි ශීතකිරීමේ උපකරණය භාවිත කිරීමෙන් හැකියාව ලැබෙන අතර එමගින් ජාතික කිරි ජාලයට මෙතෙක් අස්වනු නෙළා නොගත් සැලකිය යුතු නව කිරි ධාරිතාවක් එක් වනු ඇතැයිද මිල්කෝ ආයතනය බලාපොරොත්තු වේ.

මිල්කෝ ආයතනය විසින් මෙතෙක් සිදු කරන ලද දෛනික කිරි එකතු කිරීමේ කාර්යයේදී සවස කිරි එකතු කිරීමේ නිසි වැඩපිළිවෙළක් නොපැවැති අතර කිරි ශීතකිරීමේ නව උපකරණය හඳුන්වාදීමත් සමඟ කිරි ගොවීන්ගේ සවස කිරි සුරක්ෂිතව ගබඩා කිරීමට හැකියාව ලැබී තිබේ. මෙම නව උපකරණය රුපියල් පනස් දහසක් හෝ හැත්තෑදහසක් වැනි මුදලකට මිලදී ගැනීමට මෙරට කිරි නිෂ්පාදනයේ නිරත ගොවි ජනතාවට අවස්ථාව සැලසෙනු ඇත.

කිරි ගොවීන්ගේ කිරි අස්වනු සඳහා නිසි පරිදි ගෙවීම් සිදු කිරීමට මිල්කෝ ආයතනය අපොහොසත් වීම හේතුවෙන් විශ්වාසය බිඳවැටීම නිසා පසුගිය රජය සමයේ කිරි ගොවීන් ඉතා වේගයෙන් මිල්කෝ ආයතනයෙන් ඉවත් වෙමින් තිබුණි. ඒ නිසාම වත්මන් රජය බලයට පත් වන විට මේ ආයතනය ද ආර්ථික වශයෙන් පාඩු ලබන, කඩා වැටෙන ආයතන ගොන්න අතරට එකතු වී තිබුණි. එම නිසා මිල්කෝ ආයතනය වෙනුවෙන් පත් වූ නව පාලනාධිකාරියේ මුල්ම පියවර වුණේ ආයතනය දෙපයෙන් නැඟී සිටිය හැකි පරිදි ශක්තිමත් කිරිමයි.

ඒ අනුව කිරි ගොවීන්ගේ මුදල් කලට වෙලාවට ගෙවීමට කටයුතු කිරීමත්, කිරිවලට ලීටරයකට ලබා දෙන මුදල වැඩිකිරීමටත් පියවර ගැනුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස යළිත් වරක් මිල්කෝ කෙරෙහි විශ්වාසය තබන්නට කිරි ගොවියා පෙලඹවීමට හැකියාව ලැබුණි.

මේ වන විට මිල්කෝ ආයතනය සමඟ සක්‍රියව බැඳී සිටින රට පුරාම සිටින කිරි ගොවීන් ප්‍රමාණය 27,000 ක් පමණ වේ. ඔවුන් සියලු දෙනාගේම දායකත්වය ලබා ගනිමින් පසුගිය ජනවාරි මාසය වන විට ලීටර් එක්ලක්ෂ විසි දහසක්ව පැවැති දෛනික කිරි ලබා ගැනීම මේ වන විට ලීටර් දෙලක්ෂ තිස් දහසක් දක්වා වැඩි කිරීමට හැකියාව ලැබී ඇති අතර පැවැති අක්‍රමිකතා රැසක් මුලිනුපුටා දමමින් බෙදාහැරීමේ කාර්ය ශක්තිමත් කිරීමට ද පියවර රැසක් ගනු ලැබූ බව සඳහන් කළ යුතු වේ.

මේ ජයග්‍රාහී හා දූරදර්ශී මග පෙන්වීම නිසා පසුගිය මාස තුනක කාලය තුළදී රුපියල් බිලියනයකට වඩා වැඩි විකුණුම් සිදු කිරීමටද මිල්කෝ ආයතනය සමත්කම් දක්වා ඇත.

ලබන වසර වන විට මෙම ඉලක්කම බිලියන දෙකක් බවට පත් කිරීමටත් ගත වූ කාලයේ පාඩු ලබමින් තිබුණු මිල්කෝ ආයතනය නැවත ලාභ ලබන ව්‍යාපාරයක් බවට පත් කිරීමටත් මේ වන විට සියලු සැලසුම් පිළියෙල වී ඇති අතර සිය නිෂ්පාදනයන් ඉහළ නැංවීමේ අරමුණින් විධිමත් හා සැලසුම් සහගත සිව් වැදෑරුම් වැඩපිළිවෙළක් ද මිල්කෝ ආයතනය දැනටමත් ක්‍රියාත්මක කරමින් සිටියි.

එකී වැඩපිළිවලට අනුව ගැබ් ගන්නා කිරි එළදෙනුන් සංඛ්‍යාව වැඩි කිරීම සඳහා ඒ එළදෙනුන්ගේ කෘත්‍රිම සිංචනය සිදු කිරීමට කටයුතු කළ හැකි නිලධාරීන් පුහුණු කෙරෙන වැඩපිළිවෙළක් ඉදිරියේදී සාර්ථක ලෙස දිවයින පුරාම ක්‍රියාත්මක වනු ඇත.

මීට අමතරව කිරි ගොවීන් දැනුවත් කිරීමේ අධ්‍යාපනික වැඩසටහන් සංවිධානය කිරීමටද මිල්කෝ කටයුතු කර තිබේ. එමෙන්ම සත්ත්ව ආහාරවල හිඟකම නිසා එයට පිළියමක් වශයෙන් තෘණ මිලදී ගැනීමටත්, තෘණ වැවීමටත් වැඩ පිළිවෙළක් සකස් කර තිබේ.

මේ අනුව වීරවිලින් ආරම්භ කර ඇති තෘණ මිලදී ගැනීමේ හා තෘණ වැවීමේ වැඩසටහන මේ වන විට ඉතා සාර්ථක ප්‍රතිඵල අත් කර දී ඇති බවද කිව යුතුය. මේ තෘණ මිලදී ගැනීමේ හා තෘණ වැවීමේ වැඩසටහන ද ව්‍යවසායකයන් බිහි කිරීමේ වැඩසටනක මූලාරම්භයක් ලෙසද හඳුන්වා දීමටද පුළුවන.



මිල්කෝ ආයතනයේ සභාපති ලසන්ත වික්‍රමසිංහ
ඡායාරූප සරත් පීරිස්

● ජාලිය වීරක්කොඩි

# ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය සම්පත් ආකරයක් කරන හැටි

## ලොවට කියන ලාංකේය විද්‍යාඥයා

**හැරූ රන් මුසු ලෝහ පස් ටොන් සීයකින් නිස්සාරණය කර හැකි රන් ප්‍රමාණයට වඩා ඉවත ලන ස්මාර්ට් ෆොන් ටොන් සීයකින් රත්තරන් උකහා ගත හැකියි. ඉවත ලන ඉලෙක්ට්‍රොනික උපාංග හරහා ගොඩගැසෙන කසළ කන්ද ලෝකය යට කරගැනීමට ආසන්නය. එය මානව ශිෂ්ටාචාරයේ ඛේදවාචකයක් විය හැකි අයුරු ලෝකයේ සංවේදී මිනිසුන් විසින් කලක සිට පෙන්වා දී තිබේ.**

ඊ අපද්‍රව්‍ය යනු නියමිත ආයු කාලය නිමා වූ පසු නැවත භාවිත කිරීමේ අරමුණකින් තොරව ඉවත ලනු ලබන සියලු වර්ගවල විදුලි හා ඉලෙක්ට්‍රොනික් උපකරණ, ඒ උපකරණවල කොටස්, ඊ අපද්‍රව්‍ය ලෙස හඳුන්වනු ලැබේ. ලෝක ආර්ථික සංසදයට අනුව වර්ෂ 2016 දී ලෝකය උත්පාදනය කර ඇති ඊ අපද්‍රව්‍ය ප්‍රමාණය ටොන් මිලියන 44.7කි. ඔවුන් කියන්නේ එය අයිෆල් කුලුණේ අනුරූ 4500ක් හැදීමට ප්‍රමාණවත් බවය. මේ අපද්‍රව්‍ය වලින් නිසි ප්‍රතිචක්‍රීරණයට ලක් කළ හැක්කේ සියයට විස්සක් පමණි. ඉතිරි අවශේෂවලට සිදුකරන්නේ කුමක් ද යන්න සම්බන්ධ ගැටලුව කලක සිට පැවතිනි.

### ඵලදායී කළමනාකරණය

ඊට පිළියම් ලෙස මැලේසියාවේ මොනෑෂ් විශ්ව විද්‍යාලයීය ඉංජිනේරු පාසලේ ( Monash University Malaysia's School of Engineering) ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යා ආචාර්ය සමන් ඉලංගකෝන් ඊ අප්‍රද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීමේ වඩාත් ප්‍රශස්ථ වැඩ පිළිවෙළක් සඳහා ප්‍රවේශ වී සිටී. ඊ-අපද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් කුණු බඳුන්වලට බැහැර කිරීමේ හෝ නීති විරෝධී අවිධිමත් ප්‍රතිචක්‍රීකරණයේ අවඵල විඳිමින් සිටින සමාජයට එය වැදගත් පුවතකි. ඔහු මේ ප්‍රතිචක්‍රීකරණ තාක්ෂණය හඳුන්වා දෙන්නේ අයි.ඕ.ටී තාක්ෂණික භාවිතය සහිත විද්‍යාත්මක ක්‍රමවේදයකිනි.

විවිධ ගෝලීය ප්‍රවණතාවල එකතුව, වේගයෙන් දියුණුවන තාක්ෂණය, තොරතුර සන්නිවේදන තාක්ෂණයේ ඉහළ වර්ධනය, මධ්‍යම පන්තික සමාජයේ ආර්ථික ප්‍රවණතා අනුව හඳුන්වා දෙමින් ඇති ඉතා කෙටි කාලයක දී ආදේශවන විද්‍යුත් උපාංග, වැනි තත්වයන් ඉලක්ක කර ගත් ඉලෙක්ට්‍රොනික් හා විද්‍යුත් උපකරණ නිෂ්පාදනය වැඩි වෙමින් තිබේ.

මේ හරහා නිති පතා පරිසරයට එක් වන විශාල විද්‍යුත් අපද්‍රව්‍ය ප්‍රමාණය නීති විරෝධීව ප්‍රතිචක්‍රීකරණය වනවිට හෝ කුණු කසළ ලෙස බැහැර කරන විට ඒවායේ අඩංගු ඊයම්, රසදිය හා කැඩ්මියම් වැනි අන්තරායකර රසායනික ද්‍රව්‍ය හා අහිතකර ලෝහ වර්ග පසට, ජලයට හෝ වාතයට මුදා හරිනු ලැබේ.



ආචාර්ය සමන් ඉලංගකෝන්

### අප නොදැන සිටි සම්පත

එහෙත් ඊ අපද්‍රව්‍ය යනු අතිශයින්ම ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගත හැකි සම්පතකි. බොහෝ දෙනා තේරුම් ගැනීමට අපොහොසත් වන යථාර්ථය ලෝක ආර්ථික සංසදය ( WEF ) පෙන්වා දෙයි. ඔවුන්ගේ වාර්ෂික ඇස්තමේන්තුවට අනුව එහි වටිනාකම ඇමරිකානු ඩොලර් බිලියන 62.5 කි. එම වටිනාකම මෙම ඊ අපද්‍රව්‍ය වලට ලැබෙන්නේ එහි අන්තරගතයේ ඇති රන්, රිදී, තඹ, ටින්, ප්ලැටිනම් සහ පැලේඩියම් වැනි දුර්ලභ වටිනා ලෝහ සම්පත හේතුවෙනි.

"ඉදිරි වසර 50 ත් 60ත් අතර කාලය තුළ අපේ වර්තමාන ජීවන රටාව පවත්වා ගැනීම සඳහා අපිට මීට වඩා සියයට හැටක ප්‍රමාණයක් ස්වභාවික ද්‍රව්‍ය නිෂ්පාදනය කරන්න සිද්ධ වෙනවා. එය පෘථිවිය වගේ ග්‍රහලෝක හතරක තියන ස්වභාවික සම්පත් ප්‍රමාණයට සමානයි. අපට ඇති සම්පත් සීමාව මෙයින් තේරුම් ගන්න." ආචාර්ය සමන් ඉලංගකෝන් පවසා තිබිණි.

මේ වටපිටාව තුළ ඊ අපද්‍රව්‍ය විද්‍යානුකූල ලෙස ප්‍රතිචක්‍රීකරණය කිරීමෙන් එහි අන්තර්ගත වටිනා ලෝහ වර්ග නිස්සාරණය කරගෙන ස්වභාවික සම්පත් සඳහා ඉහළ යන ඉල්ලුම සපුරා ලිය හැකි බව ලෝක ආර්ථික සංසදය පනේවා දෙයි. හැරූ රන් මුසු ලෝහ පස් ටොන් සීයකින් නිස්සාරණය කර හැකි රන් ප්‍රමාණයට වඩා ඉවත ලන ස්මාර්ට් ෆොන් ටොන් සීයකින් රත්තරන් උකහා ගත හැකි බව ඔවුහු පවසති.

### රන් මසු පස්වලට වැඩි රත්තරන්

එක්සත් ජනපද පරිසර ආරක්ෂණ ඒජන්සියේ සංඛ්‍යාලේඛන වලට අනුව ජංගම දුරකථන මිලියනයක් ප්‍රතිචක්‍රීකරණය කිරීමෙන් රත්‍රන් කිලෝග්‍රෑම් 34 ක්, රිදී කිලෝග්‍රෑම් 350 ක්, තඹ කිලෝග්‍රෑම් 16,000 ක් සහ පැලේඩියම් කිලෝග්‍රෑම් 15 ක් සොයා ගත හැකිය. එහෙත් නිශ්චිත විද්‍යානුකූල ක්‍රමවේදයකින් තොරව මෙම අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය නොකරන විට මෙම මේ මහා සම්පත් ප්‍රමාණය ප්‍රයෝජන රහිතව පරිසරය තුළම විනාශ වී යයි.

"අප මේ අවකාශය වසා දැමිය යුතු නෑ. ආර්ථික සංසරණය තුළ අපද්‍රව්‍ය එකතු කිරීම, සහ සම්පත් උකහා ගැනීම සම්බන්ධව සහතික විය යුතුයි." ආචාර්ය සමන් ඉලංගකෝන් පවසා තිබිණි.

පතල් හා ඛනිජ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විශේෂඥවරයෙක් වන ආචාර්ය සමන් ඉලංගකෝන් දැනට ඉවතලන මුද්‍රිත පරිපථ පුවරු (පීසීබී) වලින් තඹ නිස්සාරණය කිරීමේ නව ක්‍රමවේදයක් පිළිබඳ ගවේෂණය කරමින් හිඳී.

ඉදිරි වසර තුන සඳහා මැලේසියානු රජයෙන් ඩොලර් 77,000 ක් වටිනා මූලික පර්යේෂණ ප්‍රතිපාදන වෙන් කරගත් ආචාර්ය ඉලංගකොන් ලෝහ නිස්සාරණය සඳහා ප්‍රශස්ත ක්‍රමයක් සංවර්ධනය කිරීමට අපේක්ෂා කරයි. මෙය කාර්මික අංශයට බලපෑම් කළ හැකි තාක්‍ෂණයකි.

ඔහුගේ අනෙක් පර්යේෂණ ව්‍යාපෘතිය වන ස්මාර්ට් ඊ-අපද්‍රව්‍ය එකතු කිරීමේ පෙට්ටිය (Smart E-Waste Collection BoX) ය. ඔහු ඒ යටතේ විද්‍යුත් අපද්‍රව්‍ය එකතු කිරීම ප්‍රශස්ත කිරීම සඳහා ජංගම දුරකථන යෙදවුමක් (mobile application) භාවිත කරයි.

මැලේසියාවේ මොනෑෂ් විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පාසල සහ තොරතුරු තාක්ෂණ පාසලේ ආචාර්ය චුන් යොං චොං සමඟ ම අවබෝධාත්මක එකඟතාවයක් සහිත නියමු ව්‍යාපෘතියක් ලෙස ස්මාර්ට් ඊ-අපද්‍රව්‍ය එකතු කිරීමේ පෙට්ටිය ක්‍රියාත්මක වේ. මෙසේ ඉවත ලන ස්මාර්ට් ඊ අපද්‍රව්‍ය මැලේසියාවේ සන්වේ අධ්‍යාපන සමූහයේ සහ මැලේසියාවේ මොනෑෂ් විශ්වවිද්‍යාලයේ තැන්පත් කර ඇති බඳුන් හරහා එකතු කරනු ලැබේ.

ස්මාර්ට් ඊ-අපද්‍රව්‍ය එකතු කිරීමේ පෙට්ටිය සමඟ ආචාර්ය ඉලංගකෝන් ඉලෙක්ට්‍රොනික උපකරණ බැහැර කිරීම සඳහා පුළුල් ප්‍රවේශයක් හඳුන්වා දුන්නේය. ඔහු විද්‍යුත් අපද්‍රව්‍ය එකතු කිරීම අධීක්ෂණය කිරීම සහ ප්‍රයෝජනවත් එකතු කිරීමේ ක්‍රියාවලියක දී අවශ්‍ය දත්ත ග්‍රහණය කර ගැනීම සඳහා ජංගම දුරකථන යෙදවුමක් සහ අතිධ්වනික සංවේදක භාවිතා කිරීම ඇරඹුවේය.



> ඉදිරි වසර 50 ත් 60ත් අතර කාලය තුළ අපේ වර්තමාන ජීවන රටාව පවත්වා ගැනීම සඳහා අපිට මීට වඩා සියයට හැටක ප්‍රමාණයක් ස්වභාවික ද්‍රව්‍ය නිෂ්පාදනය කරන්න සිද්ධ වෙනවා. එය පෘථිවිය වගේ ග්‍රහලෝක හතරක තියන ස්වභාවික සම්පත් ප්‍රමාණයට සමානයි.

### වඩා හොඳ විද්‍යුත් අපද්‍රව්‍ය කළමනාකරණයක්

"එක් අතකින් අපට තවත් විද්‍යුත් අපද්‍රව්‍ය අවශ්‍යයි. අනෙක් අතට, ඉවතලන ද්‍රව්‍ය වලින් උපරිම අගය ලබා ගත යුතුයි. එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඊ-අපද්‍රව්‍ය කළමනාකරණය ඉතා වැදගත්."

ඊළඟ පරම්පරාවේ අභිවෘද්ධිය සඳහා අපගේ ස්වාභාවික පරිසරය, ජලය සහ පස සංරක්ෂණය කළ යුතුයි. නිෂ්පාදකයන් තමන් නිෂ්පාදනය කරන දේ සම්බන්ධයෙන් වගකිව යුතුයි. විද්‍යුත් අපද්‍රව්‍ය බැහැර කිරීම නිසි තැන කළ යුතු බව ජනතාව තේරුම් ගත යුතුයි. කොටින්ම අප භාවිතා කරන දේ සම්බන්ධයෙන් අප වගකිව යුතුයි.

ආචාර්ය සමන් ඉලංගකෝන් පවසා තිබිණි. මේ සාඩම්බර විද්වතා යහපත් ලෝකයක් වෙනුවෙන් නිර්මාණශීලී වූ විද්‍යාත්මක භාවිත අත්හදා බලමින් හිඳී. . ඒ අප හැමොටම ආරක්ෂාකාරී හෙට දවසක් වෙනුවෙනි.

---

● මහේෂ් රුවන් කිර්තිරත්න

# දිනෙන් දින උණුසුම් වන මාතලේ දේශපාලනය

**මාතලේ දේශපාලනය පසුගිය සතියේදී යම් උණුසුම් බවක් දක්නට ලැබුණේ විපක්ෂයේ මෙන්ම ආණ්ඩු පක්ෂයේද දේශපාලනඥයන්ගේ ක්‍රියා කලාපය හේතුවෙනි. ඒ, පසුගියදා පැවති පාර්ලිමේන්තු මැතිවරණයේදී විපක්ෂයට හිමි එක් අසුනක් වෙනුවෙන් නැවත මානප ගණන් කරන ලෙස ඉල්ලා හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී රංජිත් අලුවිහාරේ විසින් නඩුවක් ගොනු කිරීමත් සමඟය.**

මාතලේ දිස්ත්‍රික්කය සඳහා සමගි ජන බලවේගය පක්ෂයෙන් තරග කොට තේරී පත් නොවූ අපේක්ෂකයකු වන හිටපු රාජ්‍ය අමාත්‍ය රංජිත් අලුවිහාරේ එම පෙත්සම ඉදිරිපත් කරමින් කියා සිටියේ ඉකුත් මහ මැතිවරණයේදී සමගි ජන බලවේගය පක්ෂයෙන් මාතලේ දිස්ත්‍රික්කය සඳහා තරග වැදුණු අපේක්ෂකයන්ගේ මනාප ඡන්ද ගණනය කිරීමේදී අක්‍රමිකතා සිදු වූ බවය. එම පෙත්සම පසුගිය (17) දා අභියාචනාධිකරණයේ සභාපති විනිසුරු ඒ. එච්. එම්. ඩී. නවාස් සහ සෝභිත රාජකරුණා යන මහත්වරුන්ගෙන් සමන්විත විනිසුරු මඬුල්ල ඉදිරියේ සලකා බැලීම සිදුකෙරුණි.

පෙත්සම විභාග කිරීමට තීරණය කළ අභියාචනාධිකරණ විනිසුරු මඬුල්ල මීට අදාළව නොවැම්බර් මස 05 වැනිදා අධිකරණය හමුවේ කරුණු දක්වන ලෙස දන්වා එහි වගඋත්තරකරුවන් ලෙස මාතලේ දිස්ත්‍රික් මැතිවරණ තේරීම් භාර නිලධාරියා, ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරියා, මැතිවරණ කොමිසමේ සභාපති මහින්ද දේශප්‍රිය ඇතුළු එහි සාමාජිකයන්, මාතලේ දිස්ත්‍රික්කයේ සමගි ජන බලවේගය පක්ෂයෙන් තේරී පත්වී සිටින පාර්ලිමේන්තු මන්ත්‍රිනී රෝහිණී කවිරත්න ඇතුළු 14 දෙනෙකු නම් කරමින් ඔවුන් වෙත නොතිසි නිකුත් කරන ලෙසද නියෝග කළහ.

මේ පිළිබඳ අදහස් දක්වමින් සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රිනී රෝහිණී කවිරත්න කියා සිටියේ ජනතාව විසින් වැඩි ඡන්දයෙන් තමන් තෝරා ගෙන ඇති බවත් රාජ්‍ය සේවකයන් නිවැරදිව අපක්ෂපාතිව තම වගකිම් ඉටු කර ඇති බවට තමා විශ්වාස කරන බවත්ය.

මේ අතර එක්සත් ජාතික පක්ෂයට මාතලේ දිස්ත්‍රික්කයේ බලය හිමිව තිබූ එකම පළාත් පාලන ආයතනයේ බලය ද පසුගියදා අහිමි වූයේ නගරාධිපති ඩල්ජිත් අලුවිහාරේගේ ධුරය තාවකාලිකව අත්හිටුවා එහි වැඩ බැලීම සඳහා මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලලිත් ගමගේ මහතා විසින් නියෝජ්‍ය නගරාධිපති සන්දනම් ප්‍රකාශ්ට බලය පැවරීම හේතුවෙනි.

පැවති පළාත් පාලන මැතිවරණයේදි එක්සත් ජාතික පක්ෂයට සභිකධුර 09ක්ද ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට සභික ධූර 06ක්ද එක්සත් ජනතා නිදහස් සන්ධානයට මන්ත්‍රිධුර 04ක්ද එකමුතු ප්‍රගතිශිලි සන්ධානයට මන්ත්‍රිධුරයක් සහ ජනතා විමුක්ති පෙරමුණට එක් මන්ත්‍රිධුරය බැගින් ද හිමිවිය.

මෙහිදි නගරාධිපතිවරයා තේරිමේදි එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් තරග වැද පරාජයට පත් වි නැවත ලැයිස්තුවෙන් තේරි පත්වු සන්දනම් ප්‍රකාශ් මහතාගේ සහය හිමි වුයේ ඩල්ජිත් අලුවිහාරේටය.

පැවති පළාත් පාලන මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂයට සභික ධූර 9ක්ද ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට සභික ධූර 06ක්ද එක්සත් ජනතා නිදහස් සන්ධානයට මන්ත්‍රී ධූර 4ක්ද එකමුතු ප්‍රගතිශිලි සන්ධානයට සහ ජනතා විමුක්ති පෙරමුණට එක් මන්ත්‍රී ධූරය බැගින්ද හිමි විය.

එහිදී නගරාධිපතිවරයා තේරීමේදී එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් තරග වැද පරාජයට පත් වී නැවත ලැයිස්තුවෙන් තේරී පත්වූ සන්දනම් ප්‍රකාශ් මහතාගේ සහාය හිමි වූයේ ඩල්ජිත් අලුවිහාරේට ය. සන්දනම් ප්‍රකාශ් මහතා නියෝජ්‍ය නගරාධිපතිවරයා බවට පත් විය.

කාලයක් ගතවද්දී නගරාධිපතිවරයා සහ එම පක්ෂයේ ම මන්ත්‍රීවරුන් අතර විවිධ අවස්ථාවලදී විවිධ ගැටුම් ඇති විය. නියෝජ්‍ය නගරාධිපතිවරයා ඇතුළු මන්ත්‍රීවරුන් සමඟ නගරාධිපතිවරයා විසින් විවිධ අවස්ථාවලදී තර්කවිතර්ක ඇතිකර ගැනීම හේතුවෙන් අය වැය ලේඛනයද පරාජයට පත් කිරීමට නියෝජ්‍ය නගරාධිපතිවරයා ඇතුළු මන්ත්‍රීවරු කටයුතු කළහ.

නගරාධිපතිවරයාට විරෝධය පළ කරමින් මන්ත්‍රීවරුන් අවස්ථා ගණනාවකදී ම උද්ඝෝෂණ හා විරෝධතා පැවැත් වූ අතර මධ්‍යම පළාතේ හිටපු ආණ්ඩුකාරවරුන් වෙත අවස්ථා ගණනාවකාවදී ම පැමිණිලිද ඉදිරිපත් කළහ.



අසුන වෙනුවෙන් අධිකරණයට ගිය රන්ජිත් අලුවිහාරේ



හිටපු නගරාධිපති ඩල්ජිත් අලුවිහාරේ



නව නගරාධිපති සන්දනම් ප්‍රකාශ්

> **නගරාධිපතිවරයාට විරෝධය පළ කරමින් මන්ත්‍රීවරු උද්ඝෝෂණය කරති**

> **නිවාස සංකීර්ණය නිවාස ඒකක 6කින් සමන්විත වන අතර, ඒ සඳහා රජය විසින් දරා ඇති වියදම රුපියල් මිලියන 39කි**

මාතලේ මහ නගර සභාවේ නගරාධිපති ඩල්ජිත් අලුවිහාරේ සහ මන්ත්‍රී මණ්ඩලය සමග පැවැති එම අර්බුදකාරි තත්ත්වය නිමා කරමින් පසුගියදා මධ්‍යම පළාත් ආණ්ඩුකාර නීතිඥ ලලිත් යූ. ගමගේ විසින් නගරාධිපතිවරයාගේ සේවය තාවකාලිකව අත්හිටවනු ලැබීය.

මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලලිත් යූ ගමගේ ට පැවරී ඇති බලතල අනුව 2020 අගෝස්තු 25 වන දින අංක 2190/24 දරන අති විශේෂ ගැසට් නිවේදනයක් මඟින් මෙම සේවය අත්හිටුවීම සිදු කර ඇති අතර මාස 3ක කාලසීමාවක් ඇතුළත පරික්ෂාකර කරුණු වාර්තා කිරීමට කොමිසමට බලතල ලබා දී ඇත. නගරාධිපති පිළිබඳ එම විමර්ශනයට විශ්‍රාම ලත් අධිකරණ නිලධාරිනී සරෝජනී කුසලා වීරවර්ධන පත්කර තිබේ.

ඒ අනුව 1989 අංක 12 දරන පළාත් සභා ( අනුසාංගික විධිවිධාන) පනත 02 යටතේ 02 නන වගන්තිය සමග කියවිය යුතු සංශෝධිත මහ නගර සභා ආඥා පනත යටතේ (252 අධිකාරිය) 277 (i) ( ආ) ( අ) මෙම නියෝගය ආණ්ඩුකාරවරයා විසින් නිකුත් කර ඇත.

මාතලේ මහ නගර සභාවේ දැනට නියෝජ්‍ය ධුරයෙහි කටයුතු කරන සන්දනම් ප්‍රකාශ් මාතලේ මහ නගර සභාවේ නගරාධිපතිවරයාගේ කාර්යයන් ඉටු කිරීමට හා බලතල ක්‍රියාත්මක කිරීමට සන්දනම් ප්‍රකාශ් ට බලය පවරා තිබේ.

ලියාපදිංචි නොකළ ගිවිසුමක් යටතේ කුලී පදනම මත පෞද්ගලික සමාගමකට ලබා දී ඇති නගරාධිපතිවරයා නමින් ලියාපදිංචි කර ඇති සී. පී. කේ. ඩී. 8627 ජීප් රථය නගරාධිපතිවරයාගේ නිල රථය ලෙස කුලී පදනම මත ලබා ගැනීම, තාක්ෂණික කමිටුවේ අනුමැතිය ලබා නොගෙන විථි ලාම්පු මිලදී ගෙන මුදල් අවභාවිත කිරීම, මාතලේ පාරාවත්ත ප්‍රදේශයේ නගර සභාවට අයත් ඉඩමක් සොයා බැලීමකින් තොරව සමාගමකට බදු දීම, පළාත් ආණ්ඩුකාරවරයාගෙන් අනුමැතියෙන් තොරව රියදුරකු බඳවා ගැනීම, මාතලේ රජයේ විද්‍යා විද්‍යාලය අසළ කඩ කාමර නගරාධිපතිවරයාගේ අනුමැතිය මත තෝරාගත් පිරිසකට ලබා දීම, මාතලේ ළමා උද්‍යානය අසළ ආපන ශාලාව කමිටු හෝ මහ සභා තීරණයක් නොමැතිව අභිමතය පරිදි පවත්වාගෙන යෑමට ඉඩදීම යන චෝදනා එල්ල කර තිබේ.

මධ්‍යම පළාත් ආණ්ඩුකාර නීතිඥ ලලිත් යු ගමගේ පැවසුවේ නගරාධිපතිවරයාට එල්ල වී ඇති චෝදනා විමර්ශනය සිදු කිරීම සඳහා කොමිෂන් සභා බලය ඇති ඒක පුද්ගල කොමිසමක් පත් කළ බවත් මාස තුනකට නගරාධිපතිවරයාගේ සේවය තාවකාලිකව අත්හිටවූ බවය. අදාළ කොමිසම විමර්ශනය කිරීමෙන් අනතුරුව වාර්තාව තමා වෙත ලබා දීමට නියමිත බවද සඳහන් කළේය.

සේවය අත්හිටුවීමට ලක්ව සිටින නගරාධිපති ඩල්ජිත් අලුවිහාරේගෙන් අප මේ පිළිබඳ විමසීමක් කළෙමු.

"නගරාධිපති ධුරය අත්හිටුවීමට ගත් තීරණය දේශපාලන පළිගැනීමක්. මම ඒ ගැන කනගාටු වෙනවා. ජනාධිපතිවරයාගේ සෞභාග්‍යයේ දැක්ම ක්‍රියාත්මක කරන්න අද තුනෙන් දෙකක් ලැබිලා තිබෙනවා. මේ තුනෙන් දෙකේ ප්‍රතිඵලය මත තමයි මේ දේශපාලන පළිගැනීම්වලට අප ලක් කර තිබෙන්නේ. මාතලේ මහ නගර සභාවේ පමණයි මේ දිස්ත්‍රික්කයේ එජාපය ජයග්‍රහණය කළේ. මම පත් වුණේ ජනතා ඡන්දයෙන්. නමුත් ආණ්ඩුකාරවරයා බලය අතික්‍රමණය කරමින් ගැසට් නිවේදනයක් නිකුත් කර තිබෙනවා. මම මහාධිකරණයේ නඩුවක් ගොනු කර තිබෙනවා. නීතියට පටහැනිව කටයුතු කර තිබෙනවා. කුරුණෑගල නගරාධිපති වැරදි කරලත් අද එළියේ ඉන්නවා. මම වැරදි කරලා නැහැ. අපි නිවැරදිව වැඩ කරලත් අපට බොරු චෝදනා එල්ල කරනවා. අපි බය නැහැ. ජනතාවට සේවය කරලා තියෙනවා. මේක තනිතරම දේශපාලන පළිගැනීමක්. ජනාධිපතිවරයාගෙන් ඉල්ලනවා මාතලේට විමර්ශනයක් කණ්ඩායමක් එවන්න. මම මහ සභා අනුමැතිය යටතේ සභා තීන්දු අනුව තමයි වැඩ කරලා තියෙන්නේ. මගේ අභිමතය පරිදි කිසි දෙයක් කරලා නැහැ. රජයේ විගණන අනුව අපි නිවැරදි කියලා තිබෙනවා. මම බය නැතිව කියනවා, මම අධිභාර කරලා නැහැ. විමර්ශනයක් කරලා වැරදි කරලා තියෙනවා නම් සිරගත කරන්න කියා ඉල්ලනවා."

මේ අතර පසුගිය දිනෙක මාතලේ දිස්ත්‍රික්කයේ රාජ්‍ය සේවකයන් වෙනුවෙන් මාතලේ ඇම්.සී. පාර ප්‍රදේශයේ ඉදිකළ නිල නිවාස සංකීර්ණය සේවක අයිතියට පැවරීමේ උත්සවයට මාතලේ දිස්ත්‍රික්කයේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට ආරාධනය නොකිරීම සම්බන්ධයෙන් විරෝධය පළ කිරීමත් සමඟ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ බෙදීමේ ස්වභාවයක් පෙන්නුම් කර අයුරු දක්නට ලැබුණි. මාතලේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී (පො.පෙ) නාලක බණ්ඩාර කෝට්ටේගොඩ විසින් තනිවම ගොස් මෙම නිල නිවාස සංකිර්ණය ජනතා අයිතියට පත් කළ අතර එයට ආරාධනය නොකිරීම සම්බන්ධයෙන් අනෙක් මන්ත්‍රීවරුන්ද තම විරෝධය පළ කළහ. මෙම නිවාස සංකීර්ණයේ නිවාස ඒකක 6කින් සමන්විත වන අතර ඒ සඳහා රජය විසින් දරා ඇති වියදම රුපියල් මිලියන 39කි.

ආරාධනය නොකිරීම සම්බන්ධයෙන් අදහස් දැක්වූ පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් කියා සිටියේ රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් ට කිසිදු ආරාධනාවක් සිදු නොකිරීම සම්බන්ධයෙන් කනගාටුව වන බවත් මෙවැනි දේ සිදු වීම කිසිසේත් අනුමත කළ නොහැකි බවත්ය.

ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයකු වන රෝහණ දිසානායක ගෙන් මේ පිළිබඳ විමසීමේදි කියා සිටියේ තමාට කිසිදු ආරාධනාවක් සිදු නොකළ බවත් තමන් මේ පිළිබඳ මාතලේ මහ දිසාපතිවරයා දැනුවත් කළ බවත් ය. මේ පිළිබඳව මාතලේ මහ දිසාපති කරුණාසිරි පෙරේරා කියා සිටියේ මෙම නිවෙස් හිමි රාජ්‍ය සේවකයන්ට හිමි යතුරු ආදිය මිට සති දෙකකට පෙර බාර දුන් බවත් 21 වැනිදා ඔවුන් තේ පැන් සංග්‍රහයක් සූදානම් කර තමාට ආරාධනය කළ බවත් තමන් එයට සහභාගි නොවූ බවත් ය. විවෘත කිරීම සඳහා සමරු ඵලක ආදිය සකස් කර නොතිබූ බවද හෙතෙම පැවසීය.

දිසාපතිවරයා වැඩිදුරටත් සඳහන් කළේ පසුගිය කාලයේ තමා විසින් ස්වදේශ කටයුතු හා රාජ්‍ය පරිපාලන අමාත්‍යංශය මගින් මෙම නිල නිවෙස් ඉදිකිරීම සඳහා සැලසුම් සකස් කර අමාත්‍යංශයට ඉදිරිපත් කර මුදල් අනුමත කරවාගෙන මෙම නිවෙස් ඉදි කළ බවද ඔහු පැවසිය.

මේ පිළිබඳව කමිටු සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී නාලක බණ්ඩාර කොට්ටේගොඩ පැවසුවේ පසුගිය රජය සමයේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ තීරණ සහ අමාත්‍යංශ ප්‍රතිපාදන අනුව මෙම නිල නිවෙස් ඉදිකර ඇති බවත් ඒ අනුව කමිටුව මගින් සිදු කළ සංවර්ධන යෝජනා ක්‍රම විවෘත කිරීමක් සිදු කළ බවය

කෙසේ වෙතත් දිවයිනේ අනෙකුත් නගර දෙස බැලීමේදී සංවර්ධනයක් සිදුව නොමැති බව මාතලේ ඉතිහාසය ගැන දන්නා පිරිසට අමුතුවෙන් මතක් කළ යුතු නොමැති අතර දේශපාලන පිල් බෙදීම්වලට හසුව ඇති මාතලේ සංවර්ධනය ඉදිරියට රැගෙන යෑම මාතලේට ආදරේ ඇති සියලු මහජන නියෝජිතයන්ගේ වගකීම හා යුතුකම වන බව මතක් කළ යුතුමය.



මාතලේ මහ නගර සභාව

# 'රුවන් හොඳයි රනිල් නරකයි'

## ආණ්ඩු පක්ෂයේ ඇතමුන් 20ට විරුද්ධයි

## අපි සමගි බල සන්ධානයක් හදනවා



සමගි ජන බලවේගයේ පක්ෂ මහලේකම් පාර්ලිමේන්තු මන්ත්‍රී රංජිත් මද්දුම බණ්ඩාර

● **භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්**

● **20 වෙනි සංශෝධනයට විරුද්ධව පාර්ලිමේන්තුව තුළ ඔබලා දැඩි විරෝධතාවයක නිරත වුණා. කුමන හේතුවක් නිසාද?**

20 වෙනි සංශෝධනය කියලා තියෙන්නේ මේ රටේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය විනාශ කරන, පහත් කරන මේ රට ඒකාධිපති පාලනයක් කරා ගෙන යන තනි පුද්ගලයෙකු මතට රටේ නීතිය භාර දෙන ක්‍රමවේදයක් හැටියට පෙන්වා දිය හැකියි.

මෙහිදී ජනතාවගේ අයිතිය සම්පූර්ණයෙන්ම නැති වෙලා යනවා. මේ සංශෝධනයෙන්ම ජනතාවගේ නිදහස ජනතාවගේ පරමාධිපත්‍ය ජනාධිපතිවරයා ළඟට ගන්නවා. පාර්ලිමේන්තුවත් ජනාධිපතිවරයා අතර තිබුණු බල තුලනය නැති වෙලා. පාර්ලිමේන්තුව සහ අගමැතිවරයා අතර තිබුණු බලය නැති වෙනවා. ජනපතිට බලය ලැබෙනවා. කරුණු රැසක් මේ සම්බන්ධව තිබෙනවා. ප්‍රධාන වශයෙන්ම ජනාධිපතිවරයා ඒකාධිපති පාලකයෙකු මෙන් බලවත් කිරීම මෙම ව්‍යවස්ථාවෙන් සිදු කරන නිසා මෙයට අපි සම්පූර්ණයෙන්ම විරුද්ධයි.

● **20 වෙනි සංශෝධනය වෙනස් කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළහොත් ඔබලා එයට එකඟ වනවාද?**

විස්සක් ගෙන එනවාට වඩා පහසු ක්‍රියාවලියක් වර්තමාන රජයට සිදු කරන්න තිබුණා. 19 වෙනි ව්‍යවස්ථාවේ නොගැළපෙන තැන් නිවැරදි කරන්න රජයට හැකියාව තිබුණා. 19 ගැළපෙන්නේ නැත්නම් එය ගැළපෙන විදිය වෙනස් කරන්නට හැකියාව තියෙන බව අපි රජයට අවධාරණය කරනවා. මේ ක්‍රියාදාමය සිදු නොකර 19 සම්පූර්ණයෙන්ම ඉවත් කරලා 20 ගෙන ඒම නිවැරදි ක්‍රියාමාර්ගයක් නොවෙයි. 19 තුළ සාධනීය කාරණා ගන්න තිබුණා කියන එක අපි අවධාරණය කරනවා.

ජනාධිපති පාර්ලිමේන්තුවට වගකියන්න ඕන නෑ කියන්නේ ලොකු අර්බුදයක්. පාර්ලිමේන්තුව පත්කරන්නේ මේ රටේ එක්කෝටි හැටලක්ෂයක ජනතාවගේ ඡන්දයෙන්. එහෙත් මේ සංශෝධනය මගින් ජනාධිපතිට බලතල දෙනවා. අවුරුද්දෙන් පාර්ලිමේන්තුව විසිරුවා හරින්න.

ජනතාව පත්කරන මන්ත්‍රීවරු 225 දෙනකු එක රැයකින් ගෙදර යවන එක ප්‍රජාතන්ත්‍රවාදයට ගැළපෙනවාද කියලා අපි රජයෙන් අහන්න කැමතියි.

19 ය මගින් අපි කැබිනට් මණ්ඩලය ඇතුළු ඇමතිකම් සීමා කිරීමට පියවර ගත්තා. ඇමතිවරු වැඩි වශයෙන් පත් කරාට ජනතා මුදල් වැඩිපුර නාස්ති වෙනවා. අපි මේ තත්වය වෙනස් කිරීමට ඇමැති මණ්ඩලය අඩු කළා. 20 වෙනි සංශෝධනය තුළින් මේ තත්වය වෙනස් වෙනවා. විශේෂයෙන් ම ජනාධිපතිවරයාට අවශ්‍ය ගණනක් ඇමතිවරු පත් කිරීමට හැකි වෙනවා.

කොමිෂන් රැසක් මේ යටතේ අහෝසි වෙනවා. මෙය ඉතා භයානක තත්වයක් බව අපි ජනතාවට ප්‍රකාශ කරන්නට කැමතියි.

● **පාර්ලිමේන්තුවට ගෙන එන 20 වෙනි සංශෝධනය සම්මත කර ගැනීමට තුනෙන් දෙකක බලයක් අවශ්‍යයි. රජයට දැනටමත් එම බලය ඇති බව ප්‍රකාශ වෙනවා. මේ අභියෝගය ඔබලාට ජය ගත හැකිද?**

වර්තමාන රජයට පාර්ලිමේන්තුව තුළ කිසිසේත් තුනෙන් දෙකක බලය හිමි කර ගන්න බෑ කියන කාරණය අපි පැහැදිලිව කියන්නට ඕන. පාර්ලිමේන්තුවේ විපක්ෂය මෙන්ම ආණ්ඩු පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරු රැසක් ම මෙයට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කරන බවට අප සමඟ සාකච්ඡා වට කිහිපයක්ම පවත්වා තිබෙනවා. මෙන්න මේ හේතුව නිසා තමයි මහින්දානන්ද ඇමතිවරයා පාර්ලිමේන්තුවේදි ප්‍රකාශ කළා ඔවුන් විපක්ෂයේ මන්ත්‍රීවරු විසිදෙනකු ගන්නා බව. නමුත් අපි කියනවා ආණ්ඩු පක්ෂයේ තිහකට වැඩි මන්ත්‍රීවරුන් පිරිසක් මෙයට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කරනවා කියලා. ඔවුන් ඡන්ද නොදී මඟ අරින බව ප්‍රකාශ කර තිබෙනවා.

● **සුළු පක්ෂ නායකයන් සන්ධානය වීමක් පිළිබඳව දිගින් දිගටම ප්‍රකාශ කරනවා. ඔබලා ඒ සඳහා කැමැත්තක් නැද්ද?**

නෑ. එහෙම නෑ. අපි පක්ෂ කිහිපයක සාමාජිකයන් මෙන්ම ප්‍රබල පක්ෂ එකතුවෙලා තමයි මැතිවරණයට තරග වැදුණේ. ඇත්තටම අපි සමගි ජන බලවේගය හැටියට තනි පක්ෂයක්. මැතිවරණයට තරග කරපු පක්ෂය. නමුත් තව දින කිහිපයකින් එය සමගි ජන බල සන්ධානය බවට පත්වෙනවා. ඒ නිසා ඉදිරියේදි ගැටලු සහගත තත්වයක් ඇති වන්නේ නැහැ.

● **ඔබ පාර්ශ්වයට සම්බන්ධ වෙලා පාර්ලිමේන්තුව නියෝජනය කරන රාවුෆ් හකීම්, රිෂාඩ් බදුර්දීන් ඇතුළු කිහිපදෙනකු සමගි ජන බලවේගයෙන් ඉවත් වන බවට ප්‍රචාරය වී තිබෙනවා. මෙය ඇත්තක් ද?**

දැනට එහෙම කිසිදු තත්වයක් ගොඩනැගිලා නැහැ. අපිට විරුද්ධවාදීන් කියන කතා. ප්‍රචාරයෙන් ගැටලුවක් නෑ. කියන එක අප අවධාරණය කර සිටිනවා.

බදුර්දීන් මන්ත්‍රීවරයා හකීම් මන්ත්‍රීවරයා මෙන්ම අනෙක් පක්ෂ නායකයන් අප සමඟ ඉතා සමීපව කටයුතු සිදු කරගෙන යනවා. සමගි සන්ධානයේ සාමාජිකයන් හැටියට ඔවුන් ක්‍රියාශීලීව වැඩ කටයුතු කරගෙන යනවා.

● **එක්සත් ජාතික පක්ෂයට නව නියෝජ්‍ය නායකයෙකු පත්ව සිටිනවා. ඔබ කණ්ඩායම මේ සම්බන්ධව සැහීමකට පත්වනවාද?**

ඇත්තටම රුවන් විජේවර්ධන මහතා ඉතා දක්ෂ තරුණ නායකයෙක්. ඔහුට හොඳ දැක්මක් තිබෙනවා. ඔහු අවංක නායකයෙක්. එහෙත් එක්සත් ජාතික පක්ෂයේ වර්තමාන නායකයා රනිල් වික්‍රමසිංහ මහතා. ඔහු තවත් මාස හතරක් ඉන්නවා. අපිට පෙනී යන කරුණ නම් රනිල් වික්‍රමසිංහ මහතා විසින් සෙසු නායකයන් රූකඩ මෙන් නටවන බවයි.

● **එක්සත් ජාතික පක්ෂයේ නව නියෝජ්‍ය නායකයා ප්‍රකාශ කර තිබෙනවා. ඔහු සමගි ජන බලවේගය සමඟ ඉදිරියේදි කටයුතු කිරීමට කැමැති බව මේ පිළිබඳව ඔබලාගේ පිළිතුර?**

ඇත්තටම රුවන් විජේවර්ධන මහතා විශ්වාස කළ හැකි වැදගත් මහත්මයෙක්. අපි විශ්වාස කරනවා එක්සත් ජාතික පක්ෂයට සමගි ජන සන්ධානය සමඟ ඉදිරියේදි එකතු විය හැකියි. ඒ සඳහා කිසිඳු බාධාවක් නැහැ. හෙළ උරුමය, මුස්ලිම් කොංග්‍රසය වැනි පක්ෂ අප සමඟ සම්බන්ධ වී සිටින ආකාරයටම ඔවුන්ට අප සමඟ සම්බන්ධ විය හැකියි.

විශේෂයෙන්ම මේ පක්ෂයේ නායකයන් රැසක්ම අප සමඟ ඉතා සමීපව වැඩ කළ දක්ෂ නායකයන්. ඔවුන්ව ඔය තත්වයට පත් කළේ කිහිපදෙනකු පමණයි. ඒ රනිල් වික්‍රමසිංහ මහතා සමඟ සම්බන්ධ වෙලා. මෙය තේරුම් ගත් නිසා අපි පක්ෂයෙන් ඉවත් වෙලා සජිත් ප්‍රේමදාස නායකයා සමඟ ආරම්භ කළ අලුත් ගමන සාර්ථක වෙලා තිබෙන බව මහමැතිවරණ ඡන්ද ප්‍රතිඵලයෙන් මනාවට පෙන්නුම් කරන කරුණක් බව මා මේ මොහොතේ අවධාරණය කරන්නට කැමතියි.

● **සමගි ජන බලවේගයේ නායකත්වය වෙනුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කිහිපදෙනකුම සටන් කරනවා කියන්නේ ඇත්තක්ද?**

එය මා සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරනවා. අපගේ විරුද්ධවාදීන් විසින් නිර්මාණය කරන දේවල්. මේවාට අපි උත්තර දිය යුතු නැහැ. මොකද අපි මේ වන විට සාර්ථක ගමනක් යමින් සිටිනවා.

සමගි ජන බලවේගය තුළ නායකත්වයට කිසිඳු ගැටලුවක් නැහැ. එහි නායකත්වය දරන්නේ සජිත් ප්‍රේමදාස මහතා. ඔහුට අපි සියලු දෙනාගේ ආශිර්වාදය ලැබිලා තිබෙනවා. ලබා දී තිබෙනවා. ඉදිරියටත් ලබාදෙන්න කටයුතු කරනවා. අනික ඔහු නායකයා ලෙස අපි සියලු දෙනාගේ කැමැත්තෙන් පත් කරලා අවසන්. නැවත නායකයෙක් දැනට අවශ්‍ය නැහැ. අපි ඔහු අගමැති කරන සටන ජනාධිපති කරන සටන දැනටමත් ආරම්භ කර හමාරයි. අප සමඟ සිටින සෙසු නායකයන් ඔහුව පිළිඅරන් තිබෙනවා.

● **මේ රටට පළාත් සභා අවශ්‍යද? නැද්ද?**

පළාත් සභා මේ රටට අවශ්‍යයි. ඒ නිසා පළාත් සභා මැතිවරණය ඉක්මණින් පැවැත්විය යුතුයි.පළාත් සභා ඇති කර තිබෙන්නේ මේ රටට අවශ්‍ය නිසා බව මා මතක් කරන්නට කැමතියි. මේ රටේ පැවැති ජනවාර්ගික අර්බුදයට ලබාදුන්න ස්ථිර විසඳුමක් හැටියට පළාත් සභා ක්‍රමය හඳුන්වා දෙන්නට පුළුවන්. පළාත් සභා පවත්වනවාද නැද්ද යන්න ආණ්ඩුවේ කාරණයක්. ඒ නිසා ආණ්ඩුව මේ පිළිබඳව පිළිතුරක් ඉතා ඉක්මණින් ලබා දිය යුතුයි.

පළාත් සභා මැතිවරණයට අප මුළු ලංකාවම නියෝජනය කරමින් ඉදිරිපත් වනවා. ස්ථිර වශයෙන් අපිට මෙහිදී ජයග්‍රහණය ලබා ගත හැකි බවත් අපි අවධාරණය කර සිටිනවා.

● **20 ට එරෙහිව ජනතා විරෝධතා රැල්ලක් ඇති කරන බව විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා ප්‍රකාශ කර තිබෙනවා. කොහොමද මේ රැල්ල ඇති කරන්නේ?**

ජනතා නියෝජනයක් හැටියට අපි දැනටමත් 20 ට විරුද්ධව ක්‍රියාමාර්ග රැසක් ගෙන තිබෙනවා. ජනතාවගේ අයිතිය විනාශ වෙන්න යන මෙම සංශෝධනය හකුලා ගන්නා තුරු අපි විරෝධතා රැල්ලක් ක්‍රියාත්මක කරනවා. ජාතික මට්ටමින්, පළාත් මට්ටමින් ප්‍රාදේශීය මට්ටමින් මෙන්ම ගම් මට්ටමින් ඉදිරියේදි මේ සඳහා ජනතාව පෙළ ගස්සනවා.

# 'තුන එක වුණත් අපේ වැඩේ අපි කරනවා'



ජාතික ජනබලවේගයේ ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී විජිත හේරත්

● **භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්**

● **ජනතා විමුක්ති පෙරමුණ 20 වැනි සංශෝධනය එපා කියන්නේ ඇයි?**

ජේ.ආර්. ජයවර්ධන 78 ව්‍යවස්ථාව ගෙන ආවේ කොල්ලකාරී ආර්ථිකය බලහත්කාරයෙන් ජනතාවට පටවන්න. පසුගිය කාලයේ එය අසාර්ථක වුණා. ලංකාවේ පමණක් නොවෙයි එය මුළු ලෝකය පුරාවටම අසාර්ථක වුණා. ඒ තත්ත්වය ලංකාව තුළත් අපි දැක්කා. නැවත එවැන්නක් තමයි සිද්ධ වෙන්න යන්නේ.

මේ රටේ ණය ආර්ථිකයට කඩා වැටී ඇති ආර්ථිකයට උත්තරයක් නැහැ. මෙන්න මේ නිසා බලහත්කාරය පාවිච්චි කරන්න සිද්ධ වෙනවා. බලහත්කාරය පාවිච්චි කරන්න නීතියක් ඕන වෙනවා. අන්න ඒ අර්ථයෙන් තමයි නැවත ඒකාධිපති ව්‍යවස්ථාවක් ඕන වෙලා තියෙන්නේ. 20 වැනි සංශෝධනය අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය මළගමකට යාමක් හැටියට පෙන්වා දිය හැකියි.

මෙය ඇත්තටම ඒකාධිපති පාලනයක් සඳහා යාමක්. එක් පුද්ගලයෙකුට බලය පැවරීමට මේ රටේ ජනතාව කැමැති නැහැ. මොකද ප්‍රජාතන්ත්‍රවාදයට තමයි ජනතාව කැමැති. එය ලෝකයේ ඕනෑම රටකට පොදු කාරණයක්. මෙන්න මේ කාරණාවලට ජනතාව කැමැති නෑ කියන එක අපි දන්නවා. මේ අර්ථය නිසා තමයි අපි විසිවෙනි සංශෝධනයට අකමැති වගේම විරුද්ධවන්නේ. මේ මගින් කිසිසේත්ම රටට යහපතක් නොවන බව අපි ජනතාවට වගකීමෙන් යුතුව කියන්න කැමැතියි.

● **ඔබ කෙසේ කීවත් රජය ප්‍රකාශ කර සිටින්නේ ජනතාව තමන්ට තුනෙන් දෙකක බලයක් ලබාදී තිබෙන්නේ ව්‍යවස්ථා සංශෝධනය සඳහා බවයි. පාර්ලිමේන්තු තුළ මෙම පනත ජයගන්න බැරිවෙයි කියල ඔබ විශ්වාස කරනවාද?**

ජනතාවට තුනෙන් දෙකක බලයක් දුන්නේ ජනතාවගේ බඩ ගින්න, විරැකියාව වගේ ම අන්ත අසරණකම ආර්ථික අපහසුකම් නිසායි.

ඒ වගේම අධ්‍යාපන සෞඛ්‍ය වගේම ආරක්ෂාව සපයන්න. තනි පුද්ගලයෙකුට ලබාදුන් බලයක් නොවෙයි. එක කඳවුරක එක හවුලක බලය තහවුරු කරන්න නොවෙයි. රටේ අභිලාෂය එකක් පවුලේ අභිලාෂය තව එකක්. දැන් මේ තිබෙන්නේ ජනතා අභිලාෂයට පයින් ගහලා පවුලේ අභිලාෂය ඉටු කර ගන්න දරන උත්සාහයක්.

පාර්ලිමේන්තුවේ ඔළු ගෙඩිවලින් මේක සම්මත කරගන්න පුළුවන් වෙයි. හැබැයි තව අවුරුද්දක් දෙකක් යන කොට මේකට ඡන්දය දීපු ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට තේරෙනවා තමන් ගත්තේ ලොකු වැරැද්දක් කියලා. රටේ ජනතාවටත් තේරෙනවා මේක බරපතළ අපරාධයක් කියලා.

● **ඔබ පවුලේ අභිලාෂය කියන එකෙන් අදහස් කරන්නේ කුමන පවුලක් ගැනද?**

වෙන පවුලක් ගැන නොවෙයි. රාජපක්ෂ පවුල ගැන. සංශෝධනයෙන් පසු බැසිල් රාජපක්ෂට හොඳ ඇමැතිකමක් ලබාදේවි. මොවුන් මේ උත්සහය ජනතාව ඉතා ඉක්මනින් හඳුනා ගන්නවා.

● **ඔබ රජයට චෝදනා කරනවා මේ ව්‍යවස්ථා සංශෝධනය ගෙන එන්නේ බැසිල් රාජපක්ෂ මහතා නැවත පාර්ලිමේන්තුවේ ගෙන එන්න කියලා කොහොමද එහෙම කියන්නේ.**

ඔව් පැහැදිලිවම අපි කියනවා. ද්විත්ව පුරවැසි භාවය කියන එක උසස් නිලධාරීන්ට පවා ලබා නොදිය යුතුයි කියලා.

අද තානාපති සේවයට ඇමෙරිකන් පුරවැසිභාවය තිබෙන අය පවා යනවා. ඇමෙරිකානු පුරවැසිභාවය කියන්නේ ඇමෙරිකාවේ පුරවැසිභාවය වෙනුවෙන් ඇමෙරිකාවේ සිටින පුද්ගලයන් ඕනෑම දෙයක් කරනවා. එලෙසම ඔවුන් ඇමෙරිකාව වෙනුවෙන් ඕනෑම දෙයක් සිදු කරනවා. මොකද ඒ වෙනුවෙන් දිවුරුම් දීලා ඉන්නේ.

● **කෝප් කමිටුවට සභාපති තෝරා ගැනීමේදී මෙතෙක් ඉතිහාස වෙනස් කරමින් ආණ්ඩු පක්ෂයට ලබාදී තිබෙනවා. එය ඔබලාගේ පක්ෂය දැඩි විවේචනයක් එල්ල කරනවා. අපි මාධ්‍ය තුළින් දුටුවා. ඇයි එලෙස විරුද්ධ වන්නේ?**

මේ ආණ්ඩුව සම්පූර්ණයෙන් ම යන්නේ ඒකමතික තීරණ ගනිමින්. රටේ ජනතාවට කෝප් කමිටු තීරණ දැනගත යුතුයි. රජය අද ජනතාවට එය ද නැති කරලා.

ඇත්තටම ඉතිහාසය පුරාවටම මේකේ සභාපතිකම දුන්නේ විපක්ෂයේ මන්ත්‍රීවරයෙකුට. අද එය ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙකුට දීලා.

කුමන ආණ්ඩුවක් තිබුණත් ඒ ආණ්ඩුව සිදු කරන මූල්‍ය වංචා මුර බල්ලෙකු වගේ ක්‍රියා කරමින් පරික්ෂා කරන්න කෝප් කමිටුවට හැකියාවක් තිබුණා. අද එය ආණ්ඩු පක්ෂයටම ලබාදීලා. මේ තුළින් පෙන්නුම් කරන්නේ ආණ්ඩුව තමන්ගේ වැරදි වහගන්න කෝප් කමිටුවට තමන්ගේ ම කෙනෙක් සභාපති කර තිබෙනවා.

අනෙක් කාරණය තමයි මෙතෙක් කල් කෝප් කමිටුව මාධ්‍යයට විවෘතව තිබුණා. මින් ඉදිරියට එය මාධ්‍යයට ලබා නොදෙන්න ආණ්ඩුව තීරණය කරලා තිබෙනවා.

මින් ඉතා පැහැදිලි කාරණයක් ලෙස පෙන්වාදිය හැක්කේ රජයට අවශ්‍යවෙලා තිබෙන්නේ වුවමනා වෙලා තිබෙන්නේ මූල්‍ය වංචා මෙන් ම අකටයුතුකම් සිදු කිරීමයි කියන එක. ජනතාව මේ පිළිබඳව දැන ගැනීම නතර කරන්න තමයි මාධ්‍යයට බාධා එල්ල කර තිබෙන්නේ.

● **පාර්ලිමේන්තුව තුළ මන්ත්‍රී ආසන තුනක් තිබෙන ජනතා විමුක්ති පෙරමුණට කිසිම දෙයක් පාර්ලිමේන්තුව තුළ කළ නොහැකි බව මාධ්‍යයෙන් අසන්නට ලැබෙනවා. මේ පිළිබඳව ඔබගේ අදහස?**

ජනතාව ජනතා විමුක්ති පෙරමුණ කෙරෙහි තැබූ විශ්වාසය කිසිම අඩුවක් වෙලා නැහැ. ඔවුන් ජනතා විමුක්ති පෙරමුණ අයුක්තියට අසාධාරණයට විරුද්ධව දිගින් දිගටම හඬ නඟන බව පෙනී සිටින බව දන්නවා.

පාර්ලිමේන්තු මන්ත්‍රී ධුර ගණන තුනක් වුණත් එකක් වුණත් අපි අපගේ වගකීම ජනතාව වෙනුවෙන් ඉටු කරනවා කියන එක ජනතාව හොඳින් දන්නවා.

● **පළාත් සභා මැතිවරණය අවශ්‍ය බව එක් පිරිසකගේ මතයයි. තවත් පිරිසක් පළාත් සභා අවශ්‍ය නොවන බව කියනවා. ජනතා විමුක්ති පෙරමුණ මින් කුමන කණ්ඩායමේද?**

පළාත් සභා ක්‍රමය ගෙන එන්නේ මේ රටේ ජාතික ප්‍රශ්නයට විසඳුමක් ලබාදෙන බව කියමින් එහෙම විසඳුමක් ඉන් ලැබුණේ නැහැ. ජනතා විමුක්ති පෙරමුණ හැටියට අපි මේක ගෙන එන දවසේ ඉඳලා විරුද්ධයි. අදත් ඒ මතය එසේමයි.

**20වැනි සංශෝධනය අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය මළගමකට යාමක් හැටියට පෙන්වා දිය හැකියි**

දැන් තිබෙන තත්ත්වය ස්ථිර නෑ. ඇමැතිවරු ඔවුන්ගේ මතය ප්‍රකාශ කරනවා විතරයි. ආණ්ඩුව කියන්න ඕන පළාත් සභා මැතිවරණය පවත්වනවාද නැද්ද කියන කාරණය.

● **අලුත් මුහුණු අසූ එකක් මෙවර පාර්ලිමේන්තුවට පැමිණිලා තිබෙනවා. මේ පිළිබඳව ඔබලාගේ අදහස?**

ලොකු වෙනසක් නෑ. අලුත් මුහුණු කියලා මේ අසූ එක්දෙනා අතර වැඩි දෙනකු මූල්‍ය වංචාකරුවන්, නොයෙක් දූෂණ චෝදනා එල්ල වුණ අපරාධකාරයන් තමයි පාර්ලිමේන්තුවට තේරීපත්ව සිටින්නේ.

කප්පම් කරුවන්, දූෂිතයන්, බාර් ලයිසන් තිබෙන පුද්ගලයන් මේ ඔක්කොම අලුතෙන් ඇවිත් ඉන්නවා. ඒ අතරතුර එක් අයෙකු දෙදෙනකු ඔය කියන හොඳ අය අතරට ඉන්නවා.



## දියෙස්පෝරාව
DIASPORA
නීතිවේදී හසක රත්නමලල
කැනඩාවේ සිට ලියයි

# මහා ගමන, දිගු ගමන, පා ගමන, සහ නිකම්ම නිකම් ගමන

ලෝක ඉතිහාසයේ විවිධ ගමන් ගැන කියැවෙයි. මහා ගමන් , දිගු ගමන් , පා ගමන් ලෙස හැඳින්වූ මේ ගමන් හේතු කොටගෙන මිනිස් පැවතුම් පරිණාමයට ලක්විය, රටවල් නිර්මාණය විය, මානුෂීය ව්‍යාපාර බිහි විය.

මින් වඩාත්ම ප්‍රචලිත පා ගමන වන්නේ චීනයේ ජියැන්සි පළාතේ සිට ෂැන්සි පළාතේ යානාන් දක්වා 1934 ඔක්තෝබර් මාසයේ සිට 1935 ඔක්තෝබර් මාසය දක්වා කෙරුණු චීන කොමියුනිස්ට් පක්ෂයේ රතු හමුදාව විසින් සිදු කරන ලද දිගු ගමනය (Long March). ලෝක ඉතිහාසයේ දේශපාලන පසුබෑමකදී නායකත්වය ආරක්ෂා කරගනිමින් පක්ෂය රැක ගැනීම සඳහා කරන ලද විශිෂ්ට දේශපාලන උපක්‍රමයක් ලෙස මෙය හැඳින්විය හැකි අතර අවසානයේදී මෙම දිගු ගමන මාඕ සේතුංගේ බලයට පත්වීමේ ආරම්භය නිර්මාණය කළ අතර ඔහුට පක්ෂයේ සාමාජිකයන්ගේ සහාය මුද්‍රා තබා ගැනීමේ මාර්ගයක් බවටද එය පත්විය.

මින් අනතුරුව ලෝක ඉතිහාසයේ සනිටුවන් වන තවත් ප්‍රධාන ගමනක් වන්නේ March on Washington නමින් හැඳින්වෙන එක්සත් ජනපද ඉතිහාසයේ විශාලතම සිවිල් අයිතිවාසිකම් රැලියයි. මේ පාගමනේදී, මාටින් ලූතර් කිං සිය ආනුභාව සම්පන්න “මට සිහිනයක් තිබේ”(I have a dream) යන ලෝක ප්‍රසිද්ධ දේශනය පැවැත්වූ අතර, මිනිසුන්ව විනිශ්චය කළ යුත්තේ ඔවුන්ගේ සමේ වර්ණයෙන් නොව ඔවුන්ගේ චරිතයේ අන්තර්ගතයෙන් බවට කළ ප්‍රකාශය, අනතුරුව ඇමරිකානු මාධ්‍ය ඇතුළත බෙහෙවින් ප්‍රචලිත වූ අතර 1964 දී සිවිල් අයිතිවාසිකම් පනත සම්මත කර ගැනීම සඳහා එය මහත් උපකාරයක් විය.

ලෝක ඉතිහාසය තුළ ලියවුණු තවත් පා ගමනක් ලෙස ටෙරී ෆොක්ස් පා ගමන (Terry Fox Walk) එසේ නැතිනම් “බලාපොරොත්තුවේ ගමන” (Marathon of Hope) හැඳින්විය හැකිය.

මා දැනට ජීවත්වන විනිපෙග් නගරයේ උපත ලද ටෙරී ෆොක්ස් වයස අවුරුදු 18 දී පිළිකාවකට භාජනය විය. ඉන් ඔහුගේ දකුණු කකුල අහිමි වීමෙන් පසු ටෙරී ෆොක්ස් පිළිකා පර්යේෂණ සඳහා දැනුවත්භාවය සහ මුදල් එක් රැස් කිරීමේ අරමුණින් කැනඩාව පුරා ඇවිද යෑමට තීරණය කළේය.

ඔහු 1980 අප්‍රියෙල් 12 වැනි දින නිව්ෆවුන්ඩ්ලන්ඩ්හි ශාන්ත ජෝන්ස් නගරයෙන් පිටත් ව දින 143 කින් කිලෝමීටර් 5,373 ක් ආවරණය කරමින් සාමාන්‍යයෙන් දිනකට කිලෝමීටර 42ක් පමණ ගමන් කරමින් සිටියදී 1980 සැප්තැම්බර් 1 වැනි දින ඔන්ටේරියෝහි තන්ඩර් බේ නගරයෙන් පිටතදී පිළිකාව ඔහුගේ පෙණහලු ආක්‍රමණය කිරීම හේතුවෙන් ඔහුගේ 23 වැනි උපන්දිනයට මාසයකට පෙර ඔහුට සිය ජීවිත ගමන අවසන් කරන්නට සිදු විය.

අද කැනඩාවේ ජාතික වීරයකු ලෙස සැලකෙන ටෙරී ෆොක්ස්ගේ ගෞරවය පිණිස රට පුරා බොහෝ ගොඩනැගිලි, ප්‍රතිමා, මාර්ග සහ උද්‍යාන නම් කර තිබේ. ටෙරී ෆොක්ස් Order of Canada නම් වූ කැනඩාවේ විශිෂ්ටයනට පිදෙන ඉහළම සම්මානයෙන් පිදුම් ලද ලාබාලම පුද්ගලයා වීමට අමතරව, ෆොක්ස් 1980 ලූ මාෂ් සම්මානය ජාතියේ ඉහළ ම ක්‍රීඩකයා ලෙස දිනාගත් අතර 1980 සහ 1981 යන දෙවර්ෂයේම කැනඩාවේ වසරේ ප්‍රවෘත්ති සම්පාදකයා ලෙස නම් කරන ලදී. අදත් පිළිකා නිවාරණය සඳහා අරමුදල් එක රැස් කිරීමේ අරමුණින් ලොවපුරා විවිධ සංවිධානයන් මගින් ටෙරී ෆොක්ස් පා ගමන් සංවිධානය කරති.

උක්ත විශිෂ්ටයන්ගේ අතිවිශිෂ්ට ක්‍රියාකාරකම් සැහැල්ලුවට ලක් කරමින් සිය ගිලිහෙමින් පවතින ජනප්‍රියත්වය නැවත උරගා බැලීම සඳහා එකිනෙකා පරයන උත්සාහයක යෙදෙමින් සිටින ත්‍රස්තවාදීන්ට අරමුදල් එකතු කිරීම සඳහා කැනඩාවට පැමිණ, මහා ධන කුවේරයන් බවට පත්ව සිටින එල්ටීටීඊ දියෙස්පෝරාවේ අතළොස්ස ද සිය අලුත්ම උපක්‍රමය ලෙස පාගමන යොදා ගැනීමට ගත් උත්සාහයක් පසුගිය සතියේදී වාර්තා වුණු අතර එය සම්පූර්ණයෙන්ම අසාර්ථක ව්‍යායාමයක් බවට පත්විය.

මුලින්ම නෝර්වේ සිට ක්‍රියාත්මක වන නෙදියවන් කණ්ඩායමේ කැනේඩියානු නියෝජිත කණ්ඩායම වන එන්.ටී.ටී.සී කල්ලියේ පස්දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් ටොරන්ටෝ සිට ඔටාවා අගනුවර දක්වා ගමන් කිරීම ආරම්භ කළ අතර එයට ඉන්දීය රෝ ඒජන්තයන් වූ නාන් තමිලර් කණ්ඩායමේද සහය පළවී තිබුණි. එහෙත් කිසිදු ජනතා සහයක් නොලැබීමේ හේතුවෙන් ඔවුන් අතරමගදී අතුරුදහන් විය.

දින කිහිපයකින් අනතුරුව මාර්ගයට පිවිසියේ දෙමළ ඊලාම් අන්තර්ජාතික රජය (ටීජීටීඊ) යනුවෙන් හඳුන්වනු ලබන කල්ලියයි. කණ්ඩායම් දෙකක් ලෙස එකක් බ්‍රැම්ප්ටන් සිට ඔටාවා නුවර දක්වාද අනෙක් කණ්ඩායම මොන්ට්‍රියල් සිට ඔටාවා දක්වාද ගමන් කිරීමට නියමිත විය. මහාචාර්ය රොහාන් ගුණරත්න සිය Handbook of Terrorism in Asia Pacific නම් ග්‍රන්ථයේ සඳහන් කරන පරිදි එල්ටීටීඊයේ පෙරටු සංවිධානයක් වන ටීජීටීඊ කල්ලිය සහ එන්ටීසීසී කල්ලිය කැනඩාව තුළ ප්‍රමුඛයා වීමේ අභ්‍යන්තර ගැටුමක පැටලී සිටින මොහොතක සිය ආධිපත්‍ය තහවුරු කිරීම සඳහා වූ ව්‍යායාමයක් ලෙස ද මෙම පාගමන හැඳින්විය හැකිය. මෙම පාගමන් ව්‍යාපෘතිය ඔටාවා දක්වා වරෙක පා ගමනින් ද වරෙක වාහන හතරකද නැඟ දොළොස්වෙනි සෙනසුරාදා ඔටාවා නුවරට ළඟා වුවද බලාපොරොත්තුවූ මහා ජන ගඟ නැතිවීම නිසා දින දෙකක විවේකයකින් පසු දහ හතර වෙනි සඳුදා ඔටාවා නුවර පාර්ලිමේන්තු ක්‍රීඩාංගණයේ සියකගේ පමණ රැලියකින් අවසන් විය.

රැලියට පෙර ටෝරන්ටෝවේ එල්ටීටීඊයට පක්ෂ මාධ්‍ය මගින් දිගින් දිගටම ප්‍රචාරය වූ කරුණක් වූයේ පවතින ලිබරල් රජයේ අග්‍රාමාත්‍ය ජස්ටින් ට්‍රූඩෝ සමඟ අමාත්‍යවරු තුන්දෙනෙකු මෙම පාගමන් කරුවන්ගේ ඉල්ලීම් ඇතුළත් ලිපිය ලබා ගැනීමට රැලියට පැමිණෙන වගකි. එහෙත් රැලියට පැමිණි එකම දේශපාලකයා වූයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ගැරී ආනන්දසංගරී පමණි. ඔහු කාලයක සිට එල්ටීටීඊ බෙදුම්වාදී වේදිකාවල කථිකයකු වීම නිසා එහි ඇති විශේෂත්වයක් නොවීය. වෙනදා මෙන් ලිබරල් රජය නියෝජනය කරමින් කිසිවකු රැලිය ඇමතීමට නොපැමිණීම, බලාපොරොත්තුවූ පරිදි ප්‍රධාන මධ්‍ය මගින් කිසිදු මාධ්‍ය ආවරණයක් නොකිරීම සහ ජනතා සහභාගිත්වයක් නැතිවීම යනාදී හේතු මත මෙම පා ගමන නිකම්ම නිකම් ගමනක් බවට පත්වී තිබුණි.

ඔබගේ අදහස් යොමු කරන්න:
sldiasporatalks@gmail.com

# වැලපෙන මිහිකතට සැනසුම් සුසුමක්

● රසික කොටුදුරගේ

**සිංහරාජය, හන්තාන, නකල්ස්, වනාතවිල්ලුව සහ ආනවිලුන්දාව ආදී වනාන්තර ආරක්ෂා කිරීමට හා කළමනාකරණය සම්බන්ධයෙන් රජය විසින් ක්‍රියාත්මක වැඩ පිළිවෙළ විවිධ පාර්ශ්ව විසින් ඇගයුමට මෙන්ම දෝෂ දර්ශනයට ලක්කරනු අසන්නට දකින්නට ලැබේ. මේ පිළිබඳව තුලනාත්මකව විමර්ශනය කිරීම මෙම වියමනේ අරමුණ වේ.**



ආදී මානවයා කැලයෙන් එළියට ආවේ සංස්කෘතික වශයෙන් පරිණාමය වූ නිසාය. එහිදී තම පැවැත්මට සමගාමීව පරිසරය වෙනස් කිරීමට මානවයා කටයුතු කළේය. දඩයම් යුගයෙන් කෘෂිකාර්මික යුගයටත් අනතුරුව කාර්මික යුගයටත් පා තැබූ මානවයා ස්වභාවික පරිසරය ද ඊට අනුරූපව වෙනස් කර ගත්තේය.

මානවයා හා පරිසරය සම්බන්ධයෙන් කතා කිරීමේ දී මානව පරිණාමීය අවධීන් දෙකක් අපට හමු වේ. එනම්, අක්‍රීය ශිෂ්ටාචාරය (Porssive Civilization) සහ ක්‍රියාකාරී ශිෂ්ටාචාරය (Active Civilization) වශයෙනි. අක්‍රීය ශිෂ්ටාචාරය (Porssive Civilization) ලෙස හඳුන්වන්නේ පරිසරයට බලපෑම් නොකර, පරිසරයට එරෙහි නොවී ඒ හා සහයෝගයෙන් කටයුතු කළ මානව සමාජයයි. 'ගෝත්‍රිකයන්' ලෙස හඳුන්වනු ලබන මේ ජනකොට්ඨාසය අවුරුදු දහස් ගණනක් ඉක්ම ගිය ද සිය මූලික ගතිපැවතුම් වෙනස් නොකර සත්තුන් මෙන් පරිසරයට ම ඇදුණ ජනකොටසක් (සෙන්ටිනෙල්ස් - Sentinelese ගෝත්‍රිකයින් වැනි) ලෙස දිවි ගෙවති.



ක්‍රියාකාරී ශිෂ්ටාචාරය (Active Civilization) ලෙස අප හඳුන්වන්නේ, පරිසරය සමඟ ගැටෙමින්, එය වෙනස් කරමින් සිය අවශ්‍යතානුකූල ව පරිසරය වෙනස් කළ ජනකොට්ඨාසය යි. නූතන මානව ශිෂ්ටාචාරය ලෙස අප හඳුනා ගත්තේ එයයි. මේ අනුව ඕනෑම මානව ශිෂ්ටාචාරයක් පරිණාමය වන්නේ මෙකී ලක්ෂණ මූලික කරගෙන ය.

මෙම පරිණාමීය ක්‍රියාවලිය තුළ අපේ ඉතිහාසය ස්ථානගත කළහොත් එවකට ලෝකයේ පැවති අනෙකුත් ශිෂ්ටාචාරවලට සමගාමීව තාක්ෂණය, කෘෂිකර්මය, කලා නිර්මාණශීලීත්වය අතින් පරිපූර්ණ ශිෂ්ටාචාරයකට උරුමකම් කී බව නොරහසකි. ගෘහ නිර්මාණ ශිල්පය, වාරි කර්මාන්තය, ශෛලමය නිර්මාණ, වාතේ කර්මාන්තය, ඇත් දළ සහ ලීකැටයම්, අත්කම් නිර්මාණ... ආදීය ඊට සාක්ෂිය. මේ නිර්මාණ අතර අනුරාධපුරය, පොළොන්නරුව, සීගිරිය, යාපහුව්ව, ආදී ස්ථානයන් හී නිමවා ඇති ශෛලමය නිර්මාණ හා චෛත්‍ය ප්‍රධාන තැනක් ගනී. අද අප ආඩම්බරයෙන් කතා කරන මෙකී සියලු නිර්මාණ සිදු කර ඇත්තේ ස්වභාවික පරිසරය මනාව කළමනාකරණය කිරීමෙනි.





වත්මන් ආණ්ඩුව බලයට පැමිණියේ මෙකී ඓතිහාසිකව අපට උරුම වූ සංස්කෘතික භූමිකාව ඉටු කිරීමටය. ජනාධිපතිවරණයේදී ගෝඨාභය රාජපක්ෂයන් විසින් ජනගත කළ “සෞභාග්‍යයේ දැක්ම” මෙරට 69 ලක්ෂයක් වූ ජනතාව විසින් අනුමත කර ඔහු ජනාධිපතිවරයා වශයෙන් පත් කළ අතර, මෙම ප්‍රතිපත්ති ප්‍රකාශනය ක්‍රියාත්මක කිරීම සඳහා 3/2 බලයක් ලබාදෙමින් ආණ්ඩුවක් ද ලබා දුන්නේය.

ශ්‍රී ලංකාවෙ ඉඩම්වලින් 80%ට වඩා ඇත්තේ රජය සතුවය. ඉතිරි ප්‍රමාණය ඇත්තේ පෞද්ගලික අංශය සතුවය. රජය සතු මෙම භූමි ප්‍රමාණය කොටස් තුනකට බෙදා දැක්විය හැකිය. ජාතික රක්ෂිත, අභයභූමි, කළමනාකරණ රක්ෂිත (වන අලි)

යම් වනාන්තර ප්‍රදේශයක් ජාතික රක්ෂිතයක් (National Reserve) ලෙස නම් කිරීමට නම් අදාළ ප්‍රදේශවල ඇති ඉඩකඩම් සියල්ල රජයට පවරා ගත යුතුය. ඒ අනුව සකස් වූ රක්ෂිත වනාන්තර ආරක්ෂිත කලාපයකි. රක්ෂිත වනාන්තරයකට කෙනකුට ඇතුළු විය හැකිකේ විද්‍යාත්මක පර්යේෂණ ගවේෂණ සහ අධ්‍යයන සඳහා පමණි. එයද කළ හැක්කේ රජයේ අනුමත අධ්‍යාපනික ආයතනයකින් හෝ විධිමත් අධ්‍යයනයක් බව කරුණු දැක්වීමෙන් අනතුරුවය. වනාන්තරය තුළට ශාක හා සත්වයන් රැගෙන යෑමට නොහැකි සේම ඒ තුළින් කිසිවකුට සත්ත්ව හෝ ශාක කොටස් රැගෙන යා නොහැකිය. ඒ තුළ ඉතාම සංයමයෙන් හා කල්පනා කාරීව කටයුතු කළ යුතුය. ගිනිකූරක්, ලයිටරයක් දැල්වීම පවා මේ නීතිරීති යටතේ තහනම්ය. අපට හමුවන්නේ තාවකාලික නැරඹුම් සහතිකයක් පමණි. ලංකාවේ මේ වන විට ජාතික රක්ෂිතයන් හතක් පවත්වාගෙන යයි. දැඩි ස්වාභාවික රක්ෂිත හෙවත් තහනම් අඩවි (Strict Natural Reserve), ජාතික වනෝද්‍යාන (National parks), ස්වාභාවික රක්ෂිත (Nature reserves), වන පිවිසුම් (Jungle corridors), ආරක්ෂිත ස්ථාන (Refuges), සමුද්‍රීය රක්ෂිත ප්‍රදේශ (Marine reserves), සීමාන්තරික (පරිවාරක) කලාප (Buffer zones) යනු මේ රක්ෂිතය.

ආණ්ඩුව සිංහරාජය මැදින් පාරක් සෑදීම නිසා පරිසරවේදීන් බොහෝදෙනා කලකිරී ඇති බවක් ඔවුන් විසින් සිදු කරමින් තිබෙන ප්‍රකාශවලින් ගම්‍ය වේ. ඕනෑම දෙයක් දෙස සැකයෙන් බලන කල එය ඊට අනුරූපව පෙනී යාම සාමාන්‍ය තත්ත්වයකි. නමුත් ආණ්ඩුව කියන පරිදි ලංකාගමට පාර කැපෙන්නේ තනිකරම එහි ගම් වැසියන්ගේ ඉල්ලීම අනුවය. නමුත් මේ සම්බන්ධයෙන් සැක පහල කරන පරිසරවේදීන් කුමන හේතුවකට පාර කැපුවත් එමගින් සිංහරාජයේ විනාශය සිදුවන බව කියති. මේ අදහස සම්පූර්ණයෙන්ම නොසලකා හැරිය හැකි නොවේ. කාපට් කර පාරක් නිමැවෙනවා යනු නාගරික පරිසරයකට හා ජනාවාසකරණයට මඟ විවර වීමකි. ලෝක උරුමයක් බවට පත් ව ඇති වනාන්තරයක් අසලින් කාපට් පාරක් තනා දුන් පසු මෙහි වෙසෙන ජනයා මායිම ආරක්ෂා කරාවිය යන්න කිසිසේත්ම පිළිගත නොහැකිය. මන්ද යත් විල්පත්තුව මැදින් පාර ඉදි වූ පසුව සිදු වූ විනාශය කවුරුත් පාහේ දනිති. එනිසා පරිසරවේදීන්ගේ සැකයට ප්‍රමාණවත් හේතු තිබේ. නැත්තේ ඔවුන්ගේ සැක සංකා දුරු කළ හැකි හේතු සාධකය.



සමහරුන්ගේ තර්කය වන්නේ ලංකාගම තිබෙන තැනින් එළියට ගෙන ප්‍රතිස්ථානගත කළ යුතු බවය. එහිදී මේ ගැමියන්ගෙන් බහුතරයක් දෙනා තම පැවැත්ම උදෙසා වනාන්තරය හා බැඳී ජීවනෝපයන්ට හුරුවී සිටිති. ඒක් අතකින් ඔවුන් එතනින් ඉවත් කිරීම ඔවුන්ගේ ජීවනෝපාය අනතුරේ හෙළීමකි. එසේ නම් ඒ සඳහාද විකල් ක්‍රියාමාර්ග ගැනීමට ආණ්ඩුවට සිදු වේ. එසේම තමන් විසින් භුක්ති විඳින ප්‍රමාණය පුළුල් කළ නොහැකි පරිදි නීති ගෙන ආ යුතුය. නමුත් ඇති වී තිබෙන නව තත්ත්වය උඩ, එනම් සියලු නාගරික අවශ්‍යතා වනාන්තරය අද්දර සිටම භුක්ති විඳීමේ උන්නතිකාමී ආශාවන්ගෙන් මඩින ලද මනස් සහිත ගැමියන් පිරිසක් විසින් ගමේ සමාජ දේශපාලනය හසුරුවන තත්ත්වයක් උඩ ඔවුන්ගේ සියලු ඉල්ලීම් සන්තර්පණය කරමින් ඔවුන්ව මේ සිටින තැනම රැඳවීම කළ හැකිද යන්නය. ආණ්ඩුව උපාය මාර්ග තීරණය කළ යුත්තේ මේ ප්‍රයෝගික සත්‍ය කල්පනාවට ගනිමිනි. එමෙන්ම එම උපායමාර්ග අවංකව චේතනාවෙන් එනම් සිංහරාජ වැසි වනාන්තරයේ වටිනාකම මනාව අවබෝධ කරගෙන කළ යුතුය. සත්‍ය ලෙසම එය වනාන්තරය සංරක්ෂණය කිරීමක් විය යුතුය.

ඒ සඳහා ආණ්ඩුව පළමුව කළ යුත්තේ සිංහරාජය අවට ඇති රක්ෂිත සීමාව ශක්තිමත් කිරීම ය. ඒ සඳහා එම සීමාව තුළ ඇති අනවසර වගා බිම් සහ ජනාවාස නීති ප්‍රකාරව ඉවත් කර, දැනට වෙනම රක්ෂිත ලෙස පවතින කුඩා වනාන්තර සියල්ල සිංහරාජයට එක්කිරීමය. එවිට සිංහරාජයේ වපසරිය එක රැයකින් තිබෙන ප්‍රමාණය මෙන් තුන් ගුණයක් දක්වා ඉහළ යනු ඇත. අනතුරුව දැනට නිර්දේශ කර ඉඩම් ප්‍රතිසංස්කරණ සභාව යටතේ ඇති සිංහරාජ වනාන්තර සීමාවට මායිම්ව ඇති ඉඩම් සියල්ලම සිංහරාජයට එක්කළ යුතුය. එයින් සිංහරාජයට තවත් හෙක්ටයාර තුන් දහසක් පමණ එකතු වේ. එවිට පරිසරවේදීන්ගේ හඬ වියැකී යනවා සේම සෞභාග්‍ය දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් 30% දක්වා වනාන්තරය වර්ධනය කිරීම යථාර්ථයක් බවට පත් වේ.

සිංහරාජය යනු ධන ආකරයකි. වඩාත් ආර්ථික වශයෙන් ලාභදායි වන්නේ සිංහරාජය හැකි තරම් පුළුල් කරමින් තව තවත් සංරක්ෂණය කිරීමය. ලොව අනර්ඝතම වැසි වනාන්තර අතළොස්ස අතරට වැටෙන සිංහරාජයේ පහස ලැබීමට ලොව වටා ඕනෑ තරම් ධනවත් සංචාරකයන් සැදී පැහැදී සිටිති. ආණ්ඩුව කළ යුත්තේ රටේ පොදු ජනයාට අයිතිය තහවුරු වන සේ මේ කලාපය තුළ නූතන පන්නයේ සංචාරක ආයෝජනයක් සිදු කිරීමය. ඉහත සඳහන් කෙරුණු අයුරින් දැනට තිබෙන සීමාවන් සහ අලුතෙන් අවශෝෂණය කරගෙන සීමා ශක්තිමත්ව තහවුරු කිරීමෙන් අනතුරුව කළ යුත්තේ ගැමියන්ගෙන් විශාල මිලක් දී ඉඩම් මිලදී ගැනීමය. මෙම ඉඩම් ශක්තිමත් කොන්දේසි යටතේ ආයෝජකයන්ට බදු දිය හැකිය. කිසිදු ලෙසකින්වත් නීති රෙගුලාසිවලට පිටින් වනාන්තරය පරිහරණය නොකරන බවට සහතික කෙරෙන විශේෂ නීතිමය කොන්දේසි මේ වෙනුවෙන් ඇති කළ හැකි අතර මෙසේ ලබා දෙන ඉඩම් තුළ ද වන වගා ඇති කොට ඒ ඇසුරින් “සුවිශේෂී සිංහරාජ වන අත්දැකීමක්” නිර්මාණය කළ හැකිය. මෙවැනි සංචාරක පැකේජයක් අති විශාල මුදලකට විකිණිය හැකිය. කොවිඩ් තත්ත්වය පහ වන විට අප මෙවැන්නකට යන්තමින් හෝ සූදානම් වී සිටියහොත් එය අති විශාල අනාගත ආර්ථික විභවයකට දොරගුළු විවර කිරීමකි. මේ ආකාරයටම හන්තාන, කිරින්ද, වනාතවිල්ලුව, ආනවිලුන්දුව හෝටන්තැන්න ආදී රක්ෂිත අනාගත නව ආර්ථික උත්පාදනය ආයෝජන බවට පත් කළ හැකිය.



ආණ්ඩුව විසින් ඉඩම් නිදහස් කිරීමේ ගැසට් පත්‍රය නිකුත් කිරීමට පියවර ගැනීම සාධනීය වූවකි. ඉන් කාලාන්තරයක් තිස්සේ යම් භූමියක් භුක්ති විඳ ඇත් නම් ඔවුන්ට උසාවි මගින් එහි අයිතිය ලබාගත හැකිය. ඒවිට නිසියාකාරව රටේ ඉඩම්වල මායිම් නිවැරදිව සකස් කළ හැකිය. මේ නිසා අලින්ගෙන් බැට කන අහිංසක ගොවි ජනයාට තමන් වගා කරගත් අස්වැන්න ආරක්ෂා කරගෙන විකුණා ගත හැකිය. එසේම මීට මුවා වී දේශපාලනය සමඟ ගනුදෙනු කරන හෙර ඔප්පු හද ඉඩම් කොල්ල කෑමට මාන බලන ජාවාරම්කාරයන්ට වැට බැඳිය යුතුය.

ආනවිලුන්දුව අභය භූමියේ කොටසක් අනවසරයෙන් එළිපෙහෙළි කිරීමේ සිද්ධිය සම්බන්ධයෙන් වරෙන්තු නිකුත් කර සිටි රාජ්‍ය අමාත්‍ය සනත් නිශාන්තගේ සහෝදරයා වන ආරච්චිකට්ටටුව ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපති ජගත් සමන්ත පසුගිය 22 වැනිද අධිකරණයට ඉදිරිපත්වීමෙන් පසුව රක්ෂිත බන්ධනාගාරගත කිරීමට පියවර ගැනීම තරාතිරම නොබලා සැමට එක හා සමාන නීතියක් ක්‍රියා කරන බව ආණ්ඩුව ක්‍රියාවෙන්ම ඔප්පු කළ අවස්ථාවකි. එය ආණ්ඩුව කෙරෙහි ජනතා බලාපොරොත්තු ඉහළ නංවන්නකි.




ඔක්තෝබර් රාහු කේතු මාරුව ඔබට බලපාන හැටි 20 පිටුව


චාල්ස් ද සොයිසා ගේ අද්භූත මරණය 21 පිටුව


වසර 61කට පෙර සිදුවූ බණ්ඩාරනායක ඝාතනයේ සුලමුල 24 පිටුව


# චීනයෙන් අලුත් වසංගතයක් දැනට ආසාදිතයන් 21,487ක්

චීනයෙන් ආරම්භ වූ කොවිඩ් - 19 මේ වන විටත් මිනිසුන්ට කිසිඳු අවස්ථාවක් ලබා නොදෙමින් වඩා වැඩි වේගයෙන් ලොව පුරා පැතිරෙමින් තිබේ. ඉදිරි මාසවලදී පෘථිවියේ උත්තරාර්ධ ගෝලයට ශීත ඍතුව එළඹීමට නියමිත බැවින් වයිරසය තවදුරටත් ව්‍යප්ත වීමට නියමිත බව විද්‍යාඥයන්ගේ අදහසයි.

ඒ අන්දමට කොවිඩ් වයිරසය හෝ පාලනය කර ගැනීමට නොහැකිව පවතින අවස්ථාවක චීනයේ පැතිර යන තවත් හඳුනා නොගත් රෝගයක් සම්බන්ධව තොරතුරු වාර්තා වී තිබේ.

දැනට හඳුනාගෙන ඇති අන්දමට මේ රෝගය බෝ වීමට හේතුව වයිරසයක් නොව බැක්ටීරියාවකි. වයඹ දිග චීනයේ දහස් ගණන් මිනිසුන් මේ බැක්ටීරියාවේ පැතිර යෑම හේතුවෙන් රෝගී වී ඇතැයි වාර්තා වේ. මේ බැක්ටීරියාව සමාජයට මුදාහැරීම සිදුවී ඇත්තේ ඖෂධ නිෂ්පාදන ආයතනයක අත්වැරදීමක් හේතුවෙනි. එහෙත් මේ බැක්ටීරියාව ආසාදනය වී ඇත්තේ ගොවිපොළ සතුන් ඇතිකිරීමේ වෘත්තියේ නිරතව සිටින පුද්ගලයන්ටය. ඒ අනුව වයඹ දිග චීනයේ ලන්ෂූ නගරයෙන් පුද්ගලයන් 3,245කට මේ වන විට බැක්ටීරියාව ආසාදනය වී ඇතැයි වාර්තා වන අතර හරකුන්, එළුවන් සහ ඌරන් ඇතිකර පුද්ගලයන් අතර මේ බැක්ටීරියාව වේගයෙන් පැතිර යමින් පවතින බවද වාර්තා වේ.



බැක්ටීරියාව ආසාදනය වූ පුද්ගලයන්ට ප්‍රථමයෙන් ඇතිවන රෝග ලක්ෂණය වන්නේ ආහාර අරුචියයි. ඉන්පසු හිසරදය, මස්පිඩු වේදනාව, උණ සහ ඇඟපත වේදනාව වැනි රෝග ලක්ෂණද ඇතිවන බව වාර්තා වේ.

ලන්ෂූ නගරය පිහිටා ඇති ගන්ෂූ ප්‍රාන්තයේ සෞඛ්‍ය කොමිසම තහවුරු කර ඇත්තේ මේ වන විට 21,487කට බැක්ටීරියාව ආසාදනය වී ඇති බව තහවුරු වී ඇතත් එක් මරණයක් හෝ වාර්තා වී නොමැති බවයි. දැනට තහවුරු වී ඇති අන්දමට බැක්ටීරියාව සමාජ ගතවී ඇත්තේ ලන්ෂූ නගරයේ සත්ත්ව එන්නත් නිෂ්පාදනය කරන ඖෂධ සමාගමක අත්වැරදීමකිනි. මෙම බැක්ටීරියාව බෲසෙල්ලා නම් වන අතර එය ආසාදනය වීමෙන් වැලඳෙන රෝගය බෲසෙල්ලොසිස් යනුවෙන් නම් කර තිබේ. සීඑන්එන් සේවයද මේ රෝගය වාර්තා කර තිබුණේ බෲසෙල්ලොසිස් යනුවෙනි.

චීනය මේ වන විට මේ රෝගය 'වසංගතයක්' (Outbrake) යනුවෙන් නම් කර තිබේ. එමෙන්ම චීන රජය රජයේ රෝහල්වලට නියෝග කර ඇත්තේ මේ බැක්ටීරියාව ආසාදනය වී ඇතිදැයි පරීක්ෂා කර ගැනීමට රෝහල් වෙත එන ජනතාවට නොමිලේ එම පර්යේෂණයන් කර දෙන ලෙසයි.

මේ අතර චීනයෙන් තවදුරටත් කොවිඩ් රෝගීන්ද අඛණ්ඩව වාර්තා වෙමින් තිබේ. පසුගිය සතියේදී කොවිඩ් ආසාදිතයන් 32ක් වාර්තා වූ අතර දෛනිකව ආසාදිතයන් නව දෙනෙක් පමණ චීනයෙන් වාර්තා වෙමින් තිබේ.

මේ අතර සමස්ත ලෝකයේ කොවිඩ් මරණ මිලියනය සම්පූර්ණ කිරීමට ඉතා ආසන්නව සිටී. මේ වන විට සමස්ත කොවිඩ් මරණ 9,81,968ක් වාර්තා වී ඇති අතර බොහෝ දුරට මේ සතිය අවසන් වීමට පෙර සමස්ත කොවිඩ් මරණ මිලියනය ඉක්මවා යනු ඇත. සමස්ත ලෝකයෙන් මේ වන විට කොවිඩ් ආසාදනය වූ සංඛ්‍යාව මිලියන 32කි. එහෙත් ලෝක සෞඛ්‍ය සංවිධානය පවසන්නේ මේ වන විටත් වයිරසයේ ව්‍යප්තිය කිසිඳු අන්දමකින් පාලනය වී නොමැති බවයි.

එමෙන්ම පෘථිවියේ උතුරු අර්ධගෝලයට ශීත සමය එළඹීමට නියමිත බැවින් ඉදිරියේදී යුරෝපා රටවලින් තවත් විශාල වශයෙන් කොවිඩ් රෝගීන් වාර්තා විය හැකි බව ලෝක සෞඛ්‍ය සංවිධානය අනතුරු අඟවා තිබේ. ලෝක කොවිඩ් සටහනේ දාහතරවන ස්ථානය දක්වා පසුබැස ගියද මහා බ්‍රිතාන්‍ය මේ වන විට නැවත ආසාදිතයන්ගේ වර්ධනයක් පැහැදිලිවම පෙන්නුම් කරමින් තිබේ. ලන්ඩන් නගරය තවමත් ආරක්ෂිත වුවද උතුරු ප්‍රදේශයෙන් දෛනිකව වාර්තා වන ආසාදිතයන්ගේ විශාල වැඩිවීමක් දක්නට ලැබෙමින් තිබේ.

ඉන්දියාවේ තත්ත්වයද ඉතාමත් කනගාටුදායකය. මේ වන විට මිලියන පහ ඉක්මවා ආසාදිතයන් වාර්තා වී ඇති ඉන්දියාව ඉදිරියේදී මිලියන හතක් මේ වන විට ආසාදිතයන් වාර්තා කර ඇති ඇමරිකාව ඉක්මවා යෑමටද ඉඩ තිබේ. ඇමරිකානු ජනතාවගෙන් වයිරසය පාලනයට සහයෝගය නොලැබුනද ඇමරිකාව සතුව යම් යම් සෞඛ්‍ය පහසුකම් ඉන්දියාවට සාපේක්ෂව පවතින බව පැහැදිලිය. එමෙන්ම සෞඛ්‍ය පහසුකම් අවම ඉන්දියාවේද වයිරසය පාලනයට ජනතාවගෙන් ලැබෙන සහය අවමය. එබැවින් ඉදිරියේදී ඉන්දියාවෙන් වාර්තාවන ආසාදිතයන් සංඛ්‍යාව ඇමරිකාව ඉක්මවා යෑමට වුවද ඉඩ තිබේ. එමෙන්ම මේ වන විට ඉන්දියාව කොවිඩ් හේතුවෙන් රට තුළ පනවා තිබූ සියලු තහනම් ඉවත් කර සාමාන්‍ය පරිදි පවත්වාගෙන යමින් සිටී. පසුගියදා ටජ් මහලද සංචාරකයන්ට සම්පූර්ණයෙන් විවෘත කිරීමට ඉන්දීය බලධාරීහු කටයුතු කළහ.


නවල්නි ගුවන් යානයෙන් රෝහල කරා රැගෙන යමින්



සක්වළ ගල

● ටිරෝනි වෑවලගේ



විරුද්ධ පක්ෂයේ දේශපාලනඥ ඇලෙක්සෙයි නවල්නිට විෂ ශරීරගත වී ඇති බව තහවුරු වේ.

# අත නොහරින පුටින්ගේ පුරුද්ද

**රුසියාවේ විරුද්ධ පක්ෂයේ ප්‍රධාන දේශපාලන ක්‍රියාකාරිකයක් වන ඇලෙක්සෙයි නවල්නි මේ වන විට ජර්මනියේ බර්ලින්හි රෝහලක සුවය ලබමින් සිටින බව වාර්තා වේ. ඔහු පසුගියදා හදිසියේ රෝගාතුර වූයේ ගුවන් ගමනක් අතරතුරදීය. වහාම ඔහු ජර්මනියේ රෝහලක් වෙත ගෙන යන ලදුව රෝගී තත්ත්වයට හේතුව සොයා ගැනීමට පර්යේෂණ කිහිපයක් පවත්වා තිබේ. එහිදී රටවල් තුනක් විසින් ස්වාධීනව සිදුකරන ලද පර්යේෂණ මගින් තහවුරු වී ඇත්තේ නවල්නිගේ ශරීරයේ ස්නායු අක්‍රිය කරනවන විෂක් අන්තර්ගත වී ඇති බවයි.**

ඇලෙක්සෙයි නවල්නි ලෝකය හඳුනා ගන්නේ රුසියාවේ විරුද්ධ පක්ෂයේ කැපී පෙනෙන චරිතයක් වශයෙනි. ඔහු ආණ්ඩුවට විරුද්ධ දේශපාලන උද්ඝෝෂණ රැසකට නායකත්වය දී තිබේ.

තවද පුටින්ගේ ආණ්ඩුවේ දූෂණ වංචා ලෝකයට හෙළිදරව් කිරීමේ කටයුතුවලදීද ඇලෙක්සෙයි නවල්නි පෙරමුණ ගෙන කටයුතු කර තිබේ.

පසුගියදා රුසියාවේ තොමස්ක් සිට මොස්කව් දක්වා ගුවන් ගමනක යෙදෙමින් සිටියදී නවල්නි හදිසියේ රෝගාතුර වූයේය. ඔහු එක්වරම දැඩි වේදනාවෙන් කෑ ගසන්නටත්, දඟලන්නටත් පටන්ගෙන තිබේ.

ලෝකයේ හොඳම සෞඛ්‍ය සේවය පවතින ජර්මනියේ වෛද්‍යවරු පසුගිය සැප්තැම්බර් 10වැනිදා වන විට නවල්නි කෝමා තත්ත්වයෙන් මුදා ගැනීමට සමත්ව සිටියහ.

එම අවස්ථාවේදී ගුවන් යානය තොමස්ක් වෙත යළිත් හදිසි ගොඩබෑමකට ලක් කළ යානයේ නිලධාරීහු නවල්නි තොමස්ක්හි රෝහල් වෙත ගෙන යෑමට කටයුතු කළහ. ඒ වන විටද නවල්නි පසුවී ඇත්තේ 'කෝමා' තත්ත්වයෙනි. නවල්නිගේ තත්ත්වය අයහපත් බව වටහාගත් විරුද්ධ පක්ෂ සාමාජිකයන් සහ ඔහුගේ පවුලේ සාමාජිකයන් දින දෙකකට පසු ඔහුව ජර්මනිය කරා ගෙන යෑමට කටයුතු කළහ.

ඔහුව රෝහල්ගත කිරීමෙන් දින දෙකකට පසුව එනම් පසුගිය සැප්තැම්බර් 2වැනිදා ජර්මනිය නිල වශයෙන් ප්‍රකාශ කර සිටයේ නවල්නිගේ සිරුරේ විෂ අන්තර්ගත වී ඇති බවට පැහැදිලි සාක්ෂි ලැබෙමින් පවතින බවයි.

එම විෂ වර්ගය ඔහුට ගුවන් යානයේදී ලබා දුන් තේ කෝප්පයට රහසේ එක් කර තිබෙන්නට ඇති බවද අනුමාන කෙරිණි.

ජර්මන් වෛද්‍යවරුන් පෙන්වා දී ඇත්තේ ඔහුට ලබා දී ඇත්තේ ස්නායු පද්ධතිය අක්‍රිය කරවන දරුණු විෂක් බවයි. එම විෂ මගින් ස්නායු පද්ධතියේ පණිවිඩ මොළයට ගෙන යෑම වළක්වන බව වෛද්‍යවරුන් පෙන්වා දී තිබේ.

පසුව මේ බව තහවුරු කර ගැනීම සඳහා ස්වාධීන රටවල් තුනකට නවල්නිගේ රුධිර සාම්පල් ජර්මනිය විසින් ලබා දී ඇති අතර, එම රටවල් තුන මගින් ලැබුණු වාර්තා ද විෂ ශරීරගත වීම තහවුරු කර තිබේ.

මේ වාර්තා ලැබීමත් සමගම ජර්මන් චාන්සලර් ඇන්ජෙලා මර්කල්ගේ මාධ්‍ය ප්‍රකාශකවරයා ප්‍රකාශයක් නිකුත් කරමින් 'ඇලෙක්සෙයි නවල්නිගේ ශරීරයට විෂ ඇතුළු වූයේ කෙසේදැයි පිළිගත හැකි පැහැදිලි කිරීමක් රුසියානු රජය විසින් වහාම ඉදිරිපත් කළ යුතුව ඇතැයි' පවසා සිටියේය. එමෙන්ම මේ සිදුවීම ජර්මන් රජය තරයේ හෙළා දකින බවද ඔහුගේ ප්‍රකාශයේ සඳහන් ව තිබේ.

කෙසේ වුවද ලෝකයේ හොඳම සෞඛ්‍ය සේවය පවතින ජර්මනියේ වෛද්‍යවරු පසුගිය සැප්තැම්බර් 10වනදා වන විට නවල්නි කෝමා තත්ත්වයෙන් මුදා ගැනීමට සමත්ව සිටියහ.

සැප්තැම්බර් 11වැනිදා වචන මගින් අදහස් හුවමාරු කර ගැනීමට තරම් හැකියාවක් නවල්නිට ලැබී ඇති බව වාර්තා විය. ඒ සමගම ජර්මනියේ විදේශ බුද්ධි සේවය පවසා ඇත්තේ නවල්නිගේ සිරුරේ තිබුණු විෂ වර්ගය මේ දක්වා නිශ්චිතව හඳුනා ගැනීමට නොහැකි වී ඇති බවයි. එබැවින් එය අලුතින්ම නිපදවන ලද විෂ වර්ගයක් විය හැකි බවද ඔවුන් වැඩිදුරටත් ප්‍රකාශ කර තිබේ.

මේ අතර නවල්නිගේ පෞද්ගලික ආරක්ෂකයන් පවසා ඇත්තේ ඔහුට වස දී ඇත්තේ ගුවන් යානයට ගොඩවැදීමට පෙර බවයි.

ඔහු නවාතැන්ගෙන සිටි හෝටල් කාමරයේ තිබී සැකසහිත හිස් වතුර බෝතලයක් ඔවුන්ට හමුවී ඇති අතර එමගින් ඔහු ගුවන් යානයට යෑමට පෙර විෂ ශරීර ගත කරවන්නට ඇතැයි අනුමාන කර තිබේ.

කෙසේ වුවද ජර්මන් බලධාරීන් පසුගියදා ප්‍රකාශ කර සිටියේ මේ වන විට නවල්නි යළි රුසියාවට යා හැකි තරමට සුවපත්ව සිටින බවයි.

මේ අතර නවල්නිගේ සිදුවීම සම්බන්ධව පුටින්ගේ ආණ්ඩුවද ප්‍රතිචාර දක්වා තිබේ. නවල්නි ජර්මනිය කරා ගෙන ගිය අවස්ථාවේදී මොස්කව් හි මාධ්‍ය ප්‍රකාශක දිමිත්‍රි පෙස්කොව් පවසා ඇත්තේ නවල්නිගේ සිදුවීම සම්බන්ධව රජය පූර්ණ පරීක්ෂණයක් පවත්වනු ඇති බවයි. එසේ වුවද පුටින්ගේ තතු දන්නා වැඩි දෙනා පවසන්නේ නවල්නිගේ දිවි ගැලවෙන්නේ ඔහු වහාම ජර්මනිය කරා රැගෙන යෑමට ඔහුගේ පවුලේ සාමාජිකයන්ට හැකිවීමෙන් බවයි.

කෙසේ වුවද තොමස්ක් හි රෝහල් බලධාරීන් ප්‍රථමයෙන් නවල්නිගේ බිරියටද ඔහු අසලට යෑමට ඉඩ දී නැත. ඇය මොස්කව් සිට පැමිණ ඇත්තේ ඔවුන්ගේ පවුලේ වෛද්‍යවරියද සමඟිනි.

අවසානයේ ඔවුන්ට 'කෝමා' තත්ත්වයේ පසුවන නවල්නි අසලට යෑමට අවස්ථාව ලැබී ඇත්තේ ඔවුන්ගේ විවාහ සහතිකය රෝහල් බලධාරීන්ට ඉදිරිපත් කළ පසුවය.

එමෙන්ම නවල්නි ජර්මනිය කරා ගෙන යෑමට තීරණය කළ විට රෝහල් බලධාරීන් එයට විරෝධය දක්වා ඇත්තේ ඔහු ඉවතට ගෙන යෑමට තරම් නිරෝගීව නොසිටින බව පවසමිනි. එහෙත් කෙසේ හෝ එම විරෝධතා නොතකමින් ඔහු ජර්මනිය කරා රැගෙන යෑමට ඔහුගේ පවුලේ සාමාජිකයන්ට සහ දේශපාලන ක්‍රියාකාරීන්ට හැකියාව ලැබී තිබේ.

වැඩි දෙනා පවසන්නේ නවල්නි දිගටම රුසියාවේ රැඳුණේ නම් ඔහුගේ දිවි නොගැලවෙනු ඇති බවය.

එසේ පැවසීමට සාධාරණ හේතු ඇත්තේ මීට පෙර විෂ ශරීර ගත වූ රුසියානු ප්‍රබලයන් රැසක් දිවි බේරා ගැනීමට අසමත් වූ නිසාවෙනි. එම ප්‍රබලයන් සියලු දෙනාට පාහේ පුටින්ගේ විරුද්ධවාදීන් වීමද පොදු සමානකමකි. උදාහරණ ලෙස සර්ජි සහ යුලියා ස්ක්‍රිපාල්, ඇලෙක්සැන්ඩර් ලිට්විනෙන්කෝ යනාදීන් දැක්විය හැකිය.

සර්ජි ස්ක්‍රිපාල් යනු රුසියාවේ හමුදා නිලධාරියකු වූ අතර ඔහු බ්‍රිතාන්‍ය සහ රුසියාව අතර ද්විත්ව ඔත්තුකරුවකු ලෙසද කටයුතු කර තිබේ. යුලියා ස්ක්‍රිපාල් යනු ඔහුගේ දියණියයි.

2018 මාර්තු මාසයේදී බ්‍රිතාන්‍යයේ සැලිස්බරි හිදී මේ දෙදෙනා විෂ කැවීමට ලක්වූ අතර එහිදීද ලබා දී තිබුණේ ස්නායු පද්ධතිය අඩපණ කරවන විෂ වර්ගයක් බව සොයා ගෙන තිබේ.

ඇලෙක්සැන්ඩර් ලිට්විනෙන්කෝ ද එවැනිම රුසියානු බුද්ධි අංශවල සේවය කළ පුද්ගලයෙකි. අවසානයේ ඔහුටද කිසියම් පිරිසක් විසින් විෂ ශරීරගත කළ අතර ඔහු මියගියේ ඇතිවූ සංකූලතා හේතුවෙනි.

මීට අමතරව තවත් දේශපාලන ක්‍රියාකාරීන්, ඔත්තු සේවා සාමජිකයන් අභිරහස් ලෙස මියගිය අවස්ථා කිහිපයක්ම වාර්තා වන අතර, ඒ බොහෝ අවස්ථාවන්හිදී මියගිය පුද්ගලයන් පුටින්ගේ රජයට විරුද්ධව යම් රහස් ආරක්ෂා කළ අය හෝ දේශපාලන විරුද්ධවාදීන් බව හඳුනාගෙන තිබේ. කෙසේවුවද තම විරුද්ධවාදීන් ඉවත් කිරීමට විෂ භාවිත කිරීම සම්බන්ධව රුසියානු නායක ව්ලැඩිමීර් පුටින්ට ඇත්තේ කුප්‍රකට ඉතිහාසයකි.

ඒ අනුව ඇලෙක්සෙයි නවල්නි සම්බන්ධව පුටින් එම සුපුරුදු ක්‍රියාමාර්ගයම අනුගමනය කළාදැයි උපදින්නේ සාධාරණ සැකයකි.


ඇලෙක්සෙයි නවල්නි

# පලස්තීනය මතක කාටද ?



ඊශ්‍රායලය ප්‍රතික්ෂේප කළ අරාබි රටවල් දැන් ඊශ්‍රායලය සමඟ නොයෙක් ගිවිසුම්වලට එළඹෙමින් සබඳතා ඇති කර ගනිමින් සහ තර කර ගනිමින් සිටිති. බොහෝදුරට මේ ප්‍රවණතාව වළක්වා ගැනීමට පලස්තීනයට නොහැකි වනු ඇතැයි අනාවැකි පැවසිය හැකිය.

## අරාබි රටවලටවත් මතක නෑලු - අබ්බාස් කියයි

**පසුගියදා ඇමරිකාවේදී මුණගැසුණු ඊශ්‍රායෙල් අගමැති බෙන්ජමන් නෙතන්යාහු එක්සත් අරාබි එමිරේට් දේශය සමඟ ගිවිසුම් කිහිපයකට අත්සන් තැබුවේය. එමගින් මැදපෙරදිග කලාපයේ ආර්ථික උන්නතියට අදාළ පහසුකම් රැසක් බෙදාහදා ගැනීමට කලාපීය රටවල් කටයුතු කිරීමට නියමිතය. ඇමරිකාව මෙන්ම ඊශ්‍රායලයද මේ අවස්ථාව කළාපීය සාමයටද විශාල අවස්ථාවක් ලෙස අර්ථ දැක්වීය.**

දැන් මේ අවස්ථාව පදනම් කර ගනිමින් පලස්තීනය අරාබි ලෝකයට දොස් පවරා තිබේ. පලස්තීන ජනාධිපති මොහොමඩ් අබ්බාස් පසුගියදා අරාබි ලීගයේ ආරක්ෂක අංශ ප්‍රධානී සහ විදේශ අමාත්‍යවරුන් හමුවූ අවස්ථාවේදී ප්‍රකාශ කර ඇත්තේ 'පලස්තීනය තවදුරටත් කිසිවකුටත් මතක නැති' බවයි.

මෙහිදී දැඩි කනගාටුවෙන් යුතුව අදහස් දක්වා ඇති ජනාධිපතිවරයා එක්සත් අරාබි එමිරේට්ස් දේශය ඊශ්‍රායලය සමඟ ගිවිසුම්ගත වීම සම්බන්ධව තමන් පුදුමයට පත්වන බව පවසා තිබේ. එහෙත් වඩාත් කනගාටුවට කරුණ එක්සත් අරාබි එමිරේට්ස් දේශය පලස්තීනය අමතක කිරීම නොව සෙසු අරාබි රටවලටද පලස්තීනය අමතකව යෑම බව ජනාධිපතිවරයා එහිදී වැඩිදුරටත් පවසා තිබේ.

එමිරේටස් සහ ඊශ්‍රායලය ගිවිසුම් ගත වූ අවස්ථාවේදී කිසිඳු අරාබි රටක් එම ක්‍රියාව හෙළා දැකීමට කටයුතු නොකළ බව අබ්බාස් ජනාධිපතිවරයා සිහිපත් කර සිටියේය. එමෙන්ම එම ගිවිසුම හෙළා දැකීම අරාබි ලීගය විසින් ප්‍රතික්ෂේප කර ඇති බවද ජනාධිපතිවරයා පෙන්වා දුන්නේය. ඒ අනුව ඉදිරියේදී එමිරේට්ස් අනුගමනය කරමින් සෙසු අරාබි රටවල්ද ඊශ්‍රායලය සමඟ සබඳතා ආරම්භ කරනු ඇති බවට ඉඟි පළවෙමින් තිබෙන බවත්, මේ ගිවිසුම හෙළා දැකීම ප්‍රතික්ෂේප කිරීමෙන් ඒ බව තහවුරු වන බවත් ජනාධිපතිවරයා වැඩිදුරටත් පවසා තිබේ.

මේ අතර පලස්තීනය අරාබි ලීගයෙන් ඉවත් වීමට කටයුතු කරන බවට පැතිර යන කටකතා සාවද්‍ය බවද ජනාධිපතිවරයා තහවුරු කර සිටියේය.

ජනාධිපතිවරයා මෙසේ පවසද්දී තවත් පලස්තීන බලධාරීන් කිහිපදෙනක්ම මාධ්‍ය වෙත අදහස් දක්වමින් අරාබි රටවල් කෙරෙහි තම කනගාටුව පළ කිරීමට කටයුතු කර තිබෙනු දක්නට ලැබිණි. එහිදී පලස්තීනයේ තවත් එක් ජ්‍යෙෂ්ඨ බලධාරියකු රමල්ලාහ් නගරයේදී ජෙරුසෙලෙම් පෝස්ට් පුවත්පතට අදහස් දක්වමින් පවසා සිටියේ පලස්තීනයට පිටුපසින් සිටිමින් පිහියෙන් ඇන්නේ එක්සත් අරාබි එමිරේට්ස් පමණක් බව තමන් සිතා සිටි නමුත් ක්‍රමයෙන් අනික් අරාබි රටවල්ද පලස්තීනයට පිටුපෑ බව තහවුරු වෙමින් පවතින බවයි. එමෙන්ම එම ගිවිසුම අත්සන් කළ අවස්ථාව පලස්තීනයට මෙන්ම මුළු මහත් අරාබි ලෝකයටම අඳුරු මොහොතක් බවද එම ජ්‍යෙෂ්ඨ බලධාරියා පැවසූ බව ජෙරුසලම් පෝස්ට් පුවත්පත වාර්තා කර තිබිණි.

මේ අතර එමිරේට්ස්හි දේශපාලන විද්‍යාව පිළිබඳ මහාචාර්යවරයකු වන අබ්දුල්කාලික් අබ්දුල්ලාහ් පවසා ඇත්තේ අරාබි ලීගය විදේශ අමාත්‍යවරුන් රැස්වූ අවස්ථාවේදී එමිරේස්ට් - ඊශ්‍රායල් සාම ගිවිසුම හෙළා දැකීමේ යෝජනාව සම්මත කර ගැනීමට නොහැකිවීම පලස්තීන පාලකයන්ගේ දූෂිත බව හේතුවෙන් සිදුවූවක් බවයි.

වර්තමාන තත්ත්වය මෙසේ කනගාටුදායක වුවද පලස්තීනය යනු අභීත නායකයන්ගේ නායකත්වයෙන් තම හිමිකම උදෙසා සටන් වැදුණු අභීත ජනතාවක් සහ අසාධාරණයට ලක්වූ රටක් බව අමතක කළ යුතු නැත. දෙවැනි ලෝක යුද්ධයෙන් පසු අවතැන්ව සිටි යුදෙව් ජනතාව වෙනුවෙන් ඊශ්‍රායලය පිහිටුවීමේදී ඇමරිකාව ප්‍රමුඛ බලවත් රටවල් ඒ සඳහා බලෙන් අත්පත් කර ගත්තේ පලස්තීනය සතුවූ භූමියයි. ඉන්පසු පලස්තීනුවත් බලහත්කාරයෙන් තමන්ගේ භූමියෙන් පිටමං කර දැමුණු අතර ඔවුන්ගේ නිජබිම් වසා ගනිමින් දැවැන්ත තාප්ප ඉදි කිරීමටද ඊශ්‍රායලය කටයුතු කළේ බලහත්කාරයෙනි. මෙහිදී ඇමරිකාව ඊශ්‍රායලයට උපරිම සහය දක්වද්දී පලස්තීනයේ කඳුළු පිසදමන්නට ඉතිරි වූයේ සහෝදර අරාබි රටවල් පමණි. මැදපෙරදිග කලාපයේ අරාබි රටවල් පලස්තීනයේ සහයට පැමිණියේ ඊශ්‍රායලය හෙළාදකිමින්, ඊශ්‍රායල් භාණ්ඩ හා සේවා සඳහා තම වෙළෙඳපොළ වසා දමමින්, මෙන්ම පලස්තීනයට අවිආයුධ ද ලබා දෙමිනි.

අදින් දශක එකහමාරකට පමණ ඉහතදී පලස්තීනයේ අභීත නායක යසර් අරෆාත්ගේ අභාවයෙන් පසු පැමිණි පාලකයන්ට පලස්තීනය කෙරෙහි අරාබි රටවල් සතුව පැවති සංවේදී හැඟීම තවදුරටත් එලෙසම පවත්වා ගැනීමට නොහැකි වී ඇති බවට හොඳම සාක්ෂිය මෙකී එමිරේට්ස් ගිවිසුමයි. දැන් එතෙක් කල් ඊශ්‍රායලය ප්‍රතික්ෂේප කළ අරාබි රටවල් දැන් ඊශ්‍රායලය සමඟ නොයෙක් ගිවිසුම්වලට එළඹෙමින් සබඳතා ඇති කර ගනිමින් සහ තර කර ගනිමින් සිටිති. බොහෝදුරට මේ ප්‍රවණතාව වළක්වා ගැනීමට පලස්තීනයට නොහැකි වනු ඇතැයි අනාවැකි පැවසිය හැකිය. එසේ වන්නේ පලස්තීන නායකයන් තමන් කෙරෙහි වූ අරාබි විශ්වාසය කඩ කර ගත් නිසා බව අරාබි රටවල නිදහසට කරුණයි. එහෙත් සැබෑ තත්ත්වය එසේද? පිළිතුර නැත යනුවෙන් විය හැකිය.

පලස්තීනය යනු අත්හැර දමන ලද, අසරණ ජනතාව පිරුණු, කනගාටුදායක භූමි ප්‍රදේශයක් පමණි. එම අසරණයන්ට පිහිට වීමෙන් නව ලෝකය වෙත දොරටු විවර කරන්නට වෙර දරන අරාබි රටවලට ලැබෙන දෙයක් නැත. එහෙත් ඊශ්‍රායලය එසේ නොවේ. අධික මූල්‍ය ශක්තියකින්, යුද ශක්තියකින්, ශ්‍රම බලකායකින් යුක්ත ඊශ්‍රායලය මැදපෙරදිග කලාපයේ හුදකලා විප්ලවවාදියාය. ජයග්‍රාහකයාය. බලවතාය. ඊශ්‍රායලය සමඟ සබඳතා ඇති කර ගැනීමෙන් ලැබිය හැකි දේ බොහෝය. පලස්තීනයේ කඳුළු පිසලන අතරම මේ බලවතා සමඟ හොඳ හිත පවත්වා ගැනීම වාසිදායකය. එබැවින් අසාධාරණයට ලක් වූ පලස්තීනයට ඉදිරි අනාගතයේදී කඳුළ සමඟ කුසගින්න පමණක් ඉතිරි වීමට ඇති ඉඩකඩ බොහෝය. අරාබි ලෝකය ඔවුන් හුදකලා කර ඊශ්‍රායලය සමඟ ඉදිරියට පිය නගනු ඇත.

# සක්වළගල

● ටිරෝනි වැවලගේ

## චීනයෙන් බලශක්ති උත්පාදනයට කෘත්‍රිම ඉරක්

**විද්‍යාඥයන් පවසා ඇති අනාවැකි අනුව පෘථිවියේ ෆොසිල ඉන්ධන අවසන් වීමට තවත් වැඩි කාලයක් ඉතිරිව නැත. එමෙන්ම ෆොසිල ඉන්ධන පෘථිවියේ උෂ්ණත්වය ඉහළ දැමීමටද බෙහෙවින් බලපෑම් කරන බව තහවුරුය. එබැවින් මිනිසා විකල්ප බලශක්ති කෙරෙහි විතැන්වීම අරඹා දැන් ටික කාලයක් ගතවී තිබේ. විකල්ප බලශක්ති යනුවෙන් මිනිසා හඳුනාගෙන ඇති ප්‍රධාන ශක්ති ප්‍රභව කිහිපයකි. ඒ අතරින් සූර්ය බලශක්තියට හිමිවන්නේ ප්‍රධාන තැනකි.**


අපේ රටේ වුවද සූර්ය බලශක්තිය ජනතාව අතර ජනප්‍රිය කරවීමට විවිධ උත්සාහයන් ගෙන තිබේ. සූර්ය බලශක්තිය මගින් සිදුවන්නේ සූර්යයාගෙන් ලැබෙන ප්‍රබල ආලෝකය ශක්තිය බවට පරිවර්තනය කිරීමයි. එහෙත් සූර්යයාගේ ආලෝකය පෘථිවියේ සෑම තැනටම එකලෙස ප්‍රබලව නොලැබෙන අතර කාලගුණ තත්ත්වයන් අනුවද ආලෝකයේ ප්‍රබලතාව වෙනස් වේ.

මේ හේතු මත සූර්ය බලශක්තිය මත යැපෙමින් තම ආයෝජන සිදුකිරීමට බොහෝ දෙනා අකමැත්ත දක්වති. එහෙත් සූර්ය බලය වැනි පරිසර හිතකාමී බලශක්තියක් පරිභෝජනය කිරීමටත්, එහි බලශක්තිය සැමදා එකසේ බලා ගැනීමටත් උපක්‍රමයක් චීනය විසින් අත්හදා බැලීමට ලක් කර තිබේ. එහිදී චීනය සිදුකර ඇත්තේ තම විද්‍යාගාර තුළ කෘත්‍රිම සූර්යයෙක් හෙවත් කෘත්‍රිම තරුවක් නිර්මාණය කිරීමයි. මෙහි විශේෂත්වය වී ඇත්තේ මේ කෘත්‍රිම තරුව සූර්යයාටත් වඩා හයගුණයක් උෂ්ණත්වයකින් යුක්ත වීමයි. මෙහි මතුපිට උෂ්ණත්වය සෙල්සියස් අංශක මිලියන සියයක් බව චීන මාධ්‍ය වාර්තා කර තිබේ.









චීනය මේ කෘත්‍රිම තරුව නම් කර ඇත්තේ EAST (Experimental Advanced Superconducting Tokamak) යනුවෙනි. මේ කෘත්‍රිම තරුව මත අධික උෂ්ණත්වයක් ඇති කිරීමට චීන විද්‍යාඥයන් භාවිත කර ඇත්තේ පරමාණු පදනම් වූ ක්‍රමවේදයකි. මෙහිලා යොදාගෙන ඇති ක්‍රමවේදය ඉතාමත් සරල ලෙස විස්තර කරන්නේ නම් මෙසේ පැවසිය හැකිය. සැහැල්ලු පරමාණු දෙකක් එකිනෙක සම්බන්ධ කර එකක් බවට පත් කිරීම ප්‍රථමයෙන්ම සිදුකෙරේ. මෙම ක්‍රියාව සිදුවන අතර පරමාණු දෙකෙන් වඩා විශාල පරමාණුව ශක්තිය නිකුත් කරයි. බලය උත්පාදනය කිරීමට යොදාගන්නේ මේ ක්‍රමවේදයයි. මෙය බැලූ බැල්මට සරල ලෙස පෙනුනද ප්‍රායෝගික තලයේදී මෙය එතරම් පහසු නොවන බව විද්‍යාඥයන් පෙන්වා දී තිබේ. එයට හේතුව මේ පරමාණු දෙකම ධනාත්මක බලය හුවමාරු කර ගැනීම හේතුවෙනි. විද්‍යාඥයන් පවසන්නේ මෙය සැබවින්ම කාන්දම් දෙකක එකිනෙකට විරුද්ධ අග්‍ර දෙකක් සමපාත කිරීමකට සමාන වන බවයි. එකිනෙක සම්බන්ධව කරවන පරමාණු දෙක එකිනෙක විකර්ෂණයද කරයි.

අපේ සූර්යා වැනි විශාල තරුවලට මේ විකර්ෂණය ජයගැනීමේ ශක්තිය තිබේ. එසේ කිරීමට හැකියාව ලැබී තිබෙන්නේ සූර්යයාගේ විශාලත්වය හේතුවෙනි. සූර්යයාගේ අති දැවැන්තව බව හේතුවෙන් එහි හරයේ විශාල පීඩනයක් නිරන්තරයෙන් පවතී. එම පීඩනය හේතුවෙන් හරයේ ඇති පරමාණු නිතර එකිනෙක ගැටෙමින් පවතී. බලශක්තිය ලබා ගැනීමට තරුවක් නිෂ්පාදනය කිරීමේ පියවරේදී විද්‍යාඥයන් මුහුණ දුන් ප්‍රධානතම ගැටලුව වූයේ මෙවැනි අති විශාල පීඩනයක් පෘථිවිය මත ඇති කිරීමට නොහැකි වීමයි. එහෙත් මේ ගැටලුවට මුහුණ දීමේදී විද්‍යාඥයන් ඒකී වියලනය පෘථිවිය මත ඇති කිරීමට ඉතා දැඩි උෂ්ණත්වය උපයෝගී කර ගත්හ. මීට පෙර සඳහන් කළ EAST නම් වන උපකරණය මගින් ඔවුන් සිදු කරන්නේ එකී උෂ්ණත්වය ඇති කිරීමය.

මේ උපකරණය නිපදවීමේ ක්‍රියාවලියේදී විද්‍යාඥයන් අවබෝධ කර ගත්තේ උෂ්ණත්වය වඩාත් වැඩි නම් පරමාණු වඩා වැඩි වේගයෙන් චලනය වන බවයි. එමෙන්ම ප්‍රමාණවත් උෂ්ණත්වයක් නොමැති නම් පරමාණු අවශ්‍ය ප්‍රමාණයෙන් චලනය වන්නේ නැත. එහිදී තහවුරු වූයේ සෙල්සියස් අංශක මිලියන 100 යනු පරමාණු අවශ්‍ය අන්දමට චලනය කර ගැනීම සඳහා වන නියම උෂ්ණත්වය බවයි. එම උෂ්ණත්වය හිරුගේ මතුපිට උෂ්ණත්වය මෙන් හය ගුණයකි.

චීනය දැනට ලබා දී ඇති තොරතුරු අනුව මේ නවතම බලශක්ති උත්පාදකය ක්‍රියාත්මක තලයට ගෙන ඒම සඳහා ඉදිරියට තැබිය යුතු වන්නේ තවත් පියවර කිහිපයක් පමණි. එයින් පසු මිනිසාට ක්ෂය නොවන, පරිසරය දූෂණය නොවන තිරසාර නවතම බලශක්ති මූලයක් හිමිවනු ඇත. එහෙත් තවම මේ බලශක්ති මූලාශ්‍රය ආරම්භක පියවරේ පවතින බවද අමතක කළ යුතු නැත.

දැනට මේ යන්ත්‍රයේ ආරම්භක පියවර ලෙස නිපදවා ඇති යන්ත්‍රය අඩි කිහිපයක් දිග ආදර්ශකයක් පමණක් වේ. මෙහි අවසන් පර්යේෂණයන්ගෙන් පසු බලාගාර මට්ටටමේ දැවැන්ත බලශක්ති උත්පාදක යන්ත්‍ර නිපදවීමට කටයුතු කළ යුතු වනු ඇත. ඒ අදියරයන් සාර්ථක වුවහොත් මිනිස් වර්ගයා ශිෂ්ටාචාරයේ තවත් පියවරක් ඉදිරියට තැබූ බව නිශ්චිතව සටහන් කළ හැකි වනු ඇත.



## ඇන්ටාක්ටිකාවේ ග්ලැසියර යටින් උණු වතුර

## පෘථිවියේ අනාගතය භයානකයි

**අනාගත පෘථිවිය කාන්තාරයක් විය හැකි බවට අනාවැකි කොතරම් පැවසුවද මිනිසා තම ක්‍රියාකාරකම් පාලනය කර ගන්නා බවක් පෙනෙන්නට නැත. කාබන් වායු විමෝචනය සිදුවන ක්‍රියාකාරකම් නවතා දැමීමට හෝ පාලනය කිරීමට මිනිසා තවමත් කටයුතු කර නොමැති අතර වන විනාශයද දිනෙන් දින ශීඝ්‍රයෙන් වර්ධනය වන්නේය.**

මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් පෘථිවි ගෝලයේ උෂ්ණත්වය ඉහළ යන බව අදින් දශක කිහිපයකට පෙර දීම පෙන්වා දුන්නද කිසිවකු ඒ සම්බන්ධව අවධානය යොමු කර සිටියේ නැත. එහෙත් මේ වන විට සිදුවෙමින් පවතින විනාශය මිනිස් ඇසට දැකිය හැකි තරමය. පෘථිවියේ වායු සමීකරණ පද්ධතිය ලෙස කටයුතු කරන ධ්‍රැවීය අයිස් ස්ථර සහ ග්ලැසියර මේ වනවිට වේගයෙන් ක්ෂය වෙමින් යන්නේය. අයිස්ලන්තයේ මිනිස් වාසයට ආසන්නයෙන්ම පිහිටා ඇති ග්ලැසියරය වන ඔක්ජෝකුල් පසුගිය වසරේදී සම්පූර්ණයෙන් දියව ගිය බව නිල වශයෙන් ප්‍රකාශයට පත් කෙරිණි. දැන් එම කනගාටුදායක වාතාවරණයට මුහුණ දෙමින් සිටින්නේ ලෝකයේ විශාලතම දූපත වන ග්‍රීන්ලන්තයයි.

ග්‍රීන්ලන්තයේ ප්‍රධාන ග්ලැසියරයක් වන N97 ග්ලැසියරයෙන් වර්ග කිලෝමීටර් 110ක තට්ටුවක් ගැලවී ඉවත්වගොස් ඇති බව පසුගියදා එරට නිල වහයෙන් නිවේදනය කර තිබේ. මේ වසරේ දැනට වාර්තා වී ඇති විනාශය එපමණක් වුවද පසුගිය 2019 වසරේදී පමණක් ග්‍රීන්ලන්තයේ ග්ලැසියරවලින් ගැලවී ඉවතට ගොස් ඇති අයිස් ප්‍රමාණය ටොන් බිලියන 532ක් බව ප්‍රකාශ වී තිබේ. එය 2003 වසරේ සිට 2019 දක්වා ගැලවී ගිය අයිස් ප්‍රමාණය මෙන් දෙගුණයකි. ඒ අනුව ගෝලීය උෂ්ණත්වය ඉහළ යෑම කෙතරම් ශීඝ්‍රයෙන් වර්ධනය වෙමින් පවතින්නේද යන්න අනුමාන කිරීම අපහසු නොවේ.

ග්‍රීන්ලන්තය එතරම් විනාශයකට මුහුණ දෙමින් සිටින විට ඇන්ටාක්ටික් ධ්‍රැවීය කලාපයේ වාතාවරණයද ඊට නොදෙවෙනිය. ලොව විශාලතම ග්ලැසියර පිහිටා ඇති ඇන්ටාක්ටිකාවේ අයිස් ස්ථර යටින් උණුසුම් ජලය ගලා යෑම හේතුවෙන් එම අයිස් ස්ථර වේගයෙන් දියවෙමින් පවතින බව පාරිසරික විශේෂඥයන් සොයා ගත්තේ මෑතකදීය. මේ වසරේදී ඔවුන් පෙන්වා දී ඇත්තේ විනාශය ඉතා වේගවත් බවයි.

පෘථිවියේ සෙසු සාගර කලාපවල ජලය දිගින් දිගටම උණුසුම් වෙමින් පවතින අතර එම උණුසුම් ජලය ප්‍රවාහ ලෙසින් ඇන්ටාක්ටිකා කලාපයටද පැමිණේ. එම ජලය අයිස් ස්ථර යටින් ගලා යෑමේදී මතුපිටට නොපෙනෙන ලෙස අයිස් තට්ටු යටින් ඛාදනය වෙමින් පවතින බව විද්‍යාඥයන් විසින් සොයා ගනු ලැබුවේ ඉතාම මෑතකදීය. ඊට හේතුව මතුපිට අයිස් තට්ටුවලට උණුසුම් ජලයෙන් එතරම් බලපෑමක් නොවීමයි.

එහෙත් මේ වන විට වාර්ෂිකව අයිස් ටොන් බිලියන 80ක් පමණ දියව යන බව විද්‍යාඥයන්ගේ මතයයි. මේ දියව යන සියලු අයිස් ජලය බවට පත්ව සාගර ජල ස්කන්ධය වර්ධනය කරන අතර වසරකට සියයට හතරකින් සාගර ජල මට්ටම ඉහළ යන බවද ඔවුහු පෙන්වා දෙති.

ග්ලැසියර් යටින් ගලා යන උණුසුම් ජල ධාරා සම්බන්ධව වැඩිදුර තොරතුරු සෙවීමට නෞකා මෙන්ම ගුවන් යානාද යොදා ගනිමින් පර්යේෂණ මාලාවක් සිදුකිරීමට විද්‍යාඥයන් කටයුතු කළ අතර එහිදී සොයා ගනු ලැබුවේ පෙර අනුමාන කළ ප්‍රමාණයට වඩා විශාල ජල ප්‍රවාහයක් වඩාත් ගැඹුරෙන් අයිස් ස්ථර දිය කරමින් ගලා යන බවයි.

අයිස් ස්ථර දියවීම සම්බන්ධව තොරතුරු සොයමින් ගුවන් යානයකින් ගමන් කළ පාරිසරික විද්‍යාඥ ආචාර්ය ජෝඩ්න් පවසා ඇත්තේ තමන්ට දක්නට ලැබුණු දසුන් සැබවින්ම පෘථිවියේ අනාගතය සම්බන්ධව සිත බියපත් කරවන බවයි.

# අපල සපල



ප්‍රවීණ ජ්‍යොතිෂවේදී
සුබසෙත ජ්‍යෙෂ්ඨ කර්තෘ
අජිත් ධර්මසිරි

රාහු, කේතු, සෙනසුරු, කුජ යන නම් ඇසූ පමණින් ජනතාව බිය වන සුලුය. සැබවින්ම ඒ අය පීඩිත ජනතාව තව තවත් පීඩාවට පත් කරන බව රහසක් නොවේ. එයිනුත් වැඩි කාලයක් එක රාශියක හැසිරීම නිසා මේ පීඩාව ඉතා හොඳින් දැනෙනු ඇත. සෙනසුරු එක රාශියක වසර 2 1/2ක් බැගින් රාශි දොළස අවසන් කර නියම තැනට ඒමට වසර 30ක් ගත වෙයි. රාහු සහ කේතු එක රාශියක ගත කරන කාලය වසර 1 1/2 බැගින් රාශි දොළස අවසන් කිරීමට වසර 18ක් ගත වෙයි. මේ නිසාම හොඳ හෝ නරක කෙනකුට වැඩි කාලයක් පුරා අත්විඳීමට සලසන මේ ග්‍රහයන් ජනතාවට අමතක නොවන සනිටුහන් තබා යන බව ජ්‍යොතිෂය අනුගමනය කරන අයට වැට-

# වසර 18කට පසු රාහු කේතු හරි මගට

● කටක - සිංහ - කන්‍යා - වෘශ්චික - ධනු - මකර - මීන ලග්නවලට සුබයි

● මේෂ - වෘෂභ - මිථුන - තුලා - කුම්භ ලග්නවලට මධ්‍යමයි

## ඔක්තෝබර් මස ලග්න පලාපල



රාහු -කේතු අන් ග්‍රහයන් මෙන් නොව අදෘෂ්‍යමාන ඡායා ග්‍රහයෝ ය. පෘථිවිය සූර්යයා වටා ගමන් කරන අතරේ චන්ද්‍රයා තමා වටා භ්‍රමණය වෙමින් පෘථිවිය වටා ගමන් කරමින්ම සූර්යයා වටා ද ගමන් කරයි. මේ ක්‍රියාවලියේදී පෘථිවි කක්ෂයත් චන්ද්‍ර කක්ෂයත් එකිනෙකට කැපී යන ස්ථාන දෙකක් ඇතිවෙයි. ඒ ස්ථාන දෙක පිළිවෙළින් උතුරු ලක්ෂය රාහු ලෙසත් දකුණු ලක්ෂය කේතු ලෙසත් හඳුන්වනු ලබයි. මෙහි කැපී පෙනෙන ස්ථාන දෙක හෙවත් රාහු කේතු එකිනෙකා සප්තමව පිහිටා ඇත. මේ ගමන වක්‍රව කෙරෙන්නකි. ඒ නිසා රාහු කේතු ඔවුනොවුන්ට අංශක 180 කින් ඈත් ව සිටී.

රාහු සහ කේතු දිනකට අංශක 3 කලා 11ක් ගමන් කරයි. වර්ෂයකට අංශක 19 කලා 20 කි. රාහු හා කේතුට එක් රාශියක් ගමන් කිරීමට ගත වන කාලය මාස 18කි. රාශි චක්‍රය වටා ගමන් කිරීමට ගත වන කාලය වසර 18කි. ඒ නිසා රාහු කේතු ජනතාවට කරන පීඩාව හෝ යහපත හොඳින් දැනෙනු ඇත.

ස්වරභාග, අසුර, අර්ධකාය, චිත්‍ර නන්දන, චන්ද්‍රාදිත්‍ය, රෞද්‍රරූපී, රක්ත නේන්ද්‍ර රහු හඳුන්වන නම් වන අතර මෘත්‍යු පුත්‍ර, අහල, ධුම, ශිඛි, කේතු හඳුන්වන පර්යාය නාමයන් ය.

මහා සෘෂි මතයට අනුව රාහු වෘෂභයේ උච්චය කටකයේ මූල ත්‍රිකෝණය, කන්‍යාවේ ස්වක්ශේත්‍රය වෘශ්චික කේතුගේ උච්ච රාශියයි. මිථුන මූල ත්‍රිකෝණ රාශිය වන අතර ධනු මීණ ස්වක්ෂේත්‍ර රාශියයි. රාහුට මනුෂ්‍ය ශරීරයක් හා හිස නයි පෙනෙයක ස්වරූපයෙන් ද කේතුට මනුෂ්‍ය ශරීරයක් හා ඉනෙන් පහළ සර්ප කඳක් ද පිහිටා තිබීමෙන්ම ජනතාව අතර අසුබවාදී දෘෂ්ටියක් ගෙනහැර දක්වා තිබීම ම මේ ග්‍රහයන් පිළිබඳ බිය උපදවන සුලු වෙයි.

ඒ කෙසේ වෙතත් රාහු කේතු පිළිබඳ විවිධ මත පළ කළ හැකි වුව ද 2020 සැප්තැම්බර් 23 දින පෙරවරු 10.43ට රාහු වෘෂභ රාශියටත් කේතු වෘශ්චික රාශියටත් සංක්‍රමණය විය. රාහුට වඩා කේතු අංශක 180 ක දුරින් පිහිටි නිසා සැම විටම කේන්ද්‍රගත වීමේදී රාහුත් සෘජු දෘෂ්ටියක එනම් ඊටම ප්‍රතිවිරුද්ධ රාශියේ පිහිටයි. මේ අනුව රාහුට උච්ච ස්ථානය කේතුට නීචව ද කේතුට උච්ච ස්ථානය රාහුට නීචවද විද්‍යමාන වේ. ඒ අනුව වූ රාහු වෘෂභයටත් කේතු වෘශ්චිකයටත් සංක්‍රමණය වූ මේ මොහොත අපට ලග්න වශයෙන් බලපාන අයුරු සලකා බලමු. විශේෂයෙන් ම රාහු කේතු සෙනසුරු කුජ සෘජුවම පීඩිත ජනතාවට බලපාන දුකට, එසේත් නැතිනම් අගතියට පත් කෙරෙන නපුරු අසුබවාදී ග්‍රහයන් ලෙස හැඳින්වූවද මෙවර උච්ච වන රාහු කේතු රට ජනතාවට බලපාන ආකාරය සතුටුදායක වෙයි. මීට පෙර පීඩාකාරී ලෙස හැසිරුණු රාහු කේතු නිසා අප රටේ ව්‍යසනකාරී පරිසරයක් ගොඩනැඟුණි. වසංගත උවදුරු, රාජ්‍යතාන්ත්‍රික අවුල් වියවුල්, පාරිසරික ව්‍යසන, අසමගිතා ඇතුළු නොමනා දේ සිදුවිය. විශේෂයෙන්ම මත්කුඩු - මත් උවදුරු - පාතාල - අවිහරඹ එදිරිවාදිකම් අවිනීතික කටයුතු ද පරිසර විනාශයන් ද බොහෝ සිදුවනවා අපි දුටිමු. එහෙත් අද ඒ සැම අවසන් කරන්නට මෙන් රාහු, කේතු මෙතැන් සිට යහපත් ගමනක් අරඹා ඇතැයි සිතීමට පුළුවන. ඒ අනුව අපි එකිනෙක ලග්නවලට බලපාන අයුරු සලකා බලමු. සංක්‍රමණයෙන් රාහු කේතු 2039 අප්‍රේල් 30 දක්වා පවතී.

### මේෂ ලග්නය
#### ආර්ථික පසුබෑම්

**මේෂ ලග්නය** හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව රාහු 02 වැන්නටත් කේතු 08 වැන්නටත් පැමිණ ඇති නිසා විටින් විට ආර්ථික පීඩා අවහිරතා පැමිණෙනු ඇත. ශරීර සෞඛ්‍යය ද අයහපත් වීමට ඉඩ ඇත්තේ 8 වැන්න වන අසුබ ස්ථානයේ කේතු පීඩාවක් සිදුවිය හැකි නිසාය. ඒ අනුව තුනටියේ අමාරු උගුරේ ආසාදිත මතුවේ. ඒ අතරම සොර සතුරු කරදර තම ධන සම්පත් කෙරේ එල්ලවිය හැකිය. විශේෂයෙන් ඔබ ඇසුරු කරන අයගෙන් ප්‍රවේශම් විය යුතුයි. කරන කටයුතු දෙවතාවක් සිතා බලා කළ යුතු වෙයි. ආගමික කටයුතු කෙරේ යොමුවන්න.

### වෘශ්චික ලග්නය
#### විවාහ ගැටලු විසඳේ

**වෘශ්චික ලග්නය** හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව රාහු 07 වැන්නට හා කේතු 01 වැන්නට පැමිණ සිටීම නිසා විවාහගත යම් යම් මතභේද ඇති විය හැකි නමුත් කේතු ලග්නයේ නිසා ඒවා බුද්ධිමත්ව විසඳා ගැනීමට ඔබට හැකි වේ. ඒ අතරම අවිවාහක අයට විවාහ යෝජනා ද තරුණ තරුණියන්ට ආදරය ආලය පිළිබඳ සහ සම්බන්ධතා ද එළඹෙන වකවානුවකි. තම කටයුතු කෙරේ අන් අයගේ ඇප උපකාර ලැබෙන බොහෝ අය ඔබගේ ශක්තිය පිණිස පැමිණෙන අධිෂ්ඨානය සිතට එන වකවානුවකි.

### ධනු ලග්නය
#### විදේශගත අයකුගේ උපකාර

**ධනු ලග්නය** හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව රාහු 06 ට හා කේතු 12 ට පැමිණ තිබීම විශේෂයෙන් විදේශගත අයෙකුගෙන් ඇප උපකාර ලැබෙන කාලයකි. යටිබඩ ආශ්‍රිත උවදුරු විශේෂයෙන් පාදයේ වළළුකර ආශ්‍රිත උවදුරු එළඹීමට පුළුවන. තවද මුත්‍ර ආසාදිතයන් - බඩු පිපුම ආදි රෝග තත්ත්වයන් නිසා ප්‍රවේශම් වන්න. තවද ඔබ කිසියම් ව්‍යාපාරයකට අතගසනවා නම් සුදුසුම කාලය මෙයයි. අන් අය ඔබට ඇප උපකාර සලසනු ඇත. එසේම ඔබ කරන ඕනෑම කටයුත්තක් අන් අයගේ පැසසුමට හේතුවනු ඇත. උපරිම වතුර පානය නිසි වේලාවට ආහාර ගැනීමට අමතක නොකරන්න.

### මකර ලග්නය
#### ලොතරැයි ජයග්‍රහණ හිමිවේ

**මකර ලග්නය** හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව රාහු 05 ට හේතු 11 ට පැමිණ තිබීම නිසා විශේෂයෙන් ඔබට හිමි වෙන්නට තිබී ඔබෙන් දුරස්වූ ආර්ථික ලැබීමක් ඔබට හිමි වෙයි. ජලාශ්‍රිත කටයුතු කෙරෙන් ඔබට වාසි සැලසේ. මේ දිනවල විශේෂයෙන් ලොතරැයි ජයග්‍රහණ හිමි වනු ඇත.

තරග විභාගාදියෙන් විශිෂ්ට ප්‍රතිඵල අත්වේ. කුස ආශ්‍රිත ආසාදිතයන් මතු කෙරෙන නිසා ප්‍රවේශම් වන්න. තව ද ඔබ හවුල් ව්‍යාපාර කිරීමේදී කල්පනාකාරී වන්න. නැත්නම් අන් අයගේ උපක්‍රම රැවටිලිවලට හසුවීමට ඉඩ ඇති නිසාය.

## රාහු කේතු යහපත් ස්ථානයකට එයි

### වෘෂභ ලග්නය
#### අත් වැරදීම් අතපසුවීම් සිදුවේ

**වෘෂභ ලග්නය** හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව රාහු ලග්නගත වී කේතු 7 වැන්නට පැමිණීම මානසික අසහනය දලුලන අතර එදිනෙදා කටයුතු පිළිවෙළට කරගෙන යෑමට නොහැකි වීම නිසා සිත් තැවුල්, තරහ කේන්තිය ඇති වීම යනාදියට හේතුය.

විවාහස්ථානගත අසමගිතා නොසන්සුන්තා වලට මුහුණ දීමට බොහෝවිට සිදුවන නිසා කල්පනාකාරී වන්න. තම එදිනෙදා කටයුතුවලදී සුපරික්ෂාකාරී වන්න. නොඑසේ නම් අත් වැරදීම් අතපසුවීම් නිසා පීඩා විඳීමට සිදුවනු ඇත. ආදරය ආලය වැනි කටයුතු කෙරෙන් සිත් තැවුල් ඇති වනු ඇත.

### මිථුන ලග්නය
#### ව්‍යාපාර ලාභ

**මිථුන ලග්නය** හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව රාහු 02 වැන්නට හා කේතු 06 වැන්නට පැමිණීම නිසා ඔබට ව්‍යාපාර ලාභ හිමි විය හැකි නමුත් ඒවා ඉතා ක්ෂණයෙන් නැති නාස්ති වීමට ඉඩ තිබේ.

තවද යටි බඩ ආශ්‍රිත උවදුරු මුත්‍රා දෝෂ මුත්‍රගල් හා වකුගඩු රෝගය පවතින අයට එම රෝග උත්සන්න වීමටද හේතු වේ. කෙසේ නමුත් ඔබ ප්‍රවේශම් වනවා නම් ඉතා හොඳ සිහි බුද්ධියෙන් කටයුතු කරනවා නම් ඒවා වළකාගැනීමට ඔබට හැකිවනු ඇත.

ඔබ පිටරටකට යෑමට බලාපොරොත්තු වන්නේ නම් ඒ සඳහා සුදුසු පසුබිම සැකසේ.

## උගතුන්ට සහනදායක කාලයක්

### කටක ලග්නය
#### ආර්ථික වාසි සැලසේ

**කටක ලග්නය** හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව රාහු 11 වැන්නටත් කේතු 05 වැන්නටත් පැමිණීම ලැබීම් ඇති කරන ව්‍යාපාර ලාභ මතු කෙරෙන පිහිටීමකි. 11 ඒ රාහු උච්චවීම ඔබට දණහිස ආශ්‍රිත වේදනා කැක්කුම් ඇති කළද ඒ තම කාර්ය බහුලත්වය නිසා මිස රෝගී තත්ත්වයක් මත නොවනු ඇත.

තරමට සුදුසු ලෙස තම ශ්‍රමය කැපවීම කළ යුතුය. කුස ආශ්‍රිත යම් ආසාදිත තත්ත්වයක් සැර උෂ්ණ ගතියක් මතුවිය හැකි නිසා උෂ්ණ ආහාර පානාදියෙන් ප්‍රවේශම් වන්න.

උපරිම වතුර පානය, නිසි වේලාවට ආහාර ගැනීම සුදුසු වනු ඇත.

### සිංහ ලග්නය
#### රැකියා ප්‍රතිලාභ

**සිංහ ලග්නයට** අනුව ඔබගේ කේන්ද්‍රයේ රාහු 10 ටත් කේතු 4 ටත් පැමිණ උච්චවීම රැකියාගත ප්‍රශ්න රැසකට විසඳුම් ලැබේ.

රාහු සුදුසුම තැන 10 වැන්න වන අතර 10 වැන්න රැකියා ස්ථානයද වන නිසා එය එසේ වන අතර වියදම් පැත්ත නම් ඉහළ යනු ඇත. ඔබ ඉතා සුපරික්ෂාකාරී විය යුත්තේ සකසුරුවම් බව සමානාත්මතාව පිළිබඳවයි. තවද සැර උෂ්ණ ආහාර රටාව නිසා අගුණ ඇති විය හැකි අතර පපුවේ වියළි බව සෙම වියළන බව පෙනෙන්නට ඇති නිසා ප්‍රවේශම් වන්න. දණහිසේ කැළැල් මතු කෙරෙන උවදුරු විය හැකි බැවින් ඒ පිළිබඳව ද සැලකිලිමත් වන්න.

## අවිවාහක අයට ප්‍රබල මංගල යෝග

### කන්‍යා ලග්නය
#### පුණ්‍යවන්ත ගති මතුවේ

**කන්‍යා ලග්නයට** අනුව ඔබගේ කේන්ද්‍රයේ රාහු 09 ට පුණ්‍ය ස්ථානගතව ද කේතු 03 වැන්න දේපළ පිළිබඳ නියෝජනය වන ස්ථාන ගතවද පිහිටා ඇති නිසා ජීවිතයේ තමාට හිමි බොහෝ සම්පත් උරුමවේ. ඒ සඳහා මෙතෙක් ඔබ ගෙන ආ පුණ්‍යක්‍රියා හේතුවනු ඇත. විශේෂයෙන් විවාහ පාර්ශ්වයෙන් හෝ තම මව පියා වැනි වැඩිහිටි පාර්ශ්වයකින් ලැබෙන ඒ වස්තු සම්පත් ඔබට කිසියම් අස්වැසිල්ලක් වනු ඇත.

ආගමික සහජීවනය සිතට ගෙන කටයුතු කරන්න. කලක් පැවති නීති ගැටලුවක් විසඳෙන ලකුණු පළවේ. ඒ තුළින් ආර්ථික වාසියක් ද හිමිවන බව පෙනෙන්නට තිබේ.

### තුලා ලග්නය
#### මානසික කායික අසහනය

**තුලා ලග්නයට** අනුව ඔබගේ කේන්ද්‍රයේ රාහු 08ට කේතු 02 ට පැමිණීම ශාරීරික උපද්‍රව මෙන්ම මානසික අසහනකාරී තත්ත්වයකට මුහුණ දීමට සිදුවන කාලයකි. එහෙත් අධිෂ්ඨානය මත එම අසුබතා සුබ පැත්තට නැඹුරු කරවා ගැනීමට ඔබට පුළුවන.

කෙසේ නමුත් තුනටියේ අසුබතා උගුරේ ආසාදිත තත්ත්වයන්ට මුහුණ දීමට ඔබට සිදුවන නිසා කල්පනාකාරී වන්න.

කොයිදේ කළත් අපිළිවෙළ නිසා තමාට වන ආර්ථික පාඩු නොවැළැක්විය හැකි තත්ත්වයක් මතු කෙරෙන නිසා ප්‍රවේශම් වන්න.

## විභාග අපේක්ෂකයන්ට සුභ කාලයක්

### කුම්භ ලග්නය
#### හදිසි උවදුරු කරදර

**කුම්භ ලග්නය** හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව රාහු 04 ට කේතු 10 ට පැමිණ ඇති නිසාත් වියදම් අධික කෙරෙන හදිසි උවදුරු කරදර පැමිණෙන කාලයක් නිසාත් ප්‍රවේශම් වන්න.

විශේෂයෙන් නහරගත රෝග පපුවට බලපාන තත්ත්වයකි. තෙල් අධික ආහාර ගැනීමෙන් වළකින්න.

දණහිස ආශ්‍රිතවද කැළැල් ඇති වීමේ අවදානම පවතින නිසා ගමන් බිමන් වලදී වාහනවලින් ගමන් කිරීමේදි ප්‍රවේශම් වන්න. නමුත් කැපවීමෙන් කටයුතු කළොත් ව්‍යාපාර ආයෝජනයක් සඳහා සුදුසුම කාලයකි.

### මීන ලග්නය
#### පෙර පින් මතුවේ

**මීන ලග්නය** හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව රාහු 03 වැන්නටත් කේතු 09 වැන්නටත් පැමිණ සිටීම ඔබ පුණ්‍යවන්තයකු කරන පිහිටීමකි.

දෙමාපියන්ගේ ලැබිය යුතු උරුමයකට හිමිකම් කියයි. නැතහොත් ඔබගේ සහකරු හෝ සහකාරිය වෙතින් ලැබෙන්නට තිබෙන උරුමයක් ද විය හැකිය.

එය ඔබගේ පුණ්‍යවන්ත භාවය මත සිදු කිරීමට මෙම රාහු කේතු බලපෑම ඉවහල් වන අතර ආර්ථික වාසි මෙන්ම ඔබට කලක් තිස්සේ පැවතුණා වූ නීති ගැටලුවක් විසඳී යාම තුළ ආර්ථික ලැබීමක් ද විය හැකියි. කෙසේ නමුත් ඔබ උරහිස ආශ්‍රිත දණහිස ආශ්‍රිත හදිසි ආපදාවකට ගොදුරුවිය හැකි නිසා කල්පනාකාරී වන්න.

තරංග



කොල්ලුපිටියේ දැනට දක්නට නැති ඇල්ෆ්‍රඩ් මන්දිරය

# වසර 130කට පෙර සිදුවූ මහා දානපති

# චාල්ස් සොයිසාගේ අද්භූත මරණය



● ජානක පෙරේරා

**චාල්ස් හෙන්රි ද සොයිසා දහනවවන සියවසේ මැද භාගයේ ලංකාවේ විසූ නමගිය මහා දානපතියෙකි. වසර එකසිය තිහකට පෙර සිදු වූ ඔහුගේ අද්භූත මරණය අදටත් කුතුහලය දනවන්නකි. රටේ ඉහළම ප්‍රභූ පැලන්තිය සමඟ පමණක් නොව, එංගලන්ත රජපවුල සමඟ ද සම්බන්ධකම් පැවැත්වූ ඔහු ජලභීතිකාවෙන් මියයාම බොහෝ දෙනෙකු කම්පනයට පත්කළා පමණක් නොව, ඔවුන්ට එය අදහා ගත නොහැකි විය. ලියුම්කරු කුඩා කල මේ කතාව මුලින්ම ඇසුවේ සිය මව් පාර්ශ්වයේ මිත්තනිය ගෙනි. මේ ගැන දිගු විස්තරයක් ඇත්තේ වසර 1904 දී සී. දොන් බස්තියන් විසින් ලියා පළකරන ලද "චාල්ස් හැන්රි ද සොයිසා ගේ ජීවිත කතා ශරීරය" නම් කෘතියෙහිය.**

අති සාර්ථක වැවිලි කරුවෙකු සහ ව්‍යාපාරිකයකු ලෙස ඉමහත් ධනස්කන්ධයක් උපයාගත් සොයිසා මහජන ශුභ සිද්ධිය සඳහා නොමසුරුව මුදල් වියදම් කළේය. ඔහු තරුණ වයසේ සිටම පරිත්‍යාගශීලී පුද්ගලයෙකු විය. අද කොළඹ ඇස් වාට්ටුව ලෙසින් හැඳින්වෙන ස්ථානයට එනම ලැබීමට හේතුවූ මෙරට පළමු ඇස් රෝහල සහ ද සොයිසා මාතෘ නිවාසය ද ගොඩ නැගුනේ ඔහුගේ වියදමිනි. මොරටුවේ වේල්ස් කුමර, කුමරි විදුහල්, බොරැල්ලේ පොදු සුසාන භූමිය පිහිටුවීම ඔහුගේ අනෙකුත් සේවාවන් අතර වෙයි.

ගාලු මුවදොර, කොල්ලුපිටිය කොටුව සහ පිටකොටුව යන පෙදෙස්වල වාණිජ ගොඩනැගිලි බොහොමයක්ද ඉදිවූයේ ඔහුගේ වියදමෙනි. මෙරට පළමු බැංකු කරුවා ලෙස වසර 1860 මහනුවර බැංකුව සහ එහි ශාඛාවක් පිටකොටුවේ පිහිටුවීමද ඔහු අතින් සිදුවිය. පළමු වරට මෙරට විශ්‍රාම වැටුප් ක්‍රමයක් (සිය සේවකයන්ට) හඳුන්වාදුන්නේ ද චාල්ස් ද සොයිසාය. රජයේ සහ වෙනත් ආයතන එම ක්‍රමයට අනුගත වූයේ ඉන් පසුවය. ඔහු ලංකාවේ පමණක් නොව එංගලන්තයේ රෝහල් වලට ද මුදල් පරිත්‍යාග කළේය.

චාල්ස් ද සොයිසා මහතා මුදලිවරයෙකු වූ වරුසහෙන්නැදි ජෙරෝනිස් ද සොයිසා දිසානායක සහ ෆරන්සෙස්කා ද සොයිසා ළමාතැනීගේ එකම පුතණුවන් ලෙස වසර 1836 මාර්තු 3 වැනිදා මොරටුවේ උපත ලැබීය. මොරටුවේ පල්ලියගොඩැල්ල බෞද්ධ විහාරයේදී මූලික අධ්‍යාපනය ලැබූ ඔහු වැඩිදුර අධ්‍යාපනය ලැබුවේ කොළඹ ඇකඩමිය (පසුකලෙක රාජකීය විදුහල) සහ ශාන්ත තෝමස් විදුහල්වලින්ය. භක්තිමත් ඇන්ග්ලිකන් (එංගලන්ත සභා) කිතුනුවෙකු වූ ඔහු මොරටුවේ කැතරින් ද සිල්වා දෙවාදිත්‍ය මෙනෙවිය සමඟ 1863 පෙබරවාරි 4 දා විවාහ වී පසුව කොළඹ කොල්ලුපිටියේ බගතලේ වලව්වේ පදිංචි විය. අදත් එම පෙදෙස බගතලේ නමින් හැඳින්වෙයි.

## රාජකීය භෝජන සංග්‍රහය

සොයිසාගේ දිවියේ සුවිශේෂ සිද්ධියක් වූයේ 1870 මාර්තු-අප්‍රේල් දෙමසේ එඩින්බරෝ හි ආදිපාදයා වූ එංගලන්තයේ ඇල්ෆ්‍රඩ් කුමරු එවකට බ්‍රිතාන්‍ය යටත් විජිතයක්ව පැවති ලංකාවේ කළ සංචාරයේදී ඔහු වෙනුවෙන් රාජකීය භෝජන සංග්‍රහයක් පැවැත්වීමට අවස්ථාවක් ලබාගැනීමයි. ඇල්ෆ්‍රඩ් කුමරු බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ නායිකාව වූ වික්ටෝරියා මහ රැජින ගේ දෙවන පුත්‍රයාය. සොයිසා භෝජන සංග්‍රහය සඳහා මෙරට බ්‍රිතාන්‍ය ආණ්ඩුකාර හර්කියුලිස් රොබින්සන් මගින් කුමරුට ආරාධනා පත යැවූයේ ඔහු මෙරටට පැමිණීමට තෙමසකටත් කලින්ය.

ඇල්ෆ්‍රඩ් කුමරු ආරාධනය පිළිගත් විගසම සොයිසා කාමර සියයකින් යුත් මන්දිරය (පසු කලෙක ඇල්ෆ්‍රඩ් මන්දිරය) ගොඩ නැගීම ඇරඹීය. ඒ සඳහා ඔහු යොදාගත්තේ අක්කර එකසිය දොළහක් පමණ වූ බගතලේ වලව්ව පිහිටි විශාල බිමය. එහි එක් පැත්තක් කොල්ලුපිටිය ගාලු පාරේ සිට තර්ස්ටන් පාර දක්වාත් අනෙක් පැත්ත බගතලේ පාරේ සිට බම්බලපිටියේ පාසල් මාවත දක්වාත් විහිදුනි.

ඉක්මනින්ම ගෘහ නිර්මාණ ශිල්පීන්, කම්කරුවන් රැසක් දිවා රෑ නොබලා සේවයේ යෙදවූ සොයිසා දින අසූවකින් මන්දිරය ගොඩනගා නිම කරවීය. එංගලන්තයෙන් සහ බෙල්ජියමෙන් ගෙන්වූ විශේෂ ලැකර් සායම් එහි බිත්තිවල ආලේප කරන ලදී. ඇල්ෆ්‍රඩ් කුමරුට ගෞරව පිණිස එය 'ඇල්ෆ්‍රඩ් හවුස්' යනුවෙන් නම් කෙරුනි. එය මෙරට ගොඩනැගුනු විශාලතම මන්දිරය වූ අතර අදටත් එම පෙදෙස හැඳින්වෙන්නේ 'ඇල්ෆ්‍රඩ් මන්දිර උද්‍යානය' යන (Alfred House Gardens) නමිනි. එදා තනි යෝධ ගොඩනැගිල්ලක් පිහිටි එම බිමේ අද නිවෙස් දෙසියයකට වඩා ඇත.

ඇල්ෆ්‍රඩ් කුමරුට අවශ්‍ය හැඳි ගැරුප්පු රන්කරුවකු ගෙන්වා රනින් නිම කෙරුනි. ඒ භාණ්ඩ අතර තැටි දෙකක්, ෂැම්පේන් පානයට භාජන තුනක්, ගැරුප්පුවක්, පිහියක් සහ හැන්දක් ද ඇතුළත් විය. වසර 1870 අප්‍රේල් 22 දින ඇල්ෆ්‍රඩ් හවුසියේ පවත්වා ඇති සාදය ඇල්ෆ්‍රඩ් කුමරුගේ සිත්ගත් එකක් වූ බව කුමරුගේ දින පොතේ සටහන් කර ඇත. එය රාජකීය ලේඛනාගාරය සාක්ෂි දරයි. නැටුම් - ගැයුම් - වැයුම් නොඅඩුව මුළු රැයක් පහන්වන තුරු පැවැත්වූ අතිශය චමත්කාර ජනක වූ සැණකෙළියට කොල්ලුපිටියේ පිලිප්පු සිඤ්ඤෝ විසින් රචනා කරන ලද 'ඇහැලේපොළ නාඩගම' රඟදැක්වූ බවට සාක්ෂි ඇත.

එවකට තිස් හතර හැවිරිදි සොයිසා මේ උත්සවයෙන් පසු එම වසරේම එංගලන්තයට ගියේය. ඔහු නැවත සියරට පැමිණියේ විසි වසරකට පසුවය. ඒ වනවිට ඔහුගේ වයස පණස් හතරකි. ජ්‍යොතිෂය දැඩි ලෙස විශ්වාස කළ ඔහු මෙරටට පැමිණි සැණින් ගල්කිස්සේ තම්බි අප්පු ගුරුතුමාට පණිවුඩයක් යවා ගෙන්වාගෙන ඔහු ලවා තම කේන්දරය පරීක්ෂා කරවීය. තම්බි අප්පු ගුරුතුමා සොයිසාගේ 'වේලාව' බැලීමට ඇල්ෆ්‍රඩ් මන්දිරයට නිතර ආගිය අයෙකි.

කේන්දරය බැලූ තම්බි අප්පු පැවසුවේ සොයිසාට ඉතා අපල කාලයක් උදා වී ඇති බවත් විෂ දෝෂ සහ සිවුපා සතුන්ගෙන් බියකරු අනතුරු විය හැකි විය හැකි බවත්ය. වසර 1890 ජූලි 30 වැනිදා තම්බි අප්පු සමඟ සොයිසා හමුවූ පුලිනතලාරාමාධිපති වැලිගම ශ්‍රී සුමංගල ගණාචාර්ය නායක හිමියන්ද එය සනාථ කළේය.

පසුදා අලූයම සොයිසා සිහිනෙන් බියවී කෑගසනු ඇසී ඔහුගේ හිතවත්ම සේවකයා සිය හාම්පුතා වෙත දිව ගියේය. සිහිනෙන් බිය වී සිටි සොයිසාගේ සිරුර දහදියෙන් තෙත් වී තිබිණ.

"උස දත් ඇති දිග නියපොතු ඇති කළු යෝධ මිනිහෙක් ආයුධත් අරගෙන මාව හපා කන්න පැන්නා" යයි කියූ ඔහු සේවකයා ලවා වතුර පිරවූ සෙම්බුවක් ගෙන්වාගෙන එය උගුරට දෙකට බීවේය.

මේ කාලයේ මන්තර ගුරුකම් ගැන සුප්‍රසිද්ධව සිටි අයෙකි වූයේ බත්තරමුල්ලේ ශ්‍රී සුභූති හිමි. සොයිසා මන්තර ගුරුකම් ගැන එතරම් සැලකිල්ලක් දැක්වූ පුද්ගලයකු නොවූ නමුත් සුභූති හිමියන්ගේ කෙරුවාවන් ගැන ඔහු හොඳින් දැන සිට ඇත.



චාල්ස් ද සොයිසාගේ සහ කැතරින් ද සිල්වා දෙවාදිත්‍ය මෙනෙවිය ගේ මංගල සේයාරුව.

## සුභූති හිමියන් හා ගැටුම

දිනක් තම මන්දිරයේ සඳලුතලයට වී පාර දෙස බලා හුන් සොයිසා මහතාට දැකගත හැකි වූයේ පාරේ වඩින බත්තරමුල්ලේ සුභූති හිමියන්ය. ඒ දුටු ඔහු උන්වහන්සේ තම මන්දිරය අසලින් යන විට හීන් හඬින් 'මුත්තර බල්ලෙක් යනවා''යි කියා ඇත. ඒ නිග්‍රහය බත්තරමුල්ලේ හිමිට ඇසුනෙන් ඉන් ඉමහත් කෝපයට පත් වී තමන්ව සොයිසා මහතාට හොඳින් පෙනෙන තැනකට ගොස් දබර ඇඟිල්ල දිගු කොට මෙසේ තර්ජනය කර ඇත.



චාල්ස් හෙන්රි ද සොයිසා

''හොඳයි මම උඹට මුත්තර බල්ලෙක් එවන්නම්!''

සොයිසාට එය හරිහැටි ඇසුනේ නැතත් උද්‍යානයේ මල්වලට සාත්තු කරමින් සිටි ඔහුගේ සේවකයෙකුට එය හොඳට ඇසුනි. හාමුදුරුවන්ගේ කෙරුවාව දත් ඔහු බියපත්ව ඒ බව සිය හාම්පුතාට සැල කළේය.

සොයිසාගේ ඉරණම විසඳූ සිදුවීම් මෙතැන් සිට වඩාත් හොඳින් විස්තර කරන්නේ බත්තරමුල්ලේ හිමියන් දැන හැඳින සිටි පොත් ප්‍රකාශකයෙකු වූ පී.කේ. ඩබ්ලිව්. සිරිවර්ධනය. වසර 1894 දී උපත ලබා 1982 දී මියගිය ඔහුගේ දෙමාපියන් සොයිසා පවුලේ සමීපතමයෝ වූහ. සිරිවර්ධන පවසන අන්දමට නැවත පන්සලට වැඩම කළ සුභූති හිමියන් තම කුටිය වසාගෙන දින ගණනාවක් ජප කරන්නට පටන් ගෙන ඇත.

## ඉරණම විසඳූ සුරතල් බල්ලා

චාල්ස් ද සොයිසා බල්ලන්ට දැක්වූයේ දැඩි ඇල්මකි. ඔහුගේ ගෙදර ආදරයට ඇති කළේ 'ටෙරියර්' (Terrier) වර්ගයේ බැල්ලකි. දිනය මීට වසර එකසිය තිහකට පෙර 1890 අගෝස්තු 2 වැනිදාය. හිටි අඩියේ වියරු වැටුණු ඒ බැල්ලිය මුලින්ම ගොස් ඇත්තේ මන්දිරයේ කුස්සියට ය. එය දෙතුන් සියයකට වුවත් ආහාර පිසිය හැකි පන්නයේ එකකි. උගේ හැසිරීම නොඉවසූ අරක්කැමියා ඌට දර පොල්ලකින් පහර දී එළවා දමා ඇත. මන්දිරයේ එවකට සේවකයන් විසි ගාණක් සිට ඇති අතර විශාල ගෙවත්තේ සත්ව උද්‍යානයක් ද තිබී ඇත. නමුත් ඒ කිසිවකු සපා කන්නට ඌ ගොස් නැත.

එදින උදෑසන අවදි වූ සොයිසා ලී තරප්පුවේ පඩි එකින් එක බහින්නට විය. ඔහු දෙස බිම්මහලේ සිට බලාසිටි බැල්ලිය ක්ෂණයකින් එක හැල්මේ සොයිසා මහතාගේ බෙල්ල දෙසට පැන්නාය. අන්දමන්ද වූ සොයිසා උගේ බෙල්ල තදින් අල්ලාගත්තේය. ඌ පැන්නේ හුරතලයට නොවන බව ඒ මොහොතේ ඔහුට වැටහිනි. බැල්ලිය ඔහුගේ වම අත ලේ එනතුරු සපා කන්නට වූවාය. බැල්ල පැයකට වඩා සොයිසා මහතා බිම් මහලට එනතුරු තරප්පු පෙළ යට කුරුමානම් අල්ලමින් සිට ඇත.

"'මූ දාන්න කුඩුවක් ගෙනෙන්!" සොයිසා බියපත්ව කෑගැසීය . මන්දිරයේ මුරකරු වහා යකඩ කූඩුවක් ගෙන වැර යොදා තවත් සේවකයෙකුගේද සහයෙන් බැල්ලිය කූඩුවට දමා ඉබි යතුරු දැමීය. වියරුවෙන් සිටි බැල්ලිය යකඩ කුරු හපා කමින් සෙම බේරන්නට වූවාය.

සොයිසා ගේ වැඩිමහල් දියණිය ජෝජිනා කැතරින් සමඟ විවාහ වී සිටි දොස්තර සොලමන් ප්‍රනාන්දු සිය මාමණ්ඩියගේ තුවාල වලට බේත් දමා, ඔහු සාපා කනු ලැබීමට පෙර බැල්ලියගේ හැසිරීම සම්පූර්ණයෙන් නිරීක්ෂණය කළේය. (කතෝලිකයෙකු වුවද පසු කලෙක 1915 ජාතිභේද කෝලාහලයේදී සිංහල බෞද්ධ නායකයින් සිරගත කිරීම ගැන බ්‍රිතාන්‍ය යටත් විජිත පාලකයන්ට විරුද්ධව දැඩි ලෙස කතා කතා කළේ සොලමන් ප්‍රනාන්දුය)

## අවසන් මොහොත

සොයිසා ගේ රෝගී බව කෙමෙන් ජලභීතිකා තත්ත්වයකට හැරුනෙන් වෛද්‍ය සොලමන් ප්‍රනාන්දු ගේ නිර්දේශය වූයේ රෝගියා එවකට ප්‍රංශයේ සිටි ලෝකයේ අංක එකේ ජලභීතිකා විශේෂඥ වෛද්‍යවරයාට යොමු කිරීමය. ගුවන් යානා නොතිබූ ඒ කාලයේ ප්‍රංශයට නැව් නැගීමට සොයිසා ඇතුළු පිරිසට ටිකට් පත් ද මිලදී ගත්තේය. ඒ ගමනට එරෙහි වූ දේශීය වෛද්‍යවරු කියා සිටියේ දින ගණනක් ගතවන මුහුදු ගමන ජලභීතිකා රෝගීන්ට අකැප බවත් ඊට හොඳම බෙහෙත හෙළ වෙදකම බවත්ය. ඒ අනුව ප්‍රංශ ගමන අත්හරින ලදුව රෝගියාට දේශීය ප්‍රතිකාර කරන්නට තීරණය කෙරුනි

මේ අතර දිනෙන් දින කුඩු කළ බැල්ලියගේ උමතු ලක්ෂණ ඔඩු දුවන්නට විය. ඇස් බලන්නට බැරි තරම් රෞද්‍ර වූ අතර ජල වීදුරුවක් වත් කූඩුව අසලින් ගෙන යන්නට බැරි විය. සොයිසා මහතා හපා කා හත්වැනි දිනේ දී පැය ගණනාවක් පළාතම දෙදුරුම් කවමින් විලාප දුන් බැල්ලිය එක්වරම යකඩ කුරක් වියරුවෙන් හපා කමින් සෙම පෙරාගෙන කූඩව තුළම මැරී වැටුනාය. කූඩුවේ තිබූ ආහාර කිසිවක් නොකෑ බැල්ලිය දින හතක් නිරාහාරව සිට ඇත.

දේශීය වෙදකමට කොළඹින් බේත් සොයා ගැනීමට ඇති අපහසුව නිසා 1890 අගෝස්තු හයවනදා චාල්ස් සොයිසා මොරටුවේ වලව්වට ගෙන යන ලදී. මොරටු වලව්වේ වෙද මහතුන් තිදෙනෙක් සඳහා නවාතැන් සකස් කරන ලදී. 1890 අගෝස්තු නවවැනි වැනි දින මධ්‍යම රාත්‍රියේ මොරටු වලව්වම දෙවනත් කරමින් මහ හඬින් කෑ ගසමින් සොයිසා මහතා නින්දෙන් අවදි විය.

''කුරුල්ලන් කීප දෙනෙක් පියාසර කරමින් ඇවිත් මගේ තුවාලවලට කොටමින් හාරා කන්නට පටන් ගත්තා.'' සොයිසා මහතා නිදිවරමින් තම කුටියේ සිටි වෙද මහතුන් තුන්දෙනාට පැවසීය. වෙද මහත්වරු මුහුණට මුහුණ බලාගත්හ. සිහින පලාපල හොඳින් දත් ඔවුහු සිහිනයේ 'අසුබ පල' අවබෝධ කරගත් නමුත් ඒ ගැන අර්ථකථනයක් දීමට නොගියහ. ඔවුහු වෙනදාටත් වඩා උනන්දුවෙන් බේත් කරන්නට වූහ.

1890 සැප්තැම්බර් 28 වැනි ඉරු දිනට උදා විය. සොයිසා එදා නියම පිස්සු බලූ ලක්ෂණ පෙන්වීය. බැල්ලිය සපා කෑ අත බලා ඉඳිත් දී ඉදිමෙන්නට වූ අතර වේදනාව ඉවසාගත නොහැකිව සොයිසා විලාප දුන්නේය. වතුරට බියවීම, වතුර ගිලීමට අමාරුව, එළිය අප්රිය වීම, ආදි සියලූ ලක්ෂණ පෙන්නුම් කරන බැවින් තමා මේ කෙමෙන් ළඟා වන්නේ මරණයට බව සොයිසා තේරුම් ගත්තේය. ඔහු වහාම මොරටුව ශුද්ධ එම්මානුවෙල් පල්ලියේ අධිපති ජොහානස් ද සිල්වා පූජකතැන සහ නීතිඥ ලෝස් වැන්කියු ලැන්බර්ග් යන දෙදෙනා කැඳවන ලෙස නියෝග කළේය.

පූජකවරයා ලවා ආගමික චාරිත්‍ර ඉටු කරවාගත් සොයිසා තම දේපළ නිරවුල්ව පවරා දීමට අන්තිම කැමැති පත්‍රය සකස් කරන ලෙස සිය නීතිඥයින්ට නියම කළේය. අන්තිම කැමති පත්‍රය අත්සන් කර ටික වේලාවකට පසු සොයිසා සියලූ උමතු බලූ ලක්ෂණ පෙන්නන්ට වූයේ බලා සිටියවුන් බියපත් කරමිනි. වියරු වැටීම වැළැක්වීම සඳහා ශරීර ශක්තිය අඩපණ කිරීමට දුන් බේත් වඩියක් හක්කේ තබාගෙනම ඔහු නින්දට වැටුනි. එදින රාත්‍රියේ නවයට එනම් 1890 සැප්තැම්බර් 29 වැනි සඳු දින චාල්ස් ද සොයිසා අවසන් හුස්ම හෙළීය. එදිනට ඔහුගේ වයස අවුරුදු පනස් හතරකුත් මාස හයක් විය.

මුඛ පරම්පරාවෙන් එන කතාව නම් බැල්ලිය පිස්සු වැටුනේ සුභූති හිමියන් ජප කර එවූ පිල්ලියක් ඌට ආරූඪ වීම නිසාය.

මොරටු වලව්වේ මළසිරුර තබා පැවැත්වූ ඔහුගේ අවමගුල ලංකා ඉතිහාසයේ වැඩිම පිරිසක් සහභාගි වූ අවමගුල බව 'සොයිසා ජීවිත කතා ශරීරයේ' සඳහන් ය. එංගලන්ත රජ මාලිගයේ නියෝජිත පිරිසක් ද අවමංගලායට එක්වී ඇත.

සැමරුම් කිත් රැස



මහාචාර්ය **ජයන්ත අමරසිංහ**

# කියනු කිම මහිමා ගුණවඩු මුදලි උතුමා

අද තරම් විද්‍යාස්ථාන සහ පොත පත බහුලිත නොවූ දහනව වන සියවසේ මෙරට පඬිවරුන්ගේ බිහි වීම උසස් මට්ටමක පැවතීම තර්කානුසාරී විරෝධාභාසයකි (logical paradox). එවක පාණ්ඩිත්‍යය වර්ධනය වූයේ පිරිවෙන ආශ්‍රයෙනි; නැතහොත් පිරිවෙන ආශ්‍රයෙන් බිහි වුණු උගතුන් සහ ඔවුන් විසින් සම්පාදිත පොත පත සේවනයෙනි. එසේම සමාජයේ සම්භාවනාවට පාත්‍ර වූයේද සැබෑ පරිපූර්ණ පාණ්ඩිත්‍යයයි. අද මෙන් බුරුතු පිටින් ව්‍යාජ පඬිවරුන් බිහි වීමක් සිදු නොවිණ. පඬිවරු පාණ්ඩිත්‍යයට අදාළ කාර්යයන්හිම නියැළුණහ. දේශපාලකයන් පසුපස වැටී ආත්මලාභය උදෙසා නිවටකම් නොකළහ. එනිසාම ඔවුහු සැම කල්හිම සම්භාවනාවට පාත්‍ර වූහ. විලියම් ෆෙඩ්රික් ගුණවර්ධන හෙවත් ඩබ්ලිව්. එෆ්. ගුණවර්ධන එබඳු පඬි පරපුරක මුල් පෙළ හිමි වන විබුධයෙකි.

ඩබ්ලිව්. එෆ්. ගුණවර්ධන උපත ලද්දේ 1861 වර්ෂයේ මැයි මස 18 වන දින මාතර කොටුවේගොඩ රෝස් කොටේජ් නම් නිවසේදීය. පියා අමදෝරු වීරවර්ණ දොන් බස්තියන් ජයසේකර ගුණවර්ධනය. මව ලොකු බඳුගේ දෝන සෙලෙස්තිනා ජයසූරිය නම් වූවාය. ඩබ්ලිව්. එෆ්. ගුණවර්ධන ළමා වියේ ලද අධ්‍යාපනය ගැන නිශ්චිත තොරතුරු වාර්තා නොවන මුත් එවක ප්‍රමාණවත් අධ්‍යාපනයක් ලැබීමට යෝග්‍ය සාන්ත තෝමස් (1844) වැනි ඉංග්‍රීසි පාඨශාලා මාතර නගරයේ ස්ථාපිතව පැවති හෙයින් එවැනි පාඨශාලාවකින් ඔහු මූලික අධ්‍යාපනය ලද බව සිතිය හැකිය. මේ අවධිය වන විට ඉංග්‍රීසි අධ්‍යාපනය ලබා දීමට අමතරව බෞද්ධ අධ්‍යාපන පුනරුදය හේතු කොට ගෙන බිහිව සිටි ප්‍රාචීන භාෂා ශාස්ත්‍ර උගත් ගිහි පැවිදි පඬිවරුන් ඇසුරෙන් තම දරුවන්ට අධ්‍යාපනය ලබා දීමේ නැඹුරුවක් සමාජයේ පැවතිණ. ආගම ප්‍රචාරයෙහි නිමග්න කතෝලික පූජකවරුන් මෙන්ම ඉංග්‍රීසි ජාතික උගතුන්ගේද විශේෂ අවධානයක් මෙරට ප්‍රචලිත වෙමින් පැවති ප්‍රාචීන භාෂා අධ්‍යාපනය කෙරෙහි යොමු වූ පසුබිමක ගුණවර්ධන දරුවාගේ දෙමව්පියන් තම පුත්‍රයා එවක සිටි ස්වදේශික ප්‍රාචීන පඬිවරුන් කරා යොමු කරන්නට ඇතැයි සිතිය හැකිය. විශේෂයෙන්ම රාජ්‍ය සේවයේ වැදගත් තනතුරක් ලෙස පිළිගැනුණු භාෂා පරිවර්තක වැනි වෘත්තීන් සඳහා ද්විභාෂා ඥානය අත්‍යවශ්‍ය විය. වැලිගම සුමංගල නා හිමි හා දොන් අන්ද්‍රිස් තුඩාවේ පණ්ඩිත ගුණවර්ධන යන පඬිවරුන් තමන්ට ගුරු වූ බව ඩබ්ලිව්. එෆ්. ගුණවර්ධන ස්වකීය ගුත්තිල කාව්‍ය වර්ණනා කෘතිය අවසානයෙහි එන සංස්කෘත ශ්ලෝකයෙන්ද පවසා තිබේ.

පෙර'පර දෙදිග භාෂා ශාස්ත්‍ර පිළිබඳ මනා පරිචයක් ලද තෙවිසි හැවිරිදි ගුණවර්ධන තරුණයා ලංකාවේ පළමු වරට පැවැත්වුණු ලිපිකරු විභාගයෙන් සමත්ව 1884 වර්ෂයේ ජනවාරි මස පළමු වන දින රාජ්‍ය සේවයට පිවිසිණ. ලිපිකාර තනතුර ලැබ නොබෝ කලක් යාමට මත්තෙන් එතුමන්ට අධිකරණයෙහි භාෂා පරිවර්තක තනතුර හිමි විය. වෘද්ධ පරිණත වියේදී අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධාන භාෂා පරිවර්තක තනතුරට එතුමන් පත් කෙරුණු අතර එතුමන්ගේ ශාස්ත්‍රීය ප්‍රභාව මතු වන්නට පටන් ගත්තේ ඒ තනතුරට පත් වීමෙන් පසුවය. කුමාරතුංග මුනිදාස, ගුණවර්ධන පඬිවරයා ගැන ලියූ චරිතාලේඛ්‍යයක ඒ බව මෙසේ දක්වා තිබේ. "ඔවුන්ගේ ජීවිතයෙහි ඒ ස්වර්ණ යුගයයි. පෙරැ ද මඳ වශයෙන් රස දැනැ සිටි පාලි සංස්කෘත භාෂා පිළිබඳ ඥානය තර කැරැ-ගන්නට ඔවුනට අවසර ලැබුණේ ඒ යුගයෙහි දී යැ. ද්‍රවිඩ භාෂාව ද ස්වොත්සාහයෙන් ම උගත්හ. ගුණවර්ධනයන් විඥ ලෝකයේ ඇස් කෙළින් මැ අදින්නට වූයේ ඔවුන් අධ්‍යාපන පරිවර්තක කාලයෙහි සැපයූ ගුත්තිල කාව්‍ය වර්ණනාව පළ වූවාට පසු යැ."

1907 වර්ෂයේදී ගුත්තිල කාව්‍ය වර්ණනාව පළ වීමත් සමග දැඩි වාග් ප්‍රහාර මාලාවක් ගුණවර්ධන වෙත එල්ල විය. එතුමන්ට පහර දීම සඳහා ම සඟරාවක්ද ආරම්භ කෙරිණ. ඒ කිසිවකින් අසකුදු නොසැලුණු ගුණවර්ධන ස්වකීය ශාස්ත්‍ර පර්යටනය අඛණ්ඩවම කර ගෙන යමින් 1916 වර්ෂයේදී ගුත්තිල කාව්‍ය වර්ණනාව තවත් විස්තාරණය කොට පළ කළ අතර 1917 වර්ෂයේදී සුභාෂිත වර්ණනාවද 1922 වර්ෂයේදී නිකාය සංග්‍රහයද 1924 වර්ෂයේදී කෝකිල සන්දේශ වර්ණනාවද 1928 වර්ෂයේදී මයූර සන්දේශ වර්ණනාවද යන සම්භාව්‍ය සාහිත්‍ය ග්‍රන්ථ විස්තර වර්ණනා සහිතව පළ කිරීමෙන් සිංහල සාහිත්‍ය ග්‍රන්ථ සංස්කරණය නමැති අභිනව ශික්ෂණ මාර්ගය පෝෂණය කෙළේය. ගුණවර්ධන ශාස්ත්‍රීය සම්ප්‍රදානය ග්‍රන්ථ සංස්කරණය හා ව්‍යාඛ්‍යා සම්පාදනයට සීමා නොවිණ. භාෂාධ්‍යයනය සහ වාග්විද්‍යාව යන ක්ෂේත්‍රවල එතුමන් පෑ පාණ්ඩිත්‍යය වර්තමානයේ පවා සම්භාවනාවට පාත්‍ර වන්නේය. 1914 වර්ෂයේදී පළ කෙරුණු සිද්ධාන්ත පරීක්ෂණය කෘතියෙහි ලා ද්‍රාවිඩ භාෂා සිංහල භාෂාව කෙරෙහි බල පෑ ආකාරය පිළිබඳ කළ විග්‍රහය මහත් ආන්දෝලනයකට තුඩු දිණි. ගුණවර්ධන පඬිතුමාගේ විමර්ශනාක්ෂියට හසු වන කවර ශාස්ත්‍රීය කරුණක් වේද එය විද්‍යානුකූල සහ තර්කානුකූල බව සුපැදිලි නම් සමාජයේ වැඩි පිරිසක් ඊට එරෙහි වන බව මැනවින් දැන දැනම බියෙන් සහ අගතියෙන් තොරව සිය මතය ඉදිරිපත් කිරීම එතුමන්ගේ විශේෂත්වයකි.

ගුණවර්ධන පඬිතුමා නූතන සිංහල කවියේ ප්‍රථම තරංගය නියෝජනය කළ කවියෙකි. බළලා සිල් ගත් සැටි කියවෙන පැරණි ගැමි කතාවක් පාදක කොට ගෙන ඔහු 1890 වර්ෂයේ උපමාලංකාරය නම් කාව්‍යාඛ්‍යානයක් රචනා කෙළේය. පැරණි කාව්‍ය මාර්ගය අනුයමින් රචිත ඒ කාව්‍යය සමකාලීන සමාජයේ පවත්නා ශඨ කපට වංචනික පැවැත්ම ව්‍යංග්‍යයෙන් ප්‍රකාශ කිරීමට දැරූ ප්‍රයත්නයක් සේ සැලකිය හැකිය. ඥාන ගවේෂණයේ මෙන්ම ඥාන විතරණයේද අභිලාෂයෙන් යුතු වූ ගුණවර්ධන පඬිතුමා සිළුමිණ නමින් ශාස්ත්‍රීය සඟරාවක් ආරම්භ කොට පවත්වාගෙන යාමටද පුරෝගාමී විය. පී. ඩී. ඇස්. වීරසූරිය මාතර සාහිත්‍ය වංශය කෘතියෙහි ලා ගුණවර්ධන පඬිතුමා පිළිබඳ ඉංග්‍රීසි පුවත්පතක පළ වූ කරුණක් සාරාංශ කොට මෙසේ දක්වා තිබේ. "ලන්ඩන් විශ්වවිද්‍යාලය මගින් ලඞ්කා මධ්‍යස්ථානයේ පවත්වනු ලැබූ විභාගයකදී සංස්කෘත විෂයයක් හැටියට ගත් පෙරදිගින් පෙනී සිටි පළමු වැනියා ගුණවර්ධන වාසල මුදලිඳුය. ඔවුන්ගේ මිත්‍ර ගණයට සර් මැතිව් නාදන්, මහෝපාධ්‍යාය සතිශ්චන්ද්‍ර විද්‍යාභූෂණ, මහෝපාධ්‍යාය නන්දර් ගීකාර් වැනි විබුධයෝ ඇතුළත් වූහ."

ගුණවර්ධන පඬිතුමා භාෂා ශාස්ත්‍ර විෂයයෙහි පාරගත වීම හේතුවෙන් එතුමන්ට මෙරට ශාස්ත්‍ර පරිමණ්ඩල හෙබවීමේ දුලබ වරම හිමි විය. ලංකා විශ්වවිද්‍යාල විද්‍යායතනය ස්ථාපනය කෙරුණු කාලයේ වර්ෂ කිහිපයක් එහි සිංහල සහ සංස්කෘත භාෂා පිළිබඳ ආචාර්යවරයකු ලෙස සේවය කිරීමට එතුමන්ට ඇරයුම් ලැබුණේ ඒ නිසාය. ලංකාවේ ප්‍රාචීන භාෂෝපකාර සමිතිය පිහිටුවීමේ පුරෝගාමී කාර්යභාරයටද ගුණවර්ධන පඬිතුමා දායක විය. රාජකීය ආසියාතික සමිතිය මගින් ආරම්භ කරන ලද සිංහල ශබ්දකෝෂයෙහි සහකාර කර්තෘ පදවියද ඉසිලූ ගුණවර්ධන පඬිතුමා ඉන් ඉල්ලා අස් වූයේ රෝගාතුර වූ නිසාය. සිවු සැත්තෑ වසක් ජීවත් වූ ගුණවර්ධන පඬිතුමා 1935 වර්ෂයේදී මෙලොවින් සමු ගත්තේ ශාස්ත්‍ර ලෝකයට මහත් හිඩැසක් ශේෂ කරමිනි.

තරංග

# මිතුරු පවුර



● කමල් පෙරේරා


## ‘කාටවත් පාට පාට ලේ නැහැ’

පනයාා සිති අවුරුදු 21ක තායිලන්ත දැරියකි. පහුගිය දවසක ඇය කළ නිර්භීත ක්‍රියාවක් නිසා සමස්ත ලෝකය පුරාම මාධ්‍යවල ඇගේ නම රැව් නගන්නට පටන් ගත්තේය. පනයාා කළේ ලේසි පහසු වැඩක් නොවේ. සාමාන්‍යයෙන් ඇගේ වයසේ කෙල්ලකට සිතන්නවත් බැරි බරපතළ කාර්යයකි. තායිලන්තයේ ප්‍රමුඛ සරසවියක් වන තමාසාත් විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය සංගමය කලක සිට තායිලන්තයේ ප්‍රජාතන්ත්‍රවාදය දිනාගැනීමේ අරගලයක නිරතව සිටියි. ඔවුන් ඒ වෙනුවෙන්ම Dome Revolution නම් දේශපාලන ව්‍යාපාරයක්ද අරඹා තිබේ. පනයාා සිසුවියද එහි සාමාජිකාවකි.

දවස අගෝස්තු මස 21දාය. තායිලන්ත කිරීටය හොබවන මහා වජිරලොන්කෝන් රජුට අභියෝග කරමින් සරසවි ශිෂ්‍යයෝ දහස් ගණනක් වීදි බැස සිටියහ. රාජ්‍යත්වය නඩත්තු කිරීමට යොදවන මහජන මුදල් කප්පාදු කිරීම.,ජන වරමින් පත් වූ මහජන නියෝජිතයන්ට අවහිර නොකිරීම ඇතුළු කොන්දේසි 10ක් ශිෂ්‍යයෝ රජුට ඉදිරිපත් කළහ. මේ ඓතිහාසික ප්‍රකාශනය ලොවටම ඇහෙන්නට ප්‍රකාශයට පත් කිරීමේ අභියෝගය පැවරුණේ පනයාාටය.

“මනුස්සයො හැටියට අපි කවුරුත් සමාන විය යුතුයි. කාටවත් එක එක පාට ලේ නැහැ. හැම මනුස්සයෙකුගෙම ඇඟේ දුවන්නෙ රතු ලේ. ඒ හින්දා අපි අතර වෙනසක් නැහැ. මිහිතලේ කිසිම මිනිසෙක් අනිත් අයට වඩා වෙනස් විදිහට ඉපදිලා නැහැ...”

රැස්ව සිටි විශාල ජනකායකගේ ඔල්වරසන් මැද පනයාා කිසිදු චකිතයකින් තොරව හඬ නගන්න වූවාය. තායිලන්ත කිරුළ දරන්නාට මතු නොව රාජකීය ලේ තැවරුණු කිසිවකුට හෝ කිසිවක් පැවසීම බරපතළ දඬුවම් වලට යටත් විය හැකි වරදක් බව පනයාා නොදැන සිටියා නොවේ. ඒ වන විටත් රජුට එරෙහිව කුමන්ත්‍රණය කළේය යන චෝදනාව පිට අත් අඩංගුවට ගත් සිසුහු ගණනාවක් අතුරුදහන්ව සිටියහ. මුහුණු පොතෙන් රජුට අපහාස කළේයයි කියා තවත් තරුණයකුට වසර ගණනාවක සිර දඬුවමක් නියම කර තිබිණ.



පනයාා සිසුවියද

කලකට පෙර කොරෝනාවට බියෙන් රටින් පිටව ගිය රජු මේ වන විටත් ආපසු පැමිණ නැත. රජු වෙනුවෙන් තායිලන්තය පාලනය කරනු ලබන්නේ රජ පෙළපතට විශාල ළැදියාවක් දක්වන මිලිටරි ජුන්ටාවක් විසිනි. 2014දී කුමන්ත්‍රණයකින් බලය අල්ලා ගත් හමුදාව ව්‍යාජ මැතිවරණයක් පැවැත්වූවද මහජන මතයට ඉඩක් දී නැත. මිලියන 66ක ජනගහනයක් සහිත මේ රට කලින් හැඳින්වූයේ සියම ලෙසිනි. ආර්ථික සම්පත් අතින්ද පොහොසත් ආසියානු රටක් වන මෙය ලොව විශාලතම රටවල් අතර 55වන හා ජනගහනය අතින් 22වන ස්ථානවල වැජඹෙයි.

තායිලන්තය යනු පරම්පරා ගණනාවක් පුරා රාජ්‍යත්වය දේවත්වයේ ලා සැලකීමට පුරුදු පුහුණු වූ ජනතාවක් වෙසෙන රටකි. එසේම මෙහි පාලනය හොබවන්නේ රාජ්‍යත්වය විවේචනය කරන්නන් දේශද්‍රෝහීන් හැටියට නම් කොට දැඩි දඬුවම් පමුණුවන හමුදා ආඥාදායකත්වයකි. 21ක් වියැති මෙම සුකුමාල දැරියට එතරම් ශක්තියක් ලැබුණේ කෙසේදැයි ජනතාව විමතියට පත්ව සිටිති. ඇයට මේ ශක්තිය ලැබුණ සැටි පනයාා විස්තර කරන්නේ මෙසේය.

“මට මතකයි මම පුංචි කාලෙ රජ්ජුරුවො ගමන් කරන පෙළපාළියකට ආචාර කරන්න හැමෝටම පාරට එන්න කියල හමුදාව ඇවිත් අණ කළා. එදා හරිම රස්නෙ දවසක්. රජ්ජුරුවො පාර යනව කියල අපි මොකටද අව්වෙ පිච්චෙන්නෙ. මම විරෝධය පළ කරල ගෙදෙට්ටම වෙලා හිටිය. මගෙ තාත්ත තමයි පොඩි කාලෙ ඉඳලම මට මෙහෙම හිතන්න පුරුදු කළේ.“

කුඩා කල සිටම සමානත්වය හා මානව අයිතීන් ගැන ප්‍රශ්න කිරීමට ඇය පුරුදු වී සිටියාය. ඒ අතර ශිෂ්‍ය හුවමාරු වැඩසටහනක් යටතේ ලැබුණු ඇමරිකන් චාරිකාවද ඇගේ පෞරුෂයට ලොකු පිටිවහලක් විණ. ඒ අතර හමුදා නායකයකු වන ජනරාල් කොන්යොත්පොන්ග්ගේ මුවින් ශිෂ්‍ය සටන් ව්‍යාපාරය පිළිබඳව පසුගියදා නිකුත් වූ මේ වදන් පෙළ සටන්කාමීන්ට රතු එළිය දැල්වීමක් ලෙස සැලකිය හැකිය.

“රටට වෛර කරන මේ කල්ලිය කොරෝනා වසංගතයටත් වඩා භයානකයි. තම මවුබිමට වෛර කිරීම යනු සුව කළ නොහැකි ව්‍යාධියක්. ”

තම දියණියට කවර ඉරණමක් අත්වේදැයි බියෙන් සාම්ප්‍රදායික ගෘහණියක් වන පනයාාගේ මව සුසුම් හෙළමින් සිටිනුයේ මෙවන් පසුබිමකය.

“අපි මේවා කරන්නෙ විනෝදෙට නොවන බව අම්මලා තේරුන්ගන්න ඕනා. මේක හරිම බරපතළ තත්වයක්. අපි හිතන්නෙ මේක අපිට පැවරිල තියෙන වගකීමක් කියල. කවද හරි මම මගෙ අම්මව ආඩම්බර අම්මා කෙනෙක් බවට පත් කරනවා.”

ඇගේ මවද ඇතුළු සමස්ත ජනතාවටම පනයාා දැරිය දෙන මේ පිළිතුර කෙතරම් දුරට යථාර්ථයක් වේදැයි තීරණය කිරීම කාලයාට බාරය.



● නන්දසේන සූරියආරච්චි




# රාජ්‍ය මන්ත්‍රණ සභාවට ටින් එකක් රැගෙන ආ මන්ත්‍රී

**මැති සබයේ පැරණි කතා කියමින් සිටි අප පසුගියදා කථා කළේ රාජ්‍ය මන්ත්‍රණ සභා යුගයේ හොරණ මන්ත්‍රී ඒ.පී. ජයසූරිය හා ජා ඇල මන්ත්‍රී ඩී.පී. ජයසූරිය මහතා අතර ඇති වූ අරගලයයි. අද කථා කරන්නේ ද ජා ඇල මන්ත්‍රීතුමා සම්බන්ධ සිද්ධියකි. ජයසූරිය තම පුත්‍රයකුගේ වරදක් පිට ඔහු සමඟ කිසිම සම්බන්ධයක් නොපැවැත්වීය. මේ පුත්‍රයා හදිසියේම මිය ගියේය. එහෙත් ඔහු තමා මුලදී සිටි මතයේම සිටි නිසා පුත්‍රයාගේ මළගමටද ගියේ නැත. එදා කථානායක වූයේ ඇල්බට් එෆ්. පීරිස්ය. කථානායක ලේකම් තුමා මේ මළගමට පසුදින පාර්ලිමේන්තු කැන්ටිමේ කෑම ගනිමින් සිටියදී අල්ලපු මේසයේ සිටි ජයසූරිය දුටුවේය.**

“මන්ත්‍රීතුමා මොකද පුතාගෙ මළගෙදර නොසිටියෙ? අපි බැලුව නේ මන්ත්‍රී තුමා කොහේද කියලා” කථානායක ලේකම් ජයසූරිය මහතාගෙන් ඇසීය. “පර බල්ලා තොට මොකටද ඒකෙ වගක්? තෝ ඔහොම ඇහැව්වට තොගේ මහ එකාවත් මගෙන් ඔය කථාව ඇහුවෙ නැහැනේ” කියමින් මන්ත්‍රී කථානායක ලේකම්ගේ මේසයට පැන්නේය. කෑම පිඟාන පැත්තක දමා කථානායක ලේකම් පැන දිව්වේය.

දිනක් මන්ත්‍රණ සභාවේ සිදුවූ විවාදයකදී කථානායකවරයාට සුන්දරලිංගම් පාලනය කරගත නොහැකි විය. අනවශ්‍ය කථාව දිගින් දිගට කරගන යාම නිසා එය නවත්වන ලෙස කථානායකවරයා කොතෙක් කියා සිටියත් සුන්දරලිංගම් ඇසුවේ නැත. අවසානයේ මන්ත්‍රණ සභා ගොඩනැගිල්ලෙන් මන්ත්‍රීවරයා ඉවත් කරන ලෙස කථානායකවරයා පොලිසියට නියෝග කළේය.

පොලිසිය පැමිණ සුන්දරලිංගම් ඔසවාගෙන ගියේය. අතර මගදී පොලිස් නිලධාරීන්ගේ නොසැලකිල්ලෙන් තමාගේ හිස සභා ගැබේ වූ පුටුවල ගැටෙන්නට ඇතැයි සුන්දරලිංගම්ට සිතුණි. ඔහු කෑ ගැසීය.

“අයිසෙ, අයිසෙ, බලාගෙන ඔළුව හැප්පෙන්න පුළුවන් මේ ඔළුව අනික් ඔළු වලට වඩා වටිනව.”

සුන්දරලිංගම් මන්ත්‍රණ සභාවෙන් එළියට ගෙනගොස් තාත්පයද පසුකර පදිකවේදිකාවේ තබා පොලිසිය ඉවත් විය.

සුන්දරලිංගම් මන්ත්‍රණ සභාවේ සිටි අමුතුම පුද්ගලයෙකි. ඔහු මුලදී කථිකාචාර්යවරයකු ලෙස විශ්ව විද්‍යාලයේ සිටියේය. පසුව දිසාපති කෙනෙකු විය. දිසාපතිවරයකු ලෙස සිටියදී තුවක්කු බලපත්‍ර අත්සන් කරන්නට යොමුකොට තිබූ ලිපිගොනුව දුටු ඔහු “මම දිසාපති වුණේ තුවක්කු ලයිසන් අත්සන් කරන්නට නොවේ” යැයි කියා එම තනතුරින් ඉල්ලා අස්විය. වෙළෙඳ ඇමති ලෙස පත්වූ පසු මෙබඳුම ප්‍රශ්නයක් පිට දමා ඉන් ද ඉල්ලා අස්වී පසුව සාමාන්‍ය මන්ත්‍රීවරයකු වූ කෙනෙකි. ඔහු තමා එකඟ නොවන ප්‍රතිපත්තියකට විරුද්ධවීම වශයෙන් කිහිප වරක්ම මන්ත්‍රී පදවියෙන් ඉල්ලා අස්වී නැවතත් වවුනියා අසුනේ මන්ත්‍රීවරයා ලෙස පත්වූ පුද්ගලයෙකි.

නුවරඑළිය ආසනයෙන් මන්ත්‍රණ සභාවට පැමිණ සිටි අභය ගුණසේකර නම් වූ මන්ත්‍රීවරයෙක් විය. මේ මන්ත්‍රීවරයා මුලදී පොලිස් පරීක්ෂකවරයෙකි. එදා මන්ත්‍රීවරයකු දුටුවිට පොලිසියේ ඉහළම නිලධාරියා වුවද සැලියුට් කොට ආචාර කිරීම පුරුද්දකි. එක් දිනක් පොලිස්පතිවරයා වූ සුදු ජාතිකයා මන්ත්‍රණ සභා දොරටුවේ විය. මන්ත්‍රීවරයා සිය මෝටර් රථයෙන් මන්ත්‍රණ සභා දොරටුව අසලට පැමිණියේය. සුදු ජාතික පොලිස්පති මන්ත්‍රී තුමාගේ මෝටර් රථයේ දොර ඇර ආචාර සමාචාර පැවැත්වීය.

“මේ බලා ගනින්. මම ඉස්සර පොලිස් පරීක්ෂකයකු හැටියට සිටි කාලයේ උඹට සැලියුට් කරනවා. කාලෙන් කාලෙට ඔහොම තමයි.” මහ හඬින් සිනාසෙමින් කීය.

අභයගුණසේකර මන්ත්‍රීවරයා එක්තරා අන්දමක නිර්භීත පුද්ගලයෙකි. එවක නුවරඑළියේ සිටි දිසාපතිවරයාද සුදු ජාතිකයෙකි. මේ සුදු ජාතික දිසාපතිවරයා මන්ත්‍රීවරයා එතරම් සැලකිය යුතු පුද්ගලයකු ලෙස සැලකුවේ නැත.

“මේ සුද්ට මම පාඩමක් උගන්වනවා” යයි සිතූ මන්ත්‍රීවරයා, දිසාපතිවරයා තම ආසනයේ සංචාරය කරන දිනකදී තම හිතවතුන් ලවා පාරට ගස් කප්පවා දමා ඔහු යන මාර්ගය වසා දැමීය.

දිසාපතිතුමාට යාමට පාරක් නොවීය. ඔහු ආරච්චිලලා කැඳවීය. “මට යන්න පාර සුද්ද කර දීපල්ලා” යයි ඔහු ගෝරනාඩු කළේය.

“ඒක අපිට කරන්න බෑ. මන්ත්‍රී හාමුදුරුවොත් කිව්ව නම් අපිට එයිට පිටින් යන්න විධියක් නැතැ”යි ආරච්චිලලා කියන්නට වූහ.

සුද්දා මන්ත්‍රී තුමා හමුවී “අභය ගුණසේකර මහත්මයා මට යන්න පාර සුද්ධ කර දෙනවාදැ” ඇසීය.

ඉක්මනට මේ දිසාපති තුමාට යන්න පාර සුද්ධ කරලා දීපල්ලායයි හිතවතුන් කැඳවූ මන්ත්‍රීවරයා කෑ ගැසීය. පැය භාගයක් යන්නට පෙර අතර මඟ සියලු බාධක ඉවත් විය.

කථානායක ලෙස ඇල්බට් ඇෆ්. පීරිස් එක් දිනක් මන්ත්‍රණ සභාවෙහි විශාල කලබලයක් විය. ආණ්ඩු පක්ෂයේ හා විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරු අතර වූ විවාදය නිසා මන්ත්‍රණ සභා ශාලාව එකම ගාල ගෝට්ටියක් විය. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයකු කථා කරන්නට නැගිටින විට, විරුද්ධ පක්ෂයේ දෙතුන් දෙනෙකු නැගිට බාධා කරති. එය කථානායකවරයාට පාලනය කර ගත නොහැකි විය. අරගලය නතර කරන්නට බැරිවූ තැන කථානායකවරයා කළේ, සෙංකෝලය එතැනම තිබෙන්නට හැර සභා ශාලාවෙන් පිටව යාමය.

මේ වනවිට සභාවේ කථා කරමින් සිටියේ, සෝමවීර චන්ද්‍රසිරිය. විරුද්ධ පක්ෂයේ සිටි එඩ්මන්ඩ් සමරක්කොඩි කථානායක අසුනේ හිඳ ගත්තේය. සෝමවීර චන්ද්‍රසිරි නව කථානායකවරයාට සුභ පතා දීර්ඝ කථාවක් පැවැත්වීය. “මේක පොදුජනයා ලැබූ ජයග්‍රහණයක්. පොදුජනයා වෙනුවෙන් කැපවී කටයුතු කරන අපේ පක්ෂයේ කෙනෙක් නව කථානායකවරයා වීම අප කාටත් සතුටක්” යයි ඔහු කියාගෙන ගියේය. සභාව දෙස බැලූ සෝමවීර දුටුවේ විරුද්ධ විපක්ෂ මන්ත්‍රීන් හැර ආණ්ඩු පක්ෂයේ කිසිවකු සභාව තුළ නොසිටි අන්දම ය.

මේ විහිළු රැස්වීම පැවැතියේ සුළු වේලාවකි. එදා මෙය නැරඹූ ගැලරියේ සිටි පිරිස පුදුමාකාර විනෝදයක් ලැබූහ. වරප්‍රසාද කැඩීමේ චෝදනාවක් එල්ල වුවද සමරක්කොඩි නිවැරදිකරු විය. සභාව නිත්‍යානුකූලව කල් නොතබා කථානායකවරයා පිටව ගිය නිසා සභාව පවත්වා ගැනීම මන්ත්‍රීවරුන් සතු යුතුකමක් බව තීරණය විය.

රොබට් ගුණවර්ධන හැමදාම පාහේ මන්ත්‍රණ සභාවේ ගෝරියකට පැටලෙයි. තමන්ට නොගැළපෙන යමක් කාගෙන් හෝ කියවුනොත් ඊට විරුද්ධ වෙමින් කෑ මුර ගැසීම ඔහුගේ සිරිතයි.

එක් දවසක් කථානායකවරයා රොබට් එළියට දැමීය. කථානායකවරයා මේ අවස්ථාවේ හොඳටම කලබල විය. මේ නිසා රොබට්ට මන්ත්‍රණ සභාව තහනම් කිරීම, දින ගණනක් හෝ සති ගණනක් යයි කීමට අමතක විය. පොලිස් නිලධාරීන්ගේ කරපිටින් එළියට ගිය රොබට් තමාට මන්ත්‍රණ සභාව තහනම් කළේ දින කාලවේලාවක් නියම නොකර බව දැන ගත්තේය. එළියේ මොහොතක් සිටි ඔහු භාෂා පරිවර්ථකගේ දොර හැරගෙන නැවත මන්ත්‍රණ සභාවට පැමිණ අසුන් ගත්තේය. රොබට් ගුණවර්ධන මන්ත්‍රණ සභාවෙන් එළියට දැම්මේ කිසිම සඳහනක් නොකර බව දැනගත් කථානායකවරයා රොබට්ගේ පැමිණීම දුටුවත් කර කියාගත හැකි කිසිවක් නොවූයෙන් නිහඬ විය.

මන්ත්‍රණ සභා රැස්වීම් පැවැත්වෙන හැම මොහොතකම සෙංකෝලය ද එහි වෙයි.

සභාව කල්දමන විටකදී හැර මන්ත්‍රණ සභාවේ ඇති සෙංකෝලය සමහර දිනවල දිවා ආහාර වේලාවට මන්ත්‍රණ සභාව කල් තැබූ විට මුරට කවුරුන් හෝ තබා යාම සිරිතය. එක දිනක් දිවා ආහාර වේලේ මන්ත්‍රණ සභාවේ තිබූ සෙංකෝලය සවස මන්ත්‍රණ සභා රැස්වීම අරඹන විට එහි නොවීය. කවුදෝ සෙංකෝලය හොරෙන් ගෙනගොස් ඇත. මෙය ඇත්තේ වේත්‍රධාරියා භාරයේය. වේත්‍රධාරී තැන හොඳටම කලබලවී සිටී. වගකීම පැවරෙන්නේ තමා පිට නිසා මේ සිද්ධියෙන් ඔහු හොඳටම තැතිගෙන සිටියේය. යම් විධියකින් සෙංකෝලය නැතිවූවොත් සභා වාරය පැවැත්වීමට නොහැකිවේ. මෙය මුළු රටම කලඹන සිද්ධියක් වන බව ඔහුට විශ්වාසය. කලබලවී සිය සහායකයන් සමඟ මුළු සභා ශාලාවම පීරා බැලූ ඔහුට මන්ත්‍රණ සභාවේ පිටුපස පුටුවක් යට සෙංකෝලය තබා තිබෙනු සොයා ගත හැකි විය. තව මොහොතක් පමාවූවා නම් මන්ත්‍රණ සභා ශාලාවෙන් සෙංකෝලය පිටමං කරනු ඇත.

එසේ වූවා නම් පාර්ලිමේන්තු ඉතිහාසයේ මෙය අමුතුම සිද්ධියක් වනු ඇත.

එදා මන්ත්‍රණ සභාව තුළ වාර්තාවක් තබා දිග කථාවක් කරන්නට මන්ත්‍රීවරයකු කල්පනා කළේය. මේ වාර්තාගත කථාව යම් විධියකින් එක දිගට නොකර අතර වාරයේ කැඩුණොත් තම වාර්තාවට එය බාධාවක් වෙතැයි ඔහු සිතුවේය. නිතර නිතර මුත්‍රා කරන්නට කැසිකිළියට දුවන්නට පුරුදුව සිටි මේ මන්ත්‍රීවරයා යම් විධියකින් තම වාර්තාවට මේ මුත්‍රා කරන්නට යාම නිසා බාධාවක් වෙතැයි සිතා ටින් එකක් රැගෙන ආවේය. එදා මන්ත්‍රණ සභාවට අසුන් පනවා තිබූ ආකාරය අනුව යටින් ටින් එකක් තබාගෙන මුත්‍රා කළත් කිසිවකුට නොපෙනේ. කෙසේ වුවත් මන්ත්‍රීවරයා පැය ගණනක් දිග කථාවක් පවත්වමින් වාර්තාවක් තැබීය.




# කුස්සියෙන් සාලෙට එන පොල්කටු නිමැවුම්





අත්කම් ශිල්පි වසන්ත ප්‍රනාන්දු ඇමැති විමල් වීරවංශ හමුවූ මොහොත

● අනුරුද්ධ බණ්ඩාර රණවාරණ

කාලයකට මිල ඉහළ යන කාලයකට මිල පහළ වැටෙන පොල් වලට ඇති ඉල්ලුම කිසි දිනෙක අඩුවන්නේ නැත.මිල ගණන් කෙසේ වෙතත් පොල් ගෙඩියෙන් ගතහැකි ප්‍රයෝජන බොහෝය. පොල් ගා ඉවතලන කට්ට ලිපට දමනවාට වඩා එයින් /තහැකි උපරිම ප්‍රයෝජන ගැනීමට දැන් දැන් ඇතැමුන් පුරුදු පුහුණු වී ඇත. කලක් පොල්කට්ට අඟුරු සඳහා ගත්ත ද අද වනවිට පොල් කට්ටෙන් විසිතුරු නිර්මාණ කිරීමට ඊට ආසා කරන්නෝ පොල්කට්ට හොඳ ආදායම් මාර්ගයක් කර ගෙන තිබේ. එය ආදායම් මාර්ගයක් කර ගත්තා පමණක් නොව එයින් විස්මිත නිර්මාණ කරන අපූරු මිනිසෙකු ගැනය මේ කතාව.

ඔහු නම් ප්‍රවීණ හස්ත කර්මාන්ත ශිල්පියකු වන මහනුවර, බෝවල, කොකා සෙලා ෂෙල් ක්‍රාෆ්ටිං ආයතනයේ (Coca sela shell Crafting) හිමිකරු ඇම්. වසන්ත ප්‍රනාන්දු ය.


තමන් විසින් කළ පොල්කටු නිමැවුම් සඳහා දෙස් විදෙස් සම්මානයට පාත්‍ර වී සිටින වසන්ත ප්‍රනාන්දු අද වන විට තවත් අයට රැකියා අවස්ථා ද ලබාදී ඇත. පසුගිය දිනෙක කර්මාන්ත ඇමැති විමල් වීරවංශ මහතා වසන්ත ප්‍රනාන්දු හමු විය.

ඔහු හා කතාකරමින් අමාත්‍යවරයා පවසා සිටියේ වසන්ත ඇතුළු මෙම නිෂ්පාදන කර්මාන්තයේ නියැළෙන අයට පොල්කටු භාණ්ඩ නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන, තාක්ෂණය, හා වෙළෙඳපොළ අවස්ථා ලබාදිය යුතු බවය. ඒ අනුව මේ සඳහා කඩිනම් ව්‍යාපෘතියක් අරඹන ලෙස ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයට උපදෙස් ලබා දුන්නේය.

ඉවතලන පොල්කට්ටෙන් වටිනා නිෂ්පාදන කළ සම්මාන දිනූ වසන්ත ප්‍රනාන්දු ඔහු ආ ගමන් මඟ ගැන පැවැසුවේ මෙලෙසනි.

“මම 1970 සිට පොල්කටු භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තයේ නියැළී සිටිනවා. අපි මේ නිෂ්පාදන කරන්නේ දේශීය වෙළඳපොළ ඉලක්ක කර ගෙන. ඒ වුණත් මට පුළුවන් වුණා ජාත්‍යන්තරය දිනාගත හැකි පොල්කටු භාණ්ඩ නිෂ්පාදනය කළා. මගේ විශාල බලාපොරොත්තුවක් තිබුණා මගේ ශිල්පීය දැනුම මේ ක්ෂේත්‍රයේ කර්මාන්ත ශිල්පීන්ට ලබා දී ඔවුන් ද ජාත්‍යන්තරය ජයගත හැකි පොල්කටු භාණ්ඩ නිර්මාණකරුවන් බවට පත් කිරීමට. එය මට තනිවම කරන්න පුළුවන් දෙයක් නොවෙයි. ඒ සඳහා රජයේ මැදිහත්වීම අවශ්‍යයි. මා කර්මාන්ත අමාත්‍යතුමන් හමු වී මේ අදහස කියා සිටියා. ඊට සාවධානව ඇහුම්කම් දුන් විමල් වීරවංශ ඇමතිතුමා දීපව්‍යාප්තව පොල්කටු නිෂ්පාදන කර්මාන්තය සිදු කිරීමටත් කර්මාන්තයේ නියැළෙන පිරිස් වෙත ජාත්‍යන්තර තලයේ භාණ්ඩ නිෂ්පාදනය සඳහා අවශ්‍ය පුහුණුව ලබා දීමටත් පොරොන්දු වුණා. මේ වෙනුවෙන් ව්‍යාපෘතියක් සකසන ලෙස කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපති උපසේන දිසානායක මහතාට උපදෙස් දුන්නා. මා විශ්වාස කරනවා අපට මෙවර හොඳ දෙයක් වේවි කියලා. වසන්ත ප්‍රනාන්දු පවසන්නේ හෙට ගැන බොහෝ බලාපොරොත්තු තබාගෙනය.

## සැප්තැම්බර් 30 වෙනිදාට යෙදෙන ගාමිණී ෆොන්සේකා අනුස්මරණය වෙනුවෙනි



සුසිල් ප්‍රේමරත්න කලාකරුවාගෙන් චිත්‍ර කලාව ඉගෙන ගාමිණී අඳින ලද චිත්‍රයක්



ගාමිණී තම ගුරුවරයෙකු වූ අරිසෙන් අහුබුදු සූරීන් සමඟ




ගාමිණී වයස අවුරුදු 11 දී



ගාමිණී තරුණ වියේ

# තිරයෙන් ඔබ නුදුටු ගාමිණී



● ඒ.ඩී. රන්ජිත් කුමාර

**සිනමාවේ මහ නළුවා" "හෙළ සිනමාවේ සක්විති" ආදී විශේෂණ පදවලින් හැඳින්වුණ සෙම්බුගේ ගාමිණී ෂෙල්ටන් ෆොන්සේකා හඳුන්වා දීමට යාම කිරෙහි සුදු පැහැය වැනීමක් සේ ය.**

ගාමිණී සිනමා රංගනයට පිවිසීමට පෙර පාසල් වියේදී කවියකු, ලේඛකයකු ලෙස ගල්කිස්සේ ශාන්ත තෝමස් විද්‍යාලයේ කැපී පෙනුණ බවත්, 1955 වසරේ එවකට ලංකාවේ තිබූ ව්‍යාපාරික විශ්ව විද්‍යාලය (Ceylon's Business University) නොහොත් The Polytechnic වැල්ලවත්තේ පැවති ආයතනයේ ඉගෙනුම ලැබූ බවත් බොහෝ දෙනෙකු නොදනී. "ද පොලිටෙක්නික්" හි ගාමිණී කෙටිකතා රචනය (short story writing), නවකතා රචනය (Novel Writing), සාහිත්‍යය (Literature), පුවත්පත් වාර්තාකරණය (Newspaper Reporting) යන විෂයන් මෙන් අපහාස නීතිය (Law of Defamation), රාජ්‍ය පාලනය, ව්‍යවස්ථා පිළිබඳ නීතිය (Constitutional Law) විෂයයන් සහිතව පත්‍රකලා පාඨමාලාව සාර්ථකව නිම කළ බවට සහතික කර ඇත.

ගාමිණී පසු කලෙක මේ ලියුම්කරුට පැවසුවේ තමා පුවත්පත්කලාව ගැන ධර්මපාල ජයවීර (ලංකාවේ මුල්වරට පුවත්පත් කලාව ගැන ග්‍රන්ථය ලියූ ඔහු 1953 සිළුමිණ කර්තෘ මණ්ඩලයේ සේවය කර ඇත) මහතාගෙන් මෙම ආයතනයේ පත්‍රකලාව ගැන ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඇතැම්ලක් සේ ඉගෙන ගත් බවය. ඩේවිඩ් කරුණාරත්න, ලයනල් ලොකුලියන ආදී ගුරුවරුන් ගැන ද ගාමිණී ආදරයෙන් කතා කර ඇත. ගාමිණී ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගෙනුම ලැබුව ද සිංහල භාෂාව, සිංහල සාහිත්‍යයට ශාන්ත තෝමස් විද්‍යාලයේ ප්‍රවීණතා දැක් වූ බව ඔහුගේ සිංහල ගුරුවරයා වූ අරිසෙන් අහුබුදු සූරීන් අගය කොට තිබුණි. මේ එතුමා තම ප්‍රිය ශිෂ්‍යයා ගැන කියූ සැටි ය.

"ඒ දිනවල තොමොසු සිසු දරුවනට සිංහල කවි තැනීම ඉගැන්වීම ද අප විසින් කැරිණි. දිනක් කවි තරගයක් ඇති කොටැ, ඒ සඳහා මැයක් ද දෙන ලදී. ඒ මැයින් සිසුන් ලියූ පැදි පේළිවලින් මුල් තැන දිනා ගත්තේ ගාමිණී ලියූ මේ කවි පබඳ ය.

බඹ දෙව් කෙටූ ඉරණ ම සීකඩ වෙනවා
ජීවන ගඟුලැල්ල වෙන'තෙක හැර වෙනවා
තව මොහොතෙකින් සොඳුරේ ඔබ තනිවෙනවා
මරුවා සමඟ මා දැන් දීගෙක යනවා

මගෙ ආදරය කැටි කොට වැඩූ පුතා මගේ
පැරකුම් ගැමුණු ගජබා නිරනිඳුන් වගේ
මිනිසකු වුණොත් රට ජාතිය කරන අගේ
මා මිය නො ගිය බව ඒ තුළින් හැඟේ

ඉපැදුණු රටට ණය ගැති නොම වෙයන් පුතේ
ඇට මස් රිහිරි ලක් අම්මට පුදන් පුතේ
ඒ පිනට වඩා වැඩි පින් නොව සොයන් පුතේ
ජාතිය නිවන පින - නිවනට මඟ යි පුතේ

මගෙ පුතු රට දැය වෙනුවෙන් දිවි දෙනවා
මා ගිය තැනෙක හිඳ ඒ දැක හිනැහෙනවා
පුතු මගෙ මළත් රට වෙනුවෙන් සැනැහෙනවා
පුතු නැති දිනෙක පුතු වෙනුවෙන් උපදිනවා

ගාමිණී ආඩම්බරයෙන් මට කිව් දෙයක් මට දැන් මතක් වෙයි. "අයිසෙ, මම සිංහල භාෂාවත්, සාහිත්‍යයත් ඉගෙන ගත්තේ එසේ මෙසේ ගුරුවරුන්ගෙන් නොවෙයි. විනී විතාරණ, සඳ දස් කෝපරහේවා, සමරකෝන් වජිරසේන, වෙ.දො. පින්තු ජයවද්දන කියන භාෂා විශාරදයන්ගෙන්. මමත්, රංජිත් විජයවර්ධන (විජය පුවත්පත් සමාගමේ වර්තමාන සභාපති හා ලේක්හවුස් අධිපතිව සිටි) හා මම ඒ ගුරුවරුන්ගෙන් සිංහල ඉගෙන ගත්තේ."

පුදුමය නම් ගාමිණී පසු කලෙක සිනමාවේ අග්‍රගණ්‍ය චරිත රඟ පෑවත් සාන්ත තෝමස් විද්‍යාලයේ (1951 වසරේ වයස අවුරුදු පහළොවේ දී) වේදිකාගත වූ "මයුරී" නාට්‍යයේ (මාර්ටින් වික්‍රමසිංහ ගේ "විජිතා" නාට්‍ය පොත ඇසුරෙනි) සුජාතා නම් ගැහැනු චරිතයක් රඟපෑම ය. 1951 වසරේ විදුහල් සඟරාව උපුටා දක්වමින් අරීසෙන් අහුබුදු සූරීහු මෙසේ අපට කීහ.

"මයුරි වෙනුවෙන් පෙනී සිටි ඩී.ඩබ්ලිව්. පෙරේරා ද, සුජාතා වෙනුවෙන් පෙනී සිටි ඇස්.ජී. ෆොන්සේකා (ගාමිණී ෆොන්සේකා) ද නියම ස්ත්‍රී විලාසයෙන් හා වනිතා ලීලාවෙන් ද යුක්ත වූහ. ඔවුන්ගේ රැඟුම් දුටු සැවොම විස්මයට පත් වූහ."

ඒ ගාමිණීගේ මුල් ම රංගනයයි. එපමණක් නොව ඔහු දක්ෂ චිත්‍ර ශිල්පියකු ද විය. කාටූන් චිත්‍ර කලාවට හපනෙකු වූ ගාමිණී ගැන අපූරු කතාවක් මට කීවේ ඔහු සමඟ එකම පන්තියේ ඉගෙන ගත් පසුව පාසල් ගුරුවරයකු වූ කිත්සිරි නිහාල් ජයසිංහ ය.



THE POLYTECHNIC

WELLAWATTE

21st October, 1955.

This is to certify that Mr G. S. Fonseka underwent a course in Journalism, wherein he completed the following:-

1. Short Story Writing.
2. Novel Writing.
3. Literature.
4. Newspaper Reporting.
5. Law of Defamation.
6. Constitutional Law.

While at this Institute, his conduct and character were beyond reproach and he was conscientious and regular in his work.

He should do well with a little practical training.

ගාමිණී පුවත්පත් කලාව ඉගෙන ගත් The Polytechnic ආයතනයේ අධ්‍යක්ෂ විසින් 1955 වසරේ ඔක්තෝබර් 21 වෙනිදා දෙන ලද සහතිකය.

පසු කලෙක "මහ හේනේ රීරි යකා" චිත්‍රපටය අධ්‍යක්ෂණය (1971) කළ ඔහු මට කියූ කතාවකි මේ.

"ගාමිණීත් මාත් ඉගෙන ගත්තේ මරුවකු ලෙස අපව බිය ගැන්වූ විදුහල්පති ආර්.ඇස්. ද සෙරම් පියතුමා ගේ ලතින් පන්තියේ. ඔහු තේජවන්ත සිංහයකු වැනි කෙනෙක්. ඔහු එනවා දකින කොටම මුළු විද්‍යාලයම මීයට පිම්බා වගෙ. එතුමා එන වෙලාවේ ගාමිණී ලහි ලහියේ සිට පහළට දිව ගොස් ආවා. ගාමිණී ගියේ විදුහල්පතිතුමාට පෙනෙන්නට උඩු මහලේ දොරටුවේ වූ දැන්වීම් පුවරුවේ කිසියම් කාටූන් චිත්‍රයක් එල්ලන්ට. විදුහල්පතිතුමා අපේ ලතින් පන්තිය ගත්තා. ආපසු යන විට එතුමාගේ ඇස් ගියේ දැන්වීම් පුවරුව දෙසට. ඒ නම් ලෝගු (පුළුල් කකුල් ඇති) කලිසමක් ඇඳ කුනාටුවකට හසු වූ විදුහල්පති තුමාගේම විකට චිත්‍රයක්. එහෙත් ලතින් පාඩමට එදා පැමිණි විදුහල්පතිතුමා ගේ කන්නාඩි කුට්ටම යටින් තිබුණු තියුණු බැල්ම වෙනුවට එදා තිබුණේ සිනා මුසු බැල්මක්."

ලංකාවේ සිටි ජනප්‍රිය චිත්‍රකතා ශිල්පියා හා චිත්‍ර ශිල්පියෙකු වූ සුසිල් ප්‍රේමරත්නයන්ගේ මුලින්ම චිත්‍ර කලාව ඉගෙන ගත් ගෝලයා ගාමිණී බව ඔබ දැන සිටියා ද? මහා කලාකරු එම්. සාර්ලිස් මාස්ටර්ගේ පුතා වූ සුසිල් ගාමිණීට චිත්‍ර කලාව ඉගැන්නුවේය. එකොළොස් හැවිරිදි වියේ උන් ගාමිණී සිය පියාණන් වූ විලියම් ෆොන්සේකා, ගල්කිස්සේ සාන්ත රීටාස් පාරේ සුසිල් ප්‍රේමරත්නගේ නිවසට ගිය හැටිත්, එහිදී මිනිස් රූ හා දිය සායම් චිත්‍ර ඇඳීමට විශේෂයෙන් සමත් වූ බවත්, ගාමිණී සමඟම සුසිල්ගෙන් චිත්‍ර කලාව ඉගෙන ගත් ප්‍රකට දිය සායම් චිත්‍ර ඉගෙනගත් තිස්ස හේවාවිතාරණට තවමත් මතකය. ගාමිණී විසින් අඳින ලද හැම චිත්‍රයකම S.G. Fonseka යන්න ඔහුගේ අතින්ම ලියා තිබුණි.

ගාමිණී අප කාටත් නුවූ අපට හිතා ගන්නටවත් බැරි විජ්ජාමය දස්කම් දැක් වූ අප සමඟම 1951 සිට එකම පන්තියේ සිටි අපූරු කලාකාරයක් යැයි ජී.කේ. මණ්ඩාවල (පන්ති සගයෙකු වූ රංජිත් විජයවර්ධන මහතාගේ ආයතනයක ඔහු සේවය කර ඇත) මහතා අපට කීවේ 1986 වසරේ මේ ලියුම්කරු විසින් ලියූ "ගාමිණී : හෙළ සිනමාවේ සක්විති" කෘතිය ලියන අවස්ථාවේ කියා තිබුණි.



මංණ්ඩාවලත්, ගාමිණීත් පාසල් යන අවදියේ සිංහල සාහිත්‍ය සංගමයේ සම ලේකම්වරුන් වූ අතර සංගීත සංදර්ශනවලට සහභාගි වී ඇත.

"ගාමිණී වැඩියෙන් ම දස්කම් දැක් වූයේ හින්දි ගී වලටයි. ගල්කිස්සේ සේරම් පාරේ වූ රාජනීතිඥ ඩෙනිස් පෙරේරා ගේ නිවෙස අප නිතර හමු වූ තැනෙකි. සතියකට දෙතුන් වරක් ම අප එහි ගොස් පියානෝ, ගිටාර්, වයලින හා තබ්ලා වාදනය කොට පුරුදු වුණා. ගාමිණීට තිබූ තවත් හපන්කමක් තමයි තබ්ලාවක් නැතිව ම කරන තබ්ලා වාදනය කිරීම. ඔහු මෙය කරන්නේ අතේ ඇඟිලි පටලවා අහසට ගසා දැමීමෙන්." මණ්ඩවල මහතා අපට කියා ඇත.

ගාමිණී ගායකයකු බව දන්නේ ටික දෙනෙකි. වසර 58 කට පෙර තිරගත වූ "දස්කොන්" චිත්‍රපටයේ ගාමිණී ගැයූ එකම එක චිත්‍රපට ගීතය රුක්මණී දේවිය සමඟ ගායනා කිරීම සුවිශේෂ සිද්ධියකි. අරිසෙන් අහුබුදු සූරීන් රචනා කළ මේ ගීතයේ සංගීතවත් කර ඇත්තේ තිලකසිරි ප්‍රනාන්දු ය. ඒ ගීතයේ කොටසකි මේ.

රුක්මණී - අතුරු කළේ කුමටද නුවණ මද ගුරු
හකුරු කලේ දමත් ද දියව යන තුරු
කපුරු මලේ සුවඳට වැනසෙති බමරු
නපුරු මලේ දැන දැන නොකරන් වියරු

ගාමිණී - අදිතත් තල් දුන්න උරගා අදින්ඩයි
විදිතත් හස්ති රාජයකුට විදින්ඩයි
බඳිතත් වරල මල් ගවසා බඳින්ඩයි
නසිතත් වංශ ලියකට තල් බඳින්ඩයි

1965 වසරේ ගාමිණී විවාහ වූ අලුත ය. එවකට අවිවාහකව සිටි ගාමිණීගේ හොඳම මිතුරු නළුවකු වූ ක්‍රිස්ටි ලෙනාඩ් පෙරේරා සමඟ ගුවන් විදුලියේ වෙළඳ සේවයට යුග ගීයක් ගැයූහ. මේ ගීතය තනිකඩයකු හා විවාහකයකු අතර සංවාදයක් ලෙස කරුණාරත්න අබේසේකර රචනා කළ ගීතයකි. සංගීත අධ්‍යක්ෂවරයා වූයේ මොහොමඩ් සාලි ය. මේ ගීතය කොළඹ ධාලි පාරේ මොහොමඩ් සාලිගේ නිවසේ පුහුණු වෙමින් තිබුණි. ගුවන් විදුලියේ වෙළෙඳ සේවා අධ්‍යක්ෂ ලිවී විජේමාන්නට ගාමිණී ගී ගයන බව ආරංචි වී ක්‍රිස්ටි ලෙනාඩ්ගෙන් අසා තිබුණි.

### "Can he sing? I know he is a good Actor"

ක්‍රිස්ටි හා කරු ද කාරණය විස්තර කිරීමෙන් පසු මේ යුග ගීතය පටිගත කරනු බැලීමට විජේමාන්න පැමිණ ඇත. පුදුමය නම් ගාමිණී "වන් ටේක්" වලින්ම ගීතය පටිගත කිරීම ය.

ක්‍රිස්ටි - හිත යන අත යන්නට හැක රජකුට සමලු
හැමකමටම වැඩිය මිහිරි තනිකඩකමලු

ගාමිණී - තෙමි තෙමී හිද තරුණියකගෙ ආදර වැස්සේ
ජීවිතයේ රහ දැනෙන්නෙ බැන්දට පස්සේ

ක්‍රිස්ටි - ඩිංගක් වැරදුණු දවසෙදි අපා දුක දැනේ
නැන්දම්මා එරෙව්වාම ලෝකෙ එපා වේ

ගාමිණී - උයා පිහා දුන්නෙ නැතත් කැමට රහට
බඩ කට පිරෙනවා බිරිඳගේ ආදර බහට

ක්‍රිස්ටි - දවස් දෙක තුනක් අපි අම්බලමේ උන්නේ
තනි රකින්න තවත් කෙනෙක් මොකට ද ගන්නේ

ගාමිණී - වැල ගස වට එතෙයි ගඟුල මුහුදට යන්නේ
තනිකඩයා තනිව ඉඳල තනිව මැරෙන්නේ

ක්‍රිස්ටි - ඔබට ළඳක් ලැබී ඇතත් ගුණැති කදිම
නිකිණි සොයා ගන්න වගේ ගැහැනු සෙවීම

ගාමිණී - දුකට ළඟින් ඉඳන් කියන බස ද මනාපයි
ඇගේ හුස්ම ටික වැටුණත් මගෙ ඇඟට සනීපයි

ගාමිණී චිත්‍රපට රංගනයට, අධ්‍යක්ෂණයට මෙන් චිත්‍රපට කතා රචනයට, තිර නාටක රචනයට වගේ චිත්‍රපට ගීත රචනයට ද දක්ෂයෙකි. ඔහු ජනප්‍රිය ගායක ගායිකාවන්ට ද ගීත රචනා කර ඇත. වික්ටර් රත්නායකයන් ගැයූ "අහිමි වුණත් නුඹ ළඳේ" ලයනල් අල්ගම ගැයූ "ආදරයෙන් ඔබ අත පැලඳූ", සුජාතා අත්තනායක ගැයූ "දෙවොලේ සණ්ටා හැඬෙන තුරා", දමයන්ති ජයසූරිය ගැයූ "කුමාරයාණෙනි ඔබ තුරුලෙන් උදුරා" ගීත මෙන්ම ජනප්‍රිය චිත්‍රපට ගීත කිහිපයක් ම ගාමිණී රචනා කර ඇත.

"සරුංගලේ" චිත්‍රපයට ලියූ "බමරිඳු බමරිඳු කුමට වඩින්නේ" (ගායනය - අමරදේව හා නන්දා මාලිනි) "මයුරිගේ කතාව" චිත්‍රපටයට ලියූ "නැති වූ ආදරයක් වෙනුවෙන්" (ගායනය - අමරදේව හා සුජාතා අත්තනායක) "නොමියෙන මිනිසුන්" චිත්‍රපටයට ලියූ "මිහිපිට අඟලක් හිමි නැති මිනිසෙක්" (ගායනය - අමරදේව) මේ චිත්‍රපට ගීත ය. රඟපෑමට, අධ්‍යක්ෂණයට, චිත්‍ර ශිල්පයට, ගායනයට, වාදනයට, ගීත රචනය, කතා රචනයට, පුවත්පත් කලාවට, කතාවට, දේශනයට දක්ෂ පිරිපුන් මේ අසහාය කලාකරුවා 1936 මාර්තු 21 වෙනිදා දෙහිවලදී උපත ලබා 2004 සැප්තැම්බර් 30 වෙනිදා ජීවිත සිනමාවෙන් සමුගත්තේය.

**ඡායාරූප පිටපත් කිරීම - ලාල් සෙනරත්**

## අත්හදා බැලීම ඔබ සතු ය !

ලෝකයේ අප මවිත කළ ලේඛකයන් අතුරින් තෝල්ස්තෝයි ඉන්නේ පළමු පෙළකැයි මා කිවහොත් ඔබ එකඟ වනු නිසැක ය. මේ අපූරු ලේඛකයාගේ නිර්මාණ එකක් නැර වෙනස් වෙනස් අන්ත කරා පිය නඟන්නේ ඔහුගේ පරිකල්පනීය සීමා ගැන ඔබට, මට සිතා ගැනීමටවත් නොහැකි වේගයකිනි.

60 දශකයේදී සමන් ප්‍රකාශකයන්ගෙන් පොතක් මුද්‍රණය කර ගැනීම ඒ පොතට සහතිකයක් ලැබෙන වැඩක් බව මට කීවේ චන්ද්‍රසිරි සෙනෙවිරත්න අප ප්‍රවීණ ලේඛකයා ය. තෝල්ස්තෝයිගේ 'ක්‍රොයිට්සර් සොනාටා' නවකතාවේ ඇස්. ජී. සමරසිංහයන් කළ පරිවර්තනය, මුද්‍රණය කර ඇත්තේ සමන් ප්‍රකාශකයන් ය. ඒ නිසාම මුද්‍රණය වෙද්දී ම එයට වටිනාකමක් එක් විණි. දැනට කලකට පෙර අප අතරින් සමුගත් ප්‍රවීණ මාධ්‍යවේදී සුනිල් මිහිඳුකුලයන් සමන් ප්‍රකාශකයන් මුද්‍රණය කළ ඒ පැරණි පරිවර්තනය කියැවීම පිණිස කලකට ඉහතදී මට දුන්නේ ඇස්. ජී. සමරසිංහයන්ගේ පරිවර්තනය මා කියවා නැතැයි කී විටෙක ය. ඒ නිසාම එකිනෙකට වෙනස් පරිවර්තන දෙකක් කියවා ගැන්මේ අවකාශය මා හට උදා විණි. අනෙක සිරිල් සී. පෙරේරාණන් පරිවර්තනය කළ 'පෙමතො ජායතී සොකෝ'ය.

ඇස්. ජී. සමරසිංහයන් 'ක්‍රොයිට්සර් සොනාටා' වට දී ඇති නම වන්නේ 'ගැහැනු කවුරුද වරදෙ නොබැඳෙන' කියා ය. සිරි රහල් හිමියන්ගේ කවියක පේළියක් යොදා ගැනීම නිර්මාණාත්මක වැඩක් වන අතර ම, පාඨක අවධානය දිනා ගැනීමේ උපක්‍රමයක් ද වෙයි. සිරි රහල් හිමි රචනා කළ කාව්‍යශේඛරයේ එන වඩාත් අවධානයට පාත්‍ර වූ කවිය මෙයයි.

**පිරිමීනිඳු පතන**
**අවසරකල් රහස් තැන**
**මිස නොලැබෙන බැවින**
**ගැහැනු කවුරුද වරදෙ නොබැඳෙන...**

ගැහැනුන් පිරිමින් පතනවා සේම පිරිමි ද ගැහැනුන් පතති. ඒ ලෝක ධර්මයයි. ඒ ලෝක ධර්මය එක් පාර්ශ්වයකට හොඳ වන්නටත්, අනෙක් පාර්ශ්වයට නරක වන්නටත් හැකියාවක් නැත. මේ ගැන වැඩිදුරටත් ලිවීමට මා අකැමැති වන්නේ ඔබ අතරින් බහුතරයක් මේ සටහන කියැවූ ඇසිල්ලේ ස්ත්‍රී විමුක්තිකාමීන්ගේ ගොඩට මා තල්ලු කර දමනු නිසැක බැවිනි. ඇස්. ජී. සමරසිංහ කළ පරිවර්තනයේ නාමකරණයත්, සිරිල් සී. පෙරේරා කළ පරිවර්තනයේ නාමකරණයත් අතුරින් වඩාත් ගැළපෙන්නේ කුමන නාමකරණය ද යන්න දැන ගැනීමට නම් ඔබ මේ පරිවර්තන දෙක ම කියැවිය යුතුය. මේ කෘතියම 'ප්‍රේමය හා ශෝකය' නමින් තවත් පරිවර්තකයකු පරිවර්තනය කළා යැයි මා මතකයට පැමිණියත් ඒ කවුදැයි කියා මාහට මතක නැති වීම ගැන සමාව අයදිමි. කෙසේ වෙතත් ප්‍රේමය හා බැඳී ශෝකය පැමිණීම අනිවාර්යය බැව් ඔබ සැම දන්නා කරුණකි.

නවකතාවේ ප්‍රධාන චරිතය පොස්නිෂිව් විවාහය නිසා අතරමං වූවෙකි. දුම්රිය මැදිරියකදී හමුවන මගියකුට ඔහු සිය ජීවිත කතාව පවසයි. ඒ කතාව ඇතුළේ හොඳ - නරක, ප්‍රේමය - ශෝකය, අභිමානය - පසුතැවිල්ල ඈ මේ සියල්ල අන්තර්ගතය. තරුණ කාලයේදී තමා වෙසඟනන් කරා ගිය අයුරුත්, අනතුරුව වැදගත් කුල කාන්තාවක හා විවාහ වූ අයුරුත් ඒ කතාවේ ඇතුළත් ය. පසු කාලයක ඔහුගේ බිරිය වාදකයකු හා වරදේ බැඳුණු අයුරුත් වරද අතටම අසු වූ අවස්ථාවේ තමා ඈ මැරූ සැටිත් ඔහු සවිස්තරාත්මක ව විස්තර කරන්නේ ය. ඒ කුල කතගේ සිත දිනා ගන්නට සමත් වූයේ බීතෝවන්ගේ ක්‍රොයිට්සර් සොනාටාව ය.

එතැනින් නොනවතින තෝල්ස්තෝයි ත්'එයැර්'ැරටසම් නමින් ඉංග්‍රීසියට නැඟුණු අපූරු කෘතිය රචනා කරයි. එය 'විරාග සංග්‍රාම' නමින් ආචාර්ය ඩබ්ලියු. ඒ. අබේසිංහයන් විසින් සිංහලට නඟනු ලබයි. එදා කසාත්ස්කි නම් ව සිට පසුව සර්ජියස් පියතුමා බවට ද, දැන් සර්ජියස් තාපසවරයා බවට ද පත්ව සිටින මේ අපූරු මිනිසාගේ පැරණි පෙම්වතිය සිය පැරණි පෙම්වතාගේ; මේ වනවිට තාපසයකු ව සිටින සර්ජියස්ගේ තපස බිඳින්නට ප්‍රතිඥා දෙයි. මේ ක්‍රියාවලියත්, සිත පාලනය කර ගැනීමේ දැඩි අධිෂ්ඨානයත් විසින් මෙහෙයවනු ලැබූ සර්ජියස් පියතුමාගේ මානසික සට්ටනයත් අතර මේ කතාව දෝලනය වෙයි. සිය ඇඟිල්ල කෙටේරියෙන් කපා තම රාගය පාලනය කරගත් සර්ජියස් නිසා ඕ දැඩිතර ආගමික මඟ පෙන්වීම් ඔස්සේ විමුක්තිය සොයන්නට පෙලඹුණා ය.

මිනිසුන්; ඇති හෝ නැති දෙවියකු මවා ගන්නේත්, මවාගත් පසු ජීවමාන යැයි සලකා ඒ දෙවියා පසුපස ජීවිත කාලය පුරාම හඹා යන්නේත් අරුම සහගත විදියකට ය. තෝල්ස්තෝයි විස්තර සොයන්නේ මේ අරුම පුදුම මිනිස් ජීවිතය ගැන ය.

පැරණි භාරතයේ බමුණන් දෙසූ ශ්ලෝක වර්තමානයේ ඇතැම්හු දේවභාෂිත සේ ගනිති. මේ ශ්ලෝක බොහොමයක් ම වෙන් වී තිබෙන්නේ ගැහැනියගේ චපලකම ගැන කියන්නට ය. මෙකල මහා මානව දයාවකින් කතා කරන බොහෝ මානව හිතවාදීහු පවා නිදහසේ කතා කරන, සරන තැන්වලදී මේ ශ්ලෝක ගුරු කොට සලකනු අපි අත්විඳ ඇත්තෙමු; දැක ඇත්තෙමු. කුල ස්ත්‍රිය සිය ස්වාමියාට මවක් විය යුතු යැයි කියන මේ බමුණන්ගේ ශ්ලෝකයක අනෙක් පදය වන්නේ යහනේදී ඇය වෛශ්‍යාවක විය යුතුය කියා ය.

**ස්නේහේසු මාතෘ - ශයනේසු වෛශ්‍යා**

මේ ද්විරූපතාව ම නිර්මාණ ගොන්නකට මඟ පැදුවේ ය. තෝල්ස්තෝයිගේ කතා මේ සියලු අහුකොන් ස්පර්ශ කරන්නේ ය; අපට ම සිතා ගැනීමට බොහෝ දේ ඉතිරි කරන්නේ ය. හැබැයි තෝල්ස්තෝයි කියූ මේ දේ බොහෝ පාඨකයන් තේරුම් ගත්තාදැයි අපි නොදනිමු. ඔවුන් ද පැරණි බමුණන් සේ අවුරුදු 60, 70 වුණු පසු වයස 16, 17 නාඹර තරුණියන් විවාහ කරගෙන ජීවිත කාලය ම රති ශෝකයෙන් ගත කරන්නන් සේ මේ මාහැඟි ග්‍රන්ථවල අරුත් යටිපෙළ අරුත් ග්‍රහණය කර නොගන්නේ ය. ලේඛනයේ රන්සුනු සොයන ඔබට ඇරියුම් කරන්නේ මේ කෘති අවබෝධයෙන් කියවා ගතහොත් ඔබ කොතරම් පිරිපුන් මිනිසකු වන්නේ ද යන්න අත්හදා බලන ලෙස පමණි.

sumudu.chathurani@lakehouse.lk




**පිළිතුරු සැපයීම**
**කායික රෝග විශේෂඥ වෛද්‍ය වරුණ ගුණතිලක**

## මලපහ කිරීමේ අසාමාන්‍ය තත්ත්වයක්



ප්‍රශ්නය :- මම 62 හැවිරිදි විවාහක පිරිමි අයෙක්මි. මට තිබෙන ගැටලුව වන්නේ නිතර නිතර බඩේ අමාරු ඇති වීමයි. එය අජීර්ණයක් නොවන බවට මා සිතන්නේ කටේ අප්පිරියාව, කෑම අරුචිය, උණ වැනි කිසිම රෝග ලක්ෂණයක් මට නොමැති නිසාය. මට ඇති වන්නේ සතියකට වරක් හෝ දෙවරක් බඩ බුරුල් කර මලපහ පිටවීමයි. මෙය මට සාමාන්‍ය තත්ත්වයක් බවට පත්වී තිබේ. මෙය රෝගයක්ද? වෛද්‍ය ප්‍රතිකාර ලබා ගත යුතුද?

**මාළිගාවත්ත - තිස්ස කුමාරසිංහ**

පිළිතුර:- ඔබේ රෝගී තත්ත්වය නිවැරදිව හඳුනා ගැනීමට ඔබ එවා ඇති විස්තර ප්‍රමාණවත් නැත. මෙහිදී රෝග ඉතිහාසය, ඔබට වැළඳී ඇති සෙසු රෝග, ඔබේ සිරුරේ බර යනාදි කරුණු අවශ්‍ය ය. එහෙත් ඔබ එවා ඇති විස්තර අනුව ඔබේ මලපහ ක්‍රියාකාරිත්වය සාමාන්‍ය තත්ත්වයෙන් සිදු නොවන බව පෙනේ. එය සාමාන්‍ය තත්ත්වයෙන් සිදු නොවන්නේ යම් වෙනසක් තිබේ නම් මෙය යම් රෝගයක් හෝ රෝගයක ලක්ෂණයක් විය හැකිය. සාමාන්‍ය තත්වයෙන් සැලකීම සුදුසු නැත. එබැවින් විශේෂඥ වෛද්‍යවරයකු හමුවන්න. ඇතැම්විට ඔබේ ගුද මාර්ගයෙන් කැමරාවක් දමා පරීක්ෂා කිරීමට සිදු විය හැකිය. රෝගයක් තිබේ ද නැතිද කියා තහවුරු කර ගැනීමට හැකිය. ඉක්මණින් ශල්‍ය විශේෂඥ වෛද්‍යවරයකු හමුවීම ඉතා වැදගත්ය.

## ඇසේ විකෘතිය ප්‍රකෘති කළ හැකිද?

ප්‍රශ්නය:- මගේ නැගණිය 47 හැවිරිදි විවාහක කාන්තාවකි. මීට මාස කීපයකට පෙර ඇයට හිස කරකැවිල්ල ඇති විය. ඇගේ සිරුර දිනෙන් දින වැහැරෙන්නට විය. නිවස අසල සිටින වෛද්‍යවරයාගෙන් බෙහෙත් ලබා ගැනීමට ගිය විට අධි රුධිර පීඩනය, කොලෙස්ටරෝල් සහ දියවැඩියාව සඳහා පරීක්ෂණ ගණනාවක් සිදු කිරීමට උපදෙස් ලැබිණි. එම පරීක්ෂණ වාර්තාවලින් කියවුණේ ඇයට රෝගයක් නොමැති බවයි. මේ අතරවාරයේදී ඇගේ දෑස් ඉදිරියට නෙරා එළියට පනින්නට මෙන් බියකරු පෙනුමක් ඇති විය. එවිට වෛද්‍යවරයා පැවසුවේ නැගණිය තයිරොක්සින් ආබාධයකින් පෙළෙන බවයි. ඒ අවස්ථාවේදි ඇයව විශේෂඥ වෛද්‍යවරයකුට යොමු කළ අතර දැන් නැගණිය නොකඩවා ප්‍රතිකාර ලබා ගනියි. මට ඔබතුමාගෙන් දැන ගැනීමට අවශ්‍ය වන්නේ ඇගේ දෑස් යථා තත්ත්වයට පත් කර ගත හැකිද යන්නයි. නැගණිය ප්‍රතිකාර ගන්නා වෛද්‍යවරයා ඒ සම්බන්ධයෙන් පැහැදිලි පිළිතුරක් නොදුන් නිසා ඔබතුමාගෙන් ඇසීමට සිත් විය.

**දික්වැල්ල - ශ්‍රියානි පත්මලතා කොඩිතුවක්කු**

පිළිතුර:- තයිරොයිඩ් ග්‍රන්ථියේ අධි ක්‍රියාකාරිත්වය හේතුවෙන් ඔබේ නැගණියට තයිරොයිඩ් අක්ෂි ආබාධය ඇති වී තිබේ. මෙහිදී වෛද්‍යවරුන් ඇගේ තයිරොයිඩ් ග්‍රන්ථියේ අධි ක්‍රියාකාරිත්වය පාලනය කිරීම සඳහා ඖෂධ ලබා දෙනු ඇත. එවිට හෝමෝන තුලනය පවත්වා ගෙන යා හැකිය. එහෙත් එම ප්‍රතිකාරවලින් ඇස් ඉදිරියට නෙරා ඒම වළක්වා ගත නොහැකිය. ඔබේ නැගණියගේ දෑස්වල විකෘති පෙනුම ප්‍රකෘති තත්ත්වයට පත් කර ගැනීම සඳහා අක්ෂි ශල්‍ය විශේෂඥ වෛද්‍යවරයකු හමු වී ප්‍රතිකාර ගත යුතය. එසේ ප්‍රතිකාර නොකළහොත් ඇස්වල විකෘති තත්ත්වය පමණක් නොව ඇස්වල පෙනීමේ ගැටලු පවා ඇති විය හැකිය. තයිරොයිඩ් අක්ෂි ආබාධ සඳහා විශේෂිත පරීක්ෂණ සහ විශේෂිත ප්‍රතිකාර තිබේ. එබැවින් වහාම අක්ෂි ශල්‍ය විශේෂඥ වෛද්‍යවරයකු හමුවන්න.

## පියයුරු වැඩී නැති නිසා කනස්සල්ලෙන්



ප්‍රශ්නය:- මම 22 හැවිරිදි තරුණියක්මි. මගේ පියයුරු නිසියාකාරව වර්ධනය වී නොමැති වීම හේතුවෙන් මම කනස්සල්ලෙන් පසුවෙමි. මේ හේතුව නිසා මම මිතුරු මිතුරියන්ගේ සමච්චලයට ද ලක්වෙමි. වෛද්‍යවරයකු වෙත යැමටද ලැජ්ජා බැවින් මෙසේ අසන්නට සිත් විය. වෛද්‍ය උපදෙසක් බලාපොරොත්තු වෙමි.

**බැද්දගාන - සුපිපි තාරුකා අල්විස්**

පිළිතුර:- පියයුරු වර්ධනය සඳහා හෝමෝන ක්‍රියාකාරිත්වය හේතුවේ. ඔබේ වයසට සරිලන ආකාරයට පියයුරු වැඩී නොතිබුණත් ඉදිරියේදි ස්වාභාවිකව වර්ධනය වීමට තවමත් අවස්ථාව ඇත. ඇතැම් තරුණියන්ගේ පියයුරු වර්ධනය වන්නේ විවාහ වීමෙන් පසුවය. ඔබ එය මානසික ගැටලුවක් කර ගෙන ඇති බවක් පෙනේ. එබැවින් නාරි හා ප්‍රසව විශේෂඥ වෛද්‍යවරයකු හමු වී සාකච්ඡා කිරීමට ඔබට වැදගත් විය හැකිය.

## මවට වර්තමානය අමතකයි

ප්‍රශ්නය:- මගේ මව 87 හැවිරිදි වියේ පසුවෙයි. ඇයට දියවැඩියාව ඇත. වෙනත් රෝගයක් නැත. දැන් මගේ මවගේ කල්පනාව අඩුය. ඇයට කෑම කෑවාදැයිවත් මතක නැත. ඇ අහල පහල අය සමග පවසන්නේ ඇයට අප කෑම නොදෙන බවයි. මවට වර්තමානය අමතක වුවද අතීතය ඉතා හොඳින් මතකය. ඇ ඥාතීන් සමඟ පැරණි කතා කියමින් විනෝද වෙයි. වර්තමානය අමත කීම රෝගී තත්ත්වයක්ද? නැතහොත් වියපත් වීමත් සමඟ සිදු වන්නක්ද? වෛද්‍ය උපදෙසක් බලාපොරොත්තු වෙමි.

**කිණිගම - ප්‍රියන්ත රාජකරුණ**

පිළිතුර:- වියපත් වීමත් සමඟ ඔබේ මවට ඩිමෙන්ෂියා රෝගී තත්ත්වය ඇති වී තිබෙන බව කිව යුතුය. එය නිට්ටාවට සුව කළ නොහැකි නමුත් ඖෂධීය ප්‍රතිකාර මඟින් පාලනය කළ හැකිය. එබැවින් ඔබේ මවව මනෝ වෛද්‍ය විශේෂඥවරයකුට පෙන්වීමෙන් යම් සහනදායි ප්‍රතිඵලයක් ලබා ගත හැකිය.

**ඔබේ වෛද්‍ය ගැටලු පහත සඳහන් ලිපිනයට යොමු කරන්න.**
**සුව හමුව, සිළුමිණ, ලේක්හවුස්, කොළඹ.**





පළමු සහ දෙවන විත්තිකරු වූ බුද්ධිරක්ඛිත හිමි සහ එච්. පී. ජයවර්ධන නඩුව පැවැති දිනයක උසාවියට ගෙන එන අයුරු

# ලොවම හෙල්ලූ බණ්ඩාරනායක ඝාතනයට වසර 61 යි



● **ස්ටැන්ලි සමරසිංහ**

**සොලමන් වෙස්ට් රිජ්වේ ඩයස් බණ්ඩාරනායක අගමැතිවරයා මීට වසර 61කට පෙර ඝාතනය කිරීමේ විත්තිකරුවන්ට එරෙහිව විභාග කළ නඩුව මෙරට අපරාධ ඉතිහාසයේ දීර්ඝතම නඩුවය.**

රදළ පවුලකින් පැවති එතුමා මුළු ලොවම ජනාදරයට පත් බුද්ධිමතෙකි. කතෝලික බැතිමතෙකුව සිටි එතුමා බුදු දහම වැළඳගැනීමෙන් පසු බෞද්ධයෙකු වශයෙන් පළකළ අදහස් බෞද්ධ ජනතාවට ඉමහත් දැනීමක් ගෙන දුන් අතර එතුමාගේ ඝාතනය මෙරට ජනතාවම දැඩි කම්පනයක් සහ ශෝකයක් ඇති කෙරුණි.

මුළු ලොවම ශෝකයටත් මවිතයටත් පත් කළ මෙම නඩුවේදි අපේ රටේ ඇති වූ වෙනස්කම් ජනතාවට ඉගෙන ගත හැකි පාඩම් එමටය. එහෙත් එම පාඩම් පිළිබඳව ජනතාව යමක් ඉගෙන ගත්තා යැයි කිසිවෙකුට සිතා ගන්නට පුළුවන් කමක් නොමැත. 1956 දී බලයට පත් බණ්ඩාරනායක මහතාට ජීවත්වීමට හැකි වූයේ අවුරුදු තුනකි. ඒ කාලය තුළ එතුමා පොරොන්දු වූ ප්‍රධානතම කාරණා කීපයක් ඉටු කළේය.

සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කිරීම, මරණීය දඬුවම ඉවත් කිරීම, මෙරට ජනතාවට අයත් දේපළ ජනතාව සතු කිරීම, එවකට මේ රටේ පැවති අධිරාජ්‍යවාදි කඳවුරු ඉවත් කිරීම, ගැමි දරුවන්ට විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබා ගැනීමට විද්‍යෝදය සහ කැලණිය විශ්වවිද්‍යාල දෙක පිහිටුවීම වැනි කරුණු අතළොස්සක් රටට දායාද කෙරුණේ බලයට පත්වී වසර තුනක් වැනි කෙටි කාලයකදීය. ඒවායේ අඩුපාඩුකම් තිබුණත් ඒවා තවදුරටත් දියුණු කිරීමටත් තව තවත් අලුත් දේ ගොඩ නඟන්නටත් එතුමාට ජීවතුන් අතර ඉන්නට දුන්නේ නැත.

බෞද්ධ රටක් වූ අපේ රටේ කැලණියේ රජමහා විහාරයට බෞද්ධ ජනතාව තුළ ඇත්තේ ගෞරවනීය භක්තියකි. 'උපන්දා සිට කරපු පව් නැත වරක් වැන්දොත් කැලණියේ' යන වදන නිසා මෙම ගෞරවයත් භක්තියත් ඉතා පැහැදිලි ලෙස සනාථ වේ.

මෙවැනි ගරුත්වයක් සහ භක්තියක් රෝපණය වූ ඓතිහාසික සිද්ධස්ථානයකින් රටට ජාතියට බිහිවූ ප්‍රගතිශීලී නායකයෙක් ඝාතනය කිරීමට තෝතැන්නක් කරගැනීම කොයිතරම් පාපයක් ද? එපමණක්ද ඊට නායකත්වය දුන්නේ බෞද්ධ භික්ෂු වේශයෙන් සිටි පුද්ගලයන් දෙදෙනෙකු ඇතුළු තවත් ගිහි තිදෙනෙකි.

බණ්ඩාරනායක මහතාට වෙඩි තැබීමෙන් පසු රෝහලට ගෙන ගිය අවස්ථාවේදී වෛද්‍යවරු ඇසුවේ මොකද වුණේ කියලයි.

සැත්කමෙන් පසු මියයන්නට පෙර එතුමා කළ දී දේ පිළිබඳ නඩු විභාගයේ ඇන්තනිස් වෛද්‍යවරයා අධිකරණය හමුවේ සාක්ෂි දෙමින් මෙලෙස පැවසීය.

"ජාතියට ප්‍රකාශයක් කිරීම සඳහා ඔහු කීපවරක් උත්සහ ගත්තා. ඒ සෑම අවස්ථාවකම මා එය වැළැක්කුවා. බැරිම තැන මට ඒ සඳහා අවස්ථාව දෙන්න සිදුවුණා. ඒ අවස්ථාවේ මට හැඟුණේ ඔහු සුව අතට හැරෙන බවයි."

ඔහුගේ සැත්කමෙන් පසු ඔහු හැසුරුණු අන්දම ඔහුට වෙදකම් කළ වෛද්‍ය ඇන්තනිස් නඩු විභාගයේදි සාක්ෂි දෙමින් පැවසුවේ මෙලෙසය.

"මට තුවාල සිදු වූයේ උණ්ඩ තුනකින් පමණයි. එය එතරම් ගණන් ගත යුතු නෑ. ඔහුගේ දිව



විනිසුරු ටී. එස්. ප්‍රනාන්දු

බලන්න එය එළියට දමන ලෙස මා ඔහුට කීවා. ඔහු මට කීවේ දේශපාලකයන්ට තියෙන්නේ තද බල ධෛර්යයක්. මගේ දිව දිගයි.

සිද්ධිය වන විට මට පෙනුණේ කහ සිවුර අස්සෙන් කළු යමක් එළියට ගන්නවා. ඔහු සිවුරු ඇඳගත් පුද්ගලයෙක්. ඊට පසු මොනවා වුණාදැයි මා දන්නේ නෑ."

ඔහු සැත්කම් ශෛල්‍යගාරයේදි විහිළුවෙන් සිටියදි මිය ගියේය.

එතුමා මරණීය දඬුවම ඉවත් කළ දේශපාලකයෙකි. එතුමා ඝාතනය කිරීමට බුද්ධ රක්ඛිත ඇතුළු පුද්ගලයන්ට අවශ්‍ය වූයේ බල තණ්හාව සහ ඒ තුළින් ලෞකික සම්පත් විඳීමට මුදල් ලබා ගැනීමේ අරමුණයි.

ඔවුන්ගේ කුමන්ත්‍රණ සැලසුම සාර්ථක වනු ඇත්දැයි දැන ගැනීමට පේනයක් බැලීමට දක්ෂතම පේනකරුවෙකු වෙත ගියා. එහිදී ඔවුන්ට දැනගන්න ලැබුණේ එය සාර්ථක වී ආණ්ඩුව වැටෙන බවයි. ඊළඟ ආණ්ඩුවේ අගමැති කාන්තාවක් බවද පේනකරුවා පැවසුවා.

අපරාධය ඉක්මන් කිරීමට හේතුව ඝාතකයන්ට ආණ්ඩු බලය ලබා ගැනීමට තිබූ තණ්හාවය. ඔවුන් සිතුවේ ඊළඟට එන අගමැතිනිය ඔවුන් සමඟ සිටින විමලා විජේවර්ධන මහත්මිය බවය.

ඉවුන්ගේ ඉලක්කය සහමුලින් බිඳ වැටුණි. ඝාතකයන් මරණීය දණ්ඩනයට නියම විය. විමලා විජේවර්ධන මහත්මිය සදහටම දේශපාලනයෙන් ඉවත් කෙරුණි.

බණ්ඩාරනායක මහතාගේ මරණයෙන් පසු අගමැතිනිය වූයේ ලොවේ පළමු අගමැතිනිය ලෙස වාර්තාවක් පිහිටුවූ සිරිමා බණ්ඩාරනායක මැතිනියයි.

ඝාතනය සඳහා කුමන්ත්‍රණය කළ බුද්ධරක්ඛිත ඝාතනයෙන් පසු ගුවන් විදුලිය මඟින් සිද්ධිය හෙළා දැක ජාතිය අස්වසාලීමට ප්‍රකාශයක් ද කළේය.

සිද්ධියෙන් පසු ඝාතකයන් ප්‍රසිද්ධ කළේ පෙත්සමක් අගමැතිවරයාට බාරදීමට ගිය සෝමාරාමට එම වෙඩි තබා රෝහලට ඇතුළත් කර තිබෙන බවය.

කැලණිය විහාරය මීට සම්බන්ධ කර ගැනීම බෞද්ධයන්ගේ දැඩි කලකිරීමට හේතුවක් විය.

වෙඩි වැදීමෙන් ලත් තුවාල නිසා මරණයට පත් බණ්ඩාරනායක මහතා කිසිම අවස්ථාවක තමාට වෙඩි තිබ්බේ භික්ෂුවක් බව සඳහන් කළේ නැත.

මේ රටේ අගමැතිවරයා ලෙස ජනතා කැමැත්තෙන් පත්වී වසර තුනක් ගතවෙද්දි ඔහු ඝාතනයට ලක්වීම රටේත් ජනතාවගේත් අභාග්‍ය සම්පන්න කාලයක්

> **වෙඩි තිබ්බ සෝමාරාම මැතිනිය සමඟත් සටනක**

ලැබීම බව සැලකිය හැක.

කෙසේ වෙතත් බණ්ඩාරනායක ඝාතනය සිදු කිරීමට කුමන්ත්‍රණය කළේ බෞද්ධ භික්ෂුවක් මෙන් සිටි චීවර ධාරියෙකි. ඝාතනය සඳහා ගිනි අවිය යොදාගෙන එතුමාගේ සිරුර පසා කිරීමට උණ්ඩය යැවුවේ බෞද්ධ භික්ෂුවක් ලෙස සිටි චීවර ධාරියෙකි.

බෞද්ධ රටක බෞද්ධ අගමැතිවරයෙක් ඝාතනය කළ කුමන්ත්‍රණ නඩුවේ පළමුවැනි විත්තිකරු මාපිටිගම බුද්ධ රක්ඛිත ඒ වන විට බෞද්ධයන් ඉමහත් භක්තියෙන් සහ ගෞරවයෙන් වන්දනාමාන කළ කැලණි විහාරයේ විහාරාධිපතිය.

මෙම නඩුවේ දෙවැනි විත්තිකාර එච්.පී. ජයවර්ධන බුද්ධරක්ඛිත හිමිගේ ගජ මිතුරෙකි, මුද්‍රණාලයක් හිමිකරුවෙකි. ව්‍යක්ත සිංහල කතිකයෙකි. බුද්ධරක්ඛිත හිමිගේ වචනය දේව වාක්කියෙන් සලකන්නෙකි.

1956 මැතිවරණයේදි බණ්ඩාරනායකගේ දේශපාලන වේදිකාවේ නැතිවම බැරි කතිකයා දෙවනි විත්තිකාර ජයවර්ධනයි. තුන්වැනි විත්තිකාර අනුර ද සිල්වා බටහිර චිත්‍රපටි නළුවෙක් වූ ක්ලාක් ගේබල් අනුකරණය කළ සිංහල චිත්‍රපටි නළුවෙකි. කඩවසම් පෙනුමක් ඇති ඔහුගේ වෘත්තිය මෝටර් රථ අලුත්වැඩියා කිරීමය. පළමුවැනි විත්තිකාර බුද්ධරක්ඛිත හිමිගේ මෝටර් රිය අලුත්වැඩියා කළේ ඔහුය.

> **නඩුව දින 76ක් විභාග වෙයි**

හතරවැනි විත්තිකරු භික්ෂුවකි. බණ්ඩාරනායකට රිවෝල්වරයකින් සිද්ධිය වූ දිනයේ වෙඩි තැබුවේ 40 හැවිරිදි තල්දුවේ සෝමාරාම හිමිය. ආයුර්වේද අක්ෂි වෛද්‍යවරයෙකි. ආයුර්වේද විද්‍යාලයේ කථිකාචාර්යවරයෙකි. ඔහු අගමැතිවරයාග් ඝාතකයාය.

පස්වැනි විත්තිකරු පොලිස් පරීක්ෂකයෙකු වූ කැලණියේ පදිංචිකරුවෙකි. නිවුටන් පෙරේරා වන ඔහු බුද්ධරක්ඛිත හිමිගේ කුඩා කළ සිට මිතුරෙකි. ඝාතනය සඳහා ඝාතකයාට රිවෝල්වරය ලබා දුන්නේ නිවුටන්ය. එය ලබාගෙන ඇත්තේ අනවසරයෙන් ගිනිඅවිගාරයක් පවත්වාගෙන ගිය විශ්‍රාමලත් සුරාබදු පරීක්ෂක ඔසි කොරයාගෙන් බව පැමිණිල්ල සඳහන් කළේ.

හයවැනි විත්තිකාරිය එවකට බණ්ඩාරනායක මහතාගේ ඇමති මණ්ඩලයේ සෞඛ්‍ය ඇමතිනිය වූ විමලා විජේවර්ධන මහත්මියයි. විමලා විජේවර්ධන මහත්මියගේ සැමියා කැලණිය විහාරස්ථානයේ දායක සභාවේ සභාපතිවරයාය. ඒ මහතාගේ මරණයෙන් පසු ඇය දායක සභාවේ සභාපතිනිය වූවාය. ඇය බණ්ඩාරනායක මහතාගේ ඇමති මණ්ඩලයේ සාමාජිකාවක්ව සිටිමින් බණ්ඩාරනායක මහතා ඝාතනය කිරීමේ කුමන්ත්‍රණයට දැඩි ලෙස සම්බන්ධ වූ බව පැමිණිල්ල බලවත් ලෙස විශ්වාස කළේය. මෙහි 7 වැනි විත්තිකරු කරෝලිස් අමරසිංහ ආයුර්වේද අක්ෂි වෛද්‍යවරයෙකි. දින 124ක් මේ ඝාතන අපරාධය පිළිබඳව එවකට කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් එන්.ඒ. ද එස්. විජේසේකර මහතා හමුවේ ලඝු විභාගයක් පැවැත්විය. එම ලඝු නඩු විභාගය අවසානයේ හත්වැනි විත්තිකාර කරෝලිස් අමරසිංහට කොන්දේසි සහිත සමාවක් දී පැමිණිල්ලේ සාක්ෂිකරුවෙකු කළේය.

හයවැනි විත්තිකාරිය වූ විමලා විජේවර්ධන මහත්මිය නිදහස් කළේය.

පළමුවැනි විත්තිකරු ඇතුළු සෙසු පස්දෙනාට එරෙහිව මිනිමැරීමට කුමන්ත්‍රණය කිරීම සහ මිනිමැරීමේ චෝදනාවන්ට නඩු විභාගය කිරීම ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යොමු කෙරුණි.

1961 පෙබරවාරි 22 වැනි දින ජ්‍යෙෂ්ඨ පළපුරුදු ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරයෙකු වන ටී.එස්. ප්‍රනාන්දු මහතා සහ විශේෂ ජූරි සභාවක් හමුවේ බණ්ඩාරනායක ඝාතන නඩු විභාගය ඇරඹුණි.

මාපිටිගම බුද්ධරක්ඛිත, එච්. පී. ජයවර්ධන, අනුර ද සිල්වා, තල්දූවේ සෝමාරාම,නිව්ටන් පෙරේරා මෙම නඩුවේ විත්තිකරුවන්ය.

1958 අගෝස්තු 25 වැනි දින 1959 සැප්තැම්බර් 26 අතර කාලයේ එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා ඝාතනය කිරීමට



හතර වන සැකකරු තල්දූවේ සෝමාරාම අධිකරණයෙන් නික්ම යන අයුරු

කුමන්ත්‍රණය කිරීම, ආධාර දීම, අනුබල දීම සම්බන්ධයෙන් සියලුම විත්තිකරුවන් වරදකරුවන් බව පළමු චෝදනාවෙන් සඳහන් විය.

හතරවැනි විත්තිකාර තල්දූවේ සෝමාරාමට බණ්ඩාරනායක මහතා ඝාතනය කිරීම සම්බන්ධයෙන් වෙනම චෝදනාවක් නඟා තිබිණි.


කැලණිය, වැල්ලම්පිටිය, රාජගිරිය, කොළඹ යන ප්‍රදේශවල කුමන්ත්‍රණය කළ බවත් 1959 සැප්තැම්බර් 26 වැනි දින කොළඹ රොස්මීඩ් පෙදෙසේ අංක 65 දරන ස්ථානයේදි හතරවැනි විත්තිකරු විසින් මෙම ඝාතනය සිදුකළබවත් 2 වැනි චෝදනාවෙන් සඳහන් විය.

රාජනීතිඥ ජෝජ් චිට්ටි මහතා රජයේ නීතිඥවරු වන ආනන්ද පෙරේරා, ලයනල් ප්‍රේමරත්න මහත්වරු සමඟ පැමිණිල්ල මෙහෙය විය.

ලන්ඩනයේ සිට ගෙන්වාගත් පිනියාස් ක්වාස් නීතිවේදියා සමඟ ඊ ඒ ජී ද සිල්වා නීතිඥවරු බුද්ධරක්ඛිත සහ ජයවර්ධන වෙනුවෙන් පෙනී සිටියහ. නීතිඥ කේ. ෂින්යා සහ කුලාම් රත්නසිර් තුන්වැනි විත්තිකාර අනුර ද සිල්වා වෙනුවෙන් පෙනී සිටියහ. නීතිඥ ලූෂන් ජී. වීරමන්ත්‍රි 4 වැනි විත්තිකාර තල්දූවේ සෝමාරාම වෙනුවෙන් පෙනී සිටියේය. පස්වැනි විත්තිකාර නිව්ටන් පෙරේරා වෙනුවෙන් පෙනී සිටියේ නීතිඥ එන් . සත්යේන්ද්‍ර මහතාය.

*(ඉතිරි කොටස ලබන සතියේ)*

> **බුද්ධි රක්ඛිතට, සෝමාරාමට හා එච්.පී. විජයවර්ධනට මරණ දඬුවම**



බුද්ධරක්ඛිත හිමි නඩු විභාගය පැවැති දිනයකදී අධිකරණයෙන් යළි බන්ධනාගාරයට රැගෙන යන අවස්ථාව

සිළුමිණ වාණිජ මණ්ඩලී මෙම පිටු එකතුව ව්‍යාපාරික ඔබ වෙනුවෙන්ම සැකසෙන විශේෂ අතිරේකයකි.
ඔබේ දේශීය-විදේශීය ව්‍යාපාර පුවත්, ප්‍රවෘත්ති නිවේදන, ඡායාරූප සහ නවතම පුවත් අප වෙත යොමු කරන්න.
සුළු, මධ්‍ය සහ මහා පරිමාණ ව්‍යාපාරික තොරතුරු සමාජයට විවර කිරීමට ඔබ පවත්වන මාධ්‍ය සාකච්ඡා සහ ගවේෂණ චාරිකාද යොමු කරන්නේ නම් මැනවි.
සියලු ලිපි පහත ලිපිනයට පමණක් එවිය යුතු වේ.
සිළුමිණ වාණිජ මණ්ඩලී, ලේක්හවුස් - කොළඹ 10.

හෙට ලොවට මග කියන ව්‍යාපාරික අත්වැල

දුරකථන : කර්තෘ - 011 2429261
දැන්වීම් කළමණාකරු - 011 2429429 දිගුව 351
විද්‍යුත් ලිපිනය : edmediaunit@gmail.com

වාණිජ මණ්ඩලී





# ආරුගම්බේ ජාතික Surfing ශූරතාවලියේ නිල සන්නිවේදන සහකරු මොබිටෙල්

2020 සැප්තැම්බර් 21, සඳුදා, කොළඹ: ජාතික ජංගම දුරකථන ජාලය වන මොබිටෙල් ජාතික Surfing ශූරතාවලිය සඳහා නිල සන්නිවේදන සහකරු ලෙස අනුග්‍රාහක දායකත්වය ලබාදීමට පෙරට පැමිණ ඇත. ශ්‍රී ලංකා රළ මත ලිස්සායාමේ සංගමය(Surfing Federation of Sri Lanka) විසින් සංවිධානය කරන ජාතික රළ මත ලිස්සායාමේ ශූරතාවලිය සියලු දෙනාම අපේක්ෂාවෙන් බලා සිටි ක්‍රීඩා ශූරතාවලියක් වන අතර 2020 සැප්තැම්බර් මස 27 සිට 29 දක්වා ආරුගම්බේ වෙරළ තීරයේ ඉතා උත්කර්ෂවත් අන්දමින් පැවැත්වීමට නියමිතය.

මෙම ශූරතාවලිය තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය සහ සංචාරක අමාත්‍යාංශයේ කාලෝචිත පියවරකි. මෙම අමාත්‍යාංශ දෙකෙහි ඒකාබද්ධ කැපවීම ලංකාවේ රළ මත ලිස්සායාමේ ක්‍රීඩාව ප්‍රවර්ධනය කිරීමට පමණක් නොව සංචාරක කර්මාන්තය නගා සිටුවීමට සහ එම ක්ෂේත්‍රය නැවත ගොඩනැංවීමට සිදුකරන කර්තව්‍යයකි.

දේශීය සහ විදේශීය රළ මත ලිස්සායාමේ ක්‍රීඩාවෙහි යෙදෙන දහසක් ක්‍රීඩකයන්ගේ බලාපොරොත්තු දැල්වීම සඳහා එම ශූරතාවලියේ සන්නිවේදන සහකරුවා ලෙස මොබිටෙල් සිය දායකත්වය ලබාදීමට පෙරට පැමිණ ඇත. සැප්තැම්බර් 27 වැනිදාට යෙදී තිබෙන ලෝක සංචාරක දිනයට සමගාමීව අති උත්කර්ෂවත් අන්දමින් ඇරඹෙන මෙම රළ මත ලිස්සා යෑමේ ශූරතාවලිය සඳහා දෙස් විදෙස් ක්‍රීඩකයන් 70ක් පමණ සහභාගී වේ.

ඔබ සමඟ සෑම විට ම රැඳී සිටින සන්නිවේදන ජාලයක් ලෙස මොබිටෙල් තාරුණ්‍ය නිපුණතා බලගන්වමින් ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ක්ෂේත්‍රය ගොඩනැංවීමට කැපවෙයි.

# සිංගර්, SLIM එක් වෙයි



සිංගර් ශ්‍රී ලංකා සමාගම, සිය පාරිභෝගිකයන් හට උසස් අත්දැකීමක් පිරිනැමීම සඳහා, ශ්‍රී ලංකාවේ දක්ෂ අලෙවිකරුවන් බිහි කිරීමේ ප්‍රමුඛයා වන SLIM සමඟ අත්වැල් බැඳ ගනියි. බලකාය සතු අලෙවි හා පාරිභෝගික සේවාවන් ඉහළ නැංවීමට අවශ්‍ය දැනුම, හැකියා සහ ආකල්ප දියුණු කිරීමේ අරමුණ ඇතිව, සිංගර් ආයතනය SLIM ආයතනය සමගින් එක්ව සිල්ලර සේවා අලෙවිය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාවක් හැදෑරීමේ අවස්ථාව මෙමගින් පිරිනමා ඇත.

ඒ අනුව, දිවයින පුරා ව්‍යාප්ත සිංගර් ප්‍රදර්ශනාගාර මගින් භාණ්ඩ මිලදී ගැනීමේදී පාරිභෝගික සේවා සම්බන්ධයෙන් විශිෂ්ට පුහුණුවක් ලැබූ කාර්ය මණ්ඩලයක සහය සිංගර් පාරිභෝගිකයන් හට පිරිනැමේ. SLIM හා අත්වැල් බැඳ ගනිමින්, සිය අලෙවි ජාලය මෙලෙස දැනුමෙන් සන්නද්ධ කිරීමට සිංගර් කටයුතු කිරීම හේතුවෙන් වඩාත් ප්‍රශස්ත පාරිභෝගික සේවාවක් සැලසීමට අමතරව, ඔවුන් අනාගත නායකයන් බවට පත් කරලීමේ සිංගර් ප්‍රයත්නය සඵල කර ගැනීමටද මග සැලසේ. මෙම සිල්ලර සේවා අලෙවිය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව හැරුණු විට, සිය අලෙවි කාර්ය මණ්ඩලය දැනුමෙන් සන්නද්ධ කිරීමේ අරමුණින්, මේ වන විට සිංගර් මූලිකත්වයෙන්, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ (TVEC) ලියාපදිංචිය යටතේ ක්‍රියාත්මක වන සිංගර් රීටේල් ඇකඩමිය ද පිහිටුවා ඇත. එම ඇකඩමිය මගින් පාරිභෝගික කටයුතු හා සිල්ලර සේවා මෙහෙයුම් පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව පැවැත්වෙන අතර, එය සාර්ථකව හදාරා අවසන් කරන පිරිසට එහිම පැවත්වෙන සිල්ලර සේවා අලෙවිකරණ උසස් ඩිප්ලෝමා පාඨමාලාව සඳහා යොමු වීමේ හැකියාව පවතී.

දිවයින පුරා සිංගර් ප්‍රදර්ශනාගාර 430 කට අධික සංඛ්‍යාවක් මගින්, ජාත්‍යන්තරව පිළිගත් සන්නාම 50 කට අධික සංඛ්‍යාවකින් SLIM-Nielson ජනතා සම්මාන උළෙලේදී අඛණ්ඩව වසර 14 තිස්සේම සිංගර්, ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ජනතා සම්මානය ලෙසින් ගෞරවයටද පාත්‍ර වී තිබේ.

# සෙලින්කෝ ලයිෆ් 'ෆැමිලි සවාරි' වෙතින් රුපියල් මිලියන 30 ක් වටිනා රත්තරන්




කොවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේ පනවා තිබෙන විදේශ ගමන් සීමා නිසා සෙලින්කෝ ලයිෆ් සමාගම සිය 'ෆැමිලි සවාරි' ප්‍රවර්ධන වැඩසටහන මගින් සමාගමේ රක්ෂණ ඔප්පුහිමියන්ට නවතම අත්දැකීමක් ලබාදෙමින් රුපියල් මිලියන 30 ක් වටිනා රත්තරන් ලබාදීමට කටයුතු යොදා ඇත.

සාමාන්‍යයෙන් 'ෆැමිලි සවාරි' ප්‍රවර්ධන වැඩසටහන මගින් ලබාදෙන විදේශ සංචාර සහ දේශීය සංචාර වෙනුවට මෙවර මේ ආකාරයෙන් රත්තරන් දිනාගැනීමට අවස්ථාව ලබාදී තිබෙන බව සෙලින්කෝ ලයිෆ් සඳහන් කරයි. කොවිඩ්-19 වසංගත තත්ත්වය දෛනික ජීවිතයේ බොහෝ අංශ වලට බාධා ඇතිකර තිබෙන අවස්ථාවක පවත්වන මෙම ප්‍රවර්ධන වැඩසටහනේදී සමාගම විසින් මාස දෙකකට වරක් දිනුම් ඇදීමක් පවත්වමින් වසරක් තුළ දිනුම් ඇදීම් හයක් පවත්වනු ඇත. මෙහිදී, එක් දිනුම් ඇදීමකදී සුපිරි ජයග්‍රාහකයාට රුපියල් මිලියනයක් වටිනා රත්තරන් දිනාගැනීමට අවස්ථාව හිමිවන අතර අනිකුත් ජයග්‍රාහකයින් 99 දෙනා අතර රුපියල් මිලියන 04 ක් වටිනා රත්තරන් බෙදා දෙනු ලැබේ.

සේයාරූ සටහන -

සෙලින්කෝ ලයිෆ් සමාගමේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ සහ අලෙවිකරණ අංශයේ නියෝජිතයින් සමග ෆැමිලි සවාරි වැඩසටහනේ සන්නාම තානාපතිවරුන් සිව්දෙනා.

# කොමර්ෂල් බැංකුවෙන් ත්‍රෛයිභාෂා ඒකාබද්ධ ඇමතුම් හා සහාය මධ්‍යස්ථානයක්



සිය පාරිභෝගිකයන්ට සහ පාර්ශ්වකරුවන්ට භාෂා තුනෙන්ම සතියේ දින හතේම පැය 24 පුරා සේවා සැපයීම සඳහා කොමර්ෂල් බැංකුව විසින් ඒකාබද්ධ ඇමතුම් මධ්‍යස්ථානයක් එළිදක්වා තිබෙන අතර, බැංකුවේ ගනුදෙනුකරුවන්ට විවිධ සන්නිවේදන නාලිකා ඔස්සේ මෙම මධ්‍යස්ථානයෙන් තොරතුරු විමසීම සහ සහාය ඉල්ලා සිටීම කළ හැකි බව බැංකුව සඳහන් කරයි.

මෙම ඇමතුම් මධ්‍යස්ථානය තුළ බැංකුවේ පාරිභෝගික සේවා නියෝජිතයන් සේවය කරන අතර ඔවුන් පාරිභෝගිකයන්ගේ ඇමතුම් වලට පිළිතුරු ලබාදීම, පාරිභෝගිකයන්ගේ ඉල්ලීම් සහ ප්‍රතිචාර සටහන් කරගැනීම සිදු කරන අතර පාරිභෝගිකයින්ට උසස් අත්දැකීමක් ලබාදීම සඳහා මෙම කණ්ඩායමට මනා පුහුණුවක් ලබාදී තිබේ. මේ වෙනුවෙන් මෙම කටයුතු බැංකුව විසින් නිසි අධීක්ෂණයකට සහ නිරීක්ෂණයකට බඳුන් කර ඇත.

සේයාරූ සටහන -

කොමර්ෂල් බැංකුවේ ඒකාබද්ධ ඇමතුම් මධ්‍යස්ථානය විවෘත කරන අවස්ථාවේදී බැංකුවේ ප්‍රධාන මෙහෙයුම් නිලධාරී, සනත් මනතුංග (වමේ සිට තුන්වැන්නා) සහ එම අවස්ථාවට සහභාගී වූ (වමේ සිට) බැංකුවේ ජ්‍යෙෂ්ඨ සාමාන්‍යාධිකාරී - ඇමතුම් මධ්‍යස්ථානය බියට්‍රිස් ස්ටාර්ලිං, කාඩ්පත් මධ්‍යස්ථානයේ ප්‍රධානී, තුසිත සුරවීර, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අලෙවිකරණ හස්රත් මුණසිංහ, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මානව සම්පත් කළමනාකරණය ඉසුරු තිලකවර්ධන සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - පුද්ගලික බැංකු කටයුතු සැන්ඩ්‍රා වල්ගම ඡායාරූපයේ වෙති

# ඕෂන් ලංකා සමාගම රිදී ජුබිලිය සමරයි



ශ්‍රී ලංකාවේ විශාලතම weft knitted රෙදිපිළි නිෂ්පාදකයා වන ඕෂන් ලංකා සමාගම, සිය අභිමානවත් වෘත්තීය ගමන් මගෙහි 25 වැනි සංවත්සරය සමරයි.

අඛණ්ඩ 25 වසරක් පුරා ශ්‍රී ලාංකීය ඇඟළුම් ක්ෂේත්‍රයේ විශාලතම මෙන්ම, ප්‍රමුඛතම සමාගම බවට පත් වීමට සහ ජාත්‍යන්තර වශයෙන් තරගකාරී සමාගමක් ලෙසින් ස්ථාවරත්වයක් ගොඩනගා ගැනීමටත් ඕෂන් ලංකා සමාගම වෙත හැකිව තිබීම හේතුවෙන් මෙම සංවත්සරය, සමාගම මහත් අභිමානයෙන් යුතුව සිහිපත් කරයි.

සමාගමේ ආරම්භයේ පටන්ම ශ්‍රී ලංකාවේ විශාලතම weft knitted රෙදි පිළි නිෂ්පාදකයා ලෙසින් නමක් දිනා ගන්නට සමත් වුණු ඕෂන් ලංකා සමාගම, ගෙතීමේ සිට රෙදි ඩයි කිරීම, මුද්‍රණය කිරීම සහ නිම කිරීම දක්වා වන රෙදි නිෂ්පාදනයේ අදියර හතරම මගින් දේශීය හා ජාත්‍යන්තර වෙළෙඳ පොළ සාර්ථකව ජයගත් සමාගමකි.

# හොඳම ආයතනික වෙබ් අඩවිය සම්මානය ප්‍රයිම් දිනා ගනී




ප්‍රයිම් සමූහය 10 වන වරටත් සංවිධානය කෙරුණු BestWeb.lk 2020 සම්මාන උළෙලේදී සම්මාන දෙකක් දිනා ගනියි. වෙබ් අඩවි සඳහා සම්මාන පිරිනැමීමට වාර්ෂිකව පැවැත්වෙන මෙම තරගාවලියේ දී කාණ්ඩ දෙකක් යටතේ සම්මාන දිනා ගැනීමට ප්‍රයිම් සමූහය සමත් විය.

එහිදී හොඳම ආයතනික වෙබ් අඩවිය සඳහා වන රන් සම්මානයත්, සමස්ථ තරගාවලියේ රිදී සම්මානයත් ඔවුන් දිනා ගත්තේය. එමගින් ඉදිරි තාක්ෂණ, නවෝත්පාදන සහ සැලසුම්කරණය කෙරෙහි ප්‍රයිම් සමූහයේ ඇති කැපවීම මනාව පිළිබිඹු කෙරිණි. ප්‍රයිම් සමූහයේ www.primelands.lk ආයතනික වෙබ් අඩවිය මෙලෙස "Overall Winners" කාණ්ඩය යටතේ රිදී සම්මානයත් "Corporate" කාණ්ඩය යටතේ රන් සම්මානයත් හිමි කර ගනු ලැබුවේ සමස්ත තරගකරුවන් 485ක් අතුරින් සිය විශිෂ්ටත්වය විදහා දක්වමිනි.

උස්වත්ත කන්ෆැක්ෂනරි වර්ක්ස් සමාගම අනුග්‍රහයෙනි
මොටාගෙදරගේ ගුරු ගෝල වෙනස - 74

ගුරු චිත්‍රය



ගෝල චිත්‍රය



චිත්‍ර ශිල්පී මොටාගෙදර වනිගරත්න මෙහි වම් පසින් ඇති චිත්‍රය නිර්මාණය කළේ ය. ඉන්පසු එබඳුම චිත්‍රයක් නිර්මාණය කරන්නැයි සිය ගෝලයකුට උපදෙස් දුන්නේය. එහෙත් ගෝලයා නිර්මාණය කළ චිත්‍රය ගුරුවරයාගේ චිත්‍රය හා සමාන යැයි බැලූ බැල්මට පෙනුණ ද එහි වෙනස්කම් දහයක් ඇත. ඔබ කළ යුත්තේ එම වෙනස්කම් දහය මොනවාදැයි අංක මගින් සලකුණු කිරීමයි. වෙනස්කම් සලකුණු කළ 'සිළුමිණ' පත්‍රයෙන් කපා ගත් ගෝලයාගේ චිත්‍ර සටහන තැපැල්පත්වල පමණක් අලවා උස්වත්ත ටිපිටිප් හෝ බිස්කට් ලාංඡන 2 ක් සමඟ පහත දැක්වෙන ලිපිනයට යොමු කරන්න. එක් පුද්ගලයකුට චිත්‍ර සටහන් එකකට වැඩි ගණනක් එවිය හැකි අතර ඒවා මුල් පිටපත් පමණක් විය යුතු ය. ජයග්‍රාහකයන්ට වටිනා මුදල් ත්‍යාග පිරිනැමේ. තැපැල්පත් සැප්තැම්බර් මස 29 වැනිදාට පෙර පහත ලිපිනයට එවිය යුතු ය. ගුරුගෝල වෙනස, 'සිළුමිණ', ලේක්හවුස්, කොළඹ 10 මෙතෙක් පැවැති ත්‍යාග රටාව වෙනුවට ජයග්‍රාහකයන්ට රුපියල් 2500 බැගින් ත්‍යාග 09 ක් පිරිනැමේ. උස්වත්ත කන්ෆැක්ෂනරි වර්ක්ස් ලිමිටඩ් අනුග්‍රහයෙනි.

සම්බන්ධීකරණය - ගාමිණී රූපානන්ද (අනුරූ මාධ්‍ය සේවා)

රුපියල් විසිපන්දහසක තෑගි




පිළිතුරු එවීමේදී නම, නිවැරැදි ලිපිනය සහ දුරකතන අංකය සඳහන් කරන්න.

# Samsung Sri Lanka ප්‍රවර්ධන වැඩසටහන් පෙළක්



Samsung Sri Lanka විසින් සිය පාරිභෝගිකයන් සහ හිතවත් අලෙවි නියෝජිත ජාලයේ වෙත ආකර්ෂණීය ත්‍යාග ප්‍රදානය කිරීමේ අරමුණින් මේ සැප්තැම්බර් මාසයේ දී අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් පෙළක් ක්‍රියාත්මක කරයි . 'Samsung Mobile Wasi Mase' සහ Mega Vehicle Bonanza එළිදැක්වීමත් සමඟ Samsung ප්‍රවර්ධන මාසය ආරම්භ වන අතර මේ හරහා දැනට පවතින වෙළඳපොළ නැංවීමට අවශ්‍ය කර තිබුණු උපරිම ජවය සහ ආකර්ෂණය ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරෙයි.

Samsung Mobile 'Wasi Mase' හරහා තෝරාගත් දුරකථන වලට ආකර්ෂණීය වට්ටම් දීමනා සහ පොලී රහිත වාරික ලෙස පහසු ගෙවීමේ අවස්ථා හඳුන්වාදී ඇත. වැඩියෙන්ම අලෙවි වන Samsung දුරකථන රාශියක් අතරින් තමන් කැමති ඕනෑම දුරකථනයක් සුවිශේෂී මිලකට තෝරා ගැනීමේ අවස්ථාව මේ හරහා පාරිභෝගිකයන්ට හිමි වේ. 'Samsung Mobile Wasi Mase' ප්‍රවර්ධන වැඩසටහනට අයත් ස්මාර්ට් ජංගම දුරකථනය වන්නේ Galaxy A21S (රු.1000 අඩු කළ) වේ. තමන් භාවිත කරන දුරකථනයට වඩා ඉහළ විශේෂාංග ඇතුළත් අලුත් දුරකථනයක් මිලදී ගැනීමට අපේක්ෂා කරන අයට නව මිල ගණන් ගැන කරදර නොවී වඩාත් සහනදායී මිලකට දුරකථනයක් මිලදී ගැනීමේ අවස්ථාව මෙයින් උදාවේ.

# දිගු කාලීන බැටරි ධාරිතාවක් සහිත Huawei Y6P




Huawei මෑතකදී වෙළඳ පොළට දියත් කරන ලද Huawei Y6P සියලුම තරඟකාරී ස්මාර්ට් දුරකතන සඳහා විශාල අභියෝගයක් එක්කර ඇත. එයට ප්‍රධාන හේතුව නම් මෙම මිල පරාසයේ ඇති වැඩිම storage සහිත ස්මාර්ට් දුරකථනය Huawei Y6P වීමයි. 4GB RAM + 64GB storage සහිතව නිපදවා ඇති Huawei Y6P තුළින් පරිශීලකයන්ට ඇති තරම් දත්ත ප්‍රමාණයක් කිසිඳු අවහිරතාවයකින් තොරව ගබඩා කර ගැනීමේ හැකියාව හිමි වීම සුවිශේෂී වේ.

තවද මෙම මාදිලියේ දුරකථනවල ඇති තවත් එක් සුවිශේෂී විශේෂාංගයක් වනුයේ එහි 5000mAh දිගු කාලීන බැටරි ධාරිතාවයයි.

වැඩි වේලාවක් ස්මාර්ට් දුරකථනය හා ක්‍රියාකරන පරිශීලකයින්ට සුභ ආරංචියක් රැගෙන එමින් 5000mAh බැට්‍රියක් Huawei Y6P හා අන්තර්ගත කර තිබීම නිසා නිතර නිතර charge කිරීමේ ගැටලුව දැන් ඇති නොවේ.

ඕනෑ තරම් වේලාවක් Games internet browsing, social media browsing, videos නැරඹීම සහ සංගීතයට සවන්දීම ඇතුළු කාර්යයන් රැසක් Huawei Y6P හරහා දැන් බාධාවක් නොමැතිව සිදු කර හැකිය.

ක්‍රීඩා
බන්දුල ජයමාන්න
kreeda@lakehouse.lk

## ක්‍රීඩා සංගම් නිලවරණ අර්බුදය

# අවසන් තීරණය ඇමති අතේ

ආර්. බී. වික්‍රමසිංහ
ජාතික ක්‍රීඩා සංගම් විෂය බාර සහකාර අධ්‍යක්ෂ



● ගීෂා මුණසිංහ

**2020 අගෝස්තු 31වැනි දාට පෙර නිලවරණ පවත්වා අවසන් කළ යුතු ජාතික ක්‍රීඩා සංගම් 24ක් පිළිබඳ කතාබහක් පසුගියදා ජාතික ක්‍රීඩා සංගම්, සම්මේලන අතර විය. ඒ අතරින් 14ක්ම මෙතෙක් නිලවරණ පැවැත්වීමට අසමත්ව තිබේ. මේ පිළිබඳ ක්‍රීඩා අමාත්‍යාංශයේ ජාතික ක්‍රීඩා සංගම් විෂය බාර සහකාර අධ්‍යක්ෂ ආර්.බී. වික්‍රමසිංහ ගෙන් විමසුවෙමු.**

ජාතික ක්‍රීඩා පනතට අනුව මැයි මස 30වැනිදා වන විට ක්‍රීඩා සංගම් වල විගණන වාර්තා මෙන්ම නිලවරණ පැවැත්වෙන දින වකවානු ලිඛිතව ක්‍රීඩා අමාත්‍යාංශය වෙත ලබා දිය යුතුයි. නමුත් පසුගිය කොවිඩ් 19 වසංගත තත්ත්වය නිසා මෙම දින වකවානු 2020 අගෝස්තු 31වැනි දින දක්වා කල් දැම්මට කටයුතු කළා. ඒත් මේවන තෙක් ක්‍රීඩා සංගම් කිහිපයක් තම වගකීම් වලින් බැහැරව කටයුතු කරමින් සිටිනවා. ඒ අතර ශ්‍රී ලංකා හොකි සම්මේලනය, ශ්‍රී ලංකා මල්ලවපොර සම්මේලනය,ශ්‍රී ලංකා කැරම් සම්මේලනය,ශ්‍රී ලංකා පැසිපන්දු සම්මේලනය ශ්‍රී ලංකා බේස්බෝල් සම්මේලනය, ශ්‍රී ලංකා ගෝල් බැඩ්මින්ටන් සම්මේලනය, යන සංගම් 6 ය මේ වන විට නිලවරණ කැඳවා තිබේනවා, එහෙත් මෙතෙක් එම නිලවරණ අවසන් කර නෑ. ඒවගේම නිලවරණ පැවැත්වීමට ඔවුන්ට දින ගණන ප්‍රමාණවත් නෑ.ශ්‍රී ලංකා ගොල්ෆ් සංගමය හා ශ්‍රී ලංකා හැන්ඩ්බෝල් සම්මේලනය යන සංගම් දෙක අපට නිලවරණ පවත්වනවාද, ඒ කවදද, කියලවත් දැනුම්වත් කර නෑ. ශ්‍රී ලංකා පවර් බෝට් සංගමය, ශ්‍රී ලංකා යුනිෆයිට් සංගමය හා ශ්‍රී ලංකා රෝල් බෝල් සම්මේලනය නිලවරණ නොපැවැත්වුණු ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වෙමින් පවතින ජාතික ක්‍රීඩා සංගම් අතර වනවා. අවසන් තීරණය ක්‍රීඩා ඇමතිතුමා ගත යුතුයි.

ඒ වගේම මේ සංගම් වල නිලවරණ පැවැත්විමේ නිර්ණායකවලට ජාතික ක්‍රීඩා සභාවත් සමඟ සම්බන්ධ වී අවසන් තීරණවලට යාමේ හැකියාව තිබෙන්නේ ඇමතිතුමාට.ශ්‍රී ලංකා කායවර්ධන සම්මේලනය, ශ්‍රී ලංකා සවි එසවීමේ (පවර් ලිෆ්ටින්)සම්මේලනය හා පාපැදි සම්මේලනය යන සංගම් 3 දැනට ක්‍රියාත්මක වෙමින් තිබේන්නේ ක්‍රීඩා අධ්‍යක්ෂ ජෙනරාල්වරයා බාරයේ. අපි ඒ සංගම් තුනටත් නිලවරණ පැවැත්වීමට බලාපොරොත්තු වෙනවා.

කායවර්ධන සම්මේලනයෙන් හා සවි එසවීමේ සම්මේලනයෙන් දෙවතාවක් නාමයෝජනා කැඳවීමට නිලවරණ පැවැත්වීමට මහා සභාව රැස්කොට නාම යෝජනා කමිටු පත් කළා. ඒ දෙවතාවේදීම බාධා ඇතිවුණා.

ශ්‍රී ලංකා ලංකා කැරම් සම්මේලනයේ ඇතිව ඇති තත්ත්වය තමයි ජනසතුසේවා සංගමයටයි.එයට අනුබද්ධ සංගම් වලටයි ජාතික සම්මේලනයේ තනතුරු සඳහා තරග කිරිමේ අවස්ථාව ඉල්ලිම. එම අවස්ථාව ලබා දීමේදිම ශ්‍රී ලංකා කැරම් සම්මේලනය ප්‍රතික්ෂේප කළා. අපි ඒ පිළිබඳව දෙපාර්ශ්වයම කැඳවා ප්‍රශ්න කළ විට ඔවුන් පවසන්නේ ජනසතු සේවා සංගමය හා අනෙකුත් සංගම් වාර්ෂික සාමාජිකත්ව ගාස්තු ගෙවා නෑ.සම්මේලනය සංවිධානය කරන සමස්ත ලංකා තරග වලටද සහාභාගී වි නැති බවයි.

ශ්‍රී ලංකා මෝටර් රථ ක්‍රීඩා (ඔටෝමොබයිල්) සම්මේලනයේ (ස්ලාස් - SLAS )පසුගිය වසරේදී මතභේදාත්මක ආරවුලක නිරතව වුණා. ඒ ආරවුල සමතයකට පත්ව නෑ. ඒ තමයි ශ්‍රී ලංකා මෝටර් රථ ක්‍රීඩා (ඔටෝමොබයිල්) සම්මේලනයේ (ස්ලාස් - SLAS ) ජාත්‍යන්තර ඔටෝමෝබයිල් සමාජිකත්වය පිළිබඳ ආරවුලක්.ඒ ශ්‍රී ලංකා මෝටර් රථ ක්‍රීඩා (ඔටෝමෝබයිල්) සම්මේලනයේ (ස්ලාස් - SLAS ) යටතේ ලියපදිංචි සංගමයක් වන සිලෝන් මෝටර් ඔටෝමෝබයිල් සංගමය තමයි ජාත්‍යන්තර සමාජිකත්වය හිමිකරගෙන සිටින්නේ.

එහෙත් එම ක්‍රියාවලිය වැරදියි.සෑම ලියාපදිංචි ජාතික ක්‍රීඩා සංගමයකටම සිය අදාළ ජාත්‍යන්තර සම්මේලනයේ හෝ සංගමයේ ලියාපදිංචි විමේ බලය තිබිය යුතුය.ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි ක්‍රීඩා සංගම් 70ව අතර ක්‍රියාත්මක නොවන ක්‍රීඩාවක් පසුගිය දිනක තහනමට ලක් කර තිබේනවා. ඒ තමයි බාල් නැටුම් සංගමය (බෝල්රූම් ඩාන්ස්) ඒ සංගමයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වසර ගණනාවක් තිස්සේ ප්‍රශ්න තිබුණා. වාර්ෂික විගණන වාර්තා වසර 6කින් විගණනය කර නෑ. ප්‍රාදේශිය මට්ටමින් සංගම් ව්‍යාප්ත විමක් කර නෑ ,වසර පහකින් තරගාවලි පවත්වා නෑ .වසර හතරකට වැඩි කාලයක් මහා සභා රැස්විමක් පවත්වා නෑ.නිලධාරීන් පත් වී නෑ.ඒ නිසා අපට සිදුවුණා බාල් නැටුම් සංගමය (බෝල්රූම් ඩාන්ස්)තහනම් කරන්න.ප්‍රශ්න ගැටුම් නැති සංගම් මෙන්ම ගැටුම් ගැටලු ඇති සංගම්ද තිබේනවා. එම ගැටුම් නිරාකරණය කරමින් අන්තර් ජාතික තලයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් බිහිකිරිම තමයි අපේ අරමුණ විය යුත්තේ.

අපි හැම විටම ක්‍රියාත්මක කරන්නේ ගැටුම් නිරාකරණය කරමින් ඉදිරිය සකසා දිමයි සංගම් සම්මේලන ඒ මඟ යමින් ක්‍රීඩක ක්‍රිඩිකාවන්ගේ දක්ෂතාවයන් වර්ධනය කිරිමේ වගකීම දැරිය යුතුයි. ක්‍රීඩා අමාත්‍යාංශය ඒ වෙනුවෙන් ක්‍රියාකාරිව හැම විටම සිටිනවා. අවසාන කාර්තුවේදී සංගම් හා සම්මේලන ගණනාවක් තම ක්‍රීඩා තරග පැවැත්විමට කටයුතු කර තිබේනවා. මේ වසරේ මුල් කාර්තුවේදි හා මැද කාර්තුවේදි තිබුණු පසුගාමිත්වය පහව යමින් තිබෙනවා. කොවිඩ්19 වසංගත තත්ත්වය නිසා මඳක් පසුගාමිව ආරම්භ වු පුහුණු විම් නැවත පණගන්වන්නට ක්‍රීඩා අමාත්‍යාංශය වැඩ කටයුතු සම්පාදනය කරමින් සිටිනවා. තරගාවලියන්ට වඩා වැදගත්ම කරුණ තමයි පුහුණුවිම් නැතිනම් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ මානසික හා කායික යෝග්‍යතාව රඳා පවත්වා ගෙන යැම අපහසුයි. ඒ නිසා සෑම ක්‍රීඩා තරගාවලියන්ටම සමගාමීව පුහුණුවිමේ ක්‍රියාපටිපාටියක් ඉහළ නැංවිය යුතුයි.



# පුරා දින පහක් කොළඹ එකෙළි කරන

# යෞවනයේ ක්‍රීඩා සැණකෙළිය

**තිස් දෙවැනි ජාතික යොවුන් ක්‍රීඩා උලෙළ කොවිඩ් 19 වසංගතය නිසා මේ වසරේ පැවැත්වීමට නොහැකි වුවද ලබන වසරේ (2021) දී මෙකී ක්‍රීඩා තරගාවලි ඉතිහාසයේ ප්‍රථමවරට වැඩිම තෑගි මුදල් සමඟින් දින පහක් පැවැත්වීමට කටයුතු යොදා ඇතැයි ජාතික තරුණ සේවා සභාවේ සභාපති, අධ්‍යක්ෂ ජෙනරාල් තෙෂාර ජයසිංහ පවසයි.**

මේ අනුව තිස් දෙවැනි ජාතික යොවුන් ක්‍රීඩා උලෙළ ලබන වසරේ මාර්තු මාසයේදී පැවැත්වීමට නියමිතය. මෙකී තරගාවලියේ මූලික වටයේ තරග මේ වන විට ආරම්භ කර තිබේ.

ක්‍රීඩා තරගාවලියට එක්වන ක්‍රීඩක ක්‍රීඩිකාවන් එකතැනකට ගාල් කරලා දින තුනකදි මේ තරගාවලිය නිමා කිරීම සාර්ථක නොවන බව පවසන තෙෂාර ජයසිංහ, සාමාන්‍යයෙන් මෙතෙක් කල් කළේ දින තුනකට තරගාවලිය සීමා කරලාම පටන් ගන්නවා. අවසන් කරනවා. මේ ක්‍රමය සාර්ථක නෑ කියලා තේරෙනවා. ඒ නිසයි ලබන අවුරුද්දේ පවත්වන තිස් දෙවැනි ජාතික යොවුන් ක්‍රීඩා උලෙළ දින පහකට ගෙන යන්න තීරණය කළේ. දින දෙකක්ම විශේෂාංගවලට වෙන් කරන්න තීරණය කරලා තියෙනවා.

මේ අතර ජාතික යොවුන් ක්‍රීඩා තරගාවලියට එක්වන ක්‍රීඩක ක්‍රීඩිකාවන් තණකොළ සහිත ක්‍රීඩාංගණවල ක්‍රීඩා කිරීම සුදුසු නොවන බවද පවසන තෙෂාර ජයසිංහ, මලල ක්‍රීඩා ඉසව්



ජාතික තරුණ සේවා සභාවේ සභාපති සහ අධ්‍යක්ෂ ජෙනරාල් තෙෂාර ජයසිංහ

අනිවාර්යයෙන්ම සුගතදාස හෝ දියගම වගේ පහසුකම් තියෙන ක්‍රීඩාංගණවල පැවැත්විය යුතුයි. ජාතික යොවුන් ක්‍රීඩා උලෙළ අපේ රටේ පැවැත්වෙන දෙවැනි විශාලම ක්‍රීඩා උලෙළයි. මේ තරගාවලියේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් තණකොළ සහිත ක්‍රීඩාංගණවල තරග කරන එක සුදුසු නෑ. මේ ගමෙන් නගරයෙන් මතුවන ක්‍රීඩා අංකුරවලට කෘත්‍රිම ධාවනපථවල අත්දැකීම් ලබා දිය යුතුයි. එහෙම නැතුව ඔවුන්ට ඉදිරියට යන්න අමාරුයි.

මේ අතර තිස්තුන්වැනි ජාතික යොවුන් ක්‍රීඩා තරගාවලිය ද ලබන වසරේ දෙසැම්බර් මාසයේම පැවැත්වීමට ද බලාපොරොත්තු වන බව තෙෂාර ජයසිංහ පවසයි. මින් ඉදිරියට පැවැත්වෙන ජාතික යොවුන් ක්‍රීඩා උලෙළ විශේෂාංග රැසක් එක් කරමින් පැවැත්වීමට තරුණ සහ ක්‍රීඩා අමාත්‍ය නාමල් රාජපක්ෂ මහතාගේ පූර්ණ සහයෝගය ලැබී ඇතැයිද හෙතෙම පවසයි. මේ අතර දැනට ජාතික තරුණ සේවා සභාව, වොලිබෝල් සංචිතයට අමතරව, කබඩි, නෙට්බෝල්, පාපන්දු සහ කාන්තා රග්බි සංචිත අලුතින් ආරම්භ කිරීමට ද කටයුතු යොදා තිබේ.

ඒ අතර දිවයින පුරා විසිරී සිටින ක්‍රීඩාවට දක්ෂ තරුණ තරුණියන්ට ක්‍රීඩා ප්‍රවේශය සඳහා 'ටැලන්ට් හන්ට්' නමින් අලුත් වැඩසටහනකට අතගසා තිබේ. මේ සඳහා වයස අවුරුදු 16 - 25ත් අතර තරුණ තරුණියන්ට සහභාගිවීමට අවස්ථාව හිමිවෙයි. මේ තුළින් මතුවන දක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ක්‍රීඩා සංචිත සඳහා ඇතුළත්වීමට අවස්ථාව හිමිවෙයි. මේ ක්‍රීඩා පුහුණු සංචිත පවත්වාගෙන යාමට සහ මෙහෙයවීමට ක්‍රීඩා අමාත්‍යාංශය පූර්ණ දායකත්වය සපයයි. ජාතික තලයට දක්ෂයකු හඳුන්වා දීම මෙහි මූලික අරමුණයි.

**ඡායාරූපය - රංජිත් අසංක**

# ක්‍රීඩා ඉතිහාසයේ ජී. එල් - නාමල් ඓතිහාසික එක්වීමක්



ජී. එල්. පීරිස්



නාමල් රාජපක්ෂ

**දිවයිනේ සෑම දිස්ත්‍රික්කයක්ම නියෝජනය වන පරිදි මේ වනවිට ක්‍රීඩා පාසල් 25ක් ස්ථාපනය කර ඇති අතර,එකී ක්‍රීඩා පාසල් සඳහා සිසුන් ඇතුළත් කිරීම, ක්‍රීඩා පාසල්වල පරිපාලන හා මූල්‍ය කටයුතු මෙන් ම ක්‍රීඩා පාසල් සංවර්ධනයට අදාළව ඉදිරියේ දී අධ්‍යාපන හා ක්‍රීඩා අමාත්‍යාංශයන්හි සම්බන්ධීකරණයෙන් ක්‍රියාත්මක විය යුතු ආකාරය පිළිබඳ සාකච්ඡාවක් අධ්‍යාපන අමාත්‍ය, මහාචාර්ය ජී. එල්. පීරිස් සහ ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍ය නාමල් රාජපක්ෂගේ ප්‍රධානත්වයෙන් සියලු ක්‍රීඩා පාසල් විදුහල්පතිවරුන්ගේ සහභාගීත්වයෙන් පවත්වා තිබේ.**

පාසල් සිසුන්ගේ ක්‍රීඩා සාධන මට්ටම් උසස් තත්ත්වයකට ගෙන එමින්, විධිමත් ක්‍රීඩා අධ්‍යාපනයක් ලබාදීමට හැකි පාසල් පරිසරයක් ඇති කිරීමත්, එමගින් ජාත්‍යන්තරය ජයගත හැකි විශිෂ්ට ක්‍රීඩකයන් මෙරට පාසල් ක්‍රීඩා පද්ධතිය තුළින් බිහිකිරීමත් ක්‍රීඩා පාසල් ස්ථාපනය කිරීමේ ප්‍රමුඛ අරමුණු වේ. ක්‍රීඩා පාසල් සඳහා සිසුන් ඇතුළත් කිරීම 8 වැනි ශ්‍රේණියෙන් ආරම්භ කෙරෙන අතර, ක්‍රීඩා සඳහා විශේෂ හැකියාවක් සහ ලැදියාවක් සහිත සිසුන්ගෙන් නියමිත සාධන මට්ටමට පැමිණි සිසුන් සම්මුඛ පරීක්ෂණ මගින් තෝරා ක්‍රීඩා පාසල් වෙත ඇතුළත් කරනු ලැබේ. පස්වැනි ශ්‍රේණිය ශිෂ්‍යත්ව සමතුන්ගෙන් 6 ශ්‍රේණියට ඇතුළත් කරගන්නා සිසුන්ගෙන් පන්තියක සිටිය යුතු උපරිම සිසුන් සංඛ්‍යාව පූරණය වීම නිසා ක්‍රීඩා පාසල්වලට සිසුන් ඇතුළත් කිරීමේ දී මතුව පවත්නා ගැටලුවට විසඳුම් ලෙස සෑම ක්‍රීඩා පාසලක ම 8 ශ්‍රේණිය සඳහා වෙනම පන්තියක් ආරම්භ කිරීමට ද අදහස් කරගෙන තිබේ.

එමෙන්ම ක්‍රීඩා පාසල්වල මානව සම්පත් සංවර්ධනය, භෞතික සම්පත් සංවර්ධනය, දැනට පවත්නා ක්‍රීඩා පිටි සංවර්ධනය කිරීම හා නවීකරණය නේවාසිකාගාර අලුත්වැඩියා කිරීම සහ අවශ්‍ය සම්පත් සකස් කරදීම ඇතුළු ප්‍රමුඛ සංවර්ධන අවශ්‍යතා වෙනුවෙන් ද ක්‍රීඩා අමාත්‍යාංශයේ සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ සම්බන්ධීකරණයෙන් ත්‍රිවිධ හමුදාවේ විශේෂ සහාය ද ඇතිව ඉදිරි සංවර්ධන ක්‍රියාමාර්ග දියත් කිරිමට ද යෝජිතය.

ලාංකේය ක්‍රීඩාව නඟා සිටුවීමට නම් මුලින් ම කළ යුතු වන්නේ ක්‍රීඩාවේ තිඹිරිගෙය වන පාසල සම්බන්ධ කරගෙන ඉදිරියට යාම බව පළමු සමස්ත ලංකා පාසල් ළමා මලල ක්‍රීඩා තරගාවලියේදීම ඔප්පු විය. ළමුන්ගේ දෛනික දිවියේ ඇවිදීම, දිවීම, විසි කිරීම, පැනීම් වැනි සාමාන්‍ය ක්‍රියාකාරකම් විනෝදාස්වාදය ලබා ගත හැකි ආකාරයෙන් විද්‍යානුකූල පසුබිමක් යටතේ පෙළ ගැස්ම මෙම ක්‍රීඩා තරගාවලියේ මූලික පරමාර්ථය විය. මේවායේ ප්‍රතිඵල දිනකින්, සතියකින්, මාසයකින් නොලැබී යා හැකි නමුත් වැදගත් වන්නේ මේවා තුළ දිගින් දිගටම අත්වැල් බැඳගෙන කටයුතු කිරීමය.

කුඩා වියේදීම ක්‍රීඩා පිටියට පිවිසීම හරහා අනාගතය පිළිබඳ බලාපොරොත්තු ඇති කරගත හැකිය. මෙවැනි තරගාවලියක් සඳහා උපදෙස් දුන් නිලධාරීන් මීට වසර හතකට පමණ පෙර වයස අවුරුදු 13 න් පහළ තරගකාරි ක්‍රීඩා නැවැත්වීමට උපදෙස් ලබා දුන් නිලධාරින් අද අනුභව කරන්නේ මොනවාදැයි මඳක් සොයා බැලිය යුතුව තිබේ. හිටපු ක්‍රීඩා, අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන අමාත්‍යවරුන් විසින් කැබිනට් සංදේශයක් මගින් වයස අවුරුදු 13 න් පහළ ක්‍රීඩා තරග තහනම් කරන ලදී. එහිදී එවකට ක්‍රීඩා අමාත්‍යවරයා ප්‍රකාශ කළේ පුහුණුවක් නැති පිරිස් පුහුණුකරුවන් යැයි කියා ගනිමින් දරුවන්ගේ සාරය උරා බොන බවය.

එසේ නම් මේ ලේ උරාබොන පුහුණුකරුවන් ඩ්‍රැකියුලා වර්ගයේ පුහුණුකරුවන් විය යුතුය. අමාත්‍යවරයාට අවශ්‍ය නම් කළ යුතුව තිබුණේ ඩ්‍රැකියුලා වර්ගයේ පුහුණුකරුවන් ගෙන් දරුවන් බේරා ගැනීමට නම්, එකී පුහුණුකරුවන් ඉවත් කිරීම මිස දරුවන්ට ක්‍රීඩා තරග තහනම් කිරීම නොවේ. විද්‍යාත්මක හැදෑරීමකින් තොරව මහදැනමුත්තා එළුවාගේ බෙල්ල වෙන්කර මුට්ටිය ගැනීමට උපදෙස් දුන්නා සේ විශේෂයෙන් මෙරට අධ්‍යාපන සහ ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරින්, බලධාරීන්ට දිරච්ච ලණු දීමට ගජ හපන්නුය.

ඒවා අනුව ක්‍රියා කරන බලධාරින්ද අවසානයේ වැටෙන්නේ කුණු ගොඩවල්වලටය. අධ්‍යාපන අමාත්‍යාංශයට හෝ ක්‍රීඩා අමාත්‍යාංශයට ලාංකේය ක්‍රීඩාව ගොඩ ගැනීමට වෙන වෙනම සැලසුම් සකස් කිරීමෙන් පලක්වේද යන්න බලධාරින් දැන්වත් කල්පනා කළ යුතුය.

කඹ ඇදිලි, බෝල පාස්කරගැනීම් පැත්තකින් තබා අධ්‍යාපන සහ ක්‍රීඩා අමාත්‍යවරුන් මුලින්ම එකට සිටගෙන පෙරට යාමට ඉටාගත යුතුය. ලාංකේය ක්‍රීඩාවේ තිඹිරිගෙය පාසලය. එය අමතක කර වැඩ කිරීමෙන් පලක් නැත. මුල් පදනම දමා ගත යුත්තේ පාසල සමඟය. ඒ නිසා අධ්‍යාපන සහ ක්‍රීඩා අමාත්‍යවරුන් එකට හමුවී ඒ සඳහා විද්‍යානුකූල සැලසුමක් සකසා ගතයුතුය. බිඳී නොයන පදනමක් දමාගත යුතුය.




# මාධ්‍ය ලෝකයේ රසවතුන් ගේ කතාව සංඛ අමර්ජිත් ගේ 'වැඩකට නැති පොත'

● සුරේකා නිල්මිණි ඉලංගකෝන්

**එදා මෙදාතුර මාධ්‍ය ලෝකය අරුත් ගැන්වූ රස ගැන්වූ අපූර්වතම චරිත බොහෝ ය. ජීවිතය හැර ගියද ඒ මතක සහෘද හදවත් තුළ සදාතනික වේ. ප්‍රවීණ මාධ්‍යවේදී සංඛ අමර්ජිත් විසින් රචිත 'වැඩකට නැති පොත' මාධ්‍ය කලාවේ සොඳුරු මතක සහ චරිත පිළිබඳ කියැවෙන අපූරු කෘතියකි. වර්තමානයේ සංඛ අමර්ජිත් රූපවාහිනී ප්‍රේක්ෂකයන් අතර ප්‍රකටව සිටින්නේ ජනප්‍රිය නිවේදකයකු ලෙසටය. 1990 දශකය අගභාගයේදී ඔහු විසින් 'සඳරේණු'යොවුන් පුවත්පතට ලියූ 'කොමිටල් විජිතය' එකල යොවුන් පරපුර අතර අතිශයින් ජනප්‍රිය විශේෂාංගයක් විය. සංඛ අමර්ජිත් නම් ඒ ජනප්‍රිය ලේඛකයා පසු කලෙක සිරස එෆ්.එම් ගුවන් විදුලි නාළිකාවේ ආරම්භක සාමාජිකයකු වෙමින් එහි නිවේදකයකු ලෙස කටයුතු කළේය. මේ වන විට ඔහු නිවේදකයකු ලෙස මාධ්‍ය ක්ෂේත්‍රයේ නිරතව සිටින අතර වෘත්තියෙන් නීතිඥයකු ලෙස කටයුතු කරයි. 'වැඩකට නැති පොත' කෘතිය පිළිබඳ සංඛ අමර්ජිත් මෙසේ පැවසීය.**

"පත්තරේට 'කොමිටල් විජිතය' ලිව්වට පස්සේ මට එවැනි විශේෂාංගයක් හෝ පොතක් ලිවීමට විවේකයක් ලැබුණේ නැහැ. බොහෝ දෙනාගෙන් ඉල්ලීම් තිබුණා ආයෙමත් ලියන්න කියලා. නමුත් මාධ්‍ය කටයුතු සහ වෘත්තීය කටයුතු එක්ක කාර්ය බහුල වීම නිසා මට ලේඛන කටයුතුවල යෙදෙන්න විවේකයක් තිබුණේ නැහැ. ඒ අතරේ එම්.ඩී. ගුණසේන සමාගමේ ප්‍රචාරක කළමනාකරු ජයම්පති මහතා මට යෝජනා කළා 'කොමිටල් විජිතය' පොතක් කරන්න. නමුත් අවිවේකී බව නිසා ම මට ඒ ලිපි ටික සකස් කරලා දෙන්නවත් අවස්ථාවක් ලැබුණේ නැහැ. ඔහොම ඉන්නකොට කොවිඩ් 19 අවදානම නිසා පහුගිය දවස්වල ලොකු විවේකයක් ලැබුණා. ඒ නිසා මට හිතුණා පොතක් කරනවා නම් අලුත්ම දෙයක් කරන එක වඩා සුදුසුයි කියලා. ඒ උත්සාහයේ ප්‍රතිඵලයක් විදිහට තමයි 'වැඩකට නැති පොත' පොත එළිදකින්නෙ."

'වැඩකට නැති පොත' බැලූ බැල්මට ම අමුතු නමකි. පොතේ පිට කවරයේ ඉහළින් ම සඳහන් වන්නේ "වැඩක් තියනවා කියලා හිතෙනවා නම් විතරක් කියවන්න"කියා ය.

මේ අමුතු පොත ගැන අමුතු කතාව අප කතුවරයාගෙන් විමසුවෙමු.

"මාධ්‍ය ක්ෂේත්‍රයට ආව දා සිට මම ඇසූ දුටු අත්විඳි රසවත් සිදුවීම් සමුදායක එකතුවක් විදිහට මේ පොත හඳුන්වන්න පුළුවන්. සත්‍ය සිදුවීම් සහ සැබෑ චරිත පාදක කරගනිමින් අන්වර්ථිත නම් යොදා ගනිමින් තමයි පොත ලිව්වේ. එවැනි රසවත් කතා 30ක් පොතට ඇතුළත් වනවා. ඒ අතරින් පළවැනි කතාවේ නම වන 'වැඩකට නැති පොත' කියන නම තමයි පොතේ නම විදිහට යෙදුවේ."

මෙවැනි කෘතියක් ජනගත කිරීමේ අපේක්ෂාව ගැන මාධ්‍යවේදී සංඛ අමර්ජිත් මෙසේ පැවසීය.

"බොහෝ අය කියනවා ඉස්සර හිටපු මාධ්‍යවේදීන් ඉතා සුන්දර, අපූරු පුද්ගලයන් කියලා. එවැනි පුද්ගලයන් මියගියත් ඔවුන්ගේ මතක අපි නිතරම සිහි කරනවා. එවැනි සුන්දර රසකාමී පුද්ගලයන් අද මාධ්‍ය ක්ෂේත්‍රයෙත් සිටිනවා. නමුත් බොහෝ වෙලාවට ඒ සිදුවීම් සමාජගත වන්නේ නැහැ. සමාජය සුන්දර කරන, රසවත් කරන එවැනි මාධ්‍යවේදීන් ගැන කියන්නයි මම මේ කෘතිය මගින් අදහස් කළේ"



සංඛ අමර්ජිත්




පසුගිය 23 වැනිදා කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශණ භූමියේ ඇම්. ඩී. ගුණසේන ප්‍රදර්ශන කුටියේදී මාධ්‍යවේදී සංඛ අමර්ජිත්ගේ 'වැඩකට නැති පොත' කෘතිය ජනගත විය. රේඩියෝවලත්, ටෙලිවිෂන්වලත් සිදුවූ උපහාසයෙන් හා වැඩකට ඇති කතාවලින් පිරුණු 'වැඩකට නැති පොත' වැඩකට නැති පොතක් දැයි තීරණය කිරීමේ අයිතිය කතුවරයා නිහතමානීව පාඨක ඔබට බාර කළේය.

## ආනන්ද බෝඩිමේ සැඟවුණු රස කතා 3 වැනි මුද්‍රණය නිකුත් වේ

**ආදි ආනන්දයකු වන ගාල්ලේ දෙව්සිරි පී. හේවාවිදාන විසින් රචිත 'ආනන්ද බෝඩිමේ සැඟවුණු රස කතා' කෘතිය ජනප්‍රිය ව ඇත්තේ ආනන්දියන් අතර පමණක් නොවේ. පාසල් නේවාසිකාගාරයේ ජීවිතය ගැන සුන්දර මතක අවදි කිරීමක් වන එම කෘතිය පාසල් නේවාසිකාගාරයක ජීවත් වූ හැම පාසල් සිසු සිසුවකුගේ ම ඒ මතක අවදි කරන කෘතියකි.**



එහි කතුවරයා වන දැනට ලන්ඩනයේ ජීවත් වන ගාල්ලේ දෙව්සිරි පී. හේවාවිදාන තම සමකාලීනයන් වූ ජනාධිපති ගෝඨාභාය රාජපක්ෂ, බාකීර් මාකර්, රන්ජිත් මද්දුම බණ්ඩාර, සරත් වීරසේකර, සරත් ෆොන්සේකා, වසන්ත කරන්නාගොඩ වැනි මිතුරන් සමඟ ආනන්දයේ ගත කළ අතිශය විනෝදමත් පාසල් හා නේවාසික ජීවිතය ගැන සුන්දරව අකුරු කර ඇත. වර්තමානයේ මෙරට පාලනය කරන ඔවුහු එදා පාසල් සිසුන් ලෙස කළ දඟ වැඩ කියවන විට පාඨකයා ඉල ඇදෙන සිනාවෙන් කුල්මත් වීම නොවැළැක්විය හැකිය. දරුවන්ට පමණක් නොව වැඩිහිටියන්ටද කියවා රස විඳිය හැකි මෙම කෘතිය තුළ මවුපියන් විසින් දැනගත යුතු අගනා කරුණු රාශියක්ද ඇතුළත්ය.


එපමණක් නොව කොළඹ නාලන්ද, රාජකීය, විශාකා, මියුසියස්, මහනුවර ධර්මරාජ, පන්නිපිටිය ධර්මපාල විද්‍යාලය සහ ගාල්ල මහින්ද විද්‍යාලය ආදී පාසල් 11ක වංශ කතාද මෙම කෘතියට ඇතුළත් කර තිබීම විශේෂත්වයකි.

කතෘ ප්‍රකාශනයක් වන 'ආනන්ද බෝඩිමේ සැඟවුණු රස කතා- 3 වැනි මුද්‍රණය' කෘතියේ මිල රුපියල් 750කි. 0776640810 අංකය ඇමතීමෙන් ඔබට මෙම කෘතිය තැපැල් ගාස්තුවකින් තොරව නිවසටම ගෙන්වා ගත හැකිය.

# දෙවැනි ලෝක යුද්ධයේ ශෝකාන්තය ගැන කියන රෝහණ වෙත්තසිංහ

● රසික කොටුදුරගේ

**'ජීවිතය යළි ලදිමි' ප්‍රවීණ පුවත්පත් කලාවේදී රෝහණ වෙත්තසිංහ විසින් රචිත අලුත් ම පරිවර්තන කෘතිය යි. "බෙනයක් ගුහාවක් වැනි තැනකට රිංගා ගෙන මිනිසුන්ට ජීවත් විය හැකිද? එහෙත් දෙවැනි ලෝක යුද සමය යුදෙව්වන්ට මෙන්ම අනෙක් මිනිසුන්ටද දිවි බේරා ගැනීමට එලෙස සතුන් මෙන් සැඟවී සිටීමට සිදු විය. නට්සි හමුදාව විසින් යුදෙව්වන් සොයා ගම්බිම් පීරමින් සිටි එකල ලියෝකාඩියා ස්මිට් ජීවත් වූයේ ගෙටෝ නිවාසවලය. සිය සැමියා සහ පස් මසැති දරුවා සමඟ ඇය ගෙටෝ නිවාසවල සිරවී සිටින අතරතුර නට්සීන්ගේ ග්‍රහණයට හසුවේ.**




තරුණ මව සිය දරුවා සමඟ ඉරණම්කාරි ජීවිතයක් කරා තල්ලු වේ. එයද දවසකට දෙකකට මාසෙකට හමාරකට නොව යුද්ධය පවතින තුරාවට ය. අනෙක් මවුවරුන් ජීවිත ලාලාසාවෙන් තම දරුවන් අත්හැර දමා ස්වයං විමුක්තිය පැතුව ද මේ මව තම දරුවා මත්තේම නැහෙයි. සමාජ ඉතිහාසය ඉතා අඳුරුම යුගයකදී මානව බැඳීම් සුනුවිසුනු වූ මොහොතක, ඊට මඟ වළකමින් නැවත සත්තාව තුළ සිය ජීවිතය සාක්ෂාත් කරගන්නා අයුරු මෙම අනුවේදනීය සත්‍ය කථාව ඇසුරින් ලියෝකඩියා ස්මිට් ලෝකයට හෙළි කරයි. එම කෘතිය පාඨකයාට කෙතරම් සමීප වුවාද කිවහොත් 2019 වසරේදී වැඩියෙන් ම අලෙවි වූ අනුවේදනීය චරිතාපදාන කෘතිය මෙය වේ.

මෙකී අනුවේදනීය කතාව සිංහල පාඨකයා වෙත සමීප කරවන්නට ගත් සාර්ථක උත්සාහයක් ලෙස 'ජීවිතය යළි ලදිමි'කෘතිය හැඳින්විය හැකිය.



රෝහණ වෙත්තසිංහ

මහරගම ඇරැව්වල ගුරුපවුලක උපත ලද රෝහණ වෙත්තසිංහ කොළඹ නාලන්දා විද්‍යාලයට ඇතුළත්ව 1968 දී කලා විෂයන් හදාරමින් උසස් පෙළ විභාගයට මුහුණ දුන්නේය. සරසවි වරම් ලබා උසස් අධ්‍යාපනයට යොමු වීමට කිසිදු බලාපොරොත්තුවක් වෙත්තසිංහට නොතිබුණි. ඒ වෙනුවට ඔහුගේ සිතේ රජ කළේ සිනමාකරුවකු වීමේ ආශාවයි. 1969 දී සුගතපාල සෙනරත් යාපා හැදූ 'මිනිසා සහ කපුටා'නවදිල්ලි සිනමා රජත මයුර සම්මානය හිමිකර ගැනීමත් සමඟ 70 දශකයේ ඇති වූ සිනමා රැල්ලට සමගාමීව චිත්‍රපටි විචාරක හා ලේඛක සංගමය විසින් චිත්‍රපට සම්මාන උලෙළක් සංවිධානය කළේය. සිනමාව කෙරෙහි ආසාවෙන් සිටි හෙතෙම'විප්පයෝගෝ'නමින් කෙටි චිත්‍රපටයක් නිර්මාණය කළේය. ඊට ටයිටස් තොටවත්ත (ගිලිහුණු මල්, පිච්චර් පිස්ස, අහල පහල), ධර්මසේන පතිරාජ (සතුරෝ), අයි.එන්. හේවාවසම් (කලල රූ, මිනිසෙක් සහ පිරිසක්), සුනිල් ආරියරත්න (සරාගී, දුෂ්කරක්‍රියා), අමරනාත් ජයතිලක (තවත් උදෑසනක්), රංජිත් ලාල් (කම්හලක ගීතය), පරාක්‍රම සිල්වා (භග්න ආශා, එළිය), පී.යූ.ඩී. පෙරේරා (මනස් පුතෙක්, සින්ඩරෙල්ලාගේ සෙරෙප්පුව) ආදී කෙටි සිනමා නිර්මාණ ඉදිරිපත් කර තිබුණි.

පසුව චිත්‍රපටි හැදිල්ල වෙනුවට පෑන අතට ගත් හෙතෙම වෘත්තීය පුවත්පත් කලාවේදියකු ලෙස 1978 ලංකාදීප පුවත්පතට බැඳුණි. උප කතුවරයකු දක්වා සිය වෘත්තීය ජීවිතය ජයගත් ඔහු අනතුරුව දිවයින හා සිළුමිණ පුවත්පත් උප කර්තෘ හා ජ්‍යෙෂ්ඨ සම කර්තෘ ධූර දැරීය. ජ්‍යෙෂ්ඨ පුවත්පත් කලාවේදී නිමල් හොරණ මහතා (1994-1999) සිළුමිණ කතුවරයාව සිටි සමයේ 'රසඳුන' කතුවරයා වූයේ රෝහණ වෙත්තසිංහයන්ය. දශක හතරකට අධික කාලයක් ප්‍රවීණ පුවත්පත් කලාවේදීයකු ලෙස සිය කුසලතාවයන් මොනවට පෑ රෝහණ වෙත්තසිංහයන් පසුව රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ මාධ්‍ය ඒකකයේ ප්‍රධානියා වශයෙන් වසර 6 ක කාලයක් සේවය කළේය. මුල් කාලයේ සිට සිනමා ලේඛකයකු වශයෙන් නමක් දිනා සිටි හෙතෙම 'අප්පච්චිගේ සිනමාව'නමින් විචාර පොත් පිංචක් ලියා පළ කළේය. 'සතර දිගන්තේ' චිත්‍රපටිය වෙනුවෙන් ඔහු ලියූ තිර නාටකය පසුව පොතක් වශයෙන් නිකුත් විය. මේවන විට සරසවි ප්‍රකාශන ආයතනයේ ජ්‍යෙෂ්ඨ උපදේශකයකුවන රෝහණ වෙත්තසිංහයන් 2018 වසරේ පරිවර්තන සාහිත්‍ය ක්ෂේත්‍රයට යොමු විය. ඔහුගේ පළමු පරිවර්තන සාහිත්‍ය කෘතිය වන්නේ 'ඒරන්ගේ ලෝකය (The Book of Aron - Jim Shepard)' නම් යුදෙව් සාහිත්යිය කෘතිය යි. දෙවන පරිවර්තන කෘතිය 2019 වසරේ දී නාදියා මුරාත් ගේ The Last Girl 'ගිනිගත් සඳ'නමින් පළ කළේය. මෙම කෘතිය පාඨක සමාජයෙහි නොමඳ ගෞරවයට පාත්‍ර වූ අතර එය මේවන විට තෙවන මුද්‍රණය අවසන් ව සිවුවන මුද්‍රණයට පැමිණ තිබේ. යුදෙව් සාහිත්‍යය කෙරෙහි හෙතෙම ආසක්ත කළේ ද මෙම කෘතියයි. එහි ප්‍රතිඵලය වූයේ පෝලන්ත ජාතික ලියෝකාඩියා ස්මිට් ගේ 'ජීවිතය යළි ලදිමි'(Rescued From The Ashes - Leokadia Schmidt)) නම් අනුවේදනීය චරිතාපදානය අප අතට පත් වීමය.

## ඇන්ටන් ජේ. ප්‍රනාන්දු ගේ චිත්‍රපට වාර්ෂිකය එළිදකී

**ප්‍රවීණ මාධ්‍යවේදී, ගේය පද රචක සහ ලේඛකයකු වන ඇන්ටන් ජේ.ප්‍රනාන්දු විසින් සංස්කරණය කරන ලද 2018 චිත්‍රපට වාර්ෂිකය පසුගියදා නිකුත් විය.**




මෙම ග්‍රන්ථයට 2018 වසරේ තිරගත වූ සියලුම චිත්‍රපටවල සියලු තොරතුරු සහ එම චිත්‍රපට සඳහා ඇතුළත් වූ සියලුම ගීතවල නිවැරදි පදමාලා සහ තවත් තොරතුරු ඇතුළත් කර ඇත.

ජාතික චිත්‍රපට සංස්ථාවේ ප්‍රකාශනයක් වන මෙම කෘතිය සරසවි පොත්හල් ජාලය මගින් මිලදී ගත හැකිය. ඊට අමතරව කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ සංස්කෘතික දෙපාර්තමේන්තුවේ පොත් අලෙවි කුටියෙන් සහ නයින් පබ්ලිෂින් පොත් අලෙවි කුටියෙන්ද මිලදී ගත හැකිය.


ඇන්ටන් ජේ.ප්‍රනාන්දු

# කාංචනා අමිලානි ගේ 'ගුහා සටන' මායා යථාර්ථවාදයේ ශ්‍රී ලාංකේය පිවිසුමක්

● ටිරෝනි වෑවලගේ

**මායා යථාර්ථවාදය නැතහොත් 'මැජික් රියලිසම්' ආසියාවට එන්නේ ලතින් ඇමරිකානු සාහිත්‍යය ලෝකය ආක්‍රමණය කිරීමත් සමඟ බව මෑතකාලීන මතයයි. එහෙත් මායා යථාර්ථවාදය අපට හමුවන මුල් ම අවස්ථාව අප සතු මහා සාහිත්‍යමය නිධානයක් වන ජාතක පොත බව බොහෝ දෙනා අමතක කරති. එහෙත් ජාතක කතා වයස් බේදයකින් තොරව රස විඳිති. පුදුම වෙති. එහි සැඟව ඇති සාහිත්‍යමය රසය, ව්‍යංගාර්ථ, රසෝද්දීපන උපක්‍රම යළි යළිත් විඳිති. එහෙත් මායා යථාර්ථවාදය මෑතකාලීනව ස්වකීය නිර්මාණවලට දායක කර ගැනීමට සමත් වූ හෝ කටයුතු කළ නවකතාකරුවන් අපට හමුවන්නේ නැති තරම්ය. අප ගීත සාහිත්‍යය මෙන්ම නවකතා සාහිත්‍යයද යථාර්ථවාදයම පදනම් කර ගනිමින් ගොඩනැගෙමින්, ඒ මතම යැපෙමින් තිබේ. එහිලා පැවසිය යුතු තරමේ දෝෂයක්ද නැත. යථාර්ථවාදී නිර්මාණ මනැස පෑදීමට සමත්ය. එහෙත් මායා යථාර්තවාදය භාවිත කරමින් අති දක්ෂ නිර්මාණකරුවකුට යථාර්ථවාදයද ඉන් එපිටද ජය ගත හැකිය. මායා යථාර්ථවාදයේ විශේෂත්වය වන්නේ එහි ඇති අසීමිත බවයි.**

කාංචනා අමිලානිගේ කුලුඳුල් නවකතාව වන 'ගුහා සටන' කියවන පාඨකයකු එහි අභ්‍යන්තරයේ ලේඛකයා ඉතා සියුම්ව වියා ඇති දැලෙහි පැටලෙන්නේ නොදැනුවත්වමය. ගුහා සටන සිදුවන්නේ දිමියන් දෙපිරිසක් අතර බව ලේඛිකාව තම වියමන ආරම්භයේදීම පවසන්නීය. එහෙත් මේ දිමියන් මවන්නේ මිනිස් චරිත ය. ක්‍රියාකාරකම් මිනිස් ය. ඇඟවුම් මිනිස් ය. ප්‍රතිචාර මිනිස් ය. එහෙත් චරිත දිමියන් ය. ඊට අමතරව කාංචනා මේ ගුහා සටන වටා මුළු ලෝකය ම පටලවන්නීය. ඇය පවසන අන්දමට මේ සටන සිදුවන්නේ ඉන්දියාවේ චීන දේශසීමා මායිමේ පිහිටා ඇති 'ලඩක්' ප්‍රදේශයේ ය. එහෙත් මලර් මනු සං අසලට ඇද වැටුණු අවස්ථාවේ 'උඹ කොයි පැත්තෙද?' ඇයි ඇසූ විට මලර් පිළිතුරු දෙන්නේ 'සබරගමු පැත්තේ' යනුවෙනි. ඒ අනුව ලේඛිකාව තම වියමන ඉන්දියාවේ ලඩක්හි සිට අපේ සබරගමුව දක්වා ගොතන්නීය. ඉතින් මේ මායා යථාර්ථවාදයේ උපරිමය නොවේද?





කාංචනා අමිලානි

මලර් සටන් බිමට ඇද වැටෙන්නේ ජපං පුටුවද සමඟිනි. මීනාක්ෂි එහි ඇද වැටෙන්නේ තමා හිස පීරමින් සිටි පනාවද සමඟිනි. අතුරුදන් වූවන් වෙනුවෙන් සටන් වදින ආච්චී බොහෝ පැතිකඩ ඔස්සේ පාඨකයා ගෙන යන්නීය. සටන් බිමේ සිටින සෙබළුන්, ජෙනරාල්වරුන්බොහෝ යථාර්ථවාදී චරිත අප වෙත ගෙන එන්නේ මායා දවටනයේ එතු අමතර රසයක්ද සමඟිනි. පොත අතට ගත්විට බිම තබන්නට නොසිතෙන්නේ ඒ නිසාය.

ලේඛිකාවගේ අනෙක් සුවිශේෂය වන්නේ ඇය භාවිත කර ඇති චරිතවලට ඇය විසින් ලබා දී ඇති නම්ය. ඒ නම් අතර සිංහල, දෙමළ, හින්දු, මැලේ, කන්නඩ මෙන්ම චීන සම්භවයන් හඳුනා ගත හැකිය. ඒ කිසිවකදී අප ලේඛකයා ප්‍රශ්න නොකරන්නේ මායා යථාර්ථවාදය සමඟ ආරම්භයේ සිටම පාඨකයා පැටලෙන බැවිනි. කාංචනා චරිත මවන අන්දම අපූරුය. ඒ චරිත බෙහෙවින් සජීවීය. ඒවායේ කතාබහ අපට සමීපය. ඒ චරිතවල හැසිරීම් සහ අපගේ ඇති ඇතැම් සමානකම් අප මුවට සිනා නැංවීමට සමත්ය. ඒ අනුව ඇතැම්විට කාංචනාගේ පොත කියවන අපි අපිට ම සිනාසෙන්නෙමු. එය මේ සියල්ල ලියා ඇත්තේ කිසිදු ආයාසයකින් තොරව බව පොත කියවන පාඨකයාට වැටහෙන්නේ එය කියවීමටද ආයාසයක් නොදැරිය යුතු නිසාය. අමතරව පොතේ තැනින්තැන නිරූපණය කර ඇති 'දිමි' චරිතවල චිත්‍ර යථාර්ථය මත සිටි පාඨකයා යළිත් මායාව වෙත ගෙන යන්නේය. එහෙත් යළි කතාවට ප්‍රවිෂ්ට වන පාඨකයා කතාව තුළින් යළි මායාවෙන් යථාර්ථය වෙත යන්නේය. ලේඛිකාව මේ සියල්ල පාඨකයා මතම තබන්නේ ඇය ඒ කිසිවකට මැදිහත් නොවෙමිනි. රසවින්දනය තම තම නැණ පමණින්ය. කෙනෙක්ට මෙය විකාරයක් විය හැකිය. තවත් අයකුට සමාජ අභ්‍යන්තරයේ සැඟවුණු බේදවාචකයන් ප්‍රකාශ කරන ව්‍යංගාර්ථ සමුච්චයක් විය හැකිය. තවත් අයෙකුට දිමියන් මිනිස් චරිතවලට ආරූඪ කළ සරල රසවින්දනයක් ලබා දෙන පොතක් විය හැකිය. ඒ ඕනෑම තර්කයකට ඉඩ දෙමින් ලේඛිකාව මායා යථාර්ථවාදයෙන් හොඳ හැටි ප්‍රයෝජන ගන්නීය.

සැබවින්ම සිංහල නවකතා සාහිත්‍යයේ 'ගුහා සටන' වැනි පොත් දුර්ලභය. එකම රාමුවක් වටා කැරකැවෙන නිර්මාණ අතර මෙවැනි නිර්මාණ පාඨකයා පහසුවෙන් ඇද බැඳගැනීමට සමත්ය. මායා යථාර්තවාදය මත ලියැවුණු ජාතක කතා පන්සිය පනහකි. ඒ මතම පදනම් වූ අරාබි නිසොල්ලාසය හෙවත් එක් දහස් එක රැය ගැන අමුතුවෙන් කිව යුතු නැත. එබැවින් තම නවකතා කලාවේ පළමු පියවර මායා යථාර්ථවාදය මත තැබූ කාංචානා තවත් ශෙහෙර්සාද් කෙනෙකු නොවන්නේද?

## කවියෙන් ළමා කතන්දර ලියන සකුන්තලා ගෙන් පොත් 4ක්

**හොඳම දේ ළමයින්ට බව ප්‍රකට කියමනකි. ඒ අතර ළමා මනසට ගෝචර පොත්පත් වැඩි වශයෙන් බිහි වීම දැයේ දූ දරුවන්ගේ වාසනාවකි. අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාලයේ පුස්තකාලාධිපතිය ලෙස සේවය කරන නිරෝෂණී සකුන්තලා පෙරේරා එළැඹෙන ළමා දිනය වෙනුවෙන් ළමා කෘති 5ක් ප්‍රකාශයට පත් කිරීමේ සූදානමින් සිටී. නිරෝෂණී පවසන්නේ එය ඇයගේ නිර්මාණ දිවියේ හැරවුම් ලක්ෂයක් බව ය. රූපවාහිනී නාළිකාවක් සඳහා සතිපතා ළමා කතාවක් නිර්මාණය කරන ඇය ඒ සෑම කතාවක් තුළින් ම දරුවන්ගේ මනස පෝෂණය කරන ආදර්ශයක් දීමට බලාපොරොත්තු වන්නීය.**













ඇය ළමා කෘති ප්‍රකාශයට පත්කිරීමේ අරමුණද එයයි. ඒ අනුව ආඩම්බර මොනරහාමි, රැවටුණු කපුටුහාමි, බූරුවාට පාඩමක්, ඉබිහාමිගේ නුවණ යන කෘති සතර ඔක්තෝබර් මස 11 වැනිදා සවස 4ට අනුරාධපුර පොදු ක්‍රීඩාංගණයේදී ජනගත කිරීමට නියමිත ය. මෙම කෘති ප්‍රකාශයට පත් වන්නේ කතුවරිය විසින් නිර්මාණය කරන ලද 'කවියෙන් කතන්දර' ළමා කතා මාලාවේ මුල්ම කතා හතර ලෙසට ය.

කෑගල්ල ශාන්ත ජෝශප් විද්‍යාලයේ ආදි සිසුවියක වන නිරෝෂණී සකුන්තලා පෙරේරා කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාල විද්‍යා විශේෂවේදී උපාධිධාරිනියකි. ළමා ලේඛිකාවක ලෙස නිර්මාණ ජීවිතය ආරම්භ කරන ඇය සතිපූජා නමින් කවි පොතක්ද එළි දක්වා ඇත.ඊට අමතරව ඇය ගී පද රචිකාවක් සහ ගායිකාවකි. 'සකුගේ ආත්මීය වන්දනාව' නම් youtube නාළිකාවද පවත්වාගෙන යන නිරෝෂනී සකුන්තලා එහිද ඇය විසින් රචිත කවි,නිසදැස් හා ළමා කතා එළි දක්වන්නීය.


නිරෝෂනී සකුන්තලා

# සතියේ කවි පොත

**කෘතිය - සරද නුඹ තරු වැල**
**කර්තෘ - සුපුන් අතුකෝරල**
**ප්‍රකාශක සන්ථව ප්‍රකාශනයකි.**
**මිල -රු. 250.00 පිටු-55**



සරද නුඹ තරුවැල සුපුන් අතුකෝරලගේ දෙවන කාව්‍ය සංග්‍රහයයි. ඔහුගේ පළමු කාව්‍ය සංග්‍රහය වන ප්‍රේමයට ඉඩක් ඇත නිකුත් වන්නේ 2016 වසරේදීය. වෘත්තියෙන් බැංකු නිලධාරියකු වන සුපුන් කලක් තිස්සේම කවියේ නව මානයන් සොයන්නට වෙහෙස වන්නෙකි.

ප්‍රේමයට සීමා මායිම් නැත. උස් පහත් බේද, විවාහක අවිවාහක බව අදාළම නැත. හීලෑ නැති හිත් හිතෙන හිතෙන තැන් වල නතර වේ. ඒ නතර වුණ විට ඇති වන ඇතැම් ආදරණීය බැඳීම් බලට නමක් නැත. එවැනි බැඳීම් වලදී ඇය හෝ ඔහු සමාජය ඉදිරියේ හඳුන්වා දෙන්නට නමක් ද නැත. විවාහ සැමියා බිරිඳ සමඟ සමාජයේ පෙනී සිටිද්දී ඇතැමුන් සිටින්නේ තම හද ගත් ඇය සමඟය; ඔහු සමඟය. එවැනි බැඳීම් ඇති ඇය ඔහුගේ කවුදැයි තමන් හඳුන්වා දීමට බැරි ළතැවිල්ලකින් පෙළේ. කවියා මේ ලියන්නේ එවැන්නියක් තුළ ඇති ළතැවිල්ලයි. හිතේ ඇති අපරිමිත බැඳීමට ඒ ආදරයට කුමන නමකින් නම් හඳුන් වන්නද? විවාහකයකු සමඟ ඇතිකරගත් ප්‍රේමය විඳින්නියක් නොව විඳවන්නියකගේ ආත්ම කතනයකි මේ. මාතෘකාව "මම නොවේ ඇය".

**" විවා මඟුල්වල**
**ප්‍රිය සාදවල**
**මුහුණු පොතේ**
**පින්තූරවල**
**ඔබ එක්ක**
**සිටින්නෙ කවුරුද**
**මම නොවේ ඇය....**

**හඬන තරමට**
**පපුවේ මගේ වම් පැත්ත**
**සිනාසෙනවා ඇගේ**
**වම් අතේ වෙඩිංගිල්ල....**

**ඇත්තටම**
**මම ඔබේ කවුරුද**
**අසන විට හදවත**
**කියාගන්නවා මම මටම...**

**අහසේතිබෙනා**
**හඳුන නොගත්**
**අපමණ තරු වැල්....**
**ලෝකෙත් තිබෙනවා**
**සිතියම්වල නැති**
**දූපත්......"**



සුපුන් අතුකෝරල

නමක් නැති ඒ පෙම හරියටම කිව්වොත් නමක් නැති දූපත් , හඳුනා නොගත් තවමක් නමක් නැති අහසේ තරු වැනිය. කවියා ඒ බැඳීම ගැන කියන්නට යොදා ගන්නේ අපූරු වචන පෙළකි..

එන යන වෙලාවක් නතර වුණ තැනක් ගැන කියන්නට දන්නේ නැත. නමුත් එසේ පැමිණි ආදරය හැර යන්නේ බොහෝ කතා අවසානයේය. ඒ යන්නේද බොහෝ තර්ක විතර්ක කිරීම් වලින් පසුවය. ඕනෑවිට බඳා වැළඳගත් ආදරය එපා වූ විට යන්න ගිය අයුරු කවියා පවසන්නේ මෙලෙසනි. මාතෘකාව ආදරය.

**"අවසර නොලබා**
**ඇතුළු වී**
**අවසර ලබා**
**පිටත්ව යන්නට හදයි"**

දේශපානය ගැන ඇතැමෙකුට ඇත්තේ කනගාටුවකි. තවත් කෙනෙකුට ඇත්තේ කලකිරීමකි. කිසිවෙකු ගැන ගෞරවයක් නැති මානයෙන් හිස උදුම්මා ගත් පුහු මිනිසෙකුගේ ක්‍රියාවක් කවියා පද හතරකින් ලියයි. ඔහු කිසිවෙකුට බණින්නේ නැත. කවිය අවසානයේ අපට මේ සමාජ ක්‍රමය ගැන ඇති වන්නේ දුකකි. ගුරුවරිය ගැන නොව මේ සමාජ ක්‍රමය ගැනම ඇති වන්නේ කනගාටුවකි. මාතෘකාව "අකුරුවලටත් ඉකිගැසිනි".

**"නිල දන බලය ඉතිරිණි**
**රුදු රළු වදන් පිට විණි**
**පවර ගුරු සිත රිදිණි**
**අකුරුවලටත් ඉකි ගැසිණි"**

කලක් තිස්සේ ගම තනිව තිබේ. ගමට ඒ තනිකම උරුම වුයේ ගමේ සිටි ඇත්තෝ ක්‍රමයෙන් නගරයට සංක්‍රමනය වීම නිසාය. ඇතැමෙක් නගරයට ආවේ රැකියා සඳහාය. ඇතැමෙක් ආවේ උසස් අධ්‍යාපනය සඳහාය. තවකෙක් ආවේ දරුවන්ට උසස් පාසල් සොයාය. තවකෙක් ව්‍යාපාර ඇරඹීම ආදි වූ දහසකුත් එකක් කාරණා මුල්කරගෙන නගරයට ආහ. ඒ ආ කිසිවෙක් නගරයේ කොයි යම් හෝ ඉසව්වක රැඳුණා මිසක් යළි ගමේ පදිංචියට ගියේ නැත. යළි ගමට ගියා නම් ගියේ මරණයකට මඟුලකට ආදි දෙයකට පමණි. එවැන්නකටත් උපන් ගමට නොගිය කෙනෙකු අනිවාර්යයෙන්ම සිංහල අවුරුද්දට ගමට ගියේය. නගරය ගමට ගිය විට ඒ දවස් දෙක තුනට නගරය පාළුවිය. දැන් ගම ද නගරය ද කියා වෙනසක් නැත. සිංහල අවුරුද්දට පාළුවන ගමත් රූප පෙට්ටිය සමඟ සමරණ අවුරුද්දත් ගැන සුපුන් ලියන්නේ මෙලෙසිනි. මාතෘකාව "ලාබයි අවුරුද්ද"

මේ හැරුණ විට ඔහු මාතෘකා ගණනාවක් යටතේ ලියූ නිර්මාණ ගණනාවකින් මිනිස් සිත අභ්‍යන්තරයටම කතා කරයි. ඇතැම් කවියක් අවසානයේ හිතට දැනෙන්නේ සංවේදී බවකි. ඇතැම් කවි අපට මේ සමාජය දෙස වෙනස් මුහුණු වරකින් බලන්නට පොලඹවයි.

සුපුන් අතුකෝරල යොවුන් කවියාට මේ මගෙහි තව බොහෝ දුර යා හැකිය.

## දෙල්තොට කවිඳුනි

**(ජ්‍යෙෂ්ඨ පුවත්පත් කලාවේදියකු කවියකු හා ගීත රචකයකු වූ දෙල්තොට චන්ද්‍රපාල සූරීන්ගේ 15 වැනි ගුණානුස්මරණය නිමිත්තෙනි.)**


පන්හිඳ ලෙළවමින් නවනළු රසය මවා
ගී පද මුවට ළං කළ සිත් සතන් නිමා
රසකාමී පිරිස සාහිත ගඟුලෙ හොවා
ඔබ කළ මෙහෙය ඇත හදවත් සුවඳ කවා

දෙස්පාලන සබඳතා තුබුණත් ඉහළ
නොම පිම්බී එයින් දිවි ගත කළ සරල
පිරිපුන් කලාකරු ගුණ නැණයෙන් පබල
සැදුවේ වියත් පිරිසක් රට තොට පතළ

දිරි ගන්වමිනි උපදෙස් දී වැරැදි සදා
අංකුර කවින් හට සෙත් දුන් පැතුම් විදා
දැන ගෙන ඔවුන් යන මඟ දිරි දිය දදය බැඳ
ඔබ සැනසුණේ දෙනෙතෙහි තුටු කඳුළ ඇඳ

කිවිඳුනි ඔබ ඇතත් දෙනෙතින් ඉවත ගොසින්
ලිවු පොත් පත් රැසක් දකිනා විටදි ඇසින්
කළ මහ මෙහෙය ඇති සඳ අහසට ද උසින්
ඔබ මෙලොවෙහි නැතැයි පවසනු කවුරු විසින්

**ලීලා විජේසූරිය**




## රෙදි නැන්දා

සතියට වරක් රෙදි ටික ගෙන හිස මතට
ලැසි ගමනින්ම ඇය යනවා ගෙයින් ගෙට
හමුවන අයට පෙන්වා තම සිනහ කට
සිහියට නැගෙනු ඇත රෙදි නැන්දා සැමට

කුල ගොත් මාන්නය රැක ගැනුමට නොහැකි
ඇය හට සිටින ගමකට නැන්දා යෙහෙකි
කොයි කා හටත් එකලෙස සලකන කෙනෙකි
රෙදි නැන්දාව මුළු ගමටම සම්පතකි

දුහුවිලි වැදී කිලිටිව ගිය රෙදි කැලි
එකිනෙක ගණන් කර ගනිමින් නොවී මැලි
එක පොදියකට බැද දොඩමින් පල් හැලි
සතියකට වරක් ගෙන එය හොඳ රෙදි කැලි

අවුරුදු දහස් ගණනක සිට පැවත එන
හෙළ කුල සිරිත් රැක ගතහොත් කවර පැන
කොතරම් හැලි පැවසුව මුත් දුබල දැන
පති දම් සුරකිමින් දිවි ගත කළේ දැන

සැම පෝ දිනක පන්සල වෙත පිය නගන
තෙල් මල් රැගෙන සැමදා තෙරුවන් වඳින
සැම සත වෙතට සෙනෙහස මුව පා දොවන
නැන්දා සදා සැනසුම කිනි දිවි ගෙවන

නැන්දා සදා අප හැරදා ගිය දිනයේ
හත් අට දෙනෙකු පමණක් එහි වැඩ සිටියේ
ගේ දොර පිහිටි ඇ නිවසක බඩ වැටියේ
දරු මුනුපුරන් කිසිවෙකු නැත එහි සිටියේ

කුණු රෙදි අපුල්ලන්නට දැන් කෙනෙකු නැතේ
නම්බුව රැක ගන්න දැන්ගම කිසිත් නැතේ
නැන්දා තුටින් දෙව්ලොව වෙත යන්න ඇතේ
ඇයගේ ගුණය තවමත් හඬ වනනු ඇතේ

**බී. ආර්. දයානන්ද**

## ගමේ පෙරහර

නෙක දනන් තුටුවෙලා
මඟ දෙපස රැස්වෙලා
රජ කුලේ ඇත්රජා
පෙරහැරේ වඩිනවා

පාවාඩ නැති පතුල්
ගිනියම්ව දැවෙනවා
විදුලි එළි සියගණන්
යදම්වල රැඳෙනවා

දෙපා ඔසවනු බැරිව
ඇත් රජා තැවෙනවා
සැදැහැවත් දනන්ගෙන්
සාදු හඬ නැඟෙනවා

මල්සුවඳ දැනෙනවා
බෙර හඬද ඇහෙනවා
කඳුළු බිඳුවක් අරන්
ඇත් රජා වඩිනවා

**පියසීලි විජේනායක**

## හමුවෙමු හිමියෙනි දිනක

හිරු සඳු දෙපස එකවර දිලෙනා ලොවක
නුඹ මට රජෙකි මගෙ හද මැඳුරේ නිදන
නාඩා ඉන්න කීවේ කෙළෙසද කොහොම
කඳුලේ උල්පත නුඹ හද පතුලේ නොවෙද...

තුරු වන වදුලු පිරිවර ලෙස මට තබලා
වන මල් පඳුරු මුළු මිදුලම සරසාලා
සිත ළඟ නොතනියට විශ්වාසය තියලා
ගිනි මද්දහනේ නුඹ ගියෙ ඇයි මා හැරදා...

කහවනු සෙවුම අතහැරියේ නුඹ රැකුමටය
බත්පත බෙදා නොනිදා හිටියේ එනතුරුම
සිරසට නුඹේ බරදුන් සිත හැදුවේ මමය
පවු නැහැ මැණික මම දිවි පිදුවේ නුඹට

**ප්‍රියානි පී. පෙරේරා**

**ඔබේ කවි නිර්මාණ පහත ලිපිනයට එවන්න**
**සිළුමිණ, කවි පිටුව,**
**ලේක්හවුස්, කොළඹ 10.**
**edmediaunit@gmail.com**

## බුද්ධියට හදවතක්

සැමියා - මං තමුසෙ බඳින කොට, හදවතට යට වුණා
වැඩි කියල දැන් තමයි දැනෙන්නේ
රුචි-අරුචි, නැණ-නුවණ පරතරය ගව් ගණන්
බුද්ධියට දැනුයි එය පෙනෙන්නේ...

දෙන්නාම කැමති වෙන, එක දෙයක් මෙලොව නෑ
මං කැමති දෙයක් දැන් මතක නෑ
ඇස් දෙකට පෙනෙන දේ බදාගත්තම තමුසෙ
ලෝ ගැඹුර දකින මට ඇඬෙනවා......

මේ නිසරු ජීවිතේ තවත් මට විඳිනු බෑ
'ඩිවෝස්' එක හෙට 'ෆයිල්' කරනවා....

බිරිඳ - සම රුචිය, සම නුවණ ඇති ගැහැනි හමු වුණොත්
නවතින්න , මං ඊට අහිත නෑ
ඒ නමුත්, හැරෙන්නට වුණොත් යළි මෙඅතටම
බුද්ධියට හදවතක් බද්ධ කරගෙන මිසක
ඔන්න මං කිව්ව, මෙහි එනු එපා....

**දේ. වි. ගාල්ලගේ**

## රතැසි පරදා

රතැසියකු ඇවිත් රුදුරුම
රෝෂයෙන් සරයි දස දෙස
රජුන් - කෙලෙඹියන් පොදු ජන
රිසින් ගොදුරු කර ගන්නට

නිවෙස් තුළ ගුලිව හිඳිමින
කුමක් හෝ උයා පිහගෙන
අතීතයේ සුවඳ ඉව කර
හිඳින්නද කොතෙක් කල් අප?

පරාජය නොවන කිසි දින
මිනිස් ගුණ දකින හැම වර
තුටු කඳුළු නයන පොඟවන
සැටි බලන් අඳුර අතරින!

**තිස්ස නිහාල් වික්‍රමසිංහ**

## නුඹ නොලැබේද

පබවතියටත්
වැඩියෙන් නුඹ
රූ මනාව..

මගෙ හිත
ගැඹුරු තැන
සිත්තම් වුණි...

මුළු ලෝකෙට
හොරාම..

වින්දත් හැඩ
හීන පැතුමන්
මවාන
කුස මෙන්
විරූපී මෙමාට
හිමි නොවෙනා බව
දැනෙයි පබාව

**සරා සිල්වා**

## නුඹ මට

දේදුන්නක්දෝ නුඹ මට
අසුරු සැණින් පායා ආ
අස්වසන්න මගෙ දුක්බර
සිතුවිලි ආකාස තලය
සප්ත වණින් පායා විත්.....

අඳුරු ලොවක් දිදුලවද්දී
දැනසිටියෙමි මම කවදත්
නුඹ අහසෙහි සිතුවම බැව්
පායාවිත් මැකීයද්දී....

පාට හතම බොඳව යාවී
නෙතු අස්සෙන් සට සට ගා
කඳුළු වැස්ස ඇද හැළේවී

**නයනා පීරිස්**

## පශ්චාත්තාපය

රෑ රාත්තිරියෙ වීදි ගානේ ගියෙමි.
රාජ පුරුෂයන්ට හසුව
උන්ට දොස් කීවෙමි.
වරද රෑ වීම යයි සිතුවෙමි.
රා අරක්කු බී මත් වුණෙමි
වරද අරක්කුවල අඩංගු දේ යැයි
සිතුවෙමි.
සමරහුගෙ වරදින් පෙමින් බැඳුණෙමි.
වෙබ් අඩවි ගානේ ගෙන්ගෙට ගියෙමි.
මුහුණු පොත මැද
ටැබ් එකක හුදකලාවීමි.....

නොවපුල බැවින් වපසරිය වල් වැදුණි.
කලට වැසි වැටුණු වග නොදත්තෙමි.
මා එනතෙක් පෝය නොරැඳී බැවින්
පන්සලට යන විට
සිල් පෝය ඉකුත් ව ගොසිනි...

හෙම්බත්ව
හැරී බලමි.
මගේ හිතට
මගේ අත
අවසඟව කල් ගතව ගොස් තිබුණි.
හැරී බලමි
මම තවම
ගිරි මුඳුන පාමුල....

**අමරසිරි වික්‍රමරත්න**

## ශිශිර ඉසුඹුව

නග්න තුරු හිස්
ශිශිරයේ
තුටින් ඉපිලෙත්...

නේක දලු මල් එල
දරා උරහිස
පැලඳ දහසක් තුරු පතින්
සුසැදි ගන කබාය
වගුරවමින් දහදිය
වසත්කල පුරාවට
විඳින නෙක පිරිපත
නිමාවන
නවාතැන.....

විටප යට ගිම් නිවන
මගියනගෙ සුසුම් සර
සිරුර මත වසුරු ලන
විහඟ යවුල් නද
සවන් පත් නොපාරන
ඉසුඹුහල
ශිශිරය.......

**ලහිරු දෙද්දුවකුමාර**

## කොරෝනා

නියත අනියත ලොවක් අබියස
සිතිජ සිහිනය බොඳවෙලා අද
කඳුළු සයුරේ ගිලී ජන කැල
ජීවිතය යදිනා'යුරු බල!
සහස් සුවහස් දනන් මෙතරම්
අසරණ වූ කලක් වේද
මිනී කඳු ගොඩ ගසනා සඳ
මිහිකත කම්පා වී
නුඹ ලබන සුව කිම
කියන් මට කොරෝනා...

**ශ්‍රීමත් ඉන්ද්‍රජිත් ලියනගේ**

## මුහුණු පොතෙන් කවියක්

### ගණන් අසමත් කමලා

හාල් ඇට ටික හරියටම ගැනලා
මටයි මගෙ පැටවුන්ට සම සමව බෙදලා
ඇයව විතරක් මට හොරෙන් අඩු කරලා
ආදරේ චක්කරය කටපාඩමින් කියනා

ඒ තමයි මගෙ බිරිඳ ගණන් අසමත් කමලා
වස්තරේ ඉරුනු තැන් අතේ නූලෙන් මහලා
නොම්මරේ ලැබෙනකන් සමූපේ පෝලිමේ ඉඳලා
විස්තරේ අහද්දී මොනරු පිට නැගලා

මන්දිරේ හාමුගෙත් කනට අත තියලා
චන්දරේ කියාගෙන ගෙදර ආ කමලා
ගියපු දවසට ටිකක් සුදුව බොන්නට හිතිලා
කියපු දේවල් ගම්මු පතිනි සළු ලිහලා

වැඳපු දෙවියන් පල්ල ඇයට අත තියලා
පළිය ගන්නට දෙයක් මෙමට නෑ තිබිලා
සිකරට් එකක් බොන්න විතරයි ගින්දර දුන්නෙ කමලා
කැන්දගෙන ආ දිනට වඩා තව හැඩ වෙලා

මං ඉඹිනකොට වගේ නෙත් දෙකත් පියවෙලා
දැන් අඬනකොට පැටව් හෙට උඹව සිහිවෙලා
උන්ට මට කන්න ඇති නියගලා ගලවලා
ඔන්න ඔහෙ නිදියපන් දැන් හුගක් රෑ වෙලා

**ඉලක්ෂ ජයවර්ධන**

# දීපානි

## ශල්‍යාගාරය අසල සිට

නොපෙනේය ඔබේ වත
වැසී දොරගුළු සැමම
කිසිත් නොදැනේ ඔබට
අද නුහුරු නින්දකය
දිගු වෙලා පැයත් මට
දැනේ කල්පයක් ලෙස....

නින්ද නැත අහලවත්
ළං වුවද මැදියමට
වියරු දළ රළ කිමද
වදින්නේ මා හදට
ඒත් මට බියක් නෑ
වෙදැදුරන් ඔබ අවට
මදුරුවෙක් පවාවත්
ඔබ අතින් නොනැසුනේ...

බුදු මඟම යන්නටයි
මටත් නිති පැවසුවේ
වෙදැදුරුගෙ පණිවුඩය
ලැබුණේය මට සැණින්
ඔබ සුවෙන්! ඔබ සුවෙන්!.....

වෙදැදුරණි, බොහොම පිං
දෙවි කෙනෙකි ඔබ අපට
දැන් ඉතින් මගේ නෙත්
යදින්නේ නිදි දැහැන්
හිමියනේ හෙට උදෙන්
දැක ගන්න යළිඳු ඔබ.....

**දම්මිණී ප්‍රේමචන්ද්‍ර ෆොන්සේකා**

## විදෙස් කවිය

### ද්වාරය

තබා මා කුටියේ
දමා දොරගුළු තදකොට
සිතා සිටියෙද ඔබ
මා සිර කළේ යයි....

වැසූ මේ කුටියේ සිට
මම සිතමි
ඔබ ද සිර වී ඇති බව
මේ දොරෙන් පිටත....

වැසූ දොර නොඇර
ඔබ කෙලෙස ඇතුළු වන්නද
මා හමුවන්නට

භීෂ්ම උප්‍රෙති (Bhisma upreti) නේපාල ජාතික Bhisma upreti ගේ he door කවියේ සිංහලානුවාදය. ඔහු නේපාලයේ තරුණ කවියක් අතර කැපී පෙනෙන කවියෙක්. භීෂ්ම උප්‍රෙති ගේ Paaila Paaila නවකතාව වසන්තා කේ මිහිඳුකුලසූරිය අතින් යාත්‍රාහාරි නමින් පරිවර්තනය වී සැප්තැම්බර් මාසයේදිම එළිදැක්වුණා..

**ජගත් ජේ. එදිරිසිංහ**

## දෝණි

තුරුණු විය
කෙළි කවටකම් සඟවා
දුරු කතරෙ
ගත සවිය දිය කරනා
පුංචි අත්පා
රිදෙනවද ඔබෙ

අප රකින්නට
පාරමී පුරනා
පුංචි දෝණියෙ
සමා දෙනු මැන
ඔබ හඬන හඬ
රහසෙ මට ඇසුණා...

පියෙකු නැති ගෙට
පියෙක් විය ඔබ
බරක් හිස මත තබමිනේ
කවුද කිව මැන
දියණියේ ඔබෙ
ගතේ වීරිය ඇති කළේ
සත්තමයි මට දියණි වේවා
උපදිනා මතු හැම බවේ..

නොයා ඈතට
එකට ඉමු අපි
පියෙනතුරු
නෙත් දෙක මගේ

**කාන්ති කණ්ඩම්බි**

# මාතෘකාව පොත්
# තහනම් වචනය සම්මාන
## ලේඛකයෝ පොත් සල්පිල ගැන කියන කතා

**කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයේ ඇවිද යමින් සිටි අපට එහිදී හමු වූ ලේඛකයන් පවත්නා පොත් වසන්තයේ ක්‍රියාකාරකම් ගැන කියු දෑ නැගූ මත ඇතැම් විට විවාදාත්මක ය. තවත් විටක දී සංවාදශීලි ය. ඒ අනුව එය විවාදාත්මක සංවාද මෙන්ම ප්‍රශංසාත්මක ඇගයීම් වලින් ද තොර නොවී ය.**

කෙටිකතාකරුවකු මෙන්ම නවකතාකරුවෙකු ද වන කීර්ති වැලිසර මුලින්ම කීවේ සම්මාන කියන වචනය ගැන කතා නොකර වෙන ඕනම දෙයක් ගැන කතා කරමු කියා ය. මේ එහෙම පටන්ගත් කතාවයි.

"එදා අපිට තිබුණේ රාජ්‍ය සාහිත්‍ය සම්මාන උලෙළ විතරයි. ඒත් අද සම්මාන උලෙළවල් කිහිපයක්ම තියෙනවා. ඒවායින් සාහිත්‍යයට ලොකු ප්‍රබෝධයකුත් ඇති කරල දීලා තියෙනවා. නමුත් එය හොඳ මට්ටමින් පවත්වා ගැනීම වෙනුවෙන් අප පෙනී සිටිය යුතුයි. නොබෙල් සම්මානය, බුකර් සම්මානය මේ මොන සම්මානයවත් ලේඛකයන්ට ප්‍රමාණවත් තෘප්තියක් ලබා දීලා නැහැ. සාහිත්‍ය සම්මානවල විනිශ්චය මණ්ඩලවල ඉන්න මිනිස්සුන්ට දොස් කියන එක ප්‍රතිඵලයක් නැති වැඩක්. අනිත් අතට විනිශ්චය මණ්ඩල ගත්තමත් උලෙළකින් උලෙළකට ඒ අය සාපේක්ෂයි. ඒ කොහොම වුණත් ප්‍රශස්ත මට්ටමේ කෘති නිෂ්පාදනය වෙන්නේ නැතැයි මා සිත්නේ නැහැ. පහුගිය කාලේ රට පුරා තිබුණ කොරෝනා ව්‍යසනය ගැන හිතනකොට මේ විදිහට සම්මාන උත්සව වගේම ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය පැවැත්වීමත් ඇත්තටම සාධනීය තත්වයක්. හැබැයි සම්මාන ලබා දීම ඉතා ඉහළ සාධනීයත්වයකින් යුක්ත යැයි එයින් අදහස් වෙන්නෙ නෑ. මට ඒ ගැන විවේචනයක් තියෙනවා. ඒත් මම විනිශ්චයන්ට ගරු කරනවා. ඒත් තාම රාජ්‍ය සාහිත්‍ය උලෙළ පැවැත්වුණේ නෑ. ඇයි ඒ? ඒක තමයි එදා ඉඳල අපිත් එක්ක හිටපු සම්මාන උලෙළ."

රූපා ශ්‍රියානි විශේෂයෙන්ම නවකතාකාරියක හැටියට අවධානය දිනූ ලේඛිකාවක වේ. ඇය පවසන්නේ තමන් මේ සාහිත්‍යය ප්‍රබෝධය පිළිගන්නා බවයි." අපට නොදැනී, අපට නොපෙනී අපේ පොතපත කියවන පාඨක පිරිසක් බිහි වෙමින් සිටිනවා. නමුත් තරුණ හා ළමා පරපුර හැඩගස්වන්න අපට ඇති අපේක්ෂාව වෙනුවෙන් ඉහළ යන පොත් මිල ගැන නම් මට පැහැදිල වැටහීමක් නෑ.


ටී. අන්ද්‍රාදි | චුලාභය ශාන්ත කුමාර හේරත් | පාලිත ජයකොඩි | රූපා ශ්‍රියානි ඒකනායක | මංජුල කල්දේරා

මේ පොත් කර්මාන්තය ගැන මට ඇති අවබෝධය අල්පයි. ඒත් කවුරුත් පිළිගන්න ඕනේ ඉහළ යන පොත් මිල හමුවේ පාඨකයන් ගිලිහී යා හැකියි කියන කාරණය." ලේඛකයෙකුගේ ලිවීම කියන කාරණය පොත් මිල ගැන සිතා අඩු වැඩි කළ හැකි ද යන්නත් ප්‍රශ්නයක් යැයි ද ඇය පවසයි. කෙසේ වෙතත් පොත් මිල හා පාඨකයා අතර මේ ගැටුම එක එසේ පවතින බව පිළිගැනීම ඇය ප්‍රතික්ෂේප නොකළාය.

පොත් වගයක් තෝරමින් සිටි අයෙකු හමුවේ නැවතුණ අවස්ථාවක මුඛ ආවරණය තිබියදීත් ඔහු චුලාභය ශාන්ත කුමාර හේරත් බව හඳුනා ගැනීමට අපහසු නොවීය. ප්‍රස්තුථ විෂය ගැන ඔහු පවසන අන්දමට හුදෙකලා වූ පාඨකයාගේ හා ලේඛකයාගේ ඒ හුදෙකලාව නැතිකරන උත්සවාකාර හමුවීමක් හැටියට ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය දැකිය හැක. ඒ අනුව මේ භූමිය තුළ සිදු වන්නේ හුදෙක් පොතපත මිල දී ගැනීමක්ම නොවේ. එය පොතපත සහ ලේඛකයන් ඇසුරු කිරීමක් විශාල පරාසයක් තුළ සිදුවන ක්‍රියාන්විතයක් වශයෙන් ද ඔහු මේ අවස්ථාව දකී. මේ කතාබහ සාහිත්‍ය විනිශ්චය සම්බන්ධයෙන් ද යොමු විය.

"කලාකෘතීන් අතරේ එහි හොඳම කෘතිය කියන තත්වය මෙන්න මේකයි කියල තීරණය කරන්න බෑ. ඒ සඳහා පවතින නිර්නායක ගත්තම මෙන්න මේ නිර්නායක මත යම් කෘතියක් හොඳයි කියල ස්ථිර නිගමනයකට එන්න පුළුවන්කමකුත් නෑ. පුද්ගල කැමැත්ත විවිධයි. විනිශ්චය යන්න ඒ මතත් වෙනස් වෙනවා. කලාකෘතියක් විනිශ්චයේ දී එවැනි ගැටලු ඇති වෙනවා. නමුත් විනිශ්චය මණ්ඩලවල සිටින්නවුන්ගේ ඇති සුදුසුකම් පිළිබඳව ගැටලුකාරි තත්ත්වයත් ඇති බව පෙන්වා දිය යුතුව තිබෙනවා."


ඔහු තවදුරටත් මෙසේ ද පැවසී ය. "මේ විනිශ්චයන් නිසා නිර්මාණ බිහි කරන්න තියෙන හැකියාවත් අවම වෙනවා. අවුරුද්දකට වරක් කෙසේ හෝ පොතක් ලියා පළ කරන්න ඒ අනුව ඔවුන් පෙලඹී සිටිනවා. පොත් ප්‍රමාණාත්මකව වැඩි වෙනවා. නමුත් ඒ නිසා එහි ගුණාත්මක වටිනාකම පිරිහෙනවා."

ප්‍රවීණ පොත් පරිවර්තන ලේඛකයෙකු වන ටී. අන්ද්‍රාදි ට අනුව ජාත්‍යන්තර වේවා ඕනම පොත් ප්‍රදර්ශනයක් වේවා එහි අරමුණ වන්නේ පොත් ජනතාව අතරට ගෙන යාමයි. "ඒ ආකාරයට ලෝක පොත් සංස්කෘතියක් ගොඩ නැගෙනවා. "ජොලියට එන මිනිහා පවා මෙතැනට එනවා. පොත් ගත්තත් නොගත්තත් ඒ මිනිහත් පොත් අතරට යොමු වෙනවා. එංගලන්තයේ පොත් ප්‍රකාශකයො පවුමට පොතක් කියල පොත් ව්‍යාපාරයක් කළා. ඒක ලාබ ප්‍රින්ට් එකක්. මිනිස්සු එළවළු ගෙනියනවා වගේ පොත් ගෙදර ගෙනිච්චා. ඒක විවේචනයට ලක් වුණා. කොහොම නමුත් මිනිස්සු පොත් ගෙදර ගෙනිච්ච. දැං මෙතනත් චෝදනා තියෙනවා පොත් ප්‍රකාශකයෝ තමයි ලාබ ලබන්නෙ කියලා. නමුත් මේ විදිහට හරි පොත් සංස්කෘතියක් ඇති වෙන එක හොඳ නැද්ද? මිනිස්සු මේකට ඇවිල්ලා කනවා බොනවා කියල කියනවා. ඒත් අමතක කරන්න එපා. එහෙම කරන්නෙත් පොත් අතර ඉඳගෙනය කියනෙක.."

පරිවර්තන කෘති කිහිපයක් ම ඉදිරිපත් කළ මංජුල කල්දේරා පොත් ප්‍රදර්ශනය පිළිබඳව තමන්ට ඇත්තේ ප්‍රසාදයක් නමුත් ප්‍රදර්ශනය සහ පටු අරමුණු මත පවතිමින් පොත් නිෂ්පාදනය කිරීම සාහිත්‍යමය උත්තේජනයක් වශයෙන් සැලකිය නොහැකි යැයි පැවසීය. අවුරුද්දට කුමක් හෝ පොතක් නිෂ්පාදනය කිරීම ප්‍රකාශකයින් මෙන්ම ලේඛකයින් අතරේ ඇති ඒ පෙලඹීම ප්‍රබෝධයක් යැයි කිව නොහැකි ය. ඔහුට අනුව වැදගත් වන්නේ සැබෑ සාහිත්‍යය ප්‍රබෝධයක් පවත්වා ගැනීමයි.

"පිලිතියස් දුටු ලංකාව" වැනි විශිෂ්ට කෘතියක් සිංහලට නගමින් තවත් කෘති ගණනාවක් හරහා තහවුරු වූ පාලිත ජයකොඩි මේ සාහිත්‍යය ප්‍රබෝධය දෙයාකාරයකින් දකියි. ඒ අනුව ආගම් මුල් කරගනිමින් පවත්නා සංස්කෘතික උත්සව කාල වගේම සැප්තැම්බරය සාහිත්‍යය සමයක් බවට පත්ව ඇත. එහිදී විශේෂයෙන්ම පොතපතට අදාළව පොතපත කෙරෙහි ඉහළ පාඨක ආකර්ෂණයක් ඇති වීම තුළම වෙළඳපළ තත්ත්වයක් නිර්මාණය වීම වැළැක්විය නොහැක. ඒ අනුව අස්වනු සමයක් බවට ද මෙය පත් වේ. ඒ තත්වය තුළම තරගකාරී කර්මාන්තයක් බවට ද පොත් ප්‍රකාශනය පත් වීම පිළිගැනීමට සිදුව තිබේ. තරගයේ අසීමාන්තික බව හමුවේ පොතක ගුණාත්මක බව පිරිහීමේ අයහපත් ලක්ෂණ ද මතු විය හැකිය. ඉදින් අප ද දැන හෝ නොදැන මේ ක්‍රියාදාමයේ අහු මුල්ලක සිටිනවා විය හැකිය. මේ තත්වය තවදුරටත් වැඩි දියුණු වීමේ අවදානමක් ද පවතින නමුත් "වෙළඳපළ න්‍යාය තුළ මේ කර්මාන්තය ඇතුළෙන්ම තමයි අපගේ සාහිත්‍යයේ යහ සාධනීය අපේක්ෂාවන් වැඩි දියුණු කරගන්නට වෙන්නෙ" යැයි ද ඔහු පැවසීය.

> ' වෙළඳපළ න්‍යාය තුළ මේ කර්මාන්තය ඇතුළෙන්ම තමයි අපගේ සාහිත්‍යයේ යහ සාධනීය අපේක්ෂාවන් වැඩි දියුණු කරගන්නට වෙන්නෙ '



අසුර

**මොහාන් ශ්‍රියන්ත ආරියවංශ**
mohansriyantha@gmail.com


රන්ජන් ඒකනායක | ආනන්ද කහඳව ආරච්චි | වත්සලා ශ්‍රීපාලි | ඒ. ඒ. ඩී. පී ජයවර්ධන | ඉරේෂා සෙනෙවිරත්න | සුදත් සමරාස්කර | ලක්මිණි විජේසිංහ

# පොත් වසන්තයට එන්නේ පොත් ගන්න ද? සෙල්ෆි ගහන්න ද?

**වැසි මැද වුව බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්වෙන කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයට බොහෝ අය පැමිණෙන්නේ බොහෝ විට පොතපත කියවන මෙන්ම තමන් ගැන නොකියු කතා ද සමඟ ය. තමන්ගේ වෘත්තියට මෙන්ම ජීවිකයේ හැගීම් විසින් මතු කරන කතා ද ඒ අතර වේ. ඒ බව අපි දැන ගත්තේ පොත් අතර සැරි සරමින් ඔවුන් හා කළ කතාබහ ඇසුරිනි.**

"මං පුංචි කාලේ ඉඳලම පොත් කියෙව්වා. මට කියවන්න බොහෝ පොත් ගෙනත් දුන් තාත්තා කෙනෙකුත් මට හිටියා. හැබැයි ඒ පොත් ළමා පොත්ම නෙවෙයි. විෂය කරුණු අතින් වැඩිහිටියන්ට ගැළපෙන පොතුත් ඒ අතර තිබුණා. මම ඒ පොත් කියවන කොට අම්මා මගෙන් නොවයි තාත්තගෙන් ඇහුවා මේ ළමයට මේ පොත් තේරෙනවද කියලා. එතකොට තාත්තා කිව්ව දේ තමයි එයා ඒවා තේරුම් ගනීවි. ලොකු වුණාම තවදුරටත් තේරුම් ගනීවි කියන එක." එවැනි අමතක කළ නොහැකි ජීවිත මතයක් සමඟ පොළොන්නරුවේ සිට පැමිණ සිටි ඉරේෂා සෙනෙවිරත්න වෘත්තියෙන් හෙද නිලධාරිනියකි. ඇය තවදුරටත්, තමන් සෑම වසරකම වගේ මෙහි පැමිණෙන බවත් එසේ පැමිණ පොත් ගන්නවා සේම හමුවන ලේඛකයෝ සමඟ කතාබහ කරන බවද පැවැසුවාය.

මාතර බෙලිඅත්තෙ සිට පැමිණි සුදත් සමරාස්කර රජයේ සේවයෙන් විශ්‍රාම ලබා සිටින චිත්‍ර හා මූර්ති ශිල්පියෙකු වේ. ඔහුට අනුව නම් පොතක් කියවනවාය කියන්නේ අවුරුද්දකට සැරයක් කරන දෙයක් නොවිය යුතුය. "අවුරුද්ද පුරාම අපත් සමඟ පැවතිය යුතු ජීවන විලාසකි පොත් කියවීම. අනිත් අතට පොතකට සම්මානයක් දෙනවා කියන්නේ පිටු දෙකකට වඩා කියවන්න නොහිතෙන පොතක් සම්මානයෙන් ඔසවා තැබීමක් නම් ඒ සම්මානය කුමක් ද? ලොකුවට ප්‍රචාරය කරල සම්මාන දෙන පොත් ගොඩක් ඒවා කියවන්න බෑ. පොතක් කියවනවා කියන්නේ ජීවිතයත් එක්ක ඉදිරියට ගලා යන දෙයක්. කොහොම වුණත් මේ වගේ පොත් සංස්කෘතියක් ඇතිවෙන එක හොඳයි.

අලුත් පරම්පරාවක් වෙනුවෙන් වැඩ පිළිවෙළක් එක්කම ඉස්සරහට යනවනං තවත් හොඳයි."

නුගේගොඩ සිට පැමිණ සිටි දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස්වරියක වූ ලක්මිණි විජයසිංහ නිවාඩුවක් ගෙන තමන් එහි පැමිණියේ දරුවන්ට අවශ්‍ය පොතපත එකම තැනකින් ගැනීමට හැකි නිසා යැයි පැවසුවා ය.

"ඒ අතර අපිට අවශ්‍ය පොතුත් අර ගන්නවා එහෙම අරගෙන නිවාඩු වෙලාවක කියවනවා."

ජී.ඒ.ඩී.පි. ජයවර්ධන පැමිණ සිටියේ හොරණ සිට ය. ඔහු වෘත්තියෙන් ගුරුවරයෙකි.

"පොතක් කියවන මිනිහෙකුට තමයි දැනුමක් කියල දෙයක් තියෙන්නෙ. මම විද්‍යා ගුරුවරයෙක්. ඒත් මම සාහිත්‍යයට හුඟක් සමීපයි. රුසියානු පොත් කියවන්නත් හුඟක් කැමතියි. මේ විදිහට ලබාගන්න සාහිත්‍යය දැනුමෙන් තමයි ළමයින්ගේ මානසික සංවර්ධනය දියුණු කරන්නෙ. ඒක විද්‍යා දැනුම ලබා දෙන ගමන්ම මම කරනවා.



පහුගිය අවුරුද්දෙත් මම පොල්පොට් ගැන හෝචි මිං ගැන ලියවුණ පොත් කිහිපයක්ම අරගෙන ගියා. අනික තමයි මේ වගේ තැනක දි අපිට පොතක් ගන්න ලොකු නිදහසක් තියෙනවා. කඩේකදි එහෙම නෑ. පස්සෙන් එනවා මොකක්ද ඕනෙ පොත කියල අහගෙන. මේ පොතම ගන්නව කියල හිතාගෙන අපි පොත් ගන්න යන්නෙ නැනෙ. ඒ නිසා මෙන්න මේ නිදහස හරි වැදගත්."


ඡායාරූපය - රංජිත් අසංක

රාජ්‍ය තාන්ත්‍රික නිලධාරිනියක වූ වත්සලා ශ්‍රීපාලි පැමිණ සිටියේ වරකාපොල සිට ය. ඇය කියුවේ මෙවැන්නකි. " මම අවුරුද්දකට තෝරගත්ත පොත් කිහිපයක් තෝරා ගන්නවා. ඒ පොත් ගන්න තමයි මෙහි එන්නේ. ප්‍රදර්ශනයට පැමිණෙන වයස අවුරුදු 18 -20 අතර තරුණ ළමයි මෙතනට ඇවිල්ලා සෙල්ෆියක් ගහනවා. මොනව හරි කනවා. නිකං කාලය කා දමමින් පොත් අත ගගා ඇවිදිනවා. එහෙම දෙයක් තමයි දකින්න තියෙන්නෙ. මිනිස්සුන්ගෙ ඔළු ඇතුළෙ තියෙනවා පොත් ගන්න ඕනෙ. පොත් කියවන්න ඕනෙ කියන අදහස. ඒත් ප්‍රශ්නය තමයි එහෙම හිතාගෙන මෙතනට ඇවිල්ලා අර විදිහට කාලය කා දමන එක."

කඩවත සිට පැමිණි විශ්‍රාමිකයෙකු වන ආනන්ද කහඳව ආරච්චි සේවය කොට ඇත්තේ චිත්‍රපට සංස්ථාවේ ය. ඔහු පවසන අන්දමට මේ ආකාරයට පැමිණීම විනෝදජනක ය. "මෙතන පොත් විවිධත්වය තමයි වැදගත්. අවුරුද්දේ අනිත් දවස්වලටත් මම මරදානට යනවා පොත් ගන්න ඒත් හැම පොතක්ම එහෙදි හම්බ වෙන්නෙ නෑ. ඉතිං මෙහෙම ආවම අවශ්‍ය කරන පොතුත් අරගෙන මොනව හරි කාලා, සෙල්පියකුත් ගහලා යනවා. අපි ඉතිං සමාජයත් එක්ක ඉන්න මිනිස්සුනෙ."

සමන් ඉන්දික ලොකුකළුගේ පොත් ප්‍රකාශන කළමනාකරුවෙකි. සම්මානලාභි පිටකවර නිර්මාණ ශිල්පියෙකි. ඔහුට තිබුණේ මෙවැනි අදහසකි. "මේ වගේ දෙයක් ඉතිං හොඳ දෙයක්. ඉහළ යන පොත් මිල ගැන නං ගැටලු තියෙනවා. ඒත් ඉතිං එහෙම කියල මේකත් නැති වුණොත් ඒ ගැනත් හිතල බලන්න වෙනවා. මෙතනට එන අය තම තමන්ගේ රස භාවයන්ට අනුව පොත් තෝරගන්නවා. හැබැයි අපේ සමාජයෙ හැසිරීම් දැක්කම පොත් කියවන මිනිස්සු ද ඉන්නෙ කියලත් හිතෙනවා."

"මේක නං අද නියම කානිවල් එකක්." එසේ පැවසුවේ මහනුවර සිට පැමිණි රන්ජන් ඒකනායක ය. ඔහු වෘත්තියෙන් නිර්මාණ අධ්‍යක්ෂවරයෙකි.

"මේක විලාසිතාවක්. විකිණෙන තරමට පොත් කියවීමක් තියෙනවද කියන එක ප්‍රශ්නයක්. පොත් කර්මාන්තය වෙනුවෙන් පවත්වන මේ සංදර්ශනය ඇතුළේ බුද්ධිමය සංවාදයක් තියෙනවද කියා හිතාගන්න අමාරුයි. ස්ටෝල්ස්වල ලොකුවට පොත් ගොඩ ගහල තියෙනවා. වාර්තාගත අලෙවියක්. විශාල සංඛ්‍යාවකින් පැමිණන පාඨක සංඛ්‍යාවක්. මං අහන්නේ කෝ කියවීම? කෝ සංවාදය?

එවැනි කතා බහක් මේ වන විටත් කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය තුළ පවතී. එය විවෘත සංවාදයක් බවට පත් වී වැසි වසිද්දීත් ඒ වැසි අතරින් හුදී ජන පහන් සංවේගය අවදි කරමින් පැමිණෙන මේ පොත් වසන්තය ඇත්තටම සතුටකි. ඉදින් විද්වත් ජන හමුවේ අවදිවන සංවාදශීලි විමසීමක් ද වේ නම් එය අති මහත් සතුටක් ලබා දෙනු ඇත.

දීපානි

# මෙගා නාට්‍යකරුවන්ට ටොක්කක් ඇන්න

# සුදු ඇඳගෙන කළු ඇවිදින්

● තිස්ස ප්‍රේමසිරි

**ශ්‍රී ලංකාවේ ටෙලි නිර්මාණ සංස්කෘතියේ උත්කර්ෂවත්ම අවස්ථාව ලෙස සැලකිය හැක්කේ වාර්ෂිකව පැවැත්වෙන සම්මාන ප්‍රධානෝත්සවයන් ය.**

අප රට තුළ දීපශිඛා, සරසවි, ඕ.සී.අයි.සී ජනාධිපති, ආදි වශයෙන් සම්මාන උළෙලවල් පැවතුනද ඒවා සිනමාවට පමණක් සීමා වූ ඒවා විය.

නමුත් මේ මොහොතවන විට අප රට තුළ සුමති, රයිගම්, සිග්නීස් සහ රාජ්‍ය වශයෙන් ප්‍රධාන ටෙලි සම්මාන උළෙල කීපයක් තිබේ.

මීට කලෙකට පෙර විජය පුවත්පත් සමාගම සහ උන්ඩා (ශ්‍රී ලංකා) ආයතනය එක්ව ටෙලි සම්මාන උළෙලක් පැවැත්වූ නමුත් එවා නිසි පරිදි වාර්ෂිකව පැවැතුණේ නැත. එනයින් බලන කල 1995 වසරේ සිට මේ මොහොත දක්වා වසර විසි පහක් තිස්සේ අඛණ්ඩව පවත්වාගෙන එනු ලබන ප්‍රධානම ටෙලි සම්මාන උළෙළ ලෙස ස්ථාපිතව ඇත්තේ "සුමති ටෙලි සම්මාන උළෙළ"ය. ඊට සමගාමීව 2005 වසරේ ආරම්භ කරන ලදුව දශක එක හමාරක් තිස්සේ අඛණ්ඩව පවත්වා ගෙන එනු ලබන "රයිගම් ටෙලි සම්මාන" උළෙල ද සුමති උළෙළට කිසිසේත් ම නොදෙවෙනි ගුණාත්මක භාවයකින් යුතුවූ පවත්වාගෙන යනු ලැබේ.

1995 වසරේ දී ප්‍රථම වරට පවත්වනු ලැබූ " සුමති ටෙලි සම්මාන" උළෙලේ සංවිධාන කටයුතු කරන ලද්දේ "සරසවිය" සහ "සරසි" යන සිනමා පුවත් පත් වල හිටපු ප්‍රධාන කතුවරයෙකු වූ ඒ.ඩී. රන්ජිත් කුමාර විසිනි.

මෙම උළෙළේදී මුලින්ම සම්මානයට පාත්‍ර වුයේ ජයන්ත චන්ද්‍රසිරි තිර නාටකය ලියා අධ්‍යක්‍ෂණය කළ "දඬු බස්නාමානය" යයි.

"දඬු බස්නාමානය" හොඳම අධ්‍යක්‍ෂණය, ඇතුළුව ප්‍රධාන සම්මාන 12 ක් දිනා ගන්නා ලද අතර විශිෂ්ටම ටෙලි නාට්‍යය සම්මානය මෙන්ම වසරේ ජනප්‍රියම ටෙලි නාට්‍යයට හිමි සම්මානය ද දිනා ගැනීම විශේෂ කරුණකි.

එහිදී හොඳම නළුවා සම්මානය "දඬු බස්නාමානයේ" රඟපෑ බුද්ධදාස විතානාච්චිට හිමි වූ අතර, හොඳම නිළිය සම්මානය "එකගෙයි කුරුල්ලෝ" ටෙලි නාට්‍යයේ රඟපෑ අභාවප්‍රාප්ත මානෙල් ජයසේනට හිමි විය.

සුවිශේෂ කලාකරුවෙකුට හෝ කලාකාරියකට ජීවිතයේ එක් වරක් පමණක් පිරිනැමෙන යූ. ඩබ්ලිව්. සුමතිපාල අනුස්මරණ සම්මානයෙන් මුලින් ම පිදුම් ලැබුවේ ඩී.බී. නිහාල්සිංහ ය.

1970 දී ගරු අර්නස්ට් පෝරුතොට පියතුමන්ගේ ජාතික අධ්‍යක්‍ෂකත්වයෙන් ඕ.සී.අයි.සී. සංවිධානයේ ලංකා ශාඛාව පිහිටුවන ලද අතර පසුව උන්ඩා (ශ්‍රී ලංකා) ආයතනය සමඟ එක්ව බිහිකළ "සිග්නීස්" ආයතනය ශ්‍රී ලංකාවේ සම්මාන උළෙළක් ආරම්භ කළේ ය. පෙර සඳහන් කළ පරිදි විජය පුවත් සමාගම ටෙලි සම්මාන ප්‍රධානයකට සම්බන්ධ වුයේ ඊට පෙර උන්ඩා ආයතනය සමඟ ය.

ශ්‍රී ලංකාවේ සංස්කෘතික දෙපාර්තමේන්තුව විසින් 2004 දී ආරම්භ කරන ලද රාජ්‍ය ටෙලි සම්මාන උළෙල රාජ්‍ය මට්ටමින් රූපවාහිනී නිර්මාණකරුවන් ඇගයීමට ලක් කරන එකම උත්සවය ලෙස හැඳින්විය හැක.

2005 වසරේ දී ආරම්භ කරන ලද "රයිගම් ටෙලි සම්මාන'' උළෙළ ආරම්භයේ දී සම්මාන 19 කට සීමා වූ අතර 2011 වන විට එය සම්මාන 52 ක් දක්වා ඉහළ දැම්මට සංවිධායකයෝ කටයුතු කළහ.

ඔවුන්ගේ පළමු සම්මාන උළෙල 2005 දෙසැම්බර් 8 වන දින බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පවත්වන ලද අතර, 15 වෙනි සම්මාන උළෙළ මෙවර පවත්වන ලද්දේ අගනුවර සුප්‍රකට ෂැංග්‍රිලා හෝටලයේ දීය.

මෙවර සම්මාන උළෙලේ දී හොඳම ටෙලි නාට්‍ය නළුවා "සුදු ඇදගෙන කළු ඇවිදින්" නාට්‍යයේ ආනන්ද කුමාර උන්නැහේ විසින් දිනා ගන්නා ලද අතර, හොඳම ටෙලි නාට්‍ය නිළිය සම්මානය ශලනි තාරකාට හිමි විය. ඒ හැරුණු කල ජනප්‍රිය නිළියට හිමි සම්මානය ද දිනා ගන්නා ලද්දේ ද ඇය විසිනි. සුවිශේෂ සම්මානයක් වූ ප්‍රතිභා ප්‍රභා සම්මානය පිරිනමනු ලැබුවේ ප්‍රවීණ චිත්‍රපට අධ්‍යක්ෂිකා සුමිත්‍රා පීරිස් මහත්මියටය.

අප කැමති වුවත් නැතත් මෙය ශ්‍රී ලංකාවේ පොදු ජනතාවගේ කලා මාධ්‍යය ටෙලි නිර්මාණ බවට පත්ව ඇති යුගයකි. මෙවැනි ටෙලි සම්මාන උළෙලවල් මඟින් ගුණාත්මක කලා කෘති තෝරා සම්මාන පිරි නැමීම විශිෂ්ට සද්කාරයෙකි. එය සද්කාරයක් වන්නේ රටේ අනාගත පරම්පරාවේ කලා රසඥතාවය පිළිබඳ තීන්දු තීරකයන් වන රූපවාහිනී ටෙලි නිර්මාණ ශිල්පීන් වඩාත් නිර්මාණශීලී ගමනකට යොමු කරවීමට මෙවැනි සම්මානනීය ඇගයීම් ප්‍රබල හේතුවක් වන බැවිනි. තමා අද දින මහත් වෙහෙසකින් නිම කළ කෘතිය වෙනුවෙන් නිර්මාණාත්මක ඇගයීමකට බඳුන් වන කලාකරුවා ඊළඟ නිර්මාණය සඳහා පසු ගමනක යෙදෙන්නේ නැත. සම්මානයකින් පිදුම් නොලැබුවද මෙවැනි උළෙලකින් නිර්දේශිත මට්ටමින් හෝ අගය කිරීමකට ලක් විය හැකි වීම පවා නිර්මාණකරුවෙකුට ප්‍රමාණවත් ඇගයීමක් වේ.

පසුගිය දා පැවැති "රයිගම් ටෙලි සම්මාන" උළෙලේ දී අපගේ නිර්මාණකරුවන් ගණනාවක් විශිෂ්ට ඇගයීම් වලට ලක්වූයේ අත්දැකීම් සපිරි ගෞරවනීය විනිශ්චය මණ්ඩලයකට ඔවුන්ගේ ආත්ම ප්‍රකාශනයන් සියුම්ව වටහා ගත හැකි වූ බැවිනි.



වරක් සුප්‍රකට නාට්‍යවේදියකු වන නිතීඥ ඩග්ලස් සිරිවර්ධන අප හා පුවත්පත් සාකච්ඡාවකදී පැවසූ පරිදී කලා නිර්මාණ පිළිබඳ විනිශ්චය බයිසිකල් රේස් එකක් පිළිබඳ තීරණයක් දෙනවාට වඩා බොහෝ වෙනස් ය. බයිසිකල් තරගයකදී කරන්නට ඇත්තේ මහපාර හරහා අඳින ලද හුණු ඉර පළමුවෙන් පසු කළේ කවුදැයි නිවැරදිව බලා කියා ගැනීම පමණකි. නමුත් කලා කෘතියක් විනිශ්චයට භාජනය වනු ලබන්නේ රස වින්දනය අරබයා පොදු මතයක සිටිය ද, එකිනෙකාගේ බහුශ්‍රැතභාවයට අනුව කෘතිය කෙරෙහි විවිධ කෝණවලින් බැලිය හැකි පිරිසක් අතිනි. එනිසා ඉඳුරාම නොවෙතත් සම තත්ත්වයේ ලා ගිණිය හැකි නිර්මාණ අරබයා ඔවුන් එකිනෙකා විසින් එළඹෙන නිගමන වල වෙනස්කම් තිබිය හැකි වනු ඇත. විවිධාකාර වාද විවාද වලින් අනතුරුව යම් එකඟතාවයකට පැමිණිය නොහැකි වුවහොත් ජූරි සභිකයින්ගේ ඡන්දයෙන් තීරණ ප්‍රකාශයට පත්වෙන තත්ත්වයක් යටතේ රසික ජනතාව සහ කලාකරුවන් බලාපොරොත්තුව සිටි ප්‍රතිඵල සියයට සීයයක්ම ලබා දිය නොහැකිය. එය සාමාන්‍ය දැනුමක් සහිත අය කෙසේ වෙතත් සංවේදී කලාකරුවන් මැනවින් වටහා ගත යුතු දෙයකි.

එහෙත් මෙවර "රයිගම් ටෙලි සම්මාන" උළෙලේ ප්‍රතිඵල දෙස බලද්දී එක්වර පෙනී යන කාරණයක් වන්නේ පසුගිය වසරේ ප්‍රේක්‍ෂකයින් අතර කතා බහට ලක් වූ සෑම නිර්මාණයක් ම ඇගයීමකට ලක්වී ඇති බවය.

මෙවර උළෙළේදී විශිෂ්ටතම ඇගයීමට පාත්‍ර වූ ආනන්ද අබේනායකගේ "වීරයා ගෙදර ඇවිත්", සුනිල් කොස්තාගේ "සුදු ඇඳගෙන කළු ඇවිදින්" සහ ජනප්‍රිය ටෙලි නාට්‍යය ලෙස තේරුණ "තණමල්විල කොල්ලෙක්" යන ප්‍රාසාංගික නිර්මාණ ත්‍රිත්වයත්, හොඳම ඒකාංගික ටෙලි නාට්‍යය වූ සන්තුෂ ලියනගේගේ" අපරාරම්භය" කෘතියත් වසරේ විශිෂ්ටම නළුවාට හිමි සම්මානය දිනාගත් "සුදු ඇඳගෙන කළු ඇවිදින්'' ටෙලි නාට්‍යයේ ආනන්ද කුමාර උන්නැහේ රඟ පෑ විල්සන්ගේ චරිතයත් සම්මානයට පාත්‍රවීම කිසිවෙකුගේ දෝෂ දර්ශනයට ලක් වෙන්නක් නොවේයයි සිතමු.

මේ අවස්ථාවේ දීම හොඳම අධ්‍යක්‍ෂණය සඳහා සම්මානයට පාත්‍ර වූ ආනන්ද අබේනායකගේ "වීරයා ගෙදර ඇවිත්" නාට්‍ය නිර්මාණයේ හොඳම සංස්කරණය සඳහා ජගත් වීරතුංග ද, විශිෂ්ටතම ටෙලි නාට්‍ය ශබ්ද පටිගත කිරීම වෙනුවෙන් එස්. රාජේන්ද්‍රද, සංගීත අධ්‍යක්‍ෂණය වෙනුවෙන් ගයාන් ගුණකධාරද, විශිෂ්ටතම ටෙලිනාට්‍ය තිර රචනය වෙනුවෙන් නාමල් ජයසිංහ ද, ආදී වශයෙන් සම්මානයට පාත්‍ර වූහ.

වසරේ විශිෂ්ටතම ටෙලි නාට්‍ය බවට පාත්‍රවූ සුනිල් කොස්තාගේ "සුදු ඇඳගෙන කළු ඇවිදින්'' ටෙලි නාට්‍ය සඳහා විශිෂ්ටතම කලා අධ්‍යක්ෂණය වෙනුවෙන් අජන්ත අලහකෝන් ද විශිෂ්ටතම කැමරාකරණය වෙනුවෙන් සිසි කිරණ පරණවිතාන ද, හොඳම නැගී එන නිළිය ලෙස මිෂෙල් දිල්හාරාද, සම්මානයට පාත්‍ර විය.

නමුත් මේ අවස්ථාවේදී වසරේ විශිෂ්ටතම ටෙලි නාට්‍යය ලෙස සුනිල් කොස්තාගේ "සුදු ඇඳගෙන කළු ඇවිදින්" සම්මානයට පාත්‍රව තිබියදී ආනන්ද අබේනායකගේ "වීරයා ගෙදර ඇවිත්" හොඳම අධ්‍යක්‍ෂණය සඳහා සම්මානයට පාත්‍රවීම දැනටමත් බොහෝ දෙනෙකුට ගැටලුවක්ව පවතිනවා විය හැකිය.

මීට පෙර ද යම් යම් අවස්ථාවල සිනමා සම්මාන උළෙලවල් වලදී මේ ආකාරයට හොඳම නිර්මාණය සහ හොඳම අධ්‍යක්‍ෂණය වශයෙන් සම්මාන බෙදී ගොස් තිබුණද, ඒ අවස්ථාවල ද සාමාන්‍ය ප්‍රේක්‍ෂකයා අතර ගැටලුවක් ඇතිවීමට මෙවැනි තීරණ හේතුවී තිබුණි.

හොඳම නිර්මාණය යයි අප යම් කෘතියක් ගැන තීරණයකට එන්නේ එතුළින් අපගේ හදවත කෙරෙහි ඇති කරන බලපෑම ප්‍රබල වූ විටය. ඒ ප්‍රබලතාවය ඇති කිරීම උදෙසා තිර රචනයේ ඇති සාර්ථක භාවයද, එයට ජීවය සපයන නළු නිළියන්ගේ රඟපෑමේ විශිෂ්ටත්වයද, චරිතවල භාවයන් නිසි පරිදි ග්‍රහණය කර ගැනීමට කැමරා ශිල්පීයා දක්වන සමත්කමද, නිවැරදිම රූප රාමුව අර්ථාන්විත අයුරින් අපවෙත ඉදිරිපත් කිරීමට සංස්කරණ ශිල්පියා දක්වන ප්‍රතිභාවය ද, ඒ සියල්ල මෙහෙයවීමට අධ්‍යක්‍ෂවරයා විසින් දක්වා ඇති සමත්කමද මුල් වෙයි.

නමුත් තවත් නිර්මාණයක අධ්‍යක්ෂවරයා එහි ඇති සෙසු දුබලතා මධ්‍යයේ තම කාර්යය විශිෂ්ටව ඉටුකර තිබෙන බව පෙනී ගිය අවස්ථාවල ජූරි සභිකයින් විසින් ඒ පිළිබඳ අවධානය යොමු කළ අවස්ථා ටෙලි නාට්‍යය සහ චිත්‍රපට ඉතිහාසයේ තිබේ. උදාහරණයක් වශයෙන් දුර්වල තිර රචනයක් ඇති බව පැහැදිලිව පෙනෙන නිර්මාණයක් අධ්‍යක්ෂවරයාගේ නිර්මාණශීලීත්වය මතම ප්‍රේක්‍ෂක ආකර්ෂණයට ලක්වන අවස්ථා තිබිය හැකිය. එමෙන් ම ඔහු විසින් පෙන්වන සුවිශේෂතා ඒ තුළ ඉස්මතුව තිබෙන්නටද පුළුවන. එසේ වුවද මෙවන් අවස්ථා ගැන නිසි පරිදි විවරණය කිරීම සංකීර්ණ කටයුත්තකි.

නමුත් "රයිගම් සම්මාන උළෙළේදී" ගැටලුවක් ඇති වන්නේ හොඳම තිර රචනය, හොඳම සංස්කරණය යන ප්‍රධාන අංශ දෙකක් සඳහා ද සම්මානයට පාත්‍ර වී තිබෙන්නේ ආනන්ද අබේනායකගේ "වීරයා ගෙදර ඇවිත්" නාට්‍යය වීම නිසාය. ඊට අමතරව ආනන්ද අබේනායක හොඳම අධ්‍යක්‍ෂවරයා ලෙසද සම්මානයට පාත්‍රවීම නිසා මෙයටද හොඳම ටෙලි නාට්‍යයක් බවට පත්වීමට අවශ්‍ය හේතු සාධක වලින් අඩුවක් නැති බව පෙනී යයි.

සුනිල් කොස්තාගේ "සුදු ඇඳගෙන කළු ඇවිදින්" ටෙලි නාට්‍යයද, තිර රචනය මෙන්ම එහි ආකෘතිමය ලක්‍ෂණ අතින්ද වෙනසක් ඇති කළ සම්මත ටෙලි නාට්‍ය රටාවෙන් ඔබ්බට ගිය විශිෂ්ට නිර්මාණයකි.

එබැවින් මෙවැනි අවස්ථාවක වසරක් තුළ තිරගත වූ විශිෂ්ටම ටෙලි නාට්‍ය දෙකක් තෝරා ගැනීමට හැකි නම් එකී මාධ්‍යයට කෙරෙන අවැඩක් නොවේ යයි සිතමු.

ඒ වාගේ ම මේ මොහොතේ දුටු අනෙක් කාරණය වන්නේ සුනිල් කොස්තාගේ "සුදු ඇදගෙන කළු ඇවිදින්" ශ්‍රී ලංකාවේ මෙතෙක් බිහිවූ විශිෂ්ටතම මෙගා ටෙලි නාට්‍ය ලෙසද සැලකිය හැකි බවය. එය අප සුනිල්ට කරන අගෞරවයක් නොව, දර්ශන තලයේ දී තිර නාටකය ලියා රූපගත කරන ටෙලි නාට්‍ය වලින් පිරුණු වර්තමානයේ ඒ සඳහා විශිෂ්ට පූර්වාදර්ශයක් ලබාදීම වෙනුවෙන් ඔහුට කරන ගෞරව සම්මානයකි.



අධ්‍යක්ෂ රවී ලියනගේ විසින් ආරාධිත අමුත්තන් වන මහාචාර්ය සුනිල් ආරියරත්න, අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන, කැඳවාගෙන ඒම

# දහසක් තරු පෑයූ 'රයිගම් ටෙලීස්' සම්මාන රාත්‍රියේ රසමුසු තැන්



ප්‍රතිභා ප්‍රභා සම්මානය - සුමිත්‍රා පීරිස්



රයිගම් ටෙලි සම්මානලාභීන්

● නිශානී හේරත් බන්නැහැක

**රයිගම් ටෙලීස් සම්මාන රාත්‍රිය සුවහසක් තරු පිරිවරා අති උත්කර්ෂවත් අන්දමින් පසුගියදා ගාලු මුවදොර මානයේ ෂැංගිලා හෝටලයේදී වර්ණවත් වුණි.**

රයිගම් ටෙලි සම්මාන උළෙළ මෙවර පැවැත්වුණේ 16 වැනි වතාවටයි. උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තන් ලෙස සහභාගි වූයේ වෙළඳ ඇමැති බන්දුල ගුණවර්ධන, සම්මානිත මහාචාර්ය සුනිල් ආරියරත්න, රවින්ද්‍ර රන්දෙනිය 'ද කිංඩම් ඔෆ් රයිගම්' ආයතනයේ සභාපති ආචාර්ය රවි ලියනගේ, කළමනාකාර අධ්‍යක්ෂ ක්‍රිෂාන් තියඩෝර් ඇතුළු කලා කරුවෝ රැසක් සහභාගි වූහ.

චන්දන වික්‍රමසිංහ ප්‍රමුඛ නර්තන කණ්ඩායම උළෙළ රස ගැන්වූහ. නවරත්න ගමගේගේ හා ජගත් වික්‍රමසිංහගේ මියුරු සත්සර රාවය දසත නින්නාද දෙමින් ගායක ගායිකාවන්ගේ මිහිරි හඬට අත්වැල් සැපයුණි.

පුංචි තිරයේ විවිධ අංශ නියෝජනය කරමින් අදියර 07 ක් යටතේ සම්මාන 58 ක් පිරිනැමුණි. ජූරි සම්මාන හතක් පිරිනැමුණු අතර කුසලතා සම්මාන 7 ක් හා විශේෂ ඇගයීම් සම්මාන 4 ක් විය.

රූපවාහිනී මාධ්‍ය විශිෂ්ටතා සම්මාන යටතේ විශිෂ්ටතම ළමා, ක්‍රීඩා, අධ්‍යාපන, ප්‍රශ්න විචාරාත්මක, වාර්තා, පුවත් විශේෂාංග, සංගීත, හඬ කැවීම්, සඟරාමය, කථිකා වැඩසටහන් සඳහා සම්මාන පිදිණි.

එසේම, සිංහල, දමිළ, ඉංග්‍රීසි මාධ්‍ය වෙනුවෙන් ප්‍රවෘත්ති නිවේදක, නිවේදිකා, විශිෂ්ටතම අංග රචනය, කලා අධ්‍යක්ෂණය, කැමරාකරණය, සංස්කරණය, ගීත රචනය, ගායනය ඉසවු සඳහා ද සම්මාන ලබාදුනි.

ජූරියේ සම්මානය ද ඇතුළු 2019 වසරේ සම්මාන 22 න් 07 ක් දිනාගනිමින් වසරේ වැඩිම සම්මාන ගණනක් දිනාගත් නාළිකාව ලෙස සිරස රූපවාහිනී ආයතනයේ සම්මානය ප්‍රධාන විධායක නිලධාරි සුසාර දිනාල් විසින් ලබා ගත්තේය.

විශිෂ්ටතම ටෙලිනාට්‍ය ගීත ගායිකාවන් අතර අවසාන වටයට තේරුණේ ප්‍රවීණ ගායිකා චන්ද්‍රලේඛා පෙරේරා ස්වාධීන රූපවාහිනී ආයතනයේ ජූරි නාට්‍යය සඳහා ගැයූ 'සඳ එළියේ මායාවී' ගීතය හා ඇගේ දියණිය වන රයිනි චාරුකා ස්වර්ණවාහිනියේ ක්ලික් නාට්‍යයට ගැයූ මහ කතරක ගීතයයි. මව පරදවමින් රයිනි චාරුකා සම්මානය හිමිකර ගැනීම විශේෂත්වයක් විය.

නැගී එන නළුවා, නිළිය, තිර රචනය, ඒකාංගික ටෙලිනාට්‍ය සඳහා ද සම්මාන ලබාදුනි.

පුළුල් තිරයේත් පුංචි තිරයේත්, සිය ප්‍රතිභා කෞෂල්‍යය දශක කිහිපයක් තිස්සේ සදා නොමැකෙන සේ සනිටුහන් කරමින් රසික හද දිනූ ප්‍රවීණ අධ්‍යක්ෂිකා සුමිත්‍රා පීරිස් ප්‍රතිභා ප්‍රභා ගෞරව සම්මානයෙන් පිදුම් ලබන මොහොතේ කවුරුත් සිය අසුන්වලින් නැගී සිටිමින් ඇයට ගෞරවය දක්වන විරාමය මොහොතකට මුළු ශාලාවම නිහඬ කළේ අපූරු ආකාරයටයි. තම ජීවිතයේ එදා පටන් ළඟින් සිටි ආදරණීය සැමියා මෙතන නොමැති බව ඇ පැවසුවේ හැඬීම්බර, හැඟුම්බර ස්වරූපයෙනි. ජ්‍යෝෂ්ඨ රංගන ශිල්පිනී ලියෝනි කොතලාවල හා ප්‍රවීණ සංගීතවේදී විශාරද මනෝජ් පීරිස් ජීවිතයේ එක්වරක් පමණක් පිදෙන රයිගම් විශේෂ ප්‍රණාම සම්මාන ලැබූහ.

කලා ලොව කිරුළු පලඳිමින් ජීවන රඟ මඬලින් බැස ගිය සරත් නාමල්ගම, ඇන්ජලීන් ගුණතිලක, එච්.එම්. ජයවර්ධන, චිත්‍රා වාකිෂ්ට, ඉන්ද්‍රාණි සේනාරත්න, කුසුම් පීරිස්, මහාචාර්ය කාලෝ ෆොන්සේකා, චන්ද්‍රා කළුආරච්චි, ජයලත් මනෝරත්න යන කලාකරුවන් පිරිස මෙහිදී සිහිපත් කෙරුණි.

## ශලනි තාරකාට කිරුළු පිට කිරුළු

## ප්‍රතිභා සම්මානය සුමිත්‍රා පීරිස්ට

## වැඩිම සම්මාන ජාතික රූපවාහිනියට

රූපවාහිනී කෙටි පණිවුඩ මත විමසුම මත තෝරා ගැණුනු ජනප්‍රියතම ටෙලිනාට්‍ය නළුවා ලෙස සම්මාන ලැබුවේ රවීන් කණිෂ්කය.

වසරේ විශිෂ්ටතම ටෙලිනාට්‍ය නළුවා ලෙස සම්මානය දිනාගත්තේ ජාතික රූපවාහිනියේ විකාශනය වූ සුදු ඇඳගෙන කළු ඇවිදින් ටෙලිනාට්‍යයේ විල්සන්ගේ චරිතයට ජීවය දුන් ආනන්ද කුමාර උන්නැහේ රංගන ශිල්පියාය.

ජනප්‍රියතම ටෙලිනාට්‍යය ලෙස 'තණමල්විල කොල්ලෙක්' හා විශිෂ්ටතම ටෙලිනාට්‍යය ලෙස 'සුදු ඇඳගෙන කළු ඇවිදින්' සම්මාන ලැබීය.

වසරේ සම්මානනීය ටෙලිනාට්‍ය නාළිකාව හා වසරේ සම්මානනීය නාළිකාව ලෙස අභිෂේක ලැබුවේ ජාතික රූපවාහිනියයි. ටෙලිනාට්‍ය සම්මාන 14 ක්, මාධ්‍ය සම්මාන 2 ක් සමඟ සම්මාන 16 ක් දිනාගැනීමට ජාතික රූපවාහිනිය සමත් විය.

රයිගම් ටෙලීස් සම්මාන උළෙලේ සුවිශේෂම සිද්ධියක් වූයේ රයිගම් ටෙලීස් ජනප්‍රියතම නිළිය හා විශිෂ්ටතම නිළිය කිරුළ එකම නිළියකට හිමිවීමයි. රයිගම් ටෙලි සම්මාන ඉතිහාසයේ ප්‍රථම වරට මෙම වාසනාව දිනාගත්තේ ස්වර්ණවාහිනියේ අග්නි පියාපත් හි 'හිරු' නාළිකාවේ 'සිහින ගෙනෙන කුමාරියේ' නාට්‍ය වල රඟපාන ශලනි තාරකා යි. අද විශිෂ්ටතම නිළිය වූයේ සිරස ටී.වී. හි අඩෝ ටෙලිනාට්‍යයේ කමනීගේ චරිතයටයි. මෙවැනි සම්මාන ද්විත්වයක් මීට පෙර දිනාගත්තේ 1996 සුමති සම්මාන උළෙළේදී චාන්දනී සෙනෙවිරත්න විසිනි. වසර 24 ට පසුව ශලනි එම වාර්තාව බිඳදැමුවාය. මේ අවස්ථාවේදි ශලනි පැවැසුවේ; ඇය කිසිසේත්ම ජනප්‍රිය සම්මානය බලාපොරොත්තු නොවූ බවත්, ඇගේ බලාපොරොත්තුව විශිෂ්ටතම කිරුළ පමණක් බවත් පළමු වරට වේදිකාවේදී පැවසුවාය. කිරුළු දෙකක් සමඟින් දහසින් බැඳි පියලි දිනූ ශලනි පැවසුවේ මීට පෙර 7 වතාවක් දක්ෂතම නිළියට නිර්දේශ වූ බවත් දැන් තමන්ගේ හොඳ කාලය පැමිණ ඇති බවයි.



විශිෂ්ටතම නළුවා - ආනන්ද කුමාර උන්නැහේ සහ ජනප්‍රියම නිළිය හා විශිෂ්ටතම නිළිය ලෙස සම්මාන ලැබූ ශලනි තාරකා

රයිගම් සම්මාන රාත්‍රිය අලංකාර නර්තන ගායනයන් රැසකින් සමන්විත වූ අතිශය වර්ණවත් රැයක් විය.

සේයාරූ - විපුල අමරසිංහ

වෂී 2020ක් වූ සැප්තැම්බර් මස 27 වැනි ඉරිදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

Tel: 2429351
Mobile: 071 7829018
Email:
Silumina.advt@lakehouse.lk

සිළුමිණ

# අධ්‍යාපන
Education

# සිහින රටට ඔබ ගෙන යන Win Stone හෝටල් පාසල



අධ්‍යක්ෂ - ජගත් පෙරේරා

මෙරට හෝටල් ක්ෂේත්‍රයට දැවැන්ත නායකත්වයක් දුන්, ගැමුණු ගුණවර්ධන මහතා සභාපතිත්වය දරන, මෙරට ප්‍රථම විධායක සූපවේදිනිය වන, ඉයන්ති ගුණවර්ධන කළමනාකාර අධ්‍යක්ෂ ධුරයේ සිටින, 'රස සරණිය' හරහා, රූපවාහිනී ක්ෂේත්‍රයට ඉවුම් පිහුම් කලාව වෙනත් මානයකින් රැගෙන ආ, ජගත් පෙරේරා මහතා අධ්‍යක්ෂ ධුරයේ සිටින, win stone හෝටල් පාසල, එවැනිම සුදුසුකම් ලත් ආචාර්ය මණ්ඩලයකින් සැදුම් ලත් මෙරට ප්‍රමුඛ පෙළේ පුද්ගලික හෝටල් පාසලකි.

හෝටල් ක්ෂේත්‍රයට අදාළ අධ්‍යාපනයේ සම්ප්‍රදායෙන් ඔබ්බට ගොස්, තරුණ සිහින හඹා යන්නට... තමන් කැමැති රටක ජීවත් වන්නට... හෝ පුරවැසිභාවය ලබා ගැනීම සඳහා, නොසිතන පහසු මගක් පෙන්වා දෙන්නට ඔවුන් හැදූ, win stone හෝටල් පාසල සමත්ව තිබේ.

ඒ අනුව, මේ රටේ දහස් සංඛ්‍යාත තරුණ පිරිස් තවදුරටත්, ත්‍රීවිල් මත්තේ දියාරු වන ජීවිත ගත කළ යුතු නොවේ. ඒ වෙනුවට, මේ රටේ ඩොලර්වලින් උපයන තරුණ පිරිසක් බිහිකිරීමට win stone හෝටල් පාසල වෙත ඇති හැකියාව පිළිබඳ, එහි අධ්‍යක්ෂ ජගත් පෙරේරා මහතා සමඟ කළ කතාබහක් මේ.

**● හෝටල් සේවා අධ්‍යාපනය හා සසඳද්දී win stone හෝටල් පාසලේ තිබෙන විශේෂත්වය කුමක්ද...**

මෙය හෝටල් අධ්‍යාපනයට පමණක් සීමා වූ ආයතනයක් නොවේ. ඔබ ජීවත් වන්නට ආසා කරන රටක පුරවැසිභාවය ලබා ගන්නට, මඟ හසර කියා දෙන සහ ඔබ වටිනා මනුෂ්‍යයෙක් බවට පත් කරන අධ්‍යාපනික ආයතනයක් ලෙස, හඳුන්වන්නට පුළුවන්.

උදාහරණයක් විදියට අප ලබාදෙන ඕස්ට්‍රේලියානු රජයේ සුදුසුකම වන,tafe SA (government of south australia) සුදුසුකම ලබා ගැනීම ස්ට්‍රේලියාවේ ජීවත් වන්නට ඔබට මග විවර කර දෙන හොඳම දොරටුවක්. එසේ බලද්දී, win stone කියන්නේ, සූපවේදයේ හෝ හෝටල් සත්කාරක සේවයට පමණක් සීමා නොවී, ඔබේ සිහින රට වෙත යන්නට උදව් කරන පාඨමාලා පිරිනමන ආයතනයක්.

**● මේ ඔස්ට්‍රේලියානු tafe SA සුදුසුකමේ තිබෙන, වැදගත්කම කුමක්ද...**

එය හෝටල් ක්ෂේත්‍රයේ ජාත්‍යන්තර සුදුසුකමක්. ඔස්ට්‍රේලියානු පුරවැසිභාවය සඳහා පමණක් නොවේ, සමහර අය මේ සුදුසුකම ලබා ගන්නේ, එය ලොව ඕනෑම රටක් පිළිගන්නා නිසා. සමහර අයට, ඔස්ට්‍රේලියානු විශ්වවිද්‍යාලයකට ගෙවන්නට තරම් වත්කමක් නැහැ. නමුත් ලංකාවේදී රුපියල් ලක්ෂ තුනයි විස්සක් ගෙවන්නට පුළුවන්. එහෙම අයටත් අවුරුදු 6ක් මැදපෙරදිග වැඩකොට, skill migration පදනම යටතේ, ඕස්ට්‍රේලියාවට හෝ කැනඩාවට ඉල්ලුම් කරන්නට අවස්ථාව තිබෙනවා.ඕස්ට්‍රේලියානු රජයේ tafe SA සුදුසුකම වසර හයක අත්දැකීම් අනෙක් සුදුසුකම් සියල්ල එක් වූ විට, වයස 30ටත් අඩු කාලයකදී ඔවුන් පුරවැසිභාවය සඳහා සුදුසුකම් ලබනවා. ඉතින්, මුදල් නැහැ කියා, ඔබේ සිහිනයට යන මාවත වැහෙන්නේ නැහැ, වුවමනාව ඇත්නම්, කෙසේ හෝ ඒ මාවත උදාකරගන්නට winstone හරහා අවස්ථාව තිබෙනවා.

**● tafe ඕස්ට්‍රේලියානු සුදුසුකම ලබා ගන්නට ලාංකීය සිසුවකු මොන තරම් වියදමක් දැරිය යුතු ද...**

මෙය ඕස්ට්‍රේලියානු විශ්වවිද්‍යාලයක සෘජුවම හදාරනවා නම්, පෙර කියූ පරිදි, ඕස්ට්‍රේලියානු ඩොලර්,15,000 ක් එනම්, ශ්‍රී ලංකා මුදලින් රුපියල් ලක්ෂ 19ක් වැය වනවා.නමුත් win stone හෝටල් පාසලේදී ඔබට මෙය, රුපියල් ලක්ෂ තුනයි විස්සකට හදාරන්නට අවස්ථාව තිබෙනවා. එය, රුපියල් ලක්ෂ 15 ක ඉතිරියක්.ලංකාවේ සිට සම්පූර්ණ වසරක් මේ පාඨමාලාව හැදෑරූ පසු අපි සෘජුවම ඒ සිසුන් ඔස්ට්‍රේලියාවට යවනවා එවිට ඔවුන්ට සෘජුවම උපාධියට සම්බන්ධ විය හැකියි. ඒ වගේම, ඊළඟ වසරේදී ශ්‍රී ලංකාවේ සිට level 4 දක්වා ඉගෙන ගන්නට හැකිවන පරිදි අප අවස්ථාව උදාකර ගන්නවා. එවිට සම්පූර්ණ උපාධිය හමාර කරන්නට සිසුවකුට ඔස්ට්‍රේලියාවේ ගත කරන්නට සිදු වන්නේ වසර දෙකක් පමණයි. ඔස්ට්‍රේලියාවේ අවුරුදු දෙක සම්පූර්ණ කළ පසු, තවත් අවුරුදු දෙකක් ඔස්ට්‍රේලියාවේ වැඩ කිරීමට ඒ සිසුවාට වර්ක් පර්මිට් එක ලැබෙනවා. ඉන් පසු ඔවුන්ට පුළුවන්, temporary residence හෙවත්, TR සඳහා ඉල්ලුම් කරන්න.

**● win stone හි ප්‍රායෝගික පුහුණුවීම් ලබා දෙන ක්‍රමවේදයේ පවා, වෙනසක් ඇති බව ඔබ කීවා...**

ඔව්. අපේ මූලික තේමාව, Quality Education.ඒ අනුව, අප සෑම විටම මුල්තැන දෙන්නේ, ජාත්‍යන්තර කෑම වට්ටෝරු නිර්මාණය සඳහායි. ඒ වගේම, ඒවාට අදාළ ඔරිජිනල් අමුද්‍රව්‍ය, හුගක් මිලයි. නමුත්, ආදේශක යොදා නොගෙන අප එම නියම ප්‍රමිතියේ අමුද්‍රව්‍ය පමණක් ම භාවිත කිරීම විශේෂත්වයක්.අනෙක් කාරණය තමයි, අපේ ආයතනයේ ප්‍රායෝගික පුහුණුවීම් කෙරෙන්නේ, තනි තනිව. කණ්ඩායමක් විදියට කළ විට, යන අමුද්‍රව්‍ය ප්‍රමාණය සහ වියදම අඩුයි. වියදම වැඩි වුණත්, එය නිසි ආකාරයෙන් ම තමන්ගේ අත්දැකීමක් ලෙස ලබා දෙන ලෙසයි, අප ආයතනයේ ප්‍රායෝගික පුහුණුවීම් සකසා තිබෙන්නේ.

**● මෙහි සුවිශේෂී පාඨමාලාවක් වන Advanced Diploma වෙතින් ආවරණය වන, අංශ මොනවාද...**

මාස 18ක ඇඩ්වාන්ස් ඩිප්ලෝමාව අප හඳුන්වා දෙන්නේ සාමාන්‍ය පෙළ වැඩ හයක් සමත් හෝ උසස් පෙළ සමතුන් සඳහායි. ඒ අනුව මෙම මස 18 පාඨමාලාව තුළ, cookery, bakery, housekeeping, front office, food & beverage, marketing, HR, PR, guest relationship, event management, computer සහ English... කියන විෂය පථයන් ආවරණය වනවා. ඉන් පසු, නැවත මාස හයක සීමාවාසික පුහුණුවක් සඳහා, ඔවුන් තරු හෝටල් වෙත යැවෙනවා. එය, පූර්ණ කාලීන (full-time) පුහුණුවක්. එවිට සිසුවෙක් මේ පාඨමාලාව සඳහා සම්පූර්ණයෙන් වැය කරන කාලය, අවුරුදු දෙකක්.

**● මේ අවුරුදු දෙකෙන් පස්සේ, ඔවුන්ට මොනවද ලැබෙන්නේ...**

කැනඩාවට යන්න කැමැති කෙනකු නම්, තවත් අවුරුද්දක අධ්‍යාපනය සඳහා, අප ඔවුන් කැනඩාවට යවනවා. ඒ අවුරුද්දක අධ්‍යාපනයෙන් පසු, ඒ සිසුවාට කැනඩාවේ තවත් අවුරුදු දෙකක් වැඩ කිරීමට work permit හෙවත්, වැඩ කිරීමේ බලපත්‍රය ලැබෙනවා. ඉන් පසු ඔවුන්ට පුළුවන්, temporary residency හෙවත් TR සඳහා ඉල්ලුම් කරන්න.

එහෙමත් නැතිනම්, ඒ සුදුසුකමට නවසීලන්තයට යා හැකි තවත් මාවතක් තිබෙනවා. නවසීලන්තයේ අවුරුදු දෙකක් අධ්‍යාපනය හදාරා උපාධිය සම්පූර්ණ කළ විට, එක් අවුරුදු වැඩ කිරීමේ බලපත්‍රය ලැබෙනවා. TR හෙවත්, තාවකාලික පුරවැසිභාවය ඉල්ලුම් කිරීම සඳහා එයද එක් සුදුසුකමක්.

නමුත් උසස් අධ්‍යාපනය සඳහා එවැනි රටකට යන්නට මුදල් නැති නම්, ඒ සිසුවාට පුළුවන්, ලංකාවේ හෝ මැදපෙරදිග වැඩ කරන්න. අප ගැළපෙන රැකියා සොයා ගැනීමට ඔවුන්ට උදව් කරනවා. එසේ අවුරුදු හය හතක් වැඩ කළ පසු, ඔවුන් වයස 35- 40 තරුණ අවධියේදී ම ඉහළ



කළමණාකාරිත්වයේ තනතුරුවලට උසස්වීම් ලබනවා.

ඉතින් ඔබට පේනවා නේද, යම් රටක ජීවත් වන්නට අසා කරනවා නම්, අවුරුදු හතරක් වැනි කෙටි කාලයකදී සුදුසුකම් සහිතව ම ඒ සඳහා මාර්ගයක් උදා කර ගත හැකි බව. එසේත් නැති නම්, තරුණ වියේදීම ඉහළ කළමනාකාරීත්වයට යා හැකි මාර්ගයක් ඇති බව.

මේ තනතුරු සඳහා අවශ්‍ය පිරිස් අප පශ්චාත් කොවිඩ් සමය තුළ නිර්මාණය කරගත යුතුයි.මොකද, මේ අවදානම් තත්ත්වය පහ වූ පසු ශ්‍රී ලංකාවට පැමිණෙන්නට බොහෝ විදේශිකයන් පිරිසක් බලා සිටිනවා. ශ්‍රී ලංකාව පිළිබඳ දැඩි විශ්වාසයක් ඔවුන් තුළ තිබෙනවා. ඔවුන් එන්න ගත් විට, හෝටල් ක්ෂේත්‍රයට අවශ්‍ය සේවක පිරිස අනිවාර්යයෙන්ම මදි වනවා. ඒ හිස් තැනට තමයි, අප මේ පාඨමාලා තුළින් අවශ්‍ය ශ්‍රමිකයන් බිහි කරන්නේ.

**● එතකොට,සාමාන්‍ය පෙළ පමණක් ලියූ සිසුන්ට තිබෙන අවස්ථා මොනවාද...**

සාමාන්‍ය පෙළ වැඩ තුනක් සමතුන්ට වුවත්, ජාත්‍යන්තර මගී නැවක සේවය කරන්නට අප මග හසර උදාකර තිබෙනවා. අපි තමයි, සුපිරි ජර්මන් මගී නැව් සඳහා ශ්‍රී ලංකාවේ එකම නියෝජිත. ඒ කියන්නේ, එක් වර මගීන් 4,000ක් විතර ගමන් කරනා සුපිරි තලයේ ජර්මන් නැවුම් පහලොවක් සඳහා හෝටල් අංශයේ සේවකයින් සැපයීමට බලය තිබෙන්නේ ලංකාවේ win stone හෝටල් පාසලට පමණයි. එවැනි නැව්වලට සේවකයන් 2,000ක් පමණ අවශ්‍යයයි. ඒ අනුව ජර්මන් Ida, ඉතාලි Costa, ඕස්ට්‍රේලියාවේ P & O සහ Princess... කියන නැව් සමාගම්වලට අවශ්‍ය හෝටල් සේවකයින් සපයන්නේ අප විසින්.

සාමාන්‍ය පෙළ වැඩ තුනක් ඇති දරුවන් බඳවා ගෙන, cookery, waiters සහ housekeeping යන විෂයන්, ඉංග්‍රීසි සහ පරිගණක දැනුම ද ඇතුළත්ව මාස දහයක් පුහුණු කොට, එක් අවුරුද්දක් වැඩ කිරීම සඳහා තරු හෝටල් සඳහා යොමු කරනවා. ඔවුන්ට අවුරුදු 21 පිරුණු ගමන්, ඒ ජර්මන් නැව්වලට යන්නට අවශ්‍ය කටයුතු සලසා දෙනවා.

ඒ වගේම, අපි තමයි ශ්‍රී ලංකා නාවික අමාත්‍යාංශයේ ලියාපදිංචි එකම ඒජන්ත .ඒ කියන්නේ, අපි සිසුන් නැව්වලට යන්නේ රාජ්‍ය මැදිහත්වීම ඇතිව. විශේෂයෙන් අප මේ සඳහා උනන්දු කරන්නේ, අඩු ආදායම්ලාභී සහ වැඩිදුර ඉගෙන ගැනීමට නොහැකි වූ දරුවන්. ඔවුන් යන නැව්වලට අවශ්‍ය සහ ඊට ගැළපෙන සෑම පුහුණුවක් ම අප ඔවුන්ට ලබා දෙනවා.

වැදගත්ම දේ,ඒ මාස 6-8 ඇතුළත ලොව සුපිරිම රටවල් 20 ක සංචාරය කරන්නට මේ අයට අවස්ථාව ලැබෙනවා. ඒ වගේම, මේ අයට ලැබෙන මුල් කොන්ත්‍රාත් කාලය මාස හයක් හෝ අටක් වුවත්, එය නැවත නැවත අවුරුදු හතර පහ දක්වා දීර්ඝ වෙනවා.වැටුප පටන් ගන්නේ,රුපියල් ලක්ෂ එකහමාරක මුදලකින්. ඉතින්, ඕ ලෙවල් වැඩ තුනක් සමත් ළමයකුට යන්න පුළුවන් හොඳම මාවතක් නෙවෙයිද මේ . මේ මුළු කාලෙටම ඔවුන් ඉගෙනීම සඳහා වියදම් කරන්නේ, රුපියල් ලක්ෂ දෙකක මුදලක් පමණයි.

**● මේ වන විට මොන තරම් පිරිසක් එසේ නැව් සේවා සඳහා යවා තිබෙනවා ද...**

දෙදහක් පමණ. ඒ අයට හොඳ ආර්ථිකයක් හැදෙනවා විතරක් නෙවෙයි, රටට විදේශ විනිමය අරන් එන පිරිසක් බවට මේ අය පත් වනවා. මේ සමාගම් තමන්ගේ සේවකයන් ඉතා හොඳින් රැක බලා ගන්නා බවත් කිව යුතුමයි.

පසු ගිය සමයේ ඒ නැව්වල සිටි අපේ ළමයි 1700ක්, තාවකාලිකව මෙරටට ගෙන්වා ගත් අවස්ථාවේ, ඔවුන් සුපිරි හෝටල්වල නවත්වා නිරෝධායනය කොට, PCR පරීක්ෂණ සඳහා ඇතුළු ඔවුන්ගේ සියලු විය හියදම් දැරුවේ ඒ සමාගම් විසින්. එක් ළමයකුට ඔවුන් වැය කළ මුදල, ඩොලර් 1700ක්. ඉතින්, කිසිම ආදායමක් ලංකාවට ආපු නැති කාලෙක මේ සා විශාල මුදලක් මේ ජර්මානු නැව් සමාගම් අපේ රටට ගෙව්වා. මෙයින් පෙනෙන්නේ, ඔවුන් මොන තරම් හොඳින් සිය සේවකයන් බලාගන්නවා ද කියන එකයි.

**● අන්තිමට කියන්න,මෙහෙම ගොඩනැඟෙන ඔවුන්ගේ ජීවිතවලට ලැබෙන පිළිගැනීම කෙබඳුද...**

නැව්වල අවුරුදු හතරක් පහක් මේ විදියට වැඩ කරන ඔවුන්ගේ විදේශ ගමන් බලපත්‍රයට ලැබෙන පිළිගැනීම ඉතාම ඉහළයි. මාස හයක කාලයක් ඇතුළත රටවල් 20 ක සංචාරය කරනවා නම්, අවුරුදු හතරක් පහක් අවසාන වෙද්දී ඔවුන් මොනතරම් රටවල් ප්‍රමාණයක ඇවිද තිබෙනවාද... රටකින් රටකට වරායෙන් බැහැලා , ආපසු නැවට ගොඩ වෙද්දි ,ඒ රටේ සීල් එක විදේශ ගමන් බලපත්‍රයේ වදිනවා . මේ විදියට අවුරුදු හතර පහක්, ලෝකෙ වටේ රටවල් ගණනාවක සීල් මේ විදේශ ගමන් බලපත්‍රයේ තැන්පත් වෙනවා කියන්නේ, එය ලොව පිළිගන්නා සාධකයක්.

ඔවුන් වරායකින් රටකට ඇතුළු වුවා සේම, එම රටෙන් පිට වූ බවත්, ඔවුන් අවංක සහ විශ්වසනීය පුරවැසියන් බවත්, මේ ගමන් බලපත්‍රය දකින ඕනෑම රටක් තේරුම් ගන්නවා. එය රටකට යන්නට වීසා ඉල්ලන විට, ඉතාම සාධනීයව බලපානා කාරණාවක්.

හිතන්න, සාමාන්‍ය පෙළ ලියා, ත්‍රීවිල් එකක් අතට ගන්නවාට වඩා, ලොවක් පිළිගත්, ලොව වටා සංචාරය කරන ජීවිතය විඳින මනුෂ්‍යයකු වන්නට තිබෙන හොඳම අවස්ථාවක් මේ.

අනික තමයි, ලක්ෂ හත අටක් දීලා බෝට්ටුවකින් ඔස්ට්‍රේලියාවට යන්න ජීවිත අවදානමක් ගන්නේ ඇයි. ලොවක් පිළිගත් මනුෂ්‍යයෙක් ලෙස ඒ ගමන යන්නට winstone හෝටල් පාසල ඔබට මගක් විවර කර දී තිබෙනවා. මේ හැමදේටම ඔබට ගෙවන්නට වන්නේ, අධ්‍යාපනික ගාස්තු පමණයි. වීසා වෙනුවෙන් හෝ මේ උදා කර දෙන ගමන් මග වෙනුවෙන්, එක සතයක් හෝ අප අය කරන්නේ නැහැ. මොකද, අප ලොවක් පිළිගත් අධ්‍යාපනික ආයතනයක්.

ඉතින්, ඔබත් මේ අවස්ථාවෙන් උපරිම ප්‍රයෝජනය ලබා ගත යුතුයි. එයයි, අපගේ සතුට. ජයග්‍රහණය.

ඉනෝකා පෙරේරා බණ්ඩාර







## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

### බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය

### විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි කිරීම - 2020

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය මගින් පවත්වනු ලබන විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව සඳහා සිසුන් ලියාපදිංචි කිරීමට තෝරා ගැනීම පිණිස සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් 2020-11-02 වන දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

**උපාධි පාඨමාලාව :**

විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධිය, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය යටතේ ක්‍රියාත්මක වේ.

පාඨමාලාව පවත්වනු ලබන භාෂා මාධ්‍යය - සිංහල/ ඉංග්‍රීසි

පාඨමාලා කාලය - වසර 03 යි.

සම්පූර්ණ පාඨමාලා ගාස්තුව (වසර තුන සඳහාම) - රු.185,000/- ( වාරික තුනකින් ගෙවිය හැකිය.)

**අයදුම් කිරීමේ සුදුසුකම් :**

- අ.පො.ස.(උ.පෙළ) විභාගයෙන් අවම වශයෙන් එක් වරක දී පහත සඳහන් එක් විෂයක් ද ඇතුළුව සම්මාන සාමාර්ථ ("C") 03 ක් සහිතව සමත් වීම.

| | |
|---|---|
| ගණකාධිකරණය | ආර්ථික විද්‍යාව |
| ව්‍යාපාර අධ්‍යයනය | උසස් ගණිතය |
| ව්‍යාපාර සංඛ්‍යානය | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය |
| සංයුක්ත ගණිතය | ගණිතය |

- අයදුම්පත්‍ර කැඳවන අවසාන දිනයට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 35 ට නොවැඩි විය යුතුයි.

**ලියාපදිංචිය සඳහා තෝරා ගැනීම :**

බාහිර උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි කරනු ලබන්නේ සීමිත ශිෂ්‍ය සංඛ්‍යාවක් වන බැවින් අයදුම්කරුවන් සංඛ්‍යාව අනුමත ශිෂ්‍ය සංඛ්‍යාව ඉක්මවුවහොත් ප්‍රවේශ පරීක්ෂණයක් හෝ අදාළ අධ්‍යයනාංශය මගින් තීරණය කරනු ලබන වෙනත් ක්‍රමවේදයක් මගින් තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

**අයදුම්පත් ඉදිරිපත් කිරීම :**

1. අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා ඕනෑම මහජන බැංකු ශාඛාවකට 072010007127 දරන ගිණුම් අංකයට රු. 1300/- මුදලක් ගෙවා රිසිට්පත ලබා ගත යුතු අතර, www.external.sjp.ac.lk වෙබ් අඩවිය හරහා මාර්ගගත ක්‍රමවේදය (Online) අනුගමනය කරමින් අයදුම්පත සම්පූර්ණ කර යොමු (Submit) කළ යුතුය.
2. නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් පිටපතක් (Download කරගත්) සමග පහත ලේඛන ද අමුණා 2020-11-02 දිනට පෙර **සහකාර ලේඛකාධිකාරී, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය, නැ.පෙ අංක 10, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

(ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවර "**විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව**" ලෙස සඳහන් කළ යුතුය.)

I. රු. 1300/- ක මුදල් ගෙවූ රිසිට්පත (ඡායා පිටපතක් ඔබ සතුව තබා ගන්න)
II. සහතික කරන ලද උප්පැන්න සහතිකයේ පිටපතක්
III. අධ්‍යාපන සහතිකවල සහතික කරන ලද පිටපත්
IV. ජාතික හැඳුනුම්පතේ සහතික කරන ලද පිටපතක්

**අයදුම්කරුවන් සඳහා උපදෙස් :**

❖ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය සම්බන්ධව කටයුතු කරන වෙනත් කිසිදු ආයතනයක් හෝ අනුබද්ධ ආයතනයක් නොමැත. අයදුම්පත් ඉදිරිපත් කිරීම තවත් විසින්ම සිදු කළ යුතු වේ, වෙනත් ආයතන මගින් ඉදිරිපත් කරන අයදුම්පත් පිළිබඳ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ වගකීමක් නොමැත.

❖ අයදුම්කරුවන් විසින් ගෙවනු ලබන රු. 1300/- අයදුම්පත්‍ර ගාස්තු නැවත ගෙවනු නොලැබේ.

❖ ප්‍රමාද වී ලැබෙන සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

❖ වැඩිදුර තොරතුරු සඳහා www.external.sjp.ac.lk

❖ "2019-02-10 හා 2019-07-07 දිනැති පුවත්පත් දැන්වීමට අනුව මෙම උපාධි පාඨමාලාව සඳහා අයදුම් කර ඇති අපේක්ෂකයන් නැවත අයදුම් කිරීමට අවශ්‍ය නොවේ."

**ලේඛකාධිකාරී,**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.**

**තොරතුරු විමසීම්**

**බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය,**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,**
**ගංගොඩවිල,**
**නුගේගොඩ.**

**දුරකථන** : 112801481, 113132496, 112758233
**විද්‍යුත් ලිපිනය** : ext.certi@sjp.ac.lk

# සිළුමිණ රැකියා අවස්ථා


## ශ්‍රී ලංකා ජීවිතාරක්ෂක සංගමය (SLLS)

### මෙහෙයුම් ඇබෑර්තු කළමනාකරු

**කාර්යභාරය පිළිබඳව**

මෙහෙයුම් ප්‍රධානී ලෙස SLLS ක්‍රියාකාරිත්වයන් ව්‍යුහගත කිරීම, සැළසුම් කිරීම සහ මූලෝපායගත කිරීම පිළිබඳ මූලික කාර්යභාරයක් ඉටුකිරීම ඔබගෙන් අපේක්ෂා කෙරේ.

**සුදුසුකම් හා පළපුරුද්ද :**

- *MBA හෝ අදළ කේෂ්ත්‍රයේ මූලික උපාධියක්*
- *සමාන තනතුරක අවම වසර 5 – 7 ක සේවා පළපුරුද්ද*
- *ඉංග්‍රීසි බසෙහි විශිෂ්ට දැනුමක් (ද්වි භාෂා / ත්‍රෛයිභාෂා හැකියාව) අමතර සුදුසුකමක් වනු ඇත.)*

මෙම තනතුරෙහි කාර්යභාරය ඉටුකිරීමට ඔබට හැකියාව ඇති නම් කරුණාකර ආවරණ ලිපියක් සමග දින 7 ක්ඇතුළත යොමු කරන්න.

info@srilankalifesaving.lk

## වාහන විකිණීමට

| | | |
|---|---|---|
| **කාර්** | | |
| CP HD-XXXX | හොන්ඩා CIVIC 1493.00 CC | 1999 |
| NW KU-XXXX | ටොයෝටා DAA-ZVW30 1790.00 CC | 2010 |
| **ලොරි රථ** | | |
| NW LF-XXXX | ඉසුසු KK-NPR72LV 4980.00 CC | 2005 |
| CP LE-XXXX | සුසුකි LE-DA63T 650.00 CC | 2004 |
| EP PV-XXXX | ටාටා ACE EX 702.00 CC | 2013 |
| **ටිපර් රථ** | | |
| CP GF-XXXX | ටොයෝටා J05C 5300.00 CC | 1999 |
| **ට්‍රැක්ටර් රථ** | | |
| NW RE-XXXX | ටැෆේ 45DI 2500.00 CC | 2015 |
| **වෑන්** | | |
| NC JK-XXXX | සුබාරු SAMBAR 650.00 CC | 1999 |
| **ත්‍රීරෝද රථ** | | |
| NW QQ-XXXX | බජාජ් AUTO AR4S 173.50 CC | 2008 |
| CP YC-XXXX | බජාජ් AR 4 S 173.50 CC | 2010 |
| EP QK-XXXX | බජාජ් AUTO AR4S 173.00 CC | 2007 |
| CP YH-XXXX | බජාජ් RE 205 198.75 CC | 2010 |
| SP AAZ-XXXX | බජාජ් RE 198.88 CC | 2015 |
| CP YA-XXXX | බජාජ් AR4S UG 173.50 CC | 2010 |
| SG QO-XXXX | බජාජ් AUTO AR4 173.50 CC | 2008 |
| NC QQ-XXXX | බජාජ් AUTO AR4S 173.00 CC | 2008 |
| CP YG-XXXX | බජාජ් RE205 198.75 CC | 2010 |
| CP YD-XXXX | බජාජ් AR4S-UG 173.50 CC | 2010 |
| CP QQ-XXXX | බජාජ් AUTO AR 4S 173.50 CC | 2008 |

ඉහත වාහන පරීක්ෂා කිරීම උදේ 8.30 සිට සවස 5.00 දක්වා

විමසීම් - 0768578119, 0766851575 , 0775260124

diademDSM

කුරුණෑගල ඔටෝ ෆෙයාර්, නො.156/ B, කොළඹ පාර, වඳුරාගල, කුරුණෑගල කොමර්ෂල් ලීසිං වාහන අංගනයේදී.

CLC කොමර්ෂල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී

## සම්පූර්ණ ෆ්‍රන්ට් කැබින් සහ රීකන්ඩිෂන් ගියර් බොක්ස් සැපයීම සඳහා මිල ගණන් කැඳවීම

**LPA/07/2020**

"**ෆ්‍රන්ට් කැබින් සහ රීකන්ඩිෂන් ගියර් බොක්ස්**" සැපයීම සඳහා පහත දක්වා ඇති ආකාරයට මුද්‍ර, තැබූ මිල ගණන් කැඳවනු ලැබේ.

**01. ෆ්‍රන්ට් කැබින් (සම්පූර්ණ) - 01 ක් (වෑසි අලුත්වැඩියා සමග)**

පිරිවිතර:
ඉසුසු – NKR
දකුණෙන් පැදවීම
බ්‍රෑන්ඩ් නිව් මොඩ්ල් – 2006
12V
4JBI එන්ජිම
A/C නැත

**02. රීකන්ඩිෂන් ගියර් බොක්ස් - 01 ක්**

(සම්පූර්ණ එන්ජිම)
පිරිවිතර :
ඉසුසු – NMR
4 JBI එන්ජිම– බ්‍රෑන්ඩ් නිව් මොඩ්ල්
රිවෝඩ් NM

**පොදු කොන්දේසි :**

1. පිවිතර සහිත ලංසු, මුද්‍ර, තැබූ ලිපිකවරයක බහා එහි වම්පස ඉහළ කෙළවරේ "**ෆ්‍රන්ට් කැබින් සහ රීකන්ඩිෂන් ගියර් බොක්ස්**" ලෙස සඳහන් කර එවිය යුතුය.
2. ලංසු, ප්‍රසම්පාදන ප්‍රධානී වෙත 2020 ඔක්තෝබර් 07 වන දින ප.ව. 2.30 ට හෝ ඊට ප්‍රථම එවිය යුතුයි. වෙනම ලේඛන තිකුත් කරනු නොලැබේ. සැපයුම්කරුවන් විසින් තම අයදුම්පත්‍රය සකසා එවිය යුතුයි.
3. ලංසුවෙහි, සැපයීම් කළ හැකි සම්භාවී දිනය, මිලෙහි වලංගුතාවය, ගෙවීම් ක්‍රමය, ප්‍රවාහන ගාස්තු, VAT සහ අනෙකුත් බදු පැහැදිලිව සඳහන් කර එවිය යුතුය.

*ඕනෑම හෝ සියලුම ලංසු කිසිදු හේතු දැක්වීමකින් තොරව පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය සී/ස. එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම සතුවේ.*

**ප්‍රසම්පාදන ප්‍රධානී,**
**සී/ස. එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම,**
**නො. 35, ලේක්හවුස්, ඩී. ආර්. විජේවර්ධන මාවත,**
**කොළඹ 10.**

**විස්තර සඳහා : 2429422/ 2429451**



## 21 වැනි සියවසට එළඹෙන යෞවනයට නිරවුල් ගමන් මග

බුදුසරණ

## ගබඩා කාර්යාල සහායක - පිරිමි

**අවශ්‍ය සුදුසුකම්**

- වයස අවුරුදු 25 – 35 අතර
- අවම වශයෙන් අපොස සා/ පෙළ සුදුසුකම්
- සමාන තනතුරක අවම වශයෙන් වසර 1 ක පළපුරුද්ද
- සිංහල ලිවීමේ සහ කියවීමේ මනා සන්නිවේදන හැකියාව
- මූලික ඉංග්‍රීසි/ දෙමළ දැනුම අමතර සුදුසුකමක් වේ.
- කාර්යශූර, වේලාවට වැඩ කරන සහ විශ්වාසවන්තවීම
- මනා අන්තර් පුද්ගල හැකියාව සමග ප්‍රියමනාප පෞරුෂයක් තිබීම
- වලංගු රියදුරු යතුරු පැදි බලපත්‍රයක් තිබිය යුතුය.

**කරුණාකර ඔබගේ ජීවදත්ත ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ විස්තර සමග මෙම දැන්වීමෙන් දින 14 ක් ඇතුළත යොමු කරන්න.**

**කළමනාකරු**

**මානව සම්පත් හා පරිපාලන නෙට්සිස් සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්**

නො. 44A, ලියනගේ මාවත, විජිතපුර, පැලවත්ත, බත්තරමුල්ල. දුරකථන : 0112787300
ඊමේල් : careers@netsys.lk

## රැකියා ඇබෑර්තු

මාර්ග සංවර්ධන වැඩබිම්වල සේවය සඳහා පළපුරුදු සේවක මහතුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### • යන්ත්‍ර ක්‍රියාකරුවන්

♦ ලෝඩර් බැකෝ [JCB] ♦ මෝටර් ග්‍රේඩර්

ඉහත තනතුරු සඳහා වසර 03 කට නොඅඩු අදාල කෙෂ්ත්‍රයේ සේවා පළපුරුද්දක් තිබිය යුතුය. යන්ත්‍ර ක්‍රියාකරුවන් වලංගු බර වාහන රියදුරු බලපත්‍රයක් ලබා තිබිය යුතුය.

යන්ත්‍ර ක්‍රියාකරුවන් පිළිගත් ආයතනයක පුහුණුව ලබා තිබීම අමතර සුදුසුකමකි.

### • රියදුරන් (ට්‍රැක්ටර්)

වසර 03කට නොඅඩු අදාල කෙෂ්ත්‍රයේ සේවා පළපුරුද්දක් තිබිය යුතු අතර වලංගු බර වාහන රියදුරු බලපත්‍රයක් ලබා තිබිය යුතුය.

ඉහත තනතුරු සඳහා වයස අවුරුදු 50 නොයික්මවූ අය විය යුතුය.

අයදුම්කරුවන් ඒ සඳහා සේවා සහතිකපත්වල මුල් පිටපත්, ග්‍රාම නිලධාරී සහතිකය, ජාතික හැඳුනුම්පත, උප්පැන්න සහතිකය, වලංගු රියදුරු බලපත්‍රය සහ පාස්පෝට් ප්‍රමාණයේ වර්ණ ඡායාරූප 1 ක් සමග **2020 සැප්තැම්බර් මස 29, 30 සහ ඔක්තෝබර් 02** යන දිනයන්හිදී **පෙ.ව. 10.00 - ප.ව. 3.00** දක්වා පහත ලිපිනයට පැමිණෙන්න.

**විමසීම් : 011 - 4645765 (EXT. 431)**

**හොවෙල් කන්ස්ට්‍රක්ෂන් (පුද්) සමාගම**
245/47, පරණ අවිස්සාවේල්ල පාර, ඔරුගොඩවත්ත

## උප කොන්ත්‍රාත්කරුවන් අවශ්‍යයි

ගම්පහ වැලිවේරිය අවට මාර්ග සංවර්ධන ව්‍යාපෘතියක බෝක්කු, පැතිකාණු, පැතිබැම් ඉදිකිරීම් පිළිබඳ මනා දැනුමක් ඇති උප කොන්ත්‍රාත්කරුවන් අවශ්‍යයි.

CIDA ආයතනයේ (ICTAD) ලියාපදිංචි උප කොන්ත්‍රාත්කරුවන් වීම විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**පෙ.ව. 9.00 - ප.ව. 5.00 දක්වා විමසන්න**
**විමසීම්: 077 5990249, 071 2950447**

**හොවෙල් කන්ස්ට්‍රක්ෂන් (පුද්ගලික) සමාගම**
245/47, පරණ අවිස්සාවේල්ල පාර, ඔරුගොඩවත්ත

THE ORIGINAL DCSL ESTD 1913
DISTILLERIES COMPANY OF SRI LANKA PLC

## විකිණීමට

සමාගම සතු හොඳ තත්ත්වයෙන් නඩත්තු කරන ලද පහත දැක්වෙන වාහන විකිණීමට ඇත. (තනි පාවිච්චිය)

| වාහන අංකය | මාදිලිය |
|---|---|
| 31-3445 | ඩයිහට්සු (ජීප්) (ධාවන තත්වයේ නොමැත) |
| 42-3406 | ඉසුසු NPR 57 ලොරි රථය (ධාවන තත්වයේ නොමැත) |
| 42-0743 | ටාටා 1210 SE (සම්පූර්ණ බොඩිය සහිත ලොරි රථය) |
| KW-6103 | ටොයෝටා ප්‍රියස් - 2013 |
| KW-6104 | ටොයෝටා ප්‍රියස් - 2013 |
| KL-5557 | ටොයෝටා කොරොල්ලා 141- 2010 |

කොළඹ - 10, නොරිස් කැනල් පාරේ, අංක 110 දරණ ඩිස්ටිලරීස් කොම්පැනි ඔෆ් ශ්‍රී ලංකා පීඑල්සී යන ස්ථානයේදී සතියේ දිනවල පෙරවරු 8.00 සිට පස්වරු 5.00 දක්වා කාලය තුළ මෙම වාහන පරීක්ෂා කර බලා ලිඛිත මිල ගණන් ඉදිරිපත් කළ හැක.

**විමසීම් - රොෂාන්ත් පෙරේරා**
ප්‍රවාහන කළමනාකරු
දුරකථන: 2687801, 2695295-7, 5507000


## ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය

**මුදල් අමාත්‍යාංශය සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා ඌන උපයෝජන රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**

### ඇබෑර්තු

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් ස්ථිර තනතුර සඳහා මූලික සුදුසුකම් සපුරා ඇති පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### සාමාන්‍යාධිකාරී තනතුර – 01

**සුදුසුකම් ( පහත සුදුසුකම් 1 හෝ 2)**

1. කළමනාකරණය / ව්‍යාපාර පරිපාලනය / වාණිජ්‍යය / ආර්ථික විද්‍යාව / නීතිය යන විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම **සමඟ**

   අදාළ ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම/ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නාවූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම **සහ**

   රජයේ සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහළොව (15)ක පළපුරුද්දක් ලබා තිබීම. (මින් අවම වශයෙන් වසර 03ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුයි)

2. තනතුරට අදළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම **සහ**

   රජයේ රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් අදළ ක්ෂේත්‍රයේ වසර (15) ක පළපුරුද්දක් ලබා තිබීම.(මින් අවම වශයෙන් වසර 03ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුයි.)

**අතිරේක සුදුසුකම්**

1. ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කිරීමේ හැකියාව
2. පරිගණක භාවිතය පිළිබඳ දැනුම හා ඒ පිළිබඳ වෘත්තීය අධ්‍යාපන සුදුසුකම් තිබීම

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සුදුසුකම් (පහත සඳහන් 1 හෝ 2 සපුරා තිබිය යුතුයි.)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සේවාගණයේ (HM 1-1) වසර 03ක සතුටුදයක සේවා කාලය සම්පූර්ණ කර තිබීම.

**වයස් සීමාව** : අවුරුදු 35ට නොඅඩු හා අවු. 55ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**වැටුප් ක්‍රමය** : 2016.04.25 දිනැති 02/2016 කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව 2020 සිට තනතුරට හිමි වැටුප් පරිමාණය HM 1-3 2016 රු.86,865-15x2270-120,915 ක් වේ.

**බඳවා ගැනීමේදී වැටුප් තලය** : රු.86,865.00 හා රජයේ අනුමත වෙනත් දීමනා ගෙවනු ලැබේ.

**පහසුකම් හා වෙනත් දීමනා** :

ප්‍රවාහන පහසුකම් – රියදුරු සහිත වෙන්කළ වාහනය හා මාසික ඉන්ධන ලීටර් 150 කට සමාන දීමනාවක් හෝ රථවාහන දීමනාව හා ඉන්ධන දීමනාවක් හිමිවේ.

දුරකථන පහසුකම් – මාසික කාර්යාලයීය දුරකථනය, ජංගම දුරකථනය හා නිවස සඳහා රු.10,000.00ක මුදලක්ද හිමි වේ.

රජය මගින් අනුමත වෙනත් දීමනා ද හිමිවේ.

### සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය) – 01

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් (පහත සඳහන් 1 හෝ 2)**

01. ගිණුම්කරණය / කළමනාකරණය / වාණිජ්‍යවේදී / ව්‍යාපාර කළමනාකරණය / රාජ්‍ය කළමනාකරණය යන විෂය ක්ෂේත්‍රයකින් ලබාගත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම. **සහ**

    උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්ද ලබා තිබීම.

02. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ (ICASL)ආවසරික සහතිකය හෝ මධ්‍ය පරීක්ෂණයෙන් සමත් සහතිකය / (CIMA/ACCA)හි වෘත්තීය I මට්ටමේ සමත් සහතිකය හෝ ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා සහතිකය සමග අදළ සුදුසුකම් ලබාගැනීමෙන් පසු ගිණුම්කරණ / විගණන ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 01 ක පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

**සුදුසුකම් (පහත සඳහන් 1 හෝ 2)**

01. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම. **හෝ**
02. කනිෂ්ඨ කළමනාකාර (JM) සේවා ගණයේ අදළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05 සතුටුදයක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස් සීමාව** : අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදළ නොවේ.

**වැටුප් ක්‍රමය** : 2016.04.25 දිනැති 02/2016 කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව 2020 සිට තනතුරට හිමි වැටුප් ප්‍රමාණය MM 1-1 2016 – රු. 53,175 – 10X1375 – 15X1910 – රු. 95,575.00 ක් වේ. බඳවා ගැනීමේ දී වැටුප් තලය රු. 53,175.00 වේ.

**පහසුකම් හා වෙනත් දීමනා** : දුරකථන පහසුකම් – මාසික කාර්යාලයීය දුරකථන, ජංගම දුරකථනය හා නිවස සඳහා රු. 5,000.00 ක මුදලක් ද හිමි වේ.

**වෙනත් දීමනා** : රජය මගින් අනුමත දීමනා හිමි වේ.

### සම්බන්ධීකරණ නිලධාරී තනතුරු – 08

**සුදුසුකම්**

අලෙවිකරණය/ කළමනාකරණය/ වාණිජ්‍යය/ ආර්ථික විද්‍යාව/ සංඛ්‍යානය/ සමාජ විද්‍යාව/ සමාජ වැඩ/ ප්‍රජා විද්‍යාව ඇතුළත් විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

**වයස් සීමාව** : අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදළ නොවේ.

**වැටුප් ක්‍රමය** : 2016.04.25 දිනැති 02/2016 කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව 2020 සිට ඔබේ තනතුරට හිමි වැටුප් ප්‍රමාණය MA -3 (2016) – රු. 32,200–10X445–11X660–10X730–5X750–54,960ක් වේ.

**බඳවා ගැනීමේ දී වැටුප් තලය** : රු. 32,200.00 වේ.

**වෙනත් දීමනා** : රජය මගින් අනුමත දීමනා හිමි වේ. (සැලකිය යුතුයි – කොළඹ, ගම්පහ, රත්නපුරය, අනුරාධපුරය, පොළොන්නරුව, වවුනියාව, කිලිනොච්චිය හා යාපනය යන දිස්ත්‍රික්වල අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.)

**පොදු කොන්දේසි (සියලුම තනතුරු සඳහා)**

**සෑම ඉල්ලුම්කරුවකුම**

- ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
- තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
- විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
- සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම හෝ සිංහල / ද්‍රවිඩ සමග ඉංග්‍රීසි භාෂාවන්ගෙන් වැඩ කිරීමේ හැකියාව සහ පරිගණක භාවිතය පිළිබඳ දැනුම සහිත අයදුම්කරුවන්ට විශේෂ සැලකිල්ල දෙනු ලැබේ.
- සුදුසුකම්වලට අදළ සියලුම සහතිකපත්වල පිටපත් සාමදාන විනිශ්චයකාරවරයෙකු විසින් සත්‍ය පිටපත් බවට සහතික කර අයදුම්පත්‍රය සමඟ එවිය යුතුය.
- උපරිම සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබා දී සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.
- සිංහල හෝ ද්‍රවිඩ සමග ඉංග්‍රීසි භාෂාවෙන් ඉදිරිපත් කිරීම් (Powerpoint Presentations) සාර්ථකව සහ ආකර්ෂණීයව කළ හැකි අයදුම්කරුවන්ට විශේෂ සැලකිල්ල දෙනු ලැබේ.
- 2020 වර්ෂයේ රජයේ අභ්‍යාසලාභී උපාධිධාරී පුහුණුව ලබන්නන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ. 2020 වර්ෂයේ පුහුණුව නොලබන බවට දිවුරුම් ප්‍රකාශයක් අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතුය.

මෙම තනතුර ස්ථිරය. සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදලට දයක විය යුතුය. වසර තුනක පරිවාස කාලයකින් පසු සේවය ස්ථිර කරනු ලැබේ. තමන් පිළිබඳ විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනකුගේ නම් හා ලිපිනයද සහිතව ඔබ විසින් සකස් කරනු ලැබූ අයදුම්පතක් සුදුසුකම් වලට අදළ සහතිකපත්වල සහතික කරන ලද පිටපත් සමග 2020.10.12 දිනට පෙර "**සභාපති, ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය, අංක 18, රාජගිරිය පාර, රාජගිරිය**" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ප්‍රධාන කාර්යාලයේ පාලන අංශය වෙත ගෙනවිත් බාරදීම කළ යුතුය. දැනටමත් රාජ්‍ය අංශයේ හෝ ව්‍යවස්ථාපිත ආයතනවල සේවය කරන අයදුම්කරුවන් ආයතන ප්‍රධානියා මගින් අයදුම්කළ යුතුය. අයදුම්පත එවන ලිපි කවරයේ වම් ඉහළ කෙළවරෙහි **අයදුම්කරනු ලබන තනතුර** සඳහන් කර තිබිය යුතුය. වැඩිදුර තොරතුරු www.ssb.gov.lk වෙබ් අඩවියෙන් ලබාගත හැකිය.

**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සමන් හඳරාගම**
**B.A. (Special) Sociology (Hons) (CMB), MA in Sociology (CMB), CTHE (CMB).**
**සභාපති,**
**ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය,**
**"සමාජ ආරක්ෂණ පියස",**
**අංක 18, රාජගිරිය පාර, රාජගිරිය.**
**2020.09.27**

# වනඅලි - මිනිස් ගැටුම අවම කිරීමට අදාළ යෝජනා සකස් කිරීමේ විශේෂ කමිටුව

වනඅලි – මිනිස් ගැටුම අවම කිරීමට පත්කොට ඇති ජාතික කමිටුව විසින් ඒ සඳහා වන ප්‍රායෝගික සහ තිරසර යෝජනා / අදහස් ජාතික, පළාත්, ප්‍රාදේශීය ස්ථරවල මහජන නියෝජිතයන්, රාජ්‍ය නිලධාරීන්, සිවිල් සංවිධාන සහ පුරවැසියන්ගෙන් කැඳවනු ලැබේ.

මේ වන විටත් **"රැකගමු අලි සම්පත සුරකිමු මිනිස් ජීවිත"** මැයෙන් 2018.07.12 දින ලංකාදීප පුවත්පතේ පළවූ නිවේදනය ප්‍රකාරව යෝජනා / අදහස් ලබාදී ඇත්නම් නැවත එසේ කළයුතු නොවේ.

ඔබගේ සියලු යෝජනා තිරසර මෙන්ම රට තුළ ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළහැකි මට්ටමේ ඒවා විය යුතු වේ. පත්කොට ඇති කමිටුව විසින් එම යෝජනාවල ප්‍රායෝගික තත්ත්වයන් අධ්‍යයනය කොට ජාතික සැලැස්මක් සැකසීමේදී සැලකිල්ලට ගනු ඇත.

ඔබගේ සියලු යෝජනා / අදහස් පහත ක්‍රමවේදවලින් එකක් උපයෝගී කර ගනිමින් කමිටුව වෙත 2020.10.02 සිකුරාදා දිනට පෙර ලබා දිය හැක.

**ලිපිනය** : වනඅලි මිනිස් ගැටම අවම කිරීමේ ජාතික කමිටුව,
වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය,
අංක 1090, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය.

**විද්‍යුත් ලිපිනය** : adsecdev@msdw.gov.lk

**ෆැක්ස්** : 011-2879063

**වට්ස් ඇප් අංකය** : 076 2875900

2020.09.30 වන බදාදා අමාත්‍යාංශයේ පැවැත්වෙන පාර්ශ්වකරුවන්ගේ විශේෂ සාකච්ඡාවට ඔබගේ අදහස් ඉදිරිපත් කරන්නේ නම් ඒ සඳහා පහත දුරකථන අංක අමතා ඔබගේ තොරතුරු ලබාදී ලියාපදිංචි විය හැක.

**දුරකථන අංක** : 077 1380378 / 077 7335767

තිරසර සංවර්ධනයක් සඳහා "සෞභාග්‍යයේ දැක්ම" යථාවත් කරමින් රට ඉදිරියට යන ගමනේදී ඔබගේ වටිනා දායකත්වය ඉතා වැදගත් වේ.

**ජී.එල්. වර්නන් පෙරේරා**
**ලේකම්,**
**වනඅලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා ජාතික ක්‍රියාකාරී සැලසුමක් සැකසීමේ**
**ජනාධිපති කමිටුව,**
**වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය,**
**අංක 1090, ශ්‍රී ජයර්ධනපුර මාවත, රාජගිරිය.**

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව

SPMC

## ආහාර සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2020/2021

සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ පවතින රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව ශ්‍රී ලාංකිකයන්ගේ ඖෂධ අවශ්‍යතාවය සැපයීම අරමුණ කරගෙන දේශීයව ඖෂධ නිෂ්පාදනය කිරීමෙහි යෙදී සිටී.

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ 350 ක් පමණ වන සේවකයන්ගේ සුබසාධනය වෙනුවෙන් උදෑසන, දිවා, රාත්‍රී හා සවස කෙටි ආහාර සැපයීම සඳහා ලියාපදිංචි වීමට අපේක්ෂිත රජයට අයත් ව්‍යාපාර ආයතන, පිළිගත් සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. මූලික ලියාපදිංචියෙන් පසුව එම ආයතනවලින් ලංසු කැඳවනු ලැබේ.

### ආදර්ශ ආකෘති පත්‍රය

**ආහාර සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත 2020 - 2021**

1. ව්‍යාපාරික නාමය හා ලිපිනය : ..........
2. ලියාපදිංචි අංකය හා දිනය : ..........
(ලියාපදිංචි සහතිකයේ පිටපතක් අමුණන්න)
3. අයිතිකරුවන්ගේ නම් හා ලිපිනයන්: ..........
4. දුරකථන සහ ෆැක්ස් අංකය : ..........
5. පෙර ආහාර සපයන ලද ආයතන : ..........
6. සංස්ථාවට ලබාදිය හැකි ණය පහසුකම් : කාල සීමාව : .......... වටිනාකම : ..........

නම : ..........
අත්සන : ..........
තනතුර : ..........
දිනය : ..........

ප්‍රතිචාර දක්වූ සැපයුම්කරුවන් ඇගයීමේදී පහත සඳහන් නිර්ණායකයන් වලට ද ලබාගන්නා ලකුණු ප්‍රමාණය මත තෝරාගත් අයදුම්කරුවන්ගෙන් ලංසු කැඳවනු ලැබේ.

| | නිර්ණායකය | ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01. | දිවා ආහාරය බුෆේ හෝ පාසල් ක්‍රමයට සැපයීමේ හැකියාව | 20% |
| 02. | උදේ සහ රාත්‍රී ආහාර පාසල් ක්‍රමයට සැපයීමේ හැකියාව | 05% |
| 03. | වර්තමාන / පෙර ආහාර සපයන ලද ආයතන මගින් දක්වූ ප්‍රතිචාරයන් | 20% |
| 04. | මුළුතැන්ගෙයි පිරිසිදු භාවය | 25% |
| 05. | අමුද්‍රව්‍ය ගබඩාවේ පිරිසිදු භාවය | 25%. |
| 06. | සංස්ථාවේ සිට ඇති දුර කි.මී. | (0 -10)-5%, (10-15) -2%, above 15 - 0% |

සියලුම අයදුම්පත්, කවරයේ වම්පස ඉහළින් **"ආහාර සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම"** යනුවෙන් සඳහන් කර 2020 ඔක්තෝබර් මස 12 වන දින ප.ව. 2.00 හෝ ඊට පෙර සභාපති වෙත ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.

වැඩිදුර විස්තර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – සැලසුම් හා ප්‍රසම්පාදන වෙතින් ලබාගත හැකිය.
(දුරකථන : 2637574/ 2635353/ 2623298)

**සභාපති,**
**ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව,**
**නො.11, සර් ජෝන් කොතලාවල මාවත,**
**කඳවල වත්ත- රත්මලාන.**

# ප්‍රසම්පාදන දැන්වීම

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව සඳහා භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය

01. ශ්‍රී ලංකා ගුවන් හමුදා ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් පහත සඳහන් භාණ්ඩ හා සේවාව සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

| අනු අංක | ටෙන්ඩර් අනන්‍යතා අංකය | විස්තරය | ලංසු නිකුත් කරනු ලබන දිනය සහ වේලාව | ලංසු අවසන්වන / විවෘත කරන දිනය සහ වේලාව | නැවත නොගෙවනු ලබන ලංසු ගාස්තුව (රු.) |
|---|---|---|---|---|---|
| 01. | AHQ/20/PUB/ MIS/1008 | 2021 වාර්ෂික කොන්ත්‍රාත් පදනම මත අපනයන ගුවන් භාණ්ඩ බාහලන ලී පෙට්ටි හා කන්ටේනර් බහාලුම්වලට දුම් ගැසීම සඳහා ධූමායන සේවාවක් ලබාගැනීම | 2020 සැප්තැම්බර් 28 | 2020 ඔක්තෝබර් 19 පැය 1030 | 2,000/- |
| 02. | AHQ/20/PUB/ E/1007 | ගුවන් සේවා සඳහා ඉන්ධන ට්‍රේලර් බවුසරයක් මිලදී ගැනීම (ලීටර් 2000) | 2020 සැප්තැම්බර් 28 | 2020 ඔක්තෝබර් 19 පැය 1030 | 3,500/- |

02. ලංසු කැඳවීම ජාතික ලංසුකරණ පටිපාටිය අනුව සිදුකෙරෙන අතර පළමු ජේදයේ සඳහන් අනු අංක 02 ලෙස දක්වා ඇති ප්‍රසම්පාදනය සඳහා ද්විත්ව ලියුම් කවර ක්‍රමය භාවිතා කළ යුතු වේ.

03. මේ සදහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් හට ශ්‍රී ලංකා ගුවන් හමුදා www.airforce.lk වෙබ් අඩවියෙහි පළකර ඇති ලංසු ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව 2020 සැප්තැම්බර් මස 28 දින සිට 2020 ඔක්තෝබර් මස 16 දින දක්වා සතියේ වැඩ කරන දිනවලදී 1000 පැයේ සිට 1400 පැය දක්වා කාලය තුළ එක් එක් ප්‍රසම්පාදනයක් සඳහා නැවත නොගෙවනු ලබන ලංසු ගාස්තුවක් කොළඹ, ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුරේ සරප් වෙත ගෙවීමෙන් පසු ශ්‍රී ලංකා ගුවන් හමුදා ප්‍රසම්පාදන අංශයේ (ලංසු අංශය) ඉංග්‍රීසි භාෂාවෙන් මුද්‍රිත ලංසු පත්‍රිකා කට්ටලයක් ලබාගත හැක. ගෙවීම් සිදුකිරීමෙන් තොරව එවනු ලබන ලංසු භාරගනු නොලැබේ.

04. මුද්‍රා තබන ලද ලංසු පිටපත් දෙකකින් යුක්තව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වෙත ලංසු අවසන් දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ප්‍රධාන ආරක්ෂක මැදිරියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට ද බහාලීම කළ හැක. ප්‍රමාද වී ලැබෙන ලංසු භාරගනු නොලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම එකී ලංසු විවෘත කරනු ලැබේ. ජාතික හැඳුනුම්පත සහ සේව්‍යයාගේ බලය පැවරූ ලිපියක් ඉදිරිපත්කිරීම මත ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ බල ලත් නියෝජිතයින්ට ටෙන්ඩර් විවෘත කිරීමේ අවස්ථාවට සහභාගිවීමට අවසර දෙනු ලැබේ. ලංසු විවෘත කරන වේලාවට පසුව පැමිණෙන කිසිදු ටෙන්ඩර්කරුවකුට හෝ ඔවුන්ගේ නියෝජිතයකුට ලංසු විවෘත කිරීමේ අවස්ථාවට සහභාගි විය නොහැක.

05. ප්‍රසම්පාදනයට හා අවශ්‍ය සේවාව සඳහා විශේෂ කොන්දේසි සෑම ලංසු ලේඛනයකම දක්වා ඇත. සේවාව සඳහා අදාළ මිල ගණන්, සෑම භාණ්ඩය/ සේවාව සඳහා වෙන වෙනම මිල ගණන් ලැයිස්තුවේ පමණක් දැක්විය යුතුය. එක් එක් ලංසුකරුවකු විසින්ම මිල ලැයිස්තුවේ දක්වා ඇති මිල ගණන් 2021 දෙසැම්බර් 31 දින දක්වා වලංගු වන අතර, ඕනෑම ගිණුමක් මත විචල්‍යයකට යටත් නොකළ යුතුය.

06. අපේක්ෂිත ලංසුකරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන මිල ගණන් සඳහා වැට් බදු ඇතුළු සියලු බදු සහ අනෙකුත් ගාස්තු ද සමග ඔවුන්ගේ සියලු වියදම් ඇතුළත් කළ යුතු බවට ඔවුන් දැනුවත්ව සිටිය යුතුය.

07. මේ පිළිබඳ වැඩිදුර විස්තර පහත දුරකථන අංකවලට අදාළ නිලධාරීන් ඇමතීමෙන් ලබාගත හැක. ප්‍රධාන ප්‍රසම්පාදන නිලධාරී (දුරකථන : 011-2325468) හෝ ප්‍රසම්පාදන නිලධාරී (ටෙන්ඩර්) (011-2441553 හෝ 011-2441044 දිගුව 23569 ෆැක්ස් අංකः 011-2441553 සහ 011-2347694).

08. ඉහත සියලු කරුණු සඳහා පහත දැක්වෙන ලිපිනය භාවිතා කළ හැක.

ශ්‍රී ලංකා ගුවන් හමුදව
අංක 140,
සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 2.

**ගුවන් හමුද මූලස්ථානය**
තැ.පෙ. 1592,
කොළඹ 2.

**ගුවන් හමුදාධිපති**

# ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ඉංජිනේරු බළකාය විසින් භාවිත කරන ලද මෙටල් ක්‍රෂර් යන්ත්‍රය ටෙන්ඩර් ක්‍රියාවලිය මගින් අත්පිට මුදලට විකිණීම සඳහා මිල ගණන්පත් කැඳවීම

1. ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ ඉංජිනේරු බළකාය විසින් භාවිත කරන ලද දැනට ත්‍රිකුණාමල – සාම්පූර් ප්‍රදේශයේ යුහ මැටල් ක්‍රෂර් ව්‍යාපෘතිය මූතූර් පච්චනූර් යන ලිපිනයෙහි සවිකර ඇති **ජෝ ක්‍රෂර් 01 ක් සහ කෝන් ක්‍රෂර් 02 කින් සමන්විත චීනයෙහි නිෂ්පාදිත මෙටල් ක්‍රෂර් යන්ත්‍රය** හා එයට අදළ උපාංග ටෙන්ඩර් ක්‍රියාවලිය මගින් අත්පිට මුදලට විකිණීම සඳහා මිත් මිල ගණන් පත් කැඳවනු ලැබේ.
2. ටෙන්ඩර් ක්‍රියාවලිය සඳහා ඉදිරිපත් කර ඇති **යන්ත්‍රය පරීක්ෂා කිරීම සඳහා වන කාලසීමාව වනුයේ 2020 සැප්තැම්බර් මස 27 වන දින 1000 පැයේ සිට 2020 ඔක්තෝබර් මස 11 දින 1600 පැය දක්වා පමණක් වේ.** (සතිඅන්ත නිවාඩු දින හැර)
3. සියලුම මිල ගණන් පත් අවම වශයෙන් ඒවා විවෘත කරන දින සිට දින 90 ක් ඉදිරියට වලංගු විය යුතුය.
4. ටෙන්ඩර් අයදුම්පත් ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු කාර්යාලය, යුද්ධ හමුද මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර, කොළඹ යන ස්ථානයෙන් **2020 සැප්තැම්බර් මස 27 වන දින 1000 පැයේ සිට 2020 ඔක්තෝබර් මස 04 දින 1600 පැය** දක්වා ලබාගත හැක. (සතිඅන්ත නිවාඩු දින හැර)
5. මෙම මෙටල් ක්‍රෂර් යන්ත්‍රයේ ක්‍රියාකාරීත්වය පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය බලශක්තිය ටෙන්ඩර් ඉල්ලුම්කරුවන් විසින් වැය දරා සපයාගත යුතුය.
6. **2020 සැප්තැම්බර් මස 27 වන දින 1000 පැයේ සිට 2020 ඔක්තෝබර් මස 12 දින 1000 පැය** දක්වා අයදුම්පත් ඉදිරිපත් කළ හැකි අතර, ප්‍රමාදවී ලැබෙන සියලු අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබයි.
7. ඉදිරිපත් කරනු ලබන මිල ගණන් පත් සඳහා ලංසුවේ මුළු වටිනාකමින් 2% ක වටිනාකමකින් යුත් බැංකු ඇපකරයක්/ සුරක්ෂණ සහතිකයක් (BID BOND) ඉදිරිපත් කළ යුතු අතර, එම බැංකු ඇපකරය / සුරක්ෂණ සහතිකය මිල ගණන් විවෘත කරන දිනයේ සිට දින 120 ක් වලංගුව පැවතිය යුතුයි. **(ඇපකරය / සුරක්ෂණ සහතිකය ඉදිරිපත් නොකරන ටෙන්ඩර් අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ)**
8. ඉදිරිපත් කර ඇති මිල ගණන් අතුරින් රජයේ **තක්සේරු කරන ලද වටිනාකමට වඩා වැඩිම මිල ගණන් ඉදිරිපත් කර ඇති ගැනුම්කරු හට ටෙන්ඩරය ප්‍රදානය කරනු ලැබේ.** තෝරාගත් ගැනුම්කරු විසින් ටෙන්ඩරය ප්‍රදානය කළ දින සිට දින 07 ක් ඇතුළත සම්පූර්ණ මුදල එකවර ගෙවිය යුතුය. එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් දෙවෙනි වැඩිම මිල ගණන් ඉදිරිපත් කර ඇති ගැනුම්කරුට ටෙන්ඩරය ප්‍රදානය කරනු ලැබේ. **දෙවෙනි වැඩිම මිල ගණන් ඉදිරිපත් කර ඇති ගැනුම්කරුද දින 07 ක කාලයක් තුළදී සම්පූර්ණ මුදල එකවර ගෙවිය යුතුය.**
9. **මුදල් ගෙවා දින 14 ක් තුළ මෙටල් ක්‍රෂර් යන්ත්‍රය සවිකර ඇති භූමියෙන් එය ඉවත්කරගෙන යා යුතුය.** ඒ සඳහා වන සියලු පිරිවැය ගැනුම්කරු විසින් දැරිය යුතුය.
10. ටෙන්ඩර් අයදුම්පත් පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැල මගින් ඉදිරිපත් කිරීමට හෝ යුද්ධ හමුද මූලස්ථානය ශ්‍රී ජයවර්ධනපුරහි නැගෙනහිර පිවිසුම තුළ ඇති ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු කාර්යාලයට (ප්‍රක්ෂේඉකා) අයත් පොතෙහි සටහන් තබා ප්‍රක්ෂේඉකා ටෙන්ඩර් බහාලීම සඳහා ඇති පෙට්ටිය වෙත බහාලිය යුතුය.
**ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු කාර්යාලය,**
**යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර, කොළඹ.**
11. **2020 ඔක්තෝබර් මස 12 දින 1030 පැයට ජේද අංක 10 හි දක්වා** ඇති ලිපිනයට අදළ ස්ථානයෙහිදී ටෙන්ඩරය විවෘත කරන අතර, අයදුම්පත් විවෘත කරන අවස්ථාව සඳහා අනන්‍යතාවය සහතික කළ හැකි ජාතික හැඳුනුම්පත/විදේශ ගමන් බලපත්‍රය/රියදුරු බලපත්‍රය සහිතව ගැනුම්කරු හෝ ගැනුම්කරු සහභාගී නොවන්නේ නම් ඔහු වෙනුවට බලය පවරන ලද නීත්‍යානුකූල ලිපියක් සහිතව නියෝජිතයෙකු අනිවාර්යයෙන්ම සහභාගී කරවීමට ක්‍රියා කළ යුතුය.
12. ටෙන්ඩර් ක්‍රියාවලිය සඳහා අසාධු ලේඛන ගත කර ඇති අයවළුන් හට ඉදිරිපත් විය නොහැක.
13. **ටෙන්ඩරය පිළිබඳ අවසන් තීරණය ටෙන්ඩර් මණ්ඩල සභාපති සතුවේ. මේ පිළිබඳ වැඩි විස්තර දුරකථන අංක 0114-051062/0113-601950 වෙතින් කාර්යාල වේලාවන් තුළදී (සතිඅන්ත නිවාඩු දින හැර) ලබාගත හැකිය.**

**යුද්ධ හමුදාධිපති**

1950 සිට දිනපතා සහ සතිපතා පත්‍රවල පළවූ හා පළනොව ඡායාරූපවල දළ සේයාපට පුස්තකාලයේ තැන්පත් කර ඇත. ඔබටත් ඡායාරූප ලබාගැනීමට අවශ්‍ය නම් පුවත්පතේ නම, දිනය සහ ඡායාරූපයේ විස්තර සඳහන් කොට ලියා හෝ පැමිණ විමසන්න.

පුස්තකාලයාධිපති
දුරකථන
(011) 2 242 9491

LAKE HOUSE

සත වෙත සිරිසෙත සලසන සතිපත

දෝ සතර
වෙද සතර
දත් නොදත්
කාටත්
මහඟු මිණකි

සුබසෙත
සත වෙත සිරිසෙත සලසන සතිපත

# කොළඹ විශ්වවිද්‍යාලය

## ප්‍රසම්පාදන දැන්වීම

## කොළඹ විශ්වවිද්‍යාලයේ භාවිතය සඳහා මගී වාහන කුලී පදනම මත ලබාගැනීම

SAB/SUP/NCB/2020/07

කොළඹ 03, කොළඹ විශ්වවිද්‍යාලයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු (ප්‍රධාන) සභාපති විසින් පහත විස්තර කර ඇති ආකාරයට මගී වාහන කුලී පදනම මත ලබාගැනීමට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වාහන කුලියට ලබාදෙන සමාගම් හෝ ශ්‍රී ලංකාවේ වාහන හිමිකරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

- **මෝටර් රථ 01**
- **මගී වෑන් රථ 02 (ආසන 15)**

01. ලංසු තැබීම ජාතික තරගකාරී ලංසුකරණ පටිපාටියට (NCB) අනුව සිදුකෙරෙනු ලැබේ.

02. ලංසුකරු ලියාපදිංචි වාහන හිමිකරුවකු හෝ වාහන කුලී පදනම මත ලබාදෙන ආයතනයක් විය යුතුයි.

03. අභිලාෂී යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන් හට මේ පිළිබඳව වැඩිදුර විස්තර, කොළඹ විශ්වවිද්‍යාලයේ සැපයුම් අංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී වෙතින් ලබාගත හැකි අතර, ලංසු ලේඛන පරීක්ෂාව විශ්වවිද්‍යාලයේ සැපයුම් අංශයේදී 2020-09-28 දින සිට 2020-10-21 දින දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 3.30 දක්වා සිදුකළ හැක. (දු.ක. 0112-055498/ 2158097)

04. අභිලාෂී ලංසුකරුවන්හට ඉංග්‍රීසි භාෂාවෙන් මුද්‍රිත සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් කොළඹ විශ්වවිද්‍යාලයේ, සැපයුම් අංශයේ, ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී වෙත ලිඛිත අයදුම්පත්‍රයක් සහ නැවත නොගෙවන රු. 1,500/- ක ගාස්තුවක් ගෙවීම මගින් ලබාගත හැක. ලංසු ලේඛන 2020-09-28 දින සිට 2020-10-21 දින ප.ව. 2.30 දක්වා ලබාගත හැක. නැවත නොගෙවන ගාස්තුව, ඕනෑම මහජන බැංකුව ශාඛාවකින්, යොමු අංක 505170600013 භාවිත කරමින් තිඹිරිගස්යාය මහජන බැංකු ශාඛාවේ, කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන රැස්කිරීම් ගිණුම වෙත බැරකළ හැකිය.

05. ලංසු අනුපිටපත් සමග පහත ලිපිනයට 2020-10-22 දින ප.ව. 2.30 ට හෝ ඊට පෙර ගෙනැවිත් භාරදිය යුතුය. කරුණාකර ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ "**කොළඹ විශ්වවිද්‍යාලයේ භාවිතය සඳහා මගී වාහන කුලී පදනම මත ලබාගැනීම** - SAB/SUP/NCB/**2020/07**" ලෙස සඳහන් කර එවන්න.

06. සෑම ලංසුවක්ම, පහත වගුවේ සඳහන් පරිදි උපකුලපති, කොළඹ විශ්වවිද්‍යාලය නමට ලංසු සුරක්ෂණයක් සහිතව එවිය යුතුය.

| පැකේජ අංකය | අයිතම | ලංසු සුරක්ෂණය |
|---|---|---|
| 01 | මෝටර් රථ - 01 | එක් වාහනයක් සඳහා රුපියල් විසිදහසක් (රු. 20,000/-) |
| 02 | මගී වෑන් රථ - 02 | එක් වාහනයක් සඳහා රුපියල් විසිදහසක් (රු. 20,000/-) |

07. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප වේ. ලංසු, කොළඹ විශ්වවිද්‍යාලයේ, කොලේජ් හවුස්, ලේඛකාධිකාරී කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ ලියාපදිංචි තැපෑලෙන් අවසාන දිනයට පෙර ලැබෙන සේ පහත ලිපිනයට එවිය යුතුයි. ලංසු, 2020-10-22 දින ප.ව. 2.30 ට එදිනට පැමිණෙන ලංසුකරුන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් ඉදිරියේ දී විවෘත කෙරෙනු ලැබේ.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),**
**කොළඹ විශ්වවිද්‍යාලය, 94, කුමාරතුංග මුණිදාස මාවත, කොළඹ 03.**

# ජාතික තරුණ සේවා සභාව

තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

## YWT ජාතික ශ්‍රම ශක්ති ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති සඳහා මුදල් ලබා දීම

ජාතික තරුණ සේවා සභාව විසින් පසුගිය කාල වකවානුවේදී ක්‍රියාත්මක කර ඇති YWT තුරුණු ශ්‍රම ශක්ති ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති වල තත්වය හා එම ව්‍යාපෘති වෙනුවෙන් තව දුරටත් ගෙවීමට ඇති මුදල් පිළිබඳ හා අක්‍රමිකතා සොයා බලා නිර්දේශ ලබා දීමට ජාතික තරුණ සේවා සභාව විසින් ත්‍රිපුද්ගල කමිටුවක් පත්කර ඇත.

ඒ අනුව ඔබ ප්‍රදේශයේ මෙම ව්‍යාපෘතියට අදාලව සිදුකර ඇති සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් ගැටළු පවතී නම් නොපමාව ජාතික තරුණ සේවා සභාවේ දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂ හමු වී ලිඛිතව තොරතුරු ලබා දෙන්න.

නොඑසේ නම් ''ජාතික තරුණ සේවා සභාව, තැ.පෙ අංක 17, මහරගම'' ලිපිනයට තැපැල් කළ යුතු අතර, ලිපි යොමු කිරීමේදී ලිපියේ වම්පස උඩ කෙලවර ''YWT තුරුණු ශ්‍රම ශක්ති ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති'' යනුවෙන් පැහැදිලිව සටහන් කරන්න.

■ අදාල තොරතුරු බාර ගන්නා අවසාන දිනය :- 2020.10.10

වැඩි විස්තර සඳහා www.nysc.lk වෙත පිවිස ලබා ගත හැකිය.

අධ්‍යක්ෂ ජනරාල්/සභාපති,
ජාතික තරුණ සේවා සභාව,
අංක 65, හයිලෙවල් පාර,
මහරගම.

**වැවිලි අමාත්‍යාංශය**

# ශ්‍රී ලංකා තේ මණ්ඩලය

# සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම - 2021

2021 වසර තුළ, කොළඹ 3, ගාලු පාරේ, අංක 574 හි, ශ්‍රී ලංකා තේ මණ්ඩලය සඳහා පහත සඳහන් භාණ්ඩ සහ සේවාවන් සැපයීම සඳහා තමන් ලියාපදිංචි වීමට කැමැති, (ශ්‍රී ලංකා තේ මණ්ඩලය හා සමග) නිෂ්පාදකයන්, සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන් වෙතින් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

| අංකය | උප ශ්‍රේණිය අංකය | |
|---|---|---|
| | | **ප්‍රවර්ධන ද්‍රව්‍ය සැපයීම හා මුද්‍රණය කිරීම සඳහා වන මුද්‍රණ කොන්ත්‍රාත්තු** |
| 1 | a | පොලිතීන් බෑග් මුද්‍රණය කිරීම හා සැපයීම |
| | b | බයෝඩිග්‍රේඩබල් බෑග්ස් |
| | c | තේ ඇසිරීම සඳහා පත් පෙට්ටි සැපයීම |
| | d | කොරුගේටඩ් පෙට්ටි |
| | e | ලී තේ මංජුසා සැපයීම |
| | f | පිගන් මැට්ටෙන් තැනූ තේ මංජුසා |
| | g | තේ බහාලීම සඳහා ටින් සැපයීම |
| | h | තේ සාම්පල සඳහා ප්ලාස්ටික් ඇසුරුම් |
| | i | තේ සාම්පල සඳහා ඇලුෆොයිල් කවර |
| | j | වාර්ෂික වාර්තා, පොත්පත්, අත් පොත්, ලිත්, දින පොත්, සහ පෝස්ටර් ඇතුළුව, ප්‍රවර්ධන ද්‍රව්‍ය වාණිජමය ආර්ට්වර්ක් මුද්‍රණ කටයුතු |
| | k | විසිටින් කාඩ්පත්, හැඳුනුම්පත් මුද්‍රණය |
| | l | බැනර් මුද්‍රණය කිරීම |
| | m | ඡායාරූපගත කිරීම හා වීඩියෝ රූපගත කිරීම. |
| | | **පරිගණක** |
| 2 | a | ටෝනර් / කාට්රිජ් |
| | b | පරිගණක යන්ත්‍ර සර්වර්ස්, ප්‍රින්ටර්ස්, UPS සහ අමතර කොටස් |
| | c | පරිගණක මෘදුකාංග |
| | d | පරිගණක දෘඩාංග නඩත්තු කිරීම / අලුත්වැඩියාව |
| | | **වායුසමීකරණ යන්ත්‍ර සහ විදුලි අයිතම** |
| 3 | a | විදුලිමය උපකරණ / මෙවලම් |
| | b | ඉලෙක්ට්‍රොනික් උපකරණ / මෙවලම් |
| | c | වායුසමීකරණ යන්ත්‍ර |
| | d | විදුලිමය ස්ථාපනය / අලුත්වැඩියාව හා නඩත්තුව |
| | e | වායුසමීකරණ යන්ත්‍ර අලුත්වැඩියාව හා නඩත්තුව |
| | f | ඉලෙක්ට්‍රිකල් කේබල් යෙදීම හා තත් (රැහැන්) ඇඳීම |
| | | **මෝටර් රථවාහන, ටයර් සහ ටියුබ්** |
| 4 | a | මෝටර් රථ වාහන |
| | b | මෝටර් රථ වාහන සඳහා අමතර කොටස් හා උපාංග |
| | C | මෝටර් රථ වාහන සඳහා ටයර් සහ ටියුබ් |
| | d | මෝටර් රථ වාහන සඳහා බැටරි |
| | e | මෝටර් රථ වාහන අලුත්වැඩියාවන් |
| | f | වාහන විදුලිමය (ඔටෝ ඉලෙක්ට්‍රිකල්) අලුත්වැඩියාවන් |
| | g | මෝටර් රථ වාහන සේවා කිරීම හා ලිහිසි කිරීම |
| | h | මෝටර් රථ වාහන වල ටින්කරින් (තහඩු) වැඩ හා පින්තාරු කිරීම් වැඩ. |
| | i | මෝටර් රථ වාහනවල දුම්බට (සයිලන්සර්) අලුත්වැඩියාව |
| | j | මෝටර් රථ වාහනවල අප්හොල්ස්ට්‍රි වැඩ, ආසන කවර සහ කැනොපි වැඩ |
| | | **සේවා සපයන්නන්** |
| 5 | a | පලිබෝධ මර්දන නාශක (පෙස්ට් කොන්ට්‍රෝල්) සේවා |
| | b | නැව් භාණ්ඩ ප්‍රවාහනය / කුරියර් දූත සේවා |
| | c | තිල ඇඳුම් හා ලිනන් රෙදි සේදීම හා පවිත්‍ර කිරීම |
| | d | ගිනිනිවීම් හා ප්‍රවේසම් / ආරක්ෂණ සේවා |
| | | **ලිපිද්‍රව්‍ය** |
| 6 | a | ලිපිද්‍රව්‍ය හා කාර්යාල පාරිභෝජ්‍ය ද්‍රව්‍ය |
| | b | ඡායා පිටපත් කඩදාසි |
| | c | පොලිමර් සීල් හා ස්ටැම්ප්ස් |
| | | **රසායනාගාර උපකරණ හා සේවාවන්** |
| 7 | a | රසායනාගාර උපකරණ |
| | b | රසායනාගාර පරීක්ෂණ රසායන ද්‍රව්‍ය හා පාරිභෝජ්‍ය ද්‍රව්‍ය |
| | c | රසායනාගාර ආරක්ෂක පාරිභෝජ්‍ය ද්‍රව්‍ය |
| | d | රසායනාගාර ජීවානුහරණ හා විෂබීජ නාශක පවිත්‍රකාරක ද්‍රව්‍ය |
| | e | රසායනාගාර පරීක්ෂණ අවශ්‍යතා |
| | f | සාමාන්‍ය රසායනාගාර උපකරණ සේවා නඩත්තු හා අලුත්වැඩියා කටයුතු |
| | g | රසායනාගාර උපකරණ ක්‍රමාංකනය කිරීම |
| | h | රසායනාගාර අයිතම ප්‍රතිචක්‍රියාකරණය |
| | | **කාර්යාල ගෘහ භාණ්ඩ** |
| 8 | a | කාර්යාලයීය උපකරණ |
| | b | වානේ ගෘහ භාණ්ඩ |
| | c | දැවමය ගෘහ භාණ්ඩ |
| | d | කාර්යාල උපකරණ අලුත්වැඩියාවන් හා සේවා කිරීම් කටයුතු |
| | | **ඉදිකිරීම්, ආශ්‍රිත වැඩ සහ උපදේශනාත්මක සේවාවන්** |
| 9 | a | සිවිල් ඉංජිනේරු කොන්ත්‍රාත්කරුවන් |
| | b | ගොඩනැගිලි අලුත්වැඩියාවන් හා නවීකරණය කිරීම |
| | c | මෙටල් ෆැබ්රිකේෂන් හා ආශ්‍රිත වැඩ |
| | d | ඇලුමිනියම් ආශ්‍රිත වැඩ |

අයදුම්පත් ආකෘතිපත්‍ර, එක් එක් උප ශ්‍රේණිය සඳහා ආපසු ගෙවනු නොලබන රු. 1500/- ක් ගෙවීමෙන් අනතුරුව, 2020 නොවැම්බර් 3 වන දින ප.ව. 2.00 දක්වා, රාජකාරී දිනවලදී පෙ.ව. 9.30 සිට ප.ව. 3.00 දක්වා අතරතුර, කොළඹ 3, ගාලු පාරේ, අංක 574 හි ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ, පරිපාලන අංශය වෙතින්, ලබාගත හැකිය. ගෙවීම් මුදලින් හෝ චෙක්පත් මගින් ගෙවිය හැකිය. එම චෙක්පත් ශ්‍රී ලංකා තේ මණ්ඩලය නමින් ඉදිරිපත් කළ යුතුය.

නිසි පරිදි සම්පූර්ණ කළ අයදුම්පත් කොළඹ 03 ගාලු පාරේ, අංක 574 හි, ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත 2020 නොවැම්බර් මස 5 වන දින ප.ව. 3.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ, ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ, "**සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම - 2021**" යනුවෙන් පැහැදිලිව සටහන් කර, ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනැවිත් භාරදීම හෝ කළ යුතුය.

**පොදු කොන්දේසි**

1. යන්ත්‍රසූත්‍ර හා අදාළ උපකරණ වැනි අලුත්වැඩියාවන් / සේවා කිරීම් කළ හැකි අයිතම සඳහා අපේක්ෂිත සැපයුම්කරුවන් සතුව තමන්ගේම වැඩබිම් පහසුකම්, අවශ්‍ය අවස්ථාවන් හිදි අලුත්වැඩියාවන් කර ගැනීම සඳහා තිබිය යුතුය.
2. අයදුම්පත් කැඳවන අවස්ථාවේදි කඩිනමින් මිල ගණන් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන හෝ කලට වේලාවට ගෙනැවිත් භාරදීම් / සේවා සැපයීම් සිදුකිරීමට සහ පිරිවිතර / සාම්පල නියැදිවලට අනුකූලව හෝ මිලදී ගැනුම් ඇණවුමේ නියමිත කර ඇති පරිදි, සැපයුම් / සේවා ඉටුකිරීම අපොහොසත් වන හෝ තත්ත්වයෙන් බාල භාණ්ඩ සපයන සැපයුම්කරුවන්ගේ නම් ලියාපදිංචි ලේඛනයෙන් කපා ඉවත් කරනු ලැබීමට හේතු පාදක වනු ඇත.
3. භාණ්ඩ අයිතම සැපයීමට / සේවා ලබාදීමට ඉදිරිපත් කරනු ලබන මිල ගණන්, සාමාන්‍යයෙන් ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ ලැයිස්තුවෙන් කැඳවනු ලබනු නමුදු, අවශ්‍ය අවස්ථාවන්හිදි වෙනත් මූලාශ්‍ර හා ප්‍රභවයන් වෙතින් මිල ගණන් කැඳවීමේ හා භාණ්ඩ හා සේවා ලබා ගැනීමේ හෝ නව සැපයුම්කරුවන් ලියාපදිංචි කර ගැනීමේ අයිතිය ශ්‍රී ලංකා තේ මණ්ඩලය සතුය.
4. සැපයුම්කරුවන් එක් අයිතම කාණ්ඩයකට වඩා ලියාපදිංචි වීමට අදහස් කරන්නේ නම්, අයදුම්පත් ගාස්තුව ලෙස (ආපසු ගෙවනු නොලබන) රු. 1,500/- ක් බැගින් වන ගාස්තුවක් එක් එක් කාණ්ඩය සඳහා (අයදුම්පතකට) වන මුදලක් බැගින් මුදලින්, ගෙවිය යුතුය.
5. ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ (SLTB) හි සේවකයින්ගේ / සේවිකාවන්ගේ කලත්‍රයා හෝ දරුවන්, අයදුම්කරුවන් / සමාගම් හිමිකරුවන් / හවුල්කරුවන් / සමාගම් අධ්‍යක්ෂකවරුන් වන අවස්ථාවන්හිදි, එම අයදුම්කරුවන් / සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන් / සේවා සපයන්නන් / සහ උපදේශක සේවා සපයන්නන්, මෙම ලියාපදිංචිය සඳහා අයදුම්කිරීමට අයෝග්‍ය හා නුසුදුස්සන් වනු ඇත.
6. කිසිදු හේතු දැක්වීමකින් තොරව, ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරනු ලැබූ ඕනෑම අයදුම්පතක් භාරගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ශ්‍රී ලංකා තේ මණ්ඩලය සතුවන අතර, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ප්‍රතික්ෂේපිත කරනු ලැබූ අයදුම්පත් සඳහා අයදුම්කරුට අයදුම්පත් ගාස්තු නැවත ගෙවන ලෙස ඉල්ලීමට අයිතියක් නොමැත.
7. ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් පවත්වනු ලබන අගැයීම් තක්සේරුවක් මත පදනම්ව පමණක් මෝටර් රථවාහන අලුත්වැඩියාවන් හා වාහන සේවා සපයන්නන් සඳහා ලියාපදිංචි කිරීම සිදුකරනු ලැබේ.

ලියාපදිංචිය සඳහා වන අයදුම්පත් එක් එක් අයිතම කාණ්ඩය එක් අයදුම්පතකට, රුපියල් 1,500/- ක් බැගින් වන ආපසු ගෙවනු නොලබන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව පහත සඳහන් කාර්යාලයෙන් ලබාගත හැකි, නියමිත ආකෘති පත්‍ර කට්ටලයක් මත පමණක් ඉදිරිපත් කළ යුතුය. අපේක්ෂිත අයදුම්කරුවන් විසින්, සේවාව සහ කාණ්ඩ (වර්ගයේ) අංකය සඳහන් කරමින්, සිය ව්‍යාපාරික ලිපි ශිර්ෂයක් මත වන ඉල්ලීමේ ලිපියක් ද, අදාළ පරිදි ඉදිරිපත් කළ යුතුය. (ඒ සඳහා, මෙම පුවත්පත් දැන්වීම අනුගමනය කළ යුතුය.) අයදුම්පත් ආකෘතිපත්‍ර ගාස්තු ගෙවීමකින් තොරව පරීක්ෂා කර බැලිය හැකිය.

**අධ්‍යක්ෂක ජනරාල්,**
**ශ්‍රී ලංකා තේ මණ්ඩලය,**
**574, ගාලු පාර, කොළඹ 03.**

# සිළුමිණ சிழுமின The Silumina ටෙන්ඩර් හා අනෙකුත් දැන්වීම්

SriLankan Airlines oneworld

## ශ්‍රීලංකන් ගුවන් සමාගම ලංසු කැඳවීමේ දැන්වීමයි

ඉවතලන ද්‍රව්‍ය සහ පාවිච්චි කරන ලද භාණ්ඩ විකිණීම සඳහා ලංසු ඉදිරිපත් කිරීමට කෙරෙන ආරාධනයයි.

**ලංසු අංක** - LP/COM/035/20
**පරීක්ෂා කළ හැකි දිනයන්** - 2020 ඔක්තෝබර් මස 06 සහ 07 වන දින පෙ.ව. 09.00 සිට ප.ව. 03.00 දක්වා
**ලංසු කැඳවීමේ අවසන් දිනය හා වේලාව** - 2020 ඔක්තෝබර් මස 12 වන දින ප.ව. 02.00ට

**ස්ථානය** - ශ්‍රීලංකන් ගුවන් සේවා පරිශ්‍රය, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල, කටුනායක.

වැඩි විස්තර සඳහා කරුණාකර සතියේ දිනවල උදේ 9.00 සිට පස්වරු 4.00 දක්වා, ජ්‍යෙෂ්ඨ ගබඩා විධායක නිලධාරී 0197332086 ඇමතීමෙන් හෝ පහත වෙබ් අඩවියට පිවිසීමෙන් ලබාගත හැක.

**https://www.srilankan.com/tender-notices**

**කළමනාකරු, කාර්යය සම්පාදන**
**ශ්‍රීලංකන් ගුවන් සමාගම**


දැන්වීම් කාර්යාල

ඔබගේ දැන්වීම් පළකරවා ගන්න පිවිසෙන්න



මහනුවර

නො 22, දළදා වීදිය, මහනුවර
081 223 4200

සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම
ඩී ආර් විජේවර්ධන මාවත, කොළඹ 10
1949



## ප්ලාස්ටික් පැලට් (Heavy Duty) අවශ්‍යකර තිබේ.

විමසන්න:
**මල්ටිකෙම් ඉන්ටර්නැෂනල් ලිමිටඩ්**
නො. 95/4, කර්මාන්තපුරය, කිඳෙල්පිටිය, මිල්ලෑව, හොරණ.
දුරකථන අංකය: 034 2260785 / 077 9376931


## කලම්බු ඩොක්යාඩ් පී එල් සී

**කළම්බු ඩොක්යාඩ් ආයතනයේ වරාය ඇතුළත සහ ඉන් පිටත ප්‍රවාහන කටයුතු සඳහා දිගුකාලීන බදුපදනම යටතේ වාහන කුලියට ගැනීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබේ.**

| අ/අ | අවශ්‍ය වාහන වර්ගය | අවශ්‍ය ප්‍රමාණය |
|---|---|---|
| 1 | කාර් රථ | 03 |
| 2 | වෑන් රථ ද්විත්ව වායුසමීකරණ සහිත (රියදුරු සහිත හෝ රහිත) | 02 |
| 3 | වෑන්රථ භාණ්ඩ ප්‍රවාහන කටයුතු සඳහා (රියදුරු සහිත හෝ රහිත) | 01 |
| 4 | ඩබල් කැබ් රථ | 02 |
| 5 | කෲ කැබ්රථ | 02 |
| 6 | ලොරි රථ 10.5' - 14.5' - 16'-20' - 40' | 05 |
| 7 | වායු සමීකරණ සහිත බස් රථ ආසන 28 (චාරිකා සඳහා) | 01 |
| 8 | ආසන 54 බස්රථ සේවක ප්‍රවාහන කටයුතු සඳහා | 01 |
| 9 | ආසන 54 බස් රථ දුරගමන් සේවා සඳහා (චාරිකා සඳහා) | 01 |
| 10 | බූම්ට්‍රක් රථ 22' ටොන් 5 හෝ 8 බූමය සහිත | 01 |

**ටෙන්ඩර් පත්‍ර : අංක 223, ජයන්ත මල්ලිමාරච්චි මාවත, කොළඹ 14 හි පිහිටි ඩොක්යාඩ් ජෙනරල් ඉංජිනියරින් සර්විසස් පුද්ගලික සමාගම වෙතින් 29.09.2020 දින සිට 13.10.2020 වන දින දක්වා රු.250 ක් වූ නැවත නොගෙවන ටෙන්ඩර් ගාස්තුව ගෙවා ලබා ගත හැක. (සතියේ දිනවල පෙ.ව 9.00 සිට ප.ව 4.00 දක්වාද, සෙනසුරාදා දින පෙ.ව 9.00 සිට ප.ව 12.00 දක්වා පමණි)**


මිල ගණන් බහා එවනු ලබන කවරයේ ඉහල වම් කෙලවර අපගේ යොමු අංක වන **HRD&A/T/01/2020** ලෙස පැහැදිලිව සටහන් කර 2020.10.13 වන දින **ප.ව. 4.00 ට හෝ ඊට පෙර** ටෙන්ඩර්පත් නිකුත් කරනු ලබන ඉහත ලිපිනයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතු වේ.

▸ වාහන සඳහා වරාය බලපත්‍ර ඇති අයට ප්‍රමුඛතාවය ලබාදීමට සලකා බලනු ලැබේ.

**පසුව ඉදිරිපත් කරනු ලබන සහ තැපැල් මගින් එවනු ලබන ටෙන්ඩර්පත් භාරගනු නොලැබේ.**

වැඩි විස්තර සඳහා කරුණාකර විමසන්න :
**අංශප්‍රධානී (සේවක සේවා හා ප්‍රවර්ධන)**
**කලම්බු ඩොක්යාඩ් පී.එල්.සී.**
**තැපැල් පෙට්ටිය 906, කොළඹ වරාය, කොළඹ 15.**
**දු.ක : 011 - 2429000 Ex.2394/2238/2244/2494**
**විද්‍යුත් ලිපිනය : transport@cdl.lk**


BE BETTER INFORMED!




News you can trust now free on your mobile phone.

Dinamina Daily News Thinakaran

VISIT apps.lakehouse.lk

DOWNLOAD TODAY!

AVAILABLE AT

LAKE HOUSE


## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

## මිල ගණන් කැඳවීම

01. 2021 වර්ෂයේ පළමු අඩවසර තුළ (2021.01.01 දින සිට 2021.06.30 දක්වා) ශ්‍රී ලංකා යුද්ධ හමුදවට අවශ්‍ය පහත සඳහන් භාණ්ඩ ස්ථාවර මිලක් යටතේ මිලදී ගැනීම සඳහා ශ්‍රී ජයවර්ධනපුර කොළඹ පිහිටි යුද්ධ හමුද මූලස්ථානයේ යුද්ධ හමුද ටෙන්ඩර් මණ්ඩල (ප්‍රසම්පාදන) කමිටු සභාපති විසින් මිල ගණන් කැඳවනු ලැබේ.

| අනු අංකය | ටෙන්ඩර් අංකය | විස්තරය | ටෙන්ඩර් දල වටිනාකම |
|---|---|---|---|
| 01 | ඉසේඅම/04/2020/100 (933) | සිමෙන්ති | මිලියන 88 |
| 02 | ඉසේඅම/04/2020/100 (934) | දඟර වානේ හා මෘදු වානේ | මිලියන 86 |
| 03 | ඉසේඅම/04/2020/100 (935) | සිවිලිං විදුලි පංකා | මිලියන 35 |
| 04 | ඉසේඅම/04/2020/100 (936) | විදුලි කම්බි | මිලියන 75 |
| 05 | ඉසේඅම/04/2020/100 (937) | ඇස්බැස්ටෝස් රූෆින් ෂීට් | මිලියන 35 |
| 06 | ඉසේඅම/04/2020/100 (938) | සින්ක් ඇළුමිනියම් රූෆින් ෂීට් | මිලියන 84 |
| 07 | ඉසේඅම/04/2020/100 (939) | ජී අයි රැලි තහඩු | මිලියන 34 |
| 08 | ඉසේඅම/04/2020/100 (940) | ආනයනික දැව | මිලියන 70 |
| 09 | ඉසේඅම/04/2020/100 (941) | දේශීය දැව | මිලියන 75 |
| 10 | ඉසේඅම/04/2020/100 (942) | තුනී ලෑලි | මිලියන 85 |
| 11 | ඉසේඅම/04/2020/100 (943) | ජී අයි පයිප්ප | මිලියන 90 |
| 12 | ඉසේඅම/04/2020/100 (944) | පීවීසී පයිප්ප / පීවීසී උපාංග | මිලියන 45 |
| 13 | ඉසේඅම/04/2020/100 (945) | වතුර ටැංකි | මිලියන 25 |
| 14 | ඉසේඅම/04/2020/100 (946) | තීන්ත | මිලියන 61 |
| 15 | ඉසේඅම/04/2020/100 (947) | ගොඩනැගිලි ද්‍රව්‍ය (ගඟේ වැලි) | මිලියන 90 |
| 16 | ඉසේඅම/04/2020/100 (948) | ගොඩනැගිලි ද්‍රව්‍ය (මෙටල් / කළු ගල්) | මිලියන 93 |
| 17 | ඉසේඅම/04/2020/100 (949) | විදුලි අයිතම / විදුලි ස්විච් | මිලියන 15 |
| 18 | ඉසේඅම/04/2020/100 (950) | ඇළුමිනියම් උපාංග (Aluminium Bar Powder Coated / Aluminium Bar Natural) | මිලියන 67 |
| 19 | ඉසේඅම/04/2020/100 (951) | ටයිල් (Floor Tile / Wall Tile) | මිලියන 90 |
| 20 | ඉසේඅම/04/2020/100 (952) | සනීපාරක්ෂක උපාංග (Commode, Wash basins) / (Cromium Plated Piller Tap, Cromium Plated Bip Tap) | මිලියන 75 |
| 21 | ඉසේඅම/04/2020/100 (953) | වානේ ('C' Purlin, Angle lron, ms Plate) | මිලියන 90 |
| 22 | ඉසේඅම/04/2020/100 (954) | ගොඩනැගිලි ද්‍රව්‍ය (Wire Nails, Brass But Hingers, Paint Brush, Sand Paper) | මිලියන 53 |
| 23 | ඉසේඅම/04/2020/100 (955) | ආවුද හා උපකරණ | මිලියන 20 |

02. ඉහත සඳහන් සැපයීම් වෙනුවෙන් නිකුත් කරනු ලබන ප්‍රසම්පාදන ලියකියවිලි ඉංජිනේරු සේවා අධ්‍යක්‍ෂ මණ්ඩලය, යුද්ධ හමුද මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර, කොළඹ යන ලිපිනයට **2020.09.28** දින සිට **2020.10.27** දින දක්වා සතියේ වැඩ කරන දිනවල **0900 පැයේ සිට 1600 පැය** දක්වා වූ කාලය තුළදී පැමිණ ලබාගත හැකි අතර, **(යුද්ධ හමුද මූලස්ථානයේ ගොඩනැගිලි අංක 07 හි තෙවන මහලේ ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලයේ උපර්ජන අංශය වෙතින්) ඉහත සඳහන් සියලුම ටෙන්ඩරයන් 2020.10.29 වන දින 1000 පැයට යුද්ධ හමුද කඳවුර, සෙලින්කෝ ගොඩනැගිල්ල, අංක 167/30, අවිස්සාවේල්ල පාර, ඔරුගොඩවත්ත, ලිපිනයේදී විවෘත කරනු ලැබේ.** එම ලියකියවිලි ඉල්ලුම් කරන සැපයුම්කරුවන් මෙම විෂයන් සැපයීම තහවුරු කිරීමට ඇති සාධක, ආයතන ලියාපදිංචි සහතිකයේ පිටපතක් සහ පසුගිය **මාස 06 ක** ආයතන බැංකු ගිණුම් ප්‍රකාශන ඡායා පිටපතක් ඉදිරිපත් කළයුතු වේ. තවද මෙම සැපයීම් වෙනුවෙන් ඉදිරිපත් වන සැපයුම්කරුවන් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ සැපයීම් ලැයිස්තුවේ ලියාපදිංචි වී සිටින්නේ නම් ඔවුන්, රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද ලියාපදිංචි සහතිකයේ පිටපතක් ඉදිරිපත් කිරීම පමණක් ප්‍රමාණවත් වේ.

03. ඉහත ටෙන්ඩර් පිළිබඳ උනන්දුවක් ඇති හා දක්වා ඇති සුදුසුකම් සපුරන සියලුම අයදුම්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍රිකා ලබාගැනීමට පෙර ටෙන්ඩර් වටිනාකම අනුව එක් ටෙන්ඩර් පත්‍රිකාවක් සඳහා **(මිලියන 10 සිට මිලියන 50 දක්වා රු. 3,500.00 සහ මිලියන 50 සිට මිලියන 100 දක්වා රු. 12,500.00) ක ආපසු නොගෙවන මුදලක් අධ්‍යක්ෂ මුදල් කාර්යාලය, යුද්ධ හමුද මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර, කොළඹ)** වෙත ටෙන්ඩර් පත්‍රිකා ලබාගැනීමට පෙර ගෙවීම් සිදුකර එම රිසිට් පත ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුවේ.

**වැඩි විස්තර සඳහා අමතන්න**

අ. ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලයේ මිලදී ගැනීම් අංශය – දුරකථන අංකය : 0112339317
ආ. උපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාවේ ප්‍රසම්පාදන අංශය – දුරකථන අංකය : 0112431301
ඇ. ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලයේ – ෆැක්ස් අංකය : 0112435143

**යුද්ධ හමුදාධිපති,**
**යුද්ධ හමුදා මූලස්ථානය,**
**ශ්‍රී ජයවර්ධනපුර, කොළඹ.**

## ටෙන්ඩර් දැන්වීමයි

### ඇල්පිටිය වැවිලි සමාගමට අයත් පහත සඳහන් ගස් විකිණීම සඳහා මිල ගණන් කැඳවනු ලැබේ

| වත්ත හා ලිපිනය | දුරකථන අංකය | කොටස | ක්ෂේත්‍ර අංකය | ගස් වර්ගය හා ගස් ගණන දළ වශයෙන් | |
|---|---|---|---|---|---|
| දෙවිතුර වත්ත, ඇත්කඳුර | 091 4943036 | පොල්ගහවිල | 8.96 Ha | රබර් | 2,600 |
| | | | 07 (2.63 Ha) | | 721 |
| | | | 4.88 Ha | ඇල්බීසියා | 25 |
| | | ගෝණතිප්පොල | 9 (3.00 Ha) | | 28 |
| | | | 8 (1.92 Ha) | | 06 |
| ලේල්ලවල වත්ත, වඳුරඹ | 091 4943043 | ඉහල | 3.30 Ha | ඇල්බීසියා | 07 |
| | | | 1.50 Ha | | 02 |
| | | | 1.00 Ha | | 01 |
| | | | 6.00 Ha | | 02 |
| | | | 2.36 Ha | | 01 |
| | | පහල | 1.70 Ha | | 15 |
| බෙන්තොට වත්ත, ඇල්පිටිය | 091 4943051 | වඩුමුල්ල | 2.43 Ha | ඇල්බීසියා | 05 |
| | | | 3.47 Ha | | 02 |
| | | | 17.00 Ha | | 02 |
| | | අතුකෝරල | 1.17 Ha | | 18 |
| | | ප්‍රගති | 4.77 Ha | | 09 |
| | | | 7.29 Ha | | 02 |
| ගුළුගහකන්ද වත්ත, වඳුරඹ | 091 4943040 | සිට්‍රස් | 1.15 Ha | ඇල්බීසියා | 07 |
| | | | 0.82 Ha | | 01 |
| | | නාගොඩ | 9.17 Ha | | 01 |
| | | | ෆැක්ට්‍රිය අසල | | 04 |
| | | | 6.12 Ha | | 03 |
| | | | 1.00 Ha | | 05 |
| | | | 5.91 Ha | | 05 |
| | | | 10.10 Ha | | 02 |
| ඇල්පිටිය වත්ත, ඇල්පිටිය | 091 4943032 | ගිරාගොඩ | 15.00 Ha (Rubber) | ඇල්බීසියා | 28 |
| | | | 15.00 Ha (Oil Palm) | ඇල්ස්ටෝනියා | 03 |
| | | | 10.94 Ha | ඇල්බීසියා | 12 |
| | | | 15.16 Ha | ඇල්ස්ටෝනියා | 04 |
| | | | 8.50 Ha (A) | | 03 |
| | | | 8.50 Ha (B) | | 01 |
| | | ඇල්පිටිය කන්ද | 5.25 Ha | | 155 |
| | | | | ඇල්බීසියා | 02 |
| | | | 5.88 Ha | ඇල්ස්ටෝනියා | 28 |
| | | | 8.22 Ha | | 09 |
| | | | 11.00 Ha | ඇල්බීසියා | 04 |
| | | | | ඇල්ස්ටෝනියා | 02 |
| | | කිතුල්විටිගල | 33.90 Ha | ඇල්බීසියා | 11 |
| | | | | ඇල්ස්ටෝනියා | 03 |
| | | | 12.00 Ha | ඇල්බීසියා | 08 |
| | | | | ඇල්ස්ටෝනියා | 03 |
| | | | 13.00 Ha | ඇල්බීසියා | 01 |
| | | | 1.93 Ha | | 02 |
| | | | | ඇල්ස්ටෝනියා | 01 |
| | | | R/F Premises | ඇල්බීසියා | 05 |
| | | | | ඇල්ස්ටෝනියා | 04 |

සෑම ටෙන්ඩර් අයදුම්පතක්ම නිසි අයුරින් සකස් කර කවරයක බහා මුද්‍ර තබා ලිපිකවරයේ වම් කෙළවරේ "ගස් සඳහා මිල ගණන් කැඳවීම" ලෙස සඳහන් කර ප්‍රධාන විධායක නිලධාරී, ඇල්පිටිය වැවිලි සමාගම, 09 වන මහල, එයිට්කින් ස්පෙන්ස් කුළුනු අංක 01, නො. 305, වොක්ෂෝල් වීදිය, කොළඹ 02. යන ලිපිනයට **2020 ඔක්තෝබර්** 09 වන දින සවස 4.00 ට පෙර ඉදිරිපත් කළ යුතුවේ.

ටෙන්ඩර් අයදුම්පත් **2020 ඔක්තෝබර්** 09 දක්වා සතියේ වැඩ කරන දිනවල (සති අන්ත හා නිවාඩු දින හැර) උදෑසන 8.30 සිට 4.00 දක්වා ආපසු නොගෙවනු ලබන රු. 1,000.00 (රුපියල් දහසක) මුදලක් සහ ආපසු ගෙවනු ලබන රු.5,000.00 (රුපියල් පන්දහසක) ඇපකරයක්, සෑම කොටසකම ගස් සඳහා තබා, ඇල්පිටිය වැවිලි සමාගමේ ප්‍රධාන කාර්යාලයෙන් (09 වන මහල, එයිට්කින් ස්පෙන්ස් කුළුනු අංක 01, නො. 305, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.) හෝ අදාළ වතු කාර්යාලයෙන් ලබාගත හැක.

අදාළ ගස් පරීක්ෂාකිරීම, 2020 ඔක්තෝබර් 09 දක්වා සතියේ වැඩ කරන දිනවල (සති අන්ත හා රජයේ නිවාඩු දින හැර) උදෑසන 8.30 සිට 4.00 දක්වා අදාළ වතුයායේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරතුමාගේ / කළමනාකාරතුමාගේ අවසරය යටතේ සිදු කළ හැක.

සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් අයදුම්පත් පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑල මගින් හෝ එහි තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට යොමු කළ හැක.

ටෙන්ඩර් අයදුම්පත් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය ඇල්පිටිය වැවිලි සමාගම සතුය.

**ප්‍රධාන විධායක නිලධාරී,**
**ඇල්පිටිය වැවිලි සමාගම,**
**09 වන මහල, එයිට්කින් ස්පෙන්ස් කුළුනු අංක 01,**
**නො. 305, වොක්ෂෝල් වීදිය, කොළඹ 02. දු. ක. 011 - 4 693000**

ශ්‍රී ලාංකේය සුව සේවාවේ දැවැන්ත පෙරළිය!

1990 සුව සැරිය
හදිසි අවස්ථාවකදී අමතන්න



පැය 24 පුරා ක්‍රියාත්මක
ගාස්තු රහිත පූර්ව
රෝහල් ප්‍රතිකාර ගිලන් රථ සේවාව



මෙම සේවාව දැන් දිවයිනපුරා ක්‍රියාත්මකයි.

ලේක්හවුස් සමාජ සත්කාරයකි

# ටෙන්ඩර් දැන්වීමයි

## පහත සඳහන් ද්‍රව්‍ය සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබේ.

| අංකය | විස්තරය | ප්‍රමාණය |
|---|---|---|
| 1 | තෙකලා විදුලි මෝටර | 98 |
| 2 | GI ලැඩර් (400 - 600 mm) | 460 |
| 3 | GI කේබල් ට්‍රේ (50 - 300 mm) | 180 |
| 4 | සුදු යකඩ කේබල් ට්‍රේ (150, 300 mm) | 300 |
| 5 | GI කන්ඩියුට් (3/4") | 2500 |
| 6 | Fire කේබල් (2 core - 1.5 mm) | ඩ්‍රම් 15 |
| 7 | AHU Exhaust Fan | 23 |
| 8 | විදුලි පැනල (ලොකු , කුඩා) | 22 |
| 9 | පාවිච්චි කරන ලද විදුලි උපකරණ | තොග 1 |
| 10 | 20' Convertainer | 1 |
| 11 | විදුලි fire පොම්ප (500 gpm) | 1 |
| 12 | ඩීසල් fire පොම්ප (500 gpm) | 1 |
| 13 | ටියුබ් ලයිට් | 300 |

**ටෙන්ඩර් භාරගැනීම 2020 ඔක්තෝබර් 14 වන දින දහවල් 3.00 ට අවසන් වේ. සතියේ දිනවල පෙ.ව. 11.00 සිට දහවල් 3.00 දක්වා හොරණ කර්මාන්ත ශාලාවේදී භාණ්ඩ පරීක්ෂා කළ හැක. ටෙන්ඩර් පෝරමය ලබාගැනීම සඳහා නැවත ගෙවනු ලබන රු. 50,000/- ක තැන්පත් මුදලක් අය කරනු ලැබේ. මෙම ටෙන්ඩරය පිළිබඳ අවසන් තීරණ ගැනීමේ අයිතිය සමාගම සතුය. වැඩි විස්තර සඳහා හොරණ කර්මාන්ත ශාලාවේ, සහාය කාර්යාල පරිපාලන කළමණාකාර මහතා අමතන්න.**

සීමාසහිත යුනිලීවර් ශ්‍රී ලංකා
258, එම්. වින්සන්ට් පෙරේරා මාවත, කොළඹ 14.
දුරකථන අංකය : 011 4 700 800 - දිගුව 5660 - 077 9570 950

# පේරාදෙණිය විශ්වවිද්‍යාලය

## ප්‍රසම්පාදන දැන්වීමයි

## ගලි සේවාවන් සඳහා කම්කරුවන් සැපයීම - 2020/2021

පේරාදෙණිය විශ්වවිද්‍යාල නඩත්තු අංශයේ ගලි සේවාවන් පවත්වාගෙන යාම සඳහා පිරිමි කම්කරුවන් 10 දෙනෙකු සැපයීමට හැකි පිළිගත් ආයතන වෙතින් තරගකාරී මිල ගණන් යටතේ ලංසු කැඳවනු ලැබේ.

| සේවක ශ්‍රේණිය | සේවක සංඛ්‍යාව | දින ගණන | මුළු සේවක දින ගණන |
|---|---|---|---|
| කම්කරු - ගලි සේවාවන් | පිරිමි - 10 | 365 | 3650 |

- අදාළ ලංසුපත්, ආපසු නොගෙවනු ලබන රු. 2,000.00 ලංසුපත් ගාස්තුවක් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සරප් අංශය වෙත ගෙවා එම අංශයෙන් ලබාගත හැකිය.
- ලංසුකරු විසින් වාර්ෂික ලංසු වටිනාකමින් (බදු රහිත) 1% ක වටිනාකමකින් යුත් ලංසු ඇපකරයක් 2020.10.20 දින සිට 2021.02.16 දින දක්වා වලංගු වන පරිදි පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උපකුලපති නමින් තැබිය යුතු අතර, එය ශ්‍රී ලංකා මහ බැංකුව මගින් අනුමත කර ඇති රාජ්‍ය හෝ වාණිජ බැංකුවකින් ලබා ගන්නා ලද ලංසු ඇපකරයක් විය යුතුය. නැතහොත් ඒ හා සමාන මුදලක් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සරප් වෙත ගෙවා සුරක්ෂිතයක් ලෙස විශ්වවිද්‍යාලයේ තැන්පත් කළ යුතුය.

  **රක්ෂණ සමාගම් මගින් ඉදිරිපත් කරනු ලබන ලංසු ඇපකර, චෙක්පත් හෝ මුදල් ඇණවුම් භාරගනු නොලබන අතර, එවැනි අවස්ථාවලදී අදාළ ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**
- මෙම ලංසුපත් 2020.09.28 දින සිට 2020.10.19 දින දක්වා වැඩකරන දිනයන්හි පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා නිකුත් කරනු ලබන අතර, මුද්‍රා තබන ලද මිල ගණන් 2020.10.20 වන දින ප.ව. 1.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ ලේඛකාධිකාරී කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ සභාපති, ප්‍රසම්පාදන කමිටුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන සේ එවිය යුතුය. (ලේඛකාධිකාරී කාර්යාලයෙන් නිකුත් කරනු ලබන රිසිට්පත ලබාගැනීම අනිවාර්ය වේ)
- ලංසුපත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"පේරාදෙණිය විශ්වවිද්‍යාල නඩත්තු අංශය වෙත ගලි සේවාවන් සඳහා කම්කරුවන් සැපයීම - 2020/2021"** යනුවෙන් සඳහන් කිරීම අනිවාර්ය වේ.
- ප්‍රමාද වූ හා අසම්පූර්ණ ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- ලංසුපත් 2020.10.20 දින ප.ව. 1.30 ට පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සනාථන මන්දිර කමිටු කාමර අංක II දී විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයින්ට මේ සඳහා සහභාගි විය හැක.

වැඩි විස්තර සඳහා පහත සඳහන් දුරකථන අංක අමතන්න.

**වැඩ ඉංජිනේරු - 081-2388930, 081-2392166**

**ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, පාලන අංශය**
**081-2388103 081-2392438 081-2392436**

**සභාපති, විශ්වවිද්‍යාල ප්‍රසම්පාදන කමිටුව.**







මංගල යෝජනා
දශක ගණනාවක විශ්වසනීය සේවාව...
SUNDAY OBSERVER
Marriage Proposals
දැන් වචන 15ක් රු. 560ක් පමණයි...
චාමර - 0777 270 067 / අනුෂා - 0777 278 948



ස්වාධීන රූපවාහිනී සේවය
පුරන් ටෙලි කෙත
ගුණාත්මක ප්‍රේක්ෂක රසවින්දනයෙන් අස්වද්දයි !
Raigam TELE'ES 2019
වසරේ ජනප්‍රියතම ටෙලිනාට්‍යය
තණමල්විල කොල්ලෙක්
ස්වාධීන රූපවාහිනී සේවය
වසරේ ජනප්‍රියතම ටෙලිනාට්‍ය නිළිය
ශලනි තාරකා
ගිරිදේවි ටෙලිනාට්‍ය
ස්වාධීන රූපවාහිනී සේවය
ගිරිදේවි
තණමල්විල කොල්ලෙක්
වසරේ විශිෂ්ටතම ප්‍රවෘත්ති නිවේදක (සිංහල)
සහන් උඩුවවිදාන
වසරේ විශිෂ්ටතම ප්‍රවෘත්ති නිවේදක (දෙමළ)
චන්ද්‍රිකා ආරුමුගම් - වසන්තම් TV
වසරේ විශිෂ්ටතම රූපවාහිනී සම්ප්‍රේෂක (දෙමළ)
ඉර්ෆාන් මොහොමඩ්
වසරේ විශිෂ්ටතම රූපවාහිනී ළමා වැඩසටහන
O-Kay Art Palette
විශිෂ්ටතම රූපවාහිනී ප්‍රශ්න විචාරත්මක වැඩසටහන
Know Your Rights
වසරේ විශිෂ්ටතම රූපවාහිනී සංගීතමය වැඩසටහන
Acoustica Unlimited
වසරේ විශිෂ්ටතම ටෙලිනාට්‍ය ගීත රචනය
මංජුල වෙඩිවර්ධන - දෙයියන්ගෙ රටේ
ජූරියේ කුසලතා සහතිකය
හිරුන්දි දෙව්සිළුනි - හුස්ම වැටෙන මල්
ටෙලි නාට්‍ය සංස්කෘතිය
විජයග්‍රහණයෙන් ජනප්‍රියත්වයට ඔසවා තැබූ ප්‍රේක්ෂක ඔබට
ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ උත්තමාචාරය...!
ITN SriLanka
ඔබේ පවුලේ නාලිකාව
www.itn.lk www.itntv.lk
වසන්තම් TV
PRIME TV
digital
@ITNSriLanka

# පොලිස් සුනඛයන්ට විනා කරන 'බලු වෙන්දේසිය' නතරවන හැඩ

● නිහාල් පී. අබේසිංහ

**තම ජීවිතය නොතකා රටට ඉමහත් සුවිශේෂී සේවයක් කළ පාද හතරේ 'රහස් පරීක්ෂකයන්' 25 ක පිරිසක් පසුගියදා වෙන්දේසියේ විකුණන බවට මහනුවරින් වාර්තා විය.බුදු රජාණන් වහන්සේගේ ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ වැඩ සිටින කන්ද උඩරටට වාර්තා වූ සත්ත්ව ලෝලීන්ගේ ඇසට කඳුළු උනන ඒ කෲර වෙන්දේසිය මගින් පසුගිය වසර 10 තුළ අපරාධ, මත්ද්‍රව්‍ය හා ත්‍රස්තවාදී කටයුතු මර්දනයට රණ විරුවන් ගේ ඇප කැපවූ පොලිස් සුනඛයන් 25 ක් හොඳ තත්ත්වයේ සිටියදීම පිට අයට විකුණා ඇත.**

මේ වෙන්දේසියේ විකුණු සුනඛයන් අතර මෙරට අපරාධ මත්ද්‍රව්‍ය හා ත්‍රස්තවාදී ක්‍රියා පිළිබඳව රටේ සුවිශේෂතම දස්කම් දැක්වූ පොලිස් සුනඛයෝ 10 ක් පමණ සිටියහ. මිනිසුන්ටත් කළ නොහැකිවූ රහස් පරීක්ෂක වැඩ රැසක් ඒ සුනඛයන් සිදුකර තිබිණි.

හොරණ පොලිස් සුනඛ අංශයේ මග මෙහෙයක් කළ 'ඇල්වින්' සුනඛයා අපේ රටේ අපරාධ පරීක්ෂණ 200 ක් සඳහා සාක්ෂි සැපයූ හොඳ 'රහස් පරීක්ෂකයෙකි'. ඒ සමගම මහනුවරදී වෙන්දේසි කළ බෙල්ජියමේ මෙලනොයින් විශේෂයට අයත් අනුරපුරයේ 'හීරෝස්' ද මත්ද්‍රව්‍ය වැටලීම් අපරාධ ආදී නීති විරෝධී කටයුතු 310 ක් පමණ වැටලීමට සක්‍රියව එක්වී ඇති සුනඛයෙකි. ඊට අමතරව එදා අඩු මුදලට විකිණූ කොම්පඤ්ඤවීදියේ බෙට්කා ද අපරාධ පරීක්ෂණ 110 කට එක්වූ තවත් කකුල් හතරේ දක්ෂ නිල සුනඛ රහස් පරීක්ෂකයෙකි.

මෙම සුනඛ වෙන්දේසියේදී සුනඛයින් 25 දෙනාගෙන් වැඩිම මිලට මෙවර ද අලෙවි වී ඇත්තේ 'බ්‍රිත්' නම් 'ලැබ්‍රඩෝර්' වර්ගයේ සතෙකි. ඌ අලෙවි වූ මිල ගණන රුපියල් ලක්ෂයකට වැඩි මුදලක් විය. නමුත් ඒ සුනඛයා ලබාගත් අය ඒ සතාව රැගෙන ගොස් ඇත්තේ ත්‍රිවිලයකිනි.

මෙහිදී රුපියල් 1100 කට ද පොලිස් නිල සුනඛයෙක් අලෙවි විය. ඒ 'රෝයි' සුනඛයාය. නමුත් මේ වෙන්දේසි කළ සුනඛයන්ට පසුව අත්වී ඇති ඉරණම ඉතා කනගාටුදායක බව සත්ව මිත්‍ර සංගම් පවසයි.

මේ සුනඛයන් වෙන්දේසි කළේ ඇයි දැයි අප මහනුවර පොලිස් සුනඛ අංශයේ නිලධාරීන්ගෙන් විමසූවිට 'සිළුමිණ' ට පැවසුවේ වසර 10 -12 ක් එක දිගට සේවය කළ නිසාත් දැන් ඔවුන්ගෙන් වැඩගැනීම අපහසු නිසාත් සමහර සතුන් පුහුණු කිරීමට අපහසු නිසාත් මෙසේ පොලිස් සුනඛයන් වෙන්දේසි කරන බවයි.

එසේ වුවත් සත්ව මිත්‍ර සංවිධාන පවසන්නේ වසර 10 - 12 ක් එක දිගට වැඩ කරන අපේ පොලිස් සුනඛයන්ට සැලකීමට ඔවුන් සූදානම් බවයි. යම් පුද්ගලයෙක් යම් සතකුගේ හාම්පුතා ලෙස දිගු කලක් සේවය කළ පසු ඔහුගෙන් වෙන්කර තැබීම අපහසුවේ එසේ අයින් කළොත් සත්ව ජීවිත වලට විවිධ පීඩා එල්ල වන බවත් සත්ව මිත්‍ර සංවිධාන පවසයි. බුදු දහම අනුවත් මෙය අපේ රටට උචිත දෙයක් නොවේ. ඒ අනුව මේ සුනඛ වෙන්දේසිය වළක්වන ලෙසට සත්ව සුබසාධන භාරය 'බව් බව්' සංවිධානය, Emburh සංවිධානයේ ඔටාරා ගුණවර්ධන ඇතුළු සත්ව මිත්‍ර සංගම් දක්ෂිණ ලංකාවේ ප්‍රධාන සංඝනායක ඕමල්පේ සෝභිත නාහිමිපාණන්ගේ උපදෙස් හා මෙහෙයවීම මත වැඩබලන පොලිස්පතිට හා සුනඛ අංශය බාර නියෝජ්‍ය පොලිස්පතිට දන්වා සිටියහ.

ඊට අමතරව මෙම සත්ව මිත්‍ර සංවිධාන සමාජ ජාලා ඔස්සේ ද සත්වලෝලීන් ජනතාව හා වගකිවයුත්තන් මේ ගැන දැනුම්වත් කිරීම් ද අමතක කළේ නැත. එයට ඉහළ ප්‍රතිචාර ලැබිණි. මේ වෙන්දේසිය තහනම් කළ යුතු බවට ජන මතයක් ද ඇති විය.

මේ පිළිබඳව 'සිළුමිණ' ට අදහස් දැක්වූ 'බව් බව්' සංවිධානයේ සභාපති ගිහාන් දිනුෂ්ක මහතා පැවසුවේ මේ පොලිස් සුනඛයන් වෙන්දේසි කිරීම වැළැක්වීම පිළිබඳව ආරක්ෂක ලේකම් කමල් ගුණරත්න මහතාට සිය ස්තුතිය පිරිනමන බවයි.

"මේ සුනඛයන් වසර 10 - 15 ක් රටේ ආරක්ෂාව පිණිස පාතාල අපරාධ මඩින්නට සිය ජීවිතය පරදුවට තියා කටයුතු කළ පිරිසක්. ඒ අය ආයුධ අල්ලන්න අපරාධ කාරයන් අල්ලන්න හා බෝම්බ කඩු ආදිය අල්ලන්න කටයුතු කළ පිරිසක්. ඒ කටයුතුවලට පුහුණු කිරීම හා ක්‍රියාශීලීව වැඩ කරන නිසාම ඒ අයගේ ජීවිතයේ ආයුෂ කෙටි වෙන්න පුළුවන්.



**පොලිස් සුනඛයන් වෙන්දේසි කිරීම තහනම් කරන්න වැඩ බලන පොලිස්පතිට නියෝග කළා. මින් පසු අපේ රටේ කොහේවත් පොලිස් සුනඛ වෙන්දේසි බැහැ.**

● ආරක්ෂක ලේකම් මේජර් ජනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න

මේ සුනඛයන් වෙන්දේසි කරනව කියන ආරංචිය ආපුවාම අපි තවත් සත්ව මිත්‍ර සංවිධාන රැසක් සමග එක්වී ඒ පිළිබඳව සුනඛ අංශය බාර නියෝජ්‍ය පොලිස්පතිට දැන්වූව ද පසුව අපි වැඩ බලන පොලිස්පතිටත් දැන්වූවා. පසුව සමාජ ජාල මගිනුත් ඒ පිළිබඳව ජනතාව දැනුම්වත් කළා.

එහි ප්‍රතිඵලයක් ලෙස ඒ ගැන ආරක්ෂක ලේකම් කමල් ගුණරත්න මැදිහත් වුණා. මින් පසු අපේ රටේ පොලිස් සුනඛ වෙන්දේසි තහනම් කරන ලෙස වැඩබලන පොලිස්පතිවරයාට දැන්වූවා. ඒ පිළිබඳව අපි ඒ අයට ඉතා ස්තුතිවන්ත වෙනවා. නමුත් අපි මහනුවර පොලිස් සුනඛ අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ අනුර දෙල්ගහවත්ත මහතා පවසන්නේ



**පොලිස් සුනඛ වෙන්දේසිය නැවැත්වීම අපි අගය කරනවා හැබැයි පොලිස් නිල ඇඳුමේ ගෞරවය රකිමින් පොලිස් සුනඛයන් මැරෙන තුරු සුරැකිය යුතුයි ඒ අයට ඒක කරන්න බැරිනම් සතුන් ටික අපිට දෙන්න**

● දක්ෂිණ ලංකාවේ ප්‍රධාන සංඝනායක ආචාර්ය ඕමල්පේ සෝභිත නාහිමි

මේ 1948 ඉඳන් මේ වෙන්දේසිය තිබිල තිබෙනවා. ඒ විකුණපු සතුන් දැන් පුදුම දුකක් විඳින්නේ. අපි කියන්නේ මේ රටට සේවය කරපු සුනඛයන් ඒ අයව බලාගත් පොලිස් නිලධාරීන් සමඟම මැරෙන තුරු තබාගන්න කියලා" සත්ව සුබසාධන භාරයේ සභාපතිනි අයිරාංගනී ද සිල්වා පවසන්නීය.

1948 සිට ඒ පැවතුණු මේ පොලිස් සුනඛ වෙන්දේසි නැවැත්වීම පිළිබඳව ආරක්ෂක ලේකම් මේජර් ජනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්නට ස්තුතිවන්ත වන බවත් ඇය පවසන්නීය. එසේ වුවත් ඔහු පොලිසියට දුන් නියෝග ක්‍රියාත්මක වනවා දැයි පසු විපරම අත්‍යවශ්‍ය බව ද සත්ව සුබසාධන පනත

නියම කකුල් හතරේ රහස් පරීක්ෂකයන් ලෙස වැඩ රැසක් කළ මේ අය මැරෙන තුරු සුරැකීම අපේ යුතුකමක්.

මෙවැනි පළපුරුදු පොලිස් සුනඛයන් මිනිසකුට මොන අයුරින්වත් සොයාගත නොහැකි අපරාධ, මත්ද්‍රව්‍ය තොරතුරු විනාඩි කීපයක් ඇතුළත සොයා ගන්නවා. මේ සතුන් මේ අයුරින් වෙන්දේසි කර බාහිර අයට ලබාදීම ජාතික අපරාධයක් මෙන්ම ජාතික ආරක්ෂාවටත් තර්ජනයක්.

අද රජය හා පොලිසිය වහාම කළ යුත්තේ සුනඛයන් වෙන්දේසි නොකර හා වෙන්දේසිකර දැනට ජීවත්ව සිටින පොලිස් සුනඛයන් ජීවත්ව සිටිනතාක් පහසුකම් සැලසීමයි. ඒ සමගම තවදුරටත් ඒ සුනඛයන්ට අසනීපවලට බෙත් හේත් ආදිය ද ලබාදිය යුතුමයි. එයට ආරක්ෂක වනජීවි; පශු සම්පත් ආදී අමාත්‍යාංශයත් එක්වී ඒකාබද්ධ ක්‍රමවේදයක් අනුව මේ පොලිස් සුනඛයන් සුරැකිය යුතුයි.

"අපිට ආරංචි වුණා මහනුවර වෙන්දේසියේ රුපියල් ලක්ෂයකට වඩා දීලා මිලදී ගත්ත විශාල පොලිස් බල්ලෙක් අරන් ගිහින් තිබෙන්නේ ත්‍රිරෝද රථයක දමාගෙන බව. ඒ බල්ලා කීකරු නිසා එසේ අරන් යන්න ඇති. මේ වෙන්දේසියෙන් අරන් යන සතුන් පුදුම දුක් විඳිනවා. සමහරු ගෙවල් මුර කරනවා.





**සුනඛ වෙන්දේසිය නැවැත්වීම ගැන ආරක්ෂක ලේකම්ට ස්තුතියි නමුත් පොලිසියට දුන් නියෝග තවම ක්‍රියාත්මක කර නැහැ**

● 'බව් බව්' සංවිධානයේ සභාපති සත්වලෝලී ගිහාන් දිනුෂ්ක

මේ ගැන ඒ අයට කිසිම නියෝගයක් ලැබී නැති බවයි.

අපි මේ පිළිබඳව නිතරම අවධානයෙන් සිටිනවා. මේ පොලිස් සුනඛ වෙන්දේසිය අපේ රටේ නැවතත් සිදු නොකළ යුතුයි." ආරක්ෂක ලේකම් තුමාගේ උපදෙස් ක්‍රියාත්මක නොකළහොත් මෙරට සත්ව ලෝලී සංවිධාන හා සමාජ ජාල එක්වී දිගටම අපේ අරමුණ ඉටු කර ගැනීමට කටයුතු කරන බවට සත්ත්වලෝලී දිනුෂ්ක පවසයි.

සත්ව සුබසාධන භාරය ද මේ කටයුත්තේදී පෙරමුණේ සිටී. "මේ සුනඛයන් වෙන්දේසි කළාට පස්සේ ඒ සතුන්ට පුදුම දුක් කන්දරාවක් විඳින්න සිදුවී ඇති බව අපට වාර්තා වෙලා තිබෙනවා. මේ සුනඛයන් පිළිබඳව පොලිසියේ කිසිම පසු විපරමක් නැහැ. මේ ලොකු සුනඛයන් මිලදී ගන්න අයට ඒ සතුන්ට සුදුසු ආහාර හා පහසුකම් ලබාදෙන්න පුළුවන් ද කියල මුලින් ම සොයා බලාගන්න ඕනෑ.



**මේ ගැටලු වළක්වන්න සත්ව සුබසාධන පනත ක්‍රියාවට නංවන්න**

● සත්ව සුබසාධන භාරයේ සභාපතිනි අයිරංගනී ද සිල්වා

අනුමත කිරීම වහා කළයුතු බව ද ඇය පෙන්වා දෙයි.

මේ පිළිබඳව අප කළ විමසීමකදී 'සිළුමිණ' ට කරුණු දැක්වූ දක්ෂිණ ලංකාවේ ප්‍රධාන සංඝනායක ආචාර්ය ඕමල්පේ සෝභිත නාහිමිපාණෝ පවසන්නේ පොලිසියේ නිල ඇඳුමේ ඇති ධර්ම චක්‍රය හා නිල ඇඳුමේ ගෞරවය සුරකිමින් මේ පොලිස් සුනඛ වෙන්දේසි නවතා ඒ සුනඛයන්ට ජීවිතාන්තය දක්වා රැකවරණ හා ආරක්ෂාව පොලිසියේ යුතුකමක් බවයි. එසේ පොලිසියට ඒ වැඩේ කරන්න බැරිනම් එම සියලු සුනඛයන් උන් වහන්සේ සභාපතිත්වය දරන 'සොබාදහම සඳහා නීතිය' සංවිධානයට බාර දෙන ලෙස ද උන්වහන්සේ ඉල්ලා සිටිති.

පොලිස් සුනඛයන් කියන්නේ අපේ ජනතාව හා අපේ රට වෙනුවෙන් මහ මෙහෙවරක් කරන අපේ කල්‍යාණ මිත්‍රයන් පිරිසක්. රටට කෝටි ගණන් වටිනා මෙහෙයක් කරපු

## මැරෙන තුරු සුරැකිය යුතු 'රහස් පරීක්ෂකයන්' පිරිසක්

### ලක්ෂයකට ගත්ත පොලිස් සුනඛයා අරන් ගියේ ත්‍රිරෝද රථයක දමාගෙන

සමහරුන්ගෙන් අමානුෂික ලෙස පැටව් හදලා විකුණනවා. සමහරු කූඩුවල දමා කන්න දෙන්නෙත් නැහැ. පොලිසියේ කවුරුවත් මේ සතුන් උන්නාද මළා ද කියලා බලන්නේ නැහැ.

ආරක්ෂක ලේකම් තුමා මේ සුනඛ වෙන්දේසිය නැවැත්වීම පිළිබඳ අපි සතුටු වෙනවා. ඒත් එතුමාගේ නියෝගය වැඩ බලන පොලිස්පති හරහා ක්‍රියාත්මක වුණා ද කියලත් සොයා බැලිය යුතුයි" ආචාර්ය ඕමල්පේ සෝභිත හිමියෝ පවසති. පොලිසියේ නිල ඇඳුමේ ධර්ම චක්‍රය තිබෙනවා. මේ අනුව මේ පොලිස් නිලධාරීන් තම පොලිස් ඇඳුමට ගරු කිරීමට නම් මේ පොලිස් සුනඛ වෙන්දේසි වහාම නතර කළ යුතුය. පොලිස් සුනඛයන්ට කරන සුනඛ වැඩේ නැවැත්විය යුතු බව ද ඕමල්පේ සෝභිත නාහිමියෝ පවසති.

# නිවාස සිහිනයේ ඛේදවාචකය අබියස හඬා වැටෙන මංගලගම මිනිස්සු



අඩාල වී ඇති නිවාස ක්‍රම



වතුර ගෙන යෑමට පැමිණි පිරිස

**පානීය ජල ප්‍රශ්නය ප්‍රබල ගැටලුවක්**

**වැහි කාලයට පාරවල් මාර්ග වගුරු බිම් බවට පත් වෙනවා**

**අලි වැට අතරමැද නතර කරලා මුදල් ලැබුණු ගමන් නැවත ඉදි කිරීම් කටයුතු ආරම්භ කරනවා - නිවාස ව්‍යාපෘති භාර තාක්ෂණ නිලධාරි**



අනුර අබේසිංහ



ඩී. එම් දිසානායක



තනූජා අමාලි



නිලූකා සුභාෂිණී



ප්‍රියංගිකා මල්කාන්ති

● රවින්ද්‍ර මැදගෙදර - අම්පාර සමුහ

**තමන්ගේම කියා හිසට සෙවණක් තිබීම සිතකට අපූරු සැනසීමකි. මඩකලපුව දිස්ත්‍රික්කයට අයත් සිංහල ගම්මානයක් වන මංගලගම 25 කණුව ගම්මානයේ ඉදි කිරීමට නියමිත නිවාස 50කින් යුත් අදියර 1 හා 2 ආදර්ශ ගම්මානවල ඉදි කිරීම් කටයුතු ආරම්භ කොට එහි යටිතල පහසුකම් සපයා දෙන්නැයි එහි නිවාස හිමියෝ ඉල්ලා සිටිති.**

2016 වර්ෂයේ දී පමණ ඉදි කිරීම් ආරම්භ කරන ලද අදියර 1 නිවාස 25 ගම්මානයේ දැනට නිවාස 15ක් පමණ සිය ශ්‍රමය හා මූල්‍ය දායකත්වයෙන් වැඩ අවසන් කර ඇති අතර අවුරුදු 10ක් පමණ දැනට ස්ථිර වශයෙන් පදිංචි වී සිටිති. මෙහි බොහෝ නිවාසවල වහල ගසා ඇති අතර සමහර වහල මට්ටම දක්වා බිත්ති බැඳ තිබේ. නමුත් දෙවැනි අදියරේ නිවාසවල වහල ගසා නැති අතර විවිධ මට්ටම්වලින් ඉදි කිරීම් කොට නවතා දමා වල් බිහිවෙමින් තිබේ.

මෙහි නිවැසියන්ට නිවාස අධිකාරියෙන් ලැබිය යුතු ණය මුදල් සම්පූර්ණයෙන් ලැබී නැති නිසා ඉදි කිරීම් කටයුතු අවසන් කිරීමට නොහැකිව සිටී. ඒ ප්‍රදේශයේ මාර්ග පද්ධති ගමගමනයට සුදුසු පරිදි සකස් කර දී නොමැති නිසා වැහි කාලයට එම මාර්ග වගුරු බිම් බවට පත් වේ. පානීය ජල ප්‍රශ්නය ද ඔවුහු මුහුණ දෙන තවත් ප්‍රබල ගැටලුවකි. අලි වැටක් ඉදි කර ඇතත් එය අතරමැද නතර කර දමා ඇති තිබේ. එය ඉදි කර ඇත්තේ ද ප්‍රමිතියකින් තොරව හා ගම පිටට දමා වැරදි ආකාරයට බව ද ප්‍රදේශවාසීහු පවසති.

ප්‍රදේශවාසියකු වන ඩී.එම්. දිසානායක ඔවුන් මුහුණ දී සිටින අසීරු තත්ත්වය ගැන මෙසේ කීවේය.

"මේ ගම්මානයට ඇවිත් අවුරුදු 2ක් විතර වෙනවා. ගේ හදලා ඉවර කරගන්න බැරි වුණා. දෙනවා කියූ ණය මුදල සම්පූර්ණයෙන් දුන්නේ නැහැ. මේ වන විටත් අපි ලක්ෂ දෙක හමාරක් විතර වැය කරලා තියෙනවා. ඉතිරි වැඩ කරගන්නත් තව රුපියල් ලක්ෂ 3ක් 4ක් අවශ්‍ය වෙනවා. කුලී වැඩක් කරලා තමයි ජීවත් වෙන්නේ. වගාවක් කරන්න බැහැ අලි සහ හරක් නිසා. හැම වගාවක්ම විනාශ කරනවා. අලි වැටක් ඉදි කරන්න ශ්‍රම දායකත්වය දුන්නා. නමුත් දැන් ඒකත් අතරමග නතර කරලා තියෙන්නෙ"

වැඩිහිටියන් පමණක් නොව ගමේ දරුවන් ද මුහුණ දෙ ප්‍රශ්න රැසකි. මේ, මවක වන තනූජා අමාලි ගේ කතාවයි.

"ඉන්න තැනක් නැති නිසා මේ ගේ යාන්තම් හදාගෙන පදිංචි වුණා. නිවාස අධිකාරියෙන් දෙනවා කිවූ ණය මුදල් ඔක්කොම දුන්නේ නැහැ. අපේ ළමයින් ඉස්කෝලේ යනවා. ලොකු දුව යන්නේ උහන මහා විද්‍යාලයට. මෙහේ ඉඳලා උදේ 6වත් පාරට යන්න ඕන. තනිවම යවන්න බෑ මහ පාරට කිලෝ මීටරයක් විතර දුර පයින් යන්න ඕන. පාරේ අලි ඉන්නවා. පාර දෙපැත්තම කැලේ. පාර ළඟට අලි ආවත් පේන්නේ නැහැ. උදේ 7,8 වෙනකම් පාරේ අලි ඉන්නවා. සමහර දවස්වල අලි වෙඩි දාලා තමයි පන්න ගන්නේ. සෞඛ්‍ය සායනවලටත් අපි මංගලගමට ම යන්න ඕන. බබාලා ලැබෙන්න ඉන්න අම්මලා සහ කුඩා ළමයින් ගොඩක් ඉන්නවා. සායනවලට බර කිරන්න අපි යන්න ඕන. ගමට එන්නේ නැහැ." දෙදරු මවක වන නිලූකා සුභාෂිණී මෙසේ කීවාය. "පොඩි දරුවො දෙන්නෙක් මට ඉන්නෙ. සවස 6 වෙද්දි ගේ ඇතුළට වෙලා දොරවල් වහගෙන ඉන්නවා. මහත්තයා එන්නේ රෑ 8ට විතර. ඒ වෙනකොටත් ගම පුරා අලි ඉන්නවා. අලි වැට ගහලා තියෙන්නේ ගමට පිටින්. ඒ නිසා අලි ගම ඇතුළේ තමයි ඉන්නේ. අපිට පානීය ජල ප්‍රශ්නය තමයි ඉතා උග්‍ර විදියට බලපාලා තියෙන්නේ. ප්‍රාදේශීය සභාවෙන් සති දෙකෙන් දෙකට මේ බූලියට වතුර ගෙනත් දානවා. ඒක ප්‍රමාණවත් නැහැ. අනෙක් දවස්වලට කල අරන් තැනින් තැන ගිහින් තමයි වතුර ගේන්නේ. වෙන ඉන්න තැනක් ගෙයක් දොරක් නැති නිසා තමයි මේ දුක් විඳගෙන හරි මෙහේ පදිංචි වෙලා ඉන්නේ."

"මම මේ ගම්මානයට ඇවිත් අවුරුදු 2ක් වෙනවා. බොහෝ අය මේ ගෙවල් හදාගෙන එන්න අකමැතියි. ඒ වතුර හා අලි ප්‍රශ්නය නිසයි. බොන්න වතුර ටිකක් සති දෙකකට වරක් ගෙනත් දුන්නට බවලතකුට එළිපහළියට යන්න තරම්වත් වතුර ටිකක් නැහැ. වතුර ටිකක් නා ගන්න හැතැප්ම දෙක තුනක් යන්න ඕන. වතුර නැතුව ගෙවල් හදන්නත් බැහැ. මේ වතුර ප්‍රශ්නය විසඳුණොත් මිනිස්සු ගෙවල් හදයි. අපි ඉල්ලන්නේ ඉතිරි ණය වාරික දීල යටිතල පහසුකමුත් ලබා දීලා මිනිස්සු පදිංචි කරවන්න කියලයි" ඒ, අනුර අබේසිංහගේ හඬයි.

එම්.වී. ප්‍රියංගිකා මල්කාන්තිද මෙලෙස තම දුක කීවාය.

"මේ ගම්මානයේ ගෙවල් 50ක් ඉදි වුණාට පදිංචි වෙලා ඉන්නේ පවුල් 10ක් විතර. තවත් අය ගෙවල් හදාගෙන ඉන්නවා. නමුත් පදිංචියට එන්නේ නැහැ. පහසුකම් නැති නිසා. බොන්න වතුර ටික නම් සති දෙකකට වරක් ප්‍රාදේශීය සභාවෙන් ගෙනත් දානවා. නාන්න හා අනිත් වැඩවලට කිලෝ මීටර් 2ක් විතර දුරින් තියෙන වැවට යන්න ඕන. වැවේ හරකුත් ලැගලා ඉන්නවා. මොනවා කරන්න ද? ජල නල මාර්ග ගම ළඟටම ඇවිත් තියෙනවා. නල දෙනවානම් ගම ඇතුළේ කාණු කපන එක අපිට කරගන්න පුළුවන්."

මේ පිළිබඳ මංගලගම නිවාස ව්‍යාපෘති භාර තාක්ෂණ නිලධාරි එදිරියෙන් දුෂ්‍යන්තන මහතාගෙන් කරුණු විමසා සිටියෙමු.

"පසුගිය රජය කාලයේ තමයි මේ නිවාස යෝජනා ක්‍රම ආරම්භ කළේ. මෙයට කලින් ගෙවල් 40ක් හදලා සියලු යටිතල පහසුකම් සමග නිවාස ලාභීන් පදිංචි කළා. නමුත් මෙම යෝජනා ක්‍රමවල වැඩ නිම කරන්න බැරි වුණා. ඊට හේතු වුණේ පසුගිය කාලයේ පැවති මැතිවරණ හා පැවති රජයන් වෙනස් වීමයි. ඒ නිසා මුදල් ගෙවීම් නතර කරන්න සිදු වුණා. අපි දැන් සියලු විස්තර සහිත වාර්තාවල් අදාල අංශවලට යවලා තියෙන්නනේ. මුදල් ලැබුණු ගමන් නැවත ඉදි කිරීම් කටයුතු ආරම්භ කරනවා."

ගම්වැසියන් මුහුණ දෙන ජල ප්‍රශ්නය පිළිබඳ අම්පාර ජාතික ජල සම්පාදන මණ්ඩලයේ ප්‍රාදේශීය කළමනාකාරවරා පැවසුවේ මෙවැන්නකි. "මෙම නිවාස යේජනා ක්‍රමයට ළඟදීම ජලය ලබා දීමට නල මාර්ග එලමින් පවතිනවා. ගමේ අතුරු මාර්ග සඳහා නිවාසලාභීන් විසින් මුදල් එකතු කර ජේ.සී.බී. යන්ත්‍රයක් යොදවා කාණු කැපීමට එකඟ වී තිබෙනවා. ඒ අනුව එහි වැඩ කටයුතු ළඟදීම ආරම්භ කරනවා."

ඒ ප්‍රකාශ යථාර්ථයක් වී මංගලගම නිවාසලාභීන්ගේ සිහින සැබෑ වන තුරු අපද අවධානයෙන් සිටිමු.


# දිවමිණ

අදම වකුගඩුවක් දන්දී ජීවිතයක් බේරා ගන්න!

Website : www.ktsf.lk / Tel: 0722 247236; 0112 877886
E-mail: ktsfsrilanka123@gmail.com

දැන්වීම් කාර්යාල

ඔබගේ දැන්වීම් පළකරවා ගන්න පිවිසෙන්න



අනුරාධපුර
හරිස්චන්ද්‍ර මාවත,
බැංකු පෙදෙස
025 222 2370

සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම
ඩී ආර් විජේවර්ධන මාවත, කොළඹ 10
1949

To Buy Your Dream Vehicle within your Budget

If it is a vehicle you want,
YOU NAME IT,
WE HAVE IT

Sunday Observer adz Auto Focus



Sunday Observer adz it's what you want

THE ONLY PLACE TO BUY YOUR DREAM CAR!

- Vehicle Rent / Wanted
- Auto Focus

adz Magazine Issued with Sunday Observer

- Photo Classifieds

Hot Line - 011 2 429 369/ 011 2 429 368
E-mail - adzsuo@gmail.com

2020
# INNEX
Central Province Exhibition Platform

## මධ්‍යම පළාත් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සහ සංචාරක වෙළෙඳ ප්‍රදර්ශනය

மத்திய மாகாண சிறிய மற்றும் நடுத்தர அளவிலான தொழில் துறைகள் மற்றும் சுற்றுலாத்துறைக் கண்காட்சி

Central Province Small and Medium Industries, Trade & Tourism Exhibition

සැප්තැම්බර් SEPTEMBER 25 | 26 | 27
Parallel event
WORLD TOURISM DAY
2020 NATIONAL CELEBRATION

ඇතුල්වීම නොමිලේ @KCC (Kandy City Centre)

FREE WiFi by



Organized by · Main Sponsor · Official Sponsor · Gold Partner
Event Partners · Knowledge Partners · Event Sponsor · Event Managed by · Official ICT Partner · Official Media Partners · Official Printed Media Partner
Official Banking Partners





වර්ෂ 2020ක් වූ සැප්තැම්බර් මස 27 වැනි ඉරිදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.